# භික්ෂු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂ වර්ණනාව

ශ්‍රී [illegible] විජිරතන නායක ස්වාමීන්
[illegible] සුගතසේකර නායක ස්වාමීන්

සමයවර්ධන පොත්හල

රතනාර්ථ සූදනී නම් වූ

# භික්‍ෂු භික්‍ෂුණී ප්‍රාතිමොක්‍ෂ වර්‍ණනාව

සම්පාදක:

කොළඹ විද්‍යෝදය පිරිවෙන්හි ආචාර්‍ය්‍යව සිටි පණ්ඩිත
පණ්ණම්ගල සද්ධර්ම කීර්ත්ති

**ශ්‍රී සොණුත්තර ජිනරතන නායක ස්ථවිර**

බොරැල්ලේ තිලකරත්නාරාමාධිපති
ශ්‍රී සුමන සද්ධර්ම වංශපාලාචාර්‍ය්‍ය

**රත්ගම ප්‍රඥශෙඛර නායක ස්ථවිර**

යන දෙනම විසිනි.

විද්‍යෝදය පරිවෙණාධිපති අතිගරු බද්දේගම
**ශ්‍රී ප්‍රියරත්නාභිධාන නායක මාහිමියන් වහන්සේ**
විසින් ප්‍රතිගෘහිතයි.

ධර්ම ප්‍රදීපය
පොත් මැදුර
නො. 144,

**2000**

011-2925591

පස්වන මුද්‍රණය 2000

මුද්‍රණය:-

**සමයවර්ධන මුද්‍රණාලය**
53, පූජ්‍ය ශ්‍රී සුමංගල නාහිමි මාවත,
මරදාන - කොළඹ 10.

# Rathnartha Sudani Namvu
# Bhikku Bhikkuni
# Prathimoksha Varnana

ISBN 955 - 570 - 145 - 8

**Edited By :**
**Pandit Panamgala Saddharma Keerthi**
**Sri Sonuththara Jinarathana Nayaka Thero**
Ex - Teacher of Vidyodaya Pirivena,
Colombo

And

**Sri Sumana Saddharma Vamsa**
**Palacharya Rathgama Pragnasekera Nayaka Thero,**
Incumbent of
Thilakarathnaramaya, Borella.

**Recommended By :**
**Ven. Baddegama Sri Priyarathanabhidhana Nayaka Thero**
Chief of the Vidyodaya Pirivena

**Printed By :**
**Samayawardhana**
53, Poojya Sri Sumangala Nahimi Mawatha,
Maradana, Colombo 10.

# පටුන

1. ප්‍රස්ථාවනා

2. පුබ්බකරණ පුබ්බකිච්ච

3. නිදානය

4. පාරාජිකා

   i. පඨම පාරාජිකය

   ii. දුතිය පාරාජිකය

   iii. තතිය පාරාජිකය

   iv. චතුත්ථ පාරාජිකය

5. සංඝාදිසේස

   i. සුක්කවිසට්ඨි සංඝාදිසේසය

   ii. කායසංසග්ග සංඝාදිසේසය

   iii. දුට්ඨුල්ලවාචා සංඝාදිසේසය

   iv. අත්ථකාම සංඝාදිසේසය

   v. සංචරිත්ත සංඝාදිසේසය

   vi. සඤ්ඤාචික සංඝාදිසේසය

   vii. මහල්ලකවිහාර සංඝාදිසේසය

   viii. පඨම දුට්ඨදොස සංඝාදිසේසය

   ix. දුතිය දුට්ඨදොස සංඝාදිසේසය

   x. සංඝභෙද සංඝාදිසේසය

   xi. භේදානුවත්තක සංඝාදිසේසය

   xii. දුබ්බච සංඝාදිසේසය

   xiii. කුලදූසන සංඝාදිසේසය

6. අනියත

7. නිස්සගිය පාචිත්තිය
    i. චීවර වග්ගෝ
    ii. කෝසිය වග්ගෝ
    iii. පත්ත වග්ගෝ
8. පාචිත්තිය
    i. මුසාවාද වග්ගෝ
    ii. භූතගාම වග්ගෝ
    iii. ඕවාද වග්ගෝ
    iv. භෝජන වග්ගෝ
    v. අචේලක වග්ගෝ
    vi. සුරාපාන වග්ගෝ
    vii. සප්පාණක වග්ගෝ
    viii. සහධම්මික වග්ගෝ
    ix. රථන වග්ගෝ
9. පාටිදේසනීය
10. සේඛියා
    i. පරිමණ්ඩල වග්ගෝ
    ii. උජ්ඣගිගික වග්ගෝ
    iii. ඛම්භකථ වග්ගෝ
    iv. සක්කච්ච වග්ගෝ
    v. කබළ වග්ගෝ
    vi. සුරු සුරු වග්ගෝ
    vii. පාදුක වග්ගෝ
11. අධිකරණ සමථ

# ප්‍රස්තාවනා

විනය ධර්මය වනාහි සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් ශාසනා වචර කුල පුත්‍ර පුත්‍රීන් සංවරයෙහි පිහිටුවීම පරමාර්ථ **විනය** කොට ගෙණ දෙශිත පරමවිශිෂ්ට ප්‍රඥප්ති ධර්මයෙකි. සැදැහැයෙන් සසුන් වන් භික්ෂු භික්ෂුණීන්ගේ කායද්වාරය හා වාග්ද්වාරය හික්මවන හෙයින් මේ ධර්මාංශයට " විනය ධර්ම" යයි ප්‍රකාශ කරණු ලැබේ. එහෙයින් කීහු:-

"විවිධ විසෙස නයත්තා විනයනතො චෙව කාය වාචානං,

විනයත්ථ විදූහි අයං - විනයො විනයොති අක්ඛාතො".

සියලුම බුඩවචනය විනය පිටකය, සුත්තන්ත පිටකය, අභිධම්ම පිටකය යයි පිටක වශයෙන් ත්‍රිවිධ වේ. එයින් ප්‍රථම සංගායනාවේදී සංගායනා කරණ ලද්දවූ ද සංගායනා නොකරණ ලද්දවූ ද උභය ප්‍රාති මොක්ෂය, විභඞ්ග දෙකය. දෙවිස්සක් ඛන්ධකය, සොළොස් පරිවාරයෝ දැයි මේ සියල්ලම විනය පිටකයට ඇතුළත් වේ. ධර්ම සඞ්ගීති කාරකා චායඝීවරයෝ "පාරාජිකපාලි-මහාවග්ග පාලි - චුල්ලවග්ග පාලි-පාචිත්තිය පාලි-පරිවාර පාලි" යයි ග්‍රන්ථ වශයෙන් පඤ්චකයක් දැක්වූහ.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ ධරමාන සමයෙහි මේ විනය පිටකයට අයත් සියලුම ප්‍රඥප්තීන් ජීවිත පරිත්‍යාගයෙන් ව්‍යතික්‍රමණය නොකොට ආරක්ෂා කිරීමට සියලුම භික්ෂු භික්ෂුණීහු නොමැලිවූහ. තථාගත පරිනිර්වාණයෙන් පසුද විනය ගරුක ශ්‍රඩාවත් භික්ෂු භික්ෂුණීන් ගෙන් මේ ශාසනය නො සිස්විය. විනය ගරුකයන්ට තථාගතයන් වහන්සේ ද ගරු කළහ.

විනය ධාරීන්ට ගෞරව කිරීම සඳහාත් පශ්චාත් කාලීන භික්ෂූන්ට අනුකම්පාව සඳහාත් පරම ශික්ෂණයෙන් යුත් "උපාලි" මහරහතන් වහන්සේ "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං විනය ධරානං යදිදං උපාලි" යි එතදග්‍ර පාලියෙහි තබා වදළ නිසා ඒ බැව් මනාව ස්ඵුට වේ. උපාලි මහරහතුන්වහන්සේ විනය ධාරීන්ගේ ප්‍රමුඛස්ථානය ලැබගෙණ බොහෝ ශිෂ්‍යයනට ප්‍රගුණ කරවීමාදියෙන් විනය ධර්මය බැබල වූ සේක.

ප්‍රථම සඞ්ගීතියේ පටන් තෘතීය සඞ්ගීතිය දක්වා උපාලිය. දසකය,

**විනය වංශය** සොනකය, සිග්ගවය. මොග්ගලිපුත්තතිස්සය. යන පස්නම ජම්බුද්වීපයෙහි විනය වංශය නො සිඳ පැවැත්වූහ. සිය දහස් ගණන් ශිෂ්‍යගණයාට උද්ග්‍රහණ ධරණාදිය කරවීමෙන් විනය ධර්මයේ උන්නතියත් භික්ෂූන්ගේ ශික්ෂණයත් වර්ධනය කළහ. ඒ බැව් අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ මාහිමියෝ මෙසේ දක් වූහ.

"උපාලි දසකො චෙව - සොනකො සිග්ගවො තථා
තිස්සො මොග්ගලි පුත්තොච - පඤ්චෙතෙ විජිතාවිනො.
පරම්පරාය විනයං - දීපෙ ජම්බුසිරිව්හයෙ
අච්ඡිජ්ජමානං ආනෙසුං - තතියො යාව සංගහො."

තෘතීය ධර්ම සංගායනාවේ දී ප්‍රමුඛ ස්ථානය ගෙණ වදළ ෂඩභිඥලාභි මොග්ගලිපුත්තතිස්ස ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ ශිෂ්‍යභාවොපගත මහා මහේන්ද්‍ර මහරහතුන් වහන්සේ ලක්දිව සම්බුද්ධධර්මප්‍රචාරයෙහි ආදි කර්තෘවරයානෝ වූහ. මේ විනය ධර්මය ද උන්වහන්සේ ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාව ලක්දිව ප්‍රචලිතත්වයට පැමිණ වූහ.

**ලක්දිව විනයවංශය** මහින්දය, ඉට්ඨිය උත්තිය, සම්බලය, භද්දසාලය,අරිට්ඨය, තිස්ස දත්තය,කාලසුමනය, දීඝනාමය, දීඝසුමනය, කාල සුමනය. මහානාගය,බුද්ධරක්ඛිතය, තිස්සය, දෙවය, සුමනය, චූලනාගය, ධම්මපාලිතය, ඛෙමය, උපස්සය, ඵුස්සදෙවය, සුමනය. පුප්ඵනාමය. මහාසීවය, උපාලිය,මහානාගය, අභයය, තිස්සය, පුප්ඵනාමය, චූලාභය, තිස්සය, චූලදෙවයය, සීවය යන මේ මහාක්ෂීණාශ්‍රව පරම්පරාව විසින් ත්‍රිපිටක ධර්මය මුඛ පාලි වශයෙන් පවත්වා ගෙණෙන ලදී.

ශ්‍රී බුද්ධ වර්ෂ 433 දී රාජ්‍යයට පැමිණි වළගම් අබා මිහිපල්හුගේ ආරක්ෂාවෙන් පන්සියයක් මහරහතුන් වහන්සේ මාතුල දනව්වෙහි අලුලෙණ වැඩහිඳ සංගායනා කොට ඒ තාක් නිර්මලව පැවැති ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කළසේක. මේ තාක් වෛතුල්‍යවාදීන් ත්‍රිපිටක ධර්මයට ඔවුන්ගේ නානා මතාන්තරයන් මිශ්‍ර කිරීමට ප්‍රයත්න දැරූබවත් අලුලෙන දී කළ මේ ධර්ම සංගායනාවට එයත් කරුණු වූ බවත් සැලකිය හැකි වේ.

අලුලෙනැ ධර්ම සංගායනාවෙන් පසු මහා විහාරික සැදැහැවත් මහා ස්ථවිරයන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙන්ම විනය ධර්මය සුරක්ෂිත විය. විංශතිතම ශතවර්ෂයෙහි **හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල නායක මාහිමියාණෝ** ආදි විනය ගරුක මහාස්ථවිරවරු විනය ධර්මයෙහි යථාර්ථඥනය සුප්‍රකට කළහ. ඉන්පසු සකල නිකායික මහා ස්ථවිරවරු විනය ධර්මය ගරු කොට ස්වකීය ශිෂ්‍යගණයාට ප්‍රගුණ කරවති.

**භික්ෂු භික්ෂුණී ප්‍රාතිමොක්ෂය**

"ප අතිමොක්ඛං අතිපමොක්ඛං අතිඋත්තමං අතිසෙට්ඨං" යි අර්ථ කථාචාර්ය බුදුගොස් හිමියෝ "පාතිමොක්ඛ" යන්නෙහි අර්ථ කථනය කළහ. මේ වනාහි ශීල ප්‍රාතිමොක්ෂය, ග්‍රන්ථප්‍රාතිමොක්ෂ යයි දෙපරිදි වේ. "ආදිමෙතං මුඛ මෙතං පමුඛමෙතං කුසලානං ධම්මානං තෙන වුච්චති පාතිමොක්ඛං" යනාදි තන්හි ශීලප්‍රාතිමොක්ෂය ද, "උභයානි ඛො පනස්ස ප්‍රාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති" යනාදි තන්හි ග්‍රන්ථ ප්‍රාතිමොක්ෂයද ප්‍රකාශ වේ.

ග්‍රන්ථ ප්‍රාතිමොක්ෂය ද, භික්ෂුප්‍රාතිමොක්ෂය, භික්ෂුණී ප්‍රාතිමොක්ෂ යයි දෙවැදෑරුම්. නිදනුද්දෙසය. පාරාජිකුද්දෙසය, සංඝාදිසෙසුද්දෙසය, අනියතුද්දෙසය, විත්ථාරුද්දෙසය යයි උද්දෙස පසකින් සංගෘහිතවූයේ භික්ෂු ප්‍රාතිමොක්ෂයයි. අනියතුද්දෙසය රහිත සෙසු උද්දෙස සතරින් සංගෘහිත වූයේ භික්ෂුණී ප්‍රාතිමොක්ෂයයි.

. භික්ෂුණී ශාසනයාගේ නැතිවීම සමගම භික්ෂුණී ප්‍රාතිමොක්ෂයද අඳුරෙහි වැටින. භික්ෂු ප්‍රාතිමොක්ෂය අදත් ශ්‍රද්ධාවත් විනය ගරුක භික්ෂූන්ට මහදර්ථයක් සලසා දෙමින් බැබලෙයි. සකල භික්ෂූන් විසින්ම වාචොද්ගත කිරීමෙන් හා අර්ථොද්ග්‍රහණය කිරීමෙන් ආදරයෙන් පරිශීලනය කරණු ලැබේ.

**පරිවාර ග්‍රන්ථ**

කඞ්ඛාවිතරණී නම් වූ මාතිකට්ඨ කථාව අර්ථ කථාචාර්‍ය්‍ය අනුබුද්ධ බුද්ධඝොෂ මාහිමියන් වහන්සේ විසින් පෙළ බසින් ප්‍රාතිමොක්ෂයට ලියන ලද මාහැඟි පරිවාර ග්‍රන්ථයෙකි. සමන්තපාසාදිකා නම් වූ විනයාර්ථ කථාවෙහි සකල ශික්ෂාපදයක් ම විස්තර වශයෙන් ලියන ලද බැවින් මෙහි ප්‍රමාණවත් විස්තරයක් ලියන ලද බැව් පෙණේ. එහෙත් මාතිකාපාලිය පරිශීලනය කරණ ශිෂ්‍යයන්ට මෙයින් විපුල ප්‍රයෝජනයෙක් ලැබේ.

**ප්‍රාතිමොක්ෂ ව්‍යාඛ්‍යාව**

මේ වනාහි ප්‍රාතිමොක්ෂයට හෙලුබසින් අර්ථව්‍යාඛ්‍යානය කළ ප්‍රශස්ත ව්‍යාඛ්‍යාවක් වේ. මෙය කවර කලක කවරෙකු විසින් කරණ ලද්දක් දැයි දන ගැණීමට ඉවහල් කරුණු දුර්ලභය. සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු කාලයේ භාෂාවට සමකළ හැකි ඇතැම් වචන මෙහි පවත්නා බැවින් ඉතා පැරණි විනය ධාරී මහතෙර කෙනෙකු විසින් කරණ ලද්දකැයි සැලකිය හැකි වේ. පාමොක් ඉගෙණ ගන්නා භික්ෂූන්ට මේ සන්නය මේ තාක් ඉතා ප්‍රයෝජන විය.

**ගණ්ඨි දීපනිය**

මේ ද අර්ථ කථා සහිත ත්‍රිපිටක ධාරී "ඤාණකිත්ති" නැමැති මහතෙර කෙනෙකුන් විසින් පෙල බසින් ලියන ලද ප්‍රාතිමොක්ෂ පරිවාරග්‍රන්ථයෙකි. ප්‍රාතිමොක්ෂයේ ග්‍රන්ථිස්ථාන ලිහිල් කිරීමෙන් හා නිරුක්ති දැක්වීමෙන්ද විස්තර කළ යුතු ඇතැම් පද විස්තර කිරීමෙන් ද ලියන ලද්දකි. හෙද ශිෂ්‍යන්ට ඉතා ප්‍රයෝජනවත් වේ.

**රත්නාර්ථ සූදනිය**

ප්‍රාතිමොක්ෂයට පරිවාර ග්‍රන්ථ කීපයක් ඇතත් ප්‍රාතිමොක්ෂය හදරණ ශිෂ්‍යයන්ට යොග්‍ය අර්ථ වර්ණනාවක් මේ තාක් පළවී නොමැත. ශිෂ්‍යයනට වූ ඒ පාඩුව පිරිමසා ලීමෙහි ප්‍රොත්සාහි වීමි. එහෙත් ශිෂ්‍යයන්ගේ අභිමතාර්ථය සම්පූර්ණ වේමයයි නොකියමි. නමුත් මේ තාක් පළ වූ ප්‍රාතිමොක්ෂ ව්‍යාඛ්‍යානයන්ට වඩා මදීය ව්‍යාඛ්‍යා ව ශිෂ්‍යයන්ට ප්‍රයොජන වේයයි කියන්නට නො මැලිවෙමි. අර්ථකථා සහිත විනය පිටකය ආශ්‍රයෙන් ලියවුන සංලක්ෂ්‍යය ශිෂ්‍යයන්ට පහසුවන පරිදි පිළියෙළ කෙළෙමි. පොත් රාශියක් බලා ඉගෙණ ගත යුතු කරුණු මෙයින් ම ඉගෙන ගත හැකි බැවිනි. පොත් රාශියක් බැලීමෙන් ශිෂ්‍යයන්ට ඇතිවන කරදරය මෙයින් බොහෝ දුරට මග හැරේ යයි සිතමි.

වර්තමානික ශිෂ්‍යයන් අතර භික්ෂුණී ප්‍රාතිමොක්ෂය පරිශීලනය කරණ ශිෂ්‍යයෝ දුර්ලභ වෙති. එබැවින් එහි විස්තරයක් ලිවීමට කල්පනා නො කෙළෙමි.

**උපකාරානුස්මෘති**

විද්‍යොදය පරිවෙණාධිපතිව වැඩසිට ස්වර්ගස්ථවී වදාළ අතිගරු **කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන** කොළඹ නවකෝරළේ ප්‍රධාන නායක මාහිමියන් වහන්සේ මෙහි මුල කොටසෙහි ශුද්ධිපත්‍ර බලාදීම මේ ග්‍රන්ථයාගේ ගුරුත්වය ආරක්ෂා කෙරේමය. සම්පූර්ණ ග්‍රන්ථයාගේම ශුද්ධිය සිදුකරවාගන්නට නොලැබීම අපගේ අභාග්‍යයෙකි. මේ ග්‍රන්ථ සම්පාදනයෙන් සඤ්ජාත කුසලසම්භාරය යථොක්ත මාහිමියන් වහන්සේ අනුමොදන්වී ස්වර්ගමොක්ෂ සම්පත් ලබත්වා.

ඉතිරි කොටසෙහි ශුද්ධිය ඉතා සැලකිල්ලෙන් බලා වදාළ මෙකල විද්‍යොදය පරිවෙණාධිපති අතිගරු **බද්දේගම ශ්‍රී ප්‍රියරතනාභිධාන** නායක මාහිමියන් වහන්සේගෙන් ලැබුනු සමාදර පූර්වක අනුග්‍රහය ගෞරව පුරඃසරව අනුස්මරණය කරමි.

2488

1944. 10. 15. දින

විද්‍යාලොක පිරිවෙණේ දීය.

**පණ්ඩිත පණමිගල ජිනරතන ස්ථවිර.**

## රත්ථාර්ථ සූදනී

නම් වූ

# භික්ෂු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂ වර්ණනාව

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

උපොසථ කම්මස්ස

පුබ්බකරණ පුබ්බ කිච්චානි.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං,
අහං ආයස්මන්තං (ඉත්ථන්නාමං) විනයං පුච්ඡෙය්‍යං.
සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං,
අහං (ඉත්ථන්නාමෙන) විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං

---

සංසුද්ධා'මතදං ලොක-නායකං අභිවන්දිය
කරිස්සාමි සභාසාය-පාතිමොක්ඛත්ථ වණ්ණනං.

ශ්‍රීමච්ඡාක්‍ය මුනීන්ද්‍ර සුගත තථාගත ත්‍රෛලොක්‍ය ගුරු සම්මා සම්බුද්ධරාජයානන් වහන්සේ විසින් අධිශීල ප්‍රාප්ත භික්ෂු භික්ෂුණීන්ගේ ආයති සංයමය පිණිස හා සම්බුද්ධ ශාසනයාගේ චිරස්ථිතිය සඳහාත් දෙශිත ප්‍රඥප්ත්‍යන්තගීත "භික්ෂු භික්ෂුණී ප්‍රාතිමොක්ෂ" නැමැති ශ්‍රෙයස්කර විනය ග්‍රන්ථයට විස්තරාර්ථ වර්ණනාවක් කරණු ලැබේ.

(ආරාධක භික්ෂූහු විසින් හත්ථපාසොපගත සඞ්ඝ මධ්‍යයේදී මේ "ඥප්තිය" ස්ථාපනය කටයුතුයි.) භන්තෙ, වහන්ස; සඞ්ඝො, සඞ්ඝතෙමේ; මෙ, මා කියන්නක්; සුණාතු, අසාවා; යදි, ඉදින්; සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; (උපොෂිත කර්මය ), පත්ත කල්ලං, ප්‍රාප්ත කල් ඇත්තේ වී නම්; අහං, මම; ආයස්මන්තං, ආයුෂ්මත්වූ; (ඉත්ථන්නාමං, මෙනම් ඇත්තහු;) විනයං විනය (-පාමොක්);, පුච්ඡෙය්‍යං, විචාරන්නෙමි.

සම්මජ්ජනී පදීපො ච උදකං ආසනෙන ච,
උපොසථස්ස එතානි පුබ්බකරණන්ති වුච්චති.

ඔකාස = සම්මජ්ජනී, සම්මජ්ජන කරණඤ්ච, පදිපො ච, පදීප උජ්ජලනඤ්ච, (ඉදනි සූරියාලොකස්ස අත්ථිතාය පදීප කිච්චං නත්ථි) උදකං ආසනෙන ච-ආසනෙන සහ පානීය පරිභොජනීය උදකට්ඨපනඤ්ච, උපොසථස්ස එතානි පුබ්බ කරණන්ති වුච්චති, එතානි චත්තාරි කම්මානි සම්මජ්ජන කරණා දීනි සඞ්ඝසන්නිපාතතො පඨමං කත්තබ්බත්තා, උපොසථස්ස, උපොසථකම්මස්ස, පුබ්බකරණන්ති වුච්චති. පුබ්බකරණානීති අක්ඛාතානි

---

(දෙශක භික්ෂුහු විසිනු දු ප්‍රථම කොට මේ "ඤත්තිය" දෙශනා කට යුතුයි.) භනෙත වහන්ස; සඞෙඝා, සඞ්ඝ තෙමේ; මේ, මා කියන්නක්; සුණාතු, අසාවා. යදි, ඉදින්; සඞ්ඝස්ස; සඞ්ඝයාගේ; (=උපොෂිත කර්‍මය) පත්තකල්ලං, ප්‍රාප්ත කල් ඇත්තේ නම්; අහං, මම; (ඉත්ථන්නාමෙන, මෙ නම් ඇත්තහු විසින්,) විනයං, විනය, පුට්ඨො, විචාරණ ලද්දෙම්; විස්සජ්ජෙය්‍යං, විසඳන්නෙමි.

**අථ**:- සම්මජ්ජනි; පොහෝ ගෙයි කවවර හැමදීම ද; පදි පො ච (රාත්‍රියෙක්හි වුව හොත්) පහන් දල්වීම ද; ආසනෙන, අසුන් පැණවීම හා සමග; උදකඤ්ච, (ආගන්තුග භික්ෂූන් සඳහා පියයුතු වූද; (හස්තපාදධොවනාදී) පරිභොග කටයුතුවූද ජලය එලවා තැබීම ද යන; එතානි, මේ සතර වත්හු, උපොසථස්ස, (සඞ්ඝගණාදී) උපොසථයාගේ, පුබ්බකරණන්ති, පූර්‍වකරණ යයි, වුච්චති, කියනු ලැබේ.

ඔකාස, අවසරයි; (ආරාධකයා විසින් "ඔකාස"යි තෙවිටක් කියා අවසර ලබා ගතයුතුයි.) සම්මජ්ජනී, සම්මජ්ජනී යනු (දෙශකයා විසිනු දු එක්නමකට වත් බාල නම් පෙරසේ ම අවසර ගත යුතුයි.) සම්මජ්ජන කරණඤ්ච, හැමදීම කිරීම ද; පදීපො ච, පදීපො ච යනු, පදීප උජ්ජලනඤ්ච; ප්‍රදීපො ජ්වලනය ද; (ඉදනි, දැන්, සූරියාලොකස්ස, සූර්‍ය්‍යාලොකය; අත්ථිතාය, ඇති බැවින්; පදීපකිච්චං, පහන් දල්වීම්, කෘත්‍යයෙක්; නත්ථි, නැත්තේය:) උදකං ආසනෙන ච, උදකං ආසනෙනච යනු ආසනෙන සහ, අසුන් පැණවීම සමග; පානීය, පියයුතු වූ ද; පරිභොජනීය, පරිභොග කටයුතුවූද; උදකට්ඨපනඤ්ච, දිය එළවා තැබීම ද; උපොසථස්ස එතානි පුබ්බකරණන්ති වුච්චති, උපොසථස්ස - පෙ- වුච්චති, යනු, සම්මජ්ජන කරණා.

ඡන්දපාරිසුද්ධි උතුක්ඛානං භික්ඛුගණනා ච ඔවාදෙ
උපොසථස්ස එතානි පුබ්බකිච්චන්ති වුච්චති.

ඡන්ද පාරිසුද්ධි; ඡන්දරහානං භික්ඛූනං ඡන්දපාරිසුද්ධි ආහරණඤ්ච, (ඉධ නත්ථි) උතුක්ඛානං: හෙමන්තාදීනං තිණ්ණං උතූනං එත්තකං අතික්කන්තං එත්තකං අවසිට්ඨන්ති එවං උතු ආචික්ඛණං, උතූනීධ පන සාසනෙ හෙමන්ත ගිම්හ වස්සානානං වසෙන තීණි හොන්ති, අයං හෙමන්ත උතු; අස්මිං උතුම්හි අට්ඨ උපොසථා, ඉමිනා පක්ඛෙන එකො උපොසථො සම්පත්තො, එකො උපොසථො අතික්කන්තො, ඡ උපොසථා අවසිට්ඨා.

---

දීති, සම්මාර්ජනය කිරීම් ආදීවූ; එතානි චත්තාරි වත්ථානි, මේ සිවු වත්හු: සඞ්ඝ සන්නිපාතතො; සංඝයාගේ රැස්වීමෙන්; පඨමං, පළමු කොට; කත්තබ්බත්තා, කළයුතු හෙයින්: උපොසථස්ස. උපොසථස්ස යි යේයි: උපොසථ කම්මස්ස, උපොෂිත කර්‍මයාගේ; පුබ්බකරණන්ති, වුච්චති, පුබ්බකරණන්ති වුච්චති යනු; පුබ්බකරණානීති, පූර්වකරණහ යි; අක්ඛාතානි, ප්‍රකාශ කරණ ලද්දහුයි.

**සංලක්ෂ්‍යය:-** **"සම්මජ්ජනී"** යී, (සම්මජ්ජති එතායාති-**සම්මජ්ජනී**. සංපූර්ව මජ්ජ සුද්ධියං යනු ධාතුවයි. ස්ත්‍රී අර්ථයෙහි ඊ ප්‍රත්‍යයයි) මෙය මුස්නට නමෙකි. එහෙත් මෙහි "හැමදීම"කියවෙන බැවින් භාවයෙහි 'යු' ප්‍රත්‍යයයි. ස්ථවිර භික්ෂුහු විසින් අනුදන්නා ලද්දෙකු විසින් හැමදිය යුතුයි. හැමදීමට මුස්නක් නොලද හොත් අනුසම්පන්නයකු ලවා අතුකැටියක් වත් කැප කොට ගෙන්වා හැමදිය යුතුය. කෙසේ නමුත් ස්ථවිර භික්ෂූහුගේ නියමය කළයුතු වේ. නැතහොත් **-න භික්ඛවෙ ථෙරෙන ආණත්තෙන අගිලානෙන න සම්මජ්ජිතබ්බං. යො න සම්මජ්ජෙය්‍ය. ආපත්ති දුක්කටස්ස"** යී වදාළ බැවින් "දුකුළාවක්" වේ.

සං:- **"උදකං ආසනෙන ච"** යන්නෙන් ආගන්තුග භික්ෂූන් සඳහා පානය කටයුතු වූ ද, පරිභොග කටයුතු වූ ද, ජලය සීමාවෙහි තැබිය යුතු බැව් දක්වයි. එසේම පීඨකඨලිකාදි අසුන් පැනවිය යුතු, සීමාවෙහි අසුන් නැති නම් සාංඝිකාවාසයෙන් ගෙන ගොස් තබා නැවත රැගෙණවිත් එහිම තැබිය යුතුයි. යටත් පිරිසෙයින් කොල අතු වත් කැප පරිදි ලැබගෙණ පැණවිය යුත්තේය.

සං:- **"පුබ්බකරණං"** මේ සම්මජ්ජනී ආදීවූ කර්මචතුෂ්කය සංඝයා රැස්වන්නට කලින් කළයුතු හෙයින් "පූර්වකරණ" නම්.

භික්ඛුගණනා ච, ඉමස්මිං උපොසථග්ගෙ සන්නිපතිතානං භික්ඛූනං ගණනා එත්තකා භික්ඛු හොන්ති, ඔවාදෙ, භික්ඛුණීනං ඔවාදෙ දාතබ්බො, (ඉදානි පන තාසං නත්ථිතාය සො ච ඔවාදෙ ඉධ නත්ථි;) උපොසථස්ස එතානි පුබ්බකිච්චානීති වුච්චති. එතානි පඤ්ච කම්මානි ඡන්දහරණාදීනි පාතිමොක්ඛුද්දෙසතො පඨමං කත්තබ්බත්තා, උපොසථස්ස-උපොසථකම්මස්ස, පුබ්බ කිච්චන්ති වුච්චති, පුබ්බකිච්චානීති, අක්ඛාතානි;

---

අර්ථ:- ඡන්දපාරිසුද්ධි, එලවන ලද ඡන්දය හා පිරිසිදු බව ඇස්වීමය; උතුක්ඛානං, සෘතු කීමය; භික්ඛුගණනා ච, (සීමා වෙහිවූ) භික්ෂූන්ගේ ගිණීමය; ඔවාදෙ, භික්ෂුණීන්ට අවවාද කිරීමය යන; එතානි, මේ කෘත්‍ය (වත්) පස; පුබ්බකිච්චන්ති, පූර්වකෘත්‍ය යයි; වුච්චති, කියනු ලැබේ.

ඡන්දපාරිසුද්ධි, ඡන්දපාරිසුද්ධි යනු; ඡන්දරහානං, ඡන්දය එල වීමට සුදුසු වූ; භික්ඛූනං, භික්ෂූන්ගේ; ඡන්දපාරිසුද්ධි, ඡන්දය ( කැමැත්ත) හා පිරිසුදු බව; ආහාරණඤ්ච, ගෙණ ඊම ද; (ඉධ නත්ථි-මෙහි නැති;) උතුක්ඛානං, උතුක්ඛානං, යනු; හෙමන්තා දීනං, හෙමන්ත සෘතුව ආදීවූ; තිණ්ණං උතූනං, තුන් සෘතූන් අතුරෙන්; එත්තකං, මෙපමණෙක්; අතික්කන්තං, ඉකුත්විය; එත්තකං, මෙපමණෙක්; අවසිට්ඨං, ශෙෂ වී යයි; එවං, මෙසේ; උතු ආචික්ඛණං, සෘතු කීම; (හොති, වෙයි); ඉධ පන සාසනෙ; මේ සස්නේ වනාහි; හෙමන්ත ගිම්හ වස්සානානං වසෙන, හිමත් ගිමත් වසත් යන මොවුන්ගේ වශයෙන්; තීනි උතූනි, සෘතූහු තිදෙනෙක්; හොන්ති, වෙති; අය, මේ; හෙමන්ත උතු, හෙමන්ත සෘතුවයි; අස්මිං උතුම්හි, මේ සෘතුවෙහි; අට්ඨ උපොසථා, පොහෝ අටෙක්; (හොන්ති, වෙති; ) (එයින්) ඉමිනා පක්ඛෙන, මේ පක්ෂයෙන්; එකො උපොසථො, එක් පොහොයෙක්; සම්පත්තො, පැමිණියේය; එකො උපොසථො, එක් පොහොයෙක්; අතික්කන්තො, ඉක්ම ගියේය. ඡ උපොසථා පොහෝ සයක්; අවසිට්ඨා, ශෙෂ (ඉතිරි) වූහ.

භික්ඛුගණනා ච, භික්ඛුගණනා ච යනු; ඉමස්මිං උපොසථග්ගෙ, මේ උපොෂිතාග්‍රයෙහි (සීමාමාලකයෙහි); සන්නිපතිතානං, රැස්වූ; භික්ඛූනං, භික්ෂූන්ගේ; ගණනා, ගිණීම; එත්තකා භික්ඛු, මෙපමණ භික්ෂූහු; හොන්ති, වෙති.

ඔවාදෙ, ඔවාදෙ යනු; භික්ඛුණීනං, භික්ෂුණීන්ට; ඔවාදෙ, අවවාදය; දාතබ්බො, දිය යුත්තේය. ඉදානි පන, දැන් වනාහි; තාසං නත්ථිතාය, ඒ භික්ෂුණීන් නැති බැවින්; සො ච ඔවාදෙ, ඒ අවවාදය ද; ඉධ නත්ථි, මෙහි නැත. උපොසථස්ස එතානි පුබ්බකිච්චන්ති වුච්චති,

උපොසතස්ස-පෙ- වුච්චති යනු, ඡන්දහරණාදීනි, ඡන්දය ගෙණ ඊමාදී වූ; එතානි පඤ්චකම්මානි, මේ පඤ්ච කර්මයන් පාතිමොක්ඛුද්දෙසතො, පාමොක් උදෙසීමෙන්; පඨමං, පළමුව; කත්තබ්බත්තා, කළයුතු හෙයින්; උපොසථස්ස, උපොසථස්ස, යී, සේයි, උපොසථ කම්මස්ස, උපොසථ කර්මයාගේ; පුබ්බකිච්චන්ති වුච්චති; පුබ්බකිච්චන්ති වුච්චති යනු, පුබ්බකිච්චානීති, පූර්වකෘත්‍යයෝ යයි; අක්ඛාතානි, කියන ලද්දහුය.

සං:- **"ඡන්දපාරිසුද්ධි"** (ආපත්තීහි පරි සමන්තතො සුජ්ඣනං; පාරිසුද්ධි, ඡන්දො ච පාරිසුද්ධි ච, ඡන්දපාරිසුද්ධි) පොහෝ කිරීමට පළමු අන්‍ය ස්ථානයන්හි පොහෝ කොට පැමිණි භික්ෂූන් වුවහොත් ඒ භික්ෂූන්ගේ ද, ගිලනුන්ගේ ද, ග්ලානොපස්ථායකයන්ගේ ද ඡන්දය හා පිරිසිදු බව ලබාගතයුත්තේය.

ඡන්දය හා පාරිසුද්ධිය දෙන භික්ෂුහු විසින් කායද්වාරයෙන් හෝ වාග්ද්වාරයෙන් හෝ කායවාග්ද්වාරද්වයයෙන් ම හෝ සුදුසු පරිදි ඡන්දය හා පාරිසුද්ධිය දිය යුත්තේ යි. ඒ මෙසේ යි. **"ඡන්දං දම්මි, ඡන්දං මෙ හර, ඡන්දං මෙ ආරොචෙහි"** යි මේ අදහස පරිදි කැමැති භාෂාවකින් ප්‍රකාශ කළ හැකි වේ.

මෙහි දක්වෙන ඡන්දය වනාහි සමානසංවාසක සංඝයා පොහෝ කිරීම සඳහා සීමාවෙහි රැස්වන්නට මත්තෙන්ද දිය හැකිවේ. ආරොචනය සංඝයා රැස්වූ කල්හිම කළයතුයි. එහෙයින් පුරාණ ඛුද්දක සික්ඛා ටීකාවෙහි **"අසමාගමෙපි දතුං වට්ටති, ආරොචෙතෙන පන සමාගමෙ එව ආරොචෙතබ්බන්ති"** යී. කීහු.

සං:- **"උතුක්ඛානං"** යනු (තං තං කිරියං අවති වත්තෙතීති; උතු, තස්ස, අක්ඛානං; උතුක්ඛානං) හෙමන්ත ආදි ඍතූන් ප්‍රකාශ කිරීම යි. "හෙමන්තාදීනං" යන ආදියෙන් ප්‍රකාශවන්නේ ඍතූන් ප්‍රකාශ කරණ අයුරුයි.

"උතු" ශබ්දය පුංස්ත්‍රීලිඞ්ගික යයි බොහෝ තන්හි ප්‍රකාශ වේ. **"කමා හෙමන්තගිම්හාන වස්සානා උතුයො ද්විසු"** යි අභිධානප්පදීපිකාවෙහි ද පුංස්ත්‍රීලිඞ්ග වශයෙන් "උතු" ශබ්දය පැණේ. එහෙත් **"උතුනීධ පන සාසනෙ"** යන තන්හි උතුනි x ඉධ කියා පදච්ඡේදය කළ කල්හි "උතු" ශබ්දය නපුංසක ලිඞ්ගික වත් යෙදෙන බැව් පෙණේ. මෙය "උතුනි" යන්නට විශෙෂණ වශයෙන් යෙදෙන "තීණි" යන්නෙන් වඩාත් පැහැදිලි වේ.

නමුත් ඇතැම් ආචායර්‍යවරයෝ "උතුනීධ" යන සන්ධිය "උතු + ඉධ" කියා විසන්ධි කොට "න" කාරයක් ආගම කිරීමෙන් හා ඉකාරයට දීර්‍ඝ කිරීමෙන් "උතුනීධ" කියා පද සිද්ධිය කෙරෙති.

සං:- **"භික්ඛු ගණනා ච"** (භික්ඛූනං, ගණනා ; භික්ඛු ගණනා) යි අර්‍ථ හෙයින් පොහෝ කිරීම සඳහා එක සීමස්ථ භික්‍ෂූන් සංඛ්‍යාව ද පාමොක් දෙශනා කරන්නට ප්‍රථමයෙන් පූර්‍ව කෘත්‍යයයක් වශයෙන් ප්‍රකාශ කටයුත්තේය.

සං:- **"ඔවාදෙ"** පොහෝ දිනයෙහි භික්‍ෂුණී සංඝයාට අනුශාසනය කළයුතු වේ. එසේම සියලුම භික්‍ෂුණී සංඝයා විසිනුදු අවවාද ගැණීම සඳහා නියමිත ස්ථානයකට පැමිණිය යුත්තේය. සංඝයා විසින් අනුදන්නා ලද ඔවාද දයක භික්‍ෂුහු විසින් භික්‍ෂුණී සඞ්ඝයාට අෂ්ටවිධ ගරු ධර්‍මවලින් අනුශාසනා කටයුතු වේ. එකී ඔවාද දයකයා විසිනුදු වක්‍ෂ්‍යමාන අඞ්ග (කරුණු) අටකින් සමන්විත විය යුතුයි.

**තදඞ්ගාෂ්ටකය මෙසේයි**

1. සීලවා හොති =පෙ= සික්ඛති සික්ඛාපදෙසු.
2. බහුස්සුතො හොති =පෙ=දිට්ඨියා සුප්පටිවිද්ධා.
3. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි =පෙ= අනුබ්‍යඤ්ජනසො.
4. කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො.
5. යෙභුය්‍යෙන භික්ඛුණීනං පියො හොති මනාපො.
6. පටිබලො හොති භික්ඛුණියො ඔවදිතුං.
7. න ඛො පනෙතං භගවන්තං =පෙ= ගරුධම්මං අජ්ඣාපන්න. පුබ්බෙ හොති.
8. වීසතිවස්සො වා හොති අතිරෙකවීසතිවස්සො.

( වැඩි විස්තර විනයාර්‍ථ මඤ්ජුසාවෙන් බලාගත යුතුයි.)

සං:- **"පුබ්බකිච්චං"** මෙ කී පූර්‍වකෘත්‍ය පඤ්චකය පූර්‍වකරණ වලින් පසුව කළ යුතු නමුදු පාමොක් දෙශනා කිරීමට ප්‍රථම යෙන් සිඩ කටයුතු බැවින් "පුබ්බකිච්චං" යි පූර්‍වකෘත්‍යයෝ යයි දෙශනා කරණ ලදී.

උපොසථො යාවතිකා ච භික්ඛූ
කම්මප්පත්තා සභාගාපත්තියො ච,
න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා
තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති.

උපොසථො; තීසු උපොසථදිවසෙසු චාතුද්දසී පණ්ණරසී සාමග්ගීසු අජ්ජුපොසථො පණ්ණරසො; යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා; යත්තකා භික්ඛූ තස්ස උපොසථකම්මස්ස පත්තා යුත්තා අනුරූපා සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන චත්තාරො භික්ඛූ පකතත්තා සංඝෙන අනුක්ඛිත්තා තෙ ච ඛො හත්ථපාසං අවිජහිත්වා එකසීමායං ඨිතා, සභාගාපත්තියො ච නවිජ්ජන්ති.

---

එහෙත් පුබ්බකරණ පුබ්බකිච්ච යන නම් දෙකකින් ප්‍රකාශිත නවවිධ කෘත්‍යයම පාමොක් දෙශනා කරන්ට පළමු සම්පූර්ණ කළයුතු බැවින් "පූර්වකෘත්‍යයෝ" යයි විනයත්ථමඤ්ජූසාවෙහි ප්‍රකාශිත යි.

අර්ථ:- උපොසථො, චාතුද්දසී ආදී පොහොයෙක් (වේද,) යාවතිකා ච භික්ඛූ, යම් පමණ භික්ෂූහු, (හෙවත්) යටත් පිරිසෙයින් සතර නමක් පමණ පකතත්ත භික්ෂූහු, කම්මප්පත්තා, සුත්තුද්දෙසාදි උපොසථ කර්මයන්ට ප්‍රාප්තවූවාහු (වෙද්ද); සභාගාපත්තියො ච, වස්තුසභාගාපත්තිහුදු, නවිජ්ජන්ති, විද්‍යමාන නො වෙද්ද; වජ්ජනීයාච පුග්ගලා, අත්පසින් දුරුකටයුතු වූ පුද්ගලයෝ ද; තස්මිං, එහි; න හොන්ති, නොවෙද්ද; පත්ත කල්ලන්ති වුච්චති, (මේ අඟ සතරින් යුක්ත වූ කර්මය) පැමිණි කල් ඇත්තේ යයි කියනු ලැබේ.

උපොසථො. උපොසථො යනු; චාතුද්දසී, චාතුර්දශීය; පණ්ණරසී, පූර්ණමාසීය; සාමග්ගීසු, සාමග්‍රිය යන; තීසු උපොසථදිවසෙසු උපොසථ දින තුණ අතුරෙන්; අජ්ජුපොසථො, අද පෝය; පණ්ණරසො, පූර්ණිමාය; යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා, යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා යනු; යත්තකා භික්ඛූ, යම් පමණ භික්ෂූහු; තස්ස උපොසථකම්මස්ස, ඒ උපොෂිත කර්මයට; පත්තා, පැමිණියාහු ද; යුත්තා, යෙදුනාහුද, අනුරූපා, සුදුසුවූවාහු ද, සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන, යටත් පිරිසෙයින්, ස ඝෙන, සමාන සංවාසක සංඝයා විසින්; අනුක්ඛිත්තා, උත්ක්ෂෙපණීය කර්මයෙන් බැහැර නො කරණ ලද්දවූ; පකතත්තා, එහෙයින්ම ප්‍රකෘති ස්වභාව ඇත්තා වූ; චත්තාරො භික්ඛූ, භික්ෂූහු සතර නමක් (වෙද්ද), තෙ ච ඛො, ඔව්හු ද වනාහි; හත්ථපාසං අවිජහිත්වා; අත්පස නො හැර; එකසීමායං, එක් සීමාවෙක්හි,

ඨිතා, සිටියාහුද ; සභාගාපත්තියො ච න විජ්ජන්ති, සභාගා පත්තියො ච න විජ්ජන්ති යනු; විකාල භොජනාදී, හිර අවරට ගිය කල්හි ආහාර ගැනීම් ආදී වූ; වත්ථුසභාගාපත්තියො ච, වස්තු විසින් සමාන ඇවැද්ද; න විජ්ජන්ති, නො වේද්ද; වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති, වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති යනු, ගහට්ඨ පණ්ඩකාදයො, ගෘහස්ථ පණ්ඩකාදී වූ; එකවීසති වජ්ජනීය පුග්ගලා, දුරුකටයුතු එක්විසි පුද්ගලයෝ; හත්ථපාසතො, අත්පසින්; බහි කරණවසෙන, පිට කිරීම් වශයෙන්; වජ්ජෙතබ්බා, දුරුකට යුත්තාහ. (එබන්දෝ) තස්මිං න හෙන්ති, එහි නැත්තාහුද; (එකල්හි) පත්තකල්ලන්ති වුච්චති, පත්තකල්ලන්ති වුච්චති යනු, සඞ්ඝස්ස, සංඝයාගේ; උපොසථකම්මං, උපෝෂිත කර්මය; ඉමෙහි චතූහි ලක්ඛණෙහි, මේ සිවු ලකුණෙන් සඞ්ගහිතං, සංග්‍රහ කරණ ලද්දේ; පත්තකල්ලන්ති වුච්චති පත්තකල්ලන්ති වුච්චති යී සේයි පත්තකාලවන්තං ඉති, ප්‍රාප්තකාල වත්යයි; අක්ඛාතං කියන ලදී.

පුබ්බකරණ පුබ්බකිච්චානි, පූර්ව කරණ පූර්ව කෘත්‍යයන්, සමාපෙත්වා, නිමකොට, දෙසිතාපත්තිකස්ස, ආරෝචනය කරණ ලද ඇවැත් ඇත්තාවූ, සමග්ගස්ස, සමගිවූ, භික්ඛු සඞ්ඝස්ස, භික්ෂු සංඝයාගේ, අනුමතියා, අනුමතියෙන් (කැමැත්තෙන්,) පාතිමොක්ඛං, ආඥප්‍රාතිමොක්ෂය, උද්දිසිතුං, උදෙසන්නට, ආරාධනං කරොමි, ආරාධනය කරමි.

**සංලක්ෂ්‍යය:- "උපොසථො"** යනු (උපවසන්ති එත්ථාති, උපොසථො, "උප" පූර්ව "වස" නිවාසෙ යන ධාතුව කෙරෙන් "උපවසාවසෙසා" යන සූත්‍රයෙන් "අථ" ප්‍රත්‍යය වී සිඩයි")

"සඞ්ඝො උපොසථං කරෙය්‍ය" **"ආයාම ආවුසො කප්පින උපොසථං ගමිස්සාම"** යනාදි තන්හි පාමොක් උදෙසීමෙහිද **"එවං අට්ඨඞ්ගසමන්නාගතො ඛො විසාඛෙ උපොසථො උපවුත්ථො"** යන ආදි තන්හි ශීලයෙහිද, **"සුද්ධස්ස වෙ සද ඵග්ගු සුද්ධස්සුපොසථො සද"** යනාදි තන්හි උපවාසයෙහිද, **"උපොසථො නාම නාගරාජා"** යනාදි තන්හි ප්‍රඥප්තියෙහිද **"න භික්ඛවෙ තදහුපොසථෙ"** යනාදි තන්හි උපවාස කටයුතු දිනයෙහිද වැටෙන බැවින් මෙහි "උපොසථ" ශබ්දයද පොහෝදින, යන අරුත්හි යෙදෙයි.

සාමාන්‍යයෙන් උපොසථය ත්‍රිවිධයයි කීයේ නමුදු විස්තර විසින් ඒ නව විධ වේ. ඒ මෙසේයි.

විකාල භොජනාදි වත්ථුසභාගාපත්තියො ච න විජ්ජන්ති. වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති, ගහට්ඨපණ්ඩකාදයො එකවීසති වජ්ජනීය පුග්ගලා හත්ථපාසතො බහි කරණ වසෙන වජ්ජෙතබ්බා; තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති, සඞ්ඝස්ස උපොසථ කම්මං ඉමෙහි චතූහි ලක්ඛණෙහි සඞ්ගහිතං, පත්තකල්ලන්ති වුච්චති; පත්තකාලවන්තන්ති අක්ඛාතං.

පුබ්බකරණ පුබ්බකිච්චානි සමාපෙත්වා දෙසිතාපත්තිකස්ස සමග්ගස්ස භික්ඛු සංඝස්ස අනුමතියා පාතිමොක්ඛං උද්දිසිතුං ආරාධනං කරොමි.

---

චාතුද්දසී, පණ්ණරසී, සාමග්ගී, කියා දින වශයෙන් තුනෙක්ද, සඞ්ඝෙ උපොසථො, ගණෙ උපොසථො, පුග්ගලෙ උපොසථො, කියා කාරක වශයෙන් තුනෙක් ද;

සුත්තුද්දෙසො, පාරිසුද්ධි උපොසථො, අධිට්ඨාන උපොසථො, කියා කර්තව්‍යාකාර වශයෙන් තුනෙක් දැයි මෙසේ නවවිධ වේ.

එහෙයින් අට්ඨකථාචාර්‍යයෝ:-

"දින කාරක කත්තබ්බාකාරානන්තු වසා පන,
නවෙවූපොසථා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා;

චාතුද්දසො පණ්ණරසො සාමග්ගී ච උපොසථො,
දිවසෙනෙව නිද්දිට්ඨා තයොපෙතෙ උපොසථා;

සඞ්ඝෙ උපොසථො චෙව ගණෙ පුග්ගලුපොසථො,
කාරකානං වසෙනෙව තයො වුත්තා උපොසථා;

සුත්තුද්දෙසාභිධානො ච පාරිසුද්ධි උපොසථො,
අධිට්ඨානොච නිද්දිට්ඨා තයො කම්මෙනුපොසථා;

සඞ්ඝස්ස පාතිමොක්ඛොව පාරිසුද්ධි ගණස්ස ච,
අධිට්ඨානමෙකකස්ස නිද්දිට්ඨං පන සත්ථුනා."

හෙමන්තය, ග්‍රීෂ්මය, වර්ෂාය, යන තුන් ඍතුවෙහි තුන්වැනි සත්වැනි පක්ෂයන්හි දෙකක් දෙකක් බැගින් "චාතුද්දසී" පොහෝ සයක් හා සෙසු "පූර්ණිමාසී" පොහෝ අටළොසක් දැයි; කියා එක් වර්ෂයෙක් හි උපොසථ සුවිස්සෙක් වන්නාහුය.

පැළවියෙහි පටන් "තිථි" තුදුසක් සම්පූර්ණවීමෙන් පැමිණි පොහොය "චාතුද්දසී" නම් වෙයි.

එසේම "තිථි" පසළොසක් සම්පූර්ණවීමෙන් පැමිණි පොහොය "පුර්ණමාසී" නම්.

කවද නමුත් භින්නව සිටි සංඝයාගේ සාමග්‍රිය සඳහා කරණ උපොසථය "සාමග්‍රි" උපොසථයයි.

භින්නව සිටි සඞ්ඝයා එකට පොහෝකිරීමෙන් සමගිය ඇතිවේ

සීමා විස්තරය සංක්ෂේපයෙන් මෙසේ දතයුත්තේය. සීමා තොමෝ බඩ සීමා, අබඩ සීමා යි දෙපරිදි වේ.

එකාදශ විපත් සීමාවලින් අමිශ්‍රවූ එසේම ත්‍රිවිධ සම්පත්තීන්ගෙන් යුක්ත කොට නිමිත්තෙන් නිමිත්ත සටා සම්මත කරණ ලද සීමාව "බඩසීමා" යයි කියනු ලැබේ.

**එකාදශ විපත් සීමා:-**

1. අතිඛුද්දිකා,
2. අතිමහතී,
3. ඛණ්ඩනිමිත්තා,
4. ඡායානිමිත්තා,
5. අනිමිත්තා,
6. බහිසීමෙ ඨිත සම්මතා,
7. අතිමහතී,
8. සමුද්දෙ සම්මතා,
9. ජාතස්සරෙ සම්මතා,
10. සීමාය සීමං සම්භින්දන්තෙන සම්මතා
11. සීමාය සීමං අජ්ඣොත්ථරන්තෙන සම්මතා යනුයි.

භික්ෂූන් එක්විසිදෙනෙකුට අනවකාශ සීමාව "අතිඛුද්දිකා" නම් වේ. (විසති වග්ගික සඞ්ඝයාට නොකළැකි සඞ්ඝකර්මයක් නැත්තේ නමුත් එක් විස්සකට අවකාශ ගත්තේ "කම්මාහිරා"වද අවකාශ තැබිය යුතු බැවිනි).

කෙසගක් පමණ වත් තුන්යොදුන් ඉක්මවා සම්මත කරණ ලද සීමාව "අතිමහතී" නම් වේ.

පූර්විදිශාදි සිවුදිසාවෙහි නිමිති කීර්තනය කොට නොගළපන ලද නිමිති ඇති සීමාව ද, නිමිත්තුපගත නොවන එකක් අතර නිමිති කොට සම්මත සීමාවද "ඛණ්ඩනිමිත්තා" නම් වේ. පෙරදිග සිට පිළිවෙළින් නිමිති කීර්තනය කොට නැවතත් පූර්විදිශාවෙහි නිමිත්ත කීර්තනය නොකොට කළ හෙයිනි. පර්වතච්ඡායාදීන් නිමිති කොට කළ සීමාව "ඡායානිමිත්තා" නම් වේ. නිමිති විතාරණය නොකොට කළ සීමාව "අනිමිත්තා" නම්

වේ. නිමිති කීර්තනය කොට නිමිතිවලින් පිට සිටියහු විසින් සම්මත කරණ ලද්දී "බහිසීමට්ඨිතසම්මතා" නම් වේ. නදී, සමුද්‍ර, ජාතස්සරයන්හි සම්මත කරණ ලද සීමාවෝ "නදියා සම්මතා" "සමුද්දෙ සම්මතා" "ජාතස්සරෙ සම්මතා" නම් වෙති. **"සබ්බා භික්ඛවෙ නදී අසීමා, සබ්බො සමුද්දො අසීමො. සබ්බො ජාතස්සරො අසීමො"** යි දෙශිත බැවින් නද්‍යාදියෙහි සම්මත කරණ ලද්දී නමුදු අසම්මත වේ මැයි. ස්වකීය සීමාවෙන් පරසීමාව සම්භින්දනය කොට සම්මත කළ සීමාව "සීමාය සීමං සම්භින්දනෙන සම්මතා" නම් වේ. ස්වකීය සීමාවෙන් පරකීය සීමාව අජ්ඣොත්ථරණය කොට සම්මත කළ සීමාව "සීමාය සීමං අජ්ඣොත්ථරනෙන සම්මතා" නම් වේ.

**සං:- "බද්ධසීමාව"** සිවු දිශාවෙහි හා සිවු අනුදිශාවෙහිද යලිත් පූර්වදිශාවෙහිද නිමිති විචාරා ත්‍රිවිධ සම්පත්තීන් යුක්ත කොට සම්මත කටයුත්තීය. එවිට මෙකී එකදස විපත් සීමාවලින් වෙනස් වූ හෙයින් හා ත්‍රිවිධ සම්පත්තිවලින් යුක්තවූ හෙයින් පිරිසිදු වේ.

**සං:- "ත්‍රිවිධසම්පත්ති"** නිමිත්ත සම්පත්ති, පරිසසම්පත්ති, කම්මවාචා සම්පත්ති යනුයි.

| | |
|---|---|
| 1. පබ්බත නිමිත්තං | 5. මග්ග නිමිත්තං |
| 2. පාසාණ නිමිත්තං | 6. වම්මික නිමිත්තං |
| 3. වන නිමිත්තං | 7. නදී නිමිත්තං |
| 4. රුක්ඛ නිමිත්තං | 8. උදක නිමිත්තං යි |

මෙකී අෂ්ටවිධ නිමිති පිරිපුන් කල්හි "නිමිත්ත සම්පත්තියෙන් යුක්ත වේ. මේ නිමිති අටෙන් කැමති එකක් නිමිති වශයෙන් ප්‍රකාශ කළ හැකි වේ.

සබ්බන්තිම පරිච්ඡේදයෙන් චාතුර්වර්ගික සඞ්ඝයා රැස්ව ඒ ග්‍රාම ක්ෂෙත්‍රයෙහි බද්ධසීමාවක් හෝ නදී සමුද්‍ර ජාතස්සර සීමාවන් හෝ ආක්‍රමණය නොකොට සිටියාවූ සියලු භික්ෂූන් අත්පස්හි කොට ගෙණ ඡන්දහරණයට යොග්‍යවූවන්ගේ ඡන්දය ලබා ගෙණ සම්මත කරණ ලද සීමාව පරිසසම්පත්තියෙන් යුක්ත වේ.

**"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො එතෙහි නිමිත්තෙහි**

**සීමං සම්මන්නෙය්‍ය සමානසංවාසං එකූපොසථං"** යනාදි ඥත්ති දුතිය කම් වාක්‍යයෙන් සම්මත කරණ ලද සීමාව කම්මවාචා සම්පත්තියෙන් යුක්ත වේ.

ඛණ්ඩ සීමා, සමාන සංවාස සීමා, අවිප්පවාස සීමා, යනුද බධ සීමාව පිළිබඳ ප්‍රභෙදයෝ වෙති.

ගාම සීමා, සත්තබ්භන්තර සීමා උදකුක්ඛෙප සීමා, කියා "අබධ සීමාව ත්‍රිවිධ වෙයි. එක ග්‍රාමක්ෂෙත්‍රයෙක දිග පුළුල යම් පමණ නම් එ පමණ ම ගාමසීමාව වේ.

නොගම්හිවූ ආරණ්‍යයෙහි සංඝයා සිටි ස්ථානයෙහි හාත්පස සත්තබ්භන්තරයෙක් ඇත්තේ "සත්තබ්භන්තර සීමා" නම් වේ. මෙහි එක් අබ්භන්තරයෙක් අටවිසිරියනක් පමණ යයි දත යුත්තේය. මැද සිට හාත්පසින්ම මෙවැනි අබ්භන්තර සතක් සතක් ගත යුත්තාහුය.

නදී ආදියෙහි සුප්‍රතිෂ්ඨිත සීමාමාලකයෙක්හි හෝ එවෙලාවට පිළියෙළ කරගත් ඔරු පාරු ආදියෙක්හි හෝ සඞ්ඝයා රැස්ව මධ්‍යම පුරුෂයෙකුගේ අතින් පෙරදිග සිට සිවුදිගට පිළිවෙළින් ජලය විසි කොට නැවතත් පෙරදිගට වීසිකොට පිළියෙළ කරගත් සීමාව "උදකුක්ඛෙප සීමාව" යයි දත යුතුයි.

සං:- **"සභාගාපත්තියො ච න විජ්ජන්ති"** මෙයින් ප්‍රකාශිත සභාගාපත්තිහු නම් තත්‍රස්ථ සියලුම සංඝයා විකාල භොජනාදි සමාන වස්තුවක් (කරුණක්) නිසා පැමිණි ආපත්තීහු වෙති. සභාගාපත්ති දෙශනා කිරීමෙන් දෙශකයාද පිළිගැනීමෙන් ප්‍රතිග්‍රාහකයා දූයි යන දෙදෙනම දුකුළා ඇවතට පැමිණෙති. එබැවින් එක් භික්ෂුවක් සමීපස්ථ ආවාසයකට යවා ඇවැත් දෙසාගෙණ එන්නට නියම කොට ඔහු සමීපයෙහි සෙස්සන් විසින් ඇවැත් දෙසනා කටයුතුයි. සභාගාපත්තිකයෝ ද දෙවරක් ඇවැත් දෙසීමෙන් පිරිසිදු වූවෝ වෙති.

සං:- **"වජ්ජනියා ච පුග්ගලා"** වර්ජනීය පුද්ගලයෝ නම් ගෘහස්ථාදීහුයි. ගෘහස්ථ (ගිහි) ආදීවූ එක්විසි පුහුලෝ පාමොක් උදෙසන්ට පළමු සීමාභ්‍යන්තරයෙන් ඉවත් කළ යුත්තෝයි. **"න භික්ඛවෙ ගහට්ඨාය පරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං"** යනාදීන් දෙශිත හෙයිනි.

## වජ්ජනීය පුද්ගලයෝ නම්.

1. ගහට්ඨො
2. භික්ඛුනී
3. සික්ඛමානා
4. සාමණෙරො
5. සාමණෙරී
6. සික්ඛං පච්චක්ඛාතකො
7. අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො
8. ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො
9. ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො
10. පාපිකාය දිට්ඨියා අප්පටි නිස්සග්ගෙ උක්ඛිත්තකො
11. පණ්ඩකො
12. ථෙය්‍ය සංවාසකො
13. තිත්ථියපක්කන්තකො
14. තිරච්ඡානගතො
15. .මාතුඝාතකො
16. පිතුඝාතකො
17. අරහන්තඝාතකො
18. භික්ඛුනී දූසකො
19. සඞ්ඝභෙදකො
20. ලොහිතුප්පාදකො
21. උභතොබ්‍යඤ්ජනකො

මෙහි ප්‍රකාශිත වර්‍ජනීය පිරිසෙහිවූ ත්‍රිවිධ උක්ඛිත්තකයන් සමග පාමොක් උදෙසන සඞ්ඝතෙම "පචිති" ඇවතට පැමිණෙන්නේය.

සෙසු අටළොස් පුහුලන්ගෙන් යුත් පිරිසෙහි පාමොක් උදෙසන සඞ්ඝතෙමේ "දුකුළා" ඇවතට පැමිණෙන්නේය.

## පූර්වකරණ පූර්වකෘත්‍යයෝ කියා නිමවන ලද්දහ.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අජ්ජුපොසථො පණ්ණරසො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො උපොසථං කරෙය්‍ය පාති මොක්ඛං උද්දිසෙය්‍ය.

---

**අර්ථ:-** "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො උජ්ජුපොසථො පණ්ණරසො-" භන්තෙ, වහන්ස ; සඞ්ඝො, සඞ්ඝ තෙම; මේ, මා කියන්නක්; සුණාතු, , අසාවා ; අජ්ජ, අද ; පණ්ණරසො උපොසථො, පුණු රැසි පොහෝ දවසය ; "යදි සඞ්ඝස්ස -පෙ- උද්දිසෙය්‍ය" සඞ්ඝස්ස, සඞ්ඝයාගේ (උපොෂිත කර්මය;) යදි, ඉදින්; පත්තකල්ලං, ප්‍රාප්ත කල් ඇත්තේ වී නම්; සඞ්ඝො, සඞ්ඝතෙම; උපොසථං කරෙය්‍ය, පොහෝ කරන්නේය; පාතිමොක්ඛං උද්දි උද්දිසෙය්‍ය, පාමොක් උදෙසන්නේයි.

**සං:-** සුණාතු මෙ භන්තෙ සඞ්ඝො -පෙ-උද්දිසෙය්‍ය, යනු පාමොක් දෙශනාරම්භයේ දී දෙශක භික්ෂූහු විසින් ප්‍රකාශ කළ යුතු "ඤත්ති"වාක්‍යය වේ.

**සං:-** **"සුණාතු"** යන්නෙන් පාමොක් ශ්‍රවණය කිරීමට අණ කෙරෙයි.

එබැවින් "සුණාතු" යනු සවණාණත්තික ආඛ්‍යාත පදය වේ.

මේ පදයෙන් උක්තවූයේ "සඞ්ඝො" යනුයි.

**සං:-** **"සඞ්ඝො"** යනු සං පූර්ව "හන" (හිංසායං) යන ධාතුවට "සංහනඤ්ඤාය වා රො ඝො" යන සූත්‍රයෙන් ඝකාරා දෙශ වී සිද්ධවූ කෘදන්ත නාමයෙකි. සඞ්ඝයා වනුයේ යටත් පිරිසෙයින් සතර දෙනෙකුගෙනි.

**සං:-** **"අජ්ජුපොසථො"** මෙයින් අනුපොසථය ප්‍රතික්ෂෙප කෙරෙයි.

**සං:-** **"පණ්ණරසො"** යී පුණුරැසියම අපෙක්ෂිතය.

චාතුද්දසී උපොසථය වුවහොත් "අජ්ජුපොසථො චාතුද්දසො" කියාද, සාමග්ගි උපොසථයක් වුව හොත් "අජ්ජුපොසථො සාමග්ගී" කියාද යොද ඤත්ති ස්ථාපනය කට යුත්තේය.

**සං:-** **"පත්තකල්ලං"** පත්තො කාලො ඉමස්ස කම්මස්සා ති: පත්තකාලං, පත්තකාලමෙව, **"පත්තකල්ලං"** (ස්වාර්ථයෙහි භාව

ප්‍රත්‍යයයි.) මෙයින් ප්‍රකාශිත ප්‍රාප්ත කාලය වනාහි උපොසථ කිං සඞ්ඝස්ස පුබ්බකිච්චං? පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථ පාති මොක්ඛං උද්දිසිස්සාමි, තං සබ්බෙව සන්තා සාධුකං සුණොම මනසි කරොම, යස්ස සියා ආපත්ති සො ආවිකරෙය්‍ය, අසන්තියා ආපත්තියා තුණ්හී භවිතබ්බං තුණ්හීභාවෙන බො පනායස්මන්තෙ පරිසුද්ධාති වෙදිස්සාමි.

---

දිනය, කම් ප්‍රාප්ත භික්ෂූහුය, විකාලභොජනාදි සභාගාපත්ති නොමැතිවීමය, සීමාභ්‍යන්තරයෙහි ගහට්ඨ පණ්ඩකාදී වර්ජනීය පුහුලන් අවිද්‍යමානත්වය යන සිවු අඟින් යුක්තය.

එහෙයින් :-

"උපොසථො යාවතිකා ච භික්ඛූ
කම්මප්පත්තා සභාගාපත්තියො ච,
න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා
තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති"යි කීහු.

**සං:- "සඞ්ඝො"** යනු දක්ෂිණාර්හ සඞ්ඝයාය, සම්මුති සඞ්ඝයා යයි විවිධ වේ. අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සඞ්ඝයා ශ්‍රද්ධාවතුන්ගේ දක්ෂිණාවන්ට පාත්‍ර වූ බැවින් "දක්ෂිණාර්හසඞ්ඝ" යයිද, සාමාන්‍ය භික්ෂු සන්තතිය "සම්මුති සඞ්ඝයා " යයිද සැලකිය යුත්තේය.

චතුවග්ගො - පඤ්චවග්ගො - දසවග්ගො - වීසතිවග්ගො - අතිරෙක වීසතිවග්ගො යි, සම්මුති සඞ්ඝතෙම පඤ්ච විධ වේ.

උපසම්පද, පවාරණ, අබ්භාහන යන ගරු විනය කම් ත්‍රයය හැර තදන්‍ය සංඝකම් කිරීමට චාතුර්වර්ගික සංඝතෙම පොහොනේය.

මධ්‍යම ජනපදයෙහි උපසම්පද, අබ්භාහන යන ගරු විනය කම්ද්වය ය හැර සෙසු සංඝ කම් කිරීමට පඤ්ච වර්ගීය සංඝයා පොහොනේය. දසවග්ගික, වීසති වග්ගික, අතිරෙක වීසති වග්ගික, සංඝයාට නො කළැකි සංඝ කම්යෝ නොමැත්තාහුය.

**සං:- "පාතිමොක්ඛං"** යි (අතිමොක්ඛං- අතිපමොක්ඛං- අතිසෙට්ඨං- අතිඋත්තමං ) කියා අත්ථ කථාවෙහි ප්‍රභෙද වශයෙන් හා අර්ථ වශයෙන් වර්ණනා කෙරෙති. මේ වනාහි ශීලප්‍රාති මොක්ෂය, ග්‍රන්ථ ප්‍රාතිමොක්ෂයයි දෙපරිදි වේ. එයින් ග්‍රන්ථ ප්‍රාතිමොක්ෂය භික්ෂු ප්‍රාතිමොක්ෂය, භික්ෂුණී ප්‍රාතිමොක්ෂ යයි ද්විධ වේ.

**"පාතිමොක්ඛ සංවර සංවුතො විහරති"** යන ආදි තන්හි ශීල ප්‍රාතිමොක්ෂයද **"උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති"** යන ආදි තන්හි "ග්‍රන්ථ ප්‍රාතිමොක්ෂය ද කිය වෙති.

යමෙක් සීලය මොනවට රකී ද, ඔහු ආපායික දුක්වලින් හා ආත්මානුවාදදි භය වලින් මුදන නිසා ශීලයට "ප්‍රාතිමොක්ෂ" යයි ද; ඒ ශීල ප්‍රාතිමොක්ෂය ප්‍රකට කොට දක්වෙන හෙයින් උපචාර වශයෙන් ග්‍රන්ථයටත් "ප්‍රාතිමොක්ෂ යයි ව්‍යවහාර කෙරෙති.

කිං සඞ්ඝස්ස පුබ්බකිච්චං:- සංඝස්ස, (පොහෝකරණ) සඞ්ඝයාගේ: පුබ්බකිච්චං, (සම්මජ්ජනාදිවූ) නව විධ පූර්වකෘත්‍යය: කිං (කිම) කරණ ලදද? "පාරිසුඞ්ඪිං ආයස්මන්තො-පෙ-උද්දිසිස්සාමි-ආයස්මන්තො, ආයුෂ්මත්නි; පාරිසුඞ්ඪිං, (තොපගේ) පිරිසිදු බව: ආරොචෙථ, කියව්: පාතිමොක්ඛං, පාමොක් උද්දිසිස්සාමි, උදෙසන්නෙමි. තං, ඒ පාමොක්: සබ්බෙව සන්තා, (මේ පිරිසෙහි ඇති අපි හැම දෙනම:, සාධුකං, සකස් කොට: සුණොම, අසමු: මනසි කරොම, සිත්හි කරමු.

යස්ස සියා ආපත්ති-පෙ- තුණ්හී භවිතබ්බං:- යස්ස, (ස්ථවිර නවක මධ්‍යමයන් අතුරෙන්) යමෙක් හට: ආපත්ති, ඇවතක්; සියා, ඇත් නම්; සො, හෙතෙම; ආවීකරෙය්‍ය, (ආපත්තිය) ප්‍රකාශ කරන්නේය. අසන්තියා ආපත්තියා, ඇවතක් නැති කල්හි; තුණ්හීභවිතබ්බං, නිශ්ශබ්ද විය යුත්තේය. "තුණ්හී භාවෙන ඛො පනායස්මන්තෙ පරිසුද්ධාති වෙදිස්සාමි, තුණ්හී භාවෙන ඛො පන, නො බිණීම හෙතු කොට ගෙණ වනාහි; ආයස්මන්තෙ, ඇවතුන්, පරිසුද්ධාති, පිරිසිදුහයි (ම); වෙදිස්සාමි, දැනගන්නෙමි.

**සංලක්ෂ්‍යය:-**

**"කිං සංඝස්ස පුබ්බකිච්චං"** යී වියූ තන්හි "කතං" යන කෘදන්ත ක්‍රියාවක් අර්ථ වශයෙන් අපෙක්ෂිතයි.

සං:- **"පාරිසුඞ්ඪි"** පාමොක් උදෙසන්ට මත්තෙන් සජ්ඣා පත්ති ස්කන්ධයන් ගෙන් තම තමන්ගේ පිරිසුදු බව ප්‍රකාශ කටයුත්තේය. **"න හිකඛවෙ සාපත්තිකෙන පාතිමොක්ඛං සොතබ්බං, යො සුණෙය්‍ය ආපත්ති දුක්කටස්ස"** යි දෙශිත බැවිනි.

යථා ඛො පන පච්චෙකපුට්ඨස්ස වෙය්‍යාකරණං හොති, එවමෙවං එවරූපාය පරිසාය යාවතතියං අනුසාවිතං හොති. යො පන භික්ඛු යාවතතියං අනුසාවියමානෙ සරමානො සන්තිං ආපත්තිං නාවිකරෙය්‍ය, සම්පජානමුසාවාදස්ස හොති. සම්පජාන මුසාවාදෙ ඛො පනායස්මන්තො අන්තරායිකො ධම්මො වුත්තො භගවතා, තස්මා සරමානෙන භික්ඛුනා ආපන්නෙන විසුද්ධා පෙක්ඛෙන සන්තී ආපත්ති ආවීකාතබ්බා, ආවීකතාහිස්ස ඵාසු හොති.

---

සං:- **"සුණොම"** මෙහි "සුණාථ" කියා පැවසිය යුතු වුවාක් මෙන් හැඟෙතත් එසේ නොයෙදේ. සමඟි සංඝයාගේ පොහෝ කිරීමෙහි දී දෙශකයා ද සංඝ පර්‍යාපන්න බැවින් සුණොම. මනසිකරොම, යයි යෙදීම යොග්‍යතර වේ.

සං:- **"යස්ස සියා ආපත්ති"** යම්කිසි භික්ෂුවක්හට අලජ්ජිතා, අඤ්ඤාණතා; කුක්කුච්චපකතා; අකප්පියෙ කප්පියසඤ්ඤිතා; කප්පියෙ අකප්පියසඤ්ඤිතා, සතිසම්මොසා යන ෂඩාකාරයෙන් එක්තරා අයුරකින් අවන් ඇවැත් වෙත් නම් නො වළහා කිය යුත්තාහුය.

**අර්ථ:-** "යථා ඛො පන -පෙ- ආපත්ති ආවීකාතබ්බා" යථා ඛො පන, යම්සේ වනාහි, පච්චෙකපුට්ඨස්ස, වෙන් වෙන් කොට විචාරණ ලද්දහුගේ; වෙය්‍යාකරණං හොති, (මෙතෙම මා විචාරන්නේ යයි දන විචාළ ද කිම වේද;) එවමෙවං එසෙයින් ම; එවරූපාය පරිසාය, මෙබඳු (භික්ෂු) පර්ෂත්හි; යාවතතියං, තුන් යලක්; අනුසාවිතං හොති, අනුසාවනය කරණ ලද්දේ වෙයි. යො පන භික්ඛු, යම්කිසි මහණෙක්; යාවතතියං තුන් යලක්; අනුසාවියමානෙ, අස්වන කල්හි; සන්තිං අපත්තිං, (තමා කෙරෙහි) ඇති ඇවත; සරමානො, සිහි කරන්නේ; නාවීකරෙය්‍ය, පහළ නොකෙරේ නම්; අස්ස, ඕහට; සම්පජාන මුසාවාදෙ, (අනාවීකරණ සඞ්ඛ්‍යාත) සම්පජාන මුසාවාදය; හොති, වෙයි. ආයස්මන්තො, ඇවැත්නි; සම්පජාන මුසාවාදෙ ඛො පන, සම්පජාන මුසාවාදය වනාහි; භගවතා, භගවත්හු විසින්; අන්තරායිකො ධම්මො, (ප්‍රථමධ්‍යානාදීන්ගේ ප්‍රතිලාභයට); අන්තරායකර ධර්මයෙකැයි; වුත්තො, වදරණ ලදි.

තස්මා, එහෙයින්; ආපන්නෙන (ආපත්තියකට) අවන් වූ; සරමානෙන, ඒ සිහි කරන්නාවූ, විසුද්ධාපෙක්ඛෙන, විසුද්ධිය (පිරිසුදු බව) අපෙක්ෂාකරන්නාවූ; භික්ඛුනා, භික්ෂූහු විසින්;

උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං, තත්ථායස්මන්තෙ පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

**නිදානුද්දෙසො.**

---

සන්ති ආපත්ති, (නොදෙසූ බැවින් විද්‍යමානවූ)ආපත්ති තොම: ආවිකාතබ්බා,(සංඝ, ගණ පුද්ගලයන් කෙරෙහි ප්‍රකාශ කටයුත්තීය: ආවිකතාහි, ප්‍රකාශ කරණ ලද ආපත්තිය හෙතුකොට ගෙණ වනාහී; අස්ස, ඒ භික්ෂූහට; ඵාසු හොති, (ප්‍රථමධ්‍යානාදීන්ගේ අධිගමය පිණිස) පහසු වේ.

ආයස්මන්තො, ආයුෂ්මත්නි; නිදානං, නිදානය; උද්දිට්ඨං ඛො, උදෙසන ලද්දේමය; තත්ථ, එහි ලා; ආයස්මන්තෙ, ආයුෂ්මතුන්; පුච්ඡාමි, විචාරමි; කච්චි, කිම; එත්ථ, මෙහි ලා; පරිසුද්ධා, පිරිසිදු ද? නොහොත් කච්චි කිම; පරිසුද්ධා අත්ථ, පිරිසිදුවහු ද? දුතියම්පි, දෙවනුවත්: පුච්ඡාමි, විචාරමි: -පෙ-තතියම්පි, තුන් වෙනුවත්, -පෙ-එත්ථ, මෙහි ලා; ආයස්මන්තො, ආයුෂ්මත්හු; පරිසුද්ධා, පිරිසිදුහ; තස්මා, එහෙයින්; තුන්හී, නිශ්ශබ්ද භාවය වෙයි. එතං; මේ නිශ්ශබ්ද භාවය; එවං, මෙසේ; ධාරයාමි ඉති, දරමි යනුයි.

සං:- **"යථා ඛො පන -පෙ- වෙය්‍යාකරණං හොති"** වෙන් වෙන් වශයෙන් විචාරණ ලද කල්හි යම්සේ ප්‍රකාශ කෙරේ නම් එසේ ම මෙතෙම මාගෙන් ම විචාරයි කියා චින්තනය කොට ප්‍රකාශ කටයුතුයි යනු භාවයි.

සං:- **"යාවතතියං අනුසාවිතං හොති"** මෙහි "යාවතතියං" යනු නිදානොද්දෙශයෙහි යාව තතියානුසාවණයක් අවිද්‍යමාන බැවින් ලක්ෂණවාඩිමාත්‍රයෙක් යයි දක්විත. මේ ප්‍රාතිමොක්ෂය තුන් යලක් අනුසාවණය කරණු ලැබේ. ඒ යාව තතියානුසාවණය කරණ කල්හි යමෙක් සිහි කොට ඇති ඇවැත් පහළ නොකළ හොත් ඕහට යාව තතියානුසාවණයාගේ අවසානයෙහිදී සම්පජාන මුසාවාදය වේ යනු අදහසයි. **"තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා"** යනාදීන් අනුසාවණය කරණ අයුරු පරාජිකකාණ්ඩාවසානයෙහි දක්වේ.

සං:- **"සම්පජානමුසාවාදස්ස හොති"** යාවතතියානුසාවණය කළ කල්හි සීමස්ථ ස්ථවිර මධ්‍යම නවකයන් අතුරෙන් යමෙක් ඇති ඇවැත් නො පහළ කෙළේ නම් ඕහට තුන්වන අනුසාවණයාගේ කෙළවර සම්පජාන මුසාවාදයෙන් වන ඇවැත වේ. වාග්ද්වාරයෙන් වෙන මේ ඇවැත කථා නොකිරීමෙන් ද, වේ. සීමස්ථ සංඝයා මධ්‍යයෙහි අනුසාවණය කළ කල්හි ඇවැත් ඇත්තෙක් නිශ්ශබ්දව සිටී නම් සම්පජාන මුසාවාදය වේ. කියා කී බැවිනි. මේ මුසාවාද ලක්‍ෂණයෙන් තොර වුවද තථාගත වචනයෙන් වාග්ද්වාරයෙහි අක්‍රියා සමුට්ඨාන මුසාවාද ඇවතෙකි.

ඒ මෙසේයි

"අනාලපන්තො මනුජේන කෙනචි
වාචා ගිරං නො ච පරෙ භණෙය්‍ය
ආපජ්ජෙය්‍ය වාචසිකං න කායිකං
පඤ්හා මෙසා කුසලෙහි චින්තිතා ති".

සං:- **"අන්තරායිකො"** දුෂ්කෘතාපත්තිය ද, විපිළිසර ඇති කරණ බැවින් ප්‍රීතිය හා ප්‍රථමධ්‍යානාදීන්ගේ අධිගමය ද වළක්වයි.

සං:- **"ආවිකාතබ්බා"** මෙකී ආවිෂ්කරණය සංඝයා මැද හෝ පුද්ගලයෙකු ලඟ හෝ ප්‍රකාශ කටයුතු. යටත් පිරිසෙයින් ආසන්නයෙහිවූ මහණහට හෝ **"අහං ආවුසො ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො ඉතො වුට්ඨහිත්වා තං ආපත්තිං පටිකරිස්සාමී"යි** ප්‍රකාශ කටයුතුයි. ඇවතක් ගැණ වෙමතික නම් ඒ බැව් ද දන්විය යුත්තේය.

සං:- **"ආවිකතාහිස්ස ඵාසු හොති"** විද්‍යමාන ඇවැත් කියන ලද අයුරින් ආවිෂ්කරණයෙන් ශුධිය ලැබේ. නිදුකින් ප්‍රථමධ්‍යානාදියට ද පැමිණේ. එබඳු භික්ෂුතෙම විමුක්ති සුව ලබන්නේය.

**භික්ෂු ප්‍රාතිමොක්ෂයෙහි නිදාන**

**වර්ණනාව නිමි.**

තත්‍රිමෙ චත්තාරො පාරාජිකා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. යො පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය අන්තමසො තිරච්ඡානගතාය පි පාරාජිකො හොති අසංවාසො.

---

**අර්ථ:-** "තත්‍රිමෙ-පෙ-ආගච්ඡන්ති" තත්‍ර-ඒ (පාතිමොක්ඛං උද්දිසිස්සාමි යි ප්‍රතිඥාත) ප්‍රාතිමොක්‍ෂයෙහි ; ඉමෙ චත්තාරො පාරාජිකා ධම්මා, මේ සතර පාරාජිකාපත්තීහු; උද්දෙසං, (තමතමන්ගේ ස්වරූපයෙන්) උදෙසිය යුතු බවට, ආගච්ඡන්ති, පැමිණෙත්.

යො පන භික්ඛු, යම්කිසි මහණෙක් තෙම; භික්ඛූනං, භික්‍ෂූන්ගේ; සික්ඛාසාජීවසමාපන්නො, (අධිශීල සඞ්ඛ්‍යාත) ශික්‍ෂාවට හා (ප්‍රඥප්ත ශික්‍ෂා පද සංඛ්‍යාත) සාජීවයට පැමිණියේ; සික්ඛං, (ප්‍රාතිමොක්‍ෂ සංවර සංඛ්‍යාත) ශික්‍ෂාව; අපච්චක්ඛාය, (බුද්ධං පච්චක්ඛාමි" යනාදීන්) ප්‍රත්‍යාඛ්‍යානය නො කොට; දුබ්බල්‍යං, (දුක්කරං යාවජීවං එකභත්තං එකසෙය්‍යං" යන ආදීන් සාජීවයෙහි) දුර්වල බව; අනාවිකත්වා, පහළ නො කොට; අන්තමසො, යටත් පිරිසෙයින් ; තිරච්ඡාන ගතාය 'පි, තිරිසන් ගිය මාගමක හා ද; මෙථුනං ධම්මං, මෛථුන් දම්; පතිසෙවෙය්‍ය, සෙවියේ වී නම්; පාරාජිකො, (කෙලෙස් සතුරන් විසින් ) පරදවන ලද්දේ; අසංවාසො, (පුවතක් මහණුන්ගේ එක කර්මාදි සංවාසය තමා හා සමග නැති බැවින් ) සංවාසය නැත්තෙක්; හොති, වේ.

**සං:-** **"චත්තාරො"** යනු ( පාරාජිකාපත්තීන් සතරට අඩුනොවන බැවිනුත් වැඩි නොවන බැවිනුත් ) ගණන් පිරිසිඳීමයි. මෙහි "පාරාජික" යනු ස්වජාති නාමයයි, "ආපත්ති" යනු සියලු ආපත්තීන්ට සාධාරණ හෙයින් "සර්වසාධාරණ" නමෙ.ි.

**සං:-** **"උද්දෙසං ආගච්ඡන්ති"**යි ස්වරූපයෙන් උදෙසිය යුතු බවට පැමිණෙතියි යන අර්ථයි. (උද්දිසීයතීති, උද්දෙසො, පුමලිඞ්ගයි.)

**සං:-** **"යො"** යනු අනියමාර්ථද්‍යොතක සර්වනාමයෙකි. එහෙයින් යම් කිසිවෙක් ලිඞ්ග, නාම, ජාති, ගොත්ත, සීල, විහාර, ගොචර. වය, යන ආදි එක්තරා අයුරකින් ප්‍රකට ව පෙණෙයි ද, හේ මෙයින් අපෙක්‍ෂිතය.

සං:- **"භික්ඛු"** භික්ඛතීති, භික්ඛු; භික්ඛාචරියං අජ්ඣුපගතොති; භික්ඛු; භින්නපටධරොති; භික්ඛු, යි නිරුක්ති වශයෙන් ද, සමඤ්ඤාය; භික්ඛු, පටිඤ්ඤාය; භික්ඛු'යි අභිලාපන වශයෙන් ද, එහි භික්ඛූති, භික්ඛු, තිහි සරණගමනෙහි උපසම්පන්නොති, භික්ඛු,යි එහි භික්ෂු සරණ ගමන උපසම්පත්ති වශයෙන් ද, භද්‍රො, භික්ඛු; සාරො, භික්ඛු; සෙඛො, භික්ඛු; අසෙඛො, භික්ඛුයි සර්වෝත්කෘෂ්ට ගුණ වශයෙන් ද, නිදර්ශිත බැවින් "භික්ඛු" ශබ්දයාගේ ව්‍යවහාරය පෙලෙහි විවිධාර්ථා පෙක්ෂාවෙන් බැව් සැලකිය යුතු වේ.

මෙහි "භික්ඛු" යන්නෙන් අෂ්ට විධ උපසම්පදවන් අතුරෙන් අකොප්‍ය වූ ඥප්තිචතුර්ථ කර්මයෙන් උපසපන් භික්ෂුව ම ගැණෙයි.

**අෂ්ටවිධ උපසම්පද නම්:-**

| | |
|---|---|
| 1. එහි භික්ඛු උපසම්පද | 5. ගරු ධම්ම පටිග්ගහණ උපසම්පද |
| 2. සරණගමන ,, | 6. දූතෙන ,, |
| 3. ඔවාදපටිග්ගහණ ,, | 7. අට්ඨ වාචික ,, |
| 4. පඤ්හබ්‍යාකරණ ,, | 8. ඤත්තිචතුත්ථ කම්ම උපසම්පද කියායි. |

මෙයින් මෙකල කරුණු ලබන්නේ "ඥප්ති චතුර්ථ කර්ම" උපසම්පත්තියයි.

සං:- **"සික්ඛා සාජීව සමාපන්නො"** සික්ඛිතබ්බාති, සික්ඛා; (අධිශීල ශික්ෂා සංඛ්‍යාත ප්‍රාතිමෝක්ෂ ශීල යයි) සහ ජීවන්ති එත්ථාති, සාජීවං. ("සහ" ශබ්දයට "ස" ආදෙශයයි ප්‍රඥප්ත ශික්ෂායි. සික්ඛා ච සාජීවඤ්ච, සික්ඛා සාජීවං (ද්වන්ද සමාසයයි) සික්ඛා සාජීවං සමාපන්නො; සික්ඛා සාජීවසමාපන්නො (ද්විතීයා තත්පුරුෂ සමාසයයි.)

අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥ'යි ශික්ෂාත්‍රයයෙකි. එයින් මෙහි අපෙක්ෂිතවූයේ අධිශීල සංඛ්‍යාත ප්‍රාතිමෝක්ෂ ශික්ෂා යි. මේ ශික්ෂාවන්ට සම්‍යක් ප්‍රතිපන්නවූයේ "සික්ඛාසාජීව සමාපන්න" නම්.

සංඝ කර්මය කොප්‍යනොවන පරිදි:- වත්ථු සම්පත්ති, ඤත්ති සම්පත්ති, අනුසාවණ සම්පත්ති, සීමාසම්පත්ති, පරිස සම්පත්ති, යන පඤ්ච ප්‍රකාර සම්පත්තීන් පිරිපුන් කල්හි සංඝ කර්මය කොප්‍ය නො වේ. එසේ ම ස්ථානාර්හ වේ.

උනු විසිවස් පුහුලා ද, අන්තිම වස්තු සංඛ්‍යාත පරිජි අවන් පුහුලා ද, පණ්ඩකාදි එකාදශ අභව්‍ය පුහුලන් ද, හැර උපසම්පද කර්මාර්හ පුද්ගලයා "වස්තුසම්පත්ති" නම් වේ.

## එකාදශ අභව්‍ය පුද්ගලයෝ

1. පණ්ඩකො
2. ථෙය්‍ය සංවාසකො
3. තිත්ථිය පක්කන්තකො
4. අරහන්තඝාතකො
5. සංඝභෙදකො
6. තිරච්ඡානගතො
7. මාතුඝාතකො
8. පිතුඝාතකො
9. භික්ඛුණී දූසකො
10. ලොහිතුප්පාදකො
11. උභතොබ්‍යඤ්ජනකො

යන එකොළොස් දෙනා වෙති.

ආසිත්ත පණ්ඩක, උසූය පණ්ඩක, ඔපක්කමික පණ්ඩක, නපුංසක පණ්ඩක, පක්ඛ පණ්ඩක, යන පඤ්ච පණ්ඩකයන් අතුරෙන් ආසිත්ත පණ්ඩක, උසූය පණ්ඩක, යන දෙදෙනා හැර සෙස්සෝ මෙහිලා "පණ්ඩකො" යන්නෙන් ගතයුත්තාහුය.

ලිඞ්ගත්ථෙනකො, සංවාසත්ථෙනකො යී "ථෙය්‍ය සංවාසක තෙමේ ද ත්‍රිවිධ වේ. මෙකී තිදෙනා ම මෙහි ලා ගැණෙති.

සං:- **"ඤත්තිසම්පත්ති"** වත්ථු අපරාමසන, සංඝ අපරාමසන, පුග්ගල අපරාමසන, ඤත්ති අපරාමසන, පච්ඡාඤත්ති ඨපන, යන පංචවිධ ඥප්තිදෙෂාපගත වූ සුපරිශුධ ඥප්තිය කීර්තනය කිරීම "ඥප්ති සම්පත්ති" නම් වේ. උපසම්පදාපෙක්ඛයාගේ නාමය නොකියා හැරීම "වත්ථු අපරාමසනය"යි ද "සුණාතු මෙ භන්තෙ සංඝො"යන ආදියෙහි "සුණාතු මෙ භන්තෙ"යි කියා "සඞ්ඝො"යි නොකියා හැරීම "සඞ්ඝ අපරාමසන" යයි ද, උපාධ්‍යායයන්ගේ නම අකීර්තනය "පුග්ගලඅපරාමසන" යයි ද, ඥප්තිවාක්‍යය පිරිපුන් කොට නොකියා හැරීම "ඤත්ති අපරාමසන" යයි ද, කර්ම වාක්‍යය පළමු කොට දෙශනා කොට අනතුරුව "ඥප්තිය" දෙශනා කිරීම "පච්ඡාඤත්තිඨපනය" යයි ද සැලකිය යුතු.

සං:- **"අනුසාවණ සම්පත්ති"** වත්ථු අපරාමසන, සංඝ අපරාමසන, පුග්ගල අපරාමසන, සාවණං හාපන අකාලසාවණං, යන පංච ප්‍රකාර අනුසාවණ දෙසින් විනිර්මුක්තවූවා "අනුසාවණ සම්පත්ති" නම්.

සං:- **"සීමාසම්පත්ති"** පළමු ප්‍රකාශිත විපත් සීමාවලින් විනිර්මුක්ත කොට පිරිසිදු සේ සම්මත සීමාව "සීමාසම්පත්ති" නම් වේ.

සං:- **"පරිසසම්පත්ති"** එකකර්‍මප්‍රාප්ත භික්‍ෂුන් අත්පසට නො එළඹීම, ඡන්දහරණය නොකිරීම, රාශිභූත භික්‍ෂූන්ගේ ප්‍රතික්‍රෝශනය යන, (පක්‍ෂීත් පිළිබඳ) ත්‍රිවිධදෝෂාපගත වූ කර්‍ම ප්‍රාප්ත භික්‍ෂුසංඝයා "පරිස සම්පත්ති" නම් වේ.

සං:- **"සික්ඛං අපච්චක්ඛාය"** මෙය වනාහි කෙළිසෙල්ලම් ආදිය පිණිස නොව අධිශීල සංඛ්‍යාත ශික්‍ෂා විජහනය (උපසම්පදව දුරුකිරීම) කරණු රිසියෙන් ම ශාසනොත්කණ්ඨිත මහණහු විසින් තෙමේ යම් කිසි ශික්‍ෂාවකින් සමන්විත නම් එය ප්‍රතික්‍ෂේප කිරීමයි.

සං:- **"දුබ්බල්‍යං අනාවිකත්වා"** (දුබ්බලස්ස භාවො; දුබ්බල්‍යං, භාවයෙහි "ණ්‍ය" ප්‍රත්‍යයයි) ශාසනයෙන් චුතවනු කැමැත්තහු විසින් **"දුක්කරං යාවජීවං එකභත්තං එකසෙය්‍යං"** යන ආදීන් සාජීව යෙහි දුර්‍වලත්වය ප්‍රකාශ කිරීමයි.

ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යානය වනාහි චිත්ත, ඛෙත්ත, කාල, පයොග, පුග්ගල, විජානන, යන ෂට් ප්‍රකාරයකින් කළයුත්තේය.

ක්‍රීඩාදියක් පිණිස නොව උපසපන් බැවින් චුත වනු රිසි චිත්තයෙන්ම ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යානය කරන්නහුගේ "චිත්ත" වශයෙන් ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යානය වේ.

| | | | |
|---|---|---|---|
| 1. බුද්ධං | පච්චක්ඛාමි | 8. උපජ්ඣායං | පච්චක්ඛාමි |
| 2. ධම්මං | ,, | 9. ආචරියං | ,, |
| 3. සංඝං | ,, | 10 සද්ධි විහාරිකං | ,, |
| 4. සික්ඛං | ,, | 11. අන්තෙවාසිකං | ,, |
| 5. විනයං | ,, | 12 සමානුපජ්ඣායකං | ,, |
| 6. පාතිමොක්ඛං | ,, | 13. සමානාචරියකං | ,, |
| 7. උද්දෙසං | ,, | 14. සබ්‍රහ්මචාරිං | ,, |

මේ තුදුස් ආකාරයෙන් ද,

| | | | |
|---|---|---|---|
| 1. ගිහීති මං | ධාරෙහි | 5. තිත්ථියොති මං | ධාරෙහි |
| 2. උපාසකොති මං | ,, | 6. තිත්ථියසාවකොති මං | ,, |
| 3. ආරාමිකොති මං | ,, | 7. අස්සමණොති මං | ,, |
| 4. සාමණෙරොති මං | ,, | 8. අසක්‍යපුත්තියොති මං | ,, |

මේ අට අයුරින් දැයි දෙවිසි "ක්‍ෂෙත්‍ර" පදයන්ගේ වශයෙන් හෝ මෙකී දෙවිසි පදයන්ගේ "පර්‍ය්‍යාය" නාම වශයෙන් හෝ ප්‍රකාශ කළ කල්හි "ක්‍ෂෙත්‍ර" වශයෙන් ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යානය වන්නේය.

"පච්චක්ඛාමි" "ධාරෙහි" යන ආදි ක්‍රියා වර්තමාන කාලික ආඛ්‍යාත බැවින් වර්තමාන කාල වශයෙන් ද, අලමෙ බුධෙන, කිනනු මෙ බුධෙන, න මමත්‍ථො බුධෙන, සුමුත්තොහං බුධෙන, යන ආදි කාලයක් අපෙක්ෂානොකර ප්‍රකාශ කිරීමෙන් ද යන දෙපරිද්දෙන් ම ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය වේ.

පච්චක්ඛාසිං, පච්චක්ඛිස්සං, ධාරෙසි, ධාරෙස්ස සි, යන්නූනාහං පච්චක්ඛෙය්‍යං, යන ආදි අතීතානාගත කාල වශයෙන් හා පරිකල්ප වශයෙන් ප්‍රකාශ කරන්නහුගේ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය නොවේ.

ලියා පෙන්වීමෙන් හෝ හස්ත මුද්‍රාදි කිසියම් කායප්‍රයෝගයකින් හෝ අඟවන්නහුගේ ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය නො වන බැවින් "සික්ඛං පච්චක්ඛාමි"යන ආදි වාක්ප්‍රයෝගයෙන් ම සිධ කටයුතු වේ. එවිට "ප්‍රයොග" වශයෙන් ශික්ෂාප්‍රත්‍යාක්ඛ්‍යානය වේ.

උම්මත්ත, ඛිත්තචිත්තාදි විකෘතස්වභාවයෙන් විනිර්මුක්තවූවහු විසින් ප්‍රකෘති සිහියෙන් යුක්ත ව ක්‍රියමාන ප්‍රත්‍යාක්ඛ්‍යානය ප්‍රතිග්‍රාහකයා විසිනුදු එසේ ම ප්‍රකෘති සිහියෙන් යුක්ත ව ඉවසිය යුතු වේ. මෙසෙයින් සම්මුඛයේ කරණු ලබන ප්‍රත්‍යාඛ්‍යානය සම්මුඛ වූ ප්‍රකෘති සිහි ඇති මනුෂ්‍යයකු විසින් ම ඉවසුව හොත් "පුද්ගල" වශයෙන් ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය වෙයි.

විජානනය ද නියමිත අනියමිත වශයෙන් ද්විවිධ වේ. මෙයින් නියමයෙන්ම "මෙතෙම සස්නෙහි කලකිරුණේය. ගිහිබව පතයි" යන ආදීන් ප්‍රත්‍යාඛ්‍යානය අසන්නහු විසින් දත යුත්තේය. ඒ එසේ ඇති කල්හි "විජානන" වශයෙන් ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය වෙයි.

උම්මත්තක, ඛිත්තචිත්ත, වෙදනට්ට, දෙවතා, තිරච්ඡානගත, යන මොවුන්ගේ හමුවෙහි ප්‍රත්‍යාඛ්‍යානය කළේ නමුදු තදර්ථය සිදුනොවේ. ඛිත්තචිත්තාදීන් කාරණය වටහා ගැන්මෙහි අපොහොසත් හෙයින් ද, දෙවතාවන් ඉතා ශීඝ්‍රව දැනගැණීම කරණ හෙයින් ද, උම්මත්තකාදීන්ගේ හමුවෙහි ප්‍රත්‍යාඛ්‍යානය ප්‍රතික්ෂිප්තයි.)

මෙසේ චිත්තාදීන්ගේ වශයෙන් ෂඩඞ්ග පරිපූර්ණ ශික්ෂාප්‍රත්‍යා ඛ්‍යානය දතයුතුයි, එහෙයින්,

"චිත්තං ඛෙත්තඤ්ච කාලො ච පයොගො පුග්ගලො තථා,
විජානනන්ති සික්ඛාය පච්චක්ඛානං ඡළඞ්ගිකං"ති.

**සං:- "මෙථුනං ධම්මං"** (මිථුනානං අයං; මෙථුනො; තං මෙථුනං) කාමාශාවෙන් මැඩුනු සමානාධ්‍යාශයෙන් යුත් ස්ත්‍රී පුරුෂ දෙදෙනෙකුගේ ලාමකධර්මයට හෙවත් රහස්‍ය කර්මයට මෛථුන ධර්මයයි කියනු ලැබේ.

**සං:- "පතිසෙවෙය්‍ය"** පුරුෂනිමිත්තෙන් ස්ත්‍රී නිමිත්ත ද, ස්ත්‍රී නිමිත්තෙන් පුරුෂනිමිත්ත ද, එක තලැටක් පමණවත් ප්‍රකෘති වාතයෙන් ස්පර්ශ නොකළ තෙත් පෙදෙසෙහි ප්‍රවෙශ කිරීම හෙවත් ස්පර්ශ කිරීම පතිසෙවනය නම් වේ.

මෙසේ උක්තාකාරයෙන් කැරෙණ රහස්‍ය කර්මයට මෛථුන ධර්මප්‍රතිසෙවනය යි කියනු ලැබේ.

**සං:- "අන්තමසො තිරච්ඡානගතාය'පි"** යනු අනුප්‍රඥප්තිය යි.

**සං:- "අන්තමසො"** සබ්බන්තිම පරිච්ඡෙදයෙන් හෙවත් යටත් පිරිසෙයින් යන අදහස යි.

**සං:- "තිරච්ඡානගතාය'පි"** (තිරියං අඤ්චන්තීති; තිරච්ඡානො, තිරච්ඡානෙසු ගතා, තිරච්ඡානගතා) මෙයින් තිරිසන් ගිය ස්ත්‍රිය වාච්‍ය වේ. එබැවින් අන්තිම පරිච්ඡෙදයෙන් තිරිසන් ගිය ස්ත්‍රියක හා ද පූර්වෝක්ත පරිදි මෙවුන්දම් සෙවනය කළේ නම් හෙතෙමේ පරිජි වේ, යනුයි.

එහෙත් තිරිසන් ගත සියලු ස්ත්‍රීහු ම පාරාජික වස්තුහු නො වෙති. ඒ සම්බන්ධ විනිශ්චය මෙසේ දත යුත්තේය.

අපා සතුනතුරෙන් සර්පයන් හා මත්ස්‍යයෝ ද, දෙපා සතුනතුරෙන් කිකිළි ද, සිවුපා සතුන් අතරෙන් බැළලි ද, සබ්බන්තිම පරිච්ඡෙදයෙන් පාරාජිකවස්තුහු වෙති. ඒ බැව් මෙයින් දක් වේ.

අපදනං අහිමච්ඡා ද්විපදනඤ්ච කුක්කුටී,
චතුප්පදානං මජ්ජාරි වත්ථු පාරාජිකස්සිමා 'ති.

අජගර ගොනසාදි දීඝ ජාතීන් කෙරෙහි මාර්ගත්‍රය අතුරෙන් එකෙකැ තිලඵල මාත්‍රයක් ප්‍රවෙශ්‍ය කරන්ට හැකි නම් ඔව්හු පාරාජික වස්තු වෙති. එසේ නොහැක්කාවූ දීඝජාතීහු "දුකුළා" වස්තු වෙති. මත්ස්‍ය ග්‍රහණයෙන් මච්ඡකච්ඡපාදී උදකයෙහි ඇතිවන්නෝ ගත යුත්තාහුය. මෙහි ද දීඝජාතීන් කෙරෙහි මෙන් ම පාරාජිකවස්තු හා දුක්කට

වස්තු දතයුත්තාහුය. එහෙත් විශෙෂයෙක් දක්වෙයි. "පදරඩගමුබ" නැමති එක්තරා "මණ්ඩූක" වර්‍ගයෙක් ඇත්තේ ය. ඔවුන්ගේ මුව සටහන මහත් වුවත් සිදුර ඎලපවේ. එහි ප්‍රවේශය නොහැක්කේය. එබැවින් එය "ථුලච්චය" වස්තු වෙයි. "කුක්කුටී" ග්‍රහණයෙන් කාක කපොතාදි සියලුම පක්ෂීහු ද, "මජ්ජාරී" ග්‍රහණයෙන් වානර ගොධාදී සියලු චතුෂ් පදික සත්තු ද ගතයුත්තාහ. පාරාජිකවස්තු හා දුක්කට වස්තු පෙර කී සේ දත යුත්තාහ.

සං:- **"පාරාජිකො හොති"** යනු පරාජයට පමුණුවන ලද්දෙක් වෙයි, යන අර්‍ථයි. මෙහි "පාරාජික" ශබ්දය ශික්ෂාපද ආපත්ති, පුද්ගලයන් කෙරෙහි යෙදේ. **"අට්ඨානමෙතං ආනන්ද අනවකාසො යං තථාගතො වජ්ජීනං වා වජ්ජිපුත්තකානං වා කාරණා සාවකානං පාරාජිකසික්ඛාපදං පඤ්ඤත්තං සමූහ නෙය්‍යාති"** යන තන්හි "පාරාජික" ශබ්දය ශික්ෂාපද යෙහි පවත්නේ යයි ද, **"න මයං පාරාජිකා යො අවහටො සො පාරාජිකො'ති"** යන ආදි තන්හි පුද්ගලයා කෙරෙහි ද, **"ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකං"** යන ආදියෙහි ආපත්තියෙහි ද යෙදේ. මෙහි වනාහි "පුද්ගලයා" කෙරෙහි යෙදිනි.

"පරාජිතො හොති" යන තන්හි "ප" උපසර්‍ගයට වෘද්ධි කොට තකාරයට කකාරාදෙශ කොට "පාරාජික" ශබ්දය සිඩයි.

සං:- **"අසංවාසො"** යි (සහ වසන්ති එත්ථාති, සංවාසො, සො තෙන සද්ධිං නත්ථීති: අසංවාසො,

අපලොකනාදි චතුර්විධ විනයකර්‍මය සීමාබ්භ්‍යන්තරයෙහි වූ පකතත්ත භික්ෂූන් විසින් එක්ව (සමගිව) කළයුතු බැවින් "එකකර්‍ම" නම්වේ. එසේම පඤ්චවිධ පාමොක් උදෙසීම එකට උදෙසිය යුතු බැවින් "එකුද්දෙස" නම් වේ. සියලු ලජ්ජීන් විසින් ප්‍රඥප්ති සමූහයෙහි සමානව හික්මිය යුතු බැවින් "සමසික්ඛතා" නම් වේ. සියලුම ලජ්ජී පුද්ගලයෝ එකකර්‍මාදීයෙහි එක්ව වෙසෙත්නුයි යන අර්‍ථයෙන් "සංවාස" යයි කියනු ලැබේ. එකී සංවාසය පරිජි අවන් පුහුලා හා සමග නොමැති බැවින් පාරාජිකාපත්තියට පැමිණි පුද්ගලතෙම "අසංවාස" යයි කියනු ලැබේ. අසංවාස පුද්ගලතෙම සියලුම සංඝකර්‍මවලදී ගණපූරකත්වය පවා නොලබන්නේය.

මේ පාරාජිකාපත්තිය පිළිබඳ ස්ත්‍රීන්ගේ මාර්‍ග 18 ක් ද පුරුෂයන් සම්බන්ධ මාර්‍ග දෙළොසක්දැයි සියලු මාර්‍ග සමතිසෙකි.

ඒ මෙසේයි.

මනුෂ්‍ය ස්ත්‍රීන්ගේ මුඛමග්‍ග, වච්චමග්‍ග, පස්සාවමග්‍ග, වශයෙන් 3
අමනුෂ්‍ය ,, ,, ,, ,, ,, 3
තිරච්ඡාන ,, ,, ,, ,, ,, 3
මනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනක ස්ත්‍රීන්ගේ-මු-ම-,ව-ම,ප-ම ව ශ 3
අමනුෂ්‍ය ,, ,, ,, ,, ,, 3
තිරච්ඡාන ,, ,, ,, ,, ,, 3
මනුෂ්‍ය පුරුෂයන්ගේ මුඛමාර්‍ග වර්චොමාර්‍ග වශයෙන් 2
අමනුෂ්‍ය ,, ,, ,, ,, 2
තිරච්ඡාන ,, ,, ,, ,, 2
මනුෂ්‍ය පණ්ඩක පුරුෂයන්ගේ මුඛමාර්‍ග වර්චොමාර්‍ග වශයෙන් 2
අමනුෂ්‍ය ,, ,, ,, ,, ,, 2
තිරච්ඡාන ,, ,, ,, ,, ,, 2

යම් කිසි උපසපන් මහණෙකු මෙහි දක්වුන සමතිස් මගෙහි තිලබීජයක් පමණ වත් අඞ්ගජාතය ස්ත්‍රී නිමිත්තෙහි ප්‍රවේශ කළහොත් ප්‍රවේශ, ප්‍රවිෂ්ට, ස්ථිති, උද්ධරණ යන යම් කිසි අවස්ථාවක සිතින් ඉවසුව හොත් ඒ මහණ පරිජි ඇවතට පැමිණියේ ය.

මෙහි දී නානා ක්‍රමයෙන් ඇවැත් සිදුවන පරිදි දතයුතුයි. ජීවමාන මිනිස් සතෙකුගේ නිමිත්තොත්පාටනය කළ තන්හි තියපිටක් පමණ මස් පිඩක් හෝ නහරයක් හෝ ඇති කල්හි එහි මෙවුන්දම් සෙවී නම් පරිජි වේ.

නැවත එහි ම වණ ව්‍යවහාරයෙන් සෙවී නම් "ථුල්ලස්" වේ. එසේම අක්‍ෂිකූප, නාසා, මුව, කන් සිදුර, වස්ත්‍රිකොෂ, සැත් ආදියෙන් කළ වණ, යන මෙකී තැන්හි මෛථුනරාගයෙන් තලැටක් පමණ වත් තම හදන් මෙහෙයා නම් "ථුල්ලස්" වේ. කිහිලි, කළවා ආදියෙහි නම් "දුකුළා" වේ.

ඇත් අස් ආදීන්ගේ නාසා ආදියෙහි මෙහෙයා නම් "ථුල්ලස්" වේ. හැම තිරිසතුන්ගේ ම අක්‍ෂි ආදියෙහි නම් "දුකුළා" වේ. විස්තරාර්ථීන් විසින් සමන්තපාසාදිකාව හා සිබවලදන විනිස බැලිය යුතුයි.

සියලුම ශික්ෂාපදයන්ගේ සාධාරණ විනිශ්චය පිණිස මෙසේ දතයුතු.

"නිදනං පුග්ගලං වත්ථුං පඤ්ඤත්තිවිධිමෙව ච,
ආණත්තාපත්තිනාපත්ති විපත්තිං අඞ්ගමෙව ච.

සමුට්ඨානවිධිං කිරිය සඤ්ඤා චිත්තෙහි නානත්තං,
වජ්ජකම්මප්පභෙදඤ්ච තිකද්වයවිධිං තථා,

ලක්ඛණං සත්තදසධා ධීතං සාධාරණං ඉදං.
ඤත්වා යොජෙය්‍ය මෙධාවී තත්ථ තත්ථ යථාරහං"

නිදනයඃ- වෙසාලි, රාජගහ, සාවත්ථි, ආලවි, කොසම්බි, සක්ක, භග්ග යයි සප්තවිධ වේ.

යමෙකු යමෙකු නිසා ඒ ඒ සිකපද පණවන ලද නම් ඒ ඒ "පුද්ගල" නම් වේ.

ඒ ඒ පුද්ගලයන්ගේ අධ්‍යචාරය "වස්තු" නම් වේ.

පඤ්ඤත්ති, අනුප්පඤ්ඤත්ති, අනුප්පන්නපඤ්ඤත්ති, සබ්බත්ථ පඤ්ඤත්ති, පදෙසපඤ්ඤත්ති, සාධාරණපඤ්ඤාත්ති, අසාධාරණපඤ්ඤත්ති, එකතො පඤ්ඤත්ති, උභතො පඤ්ඤත්ති යයි ප්‍රඥප්තිය නවවිධ වේ.

අණ කිරීම, ආණත්ති නම් වෙයි. පූර්වප්‍රයොගාදි වශයෙන් ආපත්ති භෙදය ද, අජානනාදි වශයෙන් අනාපත්ති භෙදය ද දත යුත්තේය. සීලවිපත්ති, ආචාරවිපත්ති, දිට්ඨිවිපත්ති, ආජීව විපත්ති වශයෙන් විපත්තීහු චතුර්විධ වෙති.

---

සියලු සික පදයන්හි ඇවතට කරුණු "අඞ්ග" නම් වෙති. සියලුම ශික්ෂාපදවල කාය, වාචා, කායවාචා-කායචිත්ත, වාචා චිත්ත, කායවාචාචිත්ත යන වශයෙන් එකඞ්ගික , දුවඞ්ගික, තිවඞ්ගික වූ "ෂ සමුට්ඨානයෝ" 'සමුට්ඨාන' නම් වෙත්. පළමු තුණ අචිත්තක යයි ද අනතුරු තුණ සචිත්තක යයි ද දතයුතුයි. මෙකී සමුට්ඨාන එකකින් හෝ දෙකකින් හෝ තුනකින් හෝ සතරකින් හෝ සයෙන්ම හෝ ඇවත් වෙති. පඤ්ච සමුට්ඨානාපත්තීහු නැත්තාහ.

අත්ථාපත්ති කිරියතො සමුට්ඨාති, අත්ථාපත්ති අකිරියතො, අත්ථි කිරියාකිරියතො අත්ථි සියා කිරියතො සියා කිරියතො, අත්ථි සියා කිරියතො සියා කිරියා 'කිරියතො යි සියලු ඇවැත් කිරියා' කිරියාදි වශයෙන් පඤ්චවිධ වෙති.

එසේම සඤ්ඤාවිමොක්ඛ, නොසඤ්ඤාවිමොක්ඛ වශයෙන් ද, සචිත්තක-අචිත්තක වශයෙන් ද, ලොකවජ්ජ, පණ්ණත්තිවජ්ජ වශයෙන් ද දෙපරිදි දෙපරිදි වෙත්.

කායකම්, වාක්කම්, තදුභය වශයෙන් ත්‍රිවිධ වෙති. කුශල ත්‍රිකය, වෙදනාත්‍රිකය යි ත්‍රිකද්වයයෙකි.

## පඨම පාරාජිකාපත්තියෙහි සප්තදශාකාරය.

1. නිදානය -වෙසාලියයි.
2. පුග්ගලයා -සුදින්න ස්ථවිරයන් වහන්සේයි.
3. වස්තුව -මෛථුනධම් ව්‍යතික්‍රමණයයි.
4. ප්‍රඥප්තිය -යො පන භික්ඛු-පෙ- පතිසෙවෙය්‍ය, යනුයි. සික්ඛංඅපච්චක්ඛාය, යනුද, අන්තමසො, තිරච්ඡානගතාය'පි' යනු ද, අනුප්‍රඥප්ති වෙති.
5. ආණත්තිය -අනාණත්තික යි.
6. ආපත්තිය -පාරාජිකාපත්තියයි.
7. අනාපත්ති -අජානන්තස්ස, අසාදියන්තස්ස, උම්මත්ත, ඛිත්ත චිත්ත, වෙදනට්ට, අදිකම්මිකා නක්‍ෂව.
8. විපත්තිය -ශීලවිපත්තියයි.
9. අඞ්ග -සෙවන චිත්තය, මාර්‍ගයෙන් මාර්‍ගය ප්‍රති පාදනය යන දෙකය.
10. සමුට්ඨානය -පඨම පරාජික (කාය චිත්ත) සමුට්ඨානයි.
11. කිරියා -ක්‍රියා වශයෙනි.
12. සංඥාව -සඤ්ඤා විමොක්ඛයි.
13. චිත්තය -සචිත්තකයි.
14. වජ්ජය -ලොකවජ්ජයි.
15. කර්‍මය -කායකර්‍මයයි.
16. කුසලත්තිකය -අකුසලචිත්තයයි
17. වෙදනාත්තිකය - ද්විවෙදනායි.

මෙහිසාමන්තාපත්තිය 'දුකුළාව' යි උක්තප්‍රකාර සමුට්ඨානා දීන් ඇවැත් පිළිබඳ වුවත් ව්‍යවහාර පහසුව පිණිස සියලු අර්‍ථකථාවල ම ශික්‍ෂාපදශීර්‍ෂයෙන් දැක්වූහ. එහෙත් ව්‍යඤ්ජනයම ගරු නොකොට අර්‍ථාගයම මුඛ්‍ය වශයෙන් සැලකිය යුතුයි.

## පඨම පාරාජික වර්‍ණනාව නිමි.

# ආයුෂ්මත් සුදින්න ස්ථවිරයන් වහන්සේගේ කථා වස්තුව

බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර මහවෙනෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක. එසමයෙහි විසාලා මහා නගරාසන්නයෙහි "කලන්දක" නම්වූ ගමෙක්හි "සුදින්න"නම් වූ සිටු පුත්‍රයෙක් වාසය කෙරෙයි. හෙතෙම එක් දවසක් සිව්පිරිස් මැද ධර්ම දේශනා කරණ තථාගතයන් වහන්සේ දැක "මම ද බණ අසන්නෙම් නම් යෙහෙකැයි" සිතීය. මෙසේ සිතා බණ පිරිස් මැදට ගොස් ධර්මශ්‍රවණය කරණ ඔහුට මෙබඳු අදහසක් පහළ විය. කෙසේ ද? ගිහිගෙයි වසන්නහු විසින් බඹසර හැසිරෙන්නට දුෂ්කරය. සර්වඥ ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් යහපතැයි "යි කියායි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ දහම් කථාවෙන් ප්‍රමුදිත වූ ඒ පිරිස භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට හුනස්නෙන් නැගී ගියහ. සුදින්න සිටුපුත් තෙමේ ද පිරිස් පහව ගිය කල්හි භාග්‍යවතුන් වහන්සේ ලඟට පැමිණ මෙසේ කීයේය. "ස්වාමීනි භාග්‍යවත් බුදුරජාණන් වහන්ස! ගිහිගෙයි වසන්නහු විසින් එකාන්ත පිරිසිදු වූ බඹසර හැසිරෙන්ට දුෂ්කරය. එ බැවින් සස්නෙහි පැවිදි වන්නට කැමැත්තෙමි. මා පැවිදි කොට වදරණ සේක්වා" යි කියායි. සුදින්නය! නුඹ සස්නෙහි පැවිදි වන්ට මවුපියන් විසින් අනුදන්නා ලදද? "භාග්‍යවත් බුදුරජාණන් වහන්ස! මම සස්නෙහි පැවිදි වන්ට නො අනුදන්නා ලද්දෙමි" යි කීය. "සුදින්නය! තථාගතවරයෝ මවුපියන් විසින් නො අනුදන්නා ලද්දෙකු පැවිදි නොකෙරෙතැ"යි වදාළ සේක. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! එසේ නම් පැවිදි වන්නට මා මවුපියෝ යම්සේ අනුදනිත් නම් එසේ කරන්නෙමි"යි ගියේය.

ඉක්බිති සුදින්න කලන්දක පුත්‍ර තෙම ගෙට ගොස් මවු පියන් සමීපයෙහි දී "මෑණියෙනි! පියාණෙනි! සර්වඥයන් වහන්සේ විසින් දෙශිත ධර්මය යම් යම් පරිද්දෙකින් දනිම් ද, ඒ ඒ අයුරින් සලකන විට ගිහිගෙයි විසීම නම් දුෂ්කරය. එ බැවින් සස්නෙහි පැවිදිවන්නට අවසර දෙන සේක්වා"යි කීයේය. එකල්හි මවුපියෝ පුත්‍රයාට මෙසේ කීවාහුය. "පුත්‍රය! නුඹ වනාහි අපගේ ප්‍රියවූ ද මනවඩන්නාවූ ද එකම පුත්‍රයා වෙහිය. පුතේ සුදින්න! නුඹ කිසි දුකක් නොදන්නෙහිය. මරණයෙන් නමුදු නො කැමැත්තෙන් අපි නුඹෙන් වෙන්වන්නෙමු. ජීවත් වන්නාවූ අපි

පැවිදිවන්නට තුඹට කෙසේ නම් අනුදනිමුද? යි කීහ. දෙවෙනි වරද, තෙවෙනි වරද, පළමු සේ අවසර ඉල්ලා නො ලැබුණෙන් කලකිරුණු සිටුපුත් තෙමේ "මවුපියෝ පැවිද්දට අවසර නොදෙති. පැවිදි නොවී ජීවත් වීමෙන් කම් නැත. මරණය හෝ පැවිද්ද හෝ වන්නේය"යි එහිම භූමියෙහි හොත්තේය.

ඉක්බිති සිටුපුත්‍රයා පිළිවෙළින් බත් සතක් අනුභව නො කෙළේය. මවුපියෝ නොයෙක් අයුරින් ගිහි සැප වර්ණනා කොටත් බත් අනුභව කරවන්නට හෝ හුන් තැනින් නගා සිටුවන්නට හෝ නොහැකි වූහ. එකල්හි මවුපියෝ "මරණයට වඩා පැවිද්ද යහපත්" යයි සිතා පැවිදිවන්නට අවසර දුන්හ.

ඉක්බිති සිටුපුත් ද පැවිදි වන්නට අවසර ලැබුනේ යයි තුටු පහටු ව හුන්තෙතින් නැගී ආහාරාදිය ගැණීමෙන් කීප දිනක් විශ්‍රාම ලැබ භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ පැවිදි වූයේය. උපසම්පදව ද ලැබීය. එයට පසු ද නොයෙක් උපායෙන් සිවුරු හරවා ගිහිගෙට ගන්නට උත්සාහ කළ නමුදු ඒ කිසිත් සඵල නො විය.

එක් දවසක් සුදින්න ස්ථවිරයන්ගේ මෑණියෝ පුරාණ දුතියිකාවත් කැටුව, මහ වනයෙහි වැඩසිටි සුදින්න ස්ථවිරයන් සමීපයට ගොස් මෙසේ කීහ. "දරුව සුදින්නය! අපගේ කුලය පාරම්පරික බොහෝ ධන ධාන්‍යාදියෙන් ආඪ්‍ය වූ උසස් කුලයෙකි. එ බැවින් ගිහි බවට පැමිණ මේ සම්පත් රැගෙණ අනුභව කරව, දනාදි පුණ්‍ය කර්මද කරව" යි කියායි. දෙතුන් යලක් කියාත් තම අධ්‍යාශය ඉෂ්ඨකර ගන්නට නො හැකිවූ මවුතොමෝ "එසේ නම් සුදින්නය අපගේ කුලය නොනැසී කලක් පවත්නා පිණිස දරු බීජයක් වත් දෙනු මැනවැ"යි කීවාය. එය කළ හැක්කේ යයි කියා පුරාණ දුතීකාවගේ අතින් ගෙණ මහ වනයට වැද ශික්ෂාපදය නොපණවන ලද කල්හි ආදීනව නොදක්නේ ඈ සමග තෙවරක් මෛථුන්දම් සෙවීය. ඕද එයින් ගැබ් ගත්තීය. එ කෙනෙහි භික්ෂු සංඝ තෙම අර්බුද රහිතය. ආදීනව රහිතය. එහෙත් සුදින්න කලන්දක පුත්‍රයා විසින් අර්බුදයෙක් ඇති කරණ ලද්දේය. ආදීනවයෙක් ඇති කරණ ලද්දේය, කියා දෙවියෝ ශබ්ද පැවැත්තුහ. ඒ ශබ්දය අසා චාතුර්මහරාජික දෙවියෝ දුයි මෙසේ ක්‍රමයෙන් බ්‍රහ්මලොකය තෙක් ශබ්දය පැතිර පැවතිනි.

2. යො පන භික්ඛු ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍ය සඞ්ඛාතං ආදියෙය්‍ය, යථාරූපෙ අදින්නාදනෙ රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා චොරොසි බාලොසි මූළ්හොසි ථෙනොසී'ති තථාරූපං භික්ඛු අදින්නං ආදියමානො අයම්පි පාරාජිකො හොති අසංවාසො.

---

ඉක්බිති සුදින්නට ද මට වූයේ අලාභයකැයි කුකුසෙක් විපිළිසරෙක් උපන. එයින්ම දුර්වර්ණ වූයේ පඬුවන් සිරුරු ඇත්තේ දුකට පැමිණියේ සිතිවිළි බරින් සිටියේය. මේ බැව් දත් තථාගතයන් වහන්සේ සුදින්නගෙන් කරුණු විචාරා නොයෙක් අයුරින් ගර්හා කොට නිඳ කොට සඞ්ඝ සුට්ඨුතාදි දස කරුණක් නිසා **"යො පන භික්ඛු-පෙ-පාරාජිකො හොති අසංවාසො"** යි ප්‍රථම පරාජික ශික්ෂාපදය පණවා වදළසේක.

2. **අර්ථ:-** යො පන භික්ඛු, යම්කිසි මහණෙක්; අදින්නං, (හිමියන්) නුදුන් වස්තුව; ගාමා වා, ග්‍රාමයෙන් හෝ; අරඤ්ඤා වා, අරණ්‍යයෙන් හෝ; ථෙය්‍යසඞ්ඛාතං, සොරසිතින්; ආදියෙය්‍ය, ගණීද; යථාරූපෙ,යම්බඳු වූ; අදින්නාදනෙ, නුදුන් වස්තුව ගැන්මෙහි; රාජානො, රජදරුවෝ; චොරං, සොරහු; ගහෙත්වා, ගෙණ; හනෙය්‍යුං වා, මරත් ද; බන්ධෙය්‍යුං වා, බඳිත්ද; පබ්බා ජෙය්‍යුං වා, රටින් හෝ නෙරපත් ද; චොරොසි, සොරවෙහි; බාලොසි, බාලයෙහි; මූළ්හොසි, මූඪයෙහි; ථෙනොසීති, (දනා අයත්) සොරාගත්තෙහිය, යන (මේ වචනයෙන් හෝ හය ගන්වා) බෙණෙද්ද; තථාරූපං අදින්නං, (පාදය පාදර්හය, අතිරේක පාදය යන) එබඳු නුදුන් වස්තුව; ආදියමානො, (සොරසිතින්)ගන්නාවූ; අයම්පි භික්ඛු, මේ මහණද; පාරාජිකො, පරදවන ලද්දේ; අසංවාසො හොති, අසංවාස වේ.

**සං:- "ගාමා වා ආරඤ්ඤා වා"** මෙහි "ගාමෙ වා අරඤ්ඤෙ වා"යි සප්තමී විභක්තියෙන් දක්විය යුතු යයි අර්ථ වශයෙන් සැලකෙන නමුදු වස්තුව සම්බන්ධි ඨානා චාවනය ප්‍රකට කරණු පිණිස "ගාමා වා අරඤ්ඤා වා" යි පඤ්චමී විභක්තියෙන් යෙදිනි.

ග්‍රාමාරණ්‍යයන් පිළිබඳ විනිශ්චය ද මෙහි උපයෝගී බැවින් ඒ අර්ථ කථානුසාරයෙන් මෙසේ දත යුතුයි.

ඉට්ඨක (ගඩොල්) ප්‍රාකාරයකින් හෝ අන්තිම පරිච්ඡේදයෙන් කටු අතු වැටකින් හෝ පිරිකෙව් කළාවූද පිරිකෙව් නොකළා වූද මනුෂ්‍යාවාස වූයේ හෝ වේවා නොවූයේ හෝ වේවා එකකුටිකාදී හෙදවූ ප්‍රදෙශය "ග්‍රාමය" නම් වේ. අන්තිම පරිච්ඡේදයෙන් සිවුමසකට අධික කාලයක්

යම්කිසි සාර්ථයක් (වෙළඳ සමූහයක්) නමුත් නැවති සිටි ස්ථානය ද "ග්‍රාමය" යයි කියනු ලැබේ.

යම්කිසි ගමෙකැ මිනිස්සු අපේක්ෂා රහිතව එගම අතහැර ගියාහුද, එසේ ම සියලුම මිනිසුන්ගෙන් හිස්වූ යක්ෂ පරිගෘහීත ගමක් වේද, මේ දෙතැන ම ග්‍රාම සංඛ්‍යාවට නොයෙති. මෙහිදී අසම්මොහනය සඳහා ගෘහය, ගෘහොපචාරය, ග්‍රාමය, ග්‍රාමොප චාරය, යන මොවුන්ගේ විස්තරය ද උපයොගී වේ.

ඡදනාන්තයෙන් (වහලේ කෙළවරින්) ජලය වැටෙන සීමාවෙන් ඇතුළත "සර" නම් වේ. ද්වාරයෙහි සිටි මාගමක් බඳුන් දේනා ජලය විසි කලවිට තද්දූක පතිත ස්ථානය හෝ එසේම මාගමක් ඇතුල් ගෙයි සිට ප්‍රකෘතියෙන් විසි කළ "කුල්ල" වැටුන ස්ථානය ද, නැතහොත් ගෙහි ඉදිරිපස දෙකෙළවර සම්බන්ධ කොට මැද ගේට්ටුව (දෙරකඩ) තබා අලංකාරාදී අර්ථයක් සඳහා බඳිනාලද ප්‍රාකාරය හෝ එසේම ඉදිකඩ තබා ගවයන්ගේ ගමන වැළැක්වීම සඳහා පළමු සේ බඳනා ලද වැට හෝ "ඝරූපචාරය" වේ.

සබ්බන්තිම ඝරූපචාරයෙහි සිටි මැදුම්වියෙහි වූ තුරුණු පුරුෂයෙකු විසින් අධික ශක්තියෙන් විසි කරණ ලද ගලක් පළමු වැටුනු තැනින් මෙපිට "ග්‍රාමය" වේ. (ගෙවල් රාශියක් ඇති ගමක නම් එගමැ කෙළවර "ඝරූපචාරය" මෙයින් අභිමත වේ.

ග්‍රාමාන්තයෙහි සිට උක්තප්‍රකාරයෙන් දමූ ගල වැටුන ස්ථානය "ග්‍රාමොපචාරය" වේ. (පළමුවෙන් ගල වැටුන තැන මුත් පෙරළී ගොස් නැවතුනු තැන නො ගතයුතුය.)

පවුරු ආදියකින් පිරිකෙව් කළ ග්‍රාමය, එසේ පිරිකෙව් නොකළ ග්‍රාමය යයි ග්‍රාමය දෙපරිදි වේ. පිරිකෙව් කරණ ලද ග්‍රාමයාගේ පරික්ෂෙපයෙන් ඇතුළත "ග්‍රාම" යයි. (අනුරාධ පුරයමෙති) ඉන්ද්‍රකීලයෙහි සිටියෙකු විසින් විසිකරණලද ගලක් වැටුන ස්ථානය "ග්‍රාමොපචාරය" වන්නේය. **"ගාමූපචාරො නාම පරික්ඛිත්තස්ස ගාමස්ස ඉන්දඛීලෙ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො"**යි ප්‍රකාශිත, බැවිනි.

පිරිකෙව් නොමැති ග්‍රාමයක් වුවහොත් (අන්තිම ) ඝරූපචාරයේ සිටි මැදුම් වියෙහි වූ පුරුෂයෙකු විසින් දමූ ගල වැටුන ස්ථානයෙන් මෙපිට 'ග්‍රාමය'වේ. **"අපරික්ඛිත්තස්ස ගාමස්ස ඝරූපචාරෙ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො"**යි ප්‍රකාශිත බැවිනි. ග්‍රාමොපචාරය යටත් පරිදියි.

ග්‍රාමයත් ග්‍රාමොපචාරයත් හැර ඉන් එපිට "අරණ්‍යය" වෙයි. **"අරඤ්ඤං නාම ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච"** යි දක්වේ.

"අරණ්‍යය" පිළිබඳව මෙහි මෙසේ දක්වුනු නමුත් අභිධර්ම ක්‍රමයෙන් ස්වල්ප වෙනසක් පෙණේ. **"අරඤ්ඤන්ති නික්ඛමිත්වා බහි ඉන්දඛීලා සබ්බමෙතං අරඤ්ඤන්ති"** යි ඉන්ද්‍රඛීලයෙන් පිට "අරඤ්ඤ" යයි දක්විනි. ආරණ්‍යක ශික්ෂාපදයෙහි ද **"ආරඤ්ඤකං නාම සෙනාසනං පඤ්චධනුසතිකං පච්ඡිමන්ති"** යි දක්වන ලද හෙයින් ඉන්ද්‍රකීලයෙහි පටන් අජීය ධනුවෙන් දුනුසියයක් පමණ දුර ඇති සෙනසුන ආරණ්‍යක සෙනාසනය යි කියති.

**සං:-** "**අදින්නං**" වත් හිමියා විසින් කයින් හෝ වදනින් හෝ ස්වකීය ස්වාමිත්වය සමග නොදෙන ලද්දකි. දන්තපොණශික්ෂා පදයෙහි "අදින්නං" යනුවෙන් තමා අයත් වුවද නොපිළිගත් කැපවූ අභ්‍යවහරණී යයි ප්‍රකාශ වෙයි. මෙහි එසේ නොව පරපරිගෘහිත ස්වාමික වස්තුවක්ම යයි දතයුතුයි. අවහාරයට පොහොනා එකක් බැව් දක්වනු සඳහා අටුවාවෙහි **"අඤ්ඤස්ස මනුස්සජාතිකස්ස සන්තකන්ති"** යි දක්වූහ.

**සං:-** **"ථෙය්‍යසඞ්ඛාතං"** (ථෙනස්ස භාවො: **ථෙය්‍යං**, භාවයෙහි "ණ්‍ය" ප්‍රත්‍යය යයි. ථෙය්‍යඤ්ච තං සඞ්ඛාතං. චෙති, ථෙය්‍ය සඞ්ඛාතං, කරණාර්ථයෙහි ප්‍රථමාවයි.) මෙය අවහරණ චිත්තයට නමෙකි. ථෙය්‍යචිත්ත සඞ්ඛ්‍යාතවූ එක්තරා චිත්ත කොටඨාසයකින්ය යනු අදහසයි. **"සඤ්ඤනිදනා හි පපඤ්ච සඞ්ඛා"** යනාදී තන්හි මෙන් මෙහි "සඞ්ඛාත" ශබ්දය කොටඨාසාර්ථයි.

**සං:-** **"ආදියෙය්‍ය"** පස්විසි අවහාරයන් අතුරෙන් එක්තරා අවහාරයකින් සොරසිත් ඇතියා වැ ගැණීම ප්‍රකාශ වෙයි. පස්විසි අවහාරයෝ පසක් පසක් බැගින් පඤ්චක පසෙකි. ඒ මෙසේයි.

1. නානාභණ්ඩ පඤ්චකය, 2. එකභණ්ඩ පඤ්චකය, 3. සාහත්ථික පඤ්චකය, 4. පුබ්බපයොග පඤ්චකය, 5. ථෙය්‍යාව - හාර පඤ්චකය යනුයි.

## 1. නානාභණ්ඩ පඤ්චකය.

ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානා චාවෙය්‍ය.

**2. එකභණ්ඩ පඤ්චකය.**

ආදියෙය්‍ය, යනාදි නානා භණ්ඩ පඤ්චකයම හුදෙක් "සවිඤ්ඤාණක" වස්තු ගැණීම් වශයෙන් "එකභණ්ඩ පඤ්චකය" වන්නේය.

**3. සාහත්ථික පඤ්චකය.**

සාහත්ථිකො, ආණත්තිකො, නිස්සග්ගියො, අත්ථසාධකො, ධුරනික්ඛෙපො, කියායි.

**4. පුබ්බයොග පඤ්චකය.**

පුබ්බපයොගො, සහපයොගො, සංවිදවහාරො, සඞ්කෙත කම්මං, නිමිත්තකම්මං, කියායි.

**5. ථෙය්‍යාවහාර පඤ්චකය.**

ථෙය්‍යාවහාරො, පසය්හාවහාරො, පරිකප්පාවහාරො පටිච්ඡන්නාවහාරො, කුසාවහාරො, කියායි.

### පස්විසි අවහාරයන් සම්බන්ධ විශෙෂ විභාග

"ආදියෙය්‍ය" යනු මෙරමා අයත් ආරාමාදිය ගැණීම පිණිස බොරු පැමිණිලි කිරීමයි. වාග් ප්‍රයෝගයෙන් "දුකුළාව"ද , හිමියාට සැක උපදී නම් "තුලසි"ද, නොදෙමි යන තමාගේ ධුරනික්ෂෙපය ද, මෙතෙමේ මෙය මට නොදෙයි, එනිසා මෙහි බලාපොරොත්තුව අත්හරිමියි" හිමියා ගේ ධුරනිපෙක්ෂය ද, කළ කල්හි "පරිජි"වේ. එකෙකුගේ ධුරනික්ෂෙපයෙන් නොවේ.

"හරෙය්‍ය" යනු අන්‍යයෙකුගේ පිරිකරක් ගෙණ යමින් සොර සිතින් පරමාශීනය කෙරේ නම් "දුකුළා " වෙයි. සොලවා නම් "තුලසි" වෙයි. ඨානාවාවනය කෙළේ නම් "පරිජි" වේ.

"අවහරෙය්‍ය" යනු අනුන් තමා ලඟ තුබූ පිරිකර ආදියක් නැවත ඉල්ලූ කලැ මම නොගත්තෙමි කියා නම් අයිනාදන් පූර්වභාග හෙයින් "දුකුළා"වෙයි. හිමියාට විමති උපදවා නම් "තුලසි" වේ. දෙදෙනාගේ ධුරනික්ෂෙපයෙන් "පරිජි" වේ.

"ඉරියාපථං විකොපෙය්‍ය" යනු බඩු ගෙණ යන්නහු සමග ගණු කැමැතිව ඉරියවු කොපන පියෝහි "දුකුළා" වෙයි. පළමු පියවර ඉක්ම වූ කල්හි "තුලසි" වේ. දෙවැනි පියවර නැඟු කල්හි පරිජි වෙයි.

"ඨානා චාවෙය්‍ය" යනු අනුන්ගේ පිරිකර ආදියක් සොර සිතින් අත ගැ නම් "දුකුළා" වෙයි. සොලවා නම් "තුලසි" වේ. ඨානාචාවනය කෙළේ නම් "පරිජි " වේ.

මෙකී නානාභාණ්ඩ පඤ්චකය, සවිඤ්ඤාණක අවිඤ්ඤාණක යයි විවිධ වේ. ආදියෙය්‍ය යනාදී පස් අයුරින් සවිඤ්ඤාණක වස්තුම සොර සිතින් ගත හොත් "එකභණ්ඩ" පඤ්චකය වන්නේය.

"සාහත්ථිකො"යනු අනුන්ගේ කිසියම් බඩුවක් තමා අතින් සොර සිතින් ගැණීමයි.

"ආණත්තිකො" යනු අසවලාගේ බඩු සොරාගෙණ එවයි කෙනෙකුට අණකිරීමයි.

"නිස්සග්ගියො" යනු සුංවත් ගන්නා ස්ථානය ඇතුළත සිට බඩු එතැනින් පිටට වීසි කොට ගෙණ යෑමයි.

"අත්ථසාධකො" යනු අසවලාගේ බඩු හැකි වේලාවෙකැ ගොස් සොරාගෙණ එවයි අණ කෙළේ නම් අණකළහුට එකෙනෙහි ම පරිජි වේ. අන්‍යයාට ගත්කෙණෙහි පරිජි වේ. නැත හොත් අනුන්ගේ තෙල් සැළ ආදියෙකැ පාදයක් අගනා තෙල් බොන වහන් ආදියක් බහාලයි නම් අතින් මුත් කෙණෙහි පරිජි වේ.

"ධුරනික්ඛෙපො" යනු ආරාමාදි අභියොගයෙහි ද, තමාලඟ තුබූ පරිෂ්කාරාදියක් නොගත්තෙමි"යි ගන්නා කල්හි ද, තාවකාලික භණ්ඩ දෙය්‍යයක් නොදෙන කල්හි ද, දෙදෙනාගේ ධුරනික්ෂෙපයෙන් ගත්හට පරිජි වේ.

"පුබ්බපයොගො" යනු අසවලාගේ බඩු සොරා ගණුවයි ඇණවූ කල අණවන ලද්දහු ඒකාන්තයෙන් ගත හොත් අණ කළහුට එකෙණෙහි පරිජි වේ. ගත්තහුට ගත් කෙණෙහි පරිජි වෙයි. අත්ථසාධක පූර්ව්ප්‍රයොග දෙක්හි වෙනස මෙසේයි. අණවනු ලැබුවහු බඩුගන්ටත් පළමු ආණාපකයාට පරිජි ඇවැත් සිදුවන බැවින් "අත්ථසාධක" නම් වේ. අණවනු ලැබුවහු ගත්තත් පෙරටුව ම ඇණවූවාහට පරිජි සිදුවන නිසා ඇණවීම් වශයෙන් "පුබ්බපයොග" නම් වේ.

"සහපයොගො"යනු අනුන්ගේ ආරාම ක්ෂෙත්‍රාදිය ස්වකීය ආරාමාදියට අයුකර ගැණීමට කරණ ප්‍රයොග අතුරෙන් අවසන් ප්‍රයොගයෙන් පරිජි වේ.

"සංවිදවහරො" යනු අසවලාගේ බඩු සොරා ගනුම්හයි කිහිපදෙනෙකු එක්ව ගොස් ගැණීමයි. එක්ව ගියවුන් අතුරෙන් එකෙකු නමුත් ඒ බඩු ඨානාචාවනය කළ හොත් හැම දෙනටම පරිජි වේ.

"සඞ්කෙතකම්මං" යනු පෙරවරු පස්වරු කාල අතුරෙන් අසවල් වේලාවේ ගොස් අසවලාගේ බඩු සොරාගෙණ එවයි කී කල්හි සලකුණු කල වේලාවට පෙරපසු නොවී ඒවා ගත්තේ නම් සඞ්කෙත කර්මය කළහුට සඞ්කෙතක්ඛණයෙහි ම පරිජි වේ. ගත්හට ගත් කෙණෙහි පරිජි වේ.

"නිමිත්තකම්මං"යනු අසවලාගේ බඩු මම ඇහැ කැසීම් ආදී සංඥවක් කළ කල්හි ගනුවයි කියා ගොස් නිමිත්තට පෙරපසු නො වී එය ගණී නම් නිමිත්ත කළහුට නිමිත්ත කළ කෙණෙහිද ගත්තහුට ගත් කෙණෙහිද, පරිජි වේ.

"ථෙය්‍යාවහරො" යනු යමෙක් උමං කැණීම් ආදියෙන් සොරාගණී නම් හෝ තුලාකුට මානකුටාදියෙන් වඤ්චා කොට ගණී නම් හෝ කුටකහාපණ (බොරු කහවණු) මාරු කොට ගණී නම් හෝ පරිජි වේ.

"පසය්හාවහාරො"යනු ගාමඝාතකයන් මෙන් අනුන්ගේ බඩු බලාත්කාරයෙන් ගණී නම් හෝ ගම් ලත් රාජසේවකයන් මෙන් ගත යුතු අයබදු අධිකව ගණී නම් හෝ පරිජි වේ.

"පරිකප්පාවහාරො" යනු සාටකාර්ථියෙක් ගෙයක් ඇතුළට වැද ඉදිත් සළුවක් වුව හොත් ගණීම් යි පරිකල්පනය කොට අන්ධකාරයේ පසුම්බියක් නගාගත් නම් පිළී වුව හොත් ඨානාචාවනය කළ කෙණෙහිම පරිජි වේ. නැති නම් නොවේ. ඇරගෙණ හූ බැව් දනගෙණ ම ලැබුණු දෙය හොඳ යයි ගෙණ යෙයි නම් පළමු පියවරෙහි "තුලසි" යද, දෙවැනි පියවරෙහි, පරිජි ද වේ.

"පටිච්ඡන්නාවහාරො" යනු සඟවා ගැණීමයි. යම්කිසි මහනෙක් උද්‍යානාදියේ අනුන් විසින් ගලවා තබන ලද "මුදු" ආදියක් දක පසුව ගත්තෙමි යි පස්, කොළ ආදියෙකින් වසා තබයි ද, ඒ තාක් අවහාරයෙක් නැති. එත් හිමියා සොයා බලා හෙට සොයන්නෙමි, කියා ගිය කල්හි ඒ ගණී නම් ඨානාචාවනය කළ කල්හි පරිජි වේ

පාංශුකූල සංඥවෙන් හෝ තමාගේ යයි හිතා ගණී නම් පරිජි නොවේ. නැවත හිමියාට දිය යුතු වේ.

"කුසාවහාරො" යනු කුසපත් ලා සිවුරු ආදිය බෙදන කල යම් කිසිවෙක් තමාගේ කොටසට වඩා වටිනා වූ හෝ සම සමවූ හෝ අඩුවූ හෝ අනුන්ගේ කොටස සොරාගණු රිසියෙන් තමාගේ කොටසෙහි වූ කුසපත අනුන්ගේ කොටසට දමා ද පරිජි නොවේ. අනුන්ගේ කුසපත තමන්ගේ ගොඩට හෙලූ කෙණෙහි පරිජි වේ.

සං:- **"යථාරූපෙ අදින්නාදනෙ"** මෙය "හනෙය්‍යුං" ආදි ක්‍රියා පදවලට නිමිත්තාධාර බැවින් යම්බඳු වූ අදින්නාදනයක් නිමිති කොට යනු අදහසයි.

සං:- **"රාජානො"** මෙයින් පඨබ්‍යාරාජා, පදෙසරාජා, මණ්ඩලිකා, අන්තර භොගිකා, අක්ඛදස්සා, මහාමත්තා යන ආදීහු වාච්‍යවෙති. එහෙත් මෙතන්හි "බිම්බිසාර රජ" දක්වේ. හෙතෙම ධාර්මික රජෙකු බැවින් ප්‍රවෙණිවූ පරිද්දෙන් දඬුවම් කෙරේ. සෙසු රජවරු "කාකණික" මාත්‍රයකට නමුදු හිස සිඳුවති. බොහෝ දෙයකට නමුදු සමහර විට කිසිත් දඬුවමක් නො කරවති. එහෙයින් බිම්සර රජ වැනි ධාර්මික රජවරු කවුරු නමුත් "රාජානො" යන්නෙන් කියවෙත් යයි සිතිය හැකි වේ. (කාකණික-තුට්ටුවයි)

සං:- **"චොරං"** යමෙක් පස්මස්සක් හෝ අතිරේක පස්මස්සක් හෝ එපමණ වටිනා යමක් හෝ ථෙය්‍යචිත්තයෙන් ගණී නම් ඒ "චොර" නම් වේ. එවැනි සොරෙකු යන අදහස වේ.

චොරො'සි, බාලො'සි, මුළ්හො'සි, ථෙනො'සි, යන සිවු පදයම පරිභව කිරීම සඳහා යෙදුව හෙයින් මෙහි "පරිභාසෙය්‍යුං"යන පදයෙක් අධ්‍යාහාර කටයුතු වේ.

පාදයක් හෝ පාදභීයක් හෝ වටින්නක් සොරකම් කළ කල්හි රජවරු මෙසේ කෙරෙති.

සං:- **"තථාරූපං භික්ඛු අදින්නං ආදියමානො"**යි පාදයක් හෝ පල්පොහෝනා වතක් හෝ අතිරේක පාදයක් හෝ අයිරිත් පල්පොහෝනා වතක් හෝ පූර්වෝක්ත පස්විසි අවහාරයන් අතුරෙන් එකකින් ගන්නාවූ භික්ෂුව යන අදහසයි.

මෙහි "පාදයක්"යනු පස්මදටක් අමුරණි. (සිකවළඳවිනිස) **"පොරාණකස්ස කහාපණස්ස චතුත්ථො භාගො පාදෙ"** යි විනයත්ථ මඤ්ජුසාවේ ප්‍රකාශ වේ. මිශ්‍රකම්‍ීපණයම නීලකම්ීපණය යයි කියති. මදටිය පසක් රන් ද, පස්මදටක් රිදී ද, දසමදටක් තඹ ද, මිශ්‍ර

කොට මට පිණිස වී ඇටක් පමණ ලෝහ ද, ලා අක්ෂර රූ ආදිය දක්වා කරණ ලද ලක්ෂණවූ අගනා "කර්ෂය" නීලකර්ෂාපණය" නම් වේ. (උත්තර විනිශ්චය ටීකා)

යම් තැනෙක්හි "නීලකර්ෂාපණ " නොවෙත් නම් එහිදී කාලවර්ණ රහිතවූ පස්මස්සක් වටිනා භාණ්ඩයකින් පිරිසිඳිය යුතුයයි කියති. මෙසේ පිරික්සා බලන විට පෞරාණික කර්ෂාපණයෙන් සතරෙන් කොටසක් (රත්රන් පස්මදෙටක් වටිනා භාණ්ඩය) "පාදය" යයි සැළකිය යුතුයි. මස්ස හෙවත් මාසක පිළිබඳ මනා අවබොධයක් ඇතොත් කහවණු පිළිබඳ අවබොධය ද එයින් ම ලැබේ.

**"චත්තාරො වීහයො ගුඤ්ජා ද්වෙ ගුඤ්ජා මාසකො භවෙ"**යි "අභිධානප්පදීපිකාවෙහි මාසකය ප්‍රමාණ කළ පරිදී"යි.

ශාර්ඞ්ගධරයෙහි:-

"යවොෂ්ට සර්ෂපෛඃ ප්‍රොක්තො ගුඤ්ජාස්‍යාත්තච්චතුෂ්ටයං
ෂඩ්භිස්තුරක්තිකාභිඃ ස්‍යාන්මාශකොහෙමධාන්‍යකෞ"යි
කියායි.

අයිනාදන් පරිජි සිකපදය දෙශනා කරණ තථාගතයන් වහන්සේ **"යථාරූපෙ අදින්නාදනෙ-පෙ-ථෙනොසි"** යි රාජ නීතිය උපමා වශයෙන් දක්වා වදළ සේක. කුමක් හෙයින්ද යත්:-

භාග්‍යවතුන් වහන්සේ පෙර බුදුවරයෝ මෙපමණකින් පරිජිය ද මෙපමණකින් තුලසිය ද එසේම මෙපමණකින් දුකුළාව ද පැණවූහ යි දත්සේක. ලොකව්‍යවහාරය ද දත් සේක. එහෙත් ලොකව්‍යවහාරය දත් අන්‍යයන් හා සංසන්දනය නොකොට පාදයකින් සීමා කොට මේ සිකපදය පැණවුව හොත් එකම භික්ෂුවක්හුගේ ශීල සංවරය අප්‍රමාණය. මහ පොළව මහාසමුද්‍රය සේ ඉතා පුළුලය. භාග්‍යවතුන් වහන්සේ කෙසේ නම් එබඳු භික්ෂුව පාදයකින් විනාශ කරණසේක් දැයි කියන්නෝ වෙති. මෙසේ තථාගතයන්ගේ ඥාන බලය නො දන්නෝ ශික්ෂාපදය කොපනය කෙරෙති. පැණවුව යථා ස්ථානයේ නො තිබෙයි.

ලොකව්‍යවහාරය අනුව දෙශනා කළ හොත් පළමු කී උපවාදය නොවෙයි. අගාරික වූ රජවරු පවා "පාදය" කින් හෙවත් කහවණුවෙක සතරෙන් කොටසකින් සොරහු නැසි මාදිය කෙරෙති. කෙසේ නම් මෙපමණකින් (පාදයකින්) භික්ෂුව නොනසත්ද ඒ නිසා **"කිත්තකෙන ඛො පන භිකඛු රාජා මාගධො සෙනියො බිම්බිසාරො චොරං**

ගහෙත්වා හනති වා බන්ධති වා පබ්බාජෙති වා"යි විචාරා ලොක ව්‍යවහාරය හා සසඳ අයිනාදන් සිකපදය පැණවූ සේක.

**අයිනාදන් පරීජ්යෙහි සප්තදශාකාරය**

| | |
|---|---|
| 1. නිදනය | රජගහ නුවරය. |
| 2. පුද්ගලයා | ධනිය ස්ථවිරයන් වහන්සේ. |
| 3. වස්තුව | රජුගේ දව සොරාගැණීම් සංඛ්‍යාත වස්තුවය. |
| 4. ප්‍රඥප්තිය. | "යො පන භික්ඛු-පෙ-අසංවාසො"කියායි. "ගාමා වා අරඤ්ඤා වා" යනු අනුප්‍රඥප්තියයි. |
| 5. ආණත්තිය | සාණත්තිකය. |
| 6. ආපත්ති | දුකුළා, තුලසි, පරිජි යන මොහුය. |
| 7. අනාපත්ති | සකසඤ්ඤිස්ස, විස්සාසගාහෙ, තාවකාලිකෙ, පෙතපරිග්ගහෙ, තිරච්ඡානගතපරිග්ගහෙ, පංසු කුලසඤ්ඤිස්ස, උම්මත්තකාදිනඤ්ච" යි දක්වන ලද්දවුන්ටයි. |
| 8. විපත්තිය | සීල විපත්තිය. |
| 9. අඞ්ග | (මනුස්ස ජාතිකස්ස වසෙන) පරපරිග්ගහිතං, පරපරිග්ගහිත සඤ්ඤිතා, ගරුපරික්ඛාරො, ථෙය්‍යචිත්තං, අවහරණං"යි දක්වූ පසහෙකි. |
| 10. සමුට්ඨානය | අදින්නාදන සමුට්ඨානයයි. |
| 11. කිරියා | ක්‍රියා වශයෙනි. |
| 12. සඤ්ඤාව | සඤ්ඤා විමොක්ඛයයි. |
| 13. චිත්තය | සචිත්තකයයි. |
| 14. වජ්ජය | ලොකවජ්ජයයි. |
| 15. කම්ම | කාය, වචී යන කර්මද්වයයි. |
| 16. කුසලත්‍රිකය | අකුසල චිත්තය. |
| 17. වෙදනාත්‍රිකය | ත්‍රිවෙදනායි. |

මෙහි සාමන්තාපත්තිය ථුල්ලච්චයයි.

**ද්විතිය පාරාජික වර්ණනාව නිමි.**

# ආයුෂ්මත් ධනිය ස්ථවිරයන්ගේ කථාව

භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ රජගහ නුවර ගොචර ග්‍රාම කොට ගෙණ ගිජුකුළු පව්වෙහි වැඩවසන සේක්, බොහෝ භික්ෂූහු ඉසිගිලි පව් පසෙකැ තෘණ කුටි කරගෙණ වස් එළඹුනහ. ආයුෂ්මත් ධනිය ස්ථවිරයන් වහන්සේ ද කිළියක් කොටගෙණ එහි වස් එළඹියාහුය. මහා පවාරණයෙන් පවාරණය කළ ඒ භික්ෂූහු දනවු සැරිසරණු වස් නික්මුනාහුය. කුම්භකාරපුත් ආයුෂ්මත් ධනිය ස්ථවිර තෙම හිමත් ගිමන් දෙක්හි ද එහිම විසුයේය. එක් දවසක් ධනිය ස්ථවිරයන් වහන්සේ පිඬු පිණිස ගම්වැදුනු කල්හි තෘණ හා දර සොයන්නාවූ ස්ත්‍රීහු මේ කිළිය බිඳගෙණ දර පිණිස ගෙණ ගියාහුය. තෙවෙනි වර තෙක් මෙසේ ම කළාහුය. එකල්හි ධනිය ස්ථවිරයන් වහන්සේ මෙසේ සිතූහ. "මා පිඬුසිඟා ගිය කල්හි දර ගෙණ යන්නියෝ මාගේ කිළිය තෙවෙනි වරත් බිඳගෙණ ගියාහුය. මම වනාහි ස්වකීය පරම්පරාවෙන් පැවතෙන කුම්භකාරකම් යෙහි දක්ෂයෙක්මි. එබැවින් මැටියෙන් කිළියක් කරන්නෙම් නම් යෙහෙකැයි" කියායි. මෙසේ සිතා සර්වමෘත්මය කිළියක් කොට තෘණ කාෂ්ඨාදිය රැස් කොට ලා දැවීය.

රතිඳුගොව්වෙකුගේ පැහැ දිනූ ඒ කිළිය දකුම්කලු විය. ප්‍රසාද-ජනකද විය. එකල්හි බොහෝ භික්ෂූන් පිරිවැරූ තථාගතයන් වහන්සේ ගිජුකුළු පව්වෙන් වැඩ වදරණ සේක්, මේ කිළිය දැක භික්ෂූන් අමතා "මහණෙනි දර්ශනීය වූ ප්‍රසාද ජනක වූ මේ කිළිය කිමෙක්ද "යි අසා වදළ සේක. එකල්හි ඒ භික්ෂූහු තත් කුටිය සම්බන්ධි ප්‍රවෘත්තිය දැන්වූ හ.

භාග්‍යවතුන් වහන්සේ ද මෙබඳු වූ ශ්‍රමණසාරූප්‍ය නො වූවක් කෙසේ නම් කරන්නේ දැයි ගර්හා කොට ආයති සංවරය පිණිස කරුණු වදාරා, කිළිය බිඳදමන්ට නියම කොට වදළාහුය. එකලැ භික්ෂූහුත් එය බිඳ දමන්ට ඇරඹූහ. ඒ දුටු ධනිය ස්ථවිරතෙම "ඇවැත්නි! කුමක් නිසා මාගේ කුටිය බිඳින්නහුදැ"යි ඇසුයේය. භාග්‍යවතුන්ගේ වචනයෙන් බිඳින්නෙමු යයි කී කල්හි එසේ නම් බිඳිව් යයි කීය.

ඉක්බිති ධනිය ස්ථවිරයන් වහන්සේ මෙසේ සිතූහ. "තෙවෙනි වාරය තෙක් ම තථාගත් කුටිත්‍රයයම තෘණ හාරිකාවෝ කඩාගෙණ ගියාහුය. පසුව කරගත් මෘත්මය කුටිය ද භාග්‍යවතුන් වහන්සේ විසින් බිඳුවන ලදී. එබැවින් රාජකීය ලී ගබඩාවේ (දරුගෘහයෙහි)මා සමග කථා බස් කොට

පුරුදු වූවෙක් වෙසෙයි. රාජකීය ලී ඔහුගෙන් ආයාචනා කොට ගෙණවුත් දරුකුටියක් කරන්නෙම් නම් යෙහෙකැ"යි කියායි. මෙසේ සිතා ධනිය ස්ථවිර තෙම දරු භාණ්ඩාගාරිකයා කරා එළඹ කුටියක් කරගැණීමට ලී අයැදීය. එකල්හි භාණ්ඩාගාරික තෙමේ "ස්වාමීනි! එබඳු ලී භාණ්ඩාගාරයෙහි නොමැත්තාහ. නගර ප්‍රතිසංස්කරණය සඳහා පරෙස්සම් කොට තැබූ ආණ්ඩුවේ ලී මෙහි වෙති. නරෙශ්වර තෙමේ ඒ ලී දෙයි නම් කැමති සේ ගෙණ ගොස් කිළිය කරගණු මැනවැයි කීය.

පින්වත! රජු විසින් එය අපට දෙන ලද යි කී කල්හි එසේ නම් ගෙන යන්නැයි කීයේය. ඉක්බිති ඒ ලී කඩ කඩ කොට කපා රියවලින් ගෙණ ගොස් කැමති පරිද්දෙන් කිළියක් කෙළේය.

තදනන්තරව මගධ මහා අමාත්‍ය වූ වස්සකාර බ්‍රාහ්මණයා නුවර යම්කිසි කටයුත්තක් සඳහා දරු භාණ්ඩාගාරයට ගොස් දව ඉල්ලුවේය. භාණ්ඩාගාරිකයා ස්වාමිය! දව රජු විසින් ධනිය ස්ථවිරයන් වහන්සේට දෙන ලදැයි කීය. එකල්හි අමාත්‍ය තෙම නොසතුටු වූයේ රජහට දන්වීය. එවිට රජතෙම දව ආරක්ෂකයා විනිශ්චය ශාලාවට කැඳවන ලෙස අණ කෙළෙන් රාජ පුරුෂයෝ ඔහු බැඳගෙණ ගියාහුය. මේ කරුණු දත් ධනිය ස්ථවිර තෙමේත් රජගෙට ගොස් පණවන ලද අස්නෙක වැඩ සිටියේය. එකල්හි බිම්සර රජ ධනිය ස්ථවිරයන් කරා එළඹ වැඳ එකත් පසෙක සිට මෙසේ විචාළේය. "සවාමීනි! නගර ප්‍රතිසංස්කරණය පිණිස ආරක්ෂිත දව මවිසින් නුඹ වහන්සේට දෙන ලදලු, ඒ සැබෑද"යි කියායි. එසේය මහරජානෙනි! "ස්වාමීනි! අපි වනාහි බොහෝ රාජකෘත්‍ය ඇත්තෝ වෙමු. යමක් ප්‍රදානය කොටත් අනුස්මරණය නො කරන්නෙමු. එබැවින් නැවතත් සිහිකරණු මැනැව"යි කීය. මහරජානෙනි! තොප අභිෂෙක ලත් පළමු වස තුළදීම "මහණ බමුණන්ට තෘණ කාෂ්ඨොදක දෙන ලද්දේම ය. කැමති සේ පරිභොග කෙරෙත්වායි" කියන ලද්දේය. ස්වාමීනි! එය සිහි කරමි. ශික්ෂාකාමී මහණ බමුණෝ ඇත්තාහ. උන්වහන්සේලාට ස්වල්පදෑහි පවා කුකුස් වෙති. එබැවින් උන්වහන්සේලා නිසා ම මවිසින් ඒ වරය දෙන ලදී. එහෙත් ඒ වෙනෙහි අපරිගෘහීත ද පිළිබඳවය.

මාගේ රාජ්‍යයෙහි වසන්නාවූ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයකු කෙසේ නම් නසන්නෙම් ද? ස්වාමීනි! වඩිනු මැනව. නුඹවහන්සේ ලෝමයෙන් මිදුනහුය. නැවත මෙවැන්නක් නොකළ මැනවැයි අවවාද කොට යැවීය.

3. යො පන භික්‍ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙය්‍ය. සත්‍ථහාරකං වා'ස්ස පරියෙසෙය්‍ය මරණවණ්ණං, වා සංවණ්ණෙය්‍ය, මරණාය වා සමාදපෙය්‍ය, අම්භො පුරිස! කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජිවිතෙන, මතන්තෙ ජීවිතා සෙය්‍යොති; ඉති චිත්තමනො චිත්ත සංකප්පො අනෙකපරියායෙන මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය, මරණාය වා සමාදපෙය්‍ය, අයම්පි පාරාජිකො හොති අසංවාසො.

---

මේ කාරණය දත් ජනයෝ "මේ මහණ බමුණෝ අලජ්ජීහුය, දුශ්ශීලයෝය. මුසා බණන්නෝය, එසේ වූ මොවුහු අපි ධර්මචාරිහු වෙමුය. ශීලවන්තයෝ වෙමුය. සත්‍යවාදීහු වෙමු යයි ප්‍රතිඥ කෙරෙති. මොවුනට ශ්‍රමණ ධර්මයෙක් නැති" යන ආදීන් නුගුණ සිතත්, ප්‍රකාශ කෙරෙත්, ප්‍රකට කෙරෙත්. මේ නුගුණ කථා ශ්‍රවණය කළ ලජ්ජී භික්ෂූහු ඒ බැව් භාග්‍යවතුන් වහන්සේට සැළ කළාහුය.

භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සඞ්ඝයා කැඳවා ආයුෂ්මත් ධනිය ස්ථවිරයන්ගෙන් මෙසේ විචාළසේක.

ධනිය! රජුගේ නොදෙන ලද දැව ගත්තේලු ඒ සැබෑද? එසේය භාග්‍යවතුන් වහන්ස! යී පිළිවදන් දුන්නේය. එකල්හි නොයෙක් අයුරින් ගර්හා කොට මේ කරුණෙහි ලා "යො පන භික්ඛු-පෙ-අසංවාසො"යි ද්විතීය පාරාජික ශික්ෂාපදය පණවා වදළසේක.

3. **අර්ථ**- යො පන භික්ඛු, යම්කිසි මහණෙක්; සඤ්චිච්ච-(මොහු) මරමියි දැන දැන; මනුස්ස විග්ගහං, මනුෂ්‍ය දෙහය; ජීවිතා (රූපා 'රූප) ජීවිතයෙන් වොරොපෙය්‍ය, තොර කෙරේ ද; අස්ස, ඔහු සමීපයෙහි; සත්ථහාරකං වා, ජීවිතය හරණය කරණ ශස්ත්‍රයක් හෝ; පරියෙසෙය්‍ය, (මියනු කැමති සඳ ගත හැකිසේ) එලවා තබා ද; මරණ වණ්ණං වා, **"යො එවං මරති සො ධනං ලභති"** යන ආදීන් මරණයෙහි ගුණ හෝ; සංවණ්ණෙය්‍ය, ප්‍රකාශ කෙරේ ද; මරණාය වා සමාදපෙය්‍ය ("සත්ථං වා ආහර,විසං වා ඛාද" යන ආදීන්) මියන පිණිස උපාය හෝ උගන්වා ද; අම්භො පුරිස, භවත් පුරුෂය; තුය්හං, තාගේ; පාපකෙන, ලාමකවූ; ඉමිනා දුජ්ජිවිතෙන, මේ දුඃඛ ජීවිතයෙන්; කිං? කිම? තෙ ජීවිතා, තාගේ ජීවත්වීමට වඩා; මතං සෙය්‍යො, මියයාම උත්තමය යි; ඉති චිත්තමනො, මෙබඳු මරණ සිත් මරණ මනස් ඇත්තේ: ඉති චිත්ත සඞ්කප්පො, මෙබඳු (මරණ සංඥදී) විසිතුරු විධාන ඇත්තේ; අනෙක

පරියායෙන, නොයෙක් කාරණයෙන් මරණවණ්ණං වා, මරණයේ ගුණ හෝ; සංවණ්ණෙය්‍ය, කියා ද; මරණාය වා මියන පිණිස උපාය හෝ; සමාදපෙය්‍ය, උගන්වා ද; අයම්පි, මේ මහණ ද; පාරාජිකො, පරදවන ලද්දේ; අසංවාසො හොති, අසංවාස වේ.

සං:- **"සඤ්චිච්ච"** මෙහි "සං" යනු සහාත්‍ර්ථයෙහි උපසර්‍ගයෙකි. "සංචිච්ච" යනු උස්සුක්ක ( පූර්‍වකාලික ක්‍රියා) වචනයෙන් කිය වෙන්නේ ප්‍රාණියෙක යන හැඟීම හා සමගම මරමි යන වධක චෙතනාවෙන් සිතා යන අධ්‍යාශය යි. එහෙයින් **"සද්ධිං චෙතෙත්‍වා පාණොති සඤ්ඤාය සද්ධිංයෙව වධාමි තත්ති වධකචෙතනාය චෙතෙත්‍වා පරිකප්පෙත්‍වා"** යි අර්‍ථ කථාවෙහි ප්‍රකාශිතය.

සං- **"මනුස්සවිග්ගහං"** යනු (මනු උච්ච ඨානෙ සෙතීති, මනුසෙසා, මනසො උස්සන්නත්තා වා, මනුස්සො, විසෙසෙන ගය්හතී'ති විග්ගහො, මනුස්සස්ස විග්ගහො, මනුස්සවිග්ගහො: තං) මිනිස් සිරුරක්ය යන අර්‍ථයි. ප්‍රතිසන්ධි විඥානය සමග පහළ වන සියුම් රූපය, කලල් රූපය නම් වේ. සාමාන්‍ය වශයෙන් පුරුෂ කලල් රූපයකැ හෝ ස්ත්‍රීකලල් රූපයකැ, කායදසක, වත්‍ථුදසක, භාවදසක, වශයෙන් දසක තුනෙක් වෙති. නපුංසකයනට භාවදසකය නොමැති හෙයින් දසක දෙකකි.

තිල තෙලස්ස යථා බින්දු සප්පිමණ්ඩො අනාවිලො
එවං වණ්ණපටිභාගො කලලන්ති පවුච්චති යි.

කලලාවස්ථාවෙහි ලක්‍ෂණ ප්‍රකාශිතයි. මෙසේ ඉතා සියුම් කලල් රූපයෙහි පටන් මරණය දක්වා මෙදතුරෙහි ක්‍රමයෙන් වැඩුනුආත්ම භාවය "මනුස්සවිග්ගහං" යනුවෙන් ප්‍රකාශ වේ. බාහුල්‍ය වශයෙන් මෙසේ ප්‍රකාශිත නමුදු කලල රූපයක් නොමැති ඕපපාතිකාදි මනුෂ්‍යයෝද "මනුස්සවිග්ගහං"යන්නෙන් ගැණෙති. ඔවුනු දූ පාරාජික වස්තුවන බැවිනි.

සං- **"ජීවිතා වොරොපෙය්‍ය"** යනු කලල් අවස්ථාවෙහි තැවීම්, බෙහෙත් යෙදීමාදියෙන් හා ඊට පසු තදනුරූප උපක්‍රමය කින් දිවි තොරකරන්නේ නම් යන අදහසයි.

පළමු සත්‍තාහයෙහි සන්‍තතිවශයෙන් පවත්නා කලල සඞ්ඛ්‍යාත ආත්මභාවය ජීවිතයෙන් තොරකළ හැක.

එහෙත් මරණයට අනවකාශ කාලයකු ද ඇත්තේය. ප්‍රතිසන්ධි චිත්තය සමග කර්මජරූප තිසක් පහළ වෙති. ඒ කර්මජරූප පවත්නා කල්හි ම භවාඞ්ගසිත් සොළසක් ඉපිද නිරුද්ධ වෙති. මේ අතර පිළිසිඳගත් දරුවාට හෝ ඔහුගේ මවට හෝ අනතුරෙක් නැත්තේය

මෙහි දී විශෙෂයෙන් පාණො, පාණාතිපාතො, පාණාතිපාති, පාණාතිපාතස්ස පයොගො, යන මොවුන්ගේ විස්තරය ද උපයොගී වේ. ව්‍යවහාර හෙයින් සත්වයා ද, පරමාර්ථ හෙයින් ජීවිතෙන්ද්‍රිය ද "ප්‍රාණ" නම් වේ.

යම් චෙතනාවකින් ජීවිතෙන්ද්‍රියොපච්ඡෙදක ප්‍රයොගයක් කෙරේ ද ඒ චෙතනාව "පාණාතිපාත" නම් වේ.

උක්තප්‍රකාර වධක චෙතනා සමඞ්ගී පුද්ගලයා "පාණාතිපාතී" වේ. සාහත්ථිකය, නිස්සග්ගිකය, ආණත්තිකය, ථාවරය, විජ්ජාමයය, ඉද්ධිමය යයි ප්‍රාණාතිපාතය සම්බන්ධ ප්‍රයොග සයෙකි.

අත්පාවලින් ගසා හෝ කායසම්බන්ධවූ සැත් මුගුරු ආදිය කින් ගසා හෝ යමෙකු මරන්නහුට "සාහත්ථික" ප්‍රයෝගය වේ.

දුර සිටියක්හු මරණු කැමැත්තෙන් කයින් හෝ කය පිළිබඳ යමකින් හෝ ඊ, උල්, ගල් ආදිය හෝ විසි කොට මරන්නහුට "නිස්සග්ගිය" ප්‍රයොගය වේ.

ඒ වනාහී උද්දිස්ස, අනුද්දිස්ස, වශයෙන් විවිධ වේ. යමෙකු උදෙසා ඊ ආදිය ගසා මැරීම "උද්දිස්ස" යයි ද කවරෙක් හෝ මෙයින් මැරේවායි සිතා ගසා මැරීම "අනුද්දිස්ස" යයි ද, සැලකිය යුතුයි. අසුවල් තැනැත්තහු මරවයි නියම කිරීම "ආණත්තික" ප්‍රයොගය යි. මෙහිලා වත්ථු, කාල, ඔකාස, ආයුධ, ඉරියාපථ, කිරියාවිසෙස, යන කරුණු සය ද සැලකිය යුතු. (සමන්ත පාසාදිකාවෙන් විස්තර දතයුතුයි.)

යනෙන මාර්ගවල බොරුවළවල් කැණීමද නිතර පරිභොග කරණ ඇඳ පුටු ආදියෙහි ඇණීමට යොග්‍ය සේ ඉදිකටු ආදිය තැබීමද, කඩු ආදිය ලඟ තැබීමද, ලින් පොකුණු ආදියෙහි විෂ බහාලීම ද, ස්ථාවර ප්‍රයොග වේ. හෙද උද්දිස්ස, අනුද්දිස්ස වශයෙන් දතයුතු යි.

යමෙකු මැරීමට මන්ත්‍ර විජ්ජා ආදිය කිරීම් "විජ්ජාමය" ප්‍රයෝග යයි. කර්ම විපාක සෘද්ධියෙන් හෙවත් සාතිශය කර්මයෙන් (උත්පත්තිය සමග හටගත් සෘද්ධියෙන් ) නොයෙක් විකාර කොට මැරීමෙන් "සෘද්ධිමය" ප්‍රයොගය සිද්ධ වේ.

සං- **"සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය"** යනු (ජීවිතං හරතී ති, හාරකං; හරිතබ්බන්ති වා, හාරකං; සත්ථඤ්ච තං හාරකඤ්චාති, සත්ථහාරකං" (මෙහි "හාරකසත්ථං" යී වියයුතු තැන විශෙෂණයාගේ පරනිපාතනයෙන් "සත්ථහාරකං" කියා සිද්ධ වේ.) ජීවිතෙන්ද්‍රියය හරණයට සුදුසුවූ අසි, සැත් ආදී කිසි අවියක් යම්සේ ගත හැකි වෙයි නම් එසේ තැබීම යි.

සං- **"මරණ වණ්ණං වා සංවණ්ණෙය්‍ය"** යනු වදතින් හෝ තල්පත් කරදසි ආදියෙකැ ලියා හෝ **"යො එවං මරති සො ධනං වා ලභති"** යන ආදීන් මරණයේ ගුණ ප්‍රකාශ කරන්නේ නම් යන අදහස යි. පර්‍ය්‍යාය වචනයෙන් කීයේ නමුදු මරණ සංවර්ණනය ම වේ.

සං- **"මරණාය වා සමාදපෙය්‍ය"**යනු **"සත්ථං වා ආහර. විසං වා ඛාද. සොබ්භෙ වා නරකෙ වා පපාතෙ වා පපත"** යන ආදීන් මැරීමට අදාළ ක්‍රම (උපාය කියාදීම) වෙයි. මෙයින් ආණත්තික පියෝ දක්වෙයි.

සං- **"කිං තුය්හිමිනා=පෙ=සෙය්‍යො"**යී දක්වෙන්නේ මරණ සංවර්ණනය කරණ අයුරුයි. එනම්:-

"තුඹ වනාහි ප්‍රණීත වූ ආහාර පානාදිය නොලබන්නෙහිය. එබැවින් තුඹේ මේ දුඃඛ ජීවිතයෙන් ප්‍රයෝජන කිම්ද"යි ජීවිතයේ ආදීනව දක්වමින් හෝ, "උපාසකය! තුඹ වනාහි බොහෝ පින් කෙළෙහිය. මළාවූ තාගේ ජීවිතය මෙයට වඩා උතුම් වන්නේය. තුඹ මෙයින් මැරීගොස් දහස් ගණන් දෙවඟනන් පිරිවරණ ලදුව නඳුන වනයෙහි සැප විඳින්නෙහි"ය, යන ආදියෙන් මරණයේ ගුණ දක්වමින් කරුණු කීමයි.

සං:- **"ඉති චිත්තමනො"** යනු (චිත්තමස්ස අත්ථීති; චිත්තො. මනමස්ස අත්ථීති; මනො, "ඉති චිත්තො මනො"යි කියයුතු වුවද සුඛොච්චාරණය සඳහා "චිත්තමනො"යි කීහු) ඉති චිත්තො ඉති මනො යි යොදගත යුතුයි. මෙහි "ඉති ශබ්දය" **"අත්ථි ඛො කච්චාන අයමෙකො අත්තො. නත්ථි ඛො කච්චාන අයං දුතියො අත්තො"**ති යනාදි තන්හි මෙන් නිදර්ශනාර්ථ යි.

"චිත්ත" ශබ්දයාගේ අර්ථ දක්වනු වස් "මන" ශබ්දය යෙදිනි. එහෙයින් අර්ථ වශයෙන් භේදයක් නො පෙණේ. **"යං චිත්තං, තං මනො, යං මනො, තං චිත්තං"** යී පද භාජනයෙහි මෙයට නිදර්ශන දක්වූහ.

සං:- **"චිත්තසඞ්කප්පො"** මෙහි ද ඉති ශබ්දය යොදගත යුතුයි. "චිත්තො නානප්පකාරකො සඞ්කප්පො අස්සාති; චිත්තසඞ්කප්පො"යි අර්ථ ගතයුතු බැවින් මෙහි "චිත්ත"ශබ්දය **"නාහං භික්ඛවෙ එක නිකා යම්පි සමනුපස්සාමි යං එවං චිත්තං, යථා ඉදං භික්ඛවෙ තිරච්ජාන ගතා"** යනාදී තන්හි මෙන් විචිත්‍රාර්ථවාචී වේ. "සඞ්කප්ප"ශබ්දය තක්කො, විතක්කො, සඞ්කප්පො යන ආදී තැන්හි මෙන් මෙහි විතර්කයට නම නොවේ. ඒ සංවිදහන මාත්‍රයට නමෙකි.

සං:-**"අනෙක පරියායෙන"** උච්චාවච කාරණයෙන් හෙවත් කුදුමහත් උපායවලින්, යන අදහසයි. ජීවිතයේ දෙස් දක්වීම අමහන්ත (සුලු) උපායයි. මරණයේ ගුණ පැවසීම මහන්තාකාරයි. හෙවත් මහත් උපායයි.

**"එකාහං ජීවිතං සෙය්‍යො විරියමාරභතො දළ්හං"** යන ආදියෙන් ධර්මදෙශනා කිරීම, මරණ සංවර්ණනය නොවේ. වධක චේතනාවෙන් තොරවූ හෙයිනි.

**මිනිස් විකා පරිජ්යෙහි සප්තදශාකාරය.**

1. නිදනය - වෙසාලි යයි.
2. පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුයි.
3. වස්තුව - ඔවුනොවුන් දිවි නසා ගැණීම් සඞ්ඛ්‍යාත වස්තුවයි.
4. ප්‍රඥප්තිය - "යො පන භික්ඛු-පෙ-අසංවාසො" යනුයි. මරණ වණ්ණං වා සංවණ්ණෙය්‍ය අනුප්‍රඥප්ති යයි.
5. ආණත්තිය - සාණත්තිකයි.
6. ආපත්ති - වළ කැණීමාදියෙන් දුකුළාව ද, මිනිස් දයෙහි වූවෙකුට දුක් ඉපදවීමෙහි "තුලසි" ය ද තිරිසන් ගිය මරණයෙහි පචිතිය ද, මිනිස් මරණයෙහි පරිජිය ද, යන මොහුයි.

7. අනාපත්ති - මේ උපායෙන් මොහු මරමි යි නොසිතා මරන්නාහට ද, මෙයින් මෙතෙම මැරේ යයි නොදන්නාහට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවෙති.

8. විපත්තිය - සීල විපත්තියයි.

9. අඞග - මනුෂ්‍ය ප්‍රාණයක්වීම, ප්‍රාණියෙක්ය යන හැඟීම වධක චෙතනාව, උපක්‍රමය, එයින් මැරීම, යන පසෙකි.

10. සමුට්ඨානය - අයිනාදන් සමුට්ඨාන යයි.

11. කිරියා - ක්‍රියා වශයෙනි.

12. සංඥව - සඤ්ඤ විමොක්ඛ යයි.

13. චිත්තය - සචිත්තකයි.

14. වද්‍යය - ලොකවිද්‍යය යයි.

15. කම්ම - කාය වචී කම්මද්වය යයි.

16. කුසල ත්‍රිකය - අකුසල චිත්ත යයි.

17. වෙදනා ත්‍රිකය - දුක්ඛවෙදනාවයි.

මෙහි සාමන්තාපත්තිය "තුලසී" යයි.

**මිනිස් විකා පරිජ් වණ්ණණාව නිමි.**

---

# මිනිස් විකා පරිජ්යෙහි නිදන කථාවස්තුව

ලොකස්වාමි වූ තිලෝගුරු සම්මාසම්බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර ගොදුරුගම් කොට මහවෙනෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වාසය කරණසේක. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නොයෙක් කරුණෙන් **"අත්ථි ඉමස්මිං කායෙ කෙසා"** යන ආදීන් කාය විච්ඡන්දනීය කථාව වදරණසේක. අසුභ භාවනාවෙහි ආනිසංස හා නැවත නැවතත් අසුභසමාපත්තියෙහි ආනිසංස දක්වන සේක. එකල්හි

භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, මම අර්ධමාසයක් හුදකලාව විවේක සැප විඳිනු කැමැත්තෙමි. පිණ්ඩපාත නීහාරක එක් භික්ෂුවක් හැර කිසිවෙකු එහි නො එළඹිය යුතු යයි වදාළසේක. භික්ෂූහු ද ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! එසේ යයි පිළිවදන් දුන්හ. එකල්හි සර්වඥයන්වහන්සේ නොයෙක් කරුණෙන් අසුභභාවනාවේ ආනිසංස වදරත් යයි කියා භික්ෂූහු අසුභ භාවනාවෙහි යෙදුනාහුය. ඔවුහු තම තමන්ගේ සිරුරු කරණ කොට ගෙණ දුකට පැමිණෙත්. පිළිකුල් කෙරෙත්, ලජ්ජිත වෙත්. කෙසේද? යත්:- තුරුණු වියෙහි සිටියාවූ එසේම අලංකාරය ප්‍රිය කරන්නාවූ පිරිසිදුවූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ගෙලැ බැඳි අහි, කුක්කුර, මනුෂ්‍ය කුණපයන් අතුරෙන් එක්තරා කුණපයක් නිසා යම්සේ දුකට ලජ්ජාවට පිළිකුල් කරන බවට පැමිණේ ද එපරිද්දෙනි.

මෙසේ ඒ භික්ෂූහු ස්වකීය ශරීර නිසා දුකට පැමිණියාහු තුමූ ම දිවිනසා ගණිති. ඔවුනොවුන් ලවා ද දිවිතොර කරවා ගණිති. නැවත **"මිගලණ්ඩික"** නමැති ශ්‍රමණවෙශධාරියා ලඟට පැමිණ මෙසේ ත් කියති. ඇවැත්නි! අපගේ දිවි නසව. එකල්හි මේ පා සිවුරු තොපට වෙති යි කියා යි. එකලැ මිගලණ්ඩික තෙමේ බොහෝ භික්ෂූන් දිවි නසා ලෙයින් වැකුණු කඩුව ගෙණ පාපප්‍රවාහය සඳහා වග්ගුමුදා නදිය කරා එළඹියේය.

ඉක්බිති ලේ වැකුණු අසිපත ධොවන කරන්නාවූ ඒ ශ්‍රමණ කුත්තකයාට මෙසේ කුකුසෙක් උපන. යම්බඳු වූ මම සිල්වත් එසේම කලණ දම් ඇත්තාවූ භික්ෂූන් නැසුවෙම් ද ඒ මට වූයේ මහත් අලාභයෙක, මවිසින් බොහෝ අකුසල් රැස්කරගන්නා ලද්දේ යයි කියායි. එකල්හි මාරපාක්ෂික වූ එක්තරා මිසදිටු දෙවියෙක් දියෙහි නොගිලෙමින් අවුත් මිගලණ්ඩිකයාට මෙසේ කීවේය. කෙසේද? සාධු සාධු සත් පුරුෂය, තුඹ වනාහි සසරින් උත්තීර්ණ නොවූවන් තරණය කරවූයෙහිය. එහෙයින් තොපට වූයේ මහත් ලාභයෙකැයි කියායි.

එකල්හි හෙතෙම මට වූයේ ලාභයෙක. මවිසින් බොහෝ පින් කැරිණ, නැවතත් සසර තරණය නොකළ වුන් එතර කරවන්නෙමි යි කියා අසිපත රැගෙණ වෙහෙරෙන් වෙහෙරට ද පිරිවෙණෙන් පිරිවෙණට ද ගොස් මෙසේ කියයි. කවරෙක් සසර තරණය නොකෙළේ ද කවරෙක් තරණය කරවන්නෙම් දැයි කියායි. එකලැ අවීතරාගීහු බිය වූහ. වීතරාගීහු බිය නොවූහ. එහෙත් හෙතෙම එක් දිනකින් එකෙක දෙදෙනෙක යන ආදී වශයෙන් භික්ෂූන් සැට දක්වා නැසුයේය.

4. යො පන භික්ඛු අනභිජානං උත්තරිමනුස්ස ධම්මං අත්තූපනායිකං අලමරිය ඤාණදස්සනං සමුදාචරෙය්‍ය ඉති ජානාමි ඉති පස්සාමීති, තතො අපරෙන සමයෙන සමනුග්ගාහිය මානො වා අසමනුග්ගාහියමානො වා ආපන්නො විසුද්ධා පෙක්ඛො එවං වදෙය්‍ය, අජානමෙවං ආවුසො අවචං ජානාමි, අපස්සං පස්සාමි, තුච්ඡං මුසා විලපින්ති, අඤ්ඤත්‍ර අධිමානා, අයම්පි පාරාජිකො හොති අසංවාසො.

---

සම්මා සම්බුදුරජාණන් වහන්සේ අධිමාසයෙකින් හුදකලා වාසයෙන් නැගී සිටිසේක්, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් අමතා වදාළසේක. ආනන්දය! භික්ෂු සමූහයා අඩුවූවාක් මෙන් පෙණෙයි, ඒ කිම? දැයි කියායි. එසේය; භාග්‍යවතුන් වහන්ස! අසුභභාවනාවේ වර්ණනාව ඇසූතැන් පටන් තමාම දිවි නසා ගැණීමෙන් ද, ඔවුනොවුන් ලවා නස්වා ගැණීමෙන්ද, සමණකුත්තකයා ලවා මරවා ගැණීමෙන් දැයි මෙසේ භික්ෂු ගණයා ක්‍රමයෙන් අඩුවිය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට තදනය වූ භාවනා ක්‍රමයක් උගන්වන්නාහු නම් යෙහෙකැයි කීය.

එසේ නම් ආනන්දය! විශාලා මහනුවර ඇසුරු කොට වසන සියලු භික්ෂූන් උපස්ථානශාලාවෙහි රැස් කරවයි වදාළසේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ උපස්ථාන ශාලාවෙහි භික්ෂූන් රැස් කරවා, භාග්‍යවතුන් වහන්සේ ලඟට එළඹ, ස්වාමිනි! භාග්‍යවතුන් වහන්ස! භික්ෂුසංඝ තෙම රැස් වූයේ යයි කීහ. එකල්හි සර්වඥයන් වහන්සේ උපස්ථානශාලාවේ පණවනලද අස්නෙහි වැඩහිඳ, භික්ෂූන් ආමන්ත්‍රණය කොට ආනාපානස්මෘතිභාවනාව උගන්වා එහි ආනිසංස ද වදාළසේක.

ඉක්බිති මේ කරුණ නිමිත්ත කොට ගෙණ බික්සඟ කැඳවා කරුණු විචාරා නොයෙක් අයුරින් ගර්හා කොට "යො පන භික්ඛු මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙය්‍ය" යන ආදී ප්‍රඥප්තිය දෙශනාකොට වදාළසේක.

---

4. අර්ථ:- යො පන භික්ඛු, යම් කිසි මහණෙක්; අනභිජානං, (ස්වසන්තානයෙහි නො උපන් බැවින් තමා කෙරෙහි ඇතැයි) නො දන්නේ අලමරියඥාණදස්සනං, කෙලශ ප්‍රහාණයෙහි දක්ෂ වූ විශුඬඥාන දර්ශන ඇති, උත්තරිමනුස්සධම්මං, (ධ්‍යානාදී) උතුරු මිනිස් දම්, අත්තූපනායිකං, තමා කෙරෙහි එලවා හෝ; තමා එහි එලවා, ඉති ජානාමි, මේ කාරණයෙන් මා කෙරෙහි ඇතැයි දනිමි, ඉති පස්සාමීති, මේ කාරණයෙන් ඇසින් දුටුවාසේ දක්මියි; අඤ්ඤත්‍ර අධිමානා, අධිගත ධර්මම ඇත්තෙමියි. යන අභිමාන නැතිව, සමුදාචරෙය්‍ය, විඥ වූ මිනිස් සතක්හට කියාද, තතො

අපරෙන සමයෙන, ඒ ආරෝචිත කාලයෙන් අන්‍යකාලයෙක්හි, සමනුග්ගාහියමානො වා, (ධ්‍යාන විමොක්ෂාදීන් අතුරෙහි කවර ධර්මයක් තොප විසින් අධිගත ද යනාදීන් විචාරණු ලබන්නේ හෝ, අසමනුග්ගාහියමානො වා, එසේ නොවිචාරණු ලබන්නේ හෝ; ආපන්නො, ආරෝචිත කාලයේම පරිජි අවන්නේ; විසුද්ධාපෙක්ඛො, (තමහට ගෘහස්ථ භාවාදී) විශුද්ධිය කැමැත්තේ; ආවුසො, ඇවැත්නි; (උතුරු මිනිස් දම් මා කෙරෙහි නැති හෙයින්) ඇතැයි නොදන්නෙමි; එවං ජනාමි, මෙසේ දන්මියි; අපස්සං, නොදක්නෙමි; එවං පස්සාමි, මෙසේ දක්මියි; අවචං, කීමි; තුච්ඡං, (වචනාර්ථ රහිත හෙයින් ) හිස්වූ; මුසා, බොරු; විලපිත්ති, කීමියි; එවං වදෙය්‍ය, මෙසේ කියාද; අයම්පි, මේ මහණ ද, පාරාජිකො, පරාජයට පැමිණියේ; අසංවාසො හොති, සංවාස රහිත වේ.

සං:- **"අනභිජානං"** (අභි ජානාතීති, අභිජානං, න අභිජානං, අනභිජානං) "අභිජානන්ත" ශබ්දයාගේ "න්ත"භාගයට "අං" ආදෙශයයි. සිය සතන්හි උතුරු මිනිස්දම් නො උපන් හෙයින් තමා කෙරෙහි ඇතැයි නො දන යන අදහසයි.

සං:- **"උත්තරිමනුස්සධම්මං"** යනු (උත්තරි ච තෙ මනුස්සා චෙති, උත්තරිමනුස්සා; උත්තරී මනුස්සානං ධම්මො, උත්තරිමනුස්ස ධම්මො; තං උත්තරි මනුස්සධම්මං;) ප්‍රකෘති මනුෂ්‍යයන්ට වඩා අතිශයින් උත්කෘෂ්ට වූ ආර්යයන්ගේ ගුණධර්ම වූ ධ්‍යාන විමොක්ෂාදි ධර්මය යනාර්ථයි. ප්‍රකෘති මනුෂ්‍යයෝ භාවනා මනසි කාරාදියෙන් වෙන්ව ම දශකුශලකර්මපථය සිද්ධකර ගණිති. ධ්‍යානාදීහු වනාහි ඊට වඩා අතිශයින් ශ්‍රෙෂ්ඨ වෙති. එකී උතුම් ධ්‍යානාදියෙන් සමන්විත ආර්යයා "උත්තරිමනුස්ස" නම් වේ. ඔහුගේ ස්වභාව ධර්මයට උත්තරිමනුස්සධම්ම යයි කීහු.

සං:- **"අත්තුපනායිකං"** (අත්තනි තං උපනෙතීති, අත්තානං වා තස්මිං උපනෙතීති, අත්තුපනායිකො; තං අත්තුපනායිකං;) ධ්‍යාන විමොක්ෂාදී උතුරු මිනිස් දම් තමා කෙරෙහි විද්‍යමානයයි තමා කෙරෙහි ආරෝපණය කොට හෝ තමා උතුරු මිනිස් දම්හි නගා හෝ යන අදහසයි.

සං:- **"අලමරියඤාණදස්සනං"** (ඤාණඤ්ච තං දස්සනඤ්චාති, ඤාණදස්සනං: අරියං විසුද්ධං ඤාණදස්සනං, අරියඤාණදස්සනං, අලං පරියත්තං අරියඤාණ දසසනං, අලමරියඤාණදසසනං;) කෙලශ විධ්වංසනයට සමර්ථ වූ ආර්යයන්ගේ ඥාණදර්ශනය යනු අර්ථයි. ලෞකික ලොකොත්තර සියලුම ප්‍රඥවට සාමාන්‍යයෙන් "ඤාණ" යයි කියනු ලැබේ.

ඇසින් දුටුවාක් මෙන් සංස්කාරධර්ම ප්‍රත්‍යක්‍ෂකර ගන්නා හෙයින් "දස්සන"නම් වේ. කෙලෙස් උදුරා දැමීමට සුදුසු වූ පිරිසිදු ඤාණදස්සනය **අලමරියඤාණදස්සනය** වේ යනු භාවයි.

**සං:- "සමනුග්ගාහියමානො වා"** මෙහි සමනුගාහණය නම් ධ්‍යානාදී යම් යම් ධර්මයන් තමාසිත්සතන්හි ඇතැයි ප්‍රකාශ කළ කල්හි ඒ වස්තුවෙහි කිසිවෙකු විසින් තොප විසින් ලබන ලද්දේ කිනම් ධ්‍යානයෙක්ද? කවද ලැබුවෙහි ද? කොතැන්හිදී ලැබුවෙහි ද? කුමන කෙලශයෝ ප්‍රහීණකරණ ලද්දහු දැයි අසනු ලැබීම වේ.

**සං:- "විසුද්ධාපෙක්ඛො"** යමෙක් පරිජි අවත්තේ ද ඔහුට භික්‍ෂු භාවයෙහි සිට ධ්‍යානාදීන් ලැබගෙණ විශුද්ධිය ලැබිය නොහැක. එබැවින් ගිහි බව විශුද්ධියට උපකාර වේ. ගිහිභාවයේ සිට දන්දීමාදියෙන් ස්වර්ගීය ද ධ්‍යානාදියෙන් මොක්‍ෂය ද ලැබිය හැකිවේ. ඒ නිසා පාරාජිකාවට පැමිණියහුට ගිහිබව විශුද්ධිය වේ. මෙකී විශුද්ධිය බලාපොරොත්තු වූයේ යනුයි.

**සං:- "අඤ්ඤත්‍ර අධිමානා"** (අධිගතො මානො, අධිකො වා මානො; අධිමානො; තතො අධිමානා) අධිමානය නැතිව යනුයි. කලාප සම්මසනය කිරීම් වශයෙන් සංස්කාරයෝ අනිත්‍යයහ දුඃඛයහ අනාත්මයහ යන ත්‍රිලක්‍ෂණයට නගා විදර්ශනා වඩන්නා වූ ආරබ්ධ විදර්ශකයාහට ස්වසන්තානයෙහි උත්පත්තිවශයෙන් නොපැමිණි ධ්‍යානාදියෙහි මානය උපදී.

සමහර ශුද්ධසමථලාභි තැනැත්තේ හෝ ශුද්ධවිදර්ශනාලාභී තැනැත්තේ හෝ විසිතිස් වසක් මුළුල්ලෙහි කෙලශ සමුදචරණයක් නොදක්නේ මම සොතාපන්න වෙමි යි කියා හෝ සකෘදගාමි වෙමියි කියා හෝ අනාගාමි වෙමියි කියා හෝ සිතයි. සමථ විදර්ශනා ලාභීහුගේ සමාධිබලයෙන් කෙලශයෝ තදවූවාහු වෙති. විදර්ශනා බලයෙන් සංස්කාරයෝ සුපරිගෘහීත වෙති.

එහෙයින් සැටවසක් ද, අසූවසක් ද, සියක්වසක් ද, ගත වූයේ නමුත් කෙලශයෝ නොනැගෙති. එබැවින් ඒ පුද්ගලයා මම අර්හත් ම යයි සිතයි. මාර්ගඵලාදීන් හා ප්‍රහීණාප්‍රහීණ කෙලශප්‍රත්‍යවෙක්‍ෂා කිරීමෙන් සොම්නසට පැමිණි ආයර්‍යශ්‍රාවකයා හටද, ආයර්‍යගුණාධිගමනයෙහි ආශාරහිතදුශ්ශීලයාට ද, හැර දමණ ලද කමටහන් ඇත්තාවූ නිද්‍රාරාමාදියෙන් සමන්විත සිල්වතාට ද, යථොක්ත අධිමානය නො උපදනේය.

## උතුරුමිනිස්දම් පරිජ්යේ සප්තදශාකාරය.

1. නිදානය - වෙසාලියයි.

2. පුද්ගලයෝ - වග්ගුමුදතීරිය භික්‍ෂුහුයි.

3. වස්තුව - උත්තරිමනුස්සධම්මාරොචනයයි.

4. ප්‍රඥප්තිය "යො පන භික්ඛු අනභිජානං - පෙ - අසංවා සො"යි " අඤ්ඤත්‍ර අධිමානා"යි. යනු අනු ප්‍රඥප්තියයි.

5. ආණත්තිය - අනාණත්තික යි.

6. ආපත්තිය - පරිජි, තුලසි යන දෙකෙකි. (ප්‍රථම ධ්‍යානාදියට පැමිණියෙමියි ප්‍රකාශ කළ විට අසන තැනැත්තා එය සත්‍යයයි සිතා ද, එකල්හි අරෝචකයාට "පරිජි" වේ නොදනී ද "තුලසි" වේ.)

7. අනාපත්ති - අධිමානෙන ආරොචෙන්තස්ස, අනුල්ලපනාධිප්පායස්ස, උම්මත්තකාදිනඤ්ච යි මොවුන් හටයි.

8. විපත්තිය - සීලවිපත්තිය යි

9. අඞ්ග - උතුරුමිනිස්දම් තමා කෙරෙහි නැති බවද, පාපිච්ඡාවෙන් ආරොචනයද, අඤ්ඤපදෙස රහිත බවද, ආරොචනය කරණ කළ එය අසන්නා මිනිසෙකු වීමද, එකෙනෙහි දන ගැණීමද යන අඞ්ග පසෙක් වෙති.

10. සමුට්ඨාන - අදින්නාදනසමුට්ඨාන ය යි.

11. කිරියා - ක්‍රියා වශයෙනි.

12. සංඥාව - සඤ්ඤවිමොක්ඛ ය යි.

13. චිත්ත - සචිත්තකයි.

14. වජ්ජ - ලොකවජ්ජ ය යි.

15. කර්‍ම - කාය, වචී, කර්‍ම දෙකයි.

16. කුසලත්‍රිකය - අකුශල චිත්තය යි.

17. වෙදනාත්‍රිකය - දුක්ඛවෙදනාවයි.

මෙහි සාම න්තාපත්තිය "තුලසී"යි

**උතුරු මිනිස්දම් පරිජ් වර්‍ණනාව නිමි.**

# උතුරු මිනිස්දම් පරිජ්යෙහි නිදන කථාවස්තුව

ලොක ස්වාමි වූ තිලොගුරු බුදුරජානන් වහන්සේ විශාලා මහනුවර සමීපයෙහිවූ මහවෙනෙහි කූටාගාරශාලාවේ වැඩ වාසය කරණ සමයෙහි බොහෝ සන්දිට්ඨසම්භත්තභික්ෂූහු වග්ගු මුද නදී තීරයෙහි වස් එළඹුනෝය. එකල්හි වැදුරට දුර්භික්ෂයෙක් උපන. උඤ්ඡාචාරයෙන් ජීවිත යාපනය දුෂ්කර වූයේය. එසේ ඇති කල්හි ඒ භික්ෂූන්ට මෙබඳු සිතෙක් විය. "මෙකල වැදුරට දුර්භික්ෂයෙන් පෙළෙයි. අපිදු පිණ්ඩවයහීංවෙන් දිවි පැවැත්වීමට නොහැකි වූවෝ වෙමු. කවර නම් උපායෙකින් සමගිව සැපසේ වස් වසන්නෙමුද ආහාරයෙන් කෙසේ නම් කලාන්ත නොවන්නෝ වෙමුදැ"යි කියායි.

එකල්හි ඇතැම්හු මෙසේ කීහ. කෙසේද? ඇවැත්නි! ගිහින්ගේ කර්මාන්ත අධිෂ්ඨාන කරවු. එසේ ඇති කල්හි ඔවුහු පිණ්ඩදනයෙන් අප පොෂණය කරන්නාහුය කියායි. තවත් සමහරු ඇවැත්නි! ගිහීන්ගේ කර්මාන්ත අධිෂ්ඨානයෙන් කම් කිම? අපි ගිහීන්ගේ දූත ක්‍රියාවෙහි යෙදෙමු. එසේ ඇතිකල්හි අපට පිණ්ඩදනයට නොමැලි වෙති යි කීවාහුය. ඇතැම්හු ඇවැත්නි ! ගිහින්ගේ කර්මාන්තාධිෂ්ඨානයෙන් හා දූතෙය්‍ය කර්මයෙන් ප්‍රයෝජන නැති, අපි එසේ නම් ගිහින්ගේ සමීපයෙහි අසුවල් භික්ෂුතෙමේ ප්‍රථම ධ්‍යාන ලාභීය. අසුවල් අසුවල් භික්ෂූහු ද්විතීය ධ්‍යානාදිධ්‍යානලාභීහුය යි. මේ ආකාරයෙන් අප තුළ නොමැති උතුරුමිනිස්දම් පිළිබඳ වර්ණනාව ප්‍රකාශ කරමු. එසේ ඇති කල්හි අපට ඔවුහු පිඩුදෙන්නාහුය. එවිට අපි සැපසේ වස්වසන්නෙමු යයි කීහ. ඇවැත්නි! සියල්ලටම වඩා ඒ උපාය ම මැනැවයි කියා ගිහීන්ගේ සමීපයේ දී ඔවුනොවුන්ගේ උතුරුමිනිස්දම් පිළිබඳ වර්ණනාව කළාහුය.

එකල්හි වැදුරට වැසි මනුෂ්‍යයෝ "අපට වූයේ ඉතා ලාභයෙක, මෙවැනි සිල්වත් ගුණවත් භික්ෂූහු පෙර මෙහි වස් නොඑළඹියාහුය කියා, තුටු පහටුවූවෝ ඒ භික්ෂූන්ට ප්‍රණීත වූ ආහාරපානාදිය දීමෙන් උවටැන් කළාහුය. ඒ භික්ෂූහුත් එතැන් පටන් රසමුසු අහරින් පිණාගිය ඉඳුරන් ඇත්තෝ වර්ණවත් වූහ.

වස් පවාරණයෙන් පසු පළමු කොට බුදුන් දකින්නට යන චාරිත්‍ර ධර්මයෙක් එකලැ පැවැත්තේය. ඒ භික්ෂූහුත් තෙමසක් එහි ගත කොට පවාරණය කළෝ සෙනසුන් නොනයිනසේ සකස් කොට තබා පා සිවුරු ගෙණ බුදුරජානන්වහන්සේ දකිනුවස් ගියාහුය.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො චත්තාරො පාරාජිකා ධම්මා යෙසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා න ලභති භික්ඛුහි සද්ධිං සංවාසං යථා පුරෙ තථා පච්ඡා පාරාජිකො හොති අසංවාසො.

තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි: කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථා යස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

## පාරාජිකුද්දෙසො නිට්ඨිතො.

---

එසේ ගිය භික්ෂූහු සර්වඥයන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය. එකල අන්දිගාවල විසූ භික්ෂූහු දුර්වර්ණව ගියෝ කෘශව ගියෝ නහරින් වෙළුවන ශරීර ඇත්තෝ වූවාහුය. වග්ගුමුදුතීරයේ භික්ෂූහු වනාහි විශෙෂයෙන් පහත් ඡවිවර්ණ ඇත්තාහු පිණාගිය ඉඳුරන් ඇත්තෝය. සැපවත් වූවෝය.

ආගන්තුක භික්ෂූන් සමග සතුටින් කථා කොට සුදුසු අවවාදයක් කිරීම තථාගතවරයන්ගේ සිරිත වේ. ඒනිසා භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදුතීරීය භික්ෂූන්ගෙන් මෙසේ අසාවදාළසේක. මහණෙනි! සමගිව විවාද නොකොට සැපසේ වස්විසුවාහුද? කිම, පිණ්ඩයෙන් ක්ලාන්ත නූවූවා හුද? යි කියායි. එසේය භාග්‍යවතුන් වහන්සැයි උත්තර දුන්නහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ නැවතත් මෙසේ අසා වදාළසේක. මහණෙනි! තෙපි කෙසේනම් සමගිව සැපසේ විසූද? කෙසේ පිණ්ඩයෙන් ක්ලාන්ත නොවූවාහු දැයි කියායි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සරුණු තත්වූ පරිදි කීහ. මහණෙනි! කිම සත්‍යවූවක් ප්‍රකාශ කලාහුද? භාග්‍යවතුන් වහන්ස! අසත්‍ය වූවක්ම කීවෙමුයි කීහ.

එකල්හි බුදුරජාණන් වහන්සේ තෙපි නුසුදුසුවූවක් ශ්‍රමණ සාරුප්‍ය නොවූවක්ම කළාහුය. මොඝ පුරුෂයිනි! කෙසේ නම් තෙපි උදර පූරණය සඳහා ඔවුනොවුන්ගේ උතුරු මිනිස්දම් පිළිබඳ වර්ණනය කළාහුද? ගවමස් කපන තියුණු අවියකින් තොපගේ කුස කපා දමන උන්දේ නම් යෙහෙක; උදරපූරණය සඳහා අවිද්‍යමාන උතුරුමිනිස් දම් ප්‍රකාශ කිරීම නොහොබනේය. යන ආදීන් වදරා දැහැමි කථාවක් කොට

උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං, උද්දිට්ඨා චත්තාරො පාරාජිකා ධම්මා, සුතා ඛො පනායස්මන්තෙහි තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා, ද්වෙ අනියතා ධම්මා, තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, ද්වෙනවුති පාචිත්තියා ධම්මා, චත්තාරො පාටිදෙසනීයා ධම්මා, පඤ්චසත්තති සෙඛියා ධම්මා, සත්ත අධිකරණසමථා ධම්මා, එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති; තත්ථ සබ්බෙහෙව සමග්ගෙහි සම්මොදමානෙහි අවිවදමානෙහි සික්ඛිතබ්බන්ති.

---

**"පඤ්චිමෙ භික්ඛවෙ චොරා"** යන ආදි දෙශනාවද වදළසේක. ඉක්බිති වග්ගුමුදාතිරිය භික්ෂූන්ට නොයෙක් ආකාරයෙන් ගර්හා කොට "යො පන භික්ඛු අනභිජානං උත්තරි මනුස්සධම්මං අත්තුපනායිකං" යනාදි ප්‍රඥප්තිය වදළසේක.

---

**අර්ථ:-** ආයස්මන්තො, ඇවැත්නි; චත්තාරො පාරාජිකා ධම්මා, සතර පාරාජිකාපත්තීහු; උද්දිට්ඨා ඛො, උදෙසන ලදහු; භික්ඛු, මහණතෙම; යෙසං, යම් පාරාජිකාපත්තිකෙණෙකුන් අතුරෙන්; අඤ්ඤතරං වා, අඤ්ඤතරංවා, එක්තරා එක්තරා පාරාජිකාවකට; ආපජ්ජිත්වා පැමිණ; භික්ඛූහි සද්ධිං, සිල්වත් භික්ෂූන් සමග; සංවාසං, එක කර්මාදී භෙද ඇති සංවාසය; න ලභති, නොලබයිද; පුරෙ යථා, ගෘහස්ථානුපසම්පන්න කාලයේ යම්සේද; පච්ඡා, පසුව; පාරාජිකො, පරිජිවූයේද; තථා, එසේම; අසංවාසො හොති, භික්ෂූන් හා සමග සංවාස නැත්තේ වේ ද; එසේ වූ සතර පාරාජිකාපත්තීහු උදෙසන ලදහයි සේයි.

තත්ථ, ඒ සතර පාරාජිකාවෙහිලා; ආයස්මන්තෙ,ඇවතුන්; පුච්ඡාමි, විචාරමි. එත්ථ, මේ සතරපාරාජිකාවෙහි; පරිසුද්ධා කච්චි, කිම පිරිසිදුද? දුතියම්පි පුච්ඡාමි, දෙවන වටහිදු විචාරමි; එත්ථ, මේ පාරාජිකාවෙහි; පරිසුද්ධා කච්චි, කිම පිරිසිදුද? තතියම්පි පුච්ඡාමි, තුන්වන වටහිදු විචාරමි. එත්ථ, මේ පාරාජිකාවෙහි; පරිසුද්ධා කච්චි, කිම පිරිසිදුද? ආයස්මන්තො, ආයුෂ්මත්හු; එත්ථ, මේ සතර පාරාජිකාවෙහි; පරිසුද්ධා, පිරිසිදුයහ; තස්මා, එහෙයින්; තුණ්හී, තුෂ්ණිම්භූතයහ; එතං, මේ තුණ්හී භාවය; එවං ධාරයාමි, මෙසෙයින් දරමි. පිරිසිදු හෙයිනැයි සලකමි.

**පාරාජිකුද්දෙසය නිමියේයි.**

---

**සංලක්ෂ්‍යය:-** උද්දිට්ඨා ඛො ආයස්මන්තො චත්තාරො පාරාජිකා ධම්මා"යි මේ භික්ෂු ප්‍රාතිමොක්ෂයෙහි මෙවුන්දම් පරිජිය ආදී සතර පරිජිම උදෙසන ලද බැව් කීහු.

තන්හි තන්හි දක්වෙන චතුවීසති පරිජි මෙහිදී දත යුත්තාහුයි. භික්ෂු භික්ෂුනීන්ට සාධාරණ පරිජි සතරද, උබ්භජානුමණ්ඩලිකා, වජ්ජ පටිච්ඡාදිකා, උක්ඛිත්තානුවත්තිකා, අට්ඨවත්ථුකා, යන අසාධාරණ පරිජි සතරදැයි අටෙකි.

එකාදශ අභව්‍ය පුද්ගලයන්ගේ අභව්‍ය පරිජි එකොළොසෙකි. ගිහිබව පතන භික්ෂුනීන්ගේ "විබ්භන්ත" පරිජියද, ලම්බී, මුදුපිට්ඨිකො, පරස්ස අඞ්ගජාතං මුඛෙන ගණ්හාති, පරස්ස අඞ්ගජාතෙ අභිනිසීදති යන අනුලොම් පරිජි සතරදැයි මෙසේ සූවිසි පරිජි වෙති.

"තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා" යනාදිය අනුසාවණයයි.

**අර්ථ:-** ආයස්මන්තො, ඇවැත්නි; උද්දිට්ඨං ඛො නිදනං, නිදනය උදෙසන ලද; චත්තාරො පාරාජිකා ධම්මා, සතර පාරාජිකාපත්තීහු; උද්දිට්ඨා, උදෙසන ලදහ. ආයස්මන්තෙහි, ඇවතුන් විසින්; තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා, තෙළෙස් සඞ්ඝාදි සෙසාපත්තීහුද; ද්වෙ අනියතා ධම්මා; ද්විධ අනියතාපත්තීහුද; තිංසනිස්සග්ගියා පාචිත්තියා ධම්මා, තිස්නියහි පචිති ඇවැත්ද; ද්වෙනවුති පාචිත්තියා ධම්මා, දෙයානූ පිචිති ඇවැත්ද; චත්තාරො පාටිදෙසනීයා ධම්මා, සතර පාටිදෙසනීයාපත්තීහුද; පඤ්චසත්තති සෙඛියා ධම්මා, පස්සැත්තෑවක් ශෛක්ෂ ධර්මයෝද; සත්ත අධිකරණ සමථා ධම්මා, සප්තවිධ අධිකරණ සමථ ධර්මයෝද; සුතා ඛො පන, අසනලදහ. තස්ස භගවතො, ඒ භාග්‍යවත්හුගේ; සුත්තාගතං, ප්‍රාතිමොක්ෂයෙහි ආවාවූ; සුත්තපරියාපන්නං, ඒ සූත්‍රයෙහි ඇතුළත් වූ; එත්තකං, මෙතෙක් සිකපද; අන්වඩ්ඪමාසං, අර්ධමාසයෙහි; අර්ධමාසයෙහි; උද්දෙසං ආගච්ඡති, (පො හෝ විසින් ) උදෙසිය යුතු බවට පැමිණෙයි. තත්ථ, ඒ ඒ ශික්ෂා පදයෙහි; සමග්ගෙහි, සමගිවූ; සම්මොදමානෙහි, මනාකොට ප්‍රමුදිතවූ; අවිවදමානෙහි, විවාද නොකරන්නාවූ; සබ්බෙහෙව, හැමදෙනා විසින්ම; සික්ඛිතබ්බං, හික්මිය යුතුයි. හෙවත් ඒ ඒ ශික්ෂාපද නොයික්මවා අධිශීල ශික්ෂා තොමෝ සම්පාදනය කටයුත්තීයි.

**සං:-** ප්‍රාතිමොක්ෂය සම්පූර්ණයෙන්ම දෙසීම නියම විධිය වේ. එහෙත් අත්‍යාවශ්‍යක කරුණක් වුව හොත් පාරාජික සංඝාදි සෙසාදි

ඉමෙ බො පනායස්මන්තො තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති,

1. සඤ්චෙතනිකා සුක්කවිසට්ඨි අඤ්ඤත්‍ර සුපිනන්තා සඞ්ඝාදි සෙසො;

---

කාණ්ඩයෙකැ අවසානයේදී 'සුතා බො පනායස්මන්තෙහි" යනාදිය අස්වා නැවැත්විය යුතුයි. නිදනොද්දෙශාවසානයේදී පාමොක් නවත්වා විසිර යා නොහැක්කේය.

**භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ පාරාජික කාණ්ඩය නිමි.**

---

**අර්ථ:-** ආයස්මන්තො, ඇවැත්නි! සඞ්ඝාදිසේසා, "සඞ්ඝාදිසෙස"නම් වූ, ඉමෙ බො පන තෙරස ධම්මා, මේ තෙළෙස් ආපත්තීහු, උද්දෙසං (ස්වරූපයෙන්) උදෙසිය යුතු බවට, ආගච්ඡන්ති, පැමිණෙත්.

1. සඤ්චෙතනිකා, ව්‍යතික්‍රම වශයෙන් පැවැත්තාවූ පූර්වභාග චෙතනා ඇති හෙවත් මොචනාස්වාද චෙතනා ඇති; සුක්ක විසට්ඨි, සමහව විස්සජ්ජනය හෙවත් ශුක්‍ර මොචනය, අඤ්ඤත්‍ර සුපිනන්තා, ස්වප්නයෙහි (හිනෙහි) වන්නාවූ ශුක්‍ර මොචනය හැර, සඞ්ඝාදිසෙසො, සංඝාදිසෙස; නම් වූ ආපත්ති නිකායෙක් වේ.

**සංලක්ෂය:-** **"උද්දෙසං ආගච්ඡන්ති"** යනු නිදනොද්දෙශ යෙහි මෙන් "යස්ස සියා ආපත්ති" කියා සර්වසාධාරණ වාඞ්මාත්‍රයෙන් නොව මෙහි උදෙසනු ලබන්නාවූ තෙළෙස් සහ වෙසෙස් ඇවැත් තමතමන්ගේ ස්වරූපයෙන් උදෙසිය යුතු බවට පැමිණෙති යන අදහසයි.

**සං:-** **"සඤ්චෙතනිකා"** (සංචිජ්ජති චෙතනා යස්සා සා; සඤ්චෙතනා, ("සං" පූර්ව "චිති" ධාතුවයි.) සඤ්චෙතනා එව; සඤ්චෙතනිකා, (ස්වාර්ථයෙහි "ණික" ප්‍රත්‍යයයි) නොහොත් සඤ්චෙතනා අස්ස අත්ථීති; සඤ්චෙතනිකා,) අස්ත්‍යර්ථයෙහි "ණික"යි.) මොචනාස්වාද චෙතනා සහගතව යන අදහසයි.

**සං:-** **"සුක්කවිසට්ඨි"** සුක්කස්ස විසට්ඨි; සුක්කවිසට්ඨි; මෙයින් රාගාදී පස් අයුරෙන් එක්තරා ක්‍රමයෙකින් අඞ්ගජාතය මොචන කර්මක්ෂමවූ කල්හි අධ්‍යාත්මික රූපාදිය විෂය කොටගෙණ ආරෝග්‍යාදි යම්කිසි අභිප්‍රායයක් ඉෂ්ටකරගැණීම පිණිස මොචනස්වාදචෙතනා සහගතව ශුක්‍රධාතු විසර්ජනය හෙවත් ධාතාවාවනය ප්‍රකාශ වේ.

## ශුක්‍ර ධාතු පිහිටි ස්ථාන නම්:-

ඇතැම් ආචාර්‍ය්‍යයෝ "වස්තිශීර්ෂය" ද, ඇතැම්හු "කටිය" ද, ඇතැම්හු සකල ශරීරය ම ද, ශුක්‍ර ධාතුස්ථානය යයි කීහු. එහෙත් මල, මූත්‍ර, කෙළ, වියලි සම්, ආදී ද්‍රව්‍යයන් හැර ශරීරයේ කාය ප්‍රසාදය පවත්නා සියලු අඟ පසඟෙහි ම ශුක්‍ර ධාතුව පිහිටියේය. එබැවින් සියලු ශරීරය ම ශුක්‍ර ධාතුවට ස්ථානයයි සැලකිය යුත්තේය.

ශුක්‍ර ධාතුවල භෙද දශයෙකි. එනම්:- නීල, පීත, ලොහිතක, අවදාත, තක්‍රවර්ණ, දකවර්ණ, තෙල වර්ණ, ක්ෂීරවර්ණ, දධිවර්ණ, සප්පිවර්ණ, යනුයි.

මෙහි දක්වුන දශප්‍රකාර ශුක්‍රධාතුවට යම් තැනක් ස්ථාන වූයේ නම් එතැනින් මිදීම හෙවත් ස්ථානාචාවනය ම "සුක්ක විසට්ඨි" යනුවෙන් කිය වේ.

ක්‍රම වශයෙන් ගත් කල්හි සඤ්චෙතනා සුක්කවිසට්ඨියෙන් ම සඟ වෙසෙස් ඇවැත් දෙදහසක් සිඩවන බැව් අර්ථකථාවෙහි පෙණෙයි.

මෙහි ප්‍රකාශිත සඤ්චෙතනා සුක්කවිසට්ඨිය, උපාය, කාල, අභිප්‍රාය, වස්තු, යන කරුණු අතුරෙන් අන්‍යතර කරුණක් හෝ කීපයක් හෝ නිමිතිකොට ගෙණ කළයුතු වේ.

උපාය:- අධ්‍යාත්මික රූපයෙහි ද, බාහ්‍ය රූපයෙහි ද, අධ්‍යාත්මික බාහ්‍ය රූපද්වයයෙහි ද, ආකාශයේ කටි කම්පනය කිරීමෙන් දැයි සතරෙකි.

කාල:- රාගයෙන්, වර්චසින්, ප්‍රස්‍රාවයෙන්, වාතයෙන්, උච්චාලිඞ්ග ප්‍රාණීන් දෂ්ට්‍රකිරීමෙන් යන පස් ආකාරයෙන් ලිඞ්ගය කම්ක්ෂම වේ. මේ කාල පස නම්.

අභිප්‍රාය:- නීරෝගබව, සුඛස්වාදය, බෙහෙත්, දානය, පින්, යාගය, ස්වර්ගීය බීජය, පරීක්ෂණය, ක්‍රීඩාව පිණිසය යන අභිප්‍රාය දසයකි.

වස්තු:- නීලය, පීතය, ලොහිතකය, අවදාතය, තක්‍රවර්ණය, දකවර්ණය, තෙල වර්ණය, ක්ෂීරවර්ණය, දධිවර්ණය, සප්පි වර්ණය යන දශ ප්‍රකාර ශුක්‍ර ධාතුහු දශ වස්තු වෙති. ලිඞ්ගය රාගයෙන් කර්මණ්‍ය වූ කල්හි නිරෝගී බැව් පිණිස අධ්‍යාත්මික රූපයෙහි නීලවර්ණ ශුක්‍ර ධාතුව මුදන්නෙමියි සිතා ශුක්‍රමොචනය කරන්නහුට එක් ඇවතෙක් වේ.

එසේම සෙසු නවවිධ වර්‍ණය වෙන් වෙන් වශයෙන් මුදන්නහුට ඇවැත් නවයෙක්දැයි කියා රාගයෙන් කර්‍මණ්‍ය වූ කල්හි නීරෝග බැව් පිණිස අධ්‍යාත්මික රූපයෙහි සඞ්ඛ්‍යාදිසෙස දශයෙකි.

මෙසේම සෙසු අභිප්‍රාය නවය පිළිබඳව ද දසය බැගින් වේනුයි සහ වෙසෙස් සියයෙකි.

එසේම අධ්‍යාත්මික රූපය විෂය කොට වර්චසින් කර්‍මණ්‍යවූ කල්හි සියයෙකි. ප්‍රස්‍රාවයෙන් කර්‍මක්‍ෂම වූ කල්හි සියයෙකි. වාතයෙන් කර්‍මක්‍ෂම වූ කල්හි සියයෙකි. උච්චාලිඞ්ගප්‍රාණීන් දෂටකිරීමෙන් කර්‍මණ්‍ය වූ කල්හි සියයෙකි. මෙසේ අධ්‍යාත්මික රූපය විෂය කොට සහවෙසෙස් පන්සියයෙකි.

එසේම බාහ්‍ය රූපය විෂය කොට සහ වෙසෙස් පන්සියයෙකි. අධ්‍යාත්මික බාහ්‍ය රූපද්වය විෂය කොට පන්සියයෙකි. ආකාශයේ කටි කම්පනය කිරීමෙන් පන්සියයකි. මෙසේ ගත්කලැ සංඛ්‍යාදිසෙස දෙදහස සම්පූර්‍ණ වේ.

සං:- **"අඤ්ඤත්‍ර සුපිනන්තා"** (සුපිනො එව, සුපිනන්තා, මෙහි "අන්ත" යනු ස්වාර්ථයෙහි යෙදිනි.) ස්වප්නයෙහි වන්නාවූ ශුක්‍ර මොචනයෙන් ඇවැත් නොවෙයි. සඤ්චෙතනාවක් නැති බැවිනි.

එබැවින් අනුපඤ්ඤත්තියක් වශයෙන් නැවත ශික්ෂාපදයට අන්තර්ගත කොට දෙශනා කරණ ලදී..

**ස්වප්න පිළිබඳ විනිශ්චය මෙසේ දතයුතුයි.**

ස්වප්නයෝ (සිහින) වනාහි "ධාතුක්‍ෂොභ" වශයෙන් හෝ "අනුභූත පූර්‍වාරම්මණ" වශයෙන් හෝ "දෙවතොපසංහාර" වශයෙන් හෝ "පූර්‍ව නිමිත්ත" වශයෙන් හෝ සිවු අයුරකින් පෙණෙති.

වා පිත් ආදී දෙස් කිපීමෙන් ධාතුන්ගේ කිපීම වෙයි. එකල්හි ගස් ගල් පර්‍වතාදියෙන් පතිත්නාක්මෙන් ද, හස්ති, සිංහ, ව්‍යාඝ්‍රාදීන් විසින් ලුහුබඳිනු ලබන්නාක් මෙන් ද, අහසෙහි ගමන් කරන්නාක් මෙන් දැයි මෙසේ නොයෙක් ආකාරයෙන් පෙණෙත් නම් ඒ "ධාතුක්‍ෂොභ" වශයෙනි, තමන් කලින් දකින ලද කරන ලද කියන ලද දෙයක්ම සිහිනයෙනුත් පෙණෙයි නම් ඒ "අනුභූත පූර්‍වාරම්මණ" වශයෙනි. දෙවතාවෝ හිත කැමැත්තෝ හෝ අහිත කැමැත්තෝ හෝ ඉෂ්ට'නිෂ්ට අරමුණු පෙන්වත් නම් ඒ "දෙවතොපසංහාර" වශයෙනි.

බෝසත් මවගේ පුත්‍රලාභ සවප්නය මෙන් මතු සිදුවිය හැකි යහපතක් සඳහා හෝ කොසොල් මහරජුගේ සොළොස් අයුරු සිහිනය මෙන් මතු සිදුවිය හැකි අයහපතක් සඳහා හෝ යම් සිහිනයක් පෙණෙයි නම් ඒ කුශලාකුශල වශයෙනි. හෙවත් 'පූර්ව නිමිති' වශයෙනි.

මෙයින් ධාතුක්ෂොභ වශයෙන් හා අනුභූතපූර්වාරම්මණ වශයෙන් පෙණෙන සිහින විපාක නොදෙති.

දෙවතොපසංහාර වශයෙන් පෙණෙන සිහින ඇතැම්විට විපාක දෙයි, ඇතැම්විට අවිපාකය.

පූර්වනිමිති වශයෙන් පෙණෙන සිහින එකාන්තයෙන්ම විපාක දෙයි, අශෛක්ෂයන් හැර සෙස්සන්ට සිහින පෙණේ.

චිත්තය තමා අරමුණු කරා නොගොස් භවාඞ්ග වීමම නිදීමයි. භවාඞ්ග චිත්තයට රූපාදි අරමුණු නැත. එබැවින් නිදිගත් කල්හි සිහින නොපෙණේ; යම් හෙයකින් නිදිගත් කල්හි සිහින පෙණේ යයි කිව හොත් අභිධර්ම විරොධය වේ.

නිදිවර්ජිත වූවහුට සිහින පෙණෙයි කිව හොත් විනය විරෝධය වේ. සංවොහාරික චිත්තයෙන් ශික්ෂාව්‍යතික්‍රමනයෙන් ඇවැත් සිදුවන හෙයිනි.

නොනිදි නොපිබිදි කල්හි සිහින පෙණේ යයි සැලකුව හොත් නිදිගත් කෙණෙක් නොපෙණෙත්.

කරුණු මෙසේ හෙයින් නිතර නිතර නිදීමත් අවදිවීමත් ඇති කෙණෙකුට හෙවත් අඩක් නිදිගත් කෙනෙකුට සිහින පෙණේ යි කිය යුතුයි. එබැවින් නාගසේන ස්ථවිරයන් වහන්සේ මිලිඳු රජතුමාට **"කපිමිද්ධ පරෙතො ඛො මහාරාජ සුපිනං පස්සති"** යී දෙශනා කළසේක.

සං:- **"සඞ්ඝාදිසෙසො"** (සංඝො ආදිම්හි චෙව සෙසෙ ච ඉච්ඡිතබ්බො අස්සා 'ති; සංඝාදිසෙසො) මේ ඇවැත් සමූහයෙන් පිරිසිදුවීම සඳහා මුලදී පිරිවෙස් දීමටත්, මැදදී මානත්දීමට හා මූලාය පටිකස්සනය (මුලට ඇදීම) කිරීමට සුදුස්සන්ට ඒ සඳහාත් අගදී අබ්භාහන කර්‍මයටත් සංඝයා ලැබියයුතු බැවින් "සංඝාදිසෙස" නම්

**සඞ්ඝාදිසෙස කාණ්ඩයේ ප්‍රථම ශික්ෂාපදයෙහි සප්තදශාකාරය.**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයා | - | සෙය්‍යසක භික්‍ෂුය. |
| වස්තුව | - | උපක්‍රම කොට අසුචි (ශුක්‍ර ) මොචනයයි. |
| ප්‍රඥප්තිය | - | (සඤ්චෙතනිකා සුක්කවිසට්ඨි සඞ්ඝාදිසෙසො යනුයි (අසාධාරණ ප්‍රඥප්තියි.) (අඤ්ඤත්‍ර සුපිනන්තා යනු අනුප්‍රඥප්තියයි.) |
| ආණත්තිය | - | අනාණත්තිකයි. |
| ආපත්ති | - | සඞ්ඝාදිසෙස-ථුල්ලච්චය යන දෙකකි. |
| අනාපත්ති | - | "අනුපක්කමන්තස්ස, අමොචනාධිප්පායස්ස, සුපිනං පස්සන්තස්ස, උම්මත්තකාදීනඤ්ච" යන මොවුන්ටයි. |
| විපත්තිය | - | ශීලවිපත්තියයි. |
| අඞ්ග | - | චෙතනා, උපක්කමො, මුච්චනං යන තුනෙකි. |
| සමුට්ඨාන | - | කාය, චිත්ත සමුට්ඨානයි. |
| කිරියා | - | ක්‍රියා වශයෙනි. |
| සඤ්ඤව | - | සඤ්ඤා විමොක්ඛයයි. |
| චිත්තය | - | සචිත්තකයි. |
| වජ්ජය | - | ලොකවජ්ජයයි. |
| කර්‍ම | - | කායකර්‍මයි. |
| කුශලත්‍රිකය | - | අකුශල චිත්තයයි. |
| වෙදනාත්‍රිතය | - | දුක්ඛවෙදනායි. |

**ප්‍රථම සංඝාදිසෙස වර්‍ණනාව සමාප්තයි.**

# ප්‍රථම සංඝාදිසෙසාපත්තියෙහි නිදාන කථාව

එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර අනේපිඩුමහසිටානන්ගේ අරම්හි වැඩවසන සේක. එසමයෙහි සෙය්‍යසක තෙරුන්වහන්සේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යයෙහි නොඇලී වාසය කෙරෙති. උන්වහන්සේ ඒ හේතුවෙන්ම කෘශව ගියාහු දුර්වර්ණව නහරින් වැකුණු සිරුරින් යුක්තවූවාහුය. එක් දවසක් ආයුෂ්මත් උදයී ස්ථවිරයන් වහන්සේ එබඳු ස්වභාවයට පැමිණි සෙය්‍යසක ස්ථවිරයන් දක මෙසේ විචාළාහුය. කෙසේද? ඇවැත්නි! කුමක් නිසා බඹසර නොඇලුනෙහිද? කවර හේතුවකින් දුර්වර්ණව කෘශව ගියෙහි දැයි කියායි. සෙය්‍යසක තෙරුන්වහන්සේ ඊට කරුණු කියා පෑවාහුය. එකල්හි උදයී ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි! එසේ නම් හැකිතාක් මිහිරි ආහාර පානාදිය බුදිමින් කැමතිතාක් සයනය කරමින් සුවසේ වාසය කරව යම්විටෙකැ තොපට අනභිරතියක් උපන හොත් එකල්හි හස්තයෙන් උපක්‍රම කොට අසුචි (ශුක්‍ර) පහ කරව"යි කීහ. වහන්ස! ඒ අපට කැපද? "එසේය, මම ද එසේ කරමි" යි කීහ.

එතැන් සිට උදයී ස්ථවිරයන්වහන්සේගේ බස් පරිදි මිහිරි ආහාර පානාදිය අනුභව කොට සැපසේ සයනය කරමින් සිටිනාතර පිනාගිය ඉඳුරන් ඇත්තේ රාගයෙන් සිත මැඩෙන කල්හි අතින් උපක්‍රම කොට අසුචි පහ කෙරෙයි. එකල්හි සෙය්‍යසක තෙරුන්ගේ සහාය භික්ෂූහු "ඇවැත්නි! පෙර තෙපි කෘශව දුර්වර්ණව ගියාහුය. දැන් වූ කලි පිණාගිය ඉඳුරන් ඇත්තහුය. එසේම පිරිසිදු ඡවිවර්ණ ඇත්තහුය. කිම? බෙහෙත් කළහු ද" යි විචාළාහුය. ඇවැත්නි! මම කිසිත් බෙහෙතක් නොගතිමි. එහෙත් දැන් හැකිතාක් මිහිරි ආහාරපානාදිය අනුභව කරමි. එසේම සයනය කරමි. යම්විටෙක රාගයක් උපනි නම් එකලැ අතින් උපක්‍රම කොට අසුචි පහ කෙරෙමියි කීයේය. එකලැ භික්ෂූහු ඇවත යම් අතකින් සද්ධාදෙය්‍යය අනුභව කරමින් ඒ අතින්ම උපක්‍රම කොට කිම? අසුචි මුදන්නෙහි දැයි විචාළාහුය. එසේය, ඇවැත්නි ! කියා උත්තරය දුන්නේය. එකල්හි අල්පෙච්ඡ භික්ෂූහු උසස් කොට නුගුණ පළ කොට තථාගතයන්වහන්සේට සැළ කළෝය.

තථාගතයන්වහන්සේ සෙය්‍යසක තෙරුන්ගෙන් එය අසා වදරා නොයෙක් අයුරින් නින්‍දා කොට භික්ෂූන්ගේ ආයතිසංවරය සඳහා මේ ශික්ෂාපදය පණවා වදළ සේක.

2. යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය. හත්ථගාහං වා වෙණිගාහං වා අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අඞ්ගස්ස පරාමසනං සඞ්ඝාදිසෙසො

---

2. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක්තෙම; ඔතිණ්ණො, (අබ්භන්තරයෙහි උපන්) කායසංසර්ග රාගයා විසින් බැස ගන්නාලද්දේ නොහොත් තෙමේ කායසංසර්ග රාගයට බටුයේ, විපරිණතෙන චිත්තෙන, (කායසංසර්ග රාගය කරණ කොට ගෙණ ) ප්‍රකෘති ස්වභාවය විජහනය කළාවූ (පෙරලුනාවු) සිතින්; මාතුගාමෙන සද්ධිං, මිනිස් අඟනක් සමග; කායසංසග්ගං, කයින් කය ස්පර්ශකිරීම (තැවරීම) ට; කෙසේද? හත්ථගාහං වා, අත (අල්වා) ගැණීමට හෝ; වෙණි ගාහං වා, ගෙතු නොගෙතු කෙහෙ (අල්වා) ගැණීමට හෝ, අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්සවා අඞ්ගස්ස, අනික් අනික් අඟ පසඟ; පරාමසනං වා, පරාමර්ශනයට (අතගෑමට) හෝ; සමාපජ්ජෙය්‍ය, පැමිණියේ නම්; සඞ්ඝාදිසෙසො, (ඒ මහණහට ) "සඞ්ඝාදිසෙස නම් වූ ආපත්තිනිකායෙක් වේ.

**සං:- "ඔතිණ්ණො"** (අවතරීයතෙ'ති, ඔතිණ්ණො, අවතරතීති වා; ඔතිණ්ණො, "අව" පූර්ව "තර" ධාතුවයි, ධාත්වන්තය සමග ත ප්‍රත්‍යයට "ඉණ්ණ" ආදෙශ වී "අව" උපසර්ගයට "ඔ" ආදෙශ යද වී සිද්ධ කෘදන්ත නාමයෙකි.) කාය සංසර්ග රාගයා විසින් බැස ගන්නා ලද්දේ කියා කර්ම සාධන වශයෙන් හෝ කාය සංසර්ග රාගයට තෙමේ බටුයේ කියා කර්තෘ සාධන වශයෙන් හෝ අර්ථ දනගත යුත්තේය.

පද භාජනයෙහි, "ඔතිණ්ණො" නාම, සාරත්තො අපෙක්ඛවා පටිබද්ධචිත්තො"යි කීහු.

**සං:- "විපරිණතෙන චිත්තෙන"** පිරිසිදු භවාඞ්ග සන්තති (පරම්පරා) සංඛ්‍යාත ප්‍රකෘතිය විජහනය කොට අන් අයුරකින් පැවතුනාවූ හෝ විරූපව පෙරළුනාවූ සිතින් යන අදහසයි. රාගයෙන් ද්වේෂයෙන් මොහයෙන් සිත පෙරෙළෙයි. එහෙත් මෙහි කායසංසර්ග රාගයෙන් පෙරළුන සිතින් යයි සැලකිය යුතුයි.

**සං:- "මාතුගාමෙන සද්ධිං"** (මාතුයා විය ගාමො යස්සා සා, මාතුගාමො; මාතුයා සම්භාවං මිස්සීභාවං ගච්ඡතීති වා, මාතුගාමො. "ණ" ප්‍රත්‍යයයි. තෙන මාතුගාමෙන, සහාර්ථයෙහි තෘතීයාවයි.) මෙයින් යටත් පිරිසෙයින් එදවසැ උපන්නාවූ ජීවමාන මනුෂ්‍ය ස්ත්‍රියක් නමුදු ගැණේ. යක්ෂ, ප්‍රේත, තිරිසන් ස්ත්‍රීහු නොගැණෙති.

**සා:- "කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය"** යනු හස්ත ග්‍රහණාදී කාය සංප්‍රයොගයට හෙවත් කාය මිශ්‍ර භාවයට පැමිණියේ නම් යන අර්ථයි. මේ "කායසංසර්ග" යනුවෙන් අදහස් කරන්නේ සංයමමර්යාදාව රාගවශයෙන් අභිභවනය කොට පැමිණි අධ්‍යාචාරයයි. "හත්ථගාහං වා" යනාදියෙන් අධ්‍යාචාරයට පැමිණෙන අයුරු දක්වේ.

**සං:- "හත්ථගාහං වා"** මෙයින් "හස්ත" යයි ගැණෙන්නේ දෙවෙන මහාසන්ධියේ (වැලමිටේ) සිට නිය අග දක්වායි. එහෙයින් පද භාජනයෙහි, **"හත්ථො නාම කප්පරං උපාදාය යාව අග්ගනඛා"**යි දක්වූහ.

එහෙත් වෙන තන්හි කප්පරය (වැලමිට) දක්වා "බාහුව"යයි ද, වැලමිටේ සිට මණිබන්ධනය ( මැනික් කටුව) දක්වා "අග්ගබාහුව" යයි ද, මැණික් කටුවේ සිට නිය අග දක්වා "හත්ථ" යයි ද පෙණෙති, එබැවින් යම් මිනිස් මාගමකගේ දෙවෙනි මහාසන්ධියේ සිට නිය අග දක්වා ඇති හස්තය කොතනකින් නමුත් ඇල්ලුව හොත් හත්ථගාහය වේ.

**සං:- "වෙණිගාහං වා"** ගොතා හෝ නොගොතා කළ කොණ්ඩයට "වෙණි" යයි කියනු ලැබේ. මෙය හුදු කෙහෙවලින් හෝ නූල් මිශ්‍ර කොට හෝ මාලාදම මිශ්‍ර කොට හෝ අමුරන් මිශ්‍ර කොට හෝ රත්රන් මිශ්‍ර කොට හෝ මුතු මැණික් මිශ්‍ර කොට හෝ කෙරෙති. ඒ තන් අයුරින් කළ කොණ්ඩ සියල්ලම මෙහි "වෙණි" යන්නෙන් කියවෙයි. මෙහි කී වෙණිය ගැණීම වෙණිගාහ යයි.

අත හා වෙණිය හැර ශරීරයේ අනික් සියලුම අඟ පසඟ "අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්සවා අඞ්ගස්ස" යනුවෙන් ප්‍රකාශ වෙයි. මිනිස් මාගමක්හුගේ කොයිම අඟපසඟක් නමුත් කායසංසර්ග රාගයෙන් ස්පර්ශ කළ හොත් ඇවැත් සිදුවන බැව් මෙයින් සැලකිය යුතුයි.

මෙකී රාගයෙන් ස්ත්‍රියකගේ අතේ තිබෙන සැරයටි (බස්තන්) ආදිය හෝ හැඳ පැලඳ තිබෙන වස්ත්‍රාභරණ ද නො අතගෑයුතුයි. එයිනුදු ඇවැත් සිදුවන බැවිනි.

## ද්විතීය සඞ්ඝාදිසෙසයෙහි සප්තදශාකාරය.

නිදානය - ශ්‍රාවස්තියයි.

පුද්ගලා - උදයී තෙරුන්වහන්සේය.

වස්තුව - කායසංසග්ග සමාපජ්ජනයයි.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තියයි. (යො පන භික්ඛු ඔතිණ්ණො-පෙ-සඞ්ඝාදිසෙසො)

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්ති - සඞ්ඝාදිසෙස, ථුල්ලච්චය, දුක්කට යන තුණෙකි.

ආනාපත්ති - ඉත්ථියා ඵුසියමානස්ස, සෙවනාධිප්පායස්සාපි කායෙන අවායමිත්වා ඵස්සං පටිවිජානන්තස්ස, මොක්ඛාධිප්පායෙන ඉත්ථිං ඵුසන්තස්ස, අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, අසාදියන්තස්ස, උම්මත්තකාදීනඤ්ච යන මොවුන්ට ඇවැත් නොවෙති.

විපත්තිය - ශීලවිපත්තියයි.

අඞ්ග - මනුස්සිත්ථී, ඉත්ථිසඤ්ඤිතා, කායසංසග්ගරාගො, තෙන රාගෙන වායාමො, හත්ථගාහාදිසමා පජ්ජනං, යන පසෙකි.

සමුට්ඨාන - පඨම පාරාජික සමුට්ඨාන යි. (කාය චිත්ත දෙකයි.)

කිරියා - ක්‍රියා යි.

සඤ්ඤ - සඤ්ඤ විමොක්ඛ යි.

චිත්තය - සචිත්තකයි.

වජ්ජය - ලොකවජ්ජයි.

කර්‍මය - කාය කර්‍මයි.

කුශලත්‍රිකය - අකුශල චිත්තයයි.

වෙදනාත්‍රිකය - සුඛ-මජ්ඣත්ත ද්වයයි

**ද්විතීය සංඝාදිසෙසාපත්ති වර්‍ණනාව සමාප්තයි.**

---

# දෙවැනි සඞ්ඝාදිසෙසාපත්තියෙහි නිදන කථාව

ශාක්‍යකුල තිලකායමාන වූ තිලෝගුරු මුනීන්ද්‍රයානන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවසන සේක.

එකල්හි ආයුෂ්මත් උදයී ස්ථවිරයන්වහන්සේ ආරණ්‍යයෙහි වසන්නාහුය. උන්වහන්සේගේ විහාරය අලංකෘත බැවින් දර්ශනීය වේ. මධ්‍යයෙහි මහාඔවරකයෙක. හාත්පස පිරිවර ගබඩා වෙති. යථා ස්ථානයන්හි තබන ලද ඇඳ පුටු හා භිසි බිම්බොහනාදියෙන් හා නිතර එලවා තබන ලද පානීය පරිභොජනීය ජලයෙන් ද සමලඞ්කෘතය. එබැවින් බොහෝ මනුෂ්‍යයෝ විහාරදර්ශනාභිලාෂී ව නිතර පැමිණෙති.

එක්දවසක් ප්‍රජාපතිකාව සහිතවූ එක්තරා බ්‍රාහ්මණයෙක් වෙහෙරට පැමිණ උදයී තෙරුන් සමීපයේදී "ස්වාමීනි! ඔබ වහන්සේගේ විහාරය දකිනු කැමැත්තෙමු"යයි කීයේය. එසේ නම් බ්‍රාහ්මණය එව බලවයි කියා දෙරවල් සහ වා කවුළු විවෘත කොට විහාරාභ්‍යන්තරයට පිවිසි යේය. බ්‍රාහ්මණතෙමේ උන්වහන්සේගේ පිටිපසින් යමින් වෙහෙර සිරි නරඹයි. බැමිණි බමුණාගේ පිටිපසින් යමින් විහාරයේ ඒ ඒ තැන බලයි.

උදයී තෙරුන්වහන්සේ විහාරය පෙන්වමින් ඇතැම් වාතපානයන් වසමින් ද ඇතැම් වාතපානයන් විවෘත කරමින්ද ඇවිදිනාතර පසුව යන්නාවූ බැමිණියගේ අහපසහ පරාමර්ශනය කළාහුය. බ්‍රාහ්මණ තෙමේ ද විහාරය දක සතුටුව ස්වකීය ප්‍රීතිය ප්‍රකාශ කොට ගෙට ගොස් බැමිණිය සමග විහාරයෙහි තොරතුරු කථා කෙළේය. උදයි තෙරුන් වහන්සේ උළාර වෙහෙරෙක වෙසෙති. එ නිසා උන්වහන්සේත් උළාර කෙණෙකි, යනාදි වශයෙනි.

එකල්හි බැමිණිතොමෝ, උදයී තෙරුන්ගේ උදරත්වයෙක් කොයින් ද? නුඹ යම්සේ මා අහපසහ පරාමර්ශනය කෙරෙහි ද එසේ ම මා අහපසහ අතගෑවාහු යයි කීවාය.

එකල්හි බ්‍රාහ්මණතෙම කිපියේ මේ ශ්‍රමණයෝ අලජ්ජීහු ය, දුශ්ශීලයෝ ය, අශ්‍රමණයෝ ය. මුසා බණින්නෝ ය යනාදියෙන් නුගුණ කීයේය. ලජ්ජී භික්ෂූහු ද මහජනයා ද නුගුණ කියන්ට වන.

3. යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙය්‍ය, යථා තං යුවා යුවතිං මෙථුනුපසංහිතාහි සඞ්ඝාදිසෙසො.

---

බුදුරජ තෙම උදයී තෙරුන්ගෙන් කරුණු විචාරා නොයෙක් අයුරින් නිග්‍රහ ද කොට මේ ශික්ෂාපදය පණවා වදාළසේක.

---

**3. අර්ථ**:- යො පන භික්ඛු යම් මහණෙක්තෙම, ඔතිණ්ණො, (දුට්ඨුල්ල වාගාඝ්‍රාද රාගය විසින් ) බසින ලද්දේ නොහොත් (දුට්ඨුල්ල වාගාඝ්‍රාද රාගයට) තෙමේ බැසගත්තේ, විපරිණතෙන චිත්තෙන, (එම රාගයෙන්) පෙරළුන සිතින්, මාතුගාමං, දුට්ඨුල්ලො දුට්ඨුල්ල (සබ්භ්‍යාසබ්භ්‍ය) තෙපුල් දන්නා මිනිස් මාගමක්හට, දුට්ඨුල්ලාහි වාචාහි, (වසමග පසමග පිළිබඳවූ) අසබ්භ්‍ය තෙපුලින්, ඔභාසෙය්‍ය කියන්නේ නම්, කෙසේ ද? යුවා, තරුණ පුරුෂයෙක් තෙම, යුවතිං තරුණගනකට, මෙථුනුපසංහිතාහි, මෛථුන සන්නිශ්‍රිතවූ අසබ්භ්‍ය බසින්, යථා තං; යම්සේ කියාද (එපරිද්දෙන් මෛථුන සන්නිඃශ්‍රිත වචනයෙන් කියා නම්), සඞ්ඝාදිසෙසො, සංඝාදිසෙස නම් ආපත්ති නිකායෙක් වේ.

සං:- **"දුට්ඨුල්ලාහි වාචාහි"** දුට්ඨු නිස්සිතා, දුට්ඨුල්ලා, නිශ්‍රිතාර්ථයෙහි "ල" ප්‍රත්‍යයයි. ලකාරද්විත්ත වී සිද්ධයි. තාහි දුට්ඨුල්ලාහි, දුට්ඨුල්ල වචන නම් අසද්ධර්ම (අසබ්භ්‍ය) වචනයි. තද්වචනවලින් යන අදහසයි.

සං:- **"මාතුගාමං"** සබ්භ්‍යාසබ්භ්‍ය. (හොඳ නරක) වදන් තීරණය කළහැකි මාගමෙකි, මැහැල්ලියක් නමුදු තද්වාග් විජානනයෙහි අසමර්ථ නම් අඥාන නම් කෙලතොලු නම් මෙහි දී මාතුගාම සංඛ්‍යාවට නො යේ.

සං:- **"ඔභාසෙය්‍ය"** මෙයින් ගැණෙන ඔභාසනය නම්, මාර්ග දෙක පිළිබඳ වර්ණනා අවර්ණනා (ස්තුති නින්දා) වශයෙන් කථා කිරීමයි.

**"ඉත්ථි ලක්ඛණෙන සුභලක්ඛණෙන සමන්නාගතාසි"** යන ආදී වශයෙන් වර්ණනා කිරීම; **"ඉත්ථිලක්ඛණෙන සුභලක්ඛණෙන, අසමන්නාගතාසි සිඛරණිසි සමභින්නාසි"** යන ආදී වශයෙන් අවර්ණනා (නින්දා) කිරීමද මෙහි දක්වෙන අවභාෂණ යයි **"යථා තං යුවා යුවතිං"** යනාදියෙන් අවභාෂණය කරණ අයුරු ද එහෙයින් ම නිශ්ශඞ්කා බැව් ද දක්වෙති.

## තුන්වැති සඞ්ඝාදිසෙසාපත්තියෙහි සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත් නුවරයි. |
| පුද්ගලයා | - | උදයී තෙරණුවෝයි. |
| වස්තුව | - | දුට්ඨුල්ලවාචොභාසන වස්තුවයි. |
| ප්‍රඥප්තිය | - | අසාධාරණ ප්‍රඥප්තියයි. "යො පන භික්ඛු ඔතිණ්ණො - පෙ - සඞ්ඝාදිසෙසො" කියායි. |
| ආණත්තිය | - | අනාණත්තිකයි. |
| ආපත්ති | - | සඞ්ඝාදිසෙස, ථුල්ලච්චය, දුක්කට, යන තුනෙකි. |
| අනාපත්ති | - | අත්ථධම්මානුසාසනි පුරෙක්ඛරානං, උම්මත්තකාදීනං ච"යි කියන ලද්දවුන්ට ඇවැත් නොවෙති. |
| විපත්තිය | - | ශීලවිපත්තියයි. |
| අඞ්ග | - | "මනුස්සිත්ථී, ඉත්ථිසඤ්ඤිතා, දුට්ඨුල්ලවාචස්ස, දරාගො, තෙන රාගෙන ඔභාසනං, තං ඛණං විජානනං" යන පසෙකි. |
| සමුට්ඨාන | - | අදින්නාදන සමුට්ඨාන යි. |
| කිරියා | - | ක්‍රියා වශයෙනි. |
| සඤ්ඤා | - | සඤ්ඤාවිමොක්ඛ යි. |
| චිත්තය | - | සචිත්තකයි. |
| වජ්ජය | - | ලොකවජ්ජ යයි. |
| කර්මය | - | කාය කර්ම, වාක් කර්ම දෙකෙකි. |
| කුශලත්‍රිකය | - | අකුශල චිත්ත යයි. |
| වෙදනාත්‍රිකය | - | සුඛ, මජ්ඣත්ත, ද්විවෙදනායි. |

**තුන්වැති සංඝාදිසෙස වණ්ණනාව සමාප්තයි.**

4. යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතු ගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසෙය්‍ය: එතදග්ගං භගිනි පාරිචරියානං යා මාදිසං සීලවන්තං කල්‍යාණ ධම්මං බ්‍රහ්මචාරිං එතෙන ධම්මෙන පරිචරෙය්‍යාති මෙථුනුපසං හිතෙන සංඝාදිසෙසො;

---

# තෘතීය සංඝාදිසෙසාපත්තියෙහි නිදාන කථාව

සකල ලෝක ශිවඞ්කරවූ භාග්‍යවතුන් වහන්සේ දෙව්රමෙහි වැඩ වසනසේක. එකල්හි ආයුෂ්මත් උදයී තෙරුන්වහන්සේ අරණ්‍යෙහි වසන්නාහුය; තෙරණුවන්ගේ වෙහෙරෙ (පන්සල) අභිරූපය දර්ශනීය ය. එසේම ප්‍රසාද ජනකය. එසමයෙහි විහාර දර්ශනාභිලාෂීවූ බොහෝ ස්ත්‍රීහු ආරාමයට ආවාහුය. ඒ ස්ත්‍රීහු උදයී තෙරුන් වැද ස්වාමීනි! විහාරය දකිනු කැමැත්තම්හ යි කීවෝය.

තෙරණුවෝ එබස් අසා ඒ ස්ත්‍රීන්ට විහාරය පෙන්වා අනතුරුව ස්ත්‍රීසමූහයාගේ වසමග පසමග සම්බන්ධ වර්ණනය හා අවර්ණනය කෙරෙති. යාචන පෘච්ඡනාදිය ද කෙරෙති.

ඒ ස්ත්‍රීසමූහයා අතුරෙන් යම් ස්ත්‍රීහු ධූර්ත වූවාහු නම් ඔව්හු තෙරණුවන් සමග සිනා පහළ කෙරෙති. අලලාපසලලාප කෙරෙති. අසභ්‍ය තෙපුල් කියති.

යම් ස්ත්‍රීහු ලජ්ජිතවූවාහු නම් ඔවුහු ආක්‍රොශ පරිභව කරන්නට වූහ. ලජ්ජී භික්ෂූහු ද ශ්‍රද්ධාවත් මහජනයා ද උජ්ඣායනා කළහ.

එකල්හි භික්ෂූන් වහන්සේ මෙකරුණ බුදුරජාණන්වහන්සේට සැළ කළෝය. තථාගතයන් වහන්සේ තෙරුන් කැඳවා නොයෙක් ආකාරයෙන් නිග්‍රහ කොට මේ ශික්ෂාපදය පණවා වදාළ සේක.

---

4. **අර්ථ** :- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම ඔතිණ්ණො, අත්තකාම පාරිචරියා රාගය විසින් බැස ගන්නා ලද්දේ නොහොත් අත්තකාම පරිචරියා රාගයට බටුයේ, විපරිණතෙන චිත්තෙන, එම රාගයෙන් ප්‍රකෘති භාවාපගත (පෙරළියා) වූ සිතින්; මාතුගාමස්ස සන්තිකෙ, හුබැසි දුබැසි දන්නා මිනිස් අඟනක් සමීපයෙහි; භගිනි, නැගනියනි! යා, යම් ස්ත්‍රියක් තොමෝ, සීලවන්තං, ( ප්‍රාණඝාතාදියෙන් තොරවූ බැවින්) සිල්වත් වූ; බ්‍රහ්මචාරිං, බ්‍රහ්මචාරීවූ හෙවත් ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යා

ඇත්තාවූ; කල්‍යාණ ධම්මං, කළණ ස්වභාව ඇත්තාවූ; මාදිසං මා වැන්නකුට; එතෙන ධම්මෙන, මේ මෛථුන ධර්මයෙන්; පරිචරෙය්‍ය, උවටැන් කරන්නේ නම්; එතං, මේ මෛථුන ධර්මයෙන් උවැටැන් කිරීම; පාරිචරියානං, පරිචය්‍ර්‍යාවන් (උපස්ථානයන්) අතුරෙන් ; අග්ගන්ති, ශ්‍රේෂ්ඨයයි; අත්තකාමපාරිචරියාය, තමා සඳහා මෙවුනුන් දම් නැමැති රහස්‍ය කර්මයෙන් උපස්ථාන කිරීම නොහොත් තමා කැමතිවූ මෛථුන ධර්මයෙන් උපස්ථාන කිරීම පිළිබඳ; වණ්ණං, වර්ණනය (ආනිසංස) මෛථුන ධර්ම ප්‍රතිසං යුක්ත වූ වචනයෙන්; භාසෙය්‍ය, කියන්නේ නම්; සංඝාදිසෙසො, ඔහුට සංඝාදිසෙස නම් වූ අපත්ති නිකායෙක් වේ.

සං:- **"අත්තකාම පාරිචරියාය"** (කාමීයතීති, කාමො, පරිචරණං පරිචරියා, පරිචරියා එවං පාරිචරියා; කාමෙන පාරිචරියා. කාම පාරිචරියා; අත්තනො කාම පරිචරියා, අත්ත කාම පාරිචරියා) තමන්ට මෛථුන ධර්මයෙන් උවටැන් කිරීම සඳහා, යනු අර්ථයි. නොහොත් කාමිතාති; කාමා, අත්තනො කාමා, අත්තකාමා, අත්තකාමා ච සා පාරිචරියා චාති අත්තකාම පාරිචරියා; තස්ස, අත්තකාම පරිචරියාය) තමා මෛථුන රාග වශයෙන් පැතූ උපස්ථානය පිළිබඳව යනු අර්ථයි.

"එතදග්ගං භගිනි" යනාදිය වර්ණනය කරණ ආකාරයයි. ප්‍රාණඝාතාදී දශ අකුශල ධර්මයන් නොකරණ හෙයින් සිල්වත් වේ. මෛවුන්දම් නොසයන බැවින් බ්‍රහ්මචාරී වේ. ප්‍රාණඝාතාදියෙන් හා මෛථුන සෙවනයෙන් වෙන් වූ හෙයින් කල්‍යාණ ධර්ම ඇත්තේ වේ.

## චතුර්ථ සඞ්ඝාදිසෙසයෙහි සප්ත දශාකාරය

| | |
|---|---|
| නිදානය | - සැවැත් නුවරය. |
| පුද්ගලයා | - උදයී තෙරණුවෝය. |
| වස්තුව | - අත්තකාම පාරිචරියා වණ්ණභණනයයි. |
| ප්‍රඥප්තිය | - අසාධාරණ පඤ්ඤත්තියයි. (යො පන භික්ඛු -පෙ- සංඝාදිසෙසා) |
| ආණත්තිය | - අනාණත්තිකය. |
| ආපත්ති | - සඞ්ඝාදිසෙස, ථුල්ලච්චය, දුක්කට යන තුනෙකි. |

අනාපත්ති - "චීවරාදීහි වත්ථුකාමෙහි පාරිචරියාය වණ්ණං භණන්තස්ස, - උම්මත්තකාදීනං ච" යන මොවුන්ටයි.

විපත්තිය - සීලවිපත්තියයි.

අඞ්ග - මනුස්සිත්ථී, ඉත්ථිසඤ්ඤිතා, අත්තකාමපාරි චරියාය රාගො, තෙන රාගෙන වණ්ණ භණනං, විජානනං, යන පසෙකි;

සමුට්ඨානාදිය දුට්ඨුල්ලොභාසන ශික්ෂා පදයෙහි කී පරිද්දෙන් දතයුත්තේය.

**චතුර්ථ සංඝාදිසෙස වර්ණනාව සමාප්තයි.**

---

# චතුර්ථ සංඝාදිසෙසාපත්තියෙහි නිදාන කථාව

තිලොවට තිලක වූ දෙවාති දෙව වූ බුදුරජාණන්වහන්සේ දෙව්රම්හි වැඩ වසනසේක; එකල්හි ආයුෂ්මත් උදායී ස්ථවිරයන් වහන්සේ ඒ ඒ කුලවලට නිතර පිවිසීමෙන් බොහෝ කුලපගව වෙසෙති. එක්තරා කුලයෙක්හි මළ හිමියා ඇති දැකුම්කලු ස්ත්‍රියක් විසුවාය . උදායී තෙරණුවෝ පෙරවරු සමයෙහි හැඳ පොරවා පා සිවුර ගෙණ ඒ ස්ත්‍රියගේ ගෙට පිවිසියාහුය. ගෙට ගොස් පණවන ලද අස්නෙහි හුන්හ. ඒ ස්ත්‍රී තොමෝත් තෙරුන් කරා පැමිණ වැඳ එකත් පසෙකැ හිඳ ගත්තීය. හුන්නාවූ ඒ ස්ත්‍රිය දහැම් කථාවෙන් පැහැද වූහ. තෙරුන්ගේ දහැම් කථා වෙන් අතිප්‍රසන්න වූ ස්ත්‍රී තොමෝ මෙසේ කීවාය. ස්වාමීනි! චීවරාදී සිවුපස අතුරින් යමකින් ප්‍රයෝජන නම් අවසර ලැබෙන සේක්වා. ඒ පිදීමට ප්‍රතිබල වෙමියි කියායි.

එකල්හි උදායී තෙරණුවෝ "නැහනියනි! අපට සිවුපස දුර්ලභ නොවෙති. යමක් දුර්ලභ නම් එය දෙනු මැනවි යයි! කීහ; ස්වාමීනි! ඒ කිමෙක් ද? කියනු මැනවැයි කී කල්හි මෛථුන සෙවනය අපට දුර්ලභ යයි කීහ; ස්වාමීනි එසේ නම් වඩිනු මැනවැයි ඔවරකයට පිවිස හැඳිවත උනා දමා ඇඳෙහි උඩුකුරුව හොත්තීය.

5. යො පන භික්ඛු සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං ජායත්තනෙ වා ජාරත්තනෙ වා අන්තමසො තඛණිකා ය'පි සංඝාදිසෙසො;

---

උදායී තෙරණුවෝ ද තදෙවරකයට පිවිස ස්ත්‍රිය සමීපයට ගොස් මේ තුච්ඡවූ දුර්ගන්ධය වහනය කරන්නක් කෙසේ නම් ස්පර්ශකෙරෙම් දැයි නිට්ඨුහණය (කැරීම) කොට පිටවී ගියෝය.

එකල්හි ඒ ස්ත්‍රී තොමෝ මේ ශ්‍රමණයෝ අලජ්ජීහුය, දුස්සීලයෝය, බොරු කියන්නෝය, තෙමේ ම මෛථුන ධර්මය යාච්ඤාකොට දුර්ගන්ධය වහනය වන්නක් කෙසේ නම් සපර්ශ කෙරෙම් දැයි කාරා දමා ගියේ කොහොම ද? මාගේ තුච්ඡ වූයේ කුමක් ද? දුහඳ හමන්නේ කුමකින් ද? මම කවරෙකුට කුමකින් හය වෙම් දැයි උජ්ඣායනය කළාය. ඒ ඇසූ ස්ත්‍රීහු ත් නුගුණ පතුරුවන්ට වූහ. ලජ්ජී වූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැළ කළාහුය. භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ නිදනකොට ගෙණ මේ ශික්ෂාපදය පණවා වදළ සේක.

**5. අර්ථ:-** යො පන භික්ඛු, යම් මහණෙක් තෙම; සඤ්චරිත්තං, ස්ත්‍රී පුරුෂයන් අතුරෙහි (ආවාහ විවාහවනු කැමති ස්ත්‍රී පුරුෂයන්ගේ පණිවිඩ පිළිගැණීම් විමසීම් නැවත ගෙණ ඊමාදී) සඤ්චරණ භාවයට, සමාපජ්ජෙය්‍ය, පැමිණියේ නම්; කෙසේද? පුරිසමතිං, පුරුෂයාගේ කැමැත්ත; ඉත්ථියා වා , ස්ත්‍රියට හෝ; ඉත්ථිමතිං, ස්ත්‍රියගේ කැමැත්ත; පුරිසස්ස වා, පුරුෂයාට හෝ; ජායත්තනෙ වා, නිබඳ භාර්‍ය්‍යා බැව්හි හෝ; ජාරත්තනෙ වා, ජාර (සොරසැමි) බැව්හි හෝ; අන්තමසො, යටත් පිරිසෙයින්; තඛණිකාය'පි, එකෙණෙහි අභිරමණය කරණු කැමැති ස්ත්‍රියකට ද (පුරුෂයා ගේ පණිවිඩාදිය කියා නම්); සංඝාදිසෙසො, (ඔහුට) සංඝාදිසෙස නම් ආපත්ති නිකායෙක් වේ.

සං:- **"සඤ්චරිත්තං"යි** (සඤ්චරණං, සඤ්චරො, සඤ්චරො, අස්ස අත්ථීති, සඤ්චරී සඤ්චරිස්ස භාවො, සඤ්චරිත්තං; ආවාහ විවාහවනු කැමැති ස්ත්‍රී පුරුෂයන්ගේ ලියුම් පණිවුඩ හුවමාරු කිරීමයි.

පුරුෂයෙකු විසින් හෝ ඔහුගේ මවුපියාදීන් විසින් හෝ ස්වාමීනි! අසුවල් ස්ත්‍රියට මේ පණිවුඩය කියනු මැනව. නැතහොත් මේ ලියුම දුන මැනව, උත්තර නැවත ගෙණ එනු මැනවයි කී කල්හි වදනින් හෝ හිස සැලීමාදී කාය ප්‍රයොගයකින් හෝ පණිවුඩය භාරගත් බැව් අඟවා නම්! උක්තාකාරයෙන් ගොස් පණිවුඩය කියා නම් ලියුම හෝ

දේනම් එසේ ම විමසීම් නැවත නැවත පණිවුඩාදිය ගෙණ ඊම් කෙරේ නම් ඒ සඤ්චරිත්ත යයි. ස්ත්‍රියක් විසින් දෙනලද පණිවුඩාදිය පිළිබඳවත් මෙසේ ම සැලකිය යුතුයි.

**ස්ත්‍රිහු දශදෙනෙක:-**

මාතුරක්ඛිතා, පිතුරක්ඛිතා, මාතුපිතු රක්ඛිතා, භාතුරක්ඛිතා, භගිනිරක්ඛිතා, ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා, ධම්මරක්ඛිතා, සාරක්ඛා, සපරිදණ්ඩා, යනුයි. මොවුනතුරෙන් සාරක්ඛා, සපරිදණ්ඩා, යන ස්ත්‍රීන් දෙදෙනාට පුරුෂාන්තර ගමනයෙහි මිථ්‍යාචාරය වේ.

**භාර්‍ය්‍යාවෝ දශදෙනෙක:-**

ධනක්කීතා, ඡන්දවාසිනී, භොගවාසිනී, පටවාසිනී, ඔදපත්ත කිනී, ඔභතචුම්බටා, දසීච භරියාච, කම්මකාරීච භරියාච, ධජාහටා, මුහුත්තිකා, යනුයි.

මොවුන් දශදෙනාටම පුරුෂාන්තර ගමනෙහි මිථ්‍යාචාරය වේ. භික්‍ෂුවකට නම් මේ විසිදෙනාගේ ම ලිවුම් ආදිය හුවමාරු කිරීමෙන් සංඝාදිසෙස වෙයි.

ගෘහස්ථ පුරුෂයෙකුට මෙකී විසි ස්ත්‍රීහුම මිථ්‍යාචාරයට කරුණු වෙති.

"ඉත්ථියා වා පුරිසමතිං" යනාදිය සඤ්චරණය කරණ ආකාරයයි.

"ජායත්තනය" නම් භාර්‍ය්‍යාභාවය යි "ජාරත්තනය"නම් ජාර භාවයයි. තඛණිකාය යනු මුහුත්තිකා භාවයයි. "ජායත්තනෙ" යනාදී පදයන් නිමිත්ත සප්තමී බැවින් භාර්‍ය්‍යා භාවය නිමිති කොට ආරොවනය කෙරෙයි. යනාදී වශයෙන් සැලකිය යුතු වෙයි.

### පස්වැනි සංඝාදිසෙසයෙහි සප්ත දශාකාරය

නිදනය - සැවැත් නුවරයි.

පුද්ගලයා - උදයී තෙරණුවෝයි.

වස්තුව - සඤ්චරිත්ත සමාපජ්ජනයයි.

පඤ්ඤත්ති - සාධාරණ පඤ්ඤත්තියයි. (යො පන අඤ්චරිත්තං -පෙ- සඞ්ඝාදිසෙසො)
"අන්තමසො තඛණිකායපි" අනු ප්‍රඥප්තියයි.

| | | |
|---|---|---|
| ආණත්තිය | - | සාණත්තිකය. |
| ආපත්ති | - | සඞ්ඝාදිසෙස, ථුල්ලච්චය, දුක්කට, යන තුනෙකි. |
| අනාපත්ති | - | සඞ්ඝ, චෛතිය, ගිලාන, යන මොවුන්ගේ කටයුත්තක් සඳහා යන්නහුට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ. |
| විපත්තිය | - | ශීලවිපත්තියයි. |
| අඞ්ග | - | මනුස්සජාතිකතා, නාලං වචනීයතා, පතිගණ්හණ, වීමංසන, පච්චාහරණාති යන අඞ්ග පසෙකි. |
| සමුට්ඨාන | - | ෂසමුට්ඨාන යි. කාය, වාචා, කායවාචා, යනු සචිත්තක අචිත්තක වශයෙනි.) |
| කිරියා | - | ක්‍රියා වශයෙනි. |
| සඤ්ඤ | - | නොසඤ්ඤ විමොක්ඛයයි. |
| චිත්තය | - | "අචිත්තක"යි. |
| වජ්ජය | - | "පණ්ණත්ති" වජ්ජයි. |
| කර්මය | - | "කායකර්ම, වාක්කර්ම"දෙකයි. |
| කුශලත්‍රිකය | - | කුසල, අකුසල, මජ්ඣත්ත සිත් තුණෙකි. |
| වෙදනාත්‍රිකය | - | සුඛ, දුක්ඛ, මජ්ඣත්ත, තුණෙකි. |

---

## පංචම සංඝාදිසෙසයෙහි නිදාන කථාව

සකලක්ලෙශ විධ්වංසනයෙහි සහස්‍රකිරණායමාන වූ බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩවසන සේක. එසමයෙහි ආයුෂ්මක් උදායී තෙරණුවෝ බෝහෝ කුලයන්හි නිතර නිතර පැමිණීමෙන් ඒ ඒ කුලයන් සමග මිත්‍ර වූහ. යම් කුලයෙක්හි ප්‍රජාපතිනිය රහිත වූ කුමාරයෙකු හෝ ස්වාමියා රහිත කුමරියක් හෝ දකී ද, අසුවල් කුමාරි තොමෝ විසිතුරු රූ ඇත්තීය, ප්‍රසාදජනකය, මන වඩන්නීය. එසේම පණ්ඩිතය, අනලස්ය. ඒ කුමරිය මේ කුමරුට සුදුසුයයි කුමාරයා හමුවෙහි හෝ ඔහුගේ මවුපියන් හමුවෙහි හෝ කියාපාති. කුමාරයාගේ වර්ණනාව කුමාරිය හමුවෙහි හෝ මවුපියාදීන් හමුවෙහි හෝ කියා පාති.

6. සඤ්ඤාචිකාය පන භික්ඛුනා කුටිං කාරයමානෙන අස්සාමිකං අත්තුද්දෙසං පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං, දීඝසො ද්වාදස විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං සත්තන්තරා, භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය. තෙහි භික්ඛූහි වත්ථුං දෙසෙතබ්බං අනාරම්භං සපරික්කමණං, සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමණෙ සඤ්ඤාචිකාය කුටිං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදෙසනාය පමාණං වා අතික්කාමෙය්‍ය සඞ්ඝාදිසෙසො.

---

එසේ කරණ ලද ගුණකථනයෙන් පැහැදුනා වූ කුමරියගේ මවුපියෝ සවාමීනි! ඔවුහු අප නොහඳුනති. ආර්‍යයන්වහන්සේ මේ කුමරිය ඒ කුමාරයාට සරණ පාවාදීමට උපාබස් කියන්නහු නම් යෙහෙකැයි කියති. කුමාරයාගේ මවුපියෝ ද එසේම අපගේ පුත්‍රයාට ඒ කුමරිය ගෙණ ඊමට උපාබස් දෙනු මැනැවැයි කියති. එකල්හි උදයී තෙරණුවෝ ද ඒ ඒ කුලයන්හි ගොස් කුමාර කුමරියන්ගේ ගුණ වර්ණනා කොට ආවාහ විවාහ කරවති. එසේම ඔවුනොවුන්ගේ අගුණ කීමෙන් ආවාහ විවාහ වැලැක්වීම ද කෙරෙති.

එකල්හි එක්තරා පුරාණ ගණිකියකගේ ප්‍රසාදවහනය කරන්නා වූ දකුම් කලු දුහිතෘවක් වූවාය. ගමෙන් පිට වාසය කරන්නාවූ ආජීවක ශ්‍රාවකයෝ අවුත් ඒ ගණිකියට මෙසේ කීවාහුය, කෙසේ ද? ආයර්‍යාවෙනි! තෙල කුමරිය අපේ කුමාරයාට දෙනු මැනවැයි කියායි. ඕ තොමෝ, මෙසේ කීවාය, ආයර්‍යයෙනි! මම තොප නොහඳුනම්. මේ මාගේ එකම දූවය අන්ගමකට ද යා යුතුය, ඒ නිසා නොදෙම් යි කියායි.

එකල්හි ඒ ආජීවකයෝ උදයී තෙරුන් කරා ගොස් මෙ පුවත කීවාහුය. තෙරණුවන්ගේ වචනයෙන් ඒ කුමරිය ආජීවකයන්ට දුන්නීය. මෙයින් පහළ වූ දුඃශ්‍රාවය නිසා තථාගතයන් වහන්සේ මේ ශික්ෂාපදය පණවා වදළසේක.

---

**6. අර්ථ:-** සඤ්ඤාචිකාය, තමා විසින් ඉල්ලා ගන්නාලද වැ පොරෝ ආදියෙන්; අස්සාමිකං, කරවා දෙන හිමියන් (දායකයන්) නැති බැවින් අස්වාමික වූ; අත්තුද්දෙසං, තමා පිණිස කරවන බැවින් ආත්මොද්දෙශකොට ඇති; කුටිං, කිළියක්; කාරයමානෙන, කරවන්නා වූ භික්ෂූහු විසින්; පමාණිකා, ප්‍රමාණවත් කිළියක්; කාරෙතබ්බා, කරවිය යුත්තීය.

තත්‍ර, ඒ කිළියෙහි, ඉදං, මේ කියවෙන්නේ, පමාණං ප්‍රමාණයයි, දීඝසො, දිගින්, සුගතවිදත්ථියා, සුගත් වියතින්, ද්වාදස විදත්ථියො, දෙළොස් වියතෙකි, තිරියං සරස, අන්තරා, භිත්ති ඇතුළත, සත්ත (විදත්ථියො) සත්වියතෙකි.

වත්ථුදෙසනාය, (කුටි) වස්තුව දෙශනා කිරීම පිණිස, භික්ඛූ. භික්ෂූහු, අභිනෙතබ්බා, කැඳවිය යුත්තාහුය. තෙහි භික්ඛූහි, ඒ භික්ෂූන් විසින්, අනාරම්භං, (කඩිගුල් ආදි) සොළොස් (උපද්‍රව) බිය රහිත වූ, සපරික්කමණං, උපචාර සහිතවූ, වත්ථුං (කුටි) වස්තුව, දෙසෙතබ්බං, දෙසිය යුතුයි.

වෙ, ඉදින්, භික්ඛු, මහණ තෙම, සාරම්භෙ, (කඩිගුල් ආදී) සොළොස් බිය සහිත වූ, සඤ්ඤාචිකාය, ඉල්ලාගත් වැ පොරෝ ආදියෙන්; කුටිං, කිළියක්; කාරෙය්‍ය, කරවූයේ නම්: වත්ථු දෙසනාය, (කුටි) භූමිය දෙශනා කිරීම පිණිස; භික්ඛූ, භික්ෂූන්; අනභිනෙය්‍ය වා, නොකැඳවූයේ නම් හෝ; පමාණං, ප්‍රමාණය; අතික්කාමෙය්‍ය වා, ඉක්මවූයේ නම් හෝ; සඞ්ඝාදිසෙසො, (ඔහට) සඞ්ඝාදිසෙස නම් ඇවත (ආපත්තිනිකායෙක්) වේ.

සං:- **"සඤ්ඤාචිකාය"** (සයං පවත්තිතා යාචිකා යාචනා) යස්සා සා සඤ්ඤාචිකා (මධ්‍යපදලොපබහුව්‍රීහි සමාසයයි) තාය, සඤ්ඤාචිකාය; මෙහි "සං" යනු ආත්මවාචී තෘතීයාර්ථයෙහි නිපාතයෙකි; "යාචිකා " යනු භාවාර්ථයෙහි නිපන් කෘදන්තයෙකි; ඒ නිසා අටුවාවෙහි "සං යාචිකා නාම" "සයං පවත්තිතා යාචනා වුච්චතී"යි දක්වේ.

තමන් ඉල්වා ගත් වැ පොරෝ ආදියෙන් යනු මෙහි අදහසයි. මෙරමාගේ වැ පෙරෝ උදලු ආදිය තමන්ටම අයිතිකරගන්නා අදහසින් ඉල්ලීම නො වටී. ස්වාමීනි උවමනා යමක් අපට දන්වනු මැනවැයි පවරන ලද කුලයකින් හෝ තාවකාලික වසයෙන් " වාසිං දෙථ, ඵරසුං දෙථ" යනාදි වශයෙන් උවමනා උපකරණයක් ලබාගත හැකි වේ. එහෙත් අප්පවාරිත අඤ්ඤාතක කුලයකින් ඉල්ලුව හොත් දුකුළාවක් වේ.

කුටිය කරගැණීම සඳහා කම්කරුවන් හා වඩුවන් ආදීන් ද ශාසනික ව්‍යවහාර නොයික්මවා ඒ ඒ අයගෙන් අයැදිය යුතුයි. කම් කරුවන්ට මුදල්දීම නොවටී, සහල් ආදිය සිහාගෙණවුත් දියහැකි වේ. වඩුවෙක් හෝ මේසන් කෙණෙක් හෝ ස්වාමීනි! මට කුටිය කරදීමට අවකාශ නැත. වෙන කෙණෙකු ලවා කරවාගත මැනව මම ඊට වැටුප් ගෙවන්නෙමි කීයේ නම් වෙනකෙණෙකු ලවා කරවා ගෙණ ප්‍රතිඥත පරිදි

මුදල් දෙවිය යුතුයි. මුව වැදි කෙවට්ටාදීන්ගෙන් හස්තකම් නො ඇයදිය යුත්තේය.

**සං:- කුටිං** (කුටති ඡිජ්ජතීති, කුටී; (කුටවෙජදෙ) "ඉ" ප්‍රත්‍යයයි) උල්ලිත්තාවලිත්තාදී භෙදප්‍රාප්ත ප්‍රමාණ යුක්ත කිළියෙකි; මෙහි දී , ලෙප, අලෙප, ලෙපොකාස, අලෙපොකාස, යන මොවුහු දතයුත්තෝ යි;

මත්තිකා (මැටි) ලෙප, සුධා (හුණු) ලෙප; යයි ලෙප දෙකෙකි. භස්ම (අලු) ගොමය (ගොම) මඩ; ආදිය අලෙප වෙති.

භිත්ති යහ ඡදනය (වහල) ලෙපොකාස වෙත්. දෙරබා, දෙරකණු, උළුවහු, ජනෙල්, දුම් සිදුරු ආදිය අලෙපොකාස වෙත්.

ඇතුළත මැටියෙන් හෝ, සුණෙන් හෝ ආලෙප කළ ගානලද කුටිය "උල්ලිත්ත කුටි" නම්.

පිටත මැටියෙන් හෝ සුණෙන් හෝ ආලෙප කරණ ලද කුටිය "අවලිත්තකුටි"නම්. ඇතුළත පිටත ආලෙප කරණ ලද්ද "උල්ලිත්තාවලිත්තකුටි" නම්.

**සං:- "ද්වාදස විදත්ථියො සුගතවිදත්ථියා තිරියං සත්තන්තරා"** මෙයින් කිළියේ ප්‍රමාණය දක්වේ.

මෙහි සුගත් වියත නම් මධ්‍යම පුරුෂයෙකුගේ අතින් රියන් 1 1/2 කි.

**සං:- "භික්ඛු අභිනෙතබ්බා වත්ථුදෙසනාය"** යම් සථානයෙක් හි කුටියක් කළමනා කල්හි කුටි (භූමිය) වස්තුව දෙශනා කිරීම සඳහා එතන්හි භික්ෂූන් කැඳවීම කටයුතුය, පළමු කොට කුටි වස්තුව සීමා මණ්ඩලයක් මෙන් සම කොට සඞ්ඝයා හමුවට ගොස් උත්තරා සඞ්ගය (තනිපට සිවුර) ඒකාංශ කොට පොරවාගෙණ වෘඩ පරිපාටිය නොහැර සඟුන් වැඳ උක්කුටිකයෙන් හිඳගෙණ **"අහං භන්තෙ සංයාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං. සොහ මහන්තෙ සංඝං කුටිවත්ථු ඔලොකනං යාචාමී"ති,** යන අයුරින් තෙවරක් ආයාචනය කටයුත්තේය. එකල්හි තත්‍රස්ථ සියලු සඞ්ඝයාම හෝ සඞ්ඝයා විසින් අනුදන්නා ලද දෙතුන් නමක් හෝ එහි ගොස් කුටි වස්තුව බැලිය යුතුය.

එහෙත් අනාරම්භ (උපද්‍රව රහිත) සපරික්කමණ උපචාර සහිත) කුටිවස්තුවක් හැර සාරම්භ අපරික්කමණ වස්තු නො දෙසිය යුතුය.

කිපිල්ලිකා (රත්තවර්ණ ආදි භෙදප්‍රාප්ත යම්කිසි ප්‍රාණ විශෙෂයෙකි. උපචිකා (වේ) උන්දුර (මී) අහි (සර්ප) විච්ඡික (ගෝනුසු) සතපදී (පත්තෑ) ආදීන්ගේ හෝ හස්ති - අශ්ව - සිංහ - ව්‍යාඝ්‍ර - දීපි - (දිවි) අච්ඡ - (වලස්) තරච්ඡ - (කරබානා වලස්) යන මොවුන්ගේ ආශය ස්ථාන හා, පුබ්බන්න - අපරන්න - අබ්භාඝාතන, ආඝාතන, සුසාන, උය්‍යාන රාජවත්ථු - හත්ථි අස්ස සාලා - බන්ධනාගාර - පානාගාර - සූනා, රච්ඡා - චච්චර, සභා - සංසරණ - යන ස්ථාන ආශ්‍රිත ස්ථාන ද උපද්‍රව සහිතය.

මෙහි දක්වෙන ස්ථාන අතුරෙන් "කිපිල්ලිකාදී ප්‍රාණීන් සදෙනාගේ ආයස්ථාන සය සත්වානුග්‍රහය නිසාද, හස්ති ආදී සදෙන හැසිරෙන තැන් බිය සහිත නිසා ද, සෙසු තැන් නොයෙක් උපද්‍රව නිසා ද ප්‍රතික්ෂිප්තයහ;

සං:- **"සපරික්කමණං"** යනු ගොන් දෙදෙනෙකු යොදන ලද ගැලක් කුටිය පිසාරා (ඡදනාග්‍රයෙන් වතුර වැටෙන සීමාවෙන් පිට) ගමන් කරන්නට හැකි නම් උපචාර සහිත වේ.

මෙකී ලක්ෂණ විරහිත කුටියක් කරන්නා වූ භික්ෂුහුට උපකරණ සඳහා වනයට යෑමේ පටන් ප්‍රයෝගයක් පාසා දුකුළා වෙයි; දන් මැටි පිඩු දෙකකින් සමාප්ත වෙයි යන තැනට ගිය කල්හි ඉතිරි පළමු පිඩ තුබූ කල්හි තුලසිය ද, දෙවෙනි පිඩේ දී සඞ්ඝාදිසෙස ද වෙත්. එබඳු කුටිය සම කොට බිඳදමා ඇවැත් දෙසාගතයුතුයි.

**සප්තදශාකාරය**

| | |
|---|---|
| නිදනය | - අලවි නුවරය. |
| පුද්ගලයෝ | - අලවිහි භික්ෂුහුය. |
| වස්තුව | - සංයාචිකා කුටිකරණ යයි. |
| ප්‍රඥප්තිය | - අසාධාරණයි. සංයාචිකාය පන - පෙ- සඞ්ඝාදිසෙසො. |
| ආණත්තිය | - සාණත්තිකයි. |
| ආපත්ති | - සඞ්ඝාදිසෙස ස- ථුල්ලච්චය- දුකුළා- යන තුණෙකි. |

අනාපත්ති - විප්පකත කුටිය සම කොට බිඳදමන්නහුට ද, අන්කෙණෙකුට දෙන්නහුට ද, ලෙන් ගුහා ආදීන් අතුරෙන් යමක් කරන්නහුට ද, විප්පකත කුටිය උපොසථාගාරාදියක් සඳහා පුදන්නහුට ද උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවෙති.

විපත්ති - ශීල විපත්ති යයි.

අඞ්ග - උල්ලිත්තාදීනං අඤ්ඤතරතා, හෙට්ඨිමප්පමාණ සම්භවො, අදෙසිත වත්ථුකතා, වාසාගාරතා, ලෙපඝටනා, පමාණාතික්කන්තතා, අත්තුද්දෙසිකතා, යන සතෙකි.

සමුට්ඨාන - ඡසමුට්ඨානයි.

ක්‍රියා - ක්‍රියා-ක්‍රියා-ක්‍රිය යන වශයෙනි.

සෙස්ස "සඤ්චරිත්ත" යෙහි මෙන් දතයුතුයි.

---

# සවැනි සංඝාදිසෙසයෙහි නිදාන කථාව

එක් සමයෙක්හි ත්‍රෛලොක්‍ය චක්‍රවර්තීවූ බුදුරජාණන් වහන්සේ රජගහනුවර වෙළුවන වෙහෙරෙහි වැඩවසන සේක; එකල්හි අලවිනුවර වැසි භික්ෂූහු කරවාදෙන ස්වාමියන් නැත්තාවූ ප්‍රමාණය ඉක්මවූ කුටි තමන් උදෙසා කරති, යම් යම් අපහසුකම් නිසා ඒ බොහෝ කුටි අඩාළ වෙති; ඒ භික්ෂූහු ද "පුරුෂයෙකු දුන මැනව. පුරිසත්ථකරයක් (අත්තමක්) දුන මැනව"යනාදී ක්‍රමයෙන් යාචන බහුලව විඥපති බහුලව වෙසෙති; එයින් උපද්‍රැත වූ බොහෝ මනුෂ්‍යයෝ භික්ෂූන් දක බිය වෙති. දෙර වසති. ගම්හැර යෙති.

මහසුප් මහතෙරුන් වහන්සේ ද රජගහනුවර වස් වැස අලවිනුවරට වැඩමවා අග්ගාලව වෙහෙරෙහි වැඩවසනසේක් එක් දවසක් පාසිවුරු ගෙණ අලවිනුවර පිඩු සිහා වැඩිසේක. නුවර වැස්සෝ තෙරුන් දක ත්‍රස්ත වෙති. දුවති දෙරවල් වසති.

7. මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානෙන සස්සාමිකං අත්තුද්දෙසං භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය; තෙහි භික්ඛූහි වත්ථුං දෙසෙතබ්බං අනාරම්භං සපරික්කමණං, සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමණෙ මහල්ලකං විහාරං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදෙසනාය, සඞ්ඝාදිසෙසො;

---

තෙරණුවෝ මේ කිමෙක් දැයි සිතා පිඬු සිඟා වැඩමවා පසුබත් කල්හි භික්ෂූන් අමතා ඇවැත්නි! පෙර අලව්නුවර සුභික්ෂය, සුලභ පිණ්ඩපාත ඇත්තේය. දන් වනාහි දුර්භික්ෂය, දුර්ලභ පිණ්ඩපාත ඇත්තේය. එයට කරුණු කිමෙක් දැයි ඇසූහ. ඒ භික්ෂූහු තෙරුන් වහන්සේට එයට හේතු සැළ කළාහුය.

එකල්හි තථාගතයන් වහන්සේ රජගහනුවර අභිරතිතාක් වැඩසිට අලව්නුවර සැරිසරණ සේක් "අග්ගාලව" වෙහෙරට වැඩි සේක; එහිදී මහසුප් මහතෙරණුවෝ තථාගතයන් වහන්සේට මෙකරුණ සැළ කළාහුය. භාග්‍යවතුන් වහන්සේ ආලවික භික්ෂූන් විචාරා නොයෙක් අයුරින් නිග්‍රහ කොට ආයති සංයමය සඳහා මේ ශික්ෂාපදය පණවා වදාළසේක.

---

7. අථ:- "සස්සාමිකං" කුටිකාරක (දායකයෙකු) ස්වාමියෙකු ඇති බැවින් සස්වාමිකවූ; අත්තුද්දෙස. තමා උදෙසා කරවන බැවින් අත්තුද්දෙස වූ; මහල්ලකං විහාරං, (සංයාචිතකුටියට වඩා මහත් බැවින්) මහත්වූ විහාරයක්; කාරයමානෙන, කරවන්නා වූ; භික්ඛුනා, භික්ෂූහු විසින්; වත්ථුදෙසනාය, විහාර වස්තු දෙශනා කිරීම පිණිස;, භික්ඛු, භික්ෂූහු; අභිනෙතබ්බා, පැමිණවිය යුත්තාහුය. තෙහි භික්ඛුහි, ඒ භික්ෂූන් විසින්, අනාරම්භං (කිපිලිකාදී සොළොස්) උපද්‍රව රහිත වූ; සපරික්කමණං, උපචාර සහිතවූ; වත්ථුං, විහාරවස්තුව; දෙසෙතබ්බං, දෙශනා කටයුතුයි. චෙ ඉදින්; සාරම්භෙ, (සොළොස්) උපද්‍රව සහිත වූ; අපරික්කමණෙ, උපචාර රහිතවූ; සත්ථුස්මිං, විහාරවස්තුවෙහි; මහල්ලකං විහාරං, සස්වාමික විහාරයක්; කාරෙය්‍ය, කරවන්නේ නම්; වත්ථුදෙසනාය වා විහාර වස්තුව දෙශනාව පිණිස; භික්ඛු, භික්ෂූන්; අනභිනෙය්‍ය, නොපමුණුවා නම්; සඞ්ඝාදිසෙසො (ඕහට) එනම් අපත්තිනිකායෙක් වේ;

සං:- **"මහල්ලකං"** යි, (මහන්තං ලාති ගණ්හාතීති; මහල්ලකො; තං, මහල්ලකං) සංයාචිත කුටියට වඩා මේ විහාරය මහත් බැවිනුත් සස්වමික බැවිනුත් "මහල්ලක" නම් වේ.

8. යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය, අප්පෙවනාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති: තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමනො වා අසමනුග්ගාහියමානො වා අමූලකඤ්චෙව තං අධිකරණං හොති, භික්ඛු ච දොසං පතිට්ඨාති, සඞ්ඝාදිසෙසො:

---

සංයාචිත කුටියට වඩා මෙහි ඇති විශෙෂය, සස්වාමික බවත් ප්‍රමාණ රහිත බවත්, එකම සඞ්ඝාදිසෙසයක්වන බවත් ය; සෙසු විස්තර පළමු ශික්ෂාපදයෙහි මෙනි;

නිදනය-කොසඹෑ නුවරය. වස්තුව-චෛත්‍යවෘක්ෂ ඡෙදපනයයි.

---

# සත්වැනි සංඝාදිසෙසයෙහි නිදන කථාව

එක්සමයෙක්හි මුනීන්‍ද්‍ර වූ බුදුරජානන් වහන්සේ කොසඹෑ නුවර ඝොසිතාරාමයෙහි වැඩ වසනසේක;

එකල්හි ආයුෂ්මත් ඡන්නතෙරුන්ගේ උපස්ථායකවු ගැහැවියෙක් තෙම මෙසේ ඡන්නතෙරුන්ට කීයේ ය. ස්වාමීනි! විහාරභූමියක් පෙන්වනු මැනව විහාරයක් කරවා දෙන්නෙමියි කියායි; එවිට ඡන්නතෙරනුවෝ විහාර බිමක් පිළියෙල කරණුවෝ නගරග්‍රාම ජනපදවාසීන් විසින් පුදන ලද චෛත්‍යවෘක්ෂයක් සිඳවූහ. මනුෂ්‍යයෝ උජ්ඣයනා කළාහුය. කෙසේ නම් රට වැසියා විසින් පුදන ලද චෛත්‍යවෘක්ෂය සිඳුවන්නේ ද? එකෙන්ද්‍රිය ප්‍රාණීන් කෙසේ නම් නසන්නේ දැයි කියායි.

භික්ෂූන්වහන්සේ මේ නුගුණ කථාව ඇසුවාහුය; ඔවුනතුරෙන් අල්පෙච්ඡ භික්ෂූහු නුගුණ පළ කොට නැවත තථාගතයන් වහන්සේට දැන්වූහ.

තථාගතයන් වහන්සේ ඡන්න තෙරුන්ට ගර්හා කොට මේ ශික්ෂාපදය පණවා වදළසේක.

---

8. **අථ**- යො පන **භික්ඛු**, යම් මහණෙක් තෙම, දුට්ඨො, කිපියේ; දොසො, සෙස්සන් (මෙරමා) දූෂිත කරන්නේ; අප්පතීතො, එහෙයින්ම ප්‍රීති සුඛාදියෙන් තොරවූයේ; නං භික්ඛුං, ඒ භික්ෂූහු ඉමම්හා

බ්‍රහ්මචරියා, මෙ ශාසනයෙන් හෙවත් ශ්‍රෙෂ්ඨ චර්‍ය්‍යාවෙන්: චාවෙය්‍යං, පහකෙළෙම් නම්; අප්පෙව නාම ඉති, ඉතා යෙහෙකැයි; අමූලකෙන, (දැකීම් ඇසීම් දැනීම් සංඛ්‍යාත මුල් රහිත හෙයින්) අමූලිකවූ; පාරාජිකෙන ධම්මෙන, පරිජි ඇවතෙකින්; අනුද්ධංසෙය්‍ය, චෝදනා කෙරේද; තතො අපරෙන සමයෙන, ඒ චොදනා සමයෙන් මෑත භාගයෙකැ; සමනුග්ගාහියමානො වා, පිළිවිසිනු ලබන්නාවූ හෝ; අසමනුග්ගාහියමානො වා, නොපිළිවිසිනු ලබන්නාවූ හෝ; භික්ඛු ච, (චොදක) භික්ෂු තෙමේද; දෙසං, ප්‍රතිඥත දෙෂයෙහි; පතිට්ඨාති, පිහිටා ද; හෙවත් දෙෂය පිළිගණී ද; තං අධිකරණං ච, ඒ ආපත්තාධි කරණයත්; අමූලකං, මුල්රහිත වේද; සඞ්ඝාදිසෙසො, (ඕහට) සංඝාදිසෙස නම් ආපත්ති නිකායෙක් වේ.

සං- **"දුට්ඨො දෙසො"** (දුස්සතීති, දුට්ඨො, "දුස" ධාතුවයි "ත" ප්‍රත්‍යයයි, දූසෙතීති, දෙසො) මෙයින් එකම පුද්ගලයෙකුගේ ආකාරනානාත්වය දක්වේ;

තමන් සිත්හි උපන් කෝපයෙන් තෙමේත් දූෂිත වේ; එයින්ම මෙරමාද දූෂණය (වැනසීම) කෙරෙයි.

සං- **"අප්පතීතො"** (පතිමුඛං එතීති, පතීතො; පතී; පූර්ව "ඉ" ධාතුවයි. "ත" ප්‍රත්‍යයයි. න පතීතො, අප්පතීතෙ,) ප්‍රීති සුඛාදියෙන් අපගතවූයේ යන අදහසයි.

සං- **"අමූලකෙන පාරාජිකෙන ධම්මෙන"** යි චොදක භික්ෂුහු විසින් චූදිත භික්ෂුහුගේ යම් පාරාජිකාපත්තියක් නොදක්නා ලදද, නො අසන ලදද, නොසැක කරණ ලදද, ඒ ඇවත දර්ශන ශ්‍රවණ පරිශඞ්කා සංඛ්‍යාත මුල් නැති බැවින් අමූලික වේ; මෙහි චොදනාවට චූදිත භික්ෂුව ඇවතට පැමිණීම ප්‍රමාණ නොවේ.

තමාගේ ප්‍රසාද චක්ෂුසින් හෝ දිවැසින් නොදක්නා ලද්ද "අදිට්ඨ" නම්; එසේම කිසිවෙකු විසින් කියන ලද්දක් නො ඇසීම "අසුත" නම් වේ; ඇවැත ගැණ සැක කිරීම "පරිසඞ්කිත" නම් වේ; ඒ "දිට්ඨපරිසඞ්කිත" "සුත පරිසඞ්කිත" "මුත පරිසඞ්කිත" යයි ත්‍රිවිධ වේ.

යම් කිසි මහණෙක් තෙම මාගමක් හා රහස්‍ය කර්මයට සුදුසු ස්ථානයෙක්හි දක මොවුහු එකාන්තයෙන්ම රහස්‍ය කර්මය කළාහු දෝ කරන්නාහු දෝයි, සැක පහළ වේ නම් ඒ "දිට්ඨපරිසඞ්කිත යයි.

අන්ධකාරයෙක්හි හෝ ප්‍රතිච්ඡන්නාවකාශ ස්ථානයෙක්හි මහණෙකුගේ හා මාගමකගේ කථාවක් අසා තවෙකකු එහි ඇති බැව් නො දන්නේ පළමු පරිදි සැක කළේ නම් ඒ "සුත පරිසඞ්කිත" යයි.

දූතී ස්ත්‍රීන් සමග පසල් ගම් වෙහෙරෙක්හි මණ්ඩපයෙක්හි හෝ ශාලා ආදී තන්හි හෝ මල් සුවඳ ආදිය තැබූ ලකුණු ද, මස් සුරා ආදිය අනුභව කළ ස්ථාන ද දැක; මෙය කවරෙකු විසින් කරණ ලදදැයි පරීක්ෂා කරණ විට මල් ආදිය පුදන මහණෙකු දැක ඒ භික්ෂුව බෙහෙතක් වශයෙන් පානය කළ අරිෂ්ඨ ගන්ධාඝ්‍රාණය කොට මෙතෙම සුරාමස් ආදිය අනුභව කොට ධූර්ත ස්ත්‍රීන් සමග හැසුරුණේ යයි සැක පහළ කෙරේ නම්, ඒ "මුත පරිසඞ්කිත" යයි; යමෙකුට දිට්ඨ, සුත, මුත, යන පරිසඞ්කිත, ලක්ෂණවලින් යුත් ඇවතකින්ම චොදනා කළ යුතු වේ.

මෙහි "පාරජිකෙන ධම්මෙන" පාරාජික ධර්මයකින් යනු චතුවීසති පාරාජිකා අතුරෙන් භික්ෂූන්ට සාධාරණ වූ එකුන්විසි පරිජි අතුරෙන් එක්තරා එකකින් යයි. දතයුතුයි. (චතුවීසති පරිජි පාරාජික කාණ්ඩයේ දැක්වෙති.) එහෙත් පදභාජනයෙහි **"පාරාජිකෙන ධම්මෙනාති චතුන්නං අඤ්ඤතරෙන"** යි සතර පාරාජිකාවෙන් එකකින් යයි, පෙණේ; සංක්ෂෙපයෙන් මෙසේ දැක්වූවත් ටීකාවෙහි පෙණෙන පළමු දැක්වූ පරිදි සැළකිය යුතුවේ.

සං- **"අනුද්ධංසෙය්‍ය"** මෙහි දැක්වෙන අනුද්ධංසනය නම් ඇවතින් චොදනා කිරීමයි. තමා චොදනා කළත් මෙරමා ලවා කරවූවත් අනුද්ධංසන කර්මයට ඇතුළත් වේ; ඒ නිසා පද භාජනයෙහි, "චොදෙති වා චොදපෙති වා"යි දැක්වූහ;

මෙකී චොදනාව සතරාකාරයෙකින් කළ හැකි වේ; ඔව්හු නම් "වත්‍ථු සන්‍දස්සනා, ආපත්ති සන්‍දස්සනා, සංවාස පටික්ඛෙපො, සාමීචි පටික්ඛෙපො," යනුයි.

"ත්වං මෙථුනං ධම්මං පතිසෙවී"ති යනාදී වශයෙන් පවත්නා චොදනාව 'වස්තු සන්‍දර්ශනය කිරීම් වශයෙනි.

"ත්වං මෙථුනධම්මාපත්තිං සමාපන්නොසී"ති යනාදි ආකාරයෙන් කරණු ලබන චොදනාව 'ආපත්තිසන්‍දර්ශනය කිරීම් වශයෙනි.

"නත්‍ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සංඝ කම්මං වා"ති යනාදි වශයෙන් කරණ චොදනාව සංවාස ප්‍රතික්ෂෙප" වශයෙනි.

වෘඩ පරිපාටියෙන් වැදගෙණ යන අතර චොදනා කරණු කැමති පුද්ගලයාට නොවැඳ හැරීම, හුනස්නෙන් නැගී නොසිටීම, අඤ්ජලි කර්ම සාමීචි කර්මාදිය නොකිරීම "සාමීචි ප්‍රතික්ෂෙප" යයි;

මේ සිවු ආකාරයෙන් චොදනා කළ පමණකින් චොදකයාට සංඝාදිසෙසය නොවේ. චොදනාව ප්‍රකට කෙරෙයි. චුදිතයා විසින් කුමක් නිසා මට වැඳීමාදිය නොකරන්නෙහි දැයි විචාරණු ලැබූ කල්හි චොදකයා විසින් "අස්සමණො 'සි' අසක්‍ය පුත්තො 'සි' යනාදි වචන සමග ගළපා චොදනා කළ කල්හි සඞ්ඝාදිසෙසය වෙයි;

සං:- **"අප්පෙවනාම තං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යං"** මෙයින් චොදකයාගේ අදහස ප්‍රකට කෙරෙයි; යමෙකුට කරණ චොදනාව නා නා අදහස් මුදුන්පත් කොට ගෙණ කළ හැකි වේ;

"අක්කොසනාධිප්පායො, චාවනාධිප්පායො, කම්මාධිප්පයො, උඨානාධිප්පයො, උපොසථට්ඨපනාධිප්පායො, පවාරණට්ඨපනාධිප්පායො, අනුවිජ්ජනාධිප්පයො, ධම්ම කථාධිප්පා යො" යන අට වැදෑරුම් අභිප්‍රායයන් අතුරෙන් මෙහි "චාවනාධිප්පාය (ශ්‍රෙෂ්ඨචර්‍යයාවෙන් පහකරණ) වශයෙන් " යයි දතයුතුයි;

## සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදානය | - | රජගහ නුවරයි. |
| පුද්ගල | - | මෙත්තිය-භුම්මජක භික්ෂු දෙනමයි. |
| වස්තුව | - | අමූලක පරාජිකධර්මානුධ්වංසනය කිරීමයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. (යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො-පෙ-සංඝාදිසෙසො) |
| ආඥත්තිය | - | සාණත්තිකයි. |
| ආපත්ති | - | සංඝාදිසෙස, දුක්කට, යන දෙකකි. |
| අනාපත්ති | - | "සුද්ධෙ අසුද්ධ දිට්ඨිස්ස, අසුද්ධෙ අසුද්ධ දිට්ඨිස්ස, උම්මත්තකස්ස, ආදිකම්මිකස්ස," යන මොවුන්ටය. |
| විපත්තිය | - | ශීල විපත්තියයි. |

අඩග - "යං චොදෙති වා චොදපෙතිවා තස්ස උපසම්පන්නොති සඞ්ඛුපගමනං, තස්මිං සුද්ධසඤ්ඤිතා යෙන පාරාජිකෙන චොදෙති, තස්ස දිට්ඨා-දිවසෙන අමූලකතා, චාවනාධිප්පායෙන සම්මුඛා චොදනා, තස්ස තං ඛණං විජානනං යන පසෙකි.

සමුට්ඨානාදිය අදින්නාදානයෙහි මෙනි. "වේදනාව" දුඃඛ වේදනාවයි.

**අමූලක සංඝාදිසෙස වණ්නාව සමාප්තයි.**

---

# අමූලක සංඝාදිසෙසයෙහි නිදාන කථාවයි

ලොකෙකනාථවූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ රාජගෘහ නගරවරයෙහි වේළුවන වෙහෙරෙහි වැඩවසන සේක; එසමයෙහි ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රතෙම උත්පත්තියෙන් සත්හැවිරිදි කල්හිම අර්හත්ඵලය සාක්ෂාත් කරගත්තේය; උන්වහන්සේට මෙබඳු අදහසක් පහළ විය. කෙසේද? මම වනාහි සත්හැවිරිදි කල්හිම අර්හත් ඵලය සාක්ෂාත් කරගතිමි; නැවත කළයුත්තක් නොදකිමි; දැන් වනාහි සංඝයාට වත් පිළිවෙත් කරන්නෙම් දැයි, කියායි. අනතුරුව උන්වහන්සේ සංඝයාට සෙනසුන් පණවන්නෙම් නම් යෙහෙක, බත් උදෙසන්නෙම් නම් යෙහෙකැයි සිතූහ;

මෙසේ කල්පනා කොට ඵලසමවතින් නැගී සිටිසේක් භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ මෙසේ සැළ කළාහුය; ස්වාමීනි බුදුරජාණන් වහන්ස! ඵලසමවතින් නැගී සිටි මට මෙසේ අදහස් විය; මම වනාහි සත්හැවිරිදි කල මැ අර්හත් ඵලය සාක්ෂාත් කෙළෙමි. දැන් වනාහි සංඝයාට සෙනසුන් පණවන්නෙම් නම් බත් උදෙසන්නෙම් නම් යෙහෙකැයි කියායි;

සාධු සාධු දබ්බය! එසේ නම් සංඝයාට සෙනසුන් පණවව බත් උදෙසව යි වදරා සංඝයා අමතා මහණෙනි! එසේ නම් දබ්බමල්ලපුතුන් සෙනසුන් පණවන්නෙකු කොටත් බත් උදෙසන්නෙකු කොටත් සම්මත කරව්; එකල්හි භික්ෂූහ ද එසේ සම්මත කළාහුය;

9. යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චි දෙසං ලෙසමත්තං උපාදය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය, අප්පෙවනාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති, තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අඤ්ඤභාගියං චෙව තං අධිකරණං හොති කොචි දෙසො ලෙසමත්තො උපාදින්නො, භික්ඛු ච දොසං පතිට්ඨාති, සංඝාදිසෙසො;

---

ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රතෙම එතැන් පටන් ඍධ්කීය සෘඩ්බලයෙන් සුදුසු පරිදිත් ආශයයී පරිදිත් තමහට පත් කෘත්‍යභාරය ඉෂ්ට කෙළේය. එකල්හි මෙත්තිය-භූම්මජක භික්ෂූහු කිපී උන්වහන්සේට අමූලික පාරාජිකාපත්තියකින් චොදනා කළාහුය. ඒ කාරණය නිමිති කොට මේ ශික්ෂාපදය පණවා වදළසේක.

---

9. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම; දුට්ඨො, (ද්වේෂයෙන්) දූෂිත වූයේ, දොසො, සෙස්සන් කිලුටු (විනාශ) කරන්නේ, අප්පතීතො, ප්‍රීතිසුඛාදියෙන් තොර වූයේ; අඤ්ඤභාගියස්ස, (මනුෂ්‍යජාති භික්ෂුභාව කොට්ඨාසාදියෙන් අන්‍යවූ තිරිසන් ජාති ඡකලක භාවාදී භාග ඇති; අධිකරණස්ස, දබ්බමල්ල පුත්තාදී නම් කිරීමට ආධාරවූ ඡකලකාදීන්ගේ; කිඤ්චි දෙසං, ඇල්පදෙශයක්වූ; ලෙසමත්තං, ලෙශමාත්‍රයක්; උපාදය, චොදනා කරණු පිණිස ගෙණ; නං භික්ඛු, ඒ භික්ෂූහු; ඉමම්හා බ්‍රහ්මචරියා, මේ බ්‍රහ්මචරියයෙන් හෙවත් ශාසනයෙන්; චාවෙය්‍යං, පහකෙළෙම් නම්; අප්පෙවනාම, ඉතායෙහෙකැයි; ඉති මෙසේ; (මහණෙකුට) පාරාජිකෙන ධම්මෙන, පරිජි ඇවතකින්; අනුද්ධංසෙය්‍ය, චෝදනා කෙළේ වේද; තතො, ඒ චෝදනාකළ කාලයෙන්; අපරෙන සමයෙන, අන්‍යකාලයකැ. සමනුග්ගාහියමානොවා, විචාරණු ලබන්නාවූ හෝ; අසමනුග්ගාහියමානො වා, නො විචාරණු ලබන්නාවූ හෝ; භික්ඛු ච චොදක භික්ෂු තෙමේ ද; දොසං, (ඍධ්කීය) වරද; පතිට්ඨාති, කියාද; නොහොත් ඍධ්කීය වරදෙහි පිහිටා ද: තං අධිකරණං ච, (ඡකලකාදී) ඒ අධිකරණය ද; අඤ්ඤභාගි යසෙව ච, (තිරිසන් ජාති ඡකලකාදී වූ අනික් කොටස් ඇත්තේ; හොති, වේද; කොචි දෙසො, කිසිදෙයක්; ලෙසමත්තො, ලෙශමාත්‍රයෙක්; උපාදින්නො, ගන්නා ලද්දේ වේද; සංඝාදිසෙසො, (ඕහට) සංඝාදිසෙස නම් ආපත්තිය වේ.

**සං:- "අඤ්ඤභාගියස්ස"** (අඤ්ඤභාගස්ස ඉදං අඤ්ඤභාගියං, (මෙහි "ඉදං" යන නපුංසකනිර්දේශය "අධිකරණ"ශබ්දපෙක්‍ෂා වෙති) යමෙකුට චොදනා කරනු කැමති වේ නම් ඔහුගේ මිනිස් ද සමණ බැව් ආදියෙන් අන්‍යවූ තිරිසන්ද ආදී කොටස් ඇති අධිකරණය) යනු අදහසයි.

අඤ්ඤභාගො වා අස්ස අත්ථීති, අඤ්ඤභාගියං, යන විග්‍රහ පක්‍ෂයෙහි අන්‍යභාගවත් හෙවත් තිරිසන් ද ආදී හෙද ප්‍රාප්ත කොටස් ඇත්තාවූ යන අදහසයි.

පරමාර්ථ හෙයින් වෙන් වෙන් වශයෙන් ජකලකාදීන් නැතත් ප්‍රතිමාවට ශරීරයයි කියන්නාක් මෙන් අභෙදයෙහි හෙදකල්පනාවෙන් පැවැති ලොකව්‍යවහාරය නිසා අඤ්ඤභාගස්ස ඉදං අඤ්ඤභාගො වා අස්ස අත්ථීති යන අරුත් ප්‍රකාශ කළ බැව් ටීකාචාර්‍ය්‍යයෝ පවසති;

**සං:- "කිඤ්චි දෙසං ලෙසමත්තං උපාදය"** මෙයින් දක්වන ලෙසය දශප්‍රකාර වේ; එහෙයින් ටීකාවෙහි:-

"ලෙසා ජාති නාමගොත්ත ලිඞ්ගාපත්තිවසාපි ච
පත්තචීවරුපජ්ඣායා චරියා චාවාසා දස යී; ප්‍රකාශ වේ;

ජාතිලෙසය, නාමලෙසය, ගොත්තලෙසය, ලිඞ්ගලෙසය,ආපත්ති ලෙසය, පත්තලෙසය, චීවරලෙසය, උපජ්ඣායලෙසය, ආචරියලෙසය, සෙනාසනලෙසය, යන දශප්‍රකාර ලෙශයන් අතුරෙන් (යමෙකුට චොදනා කිරීම පිණිස) එක්තරා එකක් හෝ ඊට වැඩියක් හෝ ඉදිරිපත්කොට ගෙණ යන අදහසයි;

**සං:- "අධිකරණං"** මෙයින් අධිකරණ සතරක් ප්‍රකාශ වෙති; ඒ විවාදධිකරණය, අනුවාදධිකරණය, ආපත්තාධිකරණය, කිච්චාධිකරණය යන සිවු අධිකරණයන් අතුරෙන් මෙහි ආපත්ත්‍යධිකරණ යයි සැලකිය යුතුයි;

මෙහි නිදනය අටවැනි ශික්‍ෂාපදයෙහි මෙන් දතයුතුයි. ප්‍රඥප්තිය වානාහි අඤ්ඤභාගිය අධිකරණය පිළිබඳ කිසි ලෙශමාත්‍රයක් ගෙණ පරිජි ඇවතකින් අනුධංසනය කිරීමයි;

**නවවැනි සංඝාදිසෙස වණ්නාව සමාප්තයි.**

# නවවැනි සංඝාදිසෙසයෙහි නිදාන කථාව

අපගේ ලොකස්වාමි වූ බුදුන් වහන්සේ රජගහ නුවර වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි මෙත්තිය - භුම්මජක භික්ෂූහු ගිජ්ජකූළ පව්වෙන් බසින්නාහු සංවාසයෙහි යෙදෙමින් සිටි එළුවෙකු හා එළුදෙනක දක මෙසේ කීවාහුය. ඇවැත්ති! මේ ඡකලකයාට දබ්බමල්ල පුත්‍රයා යයි ද එළුදෙනට මෙත්තියා භික්ෂුණී යයි ද නම් තබමු. එසේම ව්‍යවහාර කරමු. ආයුෂ්මතුනි! අපි පෙර ශ්‍රැති මාත්‍රයෙන් දනිමු. දන්වූකලී දබ්බමල්ල පුත්‍රයා මෙත්තියා භික්ෂුණිය සමග සංවාසයෙහි යෙදෙනු සියැසින්ම දුටු වෙමු යි කියා එතැන් පටන් ඡකලකයාට දබ්බමල්ල පුත්‍රයා යයි ද ඒ එළුදෙනට මෙත්තියා භික්ෂුණී යයි ද ව්‍යවහාර කළහ.

ඒ භික්ෂූහු සෙසු භික්ෂූන් හමුවෙහිදී ඇවැත්ති! අපි පෙර මෙ කරුණ ශ්‍රැතියෙන් දනිමු; දන් වනාහි දබ්බමල්ල පුත්‍රයා මෙත්තිය භික්ෂුණිය සමග සංවාසයෙහි යෙදෙනු ඇසින්ම දුටුවෙමුයි කීහ; ඇවැත්ති! එසේ නොකියව්; ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රතෙම එසේ නොකරන්නේ යයි ඒ ඇසූ භික්ෂූහු කීවාහුය; නැවත භාග්‍යවතුන් වහන්සේට ද මෙ කරුණ දන්වූවාහුය;

තථාගතයන් වහන්සේ භික්ෂු සංඝයා රැස්කරවා ආයුෂ්මත් දබ්බමල්ල පුතුන් විචාළසේක; කෙසේද? දබ්බය! මෙබන්දක් කෙළෙහිය යනු සිහිකරන්නෙහිද? මේ භික්ෂූහු යමක් කියත් නම් එයයි; ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මා දන්නා සේක; දෙවනු තෙවනුත් විචාළ කල්හි එසේම උත්තර දුන්නේ ය

දබ්බය! මෙය එපමණෙකින් විනිවෙඨනය නොවන්නේය; තොප විසින් කරණලද නම් එසේ යයි ද නැතහොත් නොකෙළෙමියි ද කියව; ස්වාමීනි බුදුරජාණන්වහන්ස "මම උපන්ද සිට මෙතෙක් සිහිනෙන් නමුදු එබන්දක් කෙළෙමියි සිහි නොකරමි"යි නිදිවර්ජිත කල්හි කියනු කිම? යයි කීයේය;

එකල්හි තථාගතයන් වහන්සේ මහණෙනි! මෙත්තිය භුම්මජක භික්ෂූන් අනුයුඤ්ජනය කරව් යයි වදරා වෙහෙරට වැඩිසේක; භික්ෂූහු ද මෙ කරුණ පරීක්ෂා කොට අසත්‍ය බැව් දන බුදුන්වහන්සේට සැළකළ කල්හි භික්සඟුන් කැඳවා මේ ශික්ෂාපදය පණවා වදළ සේක;

10. යො පන භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භේදාය පරක්කමෙය්‍ය; භේදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ තිට්ඨෙය්‍ය; සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො, මා ආයස්මා සමග්ගස්ස සඞ්ඝස්ස භේදාය පරක්කමී; භේදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි, සමෙතායස්මා සඞ්ඝෙන සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතීති, එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය; සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, සඞ්ඝාදිසෙසො.

---

10. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම; සමග්ගස්ස සංඝස්ස, සමගි සංඝයාගේ, භේදාය, භේදය පිණිස; පරක්කමෙය්‍ය, යත්නකෙරේ ද! භේදනසංවත්තනිකං වා අධිකරණං, අටළොස් භේදකර වස්තුවක් හෝ; සමාදාය (භේද කරණු පිණිස) ගෙණ; පග්ගය්හ, දැඩිකොට ගෙණ; තිට්ඨෙය්‍ය, සිටීද; සො භික්ඛු, ඒ (භේදකර) මහණ තෙම; භික්ඛූහි, ලජ්ජී භික්ෂූන් විසින්; එවං, මෙසේ; වචනීයො අස්ස, කියයුතු වන්නේය; කෙසේද?

ආයස්මා, ආයුෂ්මත්තෙම; සමග්ගස්ස, සමගිවූ; සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; භේදාය, බිඳීම පිණිස; මා පරක්කමී, යත්න නොකරව; භේදනසංවත්තනිකං, සඞ්ඝභේදය පිණිස පවත්නා වූ; අධිකරණං වා අධිකරණයක් (හේතුවක්)හෝ; සමාදාය, ගෙණ; පග්ගය්හ, දැඩිකොට ගෙණ (සංග්‍රහ කොට) මා අට්ඨාසි, නො සිටුව; ආයස්මා, ආයුෂ්මත්තෙමේ; සංඝෙන, සඞ්ඝයා සමග; සමෙතු, එක්වේවා; කුමක් නිසාද යත්? හි , එසේ මැයි; සඞ්ඝො, සඞ්ඝ තෙම; සමග්ගො, සමගි වූයේ; එකුද්දෙසො, එකට පැවති පාමොක් උදෙසීම් ඇත්තේ; සම්මොදමානො, (ශීලාදීන්ගේ පරිපූර්ණත්වයෙන්) සතුටුවනුයේ; අවිවදමානො, විරුඩවාද නො කරන්නේ; ඵාසු, සුවසේ; විහරති'ති, වාසයකරයි ද; (එහෙයිනි) සො භික්ඛු, ඒ මහණ තෙම; භික්ඛූහි, භික්ෂූන් විසින්; එවඤ්ච, මෙසේත්; වුච්චමානො, කියනු ලබන්නේ; තථා එව, එසේම; පග්ගණ්හෙය්‍ය, දැඩිකොට ගෙන සිටී නම්; සො භික්ඛු, ඒ මහණතෙම; භික්ඛූහි, ලජ්ජී භික්ෂූන් විසින්; තස්ස පටිනිස්සග්ගාය, ඒ දෘෂ්ටිය හරණ පිණිස; යාව තතියං, තෙවනවරතෙක්; සමනුභාසිතබ්බො, සමනුභාෂණකර්මය (ඤත්ති චතුත්ථකර්මවාක්‍යය දෙසා හික්මවීම) කටයුත්තේයි.

වෙ ඉදින්, තස්ස පටිනිස්සග්ගාය, ඒ දෘෂ්ටිය හරණා පිණිස, යාව තතියං, තෙවනවරතෙක්; සමනුභාසියමානො, සමනු භාෂණකර්මය කරණු ලබන්නේ; තං, ඒ දෘෂ්ටිය, පටිනිස්සජ්ජෙය්‍ය, හලේ නම්; ඉච්චෙතං, මෙසේ ඒ දෘෂ්ටිය හැරපීම, කුසලං, මැනවි; නො වෙ පටි නිස්සජ්ජෙය්‍ය, ඉදින් (ඒ දෘෂ්ටිය) නො හලේ නම්; සඞ්ඝාදිසෙසො, සඞ්ඝාදිසෙසය වේ.

සං:- **"සමග්ගස්ස සඞ්ඝස්ස"** යනු සිතින් හා සිරුරින් එකීභූත වීමයි. ඒ නිසා පදභාජනයෙහි **"සමග්ගො නාම සංඝො සමාන සංවාසකො සමානසීමායං ඨිතො ති"** ප්‍රකාශ වේ. ඔවුනොවුන්ගේ සිත් එකිනෙකට අවිරුද්ධ වීම එක දෘෂ්ටියක පිහිටීම, සිතින් එක්වීමයි. කාය සාමග්‍රී දන යෙන් එක් සීමාවෙක් හි සිටීම කයින් එක්වීමයි.

සං:- **"භෙදනසංවත්තනිකං වා අධිකරණං"** යනු සංඝ භෙදයට කරුණු වූ අටළොස් හෙදකර වස්තූහු වෙති. මෙහි "අධිකරණ" ශබ්දය කාරණාර්ථ වාචී වේ, "කාමහෙතු, කාම නිදනං, කාමාධිකරණං" යනාදි තන්හි මෙනි.

හෙදකර වස්තු අටළොසෙකි ඔවුහු නම්:-

1. "අධම්මං ධම්මොති දීපෙන්ති; 2. ධම්මං අධම්මොති දීපෙන්ති; 3. අවිනයං විනයොති දීපෙන්ති; 4. විනයං අවින යොති දීපෙන්ති; 5. අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති; 6. භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති; 7. අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති; 8. ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති; 9. අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති; 10. පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති; 11. අනාපත්තිං ආපත්තිති දීපෙන්ති; 12. ආපත්තිං අනාපත්තීති දීපෙන්ති; 13 ලහුකං ආපත්තිං ගරුකං ආපත්තීති දීපෙන්ති; 14 ගරුකං ආපත්තිං ලහුකං ආපත්තීති දීපෙන්ති; 15. සාවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙන්ති; 16. අනවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙන්ති; 17. දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති; 18. අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති."

මෙහි සංග්‍රහ ගාථාවෝ ද වෙති.

"ධම්ම විනය භාසිතා චිණ්ණ පඤ්ඤත්තිනා දුකා
ආපත්තිලහු දුට්ඨුල්ලා සාවසෙස දුකානි ච
එතානට්ඨාරසභෙද කර වත්ථූති වුච්චරෙ
විපල්ලාසගහිතානි වාද මූලූපනිස්සයා'ති"

සඞ්ඝ භෙදයට උත්සාහ කරණ මහණෙකු ඉදිරියේ දකීද, නැතහොත් අසුවල් විහාරයේ සිටින්නේ යයි අසාද අඩ යොදුනක් තැන් නමුත් ගොස් එය දුරලීම පිණිස ඒ භික්ෂු හට කරුණු කීම ලජ්ජී භික්ෂූන්ට අයත් ශාසනික මෙහෙයකි. එය පැහැර හැරිය හොත් හෙදක භික්ෂුව දුටුවා වූද, ඔහුගේ තොරතුරු ඇසුවාවූද භික්ෂූන්ට දුකුළා වෙති.

**මෙහි සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | රජගහනුවරයි. |
| පුද්ගලයා | - | දෙවදත්ත තෙමේයි. |
| වස්තුව | - | සඞ්ඝභෙද පරක්කමන වස්තුවයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. ("යො පන භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස-පෙ-සඞ්ඝාදිසෙසො") |
| ආණත්තිය | - | අනාණත්තිකයි. |
| ආපත්ති | - | සංඝාදිසෙස, ථුල්ලච්චය, දුක්කට යන තුනෙකි. |
| අනාපත්ති | - | "අසමනුභාසියමානස්ස, පටිනිස්සජන්තස්ස, උම්මත්තකස්ස, ආදිකම්මිකස්ස" යන මොවුන්ටයි. |
| විපත්තිය | - | ශීලවිපත්තියයි. |
| අඞ්ග | - | "හෙදය පරික්කමනං, ධම්මකම්මෙන සමනු භාසනං, කම්මවාචාපරියොසානං, අප්පටි නිස්සජ්ජනං" යන චතුරඞ්ගයකි. |
| සමුට්ඨාන | - | සමනුභාසන සමුට්ඨානයයි, (කාය, වාචා, චිත්ත) |
| කිරියා | - | අක්‍රියාවයි. |
| සඤ්ඤව | - | සඤ්ඤවිමොක්ඛයයි. |
| චිත්තය | - | සචිත්තකයි. |
| වජ්ජය | - | ලොකවජ්ජයයි. |
| කම් | - | කාය, වචී, කම්යි. |
| කුසලත්‍රිකය | - | අකුශල චිත්තයයි. |
| වෙදනාත්‍රිකය | - | දුඃඛවෙදනාවයි. |

**දසවැනි සඞ්ඝාදිසෙස වණ්නාව සමාප්තයි.**

---

# දසවැනි සංඝාදිසෙසයෙහි නිදාන කථාව

එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වෙළුවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි දෙවදත්ත තෙම දුර්බුද්ධි වූ කොකාලිකාදීන් කරා පැමිණ මෙසේ කීයේය. කෙසේද යත්? ඇවැත්නි! මා හා සමග එනු මැනව, අපි ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ සඞ්ඝයා භෙද කරන්නෙමු"යි කියායි; මෙසේ කී කල්හි කොකාලික තෙම ඇවැත්නි! ගෞතම බුදුන් වහන්සේ මහත්වූ සෘද්ධි ඇත්තෝය, මහත් ආනුභාව ඇත්තෝය, කෙසේ නම් අපි උන්වහන්සේගේ සඞ්ඝයා භෙද කරන්නෙමුදයි ඇසීය.

ඇවැත්නි! එව, අපි බුදුන් වහන්සේගෙන් මේ පඤ්චවිධ වරය ඉල්ලමු කෙසේද? භාග්‍යවතුන් වහන්සේ නොයෙක් අයුරින් අප්පිච්ඡතාදීන්ගේ ගුණ වර්ණනා කරණ සේක, එබැවින් මේ පඤ්චවස්තූන් අනුදන වදාරණ සේක්වායි කියායි. ඒ පඤ්ච වස්තූන් පිළිබඳ වරය ලැබීම සඳහා දෙව්දත් තෙමේ ස්වකීය පිරිසත් කැටුව බුදුන් වහන්සේ වෙත ගොස් වැඳ එකත් පසෙකැ සිට මෙසේ සැළකෙළේය.

ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ආකාරයෙන් අප්පිච්ඡතාදීන්ගේ ගුණ වර්ණනා කරණ සේක. ස්වාමීනි! මේ පඤ්ච වස්තූහු අප්පිච්ඡතාදිය පිණිස පවත්නාහුය. ඒ පඤ්ච වස්තූහු නම්:- "භික්ෂූහු දිවි ඇති තෙක් ආරණ්‍යකයෝ වෙත්වා, යමෙක් ග්‍රාමාන්තයට පැමිණිය හොත් වරදක් කෙළේ වෙයි. දිවි ඇති තෙක් පිණ්ඩපාතිකයෝ වෙත්වා. යමෙක් නිමන්ත්‍රණ බත් ආදියක් ඉවසුව හොත් දෝෂයක් කෙළේ වෙයි. දිවි ඇති තෙක් පාංශුකූලිකයෝ වෙත්වා. යමෙක් ගෘහපති චීවරාදියක් දරුව හොත් වරදින් බැඳුනේ වේ. දිවි ඇති තෙක් වෘක්ෂමූල සෙනාසනිකයෝ වෙත්වා. යමෙක් සෙවිලි කළ ගෙයක් යටට පැමිණිය හොත් වරදක් කෙළේය. දිවි ඇති තෙතක් මත්ස්‍ය මාංශ අනුභව නො කෙරෙත්වා. යමෙක් මත්ස්‍ය මාංශ අනුභව කළහොත් වරදක් කෙළේ වේ, යනුයි. මේවා අනුදන වදාරණ සේක්වායි ආරාධනය කෙළේය.

11. තස්සෙව ඛො පන භික්ඛුස්ස භික්ඛූ හොන්ති අනු වත්තකා වග්ගවාදකා එකො වා ද්වෙ වා තයො වා, තෙ එවං වදෙය්‍යුං; මා ආයස්මන්තො එතං භික්ඛුං කිඤ්චි අවචුත්ථ, ධම්ම වාදී චෙසො භික්ඛු විනයවාදී චෙසො භික්ඛු; අම්හාකං චෙසො භික්ඛු ඡන්දඤ්ච රුචිඤ්ච ආදාය වොහරති, ජානාති නො භාසති, අම්හාකම්පෙතං ඛමතීති, තෙ භික්ඛූ භික්ඛූහි එවමස්සු වචනීයා, මා ආයස්මන්තො එවං අවචුත්ථ.

---

එකල්හි බුදුන් වහන්සේ දෙවදත්තය! පඤ්ච වස්තුන් විශෙෂයෙන් අනුදැනීමෙන් කටයුතු කිමද? යම්කිසි මහණෙක් ආරණ්‍යකාඞ්ගාදිය රකින්ට කැමති වූයේ නම් එසේ කෙරේවා. නැතහොත් ග්‍රාමසෙනාසනවල හිඳීමාදිය කෙරේවායි වදළ සේක.

එකල්හි දෙව්දත් තෙම පළමු කල්පනා කළ අයුරින්ම තථාගතයන් වහන්සේ පඤ්ච වස්තූන් ප්‍රතික්ෂෙප කළ බැවින් සතුටුව ගොස් මහජනයාට කියමින් තන්හි තන්හි හැසුරුණේය. එයින් අනුවණ අශ්‍රද්ධාවත් ජනයෝත් දෙව්දත් හට පැහැදුනෝය. ශ්‍රද්ධා බහුල ඥාණවන්තයෝ දෙව්දත් තෙර කෙසේ නම් සඞ්ඝ හෙදය පිණිස උපාය යොදන්නේ දැයි උජ්ඣායනා කළාහුය. මෙ කරුණ නිමිති කොට ගෙණ තථාගතයන් වහන්සේ මේ ශික්ෂාපදය පණවා වදළ සේක.

---

11. **අර්ථ**:- තස්ස එව ඛො පන භික්ඛුස්ස, ඒ සඞ්ඝ හෙදයට යත්න දරණ භික්ෂුහට වනාහි: අනුවත්තකා, (ඔහුගේ දෘෂ්ටිය ගැණීමෙන් අනුව පවත්නාවූ වග්ගවාදකා, (අසාමග්‍රීය පාක්ෂික) වචන කියන්නාවූ: භික්ඛූ, භික්ෂූහු: එකො වා, එකෙක් හෝ: ද්වෙ වා, දෙදෙනෙක් හෝ: තයො වා, තිදෙනෙක් හෝ: හොන්ති, වෙද්ද.

තෙ ඒ භික්ෂූහු; එවං වදෙය්‍යුං, මෙබස් කියන්නාහු නම්; කෙසේ ද? ආයස්මන්තො, ආයුෂ්මතුනි! එතං භික්ඛුං, මේ භික්ෂුහට; කිඤ්චි, කිසිවක්; මා ආවචුත්ථ, නොකියව්; එසො භික්ඛු, මේ මහණතෙම; ධම්මවාදී ච, ධර්මය ද කියයි; එසො භික්ඛු, මේ මහණතෙම; විනය වාදී ච, විනය ද කියයි; එසො භික්ඛු, මේ මහණ තෙම; අම්හාකඤ්ච, අපගේත් ; ඡන්දඤ්ච, කැමැත්ත (අදහස) ද: රුචිඤ්ච, රුචිය ද; අදය ගෙණ; වොහරති, ව්‍යවහාර කෙරෙයි; (කියයි) නො, අපගේ; (ඡන්දදිය) ජානාති,

නායස්මා භික්ඛු ධම්මවාදී නායස්මා භික්ඛු විනයවාදී, මා ආයස්මන්තානම්පි සංඝභෙදෙ රුච්චිත්ථ, සමෙතායස්මන්තානං සංඝෙන, සමග්ගොහි සංඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතීති,

එවඤ්ච තෙ භික්ඛූ භික්ඛූහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍යුං, තෙ භික්ඛූ භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටි නිස්සග්ගාය, යාව තතියං චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍යුං, ඉච්චෙතං කුසලං, නොචෙ පටිනිස්සජ්ජෙය්‍යුං සංඝාදිසෙසො,

---

දනියි; භාසති, කියයි; අම්හාකං අපි, අපට ද; එතං, මෙය; ඛමතීති, රුචිවේයයි; තෙ භික්ඛූ, ඒ සඞ්ඝ භෙදනුවර්තික භික්ෂූහු; ආයස්මන්තො, ආයුෂ්මතුනි ! එවං, මෙසේ; මා අවුවුත්ථ, නොකියව්; එසො භික්ඛු, මේ මහණතෙම; ධම්මවාදි ච න, ධර්මය කියන්නේත් නොවෙයි; විනයවාදී ච න, විනය කියන්නේත් නොවෙයි; ආයස්මන්තානම්පි, ආයුෂ්මතුන්ටත්; සංඝභෙදෙ, සංඝභෙදය; මා රුච්චිත්ථ, රුචිනොවේවා; ආයස්මන්තානං, ආයුෂ්මතුන්ගේ (සිත්) සංඝෙන, සඞ්ඝයා හා සමග; සමෙතු, එකීභාවයට යේවා; කුමක් හෙයින් ද යත්? සඞ්ඝො, සඞ්ඝතෙම; සමග්ගොහි, සමගි වූයේ; සම්මොදමානො, සතුටු වනුයේ; අවිවදමානො, (මේ ධර්මය වේ මේ අධර්මය වේ යයි) විවාද නොකරන්නේ; එකුද්දෙසො, එකට පැවති පාමොක් උදෙසීම් ඇත්තේ; ඵාසු, සුවසේ; විහරතීති, වාසය කරන්නේයයි; එවං වචනීයා අස්සු, මෙසේ කියයුත්තෝ වන්නාහුය. එවඤ්ච, මෙසේත්; භික්ඛූහි, (ලජ්ජී) භික්ෂූන් විසින්; වුච්චමානා කියනු ලබන්නාවූ තෙ භික්ඛූ, ඒ භික්ෂූහුතුමූ.

එවං එසේම; පග්ගණ්හෙය්‍යුං, දැඩිකොට ගෙණ සිටින්නාහු නම්; තෙ භික්ඛූ, ඒ භෙදනුවර්තක භික්ෂූහුතුමූ; භික්ඛූහි, සෙසු භික්ෂූන් විසින්; යාවතතියං, තුන්යලක්; තස්ස පටිනිස්සග්ගාය, ඒ දෘෂ්ට්‍යාදිය හරණ පිණිස; සමනුභාසිතබ්බා, සමනුභාෂණ කර්මය කටයුත්තාහුය; චෙ, ඉදින්; යාවතතියං, තෙවෙනිවර තෙක්; සමනුභාෂණ කර්මය කරණු ලබන්නාහු: තං, එය; පටිනිස්සජ්ජෙය්‍යුං, දුරු කෙරෙත් නම්; ඉච්චෙතං, මෙසේ මේ දුරුකිරීම; කුසලං. මැනවි; නොචෙ පටිනිස්සජ්ජෙය්‍යුං, ඉදින් නොහරිත් නම්; සඞ්ඝාදිසෙසො, සඞ්ඝාදිසෙසය වේ.

සං:- **"වග්ගවාදකා"** (වග්ගං වදන්තී'ති; වග්ගවාදකා,)සංඝයා කොටසක් වී කලහ කරන්නාවූ; අසාමග්‍රීය පාක්ෂික යන්ගේ වචන කියන්නා වූ යන අදහසයි.

සං:- **"එකො වා ද්වෙ වා තයො වා"** මෙහි එකෙක් හෝ දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝ කියා වෙන් කොට දක්වීමට හේතුව නම් සතරදෙනෙකු වුව හොත් "සංඝ" සංඛ්‍යාවට යාමයි. සංඝ තෙම උබ්බාහිකාදී කර්මයක් හැර නිග්‍රහ කර්මයක් නොකෙරෙයි. එබැවින් මෙහි ප්‍රකාශ වන නිග්‍රහ කර්මය තිදෙනෙකුගෙන් සීමා කොට දක්වූහයි ටීකා කාරයෝ කියති.

**සප්තදශාකාරය**

නිදනය - රජගහනුවරයි.

පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුයි.

වස්තුව - භෙදානුවර්තක වස්තුවයි.

ප්‍රඥප්ත්‍යාදිය දශවැනි ශික්ෂා පදයෙහි මෙනි.

**එකොළොස්වැනි ශික්ෂාපද වර්ණනාව සමාප්තයි.**

---

# එකාදස සංඝාදිසෙසයෙහි නිදන කථාව

සනරාමර ලොකශිවඞ්කර වූ සම්මා සම්බුදුන්වහන්සේ වෙළුවන වෙහෙරෙහි වැඩ වසන සේක. එසමයෙහි දෙව්දත්තෙම සඞ්ඝභෙදයට උත්සාහ කෙරෙයි. එකල්හි ලජ්ජී පෙසල භික්ෂූහු දෙව්දත් තෙම අධර්මවාදීය, අවිනයවාදීය, කෙසේ නම් දෙව්දත් තෙම සංඝභෙදයට උත්සාහකරන්නේ දැයි කීවාහුය. එවිට දෙවදත්ත පාක්ෂික කොකාලිකාදී භික්ෂූහු, ආයුෂ්මතුනි! මෙසේ නො කියව්. දෙව්දත් තෙම ධර්මවාදීය. විනයවාදීය අපගේ ද අදහස් පරිදි එසේ කරන්නේය. අපට ද එය රුචි වේ යයි කීවාහුය.

එකල්හි යම් භික්ෂූහු අල්පෙච්ඡ වූවාහු නම් ඔව්හු කෙසේ නම් භික්ෂූහු සඞ්ඝභෙදය පිණිස දෙව්දත්හට අනුවර්තක වන්නාහු දැයි උජ්ඣායනා කොට නුගුණ ප්‍රකට කළාහුය. ඉක්බිති තථාගතයන් වහන්සේට ද සැළ කළාහුය. භාග්‍යවතුන් වහන්සේ මෙකරුණ නිසා මේ ශික්ෂාපදය පණවා වදළසේක.

---

12. භික්ඛු පනෙව දුබ්බචජාතිකො හොති. උද්දෙසපරියා පන්නෙසු සික්ඛාපදෙසු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරොති, මා මං ආයස්මන්තො කිඤ්චි අවචුත්ථ කල්‍යාණං වා පාපකං වා, අහම්පායස්මන්තෙ න කිඤ්චි වක්ඛාමි කල්‍යාණං වා පාපකං වා විරමථා යස්මන්තො මම වචනායාති. සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනියො; මා ආයස්මා අත්තානං අවචනීයං අකාසි, වචනීයමෙවායස්මා අත්තානං කරොතු, ආයස්මා පි භික්ඛූ වදෙතු සහ ධම්මෙන, භික්ඛූ'පි ආයස්මන්තං වක්ඛන්ති සහධම්මෙන, එවං සංවද්ධා හි තස්ස භගවතො පරිසා යදිදං අඤ්ඤමඤ්ඤ වචනෙන අඤ්ඤමඤ්ඤ වුට්ඨාපනෙනාති.

එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය සො භික්ඛු භික්ඛූහි යාව තතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටි නිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය සඞ්ඝාදිසෙසො.

---

12. අර්ථ:- භික්ඛු පනෙව, භික්‍ෂුතෙම වනාහි; දුබ්බචජාතිකො හොති, දුර්වස් ස්වභාවය (නොකීකරු ගතිය) ඇත්තේ වේද, උද්දෙසපරියාපන්නෙසු ප්‍රාතිමොක්‍ෂොද්දෙශයෙහි ඇතුළත් වූ; සික්ඛාපදෙසු, ශික්‍ෂාපදයන් හි ලා; භික්ඛූහි, ලජ්ජී භික්‍ෂූන් විසින්; සහධම්මිකං, සහධර්මයෙන් (ශික්‍ෂාපදයෙන්) වුච්චමානො, කියනු ලබන්නේ; අත්තානං තමා; අවචනීයං, නො කියයුත්තෙකු; කරොති, කෙරේ ද.

ආයස්මන්තො ආයුෂ්මත්වරුනි; කල්‍යාණං වා, යහපතක් හෝ; පාපකං වා, අයහපතක් හෝ; කිඤ්චි, කිසිවක්; මං, මට; මා අවචුත්ථ, නොකියව්; අහම්පි, මම ද; ආයස්මන්තෙ, ආයුෂ්මත්වරුන්ට; කල්‍යාණං වා, යහපතක් හෝ; පාපකං වා, අයහපතක් හෝ; කිඤ්චි, කිසිවක්; න වක්ඛාමි, නො කියමි; ආයස්මන්තො, ආයුෂ්මත්වරුනි; මම වචනාය, මට (කරණ) අවවාදයෙන්; විරමථ, වෙන් වව්.

සො භික්ඛු, ඒ මහණ තෙම; භික්ඛූහි, (සෙසු ලජ්ජී) භික්‍ෂූණ් විසින්; ආයස්මා, ආයුෂ්මත් තෙම; අත්තානං, තමා; අවචනීයං, නොකිය යුත්තෙකු; මා අකාසි, නොකෙරේවා: ආයස්මා, ආයුෂ්මත්තෙම: අත්තානං, තමා: වචනීයං එව, කිවයුත්තෙකුම: කරොතු, කෙරේවා.

ආයස්මාපි, අයුෂ්මත් තෙමේ ද; භික්ඛූ, භික්‍ෂූන්ට; සහ ධම්මෙන, ප්‍රඥප්ති සඞ්ඛ්‍යාත ශික්‍ෂාවෙන්; වදෙතු, කියවා; භික්ඛූපි, භික්‍ෂූහු ද; ආයස්මන්තං, ආයුෂ්මතුන්ට; සහධම්මෙන, ප්‍රඥප්ති සංඛ්‍යාත ශික්‍ෂාවෙන්;

වක්ඛන්ති, කියත්; එවං, මෙසේ ; යදිදං, යම්මේ; අඤ්ඤමඤ්ඤ වචනෙන, අන්‍යොන්‍ය අනුශාසනාවෙන් ; (යදිදං යම්මේ) අඤ්ඤමඤ්ඤ වුට්ඨානෙන, අන්‍යොන්‍යයන් ඇවතින් නගාලීමෙන්; තස්ස භගවතො, ඒ භාග්‍යවත්හුගේ; පරිසා, පිරිස් තොමෝ; සංවඩ්ඪා හි ඉති, ශීලාදීන් කරණ කොටගෙණ) අභිවර්ධනය වන්නීම යයි; එවං, මෙසේ; වචනීයො අස්ස, කියයුතු වන්නේය.

සො භික්ඛු, ඒ මහණ තෙම; භික්ඛුහි,සෙසු ලජ්ජී භික්ෂූන් විසින්; එවඤ්ච, මෙසේත්; වුච්චමානො, කියනු ලබන්නේ; තථෙව, එපරිද්දෙන්ම; පග්ගණ්හෙය්‍ය, දැඩිකොට ගණී නම්; සො භික්ඛු, ඒ මහණතෙම; භික්ඛුහි, භික්ෂූන් විසින්; තස්ස පටිනිස්සග්ගාය, ඒ දෘෂ්ටිය දුරලීම පිණිස; යාවත තියං, තුන්වන වරතෙක්; සමනුභාසිතබ්බො, සමනුභාෂණය කටයුත්තේය; චෙ ඉදින්; යාවත තියං, තුන්වනවරතෙක්; සමනුභාසියමානො, ඥප්තිචතුර්ථ කර්ම වාක්‍යය කියනු ලබන්නේ; තං, ඒ දෘෂ්ටිය, පටිනිස්සජ්ජෙය්‍ය, හළේ නම්; ඉච්චෙතං, ඒ හැරපීම; කුසලං, යහපති; චෙ, ඉදින්; නොපටිනිස්සජ්ජෙය්‍ය, නො හළේ නම්; සංඝාදිසෙසො, සංඝාදිසෙසය වේ.

සං:- **"දුබ්බචජාතිකො"**යි (දුක්ඛෙන වත්තබ්බො අනුසාසිතුං අසක්කුණෙය්‍යො සභාවො අස්සා'ති; දුබ්බචජාතිකො; දුර්වච ස්වභාවය හෙවත් අවවාද වශයෙන් යමක් කියනු ලබන කල්හි නොයිවසන ගතිය මෙයින් දක්වේ.

සං:- **"උද්දෙසපරියාපන්නෙසු සික්ඛාපදෙසු"** යනු (උද්දිසීය තීති, උද්දෙසො; තස්මිං පරියාපන්නා, උද්දෙසපරියාපන්නානෙසු, උද්දෙසපරියාපන්නෙසු,) උද්දෙසය, නම්, ප්‍රාතිමොක්ෂයයි. එබැවින් ප්‍රාතිමොක්ෂයෙහි ඇතුළත් වූ, ශික්ෂාපදයන්හි යන අදහසයි. "යස්ස! සියා ආපත්ති සො අවිකරෙය්‍ය; "කියා සංගෘහිත බැවින් පාමොක්හි අන්තර්ගත ශික්ෂා පදයන්හි යයි නිශ්චය වශයෙන් ප්‍රකාශිතයි.

සං:- **"සහධම්මිකං වුච්චමානො"** යනු සහධම්මේ කෙන වුච්චමානො යි අර්ථගත යුතුයි; "සහධම්මි කං" යනු කරණාර්ථයෙහි ද්විතීයාවයි. භික්ෂු, භික්ෂුණී, සාමණෙර සාමණෙරී; සික්ඛමානා යන පඤ්ච සහධම්මිකයන් විසින් හික්මියයුතු බැවින් හා ඔවුන්ට අයිති බැවින් "සහධම්මික" සඤ්ඥිත වූ අධිගමූපාය භූත වූ විනය ප්‍රඥප්ති කරණ කොටගෙණ කියනු ලබන කල්හි යනු අදහසයි.

"මම වචනාය" යනු "මම වචනතො"යි අර්ථ ගත යුතුයි. වචනාය" යනු අපාදනාර්ථයෙහි සම්ප්‍රදාන විභක්තියයි.

**සප්තදශාකාරය.**

නිදනය - කොසඹෑනුවරයි.

පුද්ගලයා - ඡන්නස්ථවිරයන් වහන්සේයි.

වස්තුව - තමන් නොකියයුත්තෙකු කිරීම් වස්තුවයි.

සෙස්සෝ දසවැනි සඞ්ඝාදි සෙසයෙහි මෙනි.

අඞග අතුරෙන් එහි යම්සේ "පරක්කමෙන" වේද, මෙහි අවචනීය කරණතාව"යි දත යුතුයි.

**දෙලොස් වැනි ශික්ෂාපද වර්ණනාව සමාප්තයි.**

---

# ද්වාදසම සංඝාදිසෙසයෙහි නිදන කථාව

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවර ඝොසිතාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් ඡන්න තෙරණුවෝ අනාචාරයෙහි හැසිරෙති.

සෙසු භික්ෂූහු උන්වහන්සේට ඇවැත්නි! ඡන්නය මෙබඳු මෙබඳු දේ නොකරව, ඒ මේ දේ නොකැපයයි කීවාහුය. එබසට ඡන්නතෙරණුවෝ, ඇවැත්නි! කිම? තෙපි මා අවවාද කළ යුත්තෙකු කොට සලකන්නහුද මම නම් තොපට අවවාද කිරීමට සුදුසු වෙමි. බුදුන් අපගේය, දහම් අපගේය, අපගේ ආර්‍ය්‍ය පුත්‍රතෙම දහම්පසක් කෙළේය.

යම්සේ මහාවාතයෙන් තෘණ පරණලා පත් ආදිය එක්තන්හිවේ ද එසේම මහානදී වේගයෙන් සෙවෙල් ආදී ද එක තන්හි රැස්වේ ද? එමෙන් තෙපිත් නානා නම් ගොත් කුල ඇත්තෝය. තෙපි සියලුදෙනා එක්ව මට අවවාද කරන්ට සැලකූ දැයි කීවෝය.

එකල්හි මුන්වහන්සේගේ චරිතය කෙරෙහි කලකිරි භික්ෂූහු නුගුණ කීවාහුය. තථාගතයන් වහන්සේට ද සැළ කළාහුය.

භාග්‍යවතුන් වහන්සේ ඡන්න තෙරුන් විචාරා නිග්‍රහ කොට මේ ශික්ෂාපදය පණවා වදළසේක.

---

13. භික්ඛු පනෙව අඤ්ඤතරං ගාමං වා නිගමං වා උප නිස්සාය විහරති කුලදූසකො පාපසමාචාරො, තස්ස පාපකාසමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්තිච; කුලානි ච තෙන දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච: සො භික්ඛු භික්ඛුහි එවමස්ස වචනීයො: ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච පක්කමතායස්මා ඉමම්හා ආවාසා අලන්තෙ ඉධ වාසෙනාති. එවඤ්ච සො භික්ඛු භික්ඛුහි වුච්චමානො තෙ භික්ඛු එවං වදෙය්‍ය ඡන්ද ගාමිනො ච භික්ඛු දොසගාමිනො ච භික්ඛු මොහගාමිනො ච භික්ඛු භයගාමි නො ච භික්ඛු තාදිසිකාය ආපත්තියා එකච්චං පබ්බාජෙන්ති.

---

**13.** අර්‍ථ:- භික්ඛු පන එව, මහණෙක් තෙමේ ම වනාහි: කුලදූසකො, (පුෂ්පදානාදී වශයෙන් හා වෙදකම් කිරීමාදියෙන් ද) කුලයන් දූෂනය කරන්නේ හෙවත් කුලයන්ගේ ශ්‍රද්ධානාශනය කරන්නේ පාපසමාචාරො, (කුලදූෂණය පිණිස මල්පැල රොපණය කිරීමාදි) ලාමක සමාචාර ඇත්තේ; අඤ්ඤතරං එක්තරා; ගාමං වා, ගමක් හෝ; නිගමං වා, නියම් ගමක් හෝ; උපනිස්සාය, ඇසුරුකොට; විහරති, වාසය කෙරේ ද.

තස්ස, ඒ කුලදූසක භික්‍ෂුහුගේ; පාපකා, ලාමකවූ; සමාචාරා, සමාචාරයෝ; දිස්සන්ති ච එව, දක්නා ලැබෙද්ද; සුය්‍යන්ති ච, අසනු ලැබෙද්ද; තෙන, ඒ භික්‍ෂුහු විසින්; දුට්ඨානි, දූෂිතවූ; කුලානිච, කුලයෝත්; දිස්සන්ති ච එව, දක්නා ලැබෙද්ද; සුය්‍යන්ති ච එව, අසනු ලැබෙද්ද; සො භික්ඛු, ඒ කුලදූසක භික්‍ෂුතෙම; භික්ඛුහි (සෙසු ලජ්ජී) භික්‍ෂූන් විසින්; ආයස්මා ඛො; ආයුෂ්මත් තෙම වනාහි; කුලදූසකො, කුලදූෂණය කරන්නෙක; පාපසමාචරො, ලාමක සමාචාර ඇත්තෙක, ආයස්මතො ඛො; ආයුෂ්මත්හුගේ වනාහි; පාපකා සමාචාරා, ලාමක සමාචාරයෝ, දිස්සන්ති ච එව, දක්නා ලැබෙත්මය; සුය්‍යන්ති ච, අසනුද ලැබෙත්; ආයස්මතා, ආයුෂ්මතුන් විසින්; දුට්ඨානි, දූෂිතවූ; කුලානි ච, කුලයෝ ද; දිස්සන්ති ච එව, දකිනු ලැබෙත්මය; සුය්‍යන්ති ච, අසනු ද ලැබෙත්; ආයස්මා, ආයුෂ්මත් තෙම; ඉමම්හා ආවාසා, මේ විහාරයෙන්; පක්කමතු, බැහැර යේවා; තෙ, නුඹගේ; ඉධ, මෙහි වාසෙන, විසීමෙන්; අලං ඉති, කම් නැතැයි; එවං වචනීයො අස්ස, මෙසේ කියයුතු වන්නේය.

භික්ඛුහි, (සෙසු ලජ්ජී) භික්‍ෂූන් විසින්; එවඤ්ච, මෙසේත්; වුච්චමානො, කියනු ලබන්නා වූ; සො භික්ඛු, ඒ (පබ්බාජනීය

එකච්චං න පබ්බාජෙන්තීති. සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො මා ආයස්මා එවං අවච; න ච භික්ඛු ඡන්දගාමිනො න ච භික්ඛු, දෙසගාමිනො න ච භික්ඛු භය ගාමිනො; න ච භික්ඛු මොහගාමිනො ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති මෙව සුය්‍යන්ති ච කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච පක්කමතායස්මා ඉමම්හා ආවාසා අලන්තෙ ඉධ වාසෙනාති. එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය. සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටි නිස්සග්ගාය. යාවතතියං චෙ සමනුභාසියමානො තං පටි නිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය සංඝාදි සෙසො.

---

කර්මාහී) භික්ෂු තෙම, තෙ භික්ඛු, ඒ ලජ්ජී භික්ෂූන්ට; භික්ඛු, භික්ෂූහු; ඡන්දගාමිනො ච, ඡන්දයෙන් අගතියට පැමිණෙන්නෝද වෙති. භික්ඛු, භික්ෂූහු; දෙසගාමිනො ච, ද්වේෂයෙන් අගතියට යන්නාහුද වෙති. භික්ඛු, භික්ෂූහු; මොහගාමිනොච, මොහයෙන් අගතියට යන්නාහුද වෙති, භික්ඛු, භික්ෂූහු; භයගාමිනො ච, බියෙන් යන්නාහුද වෙති. තාදිසිකාය ආපත්තියා, එබඳුවූ ඇවතින්; එකච්චං, එකෙකු; පබ්බාජෙන්ති, බැහැර කෙරෙති; එකච්චං, එකෙකු; න පබ්බාජෙන්තීති, බැහැර නොකෙරෙති යී; එවං, මෙසේ; වදෙය්‍ය, කියන්නේ නම්; සො භික්ඛු, ඒ මහණතෙම; භික්ඛූහි, ලජ්ජී, භික්ෂූන් විසින්; ආයස්මා, ආයුෂ්මත් තෙමේ; එවං, මෙසේ; මා අවච, නොකියාවා; භික්ඛු, භික්ෂූහු; න ච ඡන්දගාමිනො, ඡන්දගාමීහුද නොවෙති; භික්ඛු, භික්ෂූහු; නච දෙසගාමිනො, ද්වෙෂගාමිහුද නොවෙති; භික්ඛු, භික්ෂූහු; න ච භයගාමිනො, භයගාමීහුද නොවෙති. භික්ඛු, භික්ෂූහු, න ච මොහගාමිනො, මොහගාමීහුද නොවෙති; ආයස්මා ඛො, ආයුෂ්මත් තෙමේ වනාහි; කුලදූසකො, ලාමකවූ සමාචාර ඇත්තෙක; ආයස්මතො ඛො, ආයුෂ්මත්හුගේ වනාහි; පාපකා, ලාමකවූ; සමාචාරා, සමාචාරයෝ; දිස්සන්තිච එව, දකිනු ලැබෙත්මය; සුය්‍යන්ති ච, අසනුද ලැබෙති. ආයස්මතා, ආයුෂ්මත්හු විසින්; දුට්ඨානි, දූෂිතවූ; කුලානි ච, කුලයෝද; දිස්සන්ති ච එව, දකිනුද ලැබෙත් මය. සුය්‍යනති ච, අසනුද ලැබෙත්; ආයස්මා, ආයුෂ්මත් තෙම; ඉමම්හා ආවාසා, මේ ආවාස (විහාර) යෙන් ; පක්කමතු, නැගී (බැහැර) යේවා; තෙ, තාගේ; ඉධ, මෙහි; වාසෙන, විසීමෙන්; අලං ඉති, කම් නැතැයි, එවං, මෙසේ; වාචනීයො අස්ස, කිය යුතු වන්නේ ය.

භික්ඛුහි, භික්ෂූන් විසින් එවඤ්ච, මෙසේත්: වුච්චමානො, කියනු ලබන්නාවූ: සො භික්ඛු, ඒ මහණතෙම: තථා එව, එසේම: පග්ගණ්හෙය්‍ය, දැඩිකොට ගණීද: සො භික්ඛු, ඒ භික්ෂූතෙම, තස්ස පටිනිස්සග්ගාය, (ඡන්දගාමිනොච භික්ඛු යනාදි) ඒ වදන හරණ පිණිස: භික්ඛුහි, ප්‍රිය ශීලී භික්ෂූන් විසින්: යාවතතියං, තුන්යලක්: සමනුභාසිතබ්බො, සමනුභාෂණ කම් කටයුත්තේය. චෙ, ඉදින්: යාවතතියා, තුන් යලක්: සමනුභාසියමානො, සමනුභාෂණ කම් කරණු ලබන්නේ: තං, ඒ (ඡන්දගාමිනොච භික්ඛු යනාදී) වදන, පටිනිස්සජ්ජෙය්‍ය, දුරු කෙළේ වී නම්: ඉති එතං, ඒ හැරපීම: කුසලං, මැනව; චෙ, ඉදින්: නො පටි නිස්සජ්ජය්‍ය, නොහළේ නම්: සඞ්ඝාදි සෙසො, (ඔහුට) සංඝාදි සෙස නම්වූ ආපත්තියෙක් වේ.

**සංලක්ෂය:-** **"ගාමං වා නිගමං වා"** යනු 'උපනිස්සාය' යන පෙර කිරියට වෙන් වශයෙන් කර්මයි. මෙහි 'ගම් නියම් ගම්' දෙක පමණක් ප්‍රකාශිත නමුදු 'නගරයත්' 'ගාමං' යන්නෙහිම ඇතුළත් කොට දෙශිත බැව් **"එත්ථ නගරම්පි ගාමෙ අන්තො ගධමෙව"** යන අර්ථ කථා පාඨයෙන් සැලකිය යුතු වේ. නැතහොත් 'වා' ශබ්දයෙන් නොකියන ලද්දද ගැණීමය. නිගම, නගර, ගාම යන තුණෙහි ඇති වෙනස ටීකාචාර්‍ය්‍යයෝ මෙසේ දක්වති. **"අපාකාරපරික්ඛෙපො සාපණො නිගමො"** ප්‍රාකාරයෙකින් පිරිකෙව් නොකරණ ලද්දවූ ආපනශාලා (සාප්පු) සහිත වූයේ 'නිගම' යයි ප්‍රාකාර යෙන් වටකරණ ලද්දවූ ආපනශාල සහිත වූයේ 'නගරය' යි ඒ බැව් **"සපාකාරාපණං නගරං"** මේ දෙකින් වෙනස් වූයේ 'ගම' යි ඒ බැව් **"තං තං විපරීතො ගාමො"** යි දක්වන ලදී.

**සං:-** **"උපනිස්සාය විහරති"** නිතර නිතර නිරායාශයෙන් ලැබෙන චීවරාදිය නිසා මෙකී නගරාදීන් ඇසුරු කොට ගෙණ වාසය කෙරෙයි.

**සං:-** **"කුලදූසකො"** යි (කුලානි දූසෙතීති, කුලදූසකො) ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර යයි කුල ප්‍රධාන වශයෙන් සතරෙකි. කුලසංග්‍රහය පිණිස ආරාමයෙහි තිබෙන මල්, ගෙඩි ආදිය දීමෙන් හා ඡඩ්කීය දූස්කෘතවලින් ඒ ඒ කුලවල ශ්‍රද්ධාව විනාශ කරණ බැවින් 'කුලදූසක' යයි කියනු ලැබේ. කුල සංග්‍රහය සඳහා සාංඝික භූමියෙහි හෝ පෞද්ගලික භූමියෙහි වූ සුණු, පත්‍ර, ඵල, පුෂ්ප, දර, මැටි, දීමෙන්ද වෙදහෙදකම් කිරීම් දූත මෙහෙවර කිරීමාදියෙන්ද කුලවල ශ්‍රද්ධාව විනාශ වන්නේය. එබැවින් එබඳු කුලදූසක කම් භික්ෂූන්ට නොකැපය.

තමන්ගේ හෝ මෙරමාගේ සුණු ආදිය කුල සංග්‍රහය සඳහා දෙන්නහුට "කුලදූෂණ" දුෂ්කෘතය වේ. සාඞ්ඝික ගරු භාණ්ඩාදිය දෙන්නහුට "තුලසි" වේ. යාවතතිය සමනු භාසනාන්තයේදී "සංඝාදිසෙසය" වේ. බුඩපූජාදිය සඳහා ආරාම යෙහි තිබෙන මල් ආදිය මවුපිය දෙදෙනා උවමනා කළ හොත් දිය යුතුයි. ශිවාදී අන්‍ය ශාස්තෘවරයෙකු පිදීමට හෝ යක් තොවිල් ආදියට හෝ සැරසීමාදියට ඔවුන්ට ද නොදිය යුතුයි.

සෙසු ඵලාදිය පිළිබඳ විනිශ්චයද යටකී නයින් සැලකිය යුතුයි.

සං:- **"පාපසමාචාරො"** (පාපකා සමාචාරා යස්ස සො, පාපසමාචාරො) මෙහි දක්වෙන පාපසමාචාර නම් කුලසංග්‍රහය සඳහා කැප භූමියෙහි හෝ නොකැප භූමියෙහි මල්පැල රෝපණය කිරීම, කරවීම, පැන් ඉසීම, ඉස්සවීම, මල් නෙළීම, නෙළවීම, මල්දම් ගෙතීම, ගෙතවීමාදිය කිරීමයි. පොළොව කැණ මල්පැල රෝපණය කිරීමෙන් හා නොකැප වදතින් අණවා රෝපණය කරවීමෙන් උපසපන් මහණහුට "දුකුළා" ඇවත සිදු වේ. ඒ දුසිරිත හැරපීම සඳහා කරණු ලබන තෙවන සමනුභාසන කම් අවසානයේදීත් එසේම ගෙණ සිටිය හොත් "සංඝාදිසෙ ස" වේ.

මෙහි වනාහි අකැප (අසාසනික) ව්‍යයවහාරය කැප (සාසනික) ව්‍යයවහාරය, පර්‍ය්‍යාය කථනය, ඕභාසය, නිමිත්ත කර්‍මය යන පස ඉගෙණගත යුතු වේ.

**"අකප්පිය වොහාරය"** නම් වෘක්ෂ තෘණාදිය කෙටීම, කෙටවීම වළවල් කැණීම, කැණවීම, මල් පැල රෝපණය කිරීම, කරවීමාදියයි.

**"කප්පිය වොහාරය"** නම් මේ රුක දනුව, මේ වළ දනගණුව, මේ මල් පැලය දන ගණුවයි අනුසම්පන්නයෙකුට කීමයි.

**"පරියාය"** නම් නැණැත්තෙකු විසින් මල්පැල රොපණය කරවිය යුත්තේය. එය පසුව ප්‍රයෝජනය විය හැකියයි අන්‍යාකාරයකින් කාරණය හැඟවීමයි.

**"ඔභාසය"** නම් උදලු අලවංගු ආදී උපකරණත් මල් පැලත් රැගෙණවිත් මල්පැල සිටවියයුතු තැනක සිටීමයි. එවිට ඒ දුටු සාමණෙරාදීහු තෙරුන්වහන්සේගේ අදහස දන මල්පැල සිටුවති.

**"නිමිත්තකම්මය"** නම් උදල්ල හෝ පොරව හෝ වෑය හෝ උදක භාජනයක් හෝ ගෙණැවිත් අනුසම්පන්නයෙකු ලඟ තැබීමයි. කාරණය දනගත් සාමණේරාදීන් විසින් ඒ ඒ දෙය කළයුත්තේය.

මේ පඤ්චාකාරයම කුල සංග්‍රහය සඳහා රොපණය කිරීමේදී නොවටී. කප්පියාකප්පිය වොහොරද්‍රව්‍ය ම එල (ගෙඩි) පරිභොගය සඳහා නොවටී. සෙසු තුන් අකාරය වටී.

සං:- **"ආයස්මා ඛො=පෙ= අලන්තෙ ඉධවාසෙනාති"** මෙයින් කුලදූෂක භික්ෂූහු හෝ භික්ෂූන් පබ්බාජනීය කර්මයට අවසින් නෙරපීමට යොග්‍ය බැව් දක්වේ. පබ්බාජනීය කර්මය කරණු ලැබූ ඒ භික්ෂු තෙමේ යම්කිසි නගරයක හෝ ගමක හෝ නියම් ගමක හෝ කුල දූෂණ කර්මය කළේ නම් ඒ නගරාදියෙහි විසීම හෝ ඒ නගරාදිය ආශ්‍රය කොට හැසිරීම හෝ තහනම්.

සං:- **"එවඤ්ච සො භික්ඛු=පෙ=එකච්චං න පබ්බා ජෙන්තීති"** මෙයින් කුලදූෂක භික්ෂූහුගේ දුර්වචස්සභාවය හා ලජ්ජී භික්ෂූන්ට අභූත චොදනාවෙහි නිභීය බැව්ද පැහැදිලි වේ.

සං:- **ඡන්ද ගාමිනො ච භික්ඛූ** (ඡන්දෙන (අගතිං) ගච්ඡන්තීති ඡන්දගාමිනො) දෙසගාමිනො යනාදී පදද මෙසේ විග්‍රහ කොට අර්ථ දත යුතුය. ලජ්ජී ප්‍රියශීලි භික්ෂූහු කිසිවිටෙකත් ඡන්දදියෙන් හෙවත් සතර අගතියෙන් අධර්මය නොගණිති. එසේම අධර්මයට අනුබලද නොදෙති. එසේ හෙයින් ලජ්ජී භික්ෂූන්ට 'ඡන්දගාමිනො ච භික්ඛූ' යනාදීන් දෙෂාරොපණය කිරීමෙන් 'දුකුළා' ඇවතක් වේ.

සං:- **"සො භික්ඛු=පෙ=අලන්තෙ ඉධ වාසෙනාති"** මෙයින් දක්වන්නේ 'ඡන්දගාමිනො ච භික්ඛූ' යනාදීන් දෙෂාරොපනය කරණ භික්ෂූහුගේ තද්දෙෂාරොපණය හැරපීම සඳහා ලජ්ජී භික්ෂූන් විසින් 'නව භික්ඛූ ඡන්දගාමිනො' යනාදීන් තුන්යලක් කියයුතු බවයි. එහෙත් කුලදූෂණය වැලැක්වීම පිණිස නොවේ. කුමක් හෙයින්ද? යත්: කුලදූෂණ කර්මයෙන් සිදුවිය හැකි ඇවැත් පළමුකොටම සිදුවූ බැවිනි. ඒ දෙස් කියන භික්ෂූහට හුදකලා තැනකදී හෝ සහමැදදී හෝ 'නව භික්ඛූ ඡන්දගාමිනො' යනාදීන් තෙවිටක් කියනු ලැබූ කල්හි තමාගේ ඒ දෙස් නැගීම නොහළේ නම් ඕහට එයිනුත් 'දුකුළා' ඇවතක් වේ.

## සප්ත දශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | අස්සජි පුනබ්බසුක භික්ෂූහුය. |
| වස්තුව | - | 'ජනදගාමිතාදීහි පාපන' වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ පඤ්ඤත්තියයි. (භික්ඛු පනෙව අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති -පෙ-සංඝාදිසෙසො) |
| ආනත්තිය | - | අනාණත්තිකයි. |
| ආපත්ති | - | (සමනු භාසනකම් කරණු ලබන කල්හි පටිනිස්සජ්ජනය නොකරන්නහුට ඥප්තිය කෙළවර) 'දුෂ්කෘත' යෙකි (කර්‍මවාක්‍යය දෙවරක් කීකල්හි) 'තුලඝි' දෙකෙකි.) තුන් වෙනිවර කියා ඉවරවූ කල්හි පළමු දුක්කටය සහ තුලඝි දෙකම පටිප්පස්සම්භනය වෙයි;) 'සංඝාදි සෙසය' සිදු වේ. |
| අනාපත්ති | - | 'අසමනුභාසියමානස්ස පටිනිස්සජ්ජන්තස්ස' උම්මත්තකාදීනං ච' යි දක්වෙන්නන්ටයි. |
| විපත්ති | - | සීල විපත්තියයි; |
| අඞ්ග | - | ඡන්දගාමිතාදීහි පාපනං, ධම්මකම්මෙන සමනු භාසනං, කම්මවාචා පරියොසානං, අප්පටිනිස්ස ජනං, යන සතරෙකි. |
| සමුට්ඨාන | - | සමනුභාසන සමුට්ඨාන යයි. |
| කිරියා | - | අක්‍රියාවයි. |
| සංඥාව | - | සඤ්ඤාවිමොක්ඛයයි. |
| චිත්ත | - | සචිත්තකය. |
| වජ්ජ | - | ලොකවජ්ජය. |
| කම් | - | කායකම්, වචීකම් දෙකයි. |
| කුසලත්‍රිකය | - | අකුසල චිත්තයයි. |
| වෙදනාත්‍රිකය | - | දුඃඛ වෙදනාවයි. |

තෙලෙස් වැනි සඞඝාදිසෙසය සමාප්තයි.

# තෙළෙස් වැනි සංඝාදිසෙසයෙහි නිදාන කථාව

අපගේ ත්‍රෛලොක්‍ය චක්‍රවර්ති ස්වාමීවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ සැවැත් නුවර අනේපිඩු මහ සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සමයෙහි අස්සජි පුනබ්බසුක නම්වූ පාප භික්ෂූහු කීටාගිරියෙහි ආවාසිකයෝ වූහ. ඔවුහු කුල සංග්‍රහය සඳහා මාලාවච්ඡ රොපණය කිරීම කරවීමාදීවූ අනෙකප්‍රකාර අනාචාර කෙරෙති.

එකල්හි එක්තරා සිල්වත් භික්ෂූන්වහන්සේ නමක් කසී රට වස් ඉළඹියේ භාග්‍යවතුන් වහන්සේ දැකීම සඳහා සැවැත් නුවරට වඩින සේක් කීටාගිරියට ද වැඩිසේක. ඒ භික්ෂූන් වහන්සේ පෙරවරු කාලයෙහි දුටුවන් පහදිනා අයුරු ඇත්තෝ පා සිවුරු ගෙණ පිඩු සිඟා වැඩිසේක.

එකල්හි කීටාගිරි වාසී මනුෂ්‍යයෝ උන්වහන්සේ දැක මෙසේ කීවාහුය. කෙසේද? ඉතා දුර්වල වූවෙකුමෙන් බිම බලාගෙණ සෙමින් සෙමින් මේ යන්නේ කවරෙක්ද? පැමිණියාවූ මොහුට පිණ්ඩදනයක් නමුදු දෙන්නේ කවුද? අපගේ අස්සජි පුනබ්බසුකයන් වහන්සේලා නම් උත්තාන මුඛ ඇත්තෝෂ. දුටුදුටුවන් සමග පළමුවෙන් කථා කරන්නෝය එසේම ස්වාගත වාදීහුය. ඒ නිසා උන් වහන්සේලාටයි පිඩුදිය යුත්තේ කියායි. අනතුරුව එක්තරා උපාසකයෙක් තෙම එසේ සංයම ඉඳුරන් ඇතිව වඩින්නාවූ ඒ භික්ෂුව දැක සමීපයට පැමිණ ස්වාමීනි! පිඩු ලැබේදැයි විචාළේය. උපාසකයෙනි! පිඩු නොලැබේ යයි කීහ. එකල්හි ඒ භික්ෂූන් වහන්සේ සිය ගෙට වැඩමවා ගෙණ ගොසින් වළඳවා තොරතුරු විචාරා මේ පණිවුඩය භාග්‍යවතුන් වහන්සේට අප කෙරෙහි අනුකම්පාවෙන් සැළකරණු මැනවයි කීටාගිරියෙහි ආවාසිකයන්ගේ සියලු අනාචාර ක්‍රියා ප්‍රකාශ කෙළේය.

උන්වහන්සේ ද තථාගතයන් වහන්සේ දැක වැඳ එකත් පසෙක සිටැ කීටාගිරියෙහි අස්සජි පුනබ්බසුකයන්ගේ සියලු පවත් උපාසකයාගේ වචනයෙන් කීහ.

එකල්හි භාග්‍යවතුන්වහන්සේ භික්ෂු සංඝයා මැද ඒ පවත් අසා දෙයගසව්වන් අමතා වදළසේක. ශාරිපුත්‍රයෙනි! තෙපි ගොස් කීටාගිරියෙහි ආවාසිකවූ අස්සජිපුනබ්බසුකයන්ට පබ්බාජනීය කර්‍මය කරව් යයි වදරා පබ්බාජනීය කර්‍මය කරණ අයුරුද වදළ සේක.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා නව පඨමාපත්තිකා චත්තාරො යාවතතියකා, යෙසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා යාවතිහං ජානං පටිච්ඡාදෙති, තාවතීහං තෙන භික්ඛුනා ආකාමා පරිවත්ථබ්බං, පරිවුත්ථ පරිවාසෙන භික්ඛුනා උත්තරිං ඡාරත්තං භික්ඛුමානත්තාය පටිපජ්ජිතබ්බං, චිණ්ණමානත්තො භික්ඛු - යත්ථ සියා වීසති ගණො භික්ඛු සංඝො, තත්ථ සො භික්ඛු අබ්භෙතබ්බො, එකෙනපි චෙ ඌනො වීසතිගණො භික්ඛු සංඝො තං භික්ඛුං අබ්භෙය්‍ය, සො ච භික්ඛු අනබ්භිතො, තෙ ච භික්ඛු ගාරය්හා අයං තත්ථ සාමීචි.

---

දෙයගසච්චෝ් ගොස් තථාගත වචනයෙන් ඔවුන්ට පබ්බාජනීය කර්මය කළෝය. එහෙත් ඒ කර්මය කරණ ලද්දෝ සම්‍යග්වර්තනය නොකෙරෙති. සඞ්ඝයා ක්ෂමා නොකෙරෙති. ආක්‍රොශ කෙරෙති. එසේ ඇති කල්හි භාග්‍ය වතුන් වහන්සේ මේ ශික්ෂා පදය පණවා වදළසේක.

මෙහි වැඩි විස්තර කථාව පාරාජික පාලියෙන් බලාගත යුතුයි. මේ සංක්ෂෙප ප්‍රවෘත්තිඥපනය කිරීමකි.

---

**අර්ථ:-** ආයස්මන්තො, ඇවැත්නි! තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා, තෙළෙස් සඞ්ඝාදිසෙසාපත්තීහු, උද්දිට්ඨා ඛො, උදෙසන ලදහ, නව පඨමා පත්තිකා, (ඔවුනතුරෙහි) ව්‍යතික්‍රම ක්ෂණයෙහිම පැමිණිය යුතු ඇවැත් නව දෙනෙකි. චත්තාරො යාවත තියකා, තුන්වැනි සමනු භාෂණයෙහි පැමිණිය යුතු ඇවැත් සතර දෙනෙකි: භික්ඛු, භික්ෂුතෙම: යෙසං, යම් සඞ්ඝාදිසෙසයන් අතුරෙන්: අඤ්ඤතරං වා, එක්තරා ඇවතකට හෝ: අඤ්ඤතරං වා, තදන්‍ය ඇවතකට හෝ: ආපජ්ජිත්වා, පැමිණ: යාවතිහං, යම් පමණ දවස්: ජානං, දන්නේ: පටිච්ඡාදෙති, (ප්‍රකාශ නොකොට) සඟවාද: තාවතිහං, එපමණ දවස්: තෙන භික්ඛුනා, ඒ භික්ෂුහු විසින්, අකාමා නොකැමැත්තෙහුද: පරිවත්ථබ්බං, පිරිවෙස් විසිය යුතුයි.. පරිවුත්ථ පරිවාසෙන, වසනලද පිරිවෙස් ඇති. භික්ඛුනා, භික්ෂුහු විසින්: උත්තරිං, (පිරිවෙස් විසීමෙන්) මත්තෙහි: ඡාරත්තං. රාත්‍රි සයක්: භික්ඛු මානත්තාය, භික්ෂූන්ට බුහුමන් කිරීම පිණිස: පටිපජ්ජිතබ්බං, පිළිපැදිය යුතුයි. චිණ්ණමානත්තො, පූරණ ලද මානත් ඇති, භික්ඛු, යම් මහණෙක් වෙයි ද: සො භික්ඛු, ඒ මහණ තෙම: වීසතිගණො

තස්මායසමන්තෙ පුච්ඡාමි: කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි: කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමි ඉති.

සඞ්ඝාදිසෙසුද්දෙසො නිට්ඨිතො.

---

භික්ඛු සංඝො, විංශතිවර්ගික භික්ෂු සඞ්ඝතෙම: යත්ථ, යම් සීමාවෙක්හි, සියා වන්නේද: තත්ථ, ඒ සීමාවෙහිදී: අබ්භෙ තබ්භො, (අබ්භාහන කර්ම විසින්) ඇතුළත් කටයුතුයි. එකෙන අපි, එක් මහණකු ගෙන්ද: ඌනො, අඩුවූ: වීසති ගණො භික්ඛු සංඝො, විංශතිවර්ගික භික්ෂු සංඝතෙම: තං භික්ඛු, ඒ භික්ෂුහු: අබ්භෙතය්‍ය වෙ, ඉදින් (අබ්භාහන කර්ම වශයෙන්) ඇතුළත් කෙරේ නම්: සො ච භික්ඛු, ඒ භික්ෂු තෙමේද: අනබ්භිතො, ඇතුළත් නොකරණ ලද්දේය: තෙ ච භික්ඛු, ඒ භික්ෂුහුද ගාරය්හා, ගර්හා කටයුත්තාහුය, (දුකුළා ඇවැත් අවදිති) තත්ථ, ඒ සංඝාදිසෙසාපත්තියෙහි, අයං, මේ, (පිරිවෙස් විසීමාදිය) සාමීචි, (ලොකොත්තර ධර්මානුගත) ප්‍රතිපත්තියෙකි.

තත්ථ, ඒ තෙළෙස් සංඝාදිසෙසාපත්තියෙහි ලා: ආයස්මන්තෙ, ආයුෂ්මතුන්: පුච්ඡාමි, විචාරමි: කච්චි පරිසුද්ධා අත්ථ, කිම? පිරිසිදුවහුද: දුතියම්පි, දෙවනුවත්: පුච්ඡාමි, විචාරමි: කච්චි පරිසුද්ධා අත්ථ කිම? පිරිසිදුවහුද: තතියම්පි, තෙවනුවත්, පුච්ඡාමි, විචාරමි: කච්චි පරිසුද්ධා අත්ථ, කිම? පිරිසිදුවහුද.

එත්ථ, මෙහි: ආයස්මන්තො, අයුෂ්මත්හු: පරිසුද්ධා, පිරිසිදුහ: තස්මා, එහෙයින්: තුණ්හි, තුෂ්ණීම්භාවය වෙයි: එතං, මේ තුෂ්ණීම් භාවය: එවං, මෙසේ: ධාරයාමි ඉති, දරමියි, (පිරිසුදු හෙයිනැයි සිතමි.)

සඞ්ඝාදිසෙසුද්දෙසො, සඞ්ඝාදිසෙසුද්දෙසය, නිට්ඨිතො, නිමියේය.

**සංලක්ෂ්‍යය:- "උද්දිට්ඨා ඛො ආයස්මන්තො තෙරස සංඝාදිසෙසා ධම්මා** 'යි තෙළෙස් සඟවෙසෙස් උදෙසා සමාප්ත බැව් ප්‍රකාශිතයි. ඔහු නම්, ශුක්‍රවිසට්ඨි සංඝාදිසෙසය, කාය සංසග්ග සඞ්ඝාදිසෙසය, දුට්ඨුල්ලවාචා සඞ්ඝාදිසෙසය, අත්තකාම පාරිචරියා සඞ්ඝාදිසෙසය, සඤ්චරිත්ත සංඝාදිසෙසය, කුටිකාර සංඝාදිසෙසය, මහල්ලක විහාරකාර සංඝාදිසෙසය, දුට්ඨදෙස සංඝාදිසෙසය, දුතියදුට්ඨදෙස සංඝාදිසෙසය, සඞ්ඝභෙදක සංඝාදිසෙසය, සංඝභෙදානුවත්තක සංඝාදිසෙසය, දුබ්බච සඞ්ඝාදිසෙසය, කුලදූසන සංඝාදිසෙසය, යනුයි.

'විස්සට්ඨි කායසංසග්ගා දුට්ඨුල්ලං අත්තකාමතං,
සඤ්චරිත්තං කුටී චෙව විහාරො ච අමූලකං,
කිඤ්චි දෙසඤ්ච භෙදෙ ච, තස්ස ච අනුවත්තකා,
දුබ්බචං කුලදූසඤ්ච සඞ්ඝාදිසෙසා තෙරසාති.'

සං:- **"නවපඨමාපත්තිකා"** (පඨමං ආපත්ති එතෙසන්ති, පඨමාපත්තිකා) මෙහි උදෙසන ලද සඟවෙසෙස් තෙළෙස අතුරෙන් ක්‍රමයෙන් පළමු නවය පඨමා පත්තිකයෝයි. 'පඨමා පත්තික' නම් ශික්ෂා වෘති ක්‍රමක්ෂණයෙහි ම ඒ ඒ ඇවතට පැමිණීම ඇති සඟවෙසෙස්හුයි. ඒ මෙසේයි. දත දත උපක්‍රම කොට ශුක්‍රවිසෘෂ්ටිය කරණවාත් සමගම එනම් සඟවෙසෙස වන්නේ වෙයි. සෙසු අට ද මේ නයින් සැලකිය යුතුයි.

සං:- **"චත්තාරො යාවතතියකා"** (යාවතතියෙ සමනු භාසන කමෙම හොන්තීති, යාවතතියකා.

සංඝ භෙදක සංඝාදිසෙසය ආදි සතර තෙවෙනි සමනුභාසන කර්මයාගේ අන්තයේදී වියයුතු බැවින් 'යාවතතියකා' යී කීහු. ඒ මෙසේයි, කිසියම් උපසපන් මහණෙක් සඞ්ඝභෙදය සඳහා ක්‍රියාරම්භ කළ කල්හි සෙසු භික්ෂූන් විසින් එයට කරුණු දක්වමින් සඞ්ඝභෙදය නොකට යුතුයයි පළමු වැනි වර කියනු ලැබුවේ ද, භෙදක භික්ෂුහට සංඝාදිසෙසය නොවේ. දෙවැනි වර කියනු ලැබුවේ ද, සංඝාදිසෙසය නොවේ. තෙවැනි වර කියනු ලැබු කල්හිත් ඒ දෘෂ්ටිය නොහළේ නම් එකල්හි සංඝාදිසෙසය වේ.

සං:- **"යාවතිහං ජානං පටිච්ඡාදෙති"** (අහස්ස යාවති, යත්තකො පරිච්ඡෙදෙ, යාවතීහං,) යාවති, තාවති, යනු පරිච්ඡේදාර්ථයෙහි නිපාතයෝයි. මෙහි 'පටිච්ඡාදනය' නම්:- යම්කිසි සඟ වෙසෙසකට පැමිණ සමානසංවාසක උපසපන් මහණෙකුට ආරොචනය කිරීමට අවකාශ තිබියදී ත් එසේ නොකොට අරුණු ඉක්මවීම යි.

එක් අරුණක් ඉක්මවුව හොත් එක් දිනක් ප්‍රතිච්ඡාදනය වේ. දෙඅරුණක් ඉක්මවුව හොත් දෙදිනකි. මේ ආදි වශයෙනි; ප්‍රතිච්ඡාදන ලක්ෂණ මෙසේ දත යුතුයි.

**"ආපත්ති ච හොති ආපත්තිසඤ්ඤී ච. පකතත්තො ච හොති පකතත්ත සඤ්ඤීච. අනන්තරායිකො ච හොති අනන්තරායික සඤ්ඤී ච. පහු ච හොති පහු සඤ්ඤී ච"** යන ලක්ෂණ වලින් යුක්ත කල්හි ම ඇවැත් ප්‍රතිච්ඡාදනය වේ. නැතහොත් නොවේ.

"**ආපත්ති ච හොති ආපත්ති සඤ්ඤී ච**" යනු යමෙක් යම් ඇවතකට පැමිණියේ වේ ද, එකී ඇවත තෙළෙස් සඟ වෙසෙස් අතුරෙන් එකක් නම්, එය වස්තු වශයෙන් හෝ නාම වශයෙන් හෝ ආපත්තියක් යයි දැන දැනම කිසියම් සභාග මහණෙකුට ආරෝචනය නොකොට අරුණක් ඉක්මවුව හොත් ප්‍රතිච්ඡාදනය වේ. හෙවත් එක් අරුණකින් සැඟවුනේ වෙයි.

"**පකතත්තො ච හොති පකතත්ත සඤ්ඤී ච**" යී පකතත්ත භික්ෂු නම් උත්ක්ෂේපණීය කර්මයකින් වෙන් නොකරණ ලද සමාන සංවාසක යෙකි. මෙසේ පකතත්ත බැව්හි පිහිටියෙක් තෙමේ පකතත්ත යයි දැන දැන ම යට කීසේ ඇවැත් සඟවා නම් ප්‍රතිච්ඡන්නවේ. "**අනන්තරායි කො ච හොති අනන්තරා යික සඤ්ඤී ච**" යම් මහණෙකුගේ ආපත්ත්‍යාරෝචනයට අන්තරාය (බාධා) කරන්නාවූ, රාජ, චොර, අග්නි, උදක, මනුස්ස, අමනුස්ස, වාල, සිරිංසප. ජීවිත, බ්‍රහ්මචරියන්තරාය, යන දසවිධ අන්තරාය වලින් එකකුත් නැතිව අනන්තරායික වෙමි'යි සඤ්ඤව (හැඟීම) ද ඇතිව ඇවැත් සැඟවුවහොත් ප්‍රතිච්ඡාදනය වේ. මෙකී දස විධ අනතුරුවලින් එකකින් නමුත් ආරෝචනයට අවකාශ නො ලැබේ නම් ඇවත ප්‍රතිච්ඡාදනය නොවේ.

"**පහු ච හොති පහුසඤ්ඤී ච**" යී 'පහු' නම් යමෙක් භික්ෂූන්ගේ සමීපයට යන්ට සමර්ථ වේ ද, ආරෝචනය කිරීමට සමර්ථ වේ ද, හෙතෙම පහු නම් වේ. හෙතෙම 'පහුය' යන හැඟීම ඇතිව ආපත්ති සඟවා ද හෙද ප්‍රතිච්ඡන්න වේ.

"**ඡාදෙතුකාමො ච හොති ඡාදෙති ච**" යී මෙය සුබොධය. යම් හෙයකින් යම්කිසි මහණෙක් සඞ්ඝාදිසෙසාපත්තියකට පැමිණ සභාග මහණෙකු දැක මුන්වහන්සේ මාගේ උපාධ්‍යායයන් වහන්සේය කියා හෝ ආචාර්‍ය්‍යයන් වහන්සේය කියා හෝ ලජ්ජාවෙන් ආරෝචනය නොකෙරේ ද එයත් ප්‍රතිච්ඡන්න වේ. උපාධ්‍යායත්වය හෝ ආචාර්‍ය්‍යත්වය මෙහි ප්‍රමාණ නොවේ. සභාග බව ම ප්‍රමාණ වේ.

සං:- "**අකාමා පරිවත්ථබ්බං**" යී ප්‍රතිකර්ම නොකරණ ලද ඇවැතින් ස්වර්ග මොක්ෂාවරණය වන හෙයින් නොකැමැත්තෙනුදු පිරිවෙස් පිරිය යුතුයි.

පරිවාසය වනාහි පටිච්ඡන්නපරිවාසො, සුද්ධන්තපරිවාසො සමොධාන පරිවාසො, යී ත්‍රිවිධ වේ.

**"පටිච්ඡන්න පරිවාසො"** ඇවැත් ප්‍රතිච්ඡන්නව ඇති කල්හි ඒ ප්‍රතිච්ඡන්න අරුණු ගණනට දිය යුතු පරිවාසය පටිච්ඡන්න පරිවාසයයි.

කිසිවෙකුගේ එක්දවසක් ප්‍රතිච්ඡන්න ඇවැත් වෙති. සමහරෙකුගේ දෙදවසක් ප්‍රතිච්ඡන්න ඇවැත් වෙති. කිසිවෙකුගේ එයට ත් වඩා කල් ප්‍රතිච්ඡන්න ඇවැත් වෙති. එසේ ම සමහරෙකුගේ එක් ඇවැතක් වෙයි. සමහරෙකුගේ දෙකක් හෝ තුනත් හෝ ඊට ත් වඩා ඇවැත් වෙති. එසේ ඇති කල්හි පටිච්ඡන්න පරිවාසය දෙන්නාවූ භික්ෂූන් විසින් කියන ලද ක්‍රමයෙන් (ආපත්ති ච හොති යනාදි ක්‍රමයෙන්) ප්‍රතිච්ඡන්න දින සංඛ්‍යාව (අරුණු ගණන) හා ඇවැත් ගණනත් පරීක්ෂා කොට **"සොහං භන්තෙ සංඝං එකිස්සාය ආපත්තියා සඤ්චෙතනිකාය සුක්කවිස්සට්ඨියා එකාහ පටිච්ඡන්නාය එකාහ පරිවාසං යාචාමි"** යනාදි වශයෙන් පිරිවෙස් තෙවරක් යාචනය කරවා ඤත්තිචතුත්ථ කම්මවාක්‍යය දෙශනා කොට දිය යුතුයි.

**"සුද්ධන්ත පරිවාසො"** සුද්ධන්තයෙහි පටන් දියයුතු පරිවාසය ශුද්ධාන්ත පරිවාස යයි.

**"ආපත්ති පරියන්තං න ජානාති රත්තිපරියන්තං න ජානාති"** යන වස්තුවෙහි සමුච්චයක්ඛන්ධකයෙහි සුද්ධන්ත පරිවාසය අනුදන්නා ලදී. මේ වනාහි චූල සුද්ධාන්තය, මහා සුද්ධාන්ත යයි විවිධ වේ. මේ පරිවාස දෙක ම ඇවැත් ප්‍රතිච්ඡන්න වූ රාත්‍රි සංඛ්‍යාව නොදන්නහුට ද, ප්‍රතිච්ඡන්න රාත්‍රි ගණන ස්මරණය නොකරන්නහුට ද, වෙමතිකයාහට ද, නියමිතය.

ආපත්ති සංඛ්‍යාව දැනීම නොදැනී ම හෝ මෙහි පමණ නොවේ. උපසපන් වූ දවසේ පටන් අනුලොම වශයෙන් හෝ ආරොචනය කළ දවසේ පටන් ප්‍රතිලොම ක්‍රමයෙන් හෝ තොපගේ අසවල් දවස හෝ පක්ෂය හෝ මාසය හෝ වර්ෂය හෝ පිරිසිදු දැයි පිළිවිසිතු ලබන කල්හි ස්වාමීනි! උපසම්පත්තියේ පටන් මෙ පමණ කල් පිරිසිදු වූ වෙමි යි කී කල්හී එපමණක් ඉවත් කොට අවසෙස කාලයට දියයුතු පරිවාසය නම් 'චූල සුද්ධාන්ත' යයි.

මේ වනාහි දීඝ කිරීමට හැකි වේ. යමෙක් දෙමසක් ඇවැත් ප්‍රතිච්ඡන්නව ඇතැයි සලකා දෙමාසයකට පිරිවෙස් ලැබ පුරණ අතර තවක් මසක් ප්‍රතිච්ඡන්න යයි සිහිවූවහොත් තෙමසක් පිරිවෙස් පිරිය යුතුයි. පසුව එක්කළ මාසයට නැවත සමාදන් වීමක් නොවුවමනා වේ. අඩු කිරීම ද මේ නයින් සැලකිය යුතුයි.

යමෙක් ප්‍රතිච්ඡන්න රාත්‍රි ගණන හෝ ඇවැත් ගණන නො දනී නම් ඔහුට දියයුතු පරිවාසය 'මහාසුඩාන්ත' යයි. එය සමාදන්ව උපසම්පද වූ දවසේ සිට පිරිවෙස් සමාදන්වන දිනය තෙක් රාත්‍රි සංඛ්‍යාව සලකා ඒ තාක් කල් පිරිවෙස් පිරිය යුතුයි. මෙය පළමු සේ දීඝ නොවේ. එහෙත් අඩුකල හැකි වේ.

'සමොධාන පරිවාසො' මෙය වනාහි ඔධාන සමොධානො, අග්ඝ සමොධානො, මිස්සක සමොධානො' යි ත්‍රිවිධ වේ.

පිරිවෙස් වුසු දින ගණන ඔධුනනය කොට හෙවත් මූලා ය පටිකස්සනය කොට දියයුතු පරිවාසය 'ඔධානසමොධාන' යයි. යමෙක් පිරිවෙස් සමාදන්ව ගෙණ වසන අතර නැවතත් සංඝාදිසෙසාපත්තියකට පැමිණ ප්‍රතිච්ඡාදනය කෙළේ නම් පළමු පිරිවෙස් පිරූ කාලය ඉවත් කොට හෙවත් ඥප්තිචතුර්ථ කර්මයෙන් මූලාය පටිකස්සනය කොට නැවත මුල සිට පිරිවෙස් දියයුතු යි.

සබ්බ චිරපටිච්ඡනන ආපත්තීන්ගේ අග්ඝයෙන් සමොධානය ඇත්තේ 'අග්ඝ සමොධාන පරිවාස' යයි.

ඇවැත් එකක් හෝ දෙකක් හෝ තුණක් හෝ ඊට වැඩියක් හෝ සබ්බචිරපටිච්ඡන්න නම් ඔවුන්ගේ අග්ඝයෙන් සමොධානය කොට ඒ ආපත්තීන්ගේ රාත්‍රි පරිච්ඡෙදවශයෙන් සෙසු ඊට වඩා අඩු අරුණු ගණන් ප්‍රතිච්ඡන්න වූ ඇවැත් එහි ඇතුළත් කොට එය දියයුතු යි. යමෙක් ඇවැත් දසය බැගින් දසයක් දසදවස දස දවස ප්‍රතිච්ඡන්න කෙළේ නම් ඔහුට ඇවැත් සීයට ම සියක් දවසට ම දස දවසක් පිරිවෙස් දිය යුතු යි. එහෙයින් කියන ලදී.

'දසසතං රත්තිසතං ආපත්තියො ඡාදයිත්වා
දස රත්තියො වසිත්වා මුච්චෙය්‍ය පාරිවාසිකොති'

නානාවත්ථුක ආපත්ති එක්කොට දියයුතු පරිවාසය මිස්සක සමොධාන' යයි.

පරිවාසය පිළිබඳ විස්තර සමන්තපාසාදිකාවෙන් හා පාලිමුත්තක විනයවිනිච්ඡයෙන් බලාගත යුතුයි.

සං:- **"උත්තරිං ජාරත්තං"** යි (රාති ගණ්හාති අබ්‍යා පාරට්ඨීතීති: රත්ති, රා ආදනෙ, රා සද්දෙ තීයති ඡිජ්ජති එත්ථාති වා රත්ති: ජත්තං රත්තීනං සමාහාරො, ජරත්තං ජරත්තමෙව, ජාරත්තං) පිරිවෙස් පුරා සමාප්ත වූ කල්හි සරුයක් (මානත් පිරිය යුතුය යනු) අර්ථයි.

සං:- **"භික්ඛුමානත්තාය පටිපජ්ජිතබ්බං"** යි භික්ෂූන් මානතය ආරාධනය පිණිස පිළිපැදිය යුතුයි.

මානත වනාහි පටිච්ඡන්නා 'පටිච්ඡන්න වශයෙන් විවිධ වේ. යම් හෙයකින් යමෙකුගේ එක් අරුණක් නමුත් ප්‍රතිච්ඡන්න වූ ඇවැත් නැත හොත් පිරිවෙස් පිරීම නොවුමනා වේ. ඇවැතට පැමිණීම නිසා ම මානත්තාභියෙක් වෙයි. ඒ නිසා ඔහුට පිරිවෙස් නොදී මානත දියයුතු යි.

මේ 'අපටිච්ඡන්නමානත්තය' නම් වේ. යමෙක් ප්‍රතිච්ඡන්න ඇවැත්වලට පිරිවෙස් පුරා සමාප්ත වූ කල්හි ඔහුට දියයුත්තේ පටිච්ඡන්නමානත්ත ය යි.

පිරිකෙවි කරණ ලද විහාරයක නම් පිරිකෙව්ව ලඟ සිට හෝ නැතහොත් පරික්ෂෙපාර්හ සථානයෙහි සිට හෝ ලෙඩ්ඩු පාතද්වයක් (ගල් පාර දෙකක්) ඉක්මවා මහාමාර්ගයක් ඇතහොත් එයින් ඉවත්ව වැටකින් හෝ කැලෑරොදකින් ආවරණ සථානයකට, යටත් පිරිසෙයින් භික්ෂූන් සතර නමක් කැටුව ගොස් **"මානත්තං සමාදියාමි වත්තං සමාදියාමි"** යන ක්‍රමයෙන් අරුණට පළමු සමාදන්විය යුතුයි. එසේ සමාදන්ව **"අහං භන්තෙ එකං ආපත්තිං ආපජ්ජිං"** යනාදි වශයෙන් ඒ භික්ෂූන්ට ආරොචනය කටයුතුයි. ආරොචිත කාලයට පසු එක් භික්ෂුනමක් සිටිය දී සෙසු භික්ෂූන්ට යා හැකි. අරුණ නැගි කල්හි ඒ භික්ෂුහු ලඟදී වත් නික්ෂෙප කටයුතු.

සං:- **"යත්ථ සියා වීසතිගණො භික්ඛුසංඝො තත්ථ සො භික්ඛු අබ්භෙතබ්බො"** (වීසති සඞ්ඛා ගණො යස්ස සො වීසතිගණො) කිසියම් සමාන සංවාසක සීමාවෙක්හි විසතිගණ සඞ්ඛ්‍යාත භික්ෂු සඞ්ඝයා වෙයි ද එහි දී අබ්භානය කට යුත්තේය.

'අබ්භානය' යනු කිම? අබ්භානය නම්: සම්පටිච්ඡනයයි. නොහොත් අව්හානය (කැඳවීම) කිරීමයි. ඒ කෙසේ කටයුතු ද? යත්: අබ්භානය කරන්නවුන් විසින් අබ්භෙතබ්බයා අබ්භා නාභියෙක් කළ යුතුයි. වත් නික්ෂෙප කළ කෙනෙක් නම් පකතත්ත බැව්හි පිහිටියේය. හේ අබ්භානය නොකට යුත්තේය. එබැවින් පළමු කොට වත් සමාදන් කරවිය යුතුයි.

1. යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රාහො පටිච්ඡන්නෙ ආසනෙ අලං කම්මනියෙ නිසජ්ජං කප්පෙය්‍ය, තමෙනං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය, පාරාජිකෙන වා සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, නිසජ්ජං භික්ඛු පටිජානමානො තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො, පාරාජිකෙන වා සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, යෙන වා සා සද්ධෙය්‍ය වචසා උපාසිකා වදෙය්‍ය, තෙන සො භික්ඛු කාරෙතබ්බො, අයං ධම්මො අනියතො

---

එවිට අබ්භානාර්හ වෙයි. අබ්භානාර්හයා විසිනුදු වත් සමාදන්ව ආරොචනා කොට අබ්භානකර්ම කරණසේ ආරාධනය කට යුතු යි. වත් නික්ෂෙප නොකොට සිටියෙක් නම් මානත් පුරා අවසාන වනවත් සමගම අබ්භානාර්හ වේ. මෙහි දැක් වූ අබ්භානාර්හ පුද්ගලයා විසතිගණ සංඛ්‍යාත සඟ මැදදී **"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො"** යනාදී ඤප්තිචතුර්ථ කර්ම වාක්‍යයෙන් අබ්භානය කට යුත්තේය.

ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙ අනියතා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

මේ අබ්භාන කර්මය විසතිගණයා විසින් විශෙෂයෙන් කටයුතු බැවින් එක් නමක් නමුත් අඩු වුවහොත් අබ්භාන කර්මය කොප්‍ය වේ. එබඳු අබ්භාන කර්මය කළ සඞ්ඝයාත් ගැරහිය යුත්තේ යි. එ පමණක් නොව ඒ එක් එක් නමට 'දුකුළා' වෙයි.

**සංඝාදිසෙස වර්ණනාව සමාප්තයි.**

---

1. **අර්ථ:-** ආයස්මන්තො, ආයුෂ්මත්නි, ඉමෙ ඛො පන ද්වෙ අනියතා ධම්මා, මේ අනියතාපත්තීහු දෙදෙන වනාහී, උද්දෙසං, උදෙසිය යුතු බවට: ආගච්ඡන්ති, පැමිණෙත්.

යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: එකො, හුදකලා වූයේ (දෙවැන්නකු නැත්තේ:) එකාය, හුදකලා වූ: මාතුගාමෙන සද්ධිං, මිනිස් මාගමක් (ස්ත්‍රියක්) හා සමඟ: රහො, නොපෙණෙන තන්හි වූ: පටිච්ඡන්නෙ, ප්‍රතිච්ඡන්න වූ හෙවත් කවාට කුඩ්‍යාදියෙන් වැසුනා වූ: අලංකම්මනියෙ: මෛථුන සෙවනයට සුදුසු වූ: ආසනෙ, අසුනෙක්හි: නිසජ්ජං, නිෂද්‍යාව (හිඳීම) කප්පෙය්‍ය, කෙරේ ද: තමෙනං, ඒ මේ භික්ෂූහු: සද්ධෙය්‍ය වචසා, ඇදහිය යුතු වදන් ඇති: උපාසිකා,

(ආයර්‍ය ශ්‍රාවිකා වූ) උවැසියක් තොමෝ: දිස්වා, දක: තිණ්ණං ධම්මානං, ත්‍රිවිධ අපත්තීන් අතුරෙන්: අඤ්ඤතරෙන, එක්තරා ඇවතක් වූ: පාරාජිකෙන වා, (මෛථුන ධර්ම) පරිජියෙන් හෝ: සංඝාදි සෙසෙන වා, (කාය සංසර්ගාදී) සංඝාදිසෙසයකින් හෝ: පාචිත්ති යෙන වා, (නිෂද්‍යාමූලක) පචිතියෙන් හෝ: වදෙය්‍ය, කියා නම්: භික්ඛු, භික්ෂු තෙම: නිසජ්ජං, නිෂද්‍යාව: පටිජානමානො, ප්‍රතිඥ කරන්නේ, තිණ්ණං ධම්මානං, ත්‍රිවිධ ආපත්තීන් අතුරෙන්: අඤ්ඤතරෙන, අන්‍යතර වූ: පාරාජිකෙන වා, (මෙවුන්දම්) පරිජියෙන් හෝ: සංඝාදිසෙසෙන වා, (කාසසහ ඇ) සහවෙසෙසකින් හෝ: පාචිත්තියෙන වා, පචිතියෙන් හෝ: කාරෙතබ්බො, කරවිය යුත්තේය: සද්ධෙය්‍ය වචසා, ඇදහිය යුතු වචන ඇති: සා උපාසිකා, ඒ උවැසි තොමෝ: යෙන වා, (නිෂද්‍යාදි) යම් ආකාරයක් හා සමග: වදෙය්‍ය, (මෙවුන්දම් සෙවනය කිරීමාදීන් ආරොපණය කොට) කියන්නී ද: සො භික්ඛු, (පිළිණ කරණ) ඒ භික්ෂුතෙම: තෙන, ඒ ආකාරයෙන්: කාරෙතබ්බො, කරවිය යුත්තේය: අයං ධම්මො, මේ ධර්මය තෙම: අනියතො, (ප්‍රතිඥවෙන් කටයුතු බැවින්) අනියත නම් වේ.

සං:- **"මාතුගාමෙන"** මෙහි දක්වෙන 'මාගම' නම් මිනිස් මාගමකි. අන්තිම පරිච්ඡේදයෙන් එදවස උපන් සජීව මිනිස් ලදරිය ද මෙහි දී 'මාතුගාම' යන්නෙන් කියවේ. යක්ෂ, ප්‍රේත, තිරශ්චීන මාගම්මු මෙහි අනභිමතයහ.

සං:- **"එකො එකාය"** යී හුදකලාවූ (තනි වූ) එක් උපසපන් මහණෙක් එසේ ම එකලා වූ 'මාතුගාම' සංඛ්‍යාත එක් වනිතාවක් සමඟ යන අදහස ගත යුතුයි.

සං:- **"රහො"** යනු රහසි ගතව (අප්‍රකාශස්ථානයෙක්හි) යනුයි. ඒ නිසා **"චක්ඛුස්ස රහො"** යී අර්ථකථාවෙහි දක් වේ. එහෙත් පාළියෙහි **"රහො නාම චක්ඛුස්ස රහො සොතස්ස රහො"** යී පෙණේ. මෙහි ම 'පටිච්ඡන්නෙ ආසනෙ' යී කියවෙන බැවින් 'චක්ඛුස්ස රහො' යනු ම යෙදෙන බවත් 'සොතස්ස රහො' යනු නොයෙදෙන බවත් අර්ථ කථාවෙහි ප්‍රකාශිතය. වසන ලද කවුළුව ඇති ඔවරකයෙක්හි (කාමරයෙකැ) දෙරකඩ යම් හෙයකින් ඇතුළත කථා කරණ වචන තේරුම් ගන්නට සමත් පුරුෂයෙක් සිටියේ නමුදු ඇතුළත සිටි භික්ෂුහට ඇවැත් වන බවත් යම් හෙයකින් චක්ෂුර් විෂයවූ (දකීමට හැක්කාවූ දෙළොස් රියනකින් මෙපිට ප්‍රකෘති ඇස් ඇත්තාවූ වික්ෂෙපගත සිත් ඇත්තෙක් හෝ වාඩි වී සිට නිදන්නෙක් හෝ සිටියේ නමුත් ඇවැත් නොවන බවත් දක්වති.

අන්ධයෙකු සමීපයෙහි ම සිටියත් ඇවැත් වේ. දර්ශන ශක්තියක් නැති බැවිනි. වැද හෙව මහා නිද්‍රාවෙන් නිදන්නාවූ ඇස් ඇත්තෙක් සමීපයෙහි සිටියේ නමුත් ඇවැත් වේ. ස්ත්‍රීන් සියගණනක් සිටියේ නමුදු ඇවැත් වෙයි. මෛථුන ධර්මයට මාගම දෙවැන්නෙක් නොවේ. සාමාන්‍යයෙන් ස්ත්‍රීහු ඔවුනොවුන්ගේ වරද සඟවති.

විසාලා මහනුවර මහවනයෙහි දොර විවෘත කරගෙණ දහවල් සැතපුන භික්ෂූහු කෙරෙහි බොහෝ ස්ත්‍රීහු අභිමත පරිදි මෛවුන්දම් කොට ගියාහුය 'මෙය පළමු කරුණට සාධකයෙකි.'

කරුණු මෙසේ බැවින් 'රහො' යනු 'චක්ඛුස්ස රහො' යි ගත යුතුයි.

සං:- **"පටිච්ඡන්නෙ ආසනෙ"** යනු භිත්ති ආදී යමකින් වැසුන අවකාශස්ථානයෙක (අසුනෙක) යයි සැලකිය යුතුයි.

සං:- **"අලං කම්මනියෙ"** කම්මස්ස යොග්ගං-කම්මනියං, අලං පරියත්තං කම්මනිය භාවාය, අලංකම්මනියං, තස්මිං අලංකම්මනියෙ) 'අලං' ශබ්දය පටිසෙධ, යොග්‍ය, භූෂණාදි අර්ථවල යෙදෙයි. **"අලං මෙ බුද්ධෙන"** යනාදි තන්හි ප්‍රතිෂෙධය ද, **"අලමෙතං සබ්බං"** යනාදි තන්හි පරියත්ත යොග්‍ය යන අර්ථය ද, **"අලංකාරො"** යනාදි තන්හි භූෂනාර්ථය ද ගැණේ. මෙහි 'අලං ශබ්දය' යොග්‍ය (සුදුසු) යන අරුත්හි වැටේ. එබැවින් 'අලංකම්මනියෙ' යනු මෛවුන්දම් සෙවීමට සුදුසු යනාර්ථයි. මෙ පරිදි කිසියම් ස්ථානයෙක්හි යනුයි.

සං:- **"නිසජ්ජං කප්පෙය්‍ය"** යනු නිසීදනය (හිඳීම) කෙරේ ද යන අර්ථයි. සයනය කිරීමද 'නිසජ්ජං' යන්නෙහි ම අන්තර්ගත බැවින් මෙහි වාඩිවීම නිදීම (සයනය) යන දෙපරිද්දම කියවේ.

මුලින් කියවුනු පරිදි අසුනෙක මාගමක් සිටි කල්හි මහණෙකු පසුව වාඩි වූවත් සයනය කළත් මහණෙකු උන් ආසනයෙක පසුව මාගමක් වාඩි වූවත් සයනය කළත් දෙදෙන එක විට වාඩි වූවත් සයනය කළත් ඇවැත් සිදුවේ.

සං:- **"සද්ධෙය්‍යවචසා"** (සද්දහිතබ්බාති, සද්ධෙය්‍යාති; සද්ධෙය්‍යාති වාචාති එතිස්සාති; සද්ධෙය්‍යාවචසා; 'ඉච්ඡියමතො ආප්පච්චයො' යි 'ආ' ප්‍රත්‍යය හා 'සසරෙ වාගමො' යි සකාරාගමව සිද්ධයි) විශ්වාස කටයුතු වචන ඇති සොවාන් ඵලයට පැමිණි ආයර්‍ය ශ්‍රාවිකාවක්ය යනු අර්‍ථයි. **"සද්ධෙය්‍යවචසා නාම ආගතඵලා අභිසමෙතාවිනී විඤ්ඤාතසාසනා"** යි පදභාජනයෙහි කීහු.

සං:- **"උපාසිකා"** යනු බුද්ධ-ධම්ම-සඞ්ඝ යන තුණුරුවන් සරණ ගත කිසියම් ස්ත්‍රියකි. මෙහි ඵලප්‍රාප්ත උවැසියක් ප්‍රකාශ වේ.

සං:- **"තිණ්ණං භික්ඛු පටිජානමානො"** යනු පූර්වොක්තාකාර ඇති උවැසියක් දක මෙසේ ප්‍රකාශ කෙරේ නම් නිෂද්‍යාව ප්‍රතිඥ කරන්නේම් පාරාජිකාපත්තියෙන් හෝ සඞ්ඝාදිසෙසාපත්තියෙන් හෝ පාචිත්තියා පත්තියෙන් හෝ එක්තරා ඇවතකින් විනිශ්චය කට යුතුයි. අපටිජාන මාන කල්හි එසේ නොකට යුතුයි. එහෙත් යම්තාක් කල් පටිජානනය නොකෙරේ ද, ඒතාක් කල් එබඳු භික්ෂු තෙමේ පරිසුද්ධය කියා හෝ අපරිසුද්ධය කියා හෝ නොකිය යුතුයි.

යම්කිසි උවැසියක් තොමෝ 'මේ භික්ෂුහු මාගමක් සමග ප්‍රතිච්ඡන්න ස්ථානයෙක්හි මෙවුන්දම් සේවනය කරණවා දුටිමි' යි කී කල්හි චොදිත භික්ෂු තෙමේ එසේම එය පිළිගණී නම් පාරාජිකාපත්තියෙන් කටයුතුයි. නො එසේ නම් නොකටයුතුයි. සෙසු ඇවැත් ගැණ ද මෙසේ ම සැලකිය යුත්තේය.

ඵලප්‍රාප්ත ස්ත්‍රියකගේ නමුත් වචන මාත්‍රයෙන් ම (කී පමණින් ම) ඇවැත් නියම නොකට යුතුයි. දක්නා ලද්ද එසේම හෝ අන් ක්‍රමයකින් හෝ වියහැකි බැවිනි.

සං:- **"අනියතො"** යනු (න නියතො-අනියතො) අවිනිශ්චිතය යනුයි. පාරාජිකාපත්තියට පැමිණියේ ය කියා හෝ සඞ්ඝාදිසෙසා පත්තියට පැමිණියේ ය කියා හෝ පචිතියට පැමිණියේය කියා හෝ අපටිජාන මාන කල්හි අතිකෙකුට නිශ්චය නොකටහැකි බැවින් ද පාරාජිකාදී ඇවැත් තුණ අතුරෙන් යමක් ප්‍රතිඥ කෙරේ නම් ඒ ඇවැත්හුගේ වශයෙන් නිශ්චය කටයුතු බැවින් ද මීට 'අනියත' යයි කියනු ලැබේ.

## සප්තදශාකාරය

නිදානය - සැවැත් නුවරය.

පුද්ගලයා - උදායී තෙරණුවෝයි.

වස්තුව - මාගමක් සමග උක්තප්‍රකාර අස්නෙක්හි නිෂද්‍යාව කළ වස්තුවයි.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තියයි. (යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය-පෙ- අනියතො)

ආණත්තිය - අනාණත්තිකයි.

ආපත්ති - මෛථුන ධර්මසන්නිඃශ්‍රිත කෙලශ සංඛ්‍යාත රහස්සාදයෙන් මාගමක් සමීපයට යනු කැමැත්තෙන් ඇස් අඳුන්ගෑම් ආදි සියලු ප්‍රයොගයන්හි 'දුකුළාව' වෙයි.

ස්ත්‍රිය සමීපයට ගොස් සිටි කල්හි ස්ත්‍රිය වාඩි වූවත් ස්ත්‍රිය සිටි කල්හි ඔහු එකට වාඩි වූවත් දෙදෙන ම එකවිට වාඩි වූවත් සයනය කළත් 'පචිතිය' වේ. කාය සංසර්ගය කළ හොත් සඞ්ඝාදිසෙසයෙකි; මෙවුන්දම් කළ හොත් පරිජියෙකි;

අනාපත්ති - වුත්තප්පකාරෙ පුරිසෙ නිපජ්ජිත්වා අනිද්දයන්තෙ අනන්ධෙ විඤ්ඤූ පුරිසෙ උපචාරගතෙ සති ඨිතස්ස, අරහො 'පෙක්ඛස්ස, අඤ්ඤවිහි තස්ස, **තිසජ්ජත පච්චයා අනාපත්ති**, උම්මත්තකාදීනං තීහිපි ආපත්තීහි අනාපත්ති යි දක්වෙන්නන්ටයි.

විපත්ති - සියා සීලවිපත්ති, සියා ආචාර විපත්ති.

අඞ්ග - යම් ඇවතක් පටිජානනය කෙරේ නම්. ඒ වශයෙන් අඞ්ග නියම කටයුතුයි.

සමුට්ඨානාදිය පඨම පාරාජික සමුට්ඨානාදිය මෙනි.

**ප්‍රථමානියත ශික්ෂාපද වර්ණනාව සමාප්තයි.**

# පළමුවැනි අනියත ශික්ෂාවෙහි නිදන කථාව

එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එ සමයෙහි උදයි තෙරණුවෝ සැවැත් නුවර කුලුපග වූහ. බොහෝ උපස්ථායක ගෙවල්හි නිතර ඇවිදිති. එකල්හි උදයි තෙරණුවන්ගේ උපස්ථායක කුලයෙක්හි කුමරියක් තවත් කුලයෙකැ කුමරුවෙකුට පාවා දුන්හ. ආයුෂ්මත් උදයී තෙරණුවෝ පෙරවරු කාලයෙහි මනා කොට හැඳ පොරවා ගෙණ යථොක්ත උපස්ථායක කුලයට වැඩිසේක. එලඹ මිනිසුන්ගෙන් මෙසේ විචාළාහුය. කෙසේ ද? 'මෙ නම් ඇත්තී කොහි දැයි' කියා යි. ස්වාමීනි! අසුවල් කුමාරයාට සරණ පාවා දුන්නාහුයයි කීහ. ඒ කුලය ද තෙරුන් වහන්සේ ගේ උපස්ථායක කුලයෙකි. අනතුරුව තෙරුන් වහන්සේ එහි ද ගියාහුය. එහි දී ද 'අසුවල් නම් ඇත්තී කොහි ද' යි මිනිසුන්ගෙන් විචාළාහුය. ඕ ඔවරකයෙහි හුන්නී යයි කී කල්හි තෙරණුවෝ ද එහි ගොස් කාලොචිත කථාවෙන් හා ධර්මදෙශනාවෙන් යුක්තව තනිව හුදකලාවූ ඒ කුමරිය සමග ප්‍රතිච්ඡන්න අසුනෙක්හි හුන්නාහුය.

මිගාර මාතෘ වූ විශාඛා තොමෝ නීරෝගවූ බොහෝ පුතුන් හා මුනුපුරන් ඇත්තීය. මනුෂ්‍යයෝ මඞ්ගලාවස්ථාවලදීත් විශෙෂ උත්සව අවස්ථාවලදීත් ඇය පළමු කොට අනුභව කරවති. විශාඛා තොමෝ මේ කුලයට ද කැඳවන ලදින් පැමිණියාය, එකල්හි ප්‍රතිච්ඡන්නවූ ආසනයෙහි හුදකලාවූ කුමරියත් සමග සිටි තෙරුන්වහන්සේ දැක මෙසේ කීවාය. ස්වාමීනි! මාගමක් සමග හුදකලා වූයේ මෙවැනි තැනෙක සිටීම නුඹ වහන්සේට නුසුදුසුය. මෙබඳු තැන් මෛථුන ධර්මය කිරීමට ද සුදුසුය. එහෙත් නුඹ වහන්සේට එයින් ප්‍රයෝජන නැත. නමුත් මනුෂ්‍යයෝ අප්‍රසන්න වන්නාහු යයි කියා යි. තෙරණුවෝ එබස් නො ඇසූහ.

විශාඛා තොමෝ භික්ෂූන්ට මෙ කරුණ කීවාය. එකල්හි පෙශල භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සැළ කළාහුය. තථාගතයන් වහන්සේ මෙ කරුණ පරීක්ෂා කොට බලා නොයෙක් අයුරින් තෙරුන් ගරහා මේ ශික්ෂාපදය පණවා වදාළ සේක.

2. නහෙව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති, නාලං කම්මනියං; අලඤ්ච ඛො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං යො පන භික්ඛු තථා රූපෙ ආසනෙ මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය, තමෙනං සද්ධෙය්‍ය වචසා උපාසිකා දිස්වා ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය, සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, නිසජ්ජං භික්ඛු පටිජානමානො ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා; යෙන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තෙන සො භික්ඛු කාරෙතබ්බො, අයම්පි ධම්මො අනියතො.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො ද්වෙ අනියතා ධම්මා; තත්ථා යස්මන්තෙ පුච්ඡාමි; කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි; කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි; කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං, ධාරයාමීති.

අනියතුද්දෙසො නිට්ඨිතො.

---

**අර්ථ**:- ආසනං අස්න; නහි එව ඛො පන පටිච්ඡන්නං හොති, (කවාට කුඩ්‍යාදියෙන්) ප්‍රතිච්ඡන්න නොවූයේ ම වේද; අලං කම්මනියං න (හොති), මෛථුන ධර්මසෙවනයට සුදුසු නොවේද; මාතුගාමං, (සුබැසි දුබැසි දන්නා) මිනිස් මාගමකට; දුට්ඨුල්ලාහි වාචාහි, අසභ්‍ය වදන් වලින්; ඔභාසිතුං, කියන්ට; අලං ච ඛො (හොති), යොගය වේද.

යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; එකො, එකලා වූයේ; එකාය- එකලා වූ; මාතුගාමෙන සද්ධිං, මාගමක් හා සමග; රහො, රහසිගත වූ (පියවි බස් නො ඇසෙන තන්හි වූ); තථාරූපෙ, එබඳු වූ; ආසනෙ, අසුනෙක්හි; නිසජ්ජං-නිෂද්‍යාව; කප්පෙය්‍ය, කෙරේද; සද්ධෙය්‍ය වචසා, හැදහිය යුතු වචන ඇති; උපාසිකා, උවැසියක් තොමෝ; තමෙනං, ඒ මේ මහණහු; දිස්වා, දැක; ද්වින්නං ධම්මානං, ද්විවිධ ආපත්තීන් අතුරෙන්; අඤ්ඤතරෙන, එක්තරා; සංඝාදිසෙසෙන වා; (කායසංසග්ගයෙන් හා දුට්ඨුල්ල වදනින් ද වන්නාවූ) සංඝාදිසෙසයෙන් හෝ; පාචිත්තියෙන වා (නිෂද්‍යාමූලක) පචිතියෙන් හෝ, වදෙය්‍ය, කියන්නීද; භික්ඛු, මහණ තෙම, නිසජ්ජං, නිෂද්‍යාව: පටිජානමානො, ප්‍රතිඥ කරන්නේ ද්වින්නං ධම්මානං, ද්විප්‍රකාර ආපත්තීන් අතුරෙන්; අඤ්ඤතරෙන: අන්‍යතරවූ; සංඝාදිසෙසෙන වා, සංඝාදිසෙසයෙන් හෝ; පාචිත්තියෙන වා, පචිතියෙන් හෝ: කාරෙතබ්බො, කරවිය යුත්තේය.

සද්ධෙයාවචසා, හැදිහිය යුතු වචන ඇත්තාවූ: සා උපාසිකා, ඒ උවැසි තොමෝ: යෙන වා, (නිෂද්‍යාදී) යම් ආකාරයකින් හෝ: වදෙය්‍ය, (කායසංසර්‍ගාදීන් ආරෝපණය කොට) කියන්නීද: සො භික්ඛු, ඒ මහණ තෙම: තෙන, ඒ ආකාරයෙන් (ඒ ඇවතින්:) කාරෙතබ්බො, ප්‍රතිකර්ම කරවිය යුත්තේය: අයං ධම්මො අපි, මේ ධර්මය ද: අනියතො, ප්‍රතිඥාවෙන් කටයුතු බැවින් අනියත නම් වේ.

ආයස්මන්තො, ආයුෂ්මත්නි: ද්වෙ අනියතා ධම්මා, ද්විවිධ අනියතා පත්තිහු: උද්දිට්ඨා බො, උදෙසන ලද්දාහු ම ය: තත්‍ථ, ඒ අනියතා පත්තියෙහි ලා: ආයස්මන්තෙ, ආයුෂ්මතුන්: පුච්ඡාමි, විචාරමි: කච්චි, මෙහි: කච්චි පරිසුද්ධා අත්‍ථ? කිම පිරිසිදු ද:? දුතියම්පි, දෙවනුව ද: පුච්ඡාමි, විචාරමි: කච්චි පරිසුද්ධා අත්‍ථ? කිම පිරිසුදුවහු ද? තතියම්පි, තෙවනුව ද: පුච්ඡාමි? විචාරමි: කච්චි පරිසුද්ධා අත්‍ථ? කිම පිරිසිදුව හුද? ආයස්මන්තො: ආයුෂ්මත්හු: එත්‍ථ, මෙහි ලා: පරිසුද්ධා, පිරිදුහ: තස්මා එහෙයින්: තුණ්හි, තුෂ්ණිම්භූතයහ: එතං, මේ තුෂ්ණිම්භාවය, එවං, මෙසෙයින්: ධාරයාමීති, දරමි යි (පිරිසුදු හෙයිනැයි සලකමි.)

අනියතුද්දෙසො, අනියතොද්දෙශය: නිට්ඨිතො නිමියේ යි.

---

**සංලක්ෂ්‍යය:- "තඤෙව බො පන පටිච්ඡන්නං ආසනං හොති"** යි යමකින් අනාවරණ වූ එහෙයින් ම මෛථුන්දම් සෙවීමට අයොග්‍ය වූ අසුන දක්වති.

බිත්තියකින් හෝ කවුළුවකින් හෝ වස්ත්‍ර ප්‍රාකාරාදියකින් හෝ නොවැසුන ආසනය අපටිච්ඡන්න වූ අසුනකි. ප්‍රාකාරාදිය කින් වටේ ආවරණය කරණ ලද්දේ (අනුරපු නමුත් ප්‍රාකාර යෙන් ඇතුළත යම්කිසි ආවරණයක් නැත හොත් එබඳු පරිවෙණාඞ්ගනාදී ස්ථාන ද මෙහි ම ඇතුළත් වෙති හෙවත් අපටිච්ඡන්නා සනය ම යයි මහා පච්චරියෙහි කීහු.

**සං:- "අලඤ්ච බො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං"**යි. අපටිච්ඡන්නාසනය ගැන ම දක් වේ.

යම්කිසි තැනකැ (අසුනකැ) මෙවුන්දම් කිරීමට අනවකාශ වුවත් මාගමගේ අභපසභ ස්පර්ශ කිරීමට (කාය සංසර්‍ගයට) හෝ මෛථුන ධර්ම සන්නිශ්‍රිත වචන කථා කිරීමට (දුට්ඨුල්ලො භාසනයට) හෝ අවකාශ ලැබිය හැකියි. එබඳු ස්ථානයක් මෙයින් ප්‍රකාශ වේ.

සං:- **"සඞ්ඝාදිසෙසෙන වා"** යි කායසංසග්ග සංඝාදිසෙසය හා දුට්ඨුල්ලොභාසන සංඝාදිසෙසය යන දෙක අනියමින් දක් වෙතත් මේ දෙවෙනි අනියත ශික්ෂාපදය දුට්ඨුල්ලවාචොභාසනය කිරීම් වශයෙන් පැමිණියේ යයි ටීකාවෙහි දක්වූහ.

මාගමක් සමග කරණ දුට්ඨුල්ලවාචොභාසනය තවත් ස්ත්‍රියක් නො සහව යි. ඒ නිසාම දුට්ඨුල්ලවාචා සික්ඛා පදයෙහි යම් පමණ ස්ත්‍රීහු ලජ්ජා වූවෝ ද ඔව්හු භික්ෂූන්ගේ නුගුණ කියා පැවාහුය. ඒ නිසා පළමු අනියත ශික්ෂා පදයෙහි මෙන් නොව ප්‍රකෘතිවචන ඇසෙන තැන (දෙළොස් රියනකින් මෙපිට) ස්ත්‍රියක් සිටියත් අනාපත්ති වේ යයි කීහු. නැත හොත් මෙහි අපටිච්ඡන්න භාවය නිසා ස්ත්‍රිය ද අනාපත්ති කර වේ. පළමු ප්‍රතිච්ඡන්නත්වය නිසා ස්ත්‍රීන් සියයක් සිටියේ නමුත් ආපත්තිය නොවැළකේ.

එබැවින් මෙහි දී අන්ධ නොවූ බිහිරි නොවූ නුවණැති පුරුෂ යෙක් හෝ වේවා ස්ත්‍රියක් හෝ වේවා දෙළොස් රියනක් ඇතුළත වාඩිවී සිටියත් සයනය කළත් ඇවත නොවේ. ඇස් ඇති බිහිරෙකු සිටිය ත් බිහිරි නොවූ අන්ධයෙකු සිටියත් ඇවත වැළකේ.

තිදනාදිය පළමු ශික්ෂා පදයෙහි මෙනි.

සමුට්ඨාන - තිසමුට්ඨානයි. (කාය චිත්තතො, වාචා චිත්තතො, කායවාචා චිත්තතො.)

කිරියා - ක්‍රියා වශයෙනි.

සඤ්ඤා - සඤ්ඤාවිමොක්ඛයයි.

චිත්ත - සචිත්තකයි.

වජ්ජ - ලොකවජ්ජයි.

කම්ම - කායකම්ම - වචීකම්ම දෙකයි.

කුශලත්‍රිකය - අකුශල චිත්තයයි.

වෙදනාත්‍රිකය - සුඛවෙදනා මජ්ඣත්ත වෙදනා දෙකයි.

මේ අනියතුද්දෙසය වනාහි දිට්ඨාදි සමූලක චොදනාවක් ඇතිවිට වස්තුව ප්‍රතිඥා කරණ කල්හි ම පරිජිය හෝ සංඝාදි සෙසය හෝ පචිතිය හෝ නියම කටයුතුයි. නැත හොත් අසවල් ඇවත යයි නොකියයුතුයි.

**ද්විතීයානියත ශික්ෂා පද වර්ණනාව සමාප්තයි.**

---

ඉමෙ ඛො පනායස්මන්තො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. නිට්ඨිත චීවරස්මිං පන භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ දසාහ පරමං අතිරෙක චීවරං ධාරෙතබ්බං තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං.

---

# දෙවැනි අනියත ශික්ෂාවෙහි නිදාන කථාව

එක් සමයෙක්හි බුදුරජානන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවසන සේක. ඒ කාලයෙහි ආයුෂ්මත් උදායී තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් එකලා වූයේ රහසිගතව මෛථුන සෙවනයට යොග්‍යවූ ප්‍රතිච්ඡන්න ආසන යෙක්හි හිඳීම ප්‍රතික්ෂිප්ත ය යි කියා ඒ කුමරිය සමගම එකලා වූයේ කාලයුක්ත කථා සල්ලාපයෙන් හා ධර්ම කථාවෙන් යුක්තව ප්‍රතිච්ඡන්න නො වූ අසුනෙක්හි නිෂද්‍යාව කළෝය.

විශාඛා තොමෝ ද කැඳවන ලදින් ඒ ගෙදරට පැමිණියාය. ඕ තොමෝ එකලාව එකලා වූ කුමරියක් සමග සිටියාවූ තෙරුන් දැක ස්වාමීනි! මෙය නුඹවහන්සේට නුසුදුසු යයි කීවාය. එහෙත් එබස් නො ඇසූහ.

විශාඛා තොමෝ භික්ෂූන් වහන්සේට සැළ කළාය. එකලැ පෙශල භික්ෂූහු නුගුණ පතුරුවන්ට වූහ. ඒ ඇසූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ කීවාහුය. තථාගතයන් වහන්සේ කරුණු පරීක්සා බලා උදායිතෙරුන්ට ගරහා මේ ශික්ෂාව දෙශනා කළ සේක.

---

**අර්ථ:-** ආයස්මන්තො, ආයුෂ්මතුනි: ඉමෙ ඛො පන තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, මේ තිස් නිසගි පචිති ඇවැත්හු: උද්දෙසං, උදෙසිය යුතු බවට: ආගච්ඡන්ති, පැමිණෙත්.

1. භික්ඛුනා පන, භික්ෂුහු විසින් වනාහි: නිට්ඨිත චීවරස්මිං, සිවුර කොට නිම කරණ ලද කල්හි: කඨිනෙ උබ්භතස්මිං, කෙළින් (කඨින චීවරය) උදුල කල්හි: දසාහ පරමං, දස දිනක් පරම කොට ඇති (දස දවසකට වැඩි නොවන) කාලයක්: අතිරෙක චීවරං, අයිරිත් (නො ඉටු නොවිකැපූ) සිවුරක්: ධාරෙ තබ්බං, දැරිය යුතුයි. තං, ඒ (දසාහපරම) කාලය: අතික්කාම යතො, ඉක්ම වන්නා හට: නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

සං:- **"නිට්ඨිතචීවරස්මිං"** යි නිට්ඨිතඤ්ච තං චීවරඤ්චාති, නිට්ඨිතචීවරං: තස්මිං, නිට්ඨිතචීවරස්මිං' 'නිට්ඨිතචීවරස්මිං' යනු ද. 'උබ්භතස්මිං' යනු ද 'ධාරෙතබ්බං' යන්නෙහි භාව සප්තමීහුයි. 'නිට්ඨිතචීවරය' නම් සූචිකර්මාවසානය කිරීමෙන් නිමියා වූ හෝ **"නට්ඨං වා විනට්ඨං වා දඩ්ඪං වා චීවරාසා උපච්ඡින්නා වා"** යි දක්වෙන කිසියම් ආකාරයකින් විනාශ වීමෙන් නිමියා වූ හෝ සිවුරයි.

චීවරයක සූචිකර්මය සමාප්ත වන්නේ 'පාසවට්ට - ගණ්ඨික වට්ට' (ගණ්ඨිපාස) දෙක බැඳීමෙන් පසුවය. මෙසේ සූචිකර්මය සමාප්ත කල කල්හි 'නිට්ඨිත චීවරය' යි කියනු ලැබේ. සොරු ආදීන්ගේ ගැණීමෙන් හෝ වේ, මී ආදීන් විසින් කනු ලැබූ කල්හි හෝ පිලිස්සීමෙන් හෝ අසුවල් කුලයෙන් (ගෙදරින්) සිවුරක් ලබන්නෙමි යි යම් ආසාවක් තිබුනේ වී නම් එය සිඳී යාමෙන් හෝ චීවරය සම්බන්ධ කරණ පළිබොධ නිමවූ බැවින් එබඳු සිවුරට ද 'නිට්ඨිතචීවරය' යි කියනු ලැබේ.

අනාමන්තචාරාදි ආනිසංසයන්ට මුල් වූ කෙළින් සිවුර ද පච්චාසා සිවුර ද 'නිට්ඨිතචීවරය' යි ටීකාවෙහි දක්වූහ.

කෙළින් අතුළ මහණහුගේ චීවර පළිබොධය මේ අයුරින් නො සිඳේ ද, එතාක් ඔහුට කඨිනානිසංස ලැබෙති.

සං:- **"උබ්භතස්මිං කඨිනෙ"** යි සඞ්ඝයා විසින් අතුරණ ලද කෙළින් සිවුරක් අට වැදෑරුම් මාතෘකාවන් අතුරෙන් එකකින් හෝ අන්තරුබ්භාරයෙන් හෝ උද්ධරණය කළ හැකි වේ. එසේ කඨිනොද්ධරණය කළ කල්හිය යනුයි. මෙහි කී අන්තරුබ්භාරය නම්, සඞ්ඝයා විසින් යම් කිසි කඨිනයක් අතර දී උද්ධරණය කිරීමයි.

කඨිනාස්තරණය හා උද්ධරණය සම්බන්ධ සංක්ෂෙප විස්තරයක් මෙයි ලියැ වේ.

මේ කඨිනාස්තරණය වනාහි භාග්‍යවතුන් වහන්සේ පෙර වස් විසූ තිසක් පමණ පාවෙය්‍යක භික්ෂූන් සඳහා **"අනුජානාමි භික්ඛවෙ වස්සං වුත්ථානං භික්ඛූනං කඨිනං අත්ථරිතුං"** යි දෙශනා කළ සේක.

පෙර වස් විසූ කාට වුවත් වස්සච්ඡෙදය නොවුවහොත් කඨිනාස්තරණය කළ හැක්කේය.

වස්සච්ඡෙදය කළෝ ද පසුවස් විසුවෝ ද කෙළින් අතුරන්ට නුසුදුස්සෝ වෙති: ගණන් වශයෙන් යටත් පිරිසෙයින් පස් දෙනෙකුන් විසින් කඨිනාස්තරණය කළ යුතු වේ: එයින් සතර නමක් දුස්සදායකයෝ

යි (කෙළින් සිවුර දෙන්නෝයි) එක් නමක් ප්‍රතිග්‍රාහක වේ. ඇතැම් ආචාර්‍ය්‍යයෝ පඤ්චවර්ගී සඞ්ඝයා විසින් මේ විනය කර්‍මය කළයුතු බැවින් පස්දෙනකුට වටී යයි කියති. ඒ ඔවුන්ගේ මතිමාත්‍රයක් බැව් ටීකාවෙහි දක්වූහ. චතුර්වර්ගී භික්‍ෂු සංඝයාට උපසම්පදව; පවාරණය, අබ්භානය යන විනය කර්‍මත්‍රය හැර නොකට හැකි විනයකර්‍ම නැති බැවිනි.

යම් කිසි ආවාසයක පෙරවස් විසූ සතරනමක් හෝ තුන් නමක් හෝ දෙනමක් හෝ එක් නමක් හෝ වේ නම් පශ්චිම වස්සූපගතයන් ගණ පූරකයන් කොට ගෙණ කෙළින් (සිවුර) අතුළ යුතුයි. එහෙත් පශ්චිම වස්සූපගතයෝ එහි දී ගණ පූරකයෝ වෙත්: ආනිසංස ලබන්නෝ නොවෙති. භික්‍ෂූහු සතර දෙනෙකුත් පිරිපුන් වස් ඇති සාමණේරයකුත් යම්කිසි ආවාසයක වස් වූසු නම් පසුවස් වසන දවසේ එකී සාමණේරයා උපසපන් කෙළේ නම් ඒ නවක භික්‍ෂු තෙමේ ගණ පූරක ද වේ. අනාමන්තචාරාදී කඨිනානිසංස ලබන්නෙක් ද වේ. එවැනි සාමණේර දෙනම, තුන්නම, සිවුනම වුවත් පළමු කී නයින් ම සැළකිය යුතුයි.

පෙරවස් වූසූ භික්‍ෂුහට හෝ භික්‍ෂූන්ට ගැහැවි පැවිදි තැන් අතුරෙන් කිසිවෙක් 'මෙයින් කඨිනයක් අතුරණු සේක්වායි' දැහැමෙන් සෙමෙන් ලත් සිවුරක් (වස්ත්‍රයක්) දෙයි නම් ඛන්ධකයෙහි දක්වන ලද ඤප්තිද්විතීය කර්‍මවාක්‍යයෙන් පිළිගත යුතුයි. ඒ මෙසේයි:-

**"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉදං සංඝස්ස කඨිනදුස්සං උප්පන්නං යදි සංඝස්ස පත්තකල්ලං සංඝො ඉදං කඨිනදුස්සං ඉත්ථන්නාමස්ස භික්ඛුනො දදෙය්‍ය කඨිනං අත්ථරිතුං එසා ඤත්ති"**

**සුණාතු මේ භන්තෙ සංඝො ඉදං සංඝස්ස කඨින දුස්සං උප්පන්නං සංඝො ඉදං කඨින දුස්සං ඉත්ථන්නාමස්ස භික්ඛුනො දෙති කඨිනං අත්ථරිතුං: යස්සායස්මතො ඛමති ඉමස්ස කඨින දුස්සස්ස ඉත්ථන්නාමස්ස භික්ඛුනො දනං කඨිනං අත්ථරිතුං: සො තණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.**

**දින්නං ඉදං සංඝෙන කඨිනදුස්සං ඉත්ථන්නාමස්ස භික්ඛුනො කඨිනං අත්ථරිතුං: ඛමති සංඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති"**

(හැමට ම වැඩිමහලු දෙනමක් කර්‍ම වාක්‍යය දෙසත් හොත් 'භන්තෙ'යි කී තන්හි 'ආවුසො' කියා ද, නොකැපූ නොමැසූ වස්ත්‍රයක් නම් 'කඨින දුස්සං' යනු ද එසේ ම සූචිකර්‍මාවසාන කොට රජන්කරණ ලද්දක් නම් 'කඨින චීවරං' කියා ද යොද ගත යුතුයි.)

සංඝයාගෙන් කඨින වස්ත්‍රයක් ලැබූවහු විසින් එදවස ම පස්කඩකට හෝ සත්කඩකට හෝ ඊට වැඩි ගණනකට කපා 'සහළ' සිවුරක් හෝ උත්තරාසඞ්ගයක් (තනිපට සිවුරක්) හෝ අන්තරවාසකයක් (අඳනයක්) හෝ කටයුත්තේය. සෙස්සන් විසින් ඕහට සහාය විය යුතුයි. කඨින චීවරයක් කරණු ලබන කල්හි මම වැඩිමහලු (ස්ථවිර) යයි කියාවත් බහුශ්‍රැතයා යයි කියාවත් සහාය නොවී සිටිය නො හැක්කේය. අනාදරයෙන් සහාය නොවූවහොත් දුකුළාවකට ද පැමිණෙයි.

**"සවෙ කතචීවරමෙව උප්පජ්ජති සුන්දරමෙව"** යි දක්වන අටුවා පාඨය වරදවා තේරුම් ගැණීමෙන් කලින් කරපු සිවුරකින්ද කෙළින් අතුරති. ඒ නොමැනවි. මේ අට්ඨකථා පාඨය දක්වා තිබෙන්නේ ඇතිරීම පිළිබඳව නොව සඞ්ඝයා විසින් කෙනෙකුට පැවරීම පිළිබඳවයි. එහි පළමුවෙන් කෙනෙකුට වස්ත්‍රය පැවරීම ගැණ විස්තර කොට නැවත එදවස ම කළ සිවුර වුවත් පැවරීම සුන්දර යයි කීහු. ඇතිරීමට එදවස ම කළ සිවුර ම වියයුතු බව මහාවග්ගකඨිනක්ඛන්ධක පාලියෙහි කියවෙන **"තදහෙව සචජ්ජතො සමණ්ඩලිකතෙන පඤ්චකෙන වා අතිරෙක පඤ්චකෙන වා අත්ථතං හොති කඨිනං"** යන ශ්‍රී මුඛ දෙශනා පාඨයෙන් මොනවට වැටහේ.

කඨිනාස්තාරක භික්ෂුහු විසින් පැරණි සහළ සිවුර පච්චුද්ධරණය කොට අභිනව සංඝාටිය අධිෂ්ඨාන කොට 'ඉමාය සංඝාටියා කඨිනං අත්ථරාමි' යි ආස්තරණය කටයුත්තේය. තනිපට සිවුර නම් 'ඉමිනා උත්තරාසඞෙගන' කියා ද, අඳනයක් නම් 'ඉමිනා අන්තරවාසකෙන' කියාද යොද ගත යුත්තේය.

අනතුරුව ඒ සීමාභ්‍යන්තරයෙහි පෙරවස් විසූ භික්ෂූන් ඇතහොත් ඔවුන් කරා පැමිණ **"අත්ථතං භන්තෙ සංඝස්ස කඨිනං ධම්මිකො කඨිනත්ථාරො අනුමොදථ"** යි කිය යුතුයි. (වැඩි මහලු භික්ෂුනමක් ඇතහොත් 'භන්තෙ' කියා ද නැත හොත් 'ආවුසො' කියා ද යොදනු) ඔවුන් විසිනුදු **"අත්ථතං භන්තෙ සංඝස්ස කඨිනං"** කියා හෝ **අත්ථතං ආවුසො සංඝස්ස කඨිනං"** කියා හෝ සුදුසු පරිද්දෙන් ප්‍රකාශ කොට **ධම්මිකො කඨිනත්ථාරො අනුමොදම"** කියා හෝ **"අනු මොදමි"** කියා හෝ අනුමෝදන් විය යුත්තේය. යමෙක් අනුමෝදන් වී නම් කඨිනොද්ධරණය දක්වා ඔවුන්ට **"අනා මන්තචාරො, අසමාදනචාරො, යාවදත්ථචීවරං, ගණ භොජනං, යො ච තත්ථ චීවරුප්පාදෙති"**යි දක්වෙන කඨිනානි සංස පඤ්චකය ලැබේ.

කඨිනයක් අතුරන්ට අඩඟාඞකයෙකින් යුක්ත පුද්ගලයා භව්‍ය වේ. තදඩගාඞකය නම්:- 1. 'පුබ්බකරණං ජානාති. 2. පච්චුද්ධාරං ජානාති. 3. අධිට්ඨානං ජානාති. 4. අත්ථාරං ජානාති. 5. මාතිකං ජානාති. 6. පළිබොධං ජානාති. 7. උද්ධාරං ජානාති. 8. ආනිසංසං ජානාති.' යනුයි.

**"අට්ඨධම්ම කොවිදෙ භික්ඛු කඨිනත්ථාරමරහති'ති"** විනිශ්චයෙහි ද දක්වූ හෙයින් මෙහි කී ලක්ෂණවලින් සමන්විත වූවෙකු විසින් ම කඨිනය ඇතිරිය යුත්තේය.

අනතුරුව කඨිනොද්ධරණය මෙසේ දත යුතුයි. කෙසේද? කඨිනොද්ධරණයෙහි මේ මාතෘකාවෝ අටදෙනෙකි; ඔවුහු නම්:-

1. 'පක්කමණන්තිකා. 2. නිට්ඨානන්තිකා. 3. සන්නිට්ඨානන්තිකා. 4. නාසනන්තිකා. 5. සවණන්තිකා. 6. ආසාවච්ඡෙදිකා. 7. සීමාතික්කමණන්තිකා. 8. සහුබ්භාරා'ති' යනුයි.

කෙළින් අතුළ යම්කිසි මහණෙක් කඨින චීවරය රැගෙන ඒ ආවාසයෙහි අපෙක්ෂා විරහිතව බැහැර යේද; ඔහුගේ බැහැර යාමෙන් වූ කඨිනොද්ධාරය සීමාව ඉක්මවූ කෙණෙහි ම වේ. මේ 'පක්කමණන්තික කඨිනොද්ධාර' යයි.

යමෙක් සඞ්ඝයාගෙන් ලත් ආනිසංස චීවරයක් රැගෙණ බැහැර යෙයි. බැහැර ගියාවූ ඔහුට මෙසේ සිතෙක් වෙයි. මෙහිදී ම චීවරය සම්බන්ධි කටයුතු ද කරන්නෙමි. නැවත මම පළමු චීවරය ලත් අවසට නොයන්නෙමියි කියායි. ඒ ආවාසය ගැණ අපෙක්ෂාවක් නැතිව සිවුර කෙරේ ද, ඒ භික්ෂු හට 'නිට්ඨානන්තික' නම් කඨිනොද්ධාරය වේ.

ඉදින් යමෙක් ආනිසංසමූලක චීවරයක් රැගෙණ වස් විසූ සීමාවෙන් පිට ගොස් මම මේ සිවුර නොකරන්නෙමි නැවත ඒ ආවාසයට ද නොයන්නෙමියි සනිටුහන් කෙරේ නම් භික්ෂුහුට 'සන්නිට්ඨානන්තික කඨිනොද්ධාරය' වේ.

ඒ ආනිසංස මූලක චීවරය රැගෙන ආවාසයෙන් බැහැර ගොස් මෙහි දී සිවුර කරගන්නෙමි. නැවත ආවාසයට නොයන්නෙමියි සිතා කරන්නහුගේ ඒ සිවුර විනාශ වෙයි නම්, දැවේ නම්, ඒ 'නාසනන්තික කඨිනොද්ධාර'යයි. එසේම යමෙක් ආනිසංස මූලක චීවරයක් ලැබ ඒ

විහාරය ගැන අපෙක්ෂාව ඇතිව ම සීමායෙන් පිට ගිය කල්හි විහාරයෙහි හුන් භික්ෂූන් විසින් අන්තරුබ්භාරය කරණ ලදයි ඇසුයේ නම් ඒ 'සවණන්තික කඨිනොද්ධාර' යයි.

කිසිවෙකු විසින් නුඹවහන්සේට සිවුරක් දෙන්නෙමියි කී කල්හි සිවුරෙහි ආශාව තබාගෙණ ආවාසයෙහි නිරාශව බැහැර ගියේ ද, නැවත සිවුරක් දෙන ලෙස ප්‍රතිඥ කළාහු විසින් නුඹවහන්සේට නොදෙන්නෙමියි කියනලද කල්හි ආශාව සිඳෙයි ද මේ 'ආසාවච්ඡෙදික කඨිනොද්ධාර' යයි.

යමෙක් වස්විසූ අවසින් අන්තැනකට ගොස් එනවිට අතර මගදී ම කඨිනොද්ධාරය ඉක්මවයි නම් ඒ 'සීමාතික්ක මණන්තික කඨිනොද්ධාර' යයි.

එසේම යමෙක් ආනිසංස මූලක චීවරය රැගෙණ සාපෙක්ෂකව බැහැර ගොසින් කඨිනොද්ධාරයට පැමිණිය හැකි වේ නම් ඔහුගේ කඨිනොද්ධාරය 'සහුබ්භාර කඨිනොද්ධාර' යයි.

මෙහි ප්‍රකාශිත කඨිනොද්ධාර අට අතුරෙන් එක්තරා එකකින් උද්ධරණය වේ. (මෙහි විස්තර සමන්තපාසාදිකාවෙන් දතයුතුයි.) 'උබ්භතස්මිං කඨිනෙ' යි ආවාසපළිබොධාභාවය දක්වේ.

සං:- **"දසාහපරමං"** යී (දස අහානි පරමො අස්සාති- දසාහපරමො; තං-දසාහපරමං; දසාහපරමං යනු 'ධාරෙතබ්බං' යන පදයෙහි අත්‍යන්ත සංයොගයි. එහෙයින් ද්විතීයා විභක්තිය වේ.) දස දවසක් පරම කොට ඇති කාලය මෙයින් කියවේ.

සං:- **"අතිරෙකචීවරං"** යි අතිරෙක චීවරය නම්-ඛොමං, කප්පාසිකං, කොසෙය්‍යං, කම්බලං, සාණං, භඞ්ගං, යී දක්වෙන ෂඩ්විධ චීවරය හෝ කොමු සිවුරු අදීන්ට අනුලොම් වූ එක්තරා සිවුරකි. 'දුකූලං පත්තුණ්ණං, සොමාරපට්ටං, චීනපට්ටං, ඉද්ධිජං, දෙවදින්නං' යි සප්තවිධ චීවරය අනුලොම් චීවර යි.

දුකූල චීවරය සාණචීවරයට අනුලොම් වේ. චීවර ද්‍රව්‍යයම වාකමය බැවිනි. පත්තුණ්ණ දෙශයෙහි ප්‍රාණී (පණු) විශෙෂයකින් කළ නූලින් කළ වස්ත්‍රය (සිවුර) 'පත්තුණ්ණ' නම් වේ. සොමාර දෙශයෙහි වූයේ

'සොමාරක' නම් වේ, චීන දෙශයෙහි වූ වස්ත්‍රය 'චීනපට්ට' නම් වේ මේ. වස්ත්‍ර තුණම කොසෙය්‍ය වස්ත්‍රයට අනුලොම් වේ. පණුවන්ගෙන් ගත් නූල් වලින් වියනලද බැවිනි. ඒහි භික්ෂූන්ගේ පින්තෙදින් නිපන් සිවුර 'ඉඩ්ජ' නම් වේ. ඒ කොමුපිළි ආදීන්ට අනුලොම් වේ. දෙවියන් විසින් දෙනලද්දේ 'දෙවදින්න' නම් වේ. එම දෙව ලොකයෙහි කප්රුකේ හටගත් 'ජාලිනී' නමැති දිව්‍ය කන්‍යාව විසින් අනුරුඬ තෙරුන්ට දුන් වස්ත්‍රයට සමාන වූවකි; එයත් කොමුපිළි ආදීන්ට අනුලොම් වේ; මෙයින් ඒ ඒ සිවුරු ඒ ඒ සිවුරට අනුලොම් වන පරිදි දත යුතුයි; අතිරෙක චීවරය නම් - අධිෂ්ඨිත විකල්පිත සිවුරු අතුරෙහි ඇතුළත් නොවූ හෙයින් අයිරිත්වූ යථොක්ත චීවරයන් අතුරෙන් අන්‍යතර එකක් යයි සැලකිය යුතුයි;

අධිට්ඨාතව්‍ය වූ ද විකල්පිතව්‍ය වූ ද චීවරාදිය මෙසේ දත යුත්තේය; **"අනුජානාමි භික්ඛවෙ ආයාමතො අට්ඨඞ්ගුලං සුගතඞ්ගුලෙන චතුරඞ්ගුල විත්ථතං පච්ඡිමං චීවරං විකප්පෙතුං"** යි ප්‍රමාණ වශයෙන් විකල්පිතව්‍ය පශ්චිම චීවරය දැක්වූහ;

**අනුජානාමි භික්ඛවෙ තිචීවරං අධිට්ඨාතුං න විකප්පෙතුං. වස්සික සාටිකං ච ස්සානං චාතුමාසං අධිට්ඨාතුං තතො පරං විකප්පෙතුං. නිසීදනං අධිට්ඨාතුං න විකප්පෙතුං. පච්චත්ථරණං අධිට්ඨාතුං න විකප්පෙතුං. කණ්ඩු පටිච්ඡාදිං යාව ආබාධා අධිට්ඨාතුං තතො පරං විකප්පෙතුං. මුඛපුඤ්ඡන චොලකං අධිට්ඨාතුං න විකප්පෙතුං. පරික්ඛාරචොලං අධිට්ඨාතුං න විකප්පෙතුං** යනුයි.

තුන් සිවුර ඉවන්නහු විසින් රජනය කළ (පඬුපෙවූ) කප්බිඳුව තුබූ තුන් සිවුර අධිෂ්ඨානය කළ යුතුයි. හෙද දිග පුළුලින් සුගත් සිවුරට අඩුවූවක් ම විය යුත්තේය.

ප්‍රමාණ වශයෙන් යටත්පිරිසෙයින් සංඝාටිය (දෙපට සිවුර) හා උත්තරාසඞ්ගය (තනිපට සිවුර) දිගින් මුට්ඨිපඤ්චකයක් හා පුළුලින් මුට්ඨිත්තිකයක් වියයුතුයි. මිට්රියන පස්වැනි කොට ඇත්තේ මුට්ඨිපඤ්චක යයි. මුට්ඨිත්තිකය ද මෙසේ මැයි. අන්තරවාසකය ද දිගින් මුට්ඨිපඤ්චකයක් හා පුළුලින් දෙරියනක් වියයුතු යි. මෙකී ප්‍රමාණ වලින් අඩු වැඩි වූ සියල්ල ම පරික්ඛාර චොල වශයෙන් අධිෂ්ඨාන කළ යුත්තාහ.

**"ද්වෙ චීවරස්ස අධිට්ඨානානි කායෙන වා අධිට්ඨාති වාචාය වා අධිට්ඨාති"** යි කී බැවින් පුරාණ සංඝාටිය **"ඉමං සංඝාටිං පච්චුද්ධරාමි"** යී පච්චුද්ධරණය කොට අළුත් සංඝාටිය අතින් ගෙණ **"ඉමං සංඝාටිං අධිට්ඨාමි"**යි සිතින් සිතාගෙණ සිවුර අත ගාමින් කයින් හෝ වාග් භෙදය කොට වචනයෙන් හෝ අධිට්ඨාන කටයුතු යි, මේ ද්විවිධ අධිෂ්ඨාන යයි.

පම්පයෙහි වූවක් නම් **"ඉමං සංඝාටිං"** කියා ද සමීපයෙහි නොවූවක් නම් **"එතං සංඝාටිං"** කියා ද උච්චාරණය කටයුත්තේය. උත්තරා සංගාදිය ද මෙසේ මය. මෙසේ අධිෂ්ඨාන කරණ ලද සිවුරු 'අනිකෙකුට දීමෙන් ද සොරු ආදීන් ගැණීමෙන් ද විශ්වාස ග්‍රාහයෙන් ද ගිහි බවට පැමිණීමෙන් ද ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙන් ද කාලක්‍රියාවෙන්ද ලිඞ්ගපරිවර්තනයෙන් ද පච්චුද්ධරණයෙන් ද සිදුරු වීමෙන් (ඉරීමෙන්) ද අධිෂ්ඨානය බිඳේ. පළමු අටවිදියෙන් සියලු ම සිවුරු අධිට්ඨානය හරිති. ඡිද්‍ර භාවයෙන් තිචීවරය පිළිබඳ අධිට්ඨානය පමණෙකි. භෙද හුලැහිල්ලේ නියපිට පමණ සිදුරකින් නමුදු අධිෂ්ඨානය බිඳේ. සිදුර ඇතුළත එක්නූලක් නමුත් නොකැඩී ඇත හොත් අධිෂ්ඨානය රැකේ. (විස්තර සමන්තපාසාදිකාවෙන් බලා ගත යුතුයි.)

**සං:- "තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං"** යි මේ දසාහ කාලය ඉක්මවන්නහුට 'නිස්සජ්ජන නැමැති විනය කර්ම්ය සහිත පචිතිය වේ ය'යි දෙශිතය. 'තං'යී චීවරය හෝ දසාහ පරම කාලය හෝ පරාමර්‍ශනය කෙරේ යයි ටීකාවෙහි දැක්වූහු.

'නිස්සජ්ජනං නිස්සග්ගියං'යී පූර්‍වභාගයෙහි කටයුතු වූ විනයකර්ම්යට 'නිස්සග්ගිය' යයි කීහු. 'නිස්සග්ගියමස්ස අත්ථීති-නිස්සග්ගියං' මෙයින් දක්වෙන්නේ 'පචිති' යයි.

යම් දවසෙක සිවුර ලැබුනේ නම් එදවස අරුණේ සිට එකොළොස්වෙනි අරුණ නැගෙන තෙක් නොයිටා විකල්පනයද නොකොට සිවුර ළඟ තබාගෙණ සිටියොත් දසදවස ඉක්මීමෙන් නිසගි වේ. (නිසගි යනු අනිකෙකුට නිස්සජ්ජනය හෙවත් පැවරීම කටයුතුය යනුයි.) මේ ආකාරයෙන් නිසගි වූ සිවුර සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ නිස්සජ්ජනය (දීම) කටයුත්තේය. **"ඉදං මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං ඉමා'හං සංඝස්ස නිස්සජාමීති"** ('ගණස්ස') කියා හෝ 'පුග්ගලස්ස' කියා හෝ සුදුසු පරිදි යොද) නිස්සජ්ජනය කොට **"අහං භන්තෙ එකං නිස්සග්ගියං පාචිත්තියං ආපන්නො, තං පටිදෙසෙමී'ති"** ඇවැත් දෙසා ගත යුත්තේය

(දෙකක් නම් 'ද්වෙ' කියා ද ඊට වැඩි නම් 'සම්බහුලා' කියා ද සුදුසු පරිදි යොද ගත යුතුයි.) සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ නිස්සජ්ජනය කළ සිවුර නිස්සජ්ජනය කළහුට ම දීම සඞ්ඝගණාදීන්ගේ යුතුකමෙකි, නුදුන හොත් දුකුළා වේ.

| | | |
|---|---|---|
| නිදානය | - | වෙසාලියයි. |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීය භික්‍ෂූහුය. |
| වස්තුව | - | අතිරෙක චීවරධාරන වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය, (නිට්ඨිත චීවරස්මිං-පෙ-පාචිත්තියං) දසාහ පරමං, යනු අනු ප්‍රඥප්තියයි. |
| ආණත්තිය | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | නිස්සජ්ජනය නොකොට පරිභොග කරන්නහුට ද, දස දිනක් නොයික්ම ගිය කල්හි ඉක්ම ගියේ යයි සිතන්නහුට ද, විමති ඇත්තහුට ද, 'දුකුළා' වෙති; ඉක්ම ගිය කල්හි නොයික්ම ගියේ යයි සිතන්නහුට ද, වෙමතිකයාට ද නිසගි පචිති' වේ. |
| අනාපත්ති | - | 'අන්තොදසාහං අධිට්ඨිතෙ, විකප්පිතෙ, විස්සජ්ජිතෙ, නට්ඨෙ, විනට්ඨෙ, දඩ්ඪෙ, අච්ඡින්නෙ, විස්සාසගහිතෙ, උම්මත්තකාදීනඤ්ච' යී කියන ලද්දවුන්ටය. |
| විපත්ති | - | ආචාර විපත්තියයි. |
| අඞ්ග | - | චීවරස්ස අත්තනො සන්තකතා, ගණනූපගතා, ජින්නපළිබොධභාවො, අතිරෙකචීවරතා, දසාහාතික්කමො'ති යී පසෙකි; |
| සමුට්ඨාන | - | කඨින සමුට්ඨාන යයි. |
| කිරියා | - | අක්‍රියායි. |
| සංඥ | - | නො සඤ්ඤා විමොක්ඛ යයි. |
| චිත්ත | - | සචිත්තකය. |
| වජ්ජ | - | පණ්ණත්ති වජ්ජය. |
| කර්‍ම | - | කායකර්‍මය, වචීකර්‍මය යි දෙකෙකි. |
| කුශලත්‍රිකය | - | කුශල, අකුශල, කුශලාකුශල යී ත්‍රි චිත්ත යි. |
| වෙදනාත්‍රිකය | - | සුඛ, දුක්ඛ, උපෙක්ඛා යි ත්‍රිවෙදනා යි. |

**පළමුවැනි නිසගි වර්‍ණනාව නිමි.**

2. නිට්ඨිත චීවරස්මිං පන භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ එකරත්තම්පි චෙ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං.

---

# නිදන කථාව

භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවරදී භික්ෂූන්ට තුන්සිවුරු අනුදන වදළසේක. එකල්හි ෂඩ්වර්ගීය භික්ෂූහු වෙන වෙන තුන්සිවුරුවලින් යුක්තව ගම් වැදීමාදිය කෙරෙති.

අලෙපච්ඡ භික්ෂූහු මෙය රුචි නො කොළෝය. එ පමණක්ද නොව භාග්‍යවතුන් වහන්සේට ද සැළ කළෝය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'යො පන භික්ඛු අතිරේකචීවරං ධාරෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං'යි අනුදන වදළ සේක.

එකල්හි ආයුෂ්මත් ආනන්‍ද ස්ථවිරයන් වහන්සේට අතිරෙක චීවරයක් උපන. උන්වහන්සේ එය ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට දෙනු කැමැති වූහ. එහෙත් උන්වහන්සේ ඒ කාලයේ සාකෙතයෙහි වෙසෙති.

ආනන්‍ද ස්ථවිරයන් වහන්සේ මෙහි දී කෙසේ පිළිපැදිය යුතුදැයි සිතා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දන්වූහ. ශාරීපුත්‍රයා කොපමණ කලකින් මෙහි පැමිණේද යි ඇසූහ. නවදවසකින් හෝ දසදවසකින් යයි කීකල්හි 'අනුජානාමි භික්ඛවෙ දසාහපරමං අතිරෙක චීවරං ධාරෙතුං'යි වදරා පළමු ශික්ෂාපදයට අනුප්‍රඥප්තියක් එක්කාසු කොට 'නිට්ඨිතචීවරස්මිං - පෙ - පාචිත්තියං'යි දෙශනාකළසේක.

---

2. **අර්ථ**:- භික්ඛුනා, භික්ෂූහුගේ; නිට්ඨිතචීවරස්මිං පන, සිවුර කොට නිමි කල්හි වනාහි; කඨිනෙ උබ්භතස්මිං, (කෙළින් සිවුර) උදුළ කල්හි; භික්ඛු, මහණ තෙමේ; චෙ, ඉදින් එකරත්තං අපි, එක රාත්‍රියකුදු; තිචීවරෙන, තුන්සිවුරෙන්; අඤ්ඤත්‍ර සංඝ සම්මුතියා, සංඝ සම්මුතියක් (සංඝයාගේ නියමයක්) නැතිව; විප්පවසෙය්‍ය, වියෝව (වෙන්ව) වෙසේනම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ.

සං:- **"නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා"යි** පළමු ශික්ෂාපදයෙහි මෙන් අර්ථ නො ගෙණ 'නිට්ඨිතචීවරස්මිං භික්ඛුනො'යි අර්ථ ගත යුතුයි. 'භික්ඛුනා' යනු ස්වාම්‍යාර්ථයෙහි කරණ වචන යි.

සං:- **"එකරත්තම්පි චෙ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍ය"** යි (එකාව රත්ති - එකරත්තං 'කච්ඡි - පෙ තෙනා' සමාසාන්තයෙහි 'අත්ව' යයි 'අපි' සද සම්භාවනාර්ථයෙහිය. තිණ්ණං චීවරානං සමාහාරො, තිචීවරං, තෙන, තිචීවරෙන.)

ජීනාවූ චීවර පළිබොධ ආවාසපළිබොධ ඇත්තාවූ භික්ෂුවක් විසින් තිචීවර නාමයෙන් ඉටූ තුන්සිවුරෙන් වෙන්ව එක අරුණක් නමුත් ගත කෙරුණි නම් නිසගි පචිති වේ.

අධිෂ්ඨාන කළ සිවුරු අත්පස තබාගෙණ ම අරුණු නැගිය යුතුයි. අත්පස නම්:- දෙරියන් භාගයක් පමණ පෙදෙසයි. අත්පස ඉක්මවා සෘඩිමත් භික්ෂුවක් අහසෙහි නමුත් අරුණු ගත කළොත් නිසගි වේමය.

සං:- **"අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා"** යී අනුප්‍රඥප්තිය යි. සඞ්ඝයා විසින් ගිලන් භික්ෂූහට ඥප්තිද්විතීය කර්මවාක්‍යයෙන් අවිප්පවාස සම්මුතිය දෙනු ලැබේ නම් එකල්හි නිසගි නොවේ. එබඳු සම්මුතියක් නැත්තෙකුට අධිෂ්ඨාන කළ තුන් සිවුරෙන් වෙන්ව අරුණ නො නැගිය හැක්කේය.

## සපත දශාකාරය.

නිදනය - සැවැත් නුවරය.

පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුය.

වස්තුව - තතිපට සිවුරය, අඳනය, යන දෙකින් යුක්ත ව ජනපද චාරිකා කිරීම් සංඛ්‍යාත වස්තුවය.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තිය යි නිට්ඨිත චීවරස්මිං - පෙ - පාචිත්තියං) 'අඤ්ඤත්‍ර භිකඛු සම්මුතියා' යනු අනු ප්‍රඥප්තියයි.

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - නොවෙන්ව විසීමෙහි වෙන්ව විසුවෙමියි සිතන්නහුට ද වෙමතිකයාට ද 'දුකුළා' වේ. වෙන්ව විසීම ඇති කල්හි එය නැතැයි යන සිත් ඇත්තහුට ද වෙමතිකයාට ද නිසගි පචිති වේ.

අනාපත්ති - අරුණට පළමු පච්චුද්ධරණය කළහුට ද ලධසම්මුතිකයාට ද, පළමු කී විස්සජ්ජනාදිය කළහුට ද අනාපත්ති වේ.

3. නිට්ඨිතචීවරස්මිං පන භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ භික්ඛුනො පනෙව අකාල චීවරං උප්පජ්ජෙය්‍ය; ආකඩ්ඛමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං, පටිග්ගහෙත්වා ඛිප්පමෙව කාරෙතබ්බං, නො චස්ස පාරිපූරි, මාසපරමං තෙන භික්ඛුනා තං චීවරං නික්ඛිපිතබ්බං ඌනස්ස පාරිපූරියා සතියා පච්චාසාය, තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය සතියාපි පච්චාසාය නිස්සග්ගියං පාචිත්තියං.

---

විපත්ති - පෙර මෙනි.

අඞ්ග - අධිට්ඨිතචීවරතා, අනත්ථතකඨිනතා, අලද්ධ සම්මුතිතා, රත්තිවිප්පවාසො' යි සතරෙකි. සමුට්ඨානාදිය පළමු සිකපදයෙහි මෙනි.

**දෙවැනි නිසඟි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

# නිදාන කථාව

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන කල්හි බොහෝ භික්ෂූහු අන්‍ය භික්ෂූන් ලඟ සිවුරු තබා උත්තරාඞ්ගය අන්තර වාසකය යන දෙකින් යුක්තව ජනපදචාරිකා කෙරෙති. මේ බැව් දත් බුදුරජානන් වහන්සේ භික්ෂූන් අමතා 'නිට්ඨිත චීවරස්මිං - පෙ - පාචිත්තියං' යි ශික්ෂාපදය අනුදන වදළසේකි.

එකල්හි කොසඹෑ නුවර එක්තරා භික්ෂුනමක් ගිලන් විය. උන්වහන්සේගේ ඤාතීහු උපස්ථාන කිරීම සඳහා වැඩමවා ගෙණ එන්ට යයි දූතයෙකු යැවූහ. භාග්‍යවතුන් වහන්සේ තිචීවරයෙන් වෙන්ව අරුණ නො නගන ලෙස අනුදන වදළ සේක. මම ගිලන් වෙමියි කීයේය. මේ බැව් දත් භාග්‍යවතුන් වහන්සේ 'අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස භික්ඛුනො තිචීවරෙන අවිප්පවාසසම්මුතිං දතුං' යි වදරා අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා' යි අනුප්‍රඥප්තිය අනුදැන වදළසේකි.

---

3. **අර්ථ**:- භික්ඛුනා පන, භික්ෂුවගේ වනාහි; නිට්ඨිත චීවරස්මිං, සිවුර කොට නිමි කල්හි; කඨිනෙ උබ්භතස්මිං, කෙළින් උදුළ කල්හි; භික්ඛුනො එව පන, භික්ෂූහට ම වනාහි; අකාලචීවර; නො කල් සිවුරක්; උප්පජ්ජෙය්‍ය, උපන්නේ නම් (ලැබුනේ නම්) ආකඩ්ඛමානෙන භික්ඛුනා, කැමැතිවන්නා වූ භික්ෂුව විසින්; පටිග්ගහෙතබ්බං, පිළිගත යුතුයි. පටිග්ගහෙත්වා, පිළිගෙණ; ඛිප්පං එව, වහාම; කාරෙතබ්බං, කරවිය යුතුයි.

වෙ, ඉදින්, පාරිපූරී නො අස්ස, සම්පූර්ණ භාවය නො වී නම් (නො සෑහේ නම්); තෙන භික්ඛුනා, ඒ භික්ෂුහු විසින්; ඌනස්ස පාරිපූරියා, ඌන පූරණය (අඩුව සම්පූර්ණ කිරීම) පිණිස: සතියා පච්චාසාය, (සිවුරක් ලබමියි යන ආසාවක් ඇති කල්හි; තං චීවරං, ඒ සිවුර: මාස පරමං, මසක් පරම කොට ඇති කාලයක්; නික්ඛිපිතබ්බං, නොයිටා නො විකපා තැබිය යුතුයි.

පච්චාසාය සතියා අපි, චීවරාසාවක් ඇති කල්හි ද, තතො උත්තරිං, ඒ මාසපරම කාලයෙන් මත්තෙහි; වෙ, ඉදින්: නික්ඛිපෙය්‍ය, තබා නම්, නිස්සග්ගියං පාචිත්තියං නිසගි පචිති වේ.

**සං - "අකාල චීවරං උප්පජ්ජෙය්‍ය"යි** (චීවරකාලතො අඤ්ඤො - අකාලො; අකාලෙ උප්පන්නං චීවරං - අකාල චීවරං;) පිටිසමයේ ලැබුනු සිවුරට නමෙකි.

කෙළින් නො අතුළ කල්හි වස්සාන ඍතුවගේ අන්තිම මාසය ද, කෙළින් අතුළ කල්හි පශ්චිම කාර්තික මාසයත් හෙමන්ත ඍතුවෙ සාරමසත් දයි යන පස්මාසය ද චීවර කාලයයි.

කඨිනයක් නො අතුළ කල්හි චීවර මාසය හැර සෙසු එකොළොස් මාසයේත් අතුළ කල්හි චීවර මාසය සහ හෙමන්ත ඍතුවේ සාරමාසය ත් හැර සෙසු සත්මාසයේත් ලැබුනු සිවුරු අකාල චීවර යි.

චීවර කාලයේ නමුත් මේ අකාලචීවරය ඉවසන සේක්වායි සඞ්ඝයාට හෝ මේ අකාල සිවුර නුඹ වහන්සේට දෙමියි කියා පුද්ගලයෙකුට හෝ යම් කිසිවෙකු විසින් දෙන ලද්ද 'අකාල චීවර' යයි.

සඞ්ඝයාගෙන් හෝ ගණයාගෙන් හෝ ඥාතීන්ගෙන් හෝ මිත්‍රයෙකුගෙන් හෝ පාංශුකූලයක් හෝ ස්වකීය ධනයෙන් හෝ යම් කිසි ආකාරයකින් ලැබීමට 'උප්පජ්ජෙය්‍ය'යි දක්වූහ.

'අට්ඨිමා භික්ඛවෙ මාතිකා චීවරස්ස උප්පාදය - සීමාය දෙති, කතිකාය දෙති, භික්ඛා පඤ්ඤත්තියා දෙති, සඞ්ඝස්ස දෙති, උභතො සඞ්ඝස්ස දෙති, වස්සංවුත්ථ සඞ්ඝස්ස දෙති, ආදිස්ස දෙති, පුග්ගලස්ස දෙති'යි චීවරුප්පාදය පිළිබඳ මාතෘකා දක්වූහ. විස්තර අටුවාවෙන් බැලිය යුතුයි.

**සං:- "ඛිප්පමෙව කාරෙතබ්බං"යි** දසදවස ඇතුළත දී ම කරවිය යුතු බැව් දක්වේ.

**සං:- "නොවඤ්ඤපාරිපූරිං"** යි (පරිපූරණං - පාරිපූරී: ආදි වෘඩියයි) සම්පූර්ණ භාවය නොවේ නම් යනුයි. යම් පමණකින් කළ සිවුරක් අධිෂ්ඨානයට පොහොනේ වේද, එපමණ නොවේ යනු යි.

**සං: "සතියා පච්චාසාය"** යි මතු බලාපොරොත්තු ඇති කල්හිය යනුයි. අසවල් දවසෙහි සංඝයාගෙන් සිවුරක් ලැබේ යයි කියා හෝ ගණ ඤාති මිත්‍රාදීන්ගෙන් ලැබේය කියා හෝ පාංශු කූලයක් ලැබේය කියා හෝ කප්පිය භාණ්ඩයක් දී සිවුරක් ගන්නෙමියි කියා හෝ ආශාවක් අදහසක් ඇති කල්හි මසක් පමණ කල් ළඟ තබා ගත හැකි වේ. ආශාව ඇතත් ඉන් වැඩිය තබාගත හොත් තිසඟි පචිති වේ.

**සප්තදශාකාරය.**

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුය.

වස්තුව - නොකල් සිවුරක් පිළිගෙණ මසක් ඉක්මවීම් සංඛ්‍යාත වස්තුවයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි. (නිට්ඨිත-පෙ-පාචිත්තියං)

ආණත්තිය - අනාණත්තික යි.

සෙසු විස්තර මෙතැන් පටන් පඨම කඨිනයෙහි මෙනි. එහි දශාතික්‍රමණය වෙනුවට මෙහි මාසාතික්‍රමණය වේ.

**තෘතිය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

## නිදන කථාව

එක්තරා භික්ෂුවක්හට නොකල් සිවුරක් ලැබුනේය. එහෙත් එය සිවුරට පමණ නොවේ. ඒ භික්ෂුව ද ඒ සිවුර වතුර ඉස රැලි ගැසුන තැන් නැවත නැවත දිග හරියි. ඒ දුටු භාග්‍යවතුන් වහන්සේ මේ කිමදැයි? විචාරා "අනුජානාමි භික්ඛවෙ අකාලචීවරං පටිග්ගහෙත්වා චීවරපච්චාසාය නික්ඛිපිතුන්ති" දෙශනා කළ සේක.

4 යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණ චීවරං ධොවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා ආකොටාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියං.

---

එවිට භික්ෂූහු නොකල් සිවුරු පිළිගෙණ මසකට වැඩි කාලයක් තැබූහ. ඒ දුටු ආනන්ද ස්ථවිරයන් වහන්සේ කරුණු පිළිවිස භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ "නිට්ඨිතචීවරස්මිං-පෙ- නිස්සග්ගියං පාචිත්තියං"යී ශික්ෂා පදය පණවා වදාළ සේක.

---

4 **අර්ථ** - යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහී; අඤ්ඤාතිකාය භික්ඛුනියා, නොනෑ මෙහෙනක ලවා; පුරාණ චීවරං (මදකුදු වැළඳ ගැන්මෙන්) පැරණිවූ සිවුරක්; ධොවාපෙය්‍ය වා, හෝදවා නම් හෝ; රජාපෙය්‍ය වා, රඳන් කරවා නම් (පඬුපොවවා නම්) හෝ; ආකොටාපෙය්‍ය වා, ශිලාමය වූ හෝ දරුමය වූ හෝ පුවරු ආදියෙක) ගස්සවා නම් හෝ; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ;

සං:- **"අඤ්ඤාතිකාය භික්ඛුනියා"**යී අම්හාකමෙව ඤායතීති, ඤාති, ඤාති එව, ඤාතිකා: න ඤාතිකා, අඤ්ඤාතිකා; තාය, අඤ්ඤාතිකාය); මෙහි දක්වෙන "අඤ්ඤාතික භික්ෂුණිය" නම්, සත්මුතු පරම්පරාවේ සිට මවු පසින් හෝ පිය පසින් නොනෑවූ උපසපන් භික්ෂුණිය යි;

ඤාති සම්බන්ධය දක්වන්නාවූ අටුවාචාර්‍ය්‍යයෝ **"යාව සත්තමයුගන්ති"**යී දක්වූහ. මෙය විස්තර කරන්නා වූ ටීකාචාර්‍ය්‍යයෝ **"යාව සත්තම යුගන්ති "යාව සත්තමස්ස පුරිසස්ස සත්තමාය වා ඉත්ථියා ආයුප්පමාණං"** යී කීහු. එබැවින් පිතාමහයුගය, පිතාමහීයුගය, මාතාමහයුගය, මතාමහීයුගය යයි දක්වන ලද යුග චතුෂ්කය හා භ්‍රාතෘ භගින්‍යාදී ක්‍රමයෙන් කිසියම් ආකාරයෙකින් සම්බන්ධ නො වූ ශුද්ධ වූ භික්ෂු සඞ්ඝයා කෙරෙහි හෝ උභතො සංඝයා කෙරෙහි හෝ ඤප්ති චතුර්ථ කර්මයෙන් උපසපන් භික්ෂුණිය මෙයින් දක්වති.

සං:- **"පුරාණ චීවරං"** යී පුරාණ චීවරය නම්, පඬු පොවා කප් බින්දු තබා එක්වරක් නමුත් හදින ලද්දවූ හෝ පොරෝණා ලද්දවූ හෝ චීවරයෙකි;

යටත් පිරිසෙයින් යම්කිසි සිවුරක් පරිභොග ශිෂ්යෙන් කරෙහි (අංසයෙහි) ලා ගත්තේ නමුදු හිසෙහි ලා ගත්තේ නමුදු බිම්බොහනය (කොට්ටය) වෙනුවට හිසට තබාගෙණ සයනය කෙළේ නමුදු මෙහි දී පැරණි සංඛ්‍යාවෙහි ලා ගනු ලැබේ.

එහෙත් යම් සිවුරක් කයට ස්පර්ශ නොවන සේ පච්චත්ථරණයට (ඇතිරිල්ලට) යට කොට තබා ගෙණ සයනය කළත් එසේ ම හිස තැබුවත් හිස නොතැවරෙණ සේ වියනක් වශයෙන් බැන්දත් මෙහි පැරණි සංඛ්‍යාවට නොයෙයි.

සං:- **"ධොවාපෙය්‍ය"** යී පෙරකී පරිදි පරිභොගයෙන් පැරණි වූ සිවුරක් නො නෑ වූ මෙහෙණක් ලවා සේද වූ වත් සෝදන්ට යයි වදනින් කීවත් කායවිකාරයෙන් හැඟවුවත් අතින් ගෙණ ඇගේ අතෙහි තැබුවත් පාමුල තැබුවත් දෙළොස්රියනක් ඇතුළත සිටගෙණ ඇ ලහට විසිකළත් අතිකෙකු අත පිටත් කළත් යන මේ කවර ආකාරයකින් නමුත් ඇට ලැබුන සිවුර සේදුව හොත් නිසගි පචිතියෙන් නො මිදෙයි. "රජාපන ආකොටාපන" දෙක ද මෙම නයින් ම සැලකිය යුතුයි.

**"ඉදං මෙ භන්තෙ පුරාණ චීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා ධොවාපිතං නිස්සග්ගියං, ඉමාහං චීවරං සංඝස්ස නිස්සජාමී"යි නිස්සජනය කටයුතුයි.**

## සප්තදශාකාරය

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයා - උදායී තෙරණුවෝය.

වස්තුව - පුරාණ චීවර ධොවාපනය යි.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තියයි. (යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා - පෙ - නිස්සග්ගියං පාචිත්තියං)

ආණත්තිය - සාණත්තිකය.

ආපත්ති - උඩන සජ්ජනාදී සියලු ප්‍රයොගයන්හි "දුකුළා ව" ද ධොවනය කොට එසවූ කෙණෙ ද, රදත් කොට අවසන් කෙණෙහි ද, ආකොටිත කෙණෙ හි ද, "නිසගිපචිති"වේ; ධොවනාදී ක්‍රියාත්‍රයම හෝ දෙකක් හෝ කරවන්නහුට එකකින් "නිසගිය"ද, සෙස්සන්ගෙන් දුකුළා"ද, වෙති.

මේ සිවුරෙහි කටයුතු කරවයි කියන්නහුට 'පච්තිය සමග 'දුකුළා' වෙයි. මේ ආදි වශයෙනි.

අනාපත්ති - නෑවූ මෙහෙණගේ සහාය මෙහෙණක් ධොවනා දිය කෙරේ ද, නො අණවා හෝ අපරිභොග සිවුරක් හෝ අන්‍ය පරිෂ්කාරයක් හෝ ධොවනා දිය කෙරේ ද, සික්ඛමානාදීහු ධොවනාදිය කෙරෙත් ද, මේ සියලු තන්හි අනාපත්ති වේ. උම්මත්තකාදීන්ට ද අනාපත්ති වේ;

විපත්ති - පෙර මෙනි.

අඞ්ග - පුරාණ චීවරතා, උපචාරෙ ඨත්වා අඤ්ඤාතිකාය භික්ඛුනියා ආණාපනං, තස්ස ධොවනාදී යී තුණෙකි.

සමුට්ඨාන - සඤ්චරිත්ත සමුට්ඨාන යි.

කිරිය - ක්‍රියා වශයෙනි.

සඤ්ඤා - නො සඤ්ඤා විමොක්ඛ යයි.

චිත්ත - සචිත්තක යි.

වජ්ජ - පණ්ණත්තිවජ්ජ යි.

කම්ම - කායකම්, වචීකම්, දෙකය.

කුශලත්‍රිකය - තිචිත්ත යි.

වෙදනාත්‍රිකය - තිවෙදන යි.

**චතුර්ථ ශික්ෂාපද වර්‍ණනාව නිමි**

---

# නිදාන කතාව

එක් සමයෙක්හි උදායී තෙරුන්ගේ පුරාණ දුතියිකා තොමෝ භික්ෂුණීන් කෙරෙහි මහණ වූවාය. ඕ උදායී තෙරුන්වහන්සේ සමීපයට නිතර යෙයි. තෙරණුවෝ ඈ හමුවීමට නිතර යෙති.

එක් දිනක් උදායී තෙරණුවෝ මෙහෙණ ඉදිරියෙහි අඞ්ග ජාතය පෙණෙන පරිදි අස්නෙහි වාඩි වූහ. ඕ ද එසේ හිඳගත්තීය.

5. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගණ්හෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා නිස්සග්ගියං පාචිත්තියං.

---

උදායී තෙරණුවෝ ඇගේ අඞ්ගජාතය රාග සිතින් බලා හිඳිනා විට අසූචි පහ විය. එකල්හි අනතර වාසකය ධොවනය කරණු වස් ගෙණ ඒ අසූචිවලින් කොටසක් මුඛයෙන් ගත්තීය. කොටසක් ඇගේ අඞ්ගජාතයෙහි බහාලීය. එයින් ඈ ගැබ් ගත්තීය.

භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ නිමිත්ත කොට ගෙණ 'යො පන භික්ඛු - පෙ - නිස්සග්ගියං පාචිත්තියං' යී ශික්‍ෂා පදය පණවා වදාළ සේක.

---

**අර්:**- යො පන භික්ඛු, යම් මහණෙක් තෙමේ වනාහි; අඤ්ඤාතිකාය භික්ඛුනියා, නොනෑ මෙහෙණකගේ; හත්ථතො, අතින්; චීවරං, (විකප්පනයට යොග්‍ය වූ) සිවුරක්; පාරිවට්ටකා අඤ්ඤත්‍ර, (යටත් පිරිසෙයින් අරළු කඩකුදු දී) මාරුකර ගැණීමක් නැතිව; පටිග්ගණ්හෙය්‍ය, පිළිගණී නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

**සං:**- **"අඤ්ඤාතිකාය"** පෙරකී සේයි.

**සං:**- **"චීවරං"** යී මෙයින් විකල්පනයට පහෝනා ඛොමාදී ෂඩ්විධ චීවරයන්ගෙන් එක්තරා එකක් දක් වේ. (ෂඩ්විධ චීවරය පෙර දක්වීමු.) මෙයින් මතු සිවුරු පිළිබඳ සිකපදයන්හි විසෙසයක් නැති තැන විස්තර නොලියන්නෙමු.

**සං:**- **"පටිග්ගණ්හෙය්‍ය"** යී සිතින් හෝ කයින් හෝ පිළිගැණීම දක්වේ. නොනෑ වූ යම්කිසි මෙහෙණක් තොමෝ චීවරයක් මහණෙකුගේ අතෙහි තබයි ද නැත හොත් පාමුල තබයි ද බණ දෙශනා කරන්නාවූ භික්‍ෂුහට පූජාවශයෙන් ආහරණ වස්ත්‍රාදිය පාමුල තබන කල්හි උපචාරය ඉක්මවා උඩින් හෝ ඒ දිශාවට විසිකරයි ද එබඳු වූවක් ඉවසූ කෙණෙහි ප්‍රතිග්‍රහණය සිදු වේ. මෙයින් නිසගි පචිතිය වේ.

සාමණේරාදීන්ගේ අතෙහි යවනලද්දක් හෝ සංකාර කූටාදීන්හි වූවක් පාංශුකූල සංඥවෙන් ගන්නෙකුට හෝ ඇවත සිදු නො වේ.

**සං:**- **"අඤ්ඤත්‍ර පාරිවට්ටකා"** යී (පරිවත්තෙතබ්බං; පරිවට්ටං, පරිවට්ටමෙව, පාරිවට්ටකං) පාරිවට්ටකය නම් මාරුකිරීමයි.

අන්තිම පරිච්ඡේදයෙන් අරළු කඩක් නමුත් ඒ වෙනුවට නො දී පසුව දෙන්නෙමි යි බලාපොරොත්තුවක් නැතුව හෝ විකප්පනය කිරීමට සෑහෙන පට පෙරහනක් නමුත් නොනෑ භික්ෂුණියකගෙන් ප්‍රතිග්‍රහණය කරන්නා වූ භික්ෂුහුගේ ඒ ගත් චීවරාදිය නිසගි වේ **"ඉදං මෙ භන්තෙ චීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො පටිග්ගහිතං අඤ්ඤත්‍ර පාරිවට්ටකා නිස්සග්ගියං"** යි නිස්සජනය කොට ආපත්තිය දෙශනා කරගත යුතු.

**සප්තදශාකාරය.**

නිදානය - රජගහනුවරයි

පුද්ගලයා - උදායි තෙරණුවෝයි.

වස්තුව - චීවර පටිග්ගහණ සංඛ්‍යාත වස්තුවයි.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්ති යයි.
(අඤ්ඤත්‍ර පාරිවට්ටකා යනු අනුප්‍රඥප්ති යයි. යො පන භික්ඛු-පෙ-නිස්සග්ගියං පාචිත්තියං

ආණත්තිය - අනාණත්තික යි.

ආපත්ති - ගැණීම පිණිස අත දිගුකිරීමාදී ප්‍රයොගයන්හි 'දුකුළා' ද ගත්කල්හි නිසගිය' ද වෙති. අඤ්ඤාතිකාය ඤාතිකසඤ්ඤී වෙමතික අඤ්ඤාතික සඤ්ඤීන්ගේ වශයෙන් පචිති තුණෙකි. එය 'තික පාචිත්ති' නම් වේ. ඤාතී වූ භික්ෂුණිය නොනෑයයි සිතන්නහුටද වෙමතිකයාටද 'දුකුළා' යි.

අනාපත්ති - 'විස්සාසගාහෙ, තාවකාලිකෙ, පත්තත්ථවිකාදිම්හි ච, අනධිට්ඨාතබ්බපරික්ඛාරෙ, සික්ඛමාන සාමණෙරාදීනං හත්ථතො ගහණෙ, උම්මත්තකාදීනඤ්ච' යි දක්වෙන්නන්ට ඇවැත්නොවේ.

විපත්ති - පෙර මෙනි.

අඞ්ග - විකප්පනුපගචීවරතා, පාරිවට්ටකාභාවො, අඤ්ඤාතිකාය හත්ථතො ගහණං යී තුණෙකි.

සමුට්ඨාන - ඡඋච්චාරිත්ත සමුට්ඨාන යි.

කිරියා - ක්‍රියා අක්‍රියා දෙකෙකි.
සෙස්ස සතර වැන්නේ මෙනි.

**පස්වැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

6. යො පන භික්ඛු අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙය්‍ය අඤ්ඤත්‍ර සමයා නිස්සග්ගියං පාචිත්තියං.

තත්ථා'යං සමයො, අච්ඡින්නචීවරො වා හොති භික්ඛු නට්ඨ චීවරො වා: අයං තත්ථ සමයො.

---

# නිදාන කථාව

උප්පලවණ්ණා භික්ෂුණී තොමෝ එක්දිනකැ අන්ධවනයෙහි දිවා විහරණය කළාය. එකල්හි සොරමුළක් සොරබඩුත් රැගෙණ එහි ගියේය. සොරදෙටුතෙම භික්ෂුණිය දුරදීම දැක මාගේ පුත්‍රාදීහු මැට හිංසා කෙරෙත් යයි සිතා වෙන මගකින් ගියේය. නැවත තමන් උදෙසා පිසන ලද මාංසයෙන් කොටසක් මූලක් බැඳ භික්ෂුණිය සමීපයෙහි ගසක එල්ලා දුටුකෙණෙක් ගණිත්වායි කියා ගියේය. ඒ මංසයත් රැගෙණ භික්ෂුණිය වෙළුවනයට ගියාය. භාග්‍යවතුන්වහන්සේට පිළිගන්වන්ට යයි මස්කොටස උදයී තෙරුන්ට දුන් කල්හි උදයී තෙරණුවෝ ඇගේ අන්තරවාසකය ඇයදූහ. නොකැමැත්තෙන් නමුදු එය දුන්නීය. ඒ බැව් දනගත් තථාගතයන්වහන්සේ 'යො පන භික්ඛු - පෙ - නිස්සග්ගියං පාචිත්තියං'යි ශික්ෂා පදය පණවා වදළසේක.

නැවත පාරිවට්ටක චීවර නො පිළිගන්නා භික්ෂූන්ගේ කුකුස කරුණු කොට ගෙන 'අඤ්ඤත්‍ර පාරිවට්ටකා'යි අනුප්‍රඥප්තිය පණවා වදළසේක.

---

6. අර්ථ:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙමේ වනාහි, අඤ්ඤාතකං, නොනෑවූ; ගහපතිං වා, ගැහැවියෙකු හෝ; ගහපතානිං වා, ගෘහපතිනියක හෝ; සමයා අඤ්ඤත්‍ර, (සුදුසු) කාලය හැර; චීවරං, (විකපුන් පොහෝනා) සිවුරක්; විඤ්ඤාපෙය්‍ය, ඉල්වා ගණී නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

තත්ථ, ඒ සිවුරු විඤ්ඤාපනයෙහි; අයං සමයො. මේ (සුදුසු) කාලයයි, (එනම්) භික්ඛු, මහණ තෙමේ; අච්ඡින්නචීවරො වා, සොරුන් විසින් පැහැර ගන්නා ලද සිවුරු ඇත්තේ හෝ; හොති, වේ ද; නට්ඨ චීවරො වා නටුවාවූ (විනාශවූ) සිවුරු ඇත්තේ හෝ වේ ද; අයං, මේ, තත්ථ, එහි; සමයො, කාලයයි.

**සංලක්ෂ්‍යය - "ගහපති"යි** (ගහස්ස පති=ගහපති: තං ගහපතිං) 'ගෘහපතියා' නම් භික්ෂූන් සමීපයෙහි පැවිදි නොවූ කිසියම් මනුෂ්‍යයෙකි. 'ගහපතානිං' යනු එසේම භික්ෂුණීන් කෙරෙහි පැවිදි නොවූ ස්ත්‍රියකි.

**සං-"විඤ්ඤාපෙය්‍ය"** යි මෙහි විඥප්තිය නම්:- තමන් උදෙසා යාචනය (ඉල්ලීම්) යාචාපනය (ඉල්ලවීම) යන දෙයාකාරයෙන්ම සිදු වේ.

**සං- "අඤ්ඤත්‍ර සමයා"** චීවර සම්බන්ධ විඥප්තියට සුදුසු කාලය දක්වේ. ඒ මෙසේයි. යම්කිසි භික්ෂුවක්හුගේ හෝ භික්ෂුණියකගේ සිවුරු රාජ චොරාදීන් විසින් පැහැර ගන්නා ලද්දහුවෙද්ද. නැතහොත් ගිනි දිය ආදී කිසියම් උවදුරකින් නැසුනාහු වෙද්ද, මෙසේ කිසියම් ආකාරයකින් සිවුරු විනාශ වූ කල්හි භික්ෂුහට හෝ භික්ෂුණියට සිවුරු ඉල්ලා ගැණීමත් කිසිවෙකු ලවා ඉල්ලවා ගැන්මත් කළහැකි වේ. ඉන් පිට සමයෙකැ විඤ්ඤාපනයෙන් 'දුකුළා' වත්, ලැබගත් කල්හි නිසගියත් වෙති; **"ඉදං මෙ භන්තෙ චීවරං අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිංවා අඤ්ඤත්‍ර සමයා විඤ්ඤාපිතං නිස්සග්ගියං"යි** නිස්සජනය කොට ඇවැත් දෙශනා කළ යුතුයි.

### සපනදශාකාරය

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයා | - | උපනන්ද තෙරණුවෝය. |
| වස්තුව | - | චීවර විඤ්ඤාපන සංඛ්‍යාත වස්තුවයි. |
| ප්‍රඥප්ති | - | සාධාරණ ප්‍රඥප්තියයි. 'අඤ්ඤත්‍ර සමයා' අනුප්‍රඥප්ති යයි. (යො පන භික්ඛු-පෙ-අයං තත්‍ථසමයො) |
| ආණත්තිය | - | අනාණත්තික යි. |
| ආපත්ති | - | තිකපාචිත්තියයි; නෑ භික්ෂුණිය නො නෑ යයි හඟින්න හුට ද; වෙමතිකයාටද 'දුකුළා' වෙති. |
| අනාපත්ති | - | 'සමයෙ වා, ඤාතක පවාරිතෙ වා විඤ්ඤාපෙන්තස්ස, අඤ්ඤස්ස වා ඤාතකපවාරිතෙ, තසෙසවත්‍ථාය |

විඤ්ඤපෙන්තස්ස, අත්තනො ධනෙන ගණ්හන්තස්ස, උම්මත්ත කාදීනඤ්චා'යි කියන ලද්දවුන්ටයි.

විපත්ති - කීසේ යි.

අඞ්ග - විකප්පනුපගචීවරතා, සමයාභාවො, අඤ්ඤාතක විඤ්ඤත්ති, තාය ච පටිලාභො' යි සතරෙකි. (සමුට්ඨානාදිය පෙර සේයි.)

**සවැනි ශික්ෂාපද වණ්නාව නිමි**.

---

# තිදන කථාව

ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙමේ සමථි ධම්කථිකයෙකි. උන්වහන්සේගේ ධම්දෙශනාවට ප්‍රසන්න වූ එක්තරා සිටු පුත්‍රයෙක් ස්වාමීන් වහන්සේට සිවුපසයෙන් යමක් කමක් උවමනා නම් මට දන්වන්ට යයි පැවරුයේය. උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේත් එසේ නම් මේ සළු දෙකෙන් එකක් දෙවයි කීය. මෙයින් එකක් දී එක සළුවෙන් යුක්තව ගෙට නොයා හැකි බැවින් ගෙදර ගොසින් එවන්නෙමියි කීය.

සළුව පමාවූයෙන් නැවත නැවතත් ඉල්ලීය. එකල්හි තමන්ගේ සළුවලින් එකක් දී සිටු පුත්තෙමේ ගෙට ගියේය. මේ බැව් දත් මනුෂ්‍යයෝ භික්ෂූන්ගේ නුගුණ කියන්නට වූහ. මේ කරුණෙහි ලා මේ ශික්ෂාපදය වදරණ ලදී.

එකල්හි දීඝ මාගීය ට ප්‍රතිපන්න භික්ෂූන්ගේ සිවුරු සොරු පැහැර ගත්හ. චීවර විඥපනය නොකටයුතු බැවින් භික්ෂූහු නග්නව ගොසින් බුදුන් වැන්දහුය. මේ කරුණෙහි ලා අනුප්‍රඥප්තිය සහිත ශික්ෂාපදය පණවා වදරණ ලදී.

---

7. තඤ්චෙ අඤ්ඤාතකො ගහපති වා ගහපතානී වා බහූහි චීවරෙහි අභිහට්ඨුං පවාරෙය්‍ය. සන්තරුත්තරපරමන්තෙන භික්ඛුනා තතො චීවරං සාදිතබ්බං, තතො චෙ උත්තරිං සාදියෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

---

7. **අර්ථ**- අඤ්ඤාතකො, නො නෑ වූ; ගහපති වා, ගෘහ පතියෙක් හෝ; ගහපතානී වා, ගෘහපත්නියක් හෝ; තං, ඒ (අච්ඡින්නචීනෂ්ට) සිවුරු ඇති භික්ෂුව කරා; අභිහට්ඨුං, (කයින් වචනයෙන්) එලවූ; බහූහි චීවරෙහි, බොහෝ සිවුරුවලින්; චෙ, ඉදින්; පවාරෙය්‍ය, පවරා නම්; තෙන භික්ඛුනා, ඒ භික්ෂූහු විසින්; තතො, ඒ එලවූ සිවුරුවලින්; සන්තරුත්තරපරමං, අඳනය හා පොරෝණය (තනිපට සිවුර) පරම කොට ඇති; චීවරං, සිවුරක්; සාදිතබ්බං, ඉවසිය යුතුයි. තතො, එයින්; උත්තරිං, වැඩියක්; චෙ, ඉදින්; සාදියෙය්‍ය, ඉවසා නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගිපචිති වේ.

**සංලක්ෂ්‍යය** - **"අභිහට්ඨුං"** යි (අභිඋපසර්ගය පූර්වවූ 'හර' හරණෙ යන ධාතුව යි. 'ත්වා' ප්‍රත්‍යයට 'ට්ඨුං' ආදෙශය හා ධාත්වන්ත ලොපය කොට බින්දු ආගමය කොට සිද්ධ නෛපාතික ක්‍රියාවෙකි.) 'අභිහට්ඨුං පවාරෙය්‍ය' යනු ගන්ට කැමැති කරවා පැවරීමයි. ගෘහපති ආදී කිසිවෙකු විසින් සිවුරු රාශියක් ගෙණැවිත් ඉදිරියේ තබා කැමති පමණක් ගන්ට යයි කයින් හෝ අපගේ සළු ගබඩාවෙන් කැමති පමණක් ගන්ට යයි වචනයෙන් හෝ නිමන්ත්‍රණය කොට ඒ පිණිස කැමැති කරවා ගැන්මයි.

**සං:**- **"සන්තරුත්තරපරමං"** යි අන්තරෙන සහිතං සන්තරං. සන්තරං උත්තරං පරමං අස්සාති; සන්තරුත්තරපරමං) තග්ගුණ සංවිඤ්ඤාණ බහුබ්බීහි යයි)

උත්කෘෂ්ට පරිච්ඡෙදයෙන් ම අඳනය සහිත පාරුපණය මෙයින් කිය වේ.

**සං:**- **"තතො චීවරං සාදිතබ්බ"** එයින් චීවරය ඉවසිය යුතු බැව් කියයි. ඒ ඉවසන අයුරු මෙසේයි.

යම් භික්ෂුවක්හුගේ අධිෂ්ඨාන කළ තුන් සිවුරම නැති වූයේ නම් ඔහු විසින් සිවුරු දෙකක් ඉවසිය යුතුයි. එකක් ඇඳගෙණ අනික පොරවාගෙන ඉතිරි සිවුර සභාග තැනකින් යෙවිය යුතුයි. දෙකක් නැතිවී නම් එකක් ගත යුතුයි. යමෙක් ස්වභාවයෙන් ම අඳනය හා තනිපට සිවුරෙන් යුක්තව හැසිරෙයිද, ඔහු විසින් දෙකක් ගත යුත්තාහ. යමෙකුගේ සිවුරු තුණෙන් එකක් නැති වූයේ නම් එකක් වත් නොගත යුතුයි. යමෙකුගේ දෙකෙන් එකක් නැතිවුවහොත් එකක් ගත යුතුයි. යමෙකුට එකක් තිබී එයත් නටුයේ නම් දෙකක් ගත යුතුය.

භික්ෂුණීන්ගේ පසම නටුවා වූ කල්හි දෙකක් ගතයුත්තාහ, සතරක් නැසුනු කල්හි එකක් ගතයුතුය. එකක් දෙකක් තුණක් නැතිවූ පමණකින් මේ ආකාර සිවුරු නො ගත යුත්තාහ. මෙහි දක්වෙන ප්‍රමාණය ඉක්මවා සිවුරු ඉල්ලුව හොත් දුකුළා වද, ගත හොත් නිසගිය ද වේ.

**"ඉදං මෙ භන්තෙ චීවරං අඤ්ඤාතකං ගහපතිං තතුත්තරිං විඤ්ඤාපිතං නිස්සග්ගිය"** න්ති මෙසේ නිස්සජනය කට යුතුයි.

## සප්තදශාකාරය.

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීය භික්ෂුහුය. |
| වස්තුව | - | බොහෝ චීවර විඤ්ඤාපනය කිරීම් සංඛ්‍යාත වස්තුවයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ පඤ්ඤත්තියයි. (තසෙඩ-පෙ- පාචිත්තියං) |
| ආණත්තිය | - | අනාණත්තිකයි. |
| ආපත්ති | - | තිකපාචිත්ති යයි. නෑයා නොනෑ යයි ගහිත්නහුට ද වෙමතිකයාට ද 'දුකුළා' වේ. |
| අනාපත්ති | - | සිවුරුදෙකක් කොට සෙස්ස ආහරණය කරන්නෙමියි කියා ගන්නහුටද, සෙස්ස නුඹටම වේවායි කියන්නාහට ද, අච්ඡින්නනටධ කාරණයෙන් වෙනස්ව දෙන ලද්ද ගන්නහුට ද, ඤාතිපවාරිතයක් විඤ්ඤාපනය කරන්නහුට ද, ස්වකීය ධනයෙන් ගන්නහුට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවෙයි. |
| අඩග | - | තතුත්තරිතා, අච්ඡින්නාදිකාරණතා, අඤ්ඤාතක විඤ්ඤත්ති, තාය ච පටිලාභො, යි සතරෙකි. |

සමුට්ඨානාදිය-සතර වැන්නෙහි මෙනි.

**සත්වැනි නිසගි පචිති වණිනාව නිමි.**

8 භික්ඛුං පනෙව උද්දිස්ස අඤ්ඤාතකස්ස ගහපතිස්ස වා ගහපතානියා වා චීවරචෙතාපනන්නං උපක්ඛටං හොති ඉමිනා චීවර චෙතාපනෙනන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙන අච්ඡාදෙස්සාමීති, තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය, සාධු වත මං ආයස්මා ඉමිනා චීවර චෙතාපනෙනන එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙහීති කල්‍යාණකම්‍යතං උපාදය, නිස්සග්ගියං පාචිත්තියං.

---

# නිදාන කථාව

එක්කලෙක ෂඩ්වර්ගීය භික්ෂූහු නටුවා වූ සිවුරු ඇති භික්ෂූන් කරා එලඹ මෙසේ කියත්. කෙසේ ද, ඇවැත්නි! භාග්‍යවතුන්වහන්සේ විසින් අචිණ්ණ චීවරිකයාට ද නොනෑ ගැහැවි ආදීන්ගෙන් චීවර විඤ්ඤාපනය අනු දන්නා ලදී. සිවුරු විඤ්ඤාපනය කරවී නැත හොත් අපි තොප වෙනුවෙන් විඤ්ඤාපනය කරන්නෙමුයි කැමැති කරවාගෙණ බොහෝ ගැහැවියන් කරා එලඹ සිවුරු ඉල්ලූහ. පසුව "අච්ඡින්නචීවරික භික්ෂූහු ආවාහුය. අපට සිවුරු දෙව්" යයි කීහ. අච්ඡින්නචීවරික භික්ෂූන්ට අපි සිවුරු දුන්නෙමුයි බොහෝ දෙනා කීහ. එපමණක් ද නො වේ. භික්ෂූන්ට ගරහන්නට ද වූහ.

මේ කරුණු නිමිත්ත කොට ගෙණ මේ ශික්ෂාපදය පණවා වදරණ ලදී.

---

8. අර්ථ:- භික්ඛුං එව පන, භික්ෂුවක් ම වනාහි; උද්දිස්ස, උදෙසා; අඤ්ඤාතකස්ස, නොනෑවූ; ගහපතිස්ස වා, ගෘහපතියෙකු විසින් හෝ; ගහපතානියා වා, ගෘහපතිනියක් විසින් හෝ: ඉමිනා චීවර චෙතාපනෙනන, මේ සිවුරුමිලයෙන්; චීවරං, සිවුරක්; චෙතාපෙත්වා, මිලයට ගෙණ; ඉත්ථන්නාමං භික්ඛුං, මෙ නම් ඇති භික්ෂුව: චීවරෙන, සිවුරකින්: අච්ඡාදෙස්සාමි ඉති, අන්ද වන්නෙමියි (මෙ නම් භික්ෂුහට සිවුරක් දෙන්නෙමියි) චීවරචෙතාපනන්නං, සිවුරු මුදලක්: උපක්ඛටං හොති, එකතු කොට තබන ලද්දේ වේ ද.

සො භික්ඛු, ඒ මහණ තෙම; වෙ ඉදින්; පුබ්බෙ, පෙර; අප්පවාරිතො, නො පවරණ ලද්දේ; තත්‍ර, (ඒ ගෘහපති ආදීහු යම්තැනෙක්හි ද, එහි: උපසඞ්කමිත්වා, එළඹ; ආයස්මා, ඇවත; ඉමිනා චීවර චෙතාපන්නෙන, මේ සිවුරු මිලයෙන්: එවරූපං වා, මේ ආකාර වූ හෝ: එවරූපං වා, මේ ආකාර වූ හෝ; චීවරං, සිවුරක්: චෙතාපෙත්වා, මිලදී ගෙණ; මං, මා: අච්ඡාදෙහි, අන්දවව; කල්‍යාණකම්‍යතං උපාදය, යහපතක් කැමැති බැව් සිතාගෙණ; සාධු වත ඉති, (මෙසේ කළොත්) මැනවැයි. චීවරෙ, සිවුරෙහි; විකප්පං, අධික (බලවත්) විධානයට (නියම කිරීමට) ආපජ්ජෙය්‍ය, පැමිණියේ වී නම්: නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

සං:- **"භික්ඛුං පනෙව උද්දිස්ස"** යනු අසවල් භික්ෂුහට දෙන්නෙමි කියා යනුයි. මෙහි 'පන' යනුද 'එව' යනුද නිපාත දෙකෙකි: එයින් විශෙෂාර්ථයෙක් නොමැත්තේය.

සං:- **"චීවරචෙතාපන්නං"** යී චීවරං චෙතාපෙන්ති එතෙ නාති: චීවරචෙතාපනං, නකාරයක් ආගම වීමෙන් 'චීවර චෙතාපන්නං' යී සිඬයි.) 'චීවරචෙතාපනන්තිපි පඨන්ති'යි ටීකාවෙහි දක්වේ. චීවර චෙතාපනය නම් කහවණු ආදි කිසියම් මුදලකි.

නොනෑවූ ගැහැවියෙකු විසින් හෝ ගැහැවියක විසින් හෝ මෙයින් සිවුරක් ගෙණ අසවල් භික්ෂූන් වහන්සේට පූජා කරන්නෙමියි කහවණු ආදි කිසියම් මුදලක් රැස්කොට තැබීම මෙයින් ප්‍රකාශ වේ.

සං:- **"විකප්පං ආපජ්ජෙය්‍ය"** යි දක්වෙන චීවරවිකප්පය නම් අධික විධාන යයි හෙවත් බලවත් ලෙස නියම කිරීමයි.

මෙහි අදහස නම් - ස්වාමීනි! නුඹවහන්සේට කෙබඳු සිවුරකින් ප්‍රයොජන ද කෙබඳු සිවුරක් ගෙණෙන්නෙම් දැයි පළමු කී චීවර මුදල සම්පාදකයන් නොවිචාළ කල්හි ම ඔවුන්ගේ ගෙවලට ගොස් මට මෙවැනි සිවුරක් ගෙණෙවයි හොඳ සිවුරක් ගන්නා බලාපොරොත්තුවෙන් බලවත්සේ නියම කිරීමයි.

සං:- **"සාධු වත මං-පෙ-අච්ඡාදෙහීති"**යි අධික විධානය කරණ අයුරු දක්වේ.

'සාධු' ශබ්දය වනාහි සම්පටිච්ඡන, සම්පහංසන, සුන්දර, යාචනාදී නොයෙක් අර්ථයන්හි පෙණේ. **"සාධු" භන්තෙති ඛො සො භික්ඛු**

**භගවතො භාසිතං අභිනන්දිත්වා"** යනාදී තන්හි සම්පටිච්ඡනයෙහි ද, **"සාධු සාධු සාරිපුත්ත**. යන ආදි තන්හි සම්පහංසනයෙහි ද්

"සාධු ධම්ම රුචී රාජා සාධු පඤ්ඤාණවා නරො
සාධු මිත්තා නමද්දුබ්භො පාපස්ස අකරණං සුඛං"

යනාදී තන්හි සුන්දරාර්ථයෙහි ද, **සාධු මෙ භන්තෙ භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු"**ති ආදී තන්හි ආයාචනයෙහි ද පෙණෙයි. මෙහි ආයාචනයෙහි යයි සැලකිය යුතුයි.

**සං:- කල්‍යාණකම්‍යතං උපාදය"** යනු දයකයාගේ බලාපොරොත්තුවට වඩා වටිනා හොඳ සිවුරක් කරවාගණු කැමැත්තෙන්ය යනුයි. (කල්‍යාණං කාමෙතීති-කල්‍යාණකාමො; කල්‍යාණ කාමස්ස භාවො-කල්‍යාණකාම්‍යතා, ඝවාදියෙන් ආකාරය හ්‍රස්ව වේ. කල්‍යාණ කම්‍යං එව:=කල්‍යාණිකම්‍යතා)

**සප්ත දශාකාරය**.

නිදානය - සැවැත්නුවරය.

පුද්ගලයා - උපනන්ද තෙරණුවෝය

වස්තුව - චීවරයෙහි අධික විධානයට පැමිණීම් සංඛ්‍යාත වස්තුවය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය. (භිකඛුං පනෙව - පෙ - පාචිත්තියං)

ආනත්තිය - අනාණත්තිකය.

ආපත්ති - තිකපචිතියයි.

නැවූවාහු කෙරෙහි නොනැයයි හඟින්නහු වද වෙමතිකයාට ද දුකුළාවෙකි.

අනාපත්ති - වටිනාකම අඩුකරවන්නහුට ද, මේ මුදලෙන් ම මෙබඳු අතිකක් ගෙණෙවයි කියන්නහු ට ද, ඤාතකපවාරිතයෙහි විධානය කරන්නහුට ද, තමන්ගේ ධනයෙන් ගෙන්වා ගන්නහුට ද, උම්මත්තකාදීන්ට ද අනාපත්ති වේ.

9. භික්ඛුං පනෙව උද්දිස්ස උභින්නං අඤ්ඤාතකානං ගහපතීනං වා ගහපතානීනං වා පච්චෙක චීවරචෙතාපන්නානි උපක්ඛටානි හොන්ති, ඉමෙහි මයං පච්චෙකචීවරචෙතාපනෙහි පච්චෙකචීවරානි චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙහි අච්ඡාදෙස්සාමාති තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො

---

විපත්ති - පෙරමෙනි.

අඞ්ග - චීවරෙ භීයොභාකම්‍යතා, අඤ්ඤාතිකවිඤ්ඤත්ති, තාය ච පටිලාභො,යි අඞ්ග තුනෙකි.

සමුට්ඨානාදිය පෙර මෙනි.

**අටවැනි නිසඟි පචිති වණ්ණනාව නිමි.**

---

## නිදාන කථාව

එක්තරා පුරුෂයෙක් තම භාර්යාවට මෙසේ කීය. කෙසේද? උපනන්ද ආයුෂ්මතුන් වහන්සේට සිවුරක් දෙන්නෙමි කියායි. ඒ බැව් දත් උපනන්ද තෙරණුවෝ ඒ පුරුෂයා කරා ගොස් තෙපි මට සිවුරක් දෙන්නහුයයි ඇසීම්. එය සැබෑද? එසේ යයි කීය. එසේ නම් මෙබඳු සිවුරක් පුදවයි කීහ. එ කල්හි ඒ පුරුෂයා නුගුණ කියා ගරහන්ට පටන් ගත්තේය.

භික්ෂූහු මෙය දැනගෙණ තථාගතයන් වහන්සේට සැළකළාහුය. එකල්හි තථාගතයන් වහන්සේ 'භික්ඛුං පනෙව උද්දිස්ස' යනාදි ශික්ෂාපදය අනුදැන වදළසේකි.

---

9. **අර්ථ**:- භික්ඛුං එව පන, භික්ෂුවක් ම වනාහි: උද්දිස්ස, උදෙසා: අඤ්ඤාතකානං, නො නෑවූ: උභින්නං ගහපතීනං වා, ගෘහපතීන් දෙදෙනකු විසින් හෝ: ගහපතානීනං වා, (නොනෑවූ) ගැහැවිනියන් දෙදෙනකු විසින් හෝ: මයං, අපි: ඉමෙහි පච්චෙකචීවර චෙතා පනෙහි, මේ වෙන් වෙන්වූ සිවුරු මිල යෙන්: පච්චෙක චීවරානි, වෙන වෙන සිවුරු: චෙතාපෙත්වා, මිලදී ගෙණ: ඉත්ථන්නාමං භික්ඛුං, මෙනම් භික්ෂූහු: චීවරෙහි, සිවුරුවලින්:

උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය, සාධු වත මං ආයස්මන්තො ඉමෙහි පච්චෙක චීවර චෙතා පන්නෙහි එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙථ උභොව සන්තා එකෙනාති කල්‍යාණකම්‍යතං උපාදාය නිස්සග්ගියං පාචිත්තියං

---

අච්ඡාදෙස්සාම ඉති, අන්දවන්නෙමුයි හෙවත් මෙනම් භික්‍ෂුහුට දෙන්නෙමුයි; පච්චෙකචීවර චෙතාපන්නානි, වෙන වෙනම සිවුරු මිල; උපක්ඛටානි හොන්ති, රැස් කරණ ලද්දහු වෙද්ද; සො භික්ඛු, ඒ මහණ තෙම; පුබ්බෙ අප්පවාරිතො, පෙර නොපවරණ ලද්දේ; තත්‍ර, (ඒ ගෘහපති ආදීහු යම් තැනෙක ද) එහි; උපසඞ්කමිත්වා, එළඹ; ආයස්මන්තො, ආයුෂ්මත්නි; උභො එව සන්තා, (තෙපි) දෙදෙන ම එක්ව; ඉමෙහි පච්චෙකචීවර චෙතාපන්නෙහි, මේ වෙන වෙන සිවුරු මිලයෙන්; එවරූපං වා එවරූපං වා, මෙබඳු වූ හෝ මෙබඳු වූ හෝ; චීවරං, සිවුරක්; චෙතාපෙත්වා, විකොට (මිල දී) ගෙණ; මං, මා; එකෙන, එක් සිවුරකින්; අච්ඡාදෙථ, අච්ඡාදනය (ඇන්දවීම) කරවි හෙවත් මට දෙව්; සාධු වත ඉති, (මෙසේ කළාහු නම්) මැනැවැයි; කල්‍යාණකම්‍යතං උපාදාය, යහපතක් කැමැති බව සිතින් ගෙණ; චීවරෙ, සිවුරෙහි; විකප්පං, අධික විධානයට (නියම කිරීමට) ආපජ්ජෙය්‍ය වෙ, ඉදින් පැමිණියේ වී නම්; නිස්සග්ගියං පාචිත්තිං, නිසඟි පචිති වේ.

**සංලක්‍ෂ්‍යයː-** මේ ශික්‍ෂා පදය වනාහි පළමු ශික්‍ෂාපදයෙහි ම අනුප්‍රඥප්තියක් වැනි වේ. එහි එකෙකු කරා ගොස් පීඩා කරණ ලදී. මෙහි දී දෙදෙනෙකුට පීඩා කරණ ලදී. විශෙෂය එයයි. සෙසු විස්තර පළමු ශික්‍ෂාපදයෙහි මෙනි.

**"ඉදං මෙ භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතෙ අඤ්ඤාතකෙ ගහපතිකෙ උපසඞ්කමිත්වා විකප්පං ආපන්නං නිස්සග්ගියන්ති"** නිස්සජනය කටයුතුයි.

නිදාන කථාව ද පළමු ශික්‍ෂා පදයෙහි මෙනි. එහි එක් කෙනෙකු සමීපයට ගොස් අධික විධානය කිරීම දක්වේ. මෙහි දෙදෙනෙකු කරා ගොස් අධික විධානය කිරීම පමණක් වෙනසකි.

**නවවැනි නිසඟි පචිති වර්‍ණනාව නිමි.**

---

10. භික්ඛුං පනෙව උද්දිස්ස රාජා වා රාජභොග්ගො වා බ්‍රාහ්මණො වා ගහපතිකො වා දූතෙන චීවරචෙතාපනනං පහිණෙය්‍ය, ඉමිනා චීවරචෙතාපනෙනන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙන අච්ඡාදෙහීති සො චෙ දූතො තං භික්ඛුං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය, ඉදං ඛො භන්තෙ ආයස්මන්තං උද්දිස්ස චීවරචෙතාපනනං ආභතං පතිගණ්හාතු ආයස්මා චීවරචෙතාපනනන්ති. තෙන භික්ඛුනා සො දූතො එව මස්ස වචනීයො, න ඛො මයං ආවුසො චීවරචෙතාපනනං පතිගණ්හාම චීවරඤ්ච ඛො මයං පතිගණ්හාම කාලෙන කප්පියන්ති, සො චෙ දූතො තං භික්ඛුං එවං වදෙය්‍ය, අත්ථි පනායස්මතො කොචි වෙය්‍යාවච්චකරොති. චීවරත්ථිකෙන

---

10. අර්ථ:- භික්ඛුං එව පන, භික්‍ෂුවක්ම වනාහි: උද්දිස්ස, උදෙසා: රාජා වා, රජෙක් හෝ: රාජභොග්ගො වා, රාජාමාත්‍යයෙක් හෝ: බ්‍රාහ්මණො වා, බමුණෙක් හෝ: ගහපතිකො වා, ගෘහපතියෙක් හෝ: ඉමිනා චීවරචෙතාපනෙනන, මේ සිවුරු මිලයෙන්: චීවරං, සිවුරක්, චෙතාපෙත්වා, විකොට (මිල දී) ගෙණ: ඉත්ථන්නාමං භික්ඛුං, මෙනම් භික්‍ෂුහු: චීවරෙන අච්ඡා දෙහි ඉති, සිවුරෙන් අච්ඡාදනය කරවයි කියා: චීවර චෙතාපනනං, (රන් රිදී ආදී) සිවුරු මිලයක්: දූතෙන, දූතයෙකු ලවා: පාහිණෙය්‍ය, එවූයේ වී නම්, සො දූතො, ඒ දූත තෙම: චෙ, ඉදින්, තං භික්ඛුං, ඒ භික්‍ෂුහු කරා: උපසඞ්කමිත්වා, එළඹ: භන්තෙ, වහන්ස: ආයස්මන්තං, ආයුෂ්මත්හු: උද්දිස්ස, උදෙසා: ඉදං ඛො චීවරචෙතාපනනං, මේ (රන්රිදී ඈ) සිවුරු මිලය: ආභතං, ගෙනෙන ලද්දේය.

ආයස්මා, ආයුෂ්මත් තෙමේ: චීවරචෙතාපනනං, සිවුරු මිලය: පතිගණ්හාතු ඉති, පිළිගණ්වයි: එවං මෙසේ: වදෙය්‍ය, කියන්නේ නම්: තෙන භික්ඛුනා, ඒ භික්‍ෂුහු විසින්: සො දූතො ඒ දූත තෙම: ආවුසො, ඇවත: මයං, අපි: චීවරචෙතාපනනං, (අකැප වූ) සිවුරු මිලය: න ඛො පතිගණ්හාම, නොපිළිගනුම්හ: මයං, අපි: කාලෙන, ප්‍රයෝජනයක් ඇති කල්හි: කප්පියං ඛො, කැපවූ ම: චීවරඤ්ච, සිවුරක්: පතිගණ්හාම ඉති, පිළිගණුම්හයි: එවං මෙසේ: වචනීයො අස්ස, කියයුතු වන්නේය.

චෙ ඉදින්: සො දූතො, ඒ දූතතෙම: තං භික්ඛුං, ඒ භික්‍ෂුහට, ආයස්මතො පන, ආයුෂ්මතුන්ගේ වනාහි, කොචි වෙය්‍යාවච්චකරො, කිසි කැපකරුවෙක්: අත්ථි ඉති, ඇද්දයි: එවං මෙසේ: වදෙය්‍ය, කියන්නේ නම්: භික්ඛවෙ, මහණෙනි, චීවරත්ථි කෙන භික්ඛුනා, සිවුරු කැමැති භික්‍ෂුහු

භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො නිද්දිසිතබ්බො ආරාමිකො වා උපාසකො වා එසො බො ආවුසො භික්ඛූනං වෙය්‍යාවච්චකරොති සො චෙ දූතො තං වෙය්‍යාවච්චකරං සඤ්ඤාපෙත්වා තං භික්ඛුං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය යං බො භන්තෙ ආයස්මා වෙය්‍යාවච්චකරං නිද්දිසි, සඤ්ඤත්තො සො මයා උපසඞ්කමතු ආයස්මා කාලෙන, චීවරෙන තං අච්ඡාදෙස්සතීති. චීවරත්ථිකෙන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො උපසඞ්කමිත්වා ද්වත්තික්ඛත්තුං චොදෙ තබ්බො සාරෙතබ්බො අත්ථො මෙ ආවුසො චීවරෙනාති ද්වත්තික්ඛත්තුං චොදයමානො සාරයමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය,

---

විසින්: වෙය්‍යාවච්ච කරො, කැපකරු වූ: ආරාමිකො වා, ආරාමිකයෙක් (අරමෙහි සිටින්නෙක්) හෝ උපාසකො වා, උවසුවෙක් හෝ: ආවුසො, ඇවත: එසො බො, මෙතෙම වනාහි: භික්ඛූනං: භික්ෂූන්ගේ: වෙය්‍යාවච්චකරො ඉති, කැපකරුවා යයි, නිද්දිසිතබ්බො, දක්විය යුතුයි චෙ, ඉදින්: සො දූතො, ඒ දූත තෙම: වෙය්‍යාවච්චකරං, ඒ කැපකරුවා: සඤ්ඤාපෙත්වා (සිවුරු ගෙණ දෙන සේ) ගිවිස්වා: (නියම කොට) තං භික්ඛුං, ඒ භික්ෂූහු කරා: උපසඞ්කමිත්වා, එළඹ: එවං, මෙසේ: වදෙය්‍ය, කියන්නේ නම් (කෙසේද?) භන්තෙ, වහන්ස: ආයස්මා, ආයුෂ්මත්තෙම: යං බො වෙය්‍යාවච්චකරං, යම් කැප කරුවෙකු: නිද්දිසි, දක්වී ද: මයා, මා විසින්: සො, හෙතෙම: සඤ්ඤත්තො, (සිවුරු ගෙන දෙන සේ) ගිවිස්සන ලද්දේය. ආයස්මා, ආයුෂ්මත් තෙමේ: කාලෙන, (සිවුරු කැමැති) කාලයෙක්හි: (දවසක) උපසඞ්කමතු, එලඹේවා: චීවරෙන: සිවුරෙන්: තං, නුඹවහන්සේ: අච්ඡාදෙස්සති ඉති, ආච්ඡාදනය කරන්නේය. (කියායි), භික්ඛවෙ, මහණෙනි: චීවරත්ථිකෙන, සිවුරු කැමැති වූ: භික්ඛුනා, මහණහු විසින්: වෙය්‍යාවච්චකරො, කප්පිය කාරක තෙමේ: උපසඞ්කමිත්වා, ලහට එළඹ: ආවුසො, ඇවත: මෙ මට: චීවරෙන, සිවුරෙන්: අත්ථො ඉති, ප්‍රයෝජන ඇත්තේ යයි: ද්වත්තික්ඛත්තුං, දෙතුන්වරෙක්හි චොදෙතබ්බො, ඉල්විය යුත්තේය: සාරෙතබ්බො සිහි කරවිය යුත්තේය: ද්වත්තික්ඛත්තුං, දෙතුන් වරෙක: චොදයමානො, ඉල්වන්නේ, සාරයමානො, සිහි කරවන්නේ: තං චීවරං ඒ සිවුර: අභිනිප්ඵාදෙය්‍ය, නිපදවී නම්: (සම්පාදනය කෙළේ නම්) ඉති එතං, මෙසේ මේ නිපදවීම: කුසලං මැනවි: නොවෙ අභිනිප්ඵාදෙය්‍ය. ඉදින් නොනිපදවී නම්: චතුක්ඛත්තුං, සතර වරෙක: පඤ්චක්ඛත්තුං, පස්වරෙක, ඡක්ඛත්තු පරමං, සය වරක් පරම කොට: තුණ්හීභූතෙන, තුෂ්ණීම්භූත වුවහු විසින්; උද්දිස්ස, උදෙසා; ඨාතබ්බං, සිටිය යුතුයි. චතුක්ඛත්තුං, සතරවරෙක: පඤ්චක්ඛත්තුං, පස් වරෙක; ඡක්ඛත්තු පරමං,

ඉච්චේතං කුසලං, නො වෙ අභිනිප්ඵාදෙය්‍ය, චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුපරමං තුණ්හිභූතෙන උද්දිස්ස ඨාතබ්බං, චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තු පරමං තුණ්හිභූතො උද්දිස්ස තිට්ඨ මානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඉච්චේතං කුසලං, නො වෙ අභිනිප්ඵාදෙය්‍ය තතො වෙ උත්තරිං වාය මානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං, නොවෙ අභිනිප්ඵාදෙය්‍ය, යතස්ස චීවරචෙතාපනනං ආභතං, තත්ථ සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො, යං ඛො තුම්හෙ ආයස්මන්තො භික්ඛුං උද්දිස්ස චීවරචෙතාපනනං පහිණිත්ථ න තං තස්ස භික්ඛුනො කිඤ්චි අත්ථං අනුභොති, යුඤ්ජන්තා යස්මන්තො සකං, මා වො සකං විනස්සාති අයං තත්ථ සාමීචි.

### චීවර වග්ගො පඨමො.

---

සයවරක් පරමකොට; තුණ්හීභූතො, තුෂ්ණීම්භූත වූයේ; උද්දිස්ස තිට්ඨමානො, උදෙසා සිටින්නේ; තං චීවරං, ඒ සිවුර; අභිනිප්ඵාදෙය්‍ය, නිපදවූයේ නම්; ඉති එතං, මෙසේ මේ නිපදවීම, කුසලං, මැනවි; නො වෙ අභිනිප්ඵාදෙය්‍ය, ඉදින් නොනිපද වූයේ නම්; වෙ ඉදින්, තතො උත්තරිං, ඒ චොදනා හා ස්ථාන පරිමාණයෙන් මත්තෙහි; වායමානො, වෑයම් කරන්නේ; තං චීවරං, ඒ සිවුර; අභිනිප්ඵාදෙය්‍ය, නිපදවූයේ නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

නොවෙ අභිනිප්ඵාදෙය්‍ය, ඉදින් නොනිපදවූයේ නම්; යතො, රාජාදි යමෙක්හු කෙරෙන්; අස්ස, ඒ භික්ෂුහට; චීවර චෙතාපනනං, සිවුරු මිලය; ආභතං, ගෙණෙන ලද ද; ආයස්මන්තො, ආයුෂ්මත්නි! තුම්හෙ, තෙපි; භික්ඛුං උද්දිස්ස, භික්ෂුවක් උදෙසා; යං ඛො චීවරචෙතාපනනං, යම් සිවුරු මිලයක්; පහිණිත්ථ, යැවූහු ද; තං ඒ (සිවුරු මිලය) තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහුගේ; කිඤ්චි අත්ථං, කිසි ප්‍රයොජනයක්; න අනුභොති, නිෂ්පාදනය නො කෙරෙයි. (ඒ නිසා) ආයස්මන්තො, ආයුෂ්මත්හු; සකං, තමන් සතු ධනයට; යුඤ්ජන්තු, යෙදෙත්වා; වො, තොපගේ; සකං, වස්තුව; මා විනස්ස ඉති, නොනැසේවයි කියා; සාමං වා, තමා විසින් හෝ, ගන්තබ්බං යා යුතුය; දූතො වා, දූතයෙක් හෝ, පාහෙතබ්බො, යැවිය යුත්තේය. තත්ථ, එහි; අයං, මේ; සාමිචි, ලොකොත්තර ධර්‍මානු ගත ප්‍රතිපත්තිය වේ.

### පඨමො. පළමුවැනි: චීවරවග්ගො. සිවුරු වර්‍ගයයි.

---

**සංලක්ෂ්‍යය:- රාජභොග්ගො'ති"** (රාජතො භොග්ගං භුඤ්ජි තබ්බං අස්ස අත්ථීති - රාජභොග්ගො:- රාජතො භොගො අස්ස අත්ථීතිවා - රාජ භොගො;) මෙයින් රාජාමාත්‍යයෙක් දක් වේ.

**සං:- "චීවරචෙතාපන්නං"** මෙයින් රන් රිදී ආදී නො කැප වස්තුවක් (මුදලක්) ප්‍රකාශ වෙයි.

**සං:- "පහිණෙය්‍ය"** යී රාජාදි කිසිවෙකු විසින් දූතයෙකු අත සිවුරු මිලයක් යවන ලද්දේ වේ ද යනුයි. 'ඉමිනා' යනාදියෙන් ආගමන සුද්ධිය දක්වති. යම්හෙයකින් මෙය අසවල් භික්ෂුහට දෙවයි කියා යවයි ද ආගමනය අසුද්ධ බැවින් නො කැප වස්තුවක් නිසා භික්ෂුව විසින් කැපකරුවෙක් ද නො දක්විය යුතුයි.

'නඛො මයං' යනාදියෙන් චීවර මූලය නො කැප බව දක්වයි. භික්ෂුවට කැප වශයෙන් ගෙණෙන ලද චීවර මූලයක් නමුත් මෙ බඳු දූත වචනයෙන් නො කැප වේ.

පිළිගැණීමට නො කැප වස්තුව නම්:- සුවණ්ණං, රජතං, කහාපණො, මාසකො යී දක්වෙන සතර, නිසඟි වස්තූන් නිසා ද, මුත්තා, මණි, වෙළුරියො, සඞ්ඛො, සිලා, පවාළං, ලොහිතඞ්කො මසාරගල්ලං, සත්තධඤ්ඤානි, දසිදසං, ඛෙත්තං, වත්ථු, පුප්ඵාරාම, ඵලාරාමාදයො යී දක්වෙන දූ, දුකුළා වස්තූන් නිසා ද, තමා උදෙසා හෝ චෛත්‍ය සංඝ ගණ පුද්ගලාදීන් උදෙසා හෝ පිළිගන්ට නොවටින බැව් දක්වනු වස් 'නඛොමයං' යනාදිය කියන ලදී.

**සං:- "චීවරඤ්ච ඛො මයං පටිග්ගණ්හාම"** තමා උදෙසා ගෙණ එන ලද්දක් බැවින් මෙසේ කියන්ට වටනේ ය.

**සං:- "වෙය්‍යාවච්චකරො නිද්දිසිතබ්බො"** යි වෙයාාවච්ච කරො යී කැපකරුවා දක් වේ. 'අත්ථි පනායස්මතො කොචි වෙයාාවච්චකරො' යී කැපවචනයෙන් කී බැවින් ආරාමිකා දී කැපකරුවෙක් දක්විය යුතුයි. 'කො ඉමං ගණ්හාති' යී කවරෙක් මෙය ගණී ද? කියා හෝ 'කස්ස දෙමි' යී කවරෙකුට දෙම් ද? කියා හෝ කියයි නම් කැපකරුවෙක් ද නොදක්විය යුතුයි. 'ආරාමිකො වා උපාසකො වා' යී දක්විය යුතු කැප කරුවා හඳුන්වයි. 'පඤ්ච සහධාර්මිකයන් හැර උපාසකාදී යමෙක් 'එසො ඛො ආවුසො භික්ඛූනං වෙයාාවච්චකරො' යී කැපකරුවෙකු ලෙස දක්විය හැක්කේය. එහෙත් මේ උපාසක තැනට හෝ ආරාමිකයාට දෙව'

යනා දී නො සරුප් බසින් කැපකරුවෙක් නො පෙන්විය යුත්තේ ය. මෙහි 'ආවුසො' යනු භික්ෂූන් අතර පවත්නා කැප වහරෙකි.

සං:- **"සඤ්ඤත්තො සො මයා"** යි ම විසින් හෙතෙම අණවන ලද්දේය යනුයි. නුඹවහන්සේ විසින් මේ භික්ෂූන්ගේ කැප කරුවා ය. යමෙක් මට දක්වන ලද නම් නුඹවහන්සේ නියම කළ දිනක සිවුරක් ගෙණ දෙන සේ ඔහුට නියම කෙළෙමි යන අදහසයි.

මේ කප්පිය කාරකයා **"නිද්දිට්ඨානිද්දිට්ඨ"** වශයෙන් දෙපරිදි වේ. එයින් නිද්දිට්ඨ කප්පියකාරකයා ද භික්ෂුව විසින් දක්වන ලද්දේය. දූතයෙකු විසින් දක්වන ලද්දේ යයි විවිධ වේ.

මුඛවෙටික කප්පිය කාරකයා ය, පරම්මුඛ කප්පිය කාරකයා යයි අනිද්දිට්ඨයා ද දෙවදෑරුම් වේ. නැවත සම්මුඛාසම්මුඛ නිද්දිට්ඨාදි වශයෙන් කැපකරුගේ දසවැදෑරුම් හෙද සැලකිය යුත්තාහ. (විස්තර ටීකාවෙන් බැලිය යුතු.)

සං:- **"අත්ථො මෙ ආවුසො චීවරෙනාති"** යි චොදනා ලක්ෂණ දක් වෙති. මෙසේ සරුප් බසින් තෙවරක් චොදනා (සිවුරක් උවමනා බැව් දන්වීම) කළ යුත්තේය. පළමුවර දී හෝ දෙවැනි වරදී හෝ තෙවැනි වර දී හෝ සිවුර ලද හොත් මැනවි. පිළිගත යුත්තේය.

'මට සිවුරක් දෙව. මට සිවුරක් ගෙණ එව' යනාදී නොසරුප් බසින් නොකිය යුතුයි.

සං:- **"ඡක්ඛත්තු පරමං"** යී (ඡක්ඛත්තුං පරමො පරිච්ඡෙදො අස්සාති= ඡක්ඛත්තු පරමං; යි භාව නපුංසක ලිඞ්ගික එකවචනයයි. 'ඡක්ඛත්තුං පරමං'යි වියයුතු නමුත් නිග්ගහීත ලොපයෙන් ඡක්ඛත්තු පරමං' කියා වේ. මෙය 'ඨාතබ්බං' යන පදයෙහි ක්‍රියා විශෙෂණයෙකි; චතුක්ඛත්තුං යනු ද පංචක්ඛත්තුං යනු ද ඡක්ඛත්තුං යනු ද 'ක්ඛත්තුං' ප්‍රත්‍යයාන්ත කෘදන්ත පදයෝයි)

සවරක් ඒ සිවුර උදෙසා ඔහුගේ ගෙදෙර නිශ්ශබ්දව සිටිය යුතුයි. ස්වාමීනි! කුමක් නිසා වැඩියෙහි දැයි ඇසුව හොත් 'ඇවැත්නි දන ගනුව' යි පමණක් කිය යුත්තේය.

මෙහි වැඩහිඳිනු මැනව යි කී කල්හි හිඳින්ටවත් කැඳබත් ආදී ආමිශ පිළිගන්ටවත් අනුමෙවෙනි බණ කියන්ටවත් නොවටී. තිසජ්ජා දිය කළහොත් ස්ථාන සයෙන් එකක් හෝ කීපයක් විනාශ වෙති; මේ චොදනා කරණ අයුරුයි.

සවැනි වාරය දක්වා මෙසේ කයින් චොදනා කොට ලැබුන හොත් පිළිගත යුතුයි. නැතහොත් සවැනි වාරයෙන් පසු ඒ සඳහා එහි නො යා යුත්තේය.

යම් හෙයකින් සිවුරු මිල දයකයා තෙමේ ම කැපකරුවන් ගෙණ ගොස් දක්වයි ද ඔවුන්ගෙන් සියක්වරක්වුවත් ඉල්ලන්ට වටනේය. මුඛවෙවික කප්පිය කාරකයාගෙන් හා පරම්මුඛ කප්පිය කාරකයා ගෙන් එකවරක් නමුත් නො ඉල්ලිය යුත්තේය.

සං:- **"තතො චෙ උත්තරිං = පෙ = අභිනිප්ඵාදෙය්‍ය"** යනු මෙහි කියන ලද වාචසික චොදනා - කායික චොදනා වාරවලට වඩා වැඩියක් චොදනා කළ හොත් ප්‍රයොගයක් පාසා දුකුළා ද ප්‍රතිලාභයෙහි තිසගි පචිතිය ද වෙති. එසේ ලත් චීවරය **"ඉදං මෙ භන්තෙ චීවරං අතිරෙක තික්ඛත්තුං චොදනාය අතිරෙක ඡක්ඛත්තුං ඨානෙන අභිනිප්ඵාදිතං නිස්සග්ගිය"** න්ති. නිස්සජ්ජනය කටයුතුයි.

සං:- **"යතස්ස චීවරචෙතාපන්නං"** යනාදියෙන් මෙවැනි කරුණෙහි භික්ෂුව විසින් පිළිපැදිය යුතු ආකාරය දැගන්වති.

සං:- **"න තං තස්ස භික්ඛුනො කිඤ්චි අත්ථං අනුභොති"** යි එකී චීවර මූලයෙන් එකී භික්ෂුවට ස්වල්පමාත්‍ර වූද ප්‍රයෝජනයක් නොවූයේය. ආයුෂ්මත්හුගේ ධනය නැවත ඔවුන්ගෙන් ලැබ ගන්ට යයි තෙමේ ම හෝ කියනු මැනවි. නැතහොත් කෙනෙකු ලවා කියවනු මැනවි. මෙසේ පිළිපැදීම ලොකොත්තර ධර්මානුගත වතෙකි. මෙසේ නොකිරීමෙන් 'දුකුළාව' කට පැමිණේ.

## සප්තදශාකාර්‍ය

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයා - උපනන්ද තෙරණුවෝය.

වස්තුව - 'අජ්ජුණ්හො භන්තෙ ආගමෙහී ති වුච්චමානො නාගමෙසි' මෙය නිමිතිකොට පණවන ලදී.

පඤ්ඤත්ති - සාධාරණ පඤ්ඤත්තිය යි.

ආණත්ති - අනාණත්තිකයි.

ආපත්ති - තිකපාචිත්තියයි.

චොදනාසථාන අඩුවූ කල්හිත් වැඩිවූයේයයි හඟින්නහුට ද, වෙමතිකයාටද, දුකුළාවෙකි.

අනාපත්ති - චොදනා නොකොට ලද්දෙහිද, හිමියන් විසින් චොදනා කොට දුන්නෙහිද, උම්මත්තකාදීන්ටද, ඇවැත් නොවේ.

විපත්ති - පෙර සේයි.

අඩග - කප්පිය කාරකස්ස හික්ඛුනො නිද්දිට්ඨභාවො, දූතෙන අප්පිතතා, තතුත්තරිං වායාමො, තෙන වායාමෙන පටිලාභො, යන සතරෙකි.

**සමුට්ඨානාදිය සතරවැනි තිසඟි පචිතියෙහි මෙති.**

---

# නිදාන කථාව

ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රයානන්ගේ උපස්ථායක මහාමාත්‍යයෙක් තෙම උන්වහන්සේට චීවර චෙතාපන්නයක් (සිවුරු මිලක්) යැවීය.

ඒ මුදල එකෙණෙහි ආරාමයට පැමිණි උවැසියෙකුට භාර කරවූයේය. ඒ ඇමැති තෙමේ ද සිවුර පිළියෙළ කරවා ගෙණ පොරවනවා දකිනු කැමැත්තෙමි'යි කියා කිහිපවිටක්ම දූතයන් යැවීය. එබැවින් උපනන්ද ශාක්‍ය පුත්‍ර තෙමේද දිනක් උවැසියාගේ ගෙට ගොස් සිවුරක් ප්‍රයෝජනයයි දන්වූයේය. එදවස නියම්ගම් වාසීන්ගේ සංගමයෙකි. යමෙක් සියල්ලට පසුව එහි ගිය හොත් පනසෙක් දඩ වේ. එබැවින් ස්වාමීනි! අද එක දවසක් ඉවසුව මැනවයි කීය. එය නොසලකා නැවතත් පීඩාකරන්ට වූයෙන් සිවුරක් ගෙණැවිත් දී සංගමයට පසුව ගියේය. ඔහුට දඩගෙවන්ට ද විය.

1 යො පන භික්ඛු කොසිය මිස්සකං සන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

---

ඒ බැව් දත් ගම්වාසීහු භික්ෂූන්ගේ නුගුණ කියන්ට වූහු. මේ කරුණෙහි ලා මේ ශික්ෂාපදය පණවා වදරණ ලදි.

## දසවෙනි නිසගිපචිති වණ්නාව නිමි.
## පළමුවෙනි චීවර වර්‍ගය නිමියේය.

---

**1. අත්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; කොසිය මිස්සකං, තිහිරි හූ (කොසෙය්‍යනූල්) මිශ්‍රකරණලද, සන්ථතං: (එළුලොම් මූවා) ඇතිරියක්, කාරාපෙය්‍ය, කරවන්නේ නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

**සං**:- **"කොසියමිස්සකං"** යි (කොසතො නිබ්බත්තං - කොසියං 'ණික' ප්‍රත්‍යයාන්ත තද්ධිතයෙකි (ප්‍රත්‍යයේ කයන්නට යකාරාදෙශ විය. කොසියෙන මිස්සං - කොසිය මිස්සකං; ස්වාර්ථයෙහි ක ප්‍රත්‍යයයි.)

කොසිය නම් කොෂකාරක පණුවන්ගේ කොෂවලින් නිපදවන හූ වෙසෙසකි; යටත් පිරිසෙයින් වාතයෙන් හෙලන ලද (හුලඟට ඇවිත් වැටුන එක කොසිය හූයකින් (කෙන්දකින්) නමුත් මිශ්‍රවූව හොත් 'කොසියමිස්සක' යනු වහර යෙදේ. මෙයින් මේ ශික්ෂාපදය අචිත්තක බැව් කිය වේ.

**සං**:- **"සන්ථතං"** යි සන්ථරණය කොට කරණ ලද අවායිම (නොවියනලද) ඇතිරියකි; මේ වනාහි සමබිමෙක; කොසිය හූ මතු මත්තෙහි ආස්තරණය කොට එකෙටෙක සවිවීම (ඇලීම) පිණිස කැඳ ආදී යමක් වත්කොට (ඉස) පිළියෙළ කරගත යුත්තකි.

කොසියමිස්සක ආස්තරණයක් කරණ කරවන භික්ෂුවට හැම පියොවෙහි ම 'දුකුළා' වේ. ප්‍රතිලාභක්ෂණයෙහි නිසගි පචිති වේ.

**"ඉදං මෙ භන්තෙ කොසියමිස්සකං සන්ථතං කාරාපිතං නිස්සග්ගියං"** යි කියා නිස්සජ්ජනය කොට ඇවැත් දෙසාගත යුත්තාහුය.

සන්ථත සම්බන්ධ විස්තර හැම ශික්ෂාපදයකම මෙසේ ම බැවින් මින් පසු ඒ ගැන නොලියන්නෙමි.

**සප්තදශාකාරය**

නිදානය - අලවිනුවරය.

පුද්ගලයෝ - ෂඩ්වර්ගීය භික්ෂූහුය.

වස්තුව - කොසියමිස්සක සන්ථත කාරාපන වස්තුවය.

පඤ්ඤත්ති - අසාධාරණ ප්‍රඥප්තියයි; (යො පන භික්ඛු - පෙ- පාචිත්තියං)

ආණත්ති - තමන් සඳහා කරවීම් වශයෙන් සාණත්තිකවේ.

ආපත්ති - චතුක්ක පාචිත්තියයි (තමා විසින් කරණලද්ද තෙමේම අවසන් කෙරෙයිද, තමා විසින් කරණලද්ද අනුල්ලවා අවසන් කරවයිද, අනුන් විසින් කරණ ලද්ද තෙමේ අවසන් කෙරෙයිද, අනුන් විසින් කරණ ලද්ද අනුන්ලවා අවසන් කරවයිද, යන ක්‍රම සතරෙන් චතුක්කපාචිත්තිය වේ.) අනුන් සඳහා කිරීම හා කරවීමෙහි ද, අනුන් විසින් කරණ ලද්දක් පරිභොග කිරීමෙහි ද දුකුළා වේ.

අනාපත්ති - වියන් හිසි බිම්බොහනාදිය කිරීමෙහි ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

විපත්ති - පෙර මෙනි.

අඞ්ග - කොසියභාවො, අත්තනො අත්ථාය සන්ථතස්ස කරණ කාරාපනං, පටිලාභො, යි අඞ්ගත්‍රයකි.

**සමුට්ඨානාදිය ධොවාපන ශික්ෂාපදයෙහි මෙනි.**

---

# නිදාන කථාව

එක්කලෙක සවග මහණහු කොසිය කරුවන් කරා ගොස් මෙසේ කීහු, කෙසේද? ඇවැත්නි! වැඩිවැඩියෙන් කොසියකාරකයන් පිසව්. අපට ද දෙව්. අපි ද එයින් කොසිය මිශ්‍රක සන්ථත කරන්ට කැමැත්තෙමුයි කියායි. එකල්හි ඔවුහු භික්ෂූන්ගේ නුගුණ කියන්ට වූහ. මේ කරුණෙහි දී මේ ශික්ෂාව පණවා වදරණ ලදී.

**ප්‍රථම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

2. යො පන භික්ඛු සුද්ධ කාළකානං එළක ලොමානං සන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

3. නවං පන භික්ඛුනා සන්ථතං කාරයමානෙන ද්වෙ භාගං සුද්ධ කාළකානං එළකලොමානං ආදාතබ්බා, තතියං ඔදාතානං චතුත්ථං ගොචරියානං, අනාද චෙ භික්ඛු ද්වෙ භාගෙ සුද්ධ කාළ කානං එළකලොමානං තතියං ඔදාතානං, චතුත්ථං ගොචරියානං නවං සන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං;

---

2. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; සුද්ධකාළ කානං, හුදු කළුවූ; එළක ලොමානං, එළුලොම් සම්බන්ධිවූ; සන්ථතං, ඇතිරියක්; කාරාපෙය්‍ය, කරවන්නේ නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

**සං**:- **"සුද්ධකාළකානං"** යි අන් වර්ණයකින් මිශ්‍රනොවූ ස්වභාවයෙන් හෝ රඳන් කිරීමෙන් හෝ කළුවන්වූ යන අදහසයි.

**සං**:- විශාලා මහනුවර ෂඩ්වර්ගීය භික්ෂූන් අරබයා එබඳු ඇතිරිලි කරවීම් සංඛ්‍යාත වස්තුවෙහි දී පණවන ලදී. සෙස්ස පළමු වැන්න හා සම වේ.

---

## නිදාන කථාව

එක්කලෙක සවග මහණහු කළු එළු ලොම්මුවා ආස්තරණ කෙරෙති. විහාර චාරිකාවෙහි හැසිරෙන මිනිස්සු එය දක උජ්ඣායනය කළාහුය. ඒ ඇසූ භික්ෂූහු බුදුන්වහන්සේට සැළ කළ කල්හි මේ ශික්ෂාපදය අනු දන වදළ සේක.

**ද්විතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

**3**. **අර්ථ**:- නවං සන්ථතං, අලුත් සන්ථතයක් (ඇතිරියක්) කාරය මානෙන, කරවනු ලබන්නාවූ; භික්ඛුනා පන, භික්ෂුව විසින් වනාහි, සුද්ධකාළකානං, හුදු කළුවූ (තනිමකළු); එළක ලොමානං, එළුලොම් පිළිබඳ; ද්වෙභාගා, දෙකොටසක්; ආදාතබ්බා, ගතයුත්තාහ; ඔදාතානං, සුදු එළුලොම් පිළිබඳ; තතියං, තුන් වන කොටස ද; ගොචරියානං, කිඹුල්වර්ණවූ; චතුත්ථං, සතර වැනි කොටස ද; ආදාතබ්බා, ගත යුත්තාහුය.

භික්ඛු, මහණතෙම; වෙ, ඉදින්; සුධකාළකානං, හුදුකළුවූ; එළක ලොමානං, එළුලොම් පිළිබඳ; ද්වෙභාගෙ, දෙබාගයක්; අනාද, නොගෙණ; ඔදතානං, සුදු එළුලොම් සම්බන්ධි වූ; තතියං, තුන්වැනි කොටස ද; අනාද, නොගෙණ; නවං සන්ථතං, අලුත් ඇතිරියක්; කාරාපෙය්‍ය, කරවන්නේ නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ;

**සං:-** **"ගොචරියානං"** යී කාළක ඔදත වර්‍ණවත් ලොම් හැර සෙසුවර්‍ණවත් එළුලොම් කපිලවර්‍ණයෙහි ම ඇතුළත් වෙති.

යම් ප්‍රමාණයෙකින් සන්ථතයක් කරනු කැමැත්තේ නම් ඒ ප්‍රමාණය හතරට බෙද කොටස් දෙකක් කාළවර්‍ණ එළුලොම් ද එක කොටසක් සුදුපාට ලොම් ද, අනික් කොටස කපිලවර්‍ණ ලොම් ද ගත යුතුයි.

කළු ලොම් අධික කොට ගැන්ම ප්‍රතික්‍ෂෙප කිරීම සඳහා මේ ශික්‍ෂාපදය පණවන ලදී මෙකී ප්‍රමාණයට වඩා කාළවර්‍ණ එක ලොමයක් නමුත් වැඩිවුව හොත් නිසඟි වේ. අඩුවීමෙන් වරදක් නොවේ.

**"තතියං ඔදතානං චතුත්ථං ගොචරියානනන්ති"** යී හෙඨිම පරිචෙඡද යයි. මොවුන්ගේ වැඩිපුර ගැණීම ප්‍රතික්‍ෂෙප නොකළ බැවින් මෙකී ප්‍රමාණයෙන් අධික වුවද වරී යයි ටීකාවෙහි පෙණෙයි.

**"ඉදං මෙ භන්තෙ සන්ථතං අනාදියිත්වා තුලං ඔදතානං තුලං ගොචරියානං සන්ථතං කාරාපිතං නිස්සග්ගියන්ති"** යී නිස්සජ්ජනය කට යුත්තේය.

**සං:-** **"අනාද"** යී අනාදය කියා කියයුතු නමුදු යකාර ලොපයෙන් මෙසේ සිධයි.

**සං:-** සැවැත්නුවර සවග මහණුන් අරබයා එබඳු සන්ථත කිරීමෙහි අනුදන්නා ලදී. කියන ලද ප්‍රමාණ ගැණීමෙන් හා නොගැණීමෙන් කෙරෙණ බැවින් ක්‍රියාක්‍රිය වශයෙන් වේ.

**සෙස්ස පළමුවැන්නෙහි මෙහි.**

---

# තිදන කථාව

සවග මහණහු හුදු කළු එළුලොම්වලින් සන්ථක කරණය භාග්‍යවතුන්වහන්සේ විසින් වළක්වන ලදයි කියා සුදු එළුලොම් ස්වල්පයක් ඇතුළට දමා සන්ථත කරවති. මෙය අල්පෙච්ඡ භික්‍ෂූහු රුචි නො කළෝය. එපමණක් ද නොවේ. බුදුන්වහන්සේට ද සැළ කළාහුය. එකරුණෙහි දී ශික්‍ෂාපදය අනුදන වදළසේකි

**තෘතීය ශික්‍ෂාපද වර්‍ණනාව නිමි.**

---

4. නවං පන භික්ඛුනා සන්ථතං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරෙතබ්බං. ඔරෙන වෙ භික්ඛු ඡන්නං වස්සානං තං සන්ථතං විස්සජ්ජෙත්වා වා අවිස්සජ්ජෙත්වා වා අඤ්ඤං නවං සන්ථතං කාරාපෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං:

---

4. **අර්ථ**:- භික්ඛුනා පන, භික්ෂුවක් විසින් වනාහි; නවං සන්ථතං. අලුත් ඇතිරියක්; කාරාපෙත්වා, කරවා: ඡබ්බස්සානි. සවසක් (අවුරුදු සයක්); ධාරෙතබ්බං, දැරිය යුත්තේය.

භික්ඛු, මහණ තෙම; වෙ, ඉදින්: ඡන්නං වස්සානං, අවුරුදු සයෙන්; ඔරෙන, මෙපිට (මෑත කාලයෙහි); තං සන්ථතං: ඒ සන්ථතය: විස්සජ්ජෙත්වා වා, (කිසිවෙකුට, දී හෝ: අවිස්සජ්ජෙත්වා වා, නොදී හෝ; භික්ඛු සම්මුතියා අඤ්ඤත්‍ර, සංඝ සම්මුතියෙන් විනා; නවං සන්ථතං, අනික් අභිනව සන්ථතයක්; කාරාපෙය්‍ය, කර වන්නේ නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ;

**සං**:- මෙකී සන්ථත තුණ නිඃසර්ජනය කළායින් පසු නැවත ලැබුවේ නමුත් පරිභොග කිරීම නොවටී. පරිභොගයෙන් දුක්කටයක් සිදුවිය හැකි බැවිනි.

**සං**:- **"ඔරෙන වෙ භික්ඛු ඡන්නං වස්සානං"** යනු වර්ෂ සයක් ඇතුළත හෙවත් වර්ෂ සයක් ගෙවෙන්නට මත්තෙන් යන අදහසයි.

**සං**:- **"අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා"** යි අනුප්‍රඥප්තිය යි.

යම්කිසි ගිලන් භික්ෂුවක් හට සන්ථතයක් නැතිව සයනය කිරීමාදිය අපහසු වේ ද, එසේ ම සන්ථතය ඒ ඒ තැනට ගෙණ යන්නට නොහැක්කේ ද, එබඳු ගිලන් භික්ෂුවට **"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු ගිලානො න සක්කොති සන්ථතං ආදය පක්කමිතුන්ති"** යනාදියෙන් සන්ථත සම්මුතිය දෙයි. සම්මුතිය ලද්දහුට සාවුරුද්දක් ගත නො වූයේ නමුදු අලුත් සන්ථත කරවිය හැක්කේය. පළමු රෝගය සුවවී නැවත නැවතත් එයම නැගෙයි නම් වර්ෂයක් පාසා වූවත් වුවමනාවූ විටෙකැ සන්ථත කරවිය හැක්කේය. නැවත නැවත සම්මුති දනයක් උවමනා නොවේ. **"සො වා ව්‍යාධි පටිකුප්පතු අඤ්ඤො වා සකිං ගිලානොති නාමං ලද්ධං ලද්ධමෙව පුන සම්මුති කිච්චං නත්ථි"** ති අන්රෝගයකින් ගිලන්වුවත් පළමු සම්මුතියම සෑහෙන බැව් උපතිෂ්‍ය ස්ථවිරයෝ කීහු: අලබ්ධසම්මුතිකයාහට ද සාවුරුද්දක් ඇතුළත අනිත් සන්ථතයක් කරන්නහුට ද නිසඟි පචිති වේ.

**"ඉදං මෙ භන්තෙ සන්ථතං ඌනක ඡබ්බස්සෙ කාරාපිතං අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගිය"** ත්ති නිස්සජ්ජනය කට යුත්තේය.

**සං:-** සැවැත්නුවර බොහෝ භික්ෂූන් අරබයා වර්ෂයක් පාසා සන්ථත කාරාපන වස්තුවෙහි පණවන ලදී.

සන්ථත සම්මුතිය යමෙකු විසින් ලබන ලද්දී නම් ඔහුගේ රෝගය යම්තාක්කල් ව්‍යපසමනය නො වේ ද. ව්‍යපසමනය වූයේ නමුත් නැවතත් නැගෙයි ද ඒ තාක් කල් ගිය ගිය තැනදී සන්ථත කරවිය හැක්කේය.

අනුන් සඳහා කරන්ටත් අනිකෙකු විසින් කරන ලද්දක් ලැබ පරිභොග කරන්ටත් වටී.

**සෙසු විස්තර පළමු ශික්ෂාපදයේ මෙනි.**

---

# නිදාන කථාව

සැවැත්නුවර බොහෝ භික්ෂූහු වර්ෂයක් පාසා අලුත් අලුත් සන්ථත කරවති. 'ඔවුහු අපට එළලොම් දෙව්' එළලොම්වලින් අපට ප්‍රයෝජන ඇතැයි යාචන බහුල වූවාහු විඥප්ති බහුල වුවාහු වෙසෙති. මනුෂ්‍යයෝ භික්ෂූන්ට මේ නිසා නොයෙක් අයුරින් ගරහන්ට වූහ.

මේ කාරණය දැන වදළ තථාගතයන් වහන්සේ 'නවං පන භික්ඛුනා - පෙ - නිස්සග්ගියං පාචිත්තියං' යි අනුදැන වදළ සේක්,

එකල්හි කොසඹෑනුවර එක්තරා මහණෙක් ගිලන් විය. ඔහුගේ ඥාතීහු උපස්ථාන කිරීමට ඔහු කැටුව එන්ට යයි දූතයෙකු යැවූහ. ඒ භික්ෂුව ද අලුත් සන්ථත නොකර විය හැකි නිසත් පැරණි සන්ථතය ගෙණයන්ට නොහැකි නිසත්, සන්ථතයක් නොමැතිව අපහසු නිසත් නොගියේය.

මේ බැව් දත් තථාගතයන් වහන්සේ **"අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස භික්ඛුනො සන්ථතසම්මුතිං දාතුං"** යි දෙශනා කොට අනු ප්‍රඥප්තිය අනුදැන වදළ සේක්;

**චතුත්ථ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

5. නිසීදනසන්ථතං පන භික්ඛුනා කාරයමානෙන පුරාණ සන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථි ආදාතබ්බා දුබ්බණ්ණකරණාය. අනාද චෙ භික්ඛු පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං නවං නිසීදනසන්ථතං කාරාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

---

**5. අර්ථ**:- නිසීදනසන්ථතං, හිඳිනා ඇතිරියක්; කාරය මානෙන, කරවන්නාවූ; භික්ඛුනා පන, භික්‍ෂූහු විසින් වනාහි; දුබ්බණ්ණ කරණාය, දුර්වර්ණ කිරීමට; පුරාණසන්ථතස්ස, පැරණි සන්ථතයාගේ; සාමන්තා, හාත්පසින් (-වටේට); සුගතවිදත්ථි, සුගත් වියතක් (පමණ තැන්); ආදාතබ්බා, ගතයුතු.

භික්ඛු, මහණ තෙම; චෙ, ඉදින්: පුරානසන්ථතස්ස, පැරණි සන්ථතයාගේ; සාමන්තා, හාත්පසින්; සුගතවිදත්ථිං, සුගත් වියතක් පමණ තැන්: අනාද(ය), නොගෙණ; නවං නිසීදන සන්ථතං, අලුත් හිඳිනා ඇතිරියක්, කාරාපෙය්‍ය, කරවන්නේ නම්: නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ.

**සං: "නිසීදන සන්ථතං"**යි 'නිසීදනන්නාම සදසං වුච්ච ති'යි පදභාජනයෙහි දක්වෙන හෙයින් මෙය 'සදස සන්ථත යෙකි. මෙහි 'නිසීදන' ග්‍රහණය සන්ථතයෙහි චීවර සංඥව වැළැක්ම පිණිස යයි ටීකාවෙහි දක්වේ.

භික්‍ෂූහු කම්බලචීවර සංඥවෙන් සන්ථත හැර දමා ධූතාඞ්ග සමාදන් වූහ. එහෙයිනි.

**සං:- පුරාණ සන්ථතස්ස**"යි එක්වරක් නමුත් යම්කිසි සන්ථත යෙකැ හිඳගත්තේ නමුදු සයනය කළේ නමුදු එය පුරාණ සන්ථතය යන වහරට යෝග්‍ය වේ.

**සං:- සාමන්තා**"යි එකපසකින් වටවූ (=රවුන්) හෝ සතරැස්වූ හෝ කොටසක් පැරණි සන්ථතයෙන් කපාගත යුතුයි.

සුගත්වියතක් පමණවූ ඒ කොටස අලුත් සන්ථතයේ එක තැනක හෝ කීපපලක සම්බන්ධ කොට කරවිය යුතුයි.

මෙසේ කරන්නේ එය දුර්වර්ණ කිරීමටයි. එ පමණෙක් ද නොවේ. ශ්‍රද්ධාදෙය්‍යය නිරර්ථක නොවීම ද වේ;

මෙහි සුගත් වියත පමණ කළේ උඩත් පිරිසෙයිනි. මෙයට අඩු වුවද ඇවැත් නොවේ.

සං:- **"අනාද!"** යි 'අනාදය' යයි වියු තන්හි යකාර ලොපයෙන් 'අනාද' යි සිද්ධයි. පැරණි සන්ථතයක් ඇත හොත් පළමු කී ප්‍රමාණය නොගෙණ නොකට යුතුයි. නැත හොත් නොගෙණ කළත් වරදක් නොවේ.

**සං:-** සැවැත්නුවර සම්බහුල භික්ෂූන් අරබයා සන්ථත විසජ්ජන වස්තුවෙහි ප්‍රඥප්තයි. සෙසු විස්තර තුන්වැන්න හා සම වේ;

---

# නිදන කථාව

එක් කලෙක බුදුහු භික්ෂූන් අමතා මහණෙනි! මම තෙමසක් පතිසල්ලානය කරණු කැමැත්තෙමි පිණ්ඩපාතනීහාරකයෙකු හැර එහි කිසිවෙකු විසින් නොයායුතු යයි වදළසේක. එය පිළිගත් භික්ෂූහු බුදුහු තෙමසක් පතිසල්ලානය කෙරෙති. එහි පිණ්ඩහාරකයෙකු විනා කිසිවෙකු නොයායුතුයි ගිය හොත් පචිතියක් දෙසා ගත යුතු යයි ද කතිකාවක් කළාහුය.

එකල්හි උපසෙන වඞ්ගන්ත පුත්‍ර තෙමේ පිරිවර සහිත වූයේ බුදුන් කරා ගොස් වැඳ සිටියේය. බුදුහු ද කාලානුරූප දහැම් කථාවෙන් ඔවුන් හා සතුටු වූහ. එකල්හි බුදුහු උපසෙන වඞ්ගන්ත පුත්හුගේ සඞ්විහාරකයෙකුගෙන් තොපට පාංශුකූලය කැමති දැයි ඇසූහ. නො කැමැති යයි කීකල්හි එසේ නම් පාංශුකූලිකවූයේ කුමක් නිසා දැයි ඇසූහ. මගේ උපාධ්‍යායන් වහන්සේ පාංශුකූලිකයෙක, එහෙයිනැයි කීහ.

උපසෙනය! මේ පිරිස පාසාදිකය; කෙසේ නම් පිරිස හික්මවන්නෙහි දැයි ඇසූහ. 'සවාමීනි! යමෙකු මගෙන් උපසම්පදව යාචඤා කළ හොත් ඇවැත්නි මම ආරණ්‍යක වෙමි. පිණ්ඩපාතික වෙමි. පාංශුකූලික ද වෙමි. තෙපි ද එසේ වන්නහු නම් උපසපත් කරන්නෙමියි කියමි. එවිට ඔවුහු ද එසේ සැරසෙති. නිස ඉල්ලූ තැනදී ද මෙසේ ම පිළිපදිමි. සාධු! සාධු!! උපසෙන තෝ මනා කොට පිරිස හික්මවන්නෙහි යයි වදරා; උපසෙනය, සැවැත්නුවර භික්ෂූන්ගේ කතිකාවත දන්නෙහි දැයි ඇසූහ. ස්වාමීනි! සංඝතෙම එයින් ප්‍රකට වන්නේය. අපි නොපණවන ලද්දක් නොපණවන්නෙමු. පණවන ලද්දක් නොසිඳින්නෙමු. පණවන ලද්දෙහි මොනවට හික්මෙන්නෙමුයි කීය. සාධු! සාධු!! උපසෙන! ඒ මැනවි **"අනුජානාමි උපසෙන යෙ තෙ භික්ඛූ ආරඤ්ඤිකා පිණ්ඩපාතිකා පංසුකූලිකා යථා සුඛං මං දස්සනාය උපසඞ්කමන්තූ"** යි අනුදැන වදළ සේක.

6. භික්ඛුනො පනෙව අද්ධානමග්ගපටිපන්නස්ස එළකලොමානි උප්පජ්ජෙය්‍යුං, ආකඞ්ඛමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බානි, පටිග්ගහෙත්වා තියොජනපරමං සහත්ථා හරිතබ්බානි අසන්තෙ හාරකෙ, තතො චෙ උත්තරිං හරෙය්‍ය අසන්තෙපි හාරකෙ, නිස්සග්ගියං පාචිත්තියං.

---

භික්ෂූහු ද වඩගන්න පුත්හට පචිතියක් දෙශනා කරවන්ට සිටියාහුය. උන්වහන්සේ ද භික්ෂූන්ට බුදුහු දෙශනා කළ පරිදි කීහ. එතැන් පටන් ඒ භික්ෂූහු ද බුදුන් දක්නට සන්ථන විසුරුවා දමා ආරණ්‍යකාඞ්ගාදිය සමාදන් වූහ. මේ කරුණ නිමිත්ත කොටගෙණ මේ ශික්ෂාපදය අනුදැන වදළසේක.

**පසළොම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

**6. අර්ථ-** අද්ධානමග්ගපටිපන්නස්ස, අදත්මගට (-දීර්ඝමාර්ගයට) පිළිපන්නාවූ; භික්ඛුනො පන එව, භික්ෂුහට ම වනාහි; එළක ලොමානි, එළුලොම්; උප්පජ්ජෙය්‍යුං, උපන්නාහු (ලැබුනාහු) නම් ආකඞ්ඛමානෙන, කැමැති වන්නාවූ; භික්ඛුනා, භික්ෂුහු විසින්; පටිග්ගහෙතබ්බානි, පිළිගත යුත්තාහ; පටිග්ගහෙත්වා, පිළිගෙණ; හාරකෙ අසන්තෙ, (වෙන) ගෙණ යන්නෙකු නැති කල්හි; තියොජනපරමං, (ගත් සීමාවේ සිට) තුන් යොදුනක් පරම කොට ඇති තැන්; සහත්ථා, සියතින්; හරිතබ්බානි, ගෙණ යා යුත්තාහුය; තතො උත්තරිං, ඒ තුන්යොදුනක් පමණ තැනින් මත්තෙහි; චෙ, ඉදින්; හාරකෙ අසන්තෙ අපි, (වෙන) ගෙණ යන්නෙකු නැති කල්හිත්; හරෙය්‍ය, (තෙමේම) ගෙණ යෙයි නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

**සං:-** **"අද්ධානමග්ගපටිපන්නස්ස"** යනු (අද්ධානමෙව මග්ගො - අද්ධානමග්ගො, තං පටිපන්නො - අද්ධානමග්ගපටිපන්නො; තස්ස = අද්ධානමග්ගපටිපන්නස්ස;) අද්ධාන මාර්ගය නම් දීර්ඝ මාර්ගයයි.

**"අද්ධයොජනං ගමිස්සාමීති භුඤ්ජිතබ්බන්ති"** යනාදීන් 'විභඞ්ග' යෙහි පෙණෙන බැවින් යොදුන් භාගයක් දුර මාර්ගය ද අද්ධානමග්ග සඞ්ඛ්‍යාවෙහි ලා ගත යුතුයි.

එළුලොම් අද්ධානමාර්ගයෙන් අන් තැනක දී ලැබුනේ නමුත් නො පිළිගත යුත්තාහුය.

**සං:-** **"සහත්ථා"** යී කරණාර්ථයෙහි නිස්සක්ක වචනය යි; එහෙයින් 'සහත්ථෙන' කියා අර්ථ ගතයුතුයි. මෙහි සියතින් කියා කීයේ නමුත් යම්කිසි ශරීරාවයවයකින් ගෙණයන්ට ද වටී.

සං:- **"අසන්තෙපි හාරකෙ"** මෙහි 'අසන්තෙයෙව' කියා අවධාරණාර්ථය යෙදේ යයි ටීකාවෙහි කීහු. ගෙණ යන්ට වෙන කෙනෙකු ඇත හොත් ගෙන්වාගෙණ යන්ට වටනේය. නැත හොත් වාතාබාධයක් නිසා හුයකින් නොබැඳ කන් සිදුරෙහි තබන ලද එළුලොම් ඣලපයක් නුමුත් රැගෙණ තුන්යොදුන ඉක්මවා නම් පළමු පියවරෙහි දී දුකුළාව ද, දෙවෙනි පියවර තබා ගත් කල්හි නිසඟි පචිතිය ද වේ.

කම්බල කොජව සන්ථතාදී එළුලොමින් කළ භාණ්ඩ කැමති පරිදි ගෙණ යන්ට වටී. එයින් ඇවතක් නැත්තේය.

**සප්තදශාකාරය**

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයා - එක්තරා මහණෙකි.

වස්තුව - තියොජනාතික්කමණ සංඛ්‍යාත වස්තුවය.

ප්‍රඥප්තිය - සාධාරණ පඤ්ඤත්තියයි, (භික්ඛුනො පනෙව =පෙ=පාචිත්තියං)

ආණත්ති - අනාණත්තිකය

ආපත්ති - තිකපාචිත්තියයි.

තුන්යොදුන් නොවූ තැන තුන්යොත්නට වැඩියයි හඟින්නහුට ද වෙමතිකයාට ද දුකුළාවෙකි.

අනාපත්ති - තුන්යොත්නක් හරණ පච්චාහරණයෙහි ද, වාසාභිප්‍රායයෙන් ගොස් ඊට පසු ගෙණ යාමෙහි ද, අවජිනනයක් හෝ නිස්සට්ඨයක් පිළිලැබ ගෙණ යාමෙහි ද, අනිකෙකු ලවා ගෙන්වාගෙණ යාමෙහි ද, එයින් කළ භාණ්ඩ ගෙණ යාමෙහි ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවෙත්.

විපත්ති - පෙරමෙනි.

අඞ්ග - 'එළකලොමානං අකත භණ්ඩතා, පඨමං පටිලාභො, අත්තනා ආදය වා අඤ්ඤස්ස අජානන්තස්ස යානෙ පක්ඛිපිත්වා වා තියොජනාතික්කමණං, ආහරණ පච්චාහරණං, ආවාසාධිප්පායතා'ති යන අඞ්ග පසෙකි.

7. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා එළකලොමානි ධොවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා විජටාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියං.

---

සමුට්ඨාන - එළකලොම සමුට්ඨානයයි.

කිරියා - ක්‍රියා වශයෙනි.

සඤ්ඤා - නො සඤ්ඤා විමොක්ඛයයි.

චිත්ත - අචිත්තකයි.

වජ්ජ - පණ්ණත්තිවජ්ජයයි.

කම්ම - කාය කර්‍මයයි.

කුශලත්‍රිකය - ත්‍රිචිත්තයයි.

වෙදනාත්‍රිකය - ත්‍රිවෙදනායි.

---

# නිදාන කථාව

එක්තරා භික්‍ෂුවක්හට සැවැත්නුවරට යද්දී (අතරමගදී) එළුලොම් ලැබුනි. උන්වහන්සේ ද සඟලෙහි පොදියක් බැඳ ගෙණ ගියාහුය. මිනිස්සු ඒ දක සවාමීනි කොපමණකින් ගන්නා ලදද? කොපමණ ලාභ දැයි උප්පණ්ඩනය (= කවටකම්) කළාහුය. එයින් ඒ භික්‍ෂුව මඞ්කු වීය. මෙය දත් බුදුහු මේ ශික්‍ෂාපදය අනුදන වදළසේකි.

**සවැනි ශික්‍ෂාපද වර්‍ණනාව නිමි.**

---

**7. අර්ථ** - යො පන භික්ඛු, යම් මහණෙක් වනාහි: අඤ්ඤාති කාය භික්ඛුනියා, නොනෑ මෙහෙණක ලවා: එළකලොමානි, එළුලොම්; ධොවාපෙය්‍ය වා, සෝදවා නම් හෝ; රජාපෙය්‍ය වා, රඳන්කරවා නම් හෝ; විජටාපෙය්‍ය වා, අවුල් හරවා නම් හෝ: නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ.

**සං:-** මෙය ශාක්‍ය ජනපදයෙහි දී සවග මහණුන් අරබයා එළුලොම් ධොවාපන වස්තුවෙහි දී අනුදන්නා ලදී.

මෙහි සියලු විස්තර පුරාණ චීවර ධොවාපන ශික්‍ෂාපදයෙහි මෙනි.

8. යො පන භික්ඛු ජාතරූපරජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං

## නිදාන කථාව

සවග මහණහු භික්ෂුණීන් ලවා එළුලොම් ධොවනය කරවති. එසේම රඳන් කරවති. අවුල් හරවති. එකල්හි භික්ෂුණීහු උදෙස පරිපුච්ඡාදියෙන් හා අධිශීල අධිචිත්ත අධි ප්‍රඥවලින්ද පිරිහෙති. මහා ප්‍රජාපතීගොතමී දිනක් බුදුන් වහන්සේට මේ කරුණ සැළකළාය. එයින් මේ ශික්ෂාපදය අනුදන වදළසේක.

**සත්වැනි ශික්ෂාපද වණ්නා නිමි.**

---

**8. අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක්තෙම වනාහි; ජාතරූප රජතං; රන්රිදී මසුකහවණු; උග්ගණ්හෙය්‍ය වා, (තමන් උදෙසා) ගත්තේ නම් හෝ; උග්ගණ්හාපෙය්‍ය වා (තමන් උදෙසා) අනුන් ලවා ගත්වා නම් හෝ; උපනික්ඛිත්තං, (තමන් පිණිස) එලවා තබන ලද්දක්; සාදියෙය්‍ය වා, (සිතින්) ඉවසයි නම් හෝ; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ.

සං:- **"ජාතරූපරජතං"** යී මෙහි ජාතරූප රජත නම් - රන් රිදී දෙවර්ගයයි, **"ජාතරූපං නාම සත්ථුවණ්ණො වුච්චති"** යි පදභාජනයෙහි කීහු. 'රජත' නම් කහාපණ, ලොහමාසක, ජතුමාසක, දරුමාසකාදි යයි. කහාපණාදී යමක් යමක් යම් යම් දනව්වල ඒ ඒ කාලවලදී ව්‍යවහාර ප්‍රාප්තද ඒ ඒ ජාතරූප රජත යයි ගතයුතුයි.

සමහර කාලවල දී රූනගා කළාවූ ද නොනගා කළාවූ ද අස්ථිමය, චර්මමය, වෘක්ෂමය, බීජමය මුදල් ඇතිවූහ. මතු ද සමහරවිට ඇතිවිය හැක. ඒ සියල්ලම ජාතරූප රජත සංඛ්‍යා වෙහි ලා ගත යුතුයි. මෙකල පවත්නා ලොහමය පවුම් රුපියල් ආදිය ද, කඩදසි වලින් කළ වලංගු සියලුම මුදල් ද, ජාතරූප රජත සංඛ්‍යාවෙහි ලා ගත යුතුයි. ඕඩර චැක් ආදිය ද වටිනා මිලට ගණුදෙනු කරගත හැකි බැවින් ජාතරූපරජත සංඛ්‍යාවෙහි නො ගැණේයයි නො සිතේ. විමසා ගත යුතුයි.

සං:- **"උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය"** යී මෙහි අදහස නම් - **"ඉදං අය්‍යස්ස හොතු"** යි සම්මුඛයෙහි තබා හෝ **"අසුකස්මිං ඨානෙ මම හිරඤ්ඤසුවණ්ණං අත්ථි තං තුය්හං හොතු"** යි නො හමුවෙහි වූ රන්රිදී

මුදලක් හෝ යමෙකු විසින් වචනයෙන් වත් හස්තමුද්‍රාවෙන් වත් පරිත්‍යාග කරණලද කල්හි කයින් හෝ වචනයෙන් හෝ ප්‍රතික්ෂෙප නො කොට සිතින් ඉවසීමයි.

මේ ආකාරයෙන් දෙනලද මුදල් ඇතහොත් එය ප්‍රතික්ෂෙප කට යුතුයි. පිළිගත හොත් සිතින් හෝ ඉවසුව හොත් නිසඟි වේ. යටත් පිරිසෙයින් නිසඟි මුදලකින් රොපනය කරණ ලද වෘක්ෂයක ඡායාව වත් ස්පර්ශ කිරීමට ඒ භික්ෂුවට නො වටනේය.

### සප්තදශාකාරය

නිදනය - රජගහනුවරය.

පුද්ගලයා - උපනන්ද තෙරණුවෝය.

වස්තුව - රූපිය පටිග්ගහණ සංඛ්‍යාත වස්තුවයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි. (යො පන භික්ඛු ජාතරූප රජතං-පෙ-පාචිත්තියං.)

ආණත්ති - සාණත්තිකය.

ආපත්ති - නිකපාචිත්තියයි,

අරූපියෙහි රූපිය සංඥ ඇත්තහුටද, වෙමතිකයාටද, සංඝ චෙතියාදින් සඳහා ගන්නහුටද, මුතු මැණික් ආදී පිළිගන්නාහුටද, දුකුළා වෙති.

අනාපත්ති - රත්න ශික්ෂාපද ක්‍රමයෙන් නිඃක්ෂෙපකරන්නහුට ද උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

විපත්ති - පෙර මෙනි.

අඞ්ග - ජාතරූපරජතභාවො, අත්තුද්දෙසිකතා, ගහණාදිසු අඤ්ඤතර භාවො යි අඞ්ග තුණෙකි.

ක්‍රියා - ක්‍රියාක්‍රියා වශයෙනි.

**සෙස්ස සංවරිත්ත ශික්ෂාපදයෙහි මෙනි.**

---

9. යො පන භික්ඛු නානප්පකාරකං රූපිය සංවොහාරං සමාපජ්ජෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං

---

# නිදන කථාව

ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙමේ එක්තරා කුලයක් හා යහලු විය. එ කුලෙහි බාද්‍යභොද්‍යාදි යමක් සම්පාදිතවී නම් උපනන්ද තෙරණුවන්ට ද කොටස අයිති වේ.

එක් දවසක් සවස් භාගයෙහි එකුලෙහි මාංසයක් සැපයුනි. එයින් කොටසක් කුලුපග භික්ෂූන්වහන්සේට තැබූ නමුත් පසුවද ප්‍රත්‍යුෂ කාලයෙහි එගෙදර ලමෝ එය අනුභව කළාහුය. පසුව වැඩිය තෙරණුවන්ට මෙකරුණ කියා කහවණුවකින් නුඹ වහන්සේට කිනම් මාංසයක් ගෙණෙන්ටදැයි ඇසීය. එවිට ඒ කහවණුව ඉල්ලා ගත්තේය. එයට නොපහන් ගැහැවියා නුගුණ කියන්ට විය. මේ කාරණය බුදුන්වහන්සේට සැළකළ කල්හි මේ ශික්ෂාපදය අනුදැන වදළ සේක.

### අටවැනි ශික්ෂාපද වර්ණනාව නිමි.

---

**9**. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙමේ වනාහි; නානප්පකාරකං, අනෙකප්‍රකාර වූ: රූපිය සංවොහාරං, රන්රිදී මසුකහවණු පෙරළීමට (ගණුදෙනු කිරීමට) සමාපජ්ජෙය්‍ය, පැමිණියේ නම්; නිස්සග්ගිය පාචිත්තියං, නිසඟි පචිති වේ.

සං: **"රූපියසංවොහාරං"** යි මෙහි 'රූපිය' ග්‍රහණයෙන් කත අකත කතාකත වශයෙන් ස්වර්ණාදී සිවුවැදෑරුම් වූ වස්තූහු දක්වෙති. 'රූපිය සංවොහාරය' නම් රන් රිදී මසු කහවණු ගණු දෙනු කිරීමයි. 'පළමු සිකපදයෙන් නිසඟිවස්තු දුකුළා වස්තු පිළිගැණීම වැලැක්විය මෙයින් එය ගණුදෙනු කිරීම වැලැක් වේ.

දුකුළා වස්තුවකින් දුකුළා වස්තූන් හා කැප වස්තූන් ද, කැප වස්තුවකින් දුකුළාවස්තූන් ද, ගණු දෙනු කරන්නහුට දුක්කටයෙකි. නිසඟි වස්තුවකින් නිසගි වස්තුවක් හෝ දුකුළා වස්තුවක් හෝ කැප වස්තුවක් හෝ දුක්කටවත්‍ථු කප්පියවත්‍ථු වලින් නිසඟි වස්තුවක් ද පරිවර්තනය කරන්නහුට නිසඟි පචිති වේ. පළමු කී පරිදි නිස්සජ්ජනය කටයුතුයි. නිස්සජ්ජනය කළ දෙයින් ප්‍රයොජන නො ගත යුතුයි.

10. යො පන භික්ඛු නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

**එළකලොමවග්ගො දුතියො.**

---

**සපනදශාකාරය**

නිදානය - සැවැත්නුවරය

පුද්ගලයෝ - සවග මහණහුය.

වස්තුව - රූපිය සංවොහාර වස්තුවය.

ප්‍රඥප්ති - සාධාරණ ප්‍රඥප්තියයි.

ආණත්ති - අනාණත්තිකය.

අඞ්ග - 'අත්තනො ධනෙන පරිවත්තෙති. තස්ස වා ධනස්ස වා රූපියභාවො පරිවත්තනඤ්ච' යී අඞ්ග දෙකෙකි.

**සෙස්ස අටවැනි ශික්ෂාපදයෙහි මෙනි.**

---

# නිදාන කථාව

සවග මහණහු නානාප්‍රකාර රූපිය සංවොහාරය කළෝය. මනුෂ්‍යයෝ උජ්ඣායනාදිය කළාහුය. අල්පෙච්ඡ භික්ෂූහු මෙය තථාගතයන් වහන්සේට සැළ කළාහුය. බුදුහු එකල්හි මේ ශික්ෂාපදය අනුදත් සේකි.

**නවවැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

10. **අර්ථ** :- යො පන භික්ඛු, යම් මහණෙක් තෙමේ වනාහි; නානප්පකාරකං, (චීවර පාත්‍රා දී කැප භාණ්ඩ වශයෙන්) නන් වැදෑරුම් වූ; කයවික්කයං, ගණු දෙනු කිරීමට; සමාපජ්ජෙය්‍ය, පැමිණියේ නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

**දුතියො, දෙවැනි වූ; එළකලොමවග්ගො.**

**එළුලොම් වර්ගයයි.**

සං:- **"කය වික්කයං"** යී අනුන්ගේ බඩු ගැණීම 'කය' (=ක්‍රය) නම්. තමන්ගේ බඩු දීම 'වික්කය' (=වික්‍රය) නම් රූපිය සංවොහාරය මුලින් කී බැවින් මෙහි චීවරා දී කැපබඩු ගණු දෙනුව යයි සැලකිය යුතුයි.

පඤ්ච සහ ධාර්මිකයන්ගෙන් හැර තමන්ගේ කැප බඩුවක් දී ස්වකීය මවගෙන් නමුත් කැප බඩුවක් ගතහොත් එය නිසගි වේ.

**සප්තදශාකාරය**

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයා - උපනන්ද තෙරණුවෝය.

වස්තුව - කය වික්කය වස්තුවය.

අනාපත්ති - මෙය කොපමණ වටී දැයි අසන්නහුට ද, කැපකරුවෙකු ලවා මෙයින් මෙනම් ද ගෙන දෙන්ට යයි කියන්නහුට ද, ස්වකීය ධනයෙන් ලත් ද ගන්නහුට ද, සහ ධාර්මිකයන් සමග කය වික්කය කරන්නහුට ද, උන්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

අඞ්ග - 'යං අත්තනො ධනෙන පරිවත්තෙති යෙන ච පරිවත්තෙති තෙසං කප්පිය වත්ථුතා, අසහධම්මිකතා, කයවික්කයාපජ්ජනඤ්ච'යී අඞ්ග තුණෙකි.

**සෙස්ස රූපිය සංවොහාර ශික්ෂාවෙහි මෙති.**

# නිදන කථාව

උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ චීවරකර්මයෙහි දක්ෂයෙකි. එක්තරා පිරිවැජියෙක් පටසළුවක් දී අලංකාර ලෙස පඩු පොවන ලද සගල සිවුරක් උපනන්ද ශාක්‍ය පුත්‍රයාගෙන් ගත්තේය. හෙතෙමේ නැවත පටපිළිය ඉල්ලීය. නුමුත් එය නුදුන්නේය. පිරිවැජියෝ භික්ෂූන්ගේ නුගුණ පවසන්ට වූහ. මේ නිමිත්ත කොට ගෙණ මේ ශික්ෂාව අනුදත් සේකි.

දෙවැනි වූ එළකලොම වර්ගයයි.

**දශවැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

1 දසාහපරමං අතිරෙකපත්තො ධාරෙතබ්බො, තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං.

---

1. **අර්ථ**:- දසාහපරමං, දස දවසක් පරම කොට ඇති කාලයක්; අතිරෙක පත්තො, (නො ඉටු නො විකපූ) පාත්‍රය තෙම; ධාරෙතබ්බො, දැරිය යුත්තේය; තං, ඒ (දසාහ පරම) කාලය; අතික්කාමයතො, ඉක්ම වන්නහුට; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ.

**සං**:- **"අතිරෙක පත්තො"** යි ප්‍රකාශිත අයිරිත් පාත්‍රය නම් **"ඉමං පත්තං අධිට්ඨාමි"** යනාදි වශයෙන් අධිෂ්ඨාන නො කළාවූ ද, **"ඉමං පත්තං තුය්හං විකප්පෙමි"** යනා දී ක්‍රමයෙන් විකල්පනය නො කළා වූ ද, උක්කට්ඨමජ්ඣිමොමක පාත්‍රයන් අතුරෙන් ප්‍රමාණවත් එක්තරා පාත්‍රයකි;

'උක්කට්ඨො:- උක්කට්ඨොමකො, උක්කට්ඨුක්කට්ඨො, මජ්ඣිමො, මජ්ඣිමොමකො, මජ්ඣිමුක්කට්ඨො, ඔමකො. ඔමකොමකො ඔමකුක්කට්ඨො' යී පාත්‍රා නවයකි.

මගධ නැළියෙන් දෙනැළියක නො කැඩුන සුපිරිදු සහලින් කළ බත් සියල්ලම බහා ඒ බතින් සතරෙන් කොටසක් පමණ මුග්ග සූප ද, ඒ බතට සෑහෙන පමණ මත්ස්‍යමාංසා දී ව්‍යඤ්ජන ද; ප්‍රක්ෂෙප කළ කල්හි පාත්‍රයෙහි මුවවිටේ යට ඉරට සමව සිටී ද, ඒ 'උක්කට්ඨ පාත්‍රය'යි. මුවවිටේ යට ඉර ඉක්මවා සථූපයක් මෙන් සිටී ද ඒ 'උක්කට්ඨොමකපාත්‍රය' යි. මුවවිට දක්වා නො පිරෙයි නම් 'උක්කට්ඨුක්කට්ඨ පාත්‍රය' යි.

උක්කට්ඨ පාත්‍රයෙන් භාගයක් පමණ වූයේ මජ්ඣිම පාත්‍රයයි. එයින් භාගයක් පමණ වූයේ මජ්ඣිමොමක පාත්‍රයයි. මේ නයින් ඉතිරි පාත්‍රවල ප්‍රමාණය ද සැලකිය යුත්තේය.

මේ පාත්‍ර නවය අතුරෙන් 'උක්කට්ඨුක්කට්ඨො, ඔමකොමකො' යි. දක්වෙන පාත්‍ර දෙක අධිෂ්ඨාන නො කට යුතුයි. පාත්‍ර නොවන බැවිනි. සෙසු පාත්‍ර සත අධිෂ්ඨානාභීයි.

(මෙහි කී මගධ නැළිය නම්, පළම් දෙළහමාරක් පමණ ගන්නා (මනින) භාජන විශෙෂයෙකි. 'මගධ නාළි නාම අඩ්ඪ තෙරස පලා හොති' යී අන්ධට්ඨ කථාවෙහි කීහු. (පලම් 16 ක් මගධ නැළි එකක් යයි වෛද්‍යක ග්‍රන්ථයන්හි සඳහන් වේ. මගධ නැළි එකහමාරක් සිංහල නැළියෙන් එකකි. එබැවින් සිංහල නැළිය මහත් බවත් ද්‍රවිඩ නැළිය කුඩා බවත් මගධ නැළිය ප්‍රමාණවත් බවත් මහාඨිකථාවෙහි කීහු.)

මෙසේ ප්‍රමාණයෙන් යුක්ත වූ ශ්‍රමණ සාරූප්‍ය සේ පිසන ලද අයොමය පාත්‍රයක් හෝ මෑත්මය පාත්‍රයක් හෝ ලද හොත් දසදවසක් ඇතුළත දී අධිෂ්ඨාන කටයුතුයි.

යමෙකුට පාත්‍ර දසයක් ලැබී දසයම පරිභොග කරන්ට කැමති වී නම් එකක් අධිෂ්ඨාන කොට දෙවෙනි දින එය පච්චුද්ධරණය කොට ලා අනිකක් අධිෂ්ඨාන කටයුත්තේය. මේ ක්‍රමයෙන් වර්ෂ සියයක් වුවත් පරිහරණය කළ හැක්කේය.

යම්කිසි පාත්‍රයක මුවවිටෙන් අහල් දෙකකට පහලින් තණ බත් තුලක් පිට විය හැකි සිදුරක් වුවහොත් අධිෂ්ඨානාහී නොවේ. ලොහාදියකින් සිදුර වසා අධිෂ්ඨාන කට යුතුයි.

සං:- සැවැත් නුවර සවග මහණුන් අරබයා අතිරෙක පාත්‍ර ධාරණ වස්තුවෙහි පණවන ලදී. අසාධාරණ ප්‍රඥප්තිය යි. සෙසු විස්තර චීවර වර්ගයෙහි පළමු වැනි ශික්ෂාවෙහි මෙනි.

---

## නිදන කථාව

එක් කලෙක සවග භික්ෂූහු බොහෝ පාත්‍ර රැස් කළාහුය. විහාර චාරිකාවෙහි හැසිරෙණ මනුෂ්‍යයෝ පාත්‍ර සමූහය දැක මේ භික්ෂූහු බොහෝ පාත්‍ර රැස් කෙරෙති. කිම? පාත්‍ර වෙළඳම කෙරෙත් දැයි කියා උජ්ඣායනා කරන්ට වූහ. මේ ඇසූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට දන්වූහ. එවිට "යො පන භික්ඛු අතිරෙක - පෙ - පාචිත්තියං" යි අනුදත් සේක.

එකල්හි ආනන්ද ස්ථවිරයන් වහන්සේට අතිරෙක පාත්‍රයක් උපන. එය ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේට දෙනු කැමති වූහ. එහෙත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ එකලැ සාකෙතයෙහි වෙසෙති. මෙහිදී කෙසේ පිළිපදින්නමෝදැයි සිතා තථාගතයන් වහන්සේට සැළකළාහුය. බුදුහු ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ පෙරලා එන දින අසා වදරා මේ ශික්ෂාපදය අනුප්‍රඥප්තියකින් පිරිපුන් කොට "දසාහපරමං-පෙ-පාචිත්තියං" යි අනුදන වදළසේක.

**පාත්‍ර වර්ගයෙහි ප්‍රථම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

2. යො පන භික්ඛු ඌනපඤ්චබන්ධනෙන, පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

තෙන භික්ඛුනා සො පත්තො භික්ඛුපරිසාය නිස්සජ්ජිතබ්බො යො ච තස්සා භික්ඛුපරිසාය පත්තපරියන්තො සො තස්ස භික්ඛුනො පදාතබ්බො අයං තෙ භික්ඛු පත්තො යාව භෙදනාය ධාරෙ තබ්බොති අයං තත්ථ සාමීචි.

---

2. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙමේ වනාහි; ඌනපඤ්චබන්ධනෙන, බන්ධන පසකින් අඩුවූ (උනුපස්බාන්) පත්තෙන, පාත්‍රයකින් උපලක්ෂිතව; (පා ඇතියාව) අඤ්ඤං නවං පත්තං, අනික් අලුත් පාත්‍රයක්; චෙතාපෙය්‍ය, ඉල්ලා ගණී නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

තෙන **භික්ඛුනා**, ඒ මහණහු විසින්; සො පත්තො, ඒ (චෙතාපිත) ඉල්වාගත් පාත්‍රය තෙම; භික්ඛු පරිසාය, භික්ෂු පිරිසෙහි; නිස්සජ්ජිතබ්බො, නිස්සජ්ජනය (-ආලය හැරපීම) කළ යුත්තේය.

තස්සා භික්ඛුපරියාය, ඒ භික්ෂු පිරිසෙහි; යො ච පත්තපරියන්තො, (හැමදෙනා වහන්සේම ගෙණ) කෙළවර ලද යම් පාත්‍රයෙක් වේද; තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහට; භික්ඛු, මහණ! තෙ, තා විසින්; අයං පත්තො, මේ පාත්‍රය තෙම; යාව භෙදනාය, බිඳීම දක්වා; ධාරෙතබ්බො ඉති, දැරිය යුත්තේයයි කියා; පාදතබ්බො, දිය යුත්තේය; අයං, මේ; තත්ථ, එහි; සාමීචි, වතයි. (පැවැත්මයි.)

**සං**:- "**ඌනපඤ්චබන්ධනෙන**"යි (ඌනානි පඤ්ච බන්ධනානි අස්සාති-ඌනපඤ්චබන්ධනො, තෙන, ඌනපඤ්චබන්ධනෙන; (ඉත්ථම් භූතාර්ථයෙහි කරණයි) බන්ධන (-පිළියම්) පසක් නො පිරිණාවූ (පාත්‍රයකින් යුක්තව) යන අදහසයි.

බන්ධන එකකින් වත් යුක්ත නොවූ පාත්‍රයද ඌනපඤ්ච බන්ධන සංඛ්‍යාවෙහි ගිණිය හැකියි. ඒ නිසා පද භාජනයෙහි "**ඌනපඤ්චබන්ධනො නාම පත්තො**, **අබන්ධනොවා එකබන්ධනො වා**"ති යනාදීන් කියන ලදී.

බන්ධන පසක් පිරුණ කල්හි අලුත් පාත්‍රයක් ලබාගත හැකි වේ.

යම්කිසි පාත්‍රයක මුවවිටෙන් යට දෙයඟුලක් පමණ ඉරක් ගියේ නම් පාත්‍ර විදින කුටුවකින් විද හූ - ලනු ආදියකින් බැඳ ආමිස නොරැඳීම පිණිස යම්කිසි ඉටි ආදියකින් වසා දැමිය යුතුයි.

නැතහොත් පැණි ගල්කුඩු දෙවගීයෙන් පිළියම් කට යුතුයි. මේ ක්‍රමයෙන් අහල් අටක් දිගට බිඳීගිය ඉරක් ඇති පාත්‍රයක් වුවත් බැම් සතරක් කොට ගත යුතුයි. දසඟුලක් පමණ දිගට බිඳුන හොත් එය බැන්දත් පරිභොග නො කට යුතුයි. මේ මැටි පාත්‍රය පිළිබඳවයි.

අයොමය පාත්‍රය හිල් පහකට වැඩිවූවත් පිළියම් කට හැකි නම් එසේ කොට පරිභොග කට යුතුයි.

**සඃං-** **"පත්තපරියන්තො"** යි කෙළවර පාත්‍රය කියවේ. මෙය ලැබෙන ක්‍රමය මෙසේයි. යම්කිසි මහණකුගේ නිසගි පාත්‍රය යම් භික්ෂු පිරිසෙක්හි නිඃසජනය කරණු ලැබේ නම් නිසගි පාත්‍රය වැඩිමහලු මහණ විසින් ගතයුතුයි. ඒ භික්ෂුහුගේ පාත්‍රය දෙවැනි මහණ විසින් ගතයුතුයි. මේ ක්‍රමයෙන් අන්තිමේදී නවක භික්ෂුහුගේ පාත්‍රය ඉතිරි වේ. එයම කෙළවර පාත්‍රයයි. එය මේ භික්ෂුහට දියයුත්තේය. ඒ භික්ෂුහු විසින් එය ගරු වශයෙන් පිළිගෙණ බිඳෙන තුරු පරිභොග කටයුතුයි.

## සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | ශාක්‍ය දනව්වය. |
| පුද්ගලයෝ | - | සවග මහණහුයි. |
| වස්තුව | - | බහු පාත්‍ර විඥපන යයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | අබන්ධන - එකබන්ධන - ද්විබන්ධන- තිබන්ධන- චතු බන්ධන - අබන්ධනොකාස - එක, ද්වි, ති, චතු බන්ධනො කාස, පාත්‍ර ඉල්වන්නහුට එක පාත්‍රයෙක්හි දශය බැගින් දශ පාත්‍රයකින් නිසගි පචිති සියයකි. |
| අනාපත්ති | - | නෂ්ඨ පාත්‍ර ඇත්තවුන්ට හා භින්න පාත්‍රාදීන්ටද ඇවත නොවේ. |
| අඞ්ග | - | 'අධිට්ඨානුපගපත්තස්ස ඌනපඤ්ච බන්ධනතා, අත්තුද්දෙසිකතා, අකතවිඤ්ඤත්ති, තාය ච පටි ලාභො'යි අඞ්ග සතරෙකි. |

සමුට්ඨානාදිය ධොවන ශික්ෂාවෙහි මෙනි.

3. යානි ඛො පන තානි ගිලානානං භික්ඛූනං පටිසායනීයානි භෙසජ්ජානි: සෙය්‍යථීදං සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං, තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි තං අතික්කමයතො නිස්සග්ගියං පාචිත්තියං.

---

# නිදාන කථාව

එක්තරා කුම්භකාරයෙක් තෙමේ පාත්‍ර වලින් භික්ෂූන් පැවරිය. භික්ෂූහු පමණ නොදන පාත්‍ර ඉල්ලූහ. එකල්හි කුම්භ කාරයා කිපී බණින්ට විය. එහිදී නටුවාවූ ද බිඳුනාවූ ද පාත්‍ර ඇත්තන්ට පමණක් පාත්‍ර විඥපනයට අනුදත්හ. එකල්හි ෂඩ්වර්ගීය භික්ෂූහු සවල්පවූ ඉරකින් - හිලකින් නමුදු පාත්‍ර වීසි කොට අලුත් පාත්‍ර ඉල්ලන්ට වූහ. එකල්හි මේ ශික්ෂාව අනුදන වදළසේක.

**ද්විතීය ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

---

3. **අර්‍ථ**:- ගිලානානං භික්ඛූනං, ගිලන් මහණුන් විසින්: පටිසායනීයානි, අනුභව කටයුතුවූ; යානි ඛො පන තානි භෙසජ්ජානි, යම් ඒ භෛෂජ්‍ය කෙනෙක් ඇද්ද: සෙය්‍යථීදං, ඔවුහු කවරහුද? යත්; සප්පි, ගිතෙල්ය; නවනීතං, වෙඬරුය; තෙලං, තලතෙල්ය; මධු, මීය; ඵාණිතං, උක්පැණිය; යන මොහුයි. තානි, ඒ (බෙහෙත්) පටිග්ගහෙත්වා, පිළිගෙණ; සත්තාහ පරමං, සත් දිනකට වැඩිනොවන කාලයක්; සන්නිධිකාරකං, සන්නිධි කොට (=සුරක්ෂිත කොට තබා) පරිභුඤ්ජිතබ්බානි, අනුභව කටයුත්තාහුය. තං, ඒ සත්දිනට වැඩි කාලය; අතික්කාමයතො, ඉක්මවන්නහුට; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ.

**සං**:- **"පටිසායනීයානි"** යී (පටිසායිතබ්බානි - පටිසායනීයානි,) පරිභොග කටයුතුවූ යන අර්‍ථයි. අනුපසම්පන්නයෙකු ලවා පිළිගන්වා නොගෙණ තෙමේම අරන් තබන ලද්දක් සත් දවසක් ඉක්ම ගියේ නමුත් ඇවැත් නොවන බැව් දක්වයි. එහෙත් අනුභව කිරීමට නො වටී.

**සං**: **"භෙසජ්ජානි"** යනු (භිසජස්ස ඉමානි - භෙසජ්ජානි) යම්කිසි සත්ප්‍රාය ද්‍රව්‍යයන්ට භෛෂජ්‍යයයි ව්‍යවහාර කෙරෙති. බෙහෙත් කිස පිණිස ගත්තත් නොගත්තත් මෙවැනි ව්‍යවහාරයක් ලබන ලද්දෝ මෙයින් කියවෙති. **"භෙසජ්ජකිච්චං කරොන්තු වා මා වා එවං ලද්ධවොහාරානීති"**යි කීහු.

සඃ- **"සප්පිං - පෙ-ඵාණිතං"** යී මෙයින් සත්තාහකාලික නිස්සග්ගිය වස්තූ දක්වෙති; 'සප්පි' නම් ගිතෙලයි. ගව එළු ආදී දෙනුන්ට කිරි ඇති බැවින් සප්පිද ඇතිවිය යුතුයි. ගවාදී යම්කිසිවෙකුගේ මස් කැපද ඇගේ කිරෙන් තිපන් ගිතෙලද කැප වේ. 'නවනීතං' ද මෙසේ මැයි. 'තෙල' නම් තල, අබ, මී, එරඬු ආදියෙන් තිපදවන තෙල්ය. උක්රස ආදී සියලු ඉක්ෂු විකෘතීහු 'ඵාණිතං' යන්නෙන් ගැණෙති.

සං:- **"සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි"** යි පෙරවරු කාලයෙහි පිළිගත්නාලද ගිතෙල් ආදිය එදවස පෙරවරු කාලයෙහි සාමිස පරිභොගයෙන්ද, පස්වරු කාලයේ සිට ඒ පිළිගත් ගිතෙල් ආදියත් පස්වරු කාලයෙහි පිළිගත්නා ලද දත් සත් දවසක් නිරාමිස පරිභොගයෙන්ද පරිභොගය වට්.

යාවජීවිකවූ අබ ඇට මී ඇට එරඬු ඇට තෙල් සෑදීම සඳහා පිළිගෙණ පිළිගත් දිනම කළ තෙල් සත්තාහ කාලික වේ. දෙවෙනි දින කරණලද තෙල් සදවසක්ද, තුන්වෙනි දින කරණ ලද්ද පස් දවසක්ද තබාගෙණ පරිභොග කළ හැක. සතර වෙනි පස්වෙනි සවෙනි සත්වෙනි දවස්වල කරණ ලද්ද ද ඒ ඒ පරිද්දෙන්ම වට්. මෙහි කී කාලසීමා ඉක්මවා අරුණක් නැගුන හොත් එතැන් පටන් නිසගි වේ.

සං:- සැවැත්නුවර බොහෝ භික්ෂූන් අරබයා සත්තාහාතික්කමන වස්තුවෙහි අනුදන්නා ලදී. සෙසු විස්තර චීවර වර්ගයෙහි පළමු ශික්ෂාවෙහි මෙනි.

## නිදාන කථාව

ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙරණුවෝ දුගී උපස්ථායක කුලය නිදහස් කරණුවස් බිම්සර රජුගේ පහය සවර්ණමය වනසේ ඉටූහ. එයින් පහන් මනුෂ්‍යයෝ උන්වහන්සේට සප්පිනවනීතාදිය ගෙණ ගියාහුය. ලැබෙන ලැබෙන තෙල් ආදිය හැළිවල කළවල පුරවා තැබූහ. විහාර චාරිකාවෙහි හැසිරෙණ මිනිස්සු මේ දක නුගුණ පහළ කළහ. ඒ දත් බුදුහු මේ ශික්ෂාපදය අනුදත් සේකි.

**තෘතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

4. මාසො සෙසො ගිම්හානන්ති භික්ඛුනා වස්සිකසාටිකචීවරං පරියෙසිතබ්බං, අඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙ තබ්බං, ඔරෙන චෙ මාසො සෙසො ගිම්හානන්ති වස්සිකසාටිකචීවරං පරියෙසෙය්‍ය, ඔරෙන'ඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

---

4. **අර්ථ**:- ගිම්හානං, ග්‍රීෂ්ම සාරමාසය අතුරෙන්; මාසො, මසෙක්; සෙසො ඉති, ශෙෂව (ඉතිරිව) සිටියේ යයි (කියයුතු කල්හි) භික්ඛුනා, භික්‍ෂුහු විසින්; වස්සික සාටික චීවරං, වැසිසළු සිවුරක්; පරියෙසිතබ්බං, සෙවිය යුත්තේ ය. ගිම්හානං ග්‍රීෂ්ම සාරමාසය අතුරෙන්; අඩ්ඪමාසො, අර්ධ මාසයෙක්; සෙසො, ඉති, ඉතිරිවූයේ යයි (කියයුතු කල්හි) කත්වා, (මැසීමාදිය) කොට (නිමවා:) නිවාසෙතබ්බං, හැන්ද යුතුයි. ගිම්හානං ග්‍රීෂ්ම සාරමාසය අතුරෙන්; මාසො, මසෙක්; සෙසො ඉති, ඉතිරිව සිටියේයයි; (කියයුතු කලට:) ඔරෙන, මෑතින්; (පශ්චිම මාසයට කලින්) චෙ; ඉදින් වස්සික සාටික චීවරං, වැසිසළු සිවුරක්; පරියෙසෙය්‍ය, සොයන්නේ නම්; ගිම්හානං, ග්‍රීෂ්ම සාරමාසය අතුරෙන්; අඩ්ඪමාසො, අර්ධ මාසයෙක්; සෙසො ඉති, ඉතිරිව සිටියේ යයි; (කියයුතු කලට) ඔරෙන, මෑතම හෙවත් පශ්චි මාර්ධ මාසයට කලින් ම; කත්වා, (ගෙත්තම් ආදිය) කොට (නිමවා) නිවාසෙය්‍ය, හඳින්නේ නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ.

සං:- "**මාසො සෙසො ගිම්හානන්ති**" යී මැදින් මස කාළ පක්‍ෂයේ සිට ඇසළ මස පුරපක්‍ෂය තෙක් ඇති සාරමස ග්‍රීෂ්මඍතුව යයි කියනු ලැබේ. මේ ග්‍රීෂ්ම ඍතුවේ අන්තිම මාසයේ පළමුවෙනි දවසේ පටන් හෙවත් පොසොන් මස කාළ පක්‍ෂයේ සිට ඇසළ මස පුරපක්‍ෂය තෙක් ඇති තිස්දවසේ මුලසිට සංඝයාට පැවරූ තැනකින් වැසිසළු සොයාගත යුතුය. ඥාතීන් විසින් පවරණ ලද තැනකින් නම් 'දෙථ මෙ වස්සික සාටික චීවරං' යි විඥප්තියෙන් නමුදු වැසිසළු සොයාගත යුතුය. අඥාතක අප්පවාරිත ස්ථානයන්හි වැසිසළු පිළිබඳ සිහිකරවන්නහුට වත්තභෙදයෙහි දුකුළාවෙක් වේ. එසේ ම 'දෙථ මෙ' යනාදී වශයෙන් ඉල්වන්නහුට අඥාතකවිඥප්තියෙන් නිසඟි පචිතියෙක් ද වේ.

සං:- "**අඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති**" ගිම්හාන ඍතුවේ පශ්චිමාර්ධමාසය නම්- පොසොන් මස කාළපක්‍ෂයේ උපොසථය ඉක්මී පැමිණෙන පාටිපාදයෙහි පටන් ඇසළ මස පුණුපොහොය දක්වා ඇති පසළොස් දවසයි. මේ ග්‍රීෂ්ම ඍතුවේ අන්තිම අර්ධමාසය වේ.

මේ අධිමාසයේ පාටිපදයෙහි පටන් වැසිසළුව පෙරවිය යුතුයි. එබැවින් ග්‍රීෂ්ම ඍතුවේ පශ්චිම මාසය 'පරියෙසනකෙබත්ත' නම් වේ. පශ්චිම අධිමාසය 'කරණකෙබත්ත' යයි ද 'නිවාසනකෙබත්ත' යයි ද කියති. වස්සාන ඍතුවේ සිවුමාසයේම වැසිසළු පරිභොග කිරීමට වටනේය.

ග්‍රීෂ්ම ඍතුවේ අන්තිම මාසයේ වැසිසළුව සෙවුයේ නම් අධිෂ්ඨාන නොකට යුතුයි. කුමක් නිසාද? යත්; සමහර විටෙක ඒ මාසය ගිය තැන වස්සුක්කඩ්ඪනය කළ හැකි වේ; එබැවිනි. එසේ වස්සුක්කඩ්ඪනය කළ හොත් තව මසක් පරිහාර ලැබේ. වැසිසළුව සෝද තබා වස් එළඹෙන දවසෙහි අධිෂ්ඨාන කටයුතුයි.

සිහිමුළා වීමෙන් (අමතක වීමෙන්)' හෝ වැසිසළුවට නොපොහොනා බැවින් හෝ නො කරණ ලද නම් ඒ දෙමසත් වස්සාන ඍතුවේ සාරමාසයත් යන සමසක් පරිහාර ලැබෙයි. ඉල්මාසයේ කෙළින් අතුළ හොත් තවත් සාරමසක් සමග දසමසෙක් පරිහාර ලැබෙයි.

ඊට පසු ද කරුණක් ඇති කල්හි මේ චීවරය මූළ චීවරයද කළහොත් තවත් මසෙක්දයි එකොළොස් මාසයක් පරිහාර ලැබෙයි.

## සපතදශාකාරය

තිදානය - සැවැත් නුවරයි.

පුද්ගලයෝ - සවග භික්ෂූහුය.

වස්තුව - වස්සික සාටිකා පරියෙසන යයි.

ප්‍රඥප්ති - අසාධාරණ ප්‍රඥප්ති යයි.

ආණත්ති - අනාණත්තික යයි.

ආපත්ති - තිකපාචිත්ති යයි.

ඌන වූ මාසාධිමාසයන්හි වැඩි යයි හඟින්නහුට ද, වෙමතිකයාට ද, වැසි සළුව තිබියදීත් නග්නව කය ඔවස්සාපනය කරන්නාට ද දුකුළා වේ.

අනාපත්ති - අච්ඡින්නචීවරාදීන්ට හා උම්මත්තකාදීන්ට ඇවත නොවේ.

5. යො පන භික්ඛු භික්ඛුස්ස සාමං චීවරං දත්වා පච්ඡාකුපිතො අනත්තමනො අච්ඡින්දෙය්‍ය වා අච්ඡින්දාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියං.

---

අඞ්ග - වස්සික සාටිකාය අත්තුද්දෙසිකතා, අසමයෙ පරියෙසනං, තාය ච පටිලාභො'යි පරියෙසනයෙහි අඞ්ග තුනෙකි.

සචීවරතා, ආපදභාවො, වස්සික සාටිකාය සක භාවො, අසමයෙ නිවාසනං, කියා නිවාසනාපත්තියෙහි අඞ්ග සතරෙකි.

සමුට්ඨානාදිය ධොවාපන ශික්ෂාවෙහි මෙනි.

**චතුත්ථ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

# නිදාන කථාව

භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට වැසිසළු අනුදන වදළ සේකැයි කියා සවග මහණහු කලින්ම වැසිසළු සොයති. කලින් මැසීමාදිය කොට පෙරවති. වැසිසළු දිරුණු කල්හි නග්නව සිරුරු තෙමති. මෙයින් ප්‍රියශීලි භික්ෂූහු දෙස් කියන්නට වූහ. තථාගතයන් වහන්සේටද සැළ කළහ. එකල්හි මේ ශික්ෂාව පණවා වදළ සේකි.

---

**5. අර්ථ:-** යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; භික්ඛුස්ස, භික්ෂුවක් හට; සාමං චීවරං දත්වා, (මෙහෙ කිරීමාදියට කැමැතිව.) තෙමේම සිවුරක් දී; කුපිතො, (මෙහෙවරාදිය නො කරණ බැවින්) කිපියේ; අනත්තමනො, නො සතුටු සිත් ඇත්තේ; අච්ඡින්දෙය්‍ය වා, (තමාගේ යයි) පැහැර ගණී නම් හෝ; අච්ඡින්දාපෙය්‍ය වා, (අනුන් ලවා) පැහැර ගන්වා නම් හෝ, නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ.

**සං:-** **"සාමං චීවරං දත්වා"** යී වතාවත් ආදිය කරවා ගන්නා බලාපොරොත්තුවෙන් තමන් විසින් ම සිවුරක් දීම මෙයින් ප්‍රකාශ වේ. එහෙත් නිස්සට්ඨ චීවරය දීම නොවේ.

**සං:-** **"අච්ඡින්දෙය්‍ය"** යනු වතාවතාදිය තමන් බලාපොරොත්තු පරිදි නොකරන්නහු දැක තමන්ගේ යයි සිතා නැවත ගන්නහුට වස්තු ගණනින් ඇවැත් වේ. මෙයින් පාරාජික අභාවය දක්වන බැව් ටීකාවෙහි කීහු.

සං:- **"අච්ඡින්දපෙය්‍ය"** යි ම විසින් දෙන ලද චීවරාදි සියල්ලම ගණුවයි අණ කරන්නහුට එක් දුකුළාවෙක් වේ. පැහැරගත් කල්හි එක වචනයෙන් ම බොහෝ පචිති වෙති. ඒ නිසා 'අච්ඡින්නෙසු වත්‍ථු ගණනාය ආපත්තියො'යි කීහු.

සමන්තපාසාදිකාවෙහි - සිවුරක් ගණුවයි අණ කෙළේ නම් දුකුළාවෙකි. අණවන ලද්දේ සිවුරු ආදී රාශියක් ගත්තේ නමුදු එක පචිතියෙකැයි කිය වේ. එකට සමබන්ධ වූ කීපයක් ගැණ නිසා අථ කථාවෙහි කියන ලද ක්‍රමයට විරුද්ධ නොවේ.

යම්හෙයකින් සංඝාටිය ගණුව, උත්තරාසඞ්ගය ගණුවයි අණ කෙරේද වචනයක් පාසා දුකුළා වෙති. පැහැරගත් කල්හි වස්තු ගණනින් පචිති වෙති.

**"ඉදං මෙ භන්තෙ චීවරං භික්ඛුස්ස සාමං දත්වා අච්ඡින්නං නිස්සග්ගියං"** යි නිස්සජ්ජනය කටයුත්තේය.

**සප්තදශාකාරය.**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයා | - | උපනන්ද තෙරණුවෝය. |
| වස්තුව | - | චීවර පැහැර ගැණීම් නැමැති වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. |
| ආණත්තිය | - | සාණත්තිකයි. |
| ආපත්ති | - | තිකපාචිත්තියයි. අනුපසම්පන්නයා උපසපන්යයි හඟින්නහුට ද, වෙමතිකාදීන්ට දුකුළාවෙකි. |
| අනාපත්ති | - | සතුටින් හෝ කිපීමෙන් හෝ දෙනලද්දක් විශ්වාසග්‍රාහී ව ගත්නහුට ද, උම්මත්තකාදීන්ටද ඇවැත් නොවෙති. |
| අඞ්ග | - | විකප්පනූපගපච්ඡිමචීවරතා, සාමං දින්නතා, සකසඤ්ඤිතා, උපසම්පන්නතා, කොධවසෙන අච්ඡින්දනං වා, අච්ඡින්දාපනං වා, කියා අඞ්ග පසෙකි. |

සමුට්ඨානාදිය අදින්නාදන ශික්ෂාවෙහි මෙනි.
මෙහි වෙදනාව වනාහි දුක්ඛ වෙදනාවයි.

**පසළොස්වම ශික්ෂාපද වණ්නාව නිමි.**

6. යො පන භික්ඛු සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

---

# නිදාන කථාව

ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙම සහෝදරයාගේ සද්ධිවිහාරික භික්ෂුවට මෙසේ කීය. ඇවැත්නි, එව; ජනපද චාරිකාවෙහි හැසිරෙන්නෙමියි කියායි. ස්වාමීනි! මාගේ සිවුරු දුර්වලය. එබැවින් නො යන්නෙමියි කීයේය. ඇවැත්නි මම සිවුරක් දෙන්නෙමි එවයි කියා සිවුරක් දුන්නේය.

එකල්හි බුදුහු ද ජනපදචාරිකාවෙහි වඩිත් යයි ඒ භික්ෂුහට අසන්ට ලැබුනේය. එබැවින් උපනන්ද ශාක්‍යපුත්‍රයා සමග ජනපද චාරිකාවෙහි නො ගියේය. එයින් කිපුනු උපනන්ද ශාක්‍ය පුත්‍රතෙමේ තමා දුන් සිවුර පැහැර ගත්තේය. මේ බැව් දත් බුදුහු මේ ශික්ෂාව අනුදත් සේකි.

---

6. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; සාමං, තෙමේම; සුත්තං විඤ්ඤාපෙත්වා, (සිවුරු සඳහා) නූල් ඉල්වා ගෙණ; තන්තවායෙහි, (නොනෑ නොපැවරු) පෙහෙරුන් ලවා; චීවරං, සිවුරක්; වායාපෙය්‍ය, වියවා නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ.

**සං**:- "**සුත්තං**" යී ඛොමං, කප්පාසියං, කොසෙය්‍යං කම්බලං, සාණං, භඞ්ගං, යන සවැදෑරුම් නූල් හා තදනුලොමික වූ දුකූලං, පත්තුණ්ණං, සොමාරපට්ටං, චීනපට්ටං, ඉද්ධිජං, දෙවදින්නං, යන සවැදෑරුම් නූල් ද ගැණෙති.

**සං**:- "**වායාපෙය්‍ය**" යි 'චීවරං මෙ ආවුසො වායථ' කියා නො කැප විඥප්තියෙන් විකප්පනුපග චීවරයක් වියවන්නහුට නිසඟි වේ.

මෙසේ තමන් උදෙසා සිවුරක් වියවන කල්හි තන්තවායයාගේ (වියන්නාගේ) තුරි වෙම සජ්ජනාදී හැම ප්‍රයොගයක් පාසාම මෙහෙයූ භික්ෂුහට දුකුලා වෙති. ('තුරි' යනු ද 'වෙම' යනු ද වායනොපකරණ දෙකෙකි.) තුරි ආදි වායනොපකරණ නැත හොත් ඔවුන් පිළියෙළ කිරීම සඳහා වෑ පොරෝ ආදිය සෙවීම රුක් කැපීමාදී හැම ප්‍රයොගයක් පාසා දුකුළා වෙති. විකල්පනයට පොහොනා පශ්චිම සිවුර පමණට වියූ කල්හි නිසඟි පචිති වේ.

එහෙයින් **"දීඝතො විදත්ථිමත්තෙ තිරියං ච හත්ථමත්තෙ විතෙ නිස්සග්ගියං පාචිත්තියං"**යි කීහු. එකී නිසහි සිවුර **"ඉදං මෙ භන්තෙ චීවරං සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි වායාපිතං නිස්සග්ගියං"** කියා නිස්සජ්ජනය කළ යුත්තේය.

## සප්තදශාකාරය

නිදානය - රජගහනුවරය.

පුද්ගලයෝ - සවග මහණුහුය.

වස්තුව - චීවර වායාපන වස්තුවය.

ප්‍රඥප්ති - සාධාරණ ප්‍රඥප්තිය ය.

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - තිකපාචිත්තිය ය.

(ඉල්වා ගන්නා ලද නූල් වලින් විඤ්ඤපිත පෙහෙරුවෙකු ලවා වියවන්නහුට දිගින් වියතක් පමණද පුළුලින් රියනක් පමණ ද වියූ කල්හි නිසඟි පචිති වේ. මෙසේ සිවුර වැඩෙන තාක් (ලොකු වෙන්ට වෙන්ට) ඇවැත් ද වැඩෙති. ඔහු ලවාම නො ඉල්ලා ලත් නූලින් වියවන්නහුට දුකුළාවද, එසේම ඉල්වා ලත් නූලින් හා නො ඉල්ලා ලත් නූලින් වියවන්නහුට නො කැප නූලින් වියූ ගණයෙහි පචිතිය ද, අතික් කොටසෙහි දුකුළා වද වෙති. මේ ආකාරයෙන් සිදුවිය හැකි ඇවැත් වෙසෙස් අර්ථ කථාවෙන් බලාගත යුතුයි.)

අනාපත්ති - සිවුරු මැසීමට හා කා බහන් අංසවට්ට පත්තත්ථවික පරිස්සාවන, යන මොවුන් සඳහා නූල් ඉල්වන්නහුට ද, නෑයන් විසින් පවරණ ලද්දෙකු ලවා කැපනූලින් වියවන්නහුට ද, තමන්ගේ ධනයෙන් ගන්නහුට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවෙති.

7. භික්ඛුං පනෙව උද්දිස්ස අඤ්ඤාතකො ගහපති වා ගහපතානි වා තන්තවායෙහි වා චීවරං වායාපෙය්‍ය. තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය. ඉදං බො අවුසො චීවරං මං උද්දිස්ස වීයති ආයතඤ්ච කරොථ විත්ථතඤ්ච අප්පිතඤ්ච සුවීතඤ්ච සුප්පවායිතඤ්ච සුවිලෙඛිතඤ්ච සුවිතච්ඡිතඤ්ච කරොථ අප්පෙව නාම මයම්පි ආයස්මනතානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමාති. එවඤ්ච සො භික්ඛු වත්වා කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍ය අන්තමසො පිණ්ඩපාතමත්තම්පි නිස්සග්ගියං පාචිත්තියං.

---

අඞ්ග - චීවරත්ථාය විඤ්ඤාපිතං සුත්තං, අත්තුද්දෙසි කතා, අකප්පියතන්තවායෙන අකප්පිය විඤ්ඤත්තියා වායාපනං, කියා අඞ්ග තුනෙකි.

සමුට්ඨානාදිය ධොවන ශික්ෂාපදයෙහි මෙනි.

**සවැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

# නිදාන කථාව

චීවර කාලයෙහි ෂඩ්වර්ගීය භික්ෂූහු බොහෝ නූල් ඉල්වා ගත්හ. සිවුරු කොට නිමකළ කල්හි බොහෝ නූල් ඉතිරි විය. එකල්හි ඒ භික්ෂූහු නැවතත් නූල් ඉල්වා සිවුරු කරවූහ. දෙවෙනි වර ද, තෙවෙනි වර ද එසේ කරවූහ. මේ නිසා මනුෂ්‍යයෝ භික්ෂූන්ගේ නුගුණ කියන්නට වූහ. ඒ නිමිත්ත කොට ගෙණ මේ ශික්ෂාව අනුදත් සේක.

---

7. **අර්ථ** - භික්ඛුං, මහණෙකු උද්දිස්ස එව පන, උදෙසාම වනාහි; අඤ්ඤාතකො, නො නෑ වූ: ගහපති වා, ගැහැවියෙක් හෝ: ගහපතානී වා, ගැහැවිනියක් හෝ; තන්තවායෙහි, පෙහෙරුන් ලවා: චීවරං වායාපෙය්‍ය, සිවුරු පිළියක් වියවා නම්; සො භික්ඛු; මහණ තෙම: පුබ්බෙ අප්පවාරිතො, (සිවුරු හිමියන් විසින්) පෙර නො පවරණ ලද්දේ; තත්‍ර, එහි: තන්ත වායෙ, පෙහෙරුන් කරා; උපසඞ්කමිත්වා, එළඹ; ආවුසො, ඇවැත්නි; ඉදං බො චීවරං, මේ සිවුරු පිළිය; මං උද්දිස්ස, මා උදෙසා; වීයති, වියනු ලැබේ, ආයතඤ්ච කරොථ, දිගුද කරව්; විත්ථතඤ්ච, පුළුලද (කරව්). අප්පිතඤ්ච, ඝනද (කරව්) සුවී තඤ්ච, සැම තැනම සම කොට විවීමද (කරව්). සුප්පවායිතඤ්ච, හැම තැනම නූල් සම කොට තත් පහරණ ලදුවාද (කරව්) සුවිලෙඛිතඤ්ච, වලයෙන් මොනවට ගහන

ලදුවාද (කරවී). සුවිතවජ්ජිතං කරොථ, කොස්සෙන් ගසා මොනවට මදනා ලදුවාද කරවී. මයං අපි, අපි ද, ආයස්මන්තානං, ආයුෂ්මතුන්ට; කිඤ්චි මත්තං, කිසිවක්; අනුපදජ්ජෙය්‍යාම, දෙන්නෙමු නම්; අප්පෙව නාම ඉති, ඉතා මැනවැයි කියා; වෙ, ඉදින්; චීවරෙ, සිවුරෙහි: විකප්පං, අධික විධානයට; ආපජ්ජෙය්‍ය, පැමිණියේ නම්; එවඤ්ච වත්වා, මෙසේත් කියා; සො භික්ඛු, ඒ භික්ෂු තෙම; කිඤ්චිමත්තං, කිසිවක්: අන්තමසො, යටත් පිරිසෙයින්: පිණ්ඩපාතමත්තං අපි, පිඩු මාත්‍රයකුදු; අනුපදජ්ජෙය්‍ය, දුන්නේ වී නම්, නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

සං:- **"විකප්පං ආපජ්ජෙය්‍ය"** යනු බලවත්සේ ඇණවීම දක්වයි. 'ඉදං ඛො ආවුසො' යනාදියෙන් අණවන ආකාරය දක් වේ.

සං:- **"පිණ්ඩපාතමත්තං"** යි මෙහි විනිශ්චය මෙසේ යි- පිණ්ඩපාතදනය කිරීමෙන් ම ඒ භික්ෂුහට මෙහිදී ප්‍රස්තුත නිසගිය නොවේ. තන්තවායකයෝ ඒ භික්ෂුහුගේ කීම නිසා සිවුරු හිමියන්ගේ අතින් නූල් රැගෙණ ස්වල්පයක් නමුත් දිග පුළුල වැඩි කළ හොත් ඔවුන්ගේ හැම පියොවකම දුකුළා වෙති. තමන්ට ලැබී අවසන් වනවාත් සමගම නිසගි පචිති වේ. මෙහි පිණ්ඩපාතය නම් කැඳ බත් ඛාදනීයාදිය යි. මෙ සඳහා බණ පදයකුදු කීම නො වටී.

## සප්ත දශාකාරය

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයා | - | උපනන්ද තෙරණුවෝය. |
| වස්තුව | - | චීවරයෙහි අධික විධානයට පැමිණීම් වස්තුවය, |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්තිය | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තික පාචිත්තිය ය. |
| | | නැයන් නොනැය යි හඟින්නහුට ද, වෙමතිකයාට ද, දුකුළා වේ. |
| අනාපත්ති | - | නැයන් විසින් පවරණ ලද පෙහෙරුන් ලවා අනිකෙකු සඳහා විධාන කරන්නහුටද, ස්වකීය ධනයෙන් කරවන්නහුට ද, වටිනාකම අඩුකරන්ට නියම කරන්නාට ද, උම්මත්තකාදීන්ටද ඇවැත් නොවෙයි. |

8. දසාහානාගතං කත්තිකතෙමාසිපුණ්ණමං භික්ඛුනො පනෙව අච්චෙකචීවරං උප්පජ්ජෙය්‍ය, අච්චෙකං මඤ්ඤමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං, පටිග්ගහෙත්වා යාව චීවරකාලසමයං නික්ඛිපිතබ්බං, තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

---

විපත්ති - පෙර සේ යි.

අඞ්ග - අඤ්ඤාතක අප්පවාරිතානං තත්‍රවායෙ උපසඞ්කමිත්වා විකප්පමාපජ්ජනතා, චීවරස්ස අත්තුද්දෙසිකතා, තස්ස වචනෙන සුත්ත වඩ්ඪනං, චීවර පටිලාභො යි, අඞ්ග සතරෙකි.

සමුට්ඨානාදිය ධොවන ශික්ෂාවෙහි මෙනි.

**සප්තම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

# නිදාන කථාව

එක්තරා පුරුෂයෙක් පිට පළාතකට යන්නේ තම භාර්‍ය්‍යාවට මෙසේ කීය. නූල් රැස්කොට අසවල් රෙදි වියන්නාට දී සිවුරු පිළියක් වියවා තබව. උපනන්ද ශාක්‍ය පුත්‍රයානන්ට පූජා කරන්නෙමියි කියායි. මෙය එක්තරා පිණ්ඩචාරික මහණෙක් අසා උපනන්ද ශාක්‍ය පුත්‍රයාට කීය. උන්වහන්සේ ද රෙදි වියන්නහු කරා ගොස් වැඩිපුර නූල් ගෙන්වා ගෙණ සිවුරු පිළිය දිගු පුළුල කරවා ගත්හ. පෙර කී පුරුෂයා ද ගෙටවුත් ඒ සිවුරු පිළිබඳ ප්‍රවෘත්තිය අසා උපනන්ද ශාක්‍ය පුත්‍රයානන්ට සිවුර පූජා කොට වැඩිපුර දිගු පුළුල කරවීම ගැණ දෙස් කීය. මෙකරුණ දත් බුදුහු ද මේ ශික්ෂාව අනුදත් සේකි.

---

8. **අර්ථ** - කත්තිකතෙමාසිපුණ්ණමං, වප්මස මැදිපොහොය: දසාහානාගතං, දසදවසකින් නො පැමිණි කල්හි: හෙවත් දස දිනකින් පැමිණෙන කල්හි: භික්ඛුනො පන එව: භික්ෂුවක්හට ම වනාහි: අච්චෙක චීවරං, (ගමිකාදීන් විසින් දෙනලද) ඉක්මන් සිවුරක්: උප්පජ්ජෙය්‍ය, උපන්නේ වී නම්: අච්චෙකං, ඉක්මන් සිවුරකැයි: මඤ්ඤමානෙන, හඟින්නාවූ (දන්නාවූ:) භික්ඛුනා, භික්ෂුහු විසින්; පටිග්ගහෙතබ්බං පිළිගත යුත්තේය.

පටිග්ගහෙත්වා, පිළිගෙණ; යාව චීවර කාලසමයං, චීවර කාල නැමැති සමය යම්තාක් නම් ඒ තාක්, නික්ඛිපිතබ්බං, (සලකුණක් කොට) තැබිය යුත්තේය. වෙ, ඉදින්; තතො උත්තරිං, ඒ චීවර කාල සමයෙන් මත්තෙහි; නික්ඛිපෙය්‍ය (නොඉටා නොවිකපා) තබන්නේ නම්, නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

සං:- **"දසාහානාගතං"** යි (දස- අහානි - දසාහං; දසාහෙන, අනාගතං, දසාහානාගතං; තං, දසාහානාගතං; අත්‍යන්ත සංයොග වශයෙන් ආධාරාර්ථයෙහි ද්විතීයාවයි) විසේසිය පටන් මැදි පොහොය තෙක් ඇති එකොළොස් දවස මුළුල්ලෙහි යන අදහසයි. 'පවාරණමාසස්ස ජුණ්හපක්ඛපඤ්චමිතො පට්ඨාය' යී අර්ථ කථාවෙහි දක්වති. ප්‍රථම පවාරණය යෙදෙන මාසයට 'පවාරණමාස'යයි ව්‍යවහාර කෙරෙති.

සං:- **"කත්තිකතෙමාසිපුණ්ණමං"** ප්‍රථම කාර්තික පෞර්ණමාසිය හෙවත් වප්මස මැදි පොහොය කියවේ. (මෙයද ආධාරාර්ථයේ ද්විතීයාවයි.) ප්‍රථම පවාරණය කරන්නට මත්තෙන් දසදවසක පටන් භික්ෂූන්ට අච්චෙකචීවර ලැබෙත් නම් ඒවා අච්චෙකචීවර යයි දන්නාවූ භික්ෂූන් විසින් පිළිගත යුත්තාහුය. එසේ පිළිගෙණ අධිෂ්ඨානය නොකොට විකල්පනයද නො කොට චීවර කාලය දක්වා මේ අච්චෙකචීවර යයි දැනගත හැකි සලකුණක් කොට තැබිය යුත්තේය.

**"කාමං චෙස දසාහපරමං අතිරෙකචීවරං ධාරෙ තබ්බන්ති ඉමිනාව සිද්ධො. අට්ඨුප්පත්තිවසෙන පන අපුබ්බං විය අත්ථං දස්සෙත්වා සික්ඛාපදං ඨපිතං"** යන පාඨය අර්ථ කථාවේ පෙණේ. එය ප්‍රමාද පාඨයෙකැයි ටීකාකාරයෝ කියති. 'දසාහානගතං' යන මෙයින් විරොධය ප්‍රකටව දක්ක හැකි බවත් 'ජුණ්හපක්ඛපඤ්චමිතො පට්ඨාය' යී අර්ථ කථාවෙහි දක්වෙන බැවින් එහිම පූර්වාපරවිරොධය ලැබෙන බවත් කීහු.

සං:- **"අච්චෙකචීවරං"** මෙහි දැක්වෙන අච්චෙක චීවරය නම් - යුද්ධයකට යන්නෙකු විසින් හෝ පිට පළාතකට යනු කැමැත්තෙකු විසින් හෝ ගිලනෙකු විසින් හෝ ගර්භිණී මාගමක විසින් හෝ හදිසියෙන් ශ්‍රද්ධාව ලත් පුද්ගලයෙකු විසින් හෝ චීවර කාලයට කලින් දූතයෙකු යවා හෝ තෙමේම පැමිණ හෝ **"වස්සාවාසිකං දස්සාමී"**ති වස්සාවාසිකයක් දෙමියි කියා දෙන ලද සිවුරයි.

9. උපවස්සං ඛො පන කත්තිකපුණ්ණමං යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි සාසඞ්කසම්මතානි සප්පටිභයානි, තථා රූපෙසු භික්ඛු සෙනාසනෙසු විහරන්තො ආකඞ්ඛමානො තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තර ඝරෙ නික්ඛිපෙය්‍ය, සියා ච තස්ස භික්ඛුනො කොචිදෙව පච්චයො තෙන චීවරෙන විප්පවාසාය, ඡාරත්ත පරමං තෙන භික්ඛුනා තෙන චීවරෙන විප්පවසිතබ්බං, තතො චෙ උත්තරිං විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං.

---

මෙකී සිවුර යමෙකු විසින් පිළිගන්නා ලද නම් ඉතිරි දස දවසද වස්සච්ඡේදය නො කොට විසිය යුතුයි. යම්හෙයකින් වස් බිඳුන හොත් සිවුර සාඞ්ඝික වේ.

**සං:-** 'යාව චීවරකාලසමයං' යී කෙළින් නො අතුළ කල්හි වස්සාන ඍතුවේ පශ්චිම මාසය ද කෙළින් අතුළ කල්හි මාස පස ද දක්වා තැබිය යුත්තේය.

**සං:-** සැවැත් නුවර බොහෝ භික්ෂූන් ඇරබ අච්චෙක චීවරය පිළිබඳ චීවර කාල සමය ඉක්මවීමෙහි අනුදන්නා ලදී.

මෙහි සෙසු විසතර චීවර වර්‍ගයෙහි ප්‍රථම ශික්ෂාවෙහි කී සේයි.

**අෂ්ටම ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

---

## නිදාන කථාව

එක්තරා මහාමාත්‍යයෙක් තෙම දූර පළාතකට යනු කැමැත්තේ 'ස්වාමීනි! වඩින සේක්වා වස්සාවාසිකය පුදන්නෙමි'යි කියා භික්ෂූන් සමීපයට දූතයෙකු යැවීය. භික්ෂූහු වස් විසූවන්ට භගවත්හු විසින් වස්සාවාසික අනුදන්නා ලදයි කුකුස් කරන්නාහු නො ගියෝය. එකල්හි මහ ඇමතියා උජ්ඣායනය කෙළේය. නුගුණ කීයේය. මේ දත් බුදුහු **"අනුජානාමි භික්ඛවෙ අච්චෙකචීවරං පටිග්ගහෙත්වා නික්ඛිපි තුන්ති"** අනුදත්හ.

එකල්හි භික්ෂූහු අච්චෙක චීවර පිළිගෙණ චීවර කාලය ඉක්ම වූහ. මේ කරුණෙහි දී මේ ශික්ෂාපදය අනුදන වදළ සේකි.

---

9. **අර්‍ථ:-** උපවස්සං ඛො පන, පෙර වස් වැස වනාහි, කත්තික පුණ්ණමං, (පවාරණය කළ ද සිට) ඉල්මස මැදි පොහොය දක්වා (මසක්

මුළුල්ලෙහි;) ආරඤ්ඤකානි, වනයෙහි කරණ ලද; සාසඞ්කසම්මතානි, (සොරුන් වසන තැන් දකීමාදියෙන්) සැක සහිත යයි දන්නා ලද; සප්පටිභයානි, සොරුන් විසින් මිනිසුන්ට හිංසා කරණ ලදුව පැහැර ගැණීමාදිය දකීමෙන්) (බලවත්) බිය සහිත වූ; යානි ඛො පන තානි සෙනාසනානි, යම් ඒ සෙනසුන් ඇද්ද; තථාරූපෙසු සෙනා සනෙසු, එබඳු වූ සෙනසුන්වල; විහරන්තො, වාසය කරන්නාවූ; භික්ඛු, භික්ෂුතෙම; ආකඞ්ඛමානො; (සොර බියෙන් සිවුරු සැඟ වීමට) කැමැති වූයේ; තිණ්ණං චීවරානං, තුන්සිවුරු අතුරෙන්; අඤ්ඤතරං චීවරං, එක්තරා සිවුරක්; අන්තරඝරෙ, ගොදුරු ගමෙහි; නික්ඛිපෙය්‍ය, තබන්නේය; තස්ස භික්ඛුනො, ඒ භික්ෂූ හට; තෙන චීවරෙන, ඒ සිවුරෙන්; විප්පවාසාය, වෙන්ව විසීමට; කොචිදෙව පච්චයො, (ග්‍රාමාන්තයට යෑමා දී) කිසි කටයුත්තෙක් ඇත් නම්; තෙන භික්ඛුනා, ඒ භික්ෂූහු විසින්; ඡාරත්තපරමං, සරැයක් වැඩි කොට ඇති කාලයක්; තෙන චීවරෙන, ඒ සිවුරෙන්; විප්පවසිතබ්බං, වෙන්ව විසිය යුතුයි.

භික්ඛු සම්මුතියා අඤ්ඤත්‍ර, සඞ්ඝ සම්මුතියක් හැර; වෙ, ඉදින්; තතො උත්තරිං, එයින් මත්තෙහි; විප්පවසෙය්‍ය, වෙන්ව විසුයේ නම්; නිස්සග්ගියං පාචිත්තියං, නිසගි පචිති වේ.

**සං:- "උපවස්සං ඛො පන"යි** (මෙහි 'උප' ශබ්දය 'උපගන්ත්වා' යන අර්ථයි. වස්සන්ති - වසිත්වා, වස, නිවාසෙ, 'ත්වා' ප්‍රත්‍යයයි. 'ක්වචිධාත්වා' දියෙන් 'ත්වා' ප්‍රත්‍යයට ලොප්වී සකාර ද්විත්වවී. සුඛොච්චාරණය සඳහා 'නිග්ගහිතඤ්ච'යි බිඳු ආගමයයි (ගණ්ඨි පදයෙහි පෙණෙයි.) පෙර වස් එළඹ යන අදහසයි.

(උප පූර්ව 'වස' ධාතුහු කෙරෙන් 'ත්වා' ප්‍රත්‍යයයි. 'ධාතුස්සන්තො ලොපො නෙකසරස්ස'යි ධාත්වන්ත අකාරයට ලොප් වේ. 'උපවස්-ත්වා' ත්වා ප්‍රත්‍යයට 'සබ්බෙහි තුනාදීනං - යො'යි 'ය' ආදෙශ වේ. 'උපවස්-ය' වේ. පර යකාරයට පූර්ව රූප වීමෙන් 'උපවස්ස' කිය වේ. මෙසේ සිද්ධ කිරීම යුක්ති යුක්තයි.)

**සං:- "යානි ඛො පන තානි ආරඤ්ඤකානි -පෙ-අන්තරඝරෙ නික්ඛිපෙය්‍ය"** මෙයින් ආරණ්‍යක සෙනසුන්වල වසන්නවුන් කැමැති නම් සීමාසහිත කාලයක් තුන් සිවුරෙන් එකක් අන්තරඝරෙහි තැබිය හැකි බව ප්‍රකාශ වේ.

සං: - **"ආරඤ්ඤකානි සෙනාසනානි"** (අරඤ්ඤෙ භවානි. ආරඤ්ඤකානි; ගමේ ඉන්ද්‍රඛීලයේ සිට (පිරිකෙව් නො කරණ ලද නම් එයට සුදුසු තැනෙක සිට) අජීය දුන්නෙන් දුනු පන්සියයක් ඉක්මවා කළ සෙනසුන් ආරණ්‍යක සෙනසුන් නම් වෙති. මනින කල්හි මගීන් යනෙන ප්‍රකෘති මාර්ගයෙන් මැනිය යුතුයි.

සං:- **"සාසඞ්කසම්මතානි"** යනු ආරාමයෙහි හෝ ආරාමූපචාරයෙහි හෝ සොරුන්ගේ වාසස්ථාන, අනුභව කළ තැන්, හිඳීම් සිටීම් සයනය කළ තැන් දැකීමෙන් චීවර පැහැර ගණී යයි සැක ඇතිවීම මෙයින් කිය වේ.

සං: **"සප්පටිභයානි"** යි. සහ පටිභයෙන වත්තන්තීති - සප්පටිභයානි.) ආරාමයේ හෝ ආරාමූපචාරයෙහි මිනිසුන් මැරීම, බඩු පැහැර ගැණීම, හිරිහැර කිරීමාදිය දැකීමෙන් බිය බැව් හැඟ වේ. මේ සාසඞ්කානි - සප්පටිභයානි යන දෙපදය ම 'සෙනාසනානි' යන්නේ විශෙෂණ බැවින් මේ ආරණ්‍යක සෙනසුනෙහි ඇති බිය ගතියත් සැකයත් ප්‍රකාශ කෙරෙති.

සං:- **"අන්තරඝරෙ නික්ඛිපෙය්‍ය"** යි (අන්තරෙ අන්තරෙ ඝරානි එත්ථාති - අන්තරඝරං) අන්තරඝරය නම් ගමෙකි.

ආරණ්‍යක සෙනසුනේ හාත්පස තමන්ට කැමැති ගොදුරු ගමෙක තුන් සිවුරෙන් එකක් පරෙස්සමට තබා සරයක් එයින් වෙන්ව සිටිය හැකි වේ. එහෙත් ඒ භික්ෂූහු මෙහි දක්වෙන අඞ්ගවලින් යුක්ත විය යුතු වේ. ඒ අඞ්ග නම්:-

මහාපවාරණයෙන් පවාරණය කිරීම ද, කාර්තික මාසයම වීම ද, ගමින් දුනු පන්සියයක් ඇතින් සෙනසුනක් වීම ද, සාසඞ්ක සප්පටිභය වීම ද, යන සතරයි.

සං:- **"තතො වෙ උත්තරිං විප්පවසෙය්‍ය"** යනු සරයකට වැඩිය මෙසේ වෙන්ව නො විසිය යුතු. සත් වෙනි අරුණ ගත කෙරෙයි නම් නිසඟි වේ.

ගිය තැන දුර බැවින් සෙනසුනට වුත් සත්වෙනි අරුණ නගන්නට නො හැක්කහු විසින් එහි සිට ගෙණ පච්චුඬරණය කට යුතුයි.

සං:- සැවැත්නුවර බොහෝ භික්ෂූන් ඇරබ චීවරවිප්පවාස වස්තුවෙහි දී පණවන ලදී. සෙසු විස්තර චීවර වර්ගයෙහි ද්විතීය ශික්ෂාවෙහි මෙනි.

**නවවැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

10. යො පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං.

පත්ත වග්ගො තතියො.

---

# නිදාන කථාව

එක් කලෙක භික්ෂූහු ආරණ්‍යක වූ සෙනසුන්වල වස් විසූහ. කාර්ත්තික චෞරයෝ උවදුරු කළහ. එකල්හි - **"අනුජානාමි භික්ඛවෙ ආරඤ්ඤකෙසු සෙනාසනෙසු විහරන්තෙන තිණ්ණං චීවරානං අඤ්ඤතරං අන්තරඝරෙ නික්ඛිපිතු"** න්ති වදාළ සේක. එකල්හි භික්ෂූහු ගමෙහි සිවුරු තබා සරයකට වඩා වෙන්ව විසූහ. ඒ සිවුරු වේ මී ආදීන් විසින් කා නසන ලදී. ඒ බැව් දත් බුදුහු මේ ශික්ෂාපදය අනුදත් සේකි.

---

10. **අර්:-** යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; පරිණතං (සඟනට) පිරිණමන (පුදන) ලද; සඞ්ඝිකං, සඞ්ඝ සන්තක වූ (සඞ්ඝයාට අයිති වූ) ලාභං, (චීවරාදී) ලාභය; ජානං, දන්නේ (දැන දැන) අත්තනො, තමහට; පරිණාමෙය්‍ය, නතු (අයිති) කෙරෙයි නම්, නිස්සග්ගියං පාචිත්තියං, නිසඟි පචිති වේ.

තතියො, තෙවැනි වූ; පත්තවග්ගො, පාත්‍රවර්ගයයි.

**සං:- "සංඝිකං"** යනු සඞ්ඝයාට අයිති වූවකි. මෙය සිවුපසයෙන් කිසිවක් විය හැක්කේය. ඒ ලාභය සඞ්ඝයාට පරිණත බැවින් සඞ්ඝයාගේ අතට නො ලැබුනේ නමුත් පරිණත භාව සඞ්ඛ්‍යාත එක් ක්‍රමයෙකින් සංඝසන්තක වේ.

**සං:- "පරිණතං"** යනු දස්සාම, කරිස්සාම, (දෙන්නෙමු කරන්නෙමු යි) වචනයෙන් හෝ හස්ත සංඥාවෙන් හෝ සඞ්ඝයාට නිමිත වූවකි.

**සං:- "අත්තනො පරිණාමෙය්‍ය"** යනු 'ඉදං මය්හං දෙථ' යනා දී වශයෙන් කියා සඞ්ඝයාට හැරී තිබුණු දෑයක් තමන් වෙතට හරවා ගැනීමයි. සඞ්ඝයාට දෙන ලද්දක් එසේ ගන්නට නො වටී. සඞ්ඝයාටම දියයුතු වේ. පක්ෂ සහ ධාර්මිකයන්ට හෝ ගිහියන්ට හෝ යටත් පිරිසෙයින් ඝචකීය මවට හෝ දෙන්නට නියම වූ යමක් තමන්ට හරවා ගන්නා වූ භික්ෂුහට හැම පියොවකින්ව 'දුකුළා' වේ. ලැබූ පසු එය නිසඟි වේ. **"ඉදං මෙ භන්තෙ ජානං සංඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමිතං නිස්සග්ගියං"** කියා නිස්සජනය කට යුත්තේය.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | සවග භික්‍ෂූහුය. |
| වස්තුව | - | පරිණාමන වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | පරිණතයෙහි වෙමතිකයාට ද, අපරිණතයෙහි පරිණත සංඥීහුට ද, වෙමතිකයාට ද, සඞ්ඝ, චෛත්‍ය, ගණ, පුග්ගල යන මොවුන් අතුරෙන් යමකට පරිණත වූවක් අන්‍ය සඞ්ඝාදීන්ට පිරිණමන්නහුට ද, "දුකුළා" වේ. |
| අනාපත්ති | - | අපරිණත සංඥීහුට ද, කවරෙකුට දෙමු දැයි ඇසූවිට තොපගේ සිත පැහැදෙන තැනකට දෙව් යයි කියන්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | සඞ්ඝ පරිණතභාවො, තං ඤත්වා අත්තනො පරිණාමනං, පටිලාභො'යි අඞ්ග තුණෙකි. |
| | | සමුට්ඨානාදිය අදින්නාදානයෙහි මෙනි. |

**දසවැනි ශික්‍ෂාපද වර්‍ණනාව නිමි.**

---

# නිදාන කථාව

සැවැත්නුවර එක්තරා පිරිසක් සඞ්ඝයාට සිවුරු සහිත දානයක් පිළියෙල කෙළේය. එකල්හි ෂඩ්වර්ගීය භික්‍ෂූහු එහි ගොස් අපට මේ සිව්රු දෙව් යයි කීහු. ස්වාමීනි! අපි සඞ්ඝයාට වර්‍ෂයක් පාසා මෙ වැනි දානයක් පවත්වා ගෙන එන්නෙමු. එබැවින් දෙන්නට නො හැකි යයි කීහ. එහෙත් මොවුන්ගේ ඇවිටිල්ල නිසා සවග භික්‍ෂූන්ට ඒ සචීවර භත්තය දුන්නේය. ඒ බැව් දත් තථාගතයන් වහන්සේ මේ ශික්‍ෂාපදය අනුදත් සේකි.

---

උද්දිට්ඨා ඛො ආයස්මන්තො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

නිස්සග්ගියා පාචිත්තියා නිට්ඨිතා

---

ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙ නවුති පාචිත්තියා
ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. සම්පජානමුසාවාදෙ පාචිත්තියං.

---

අර්ථ:- ආයස්මන්තො, ආයුෂ්මත්නි; තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, තිස් නිසඟි පචිති ඇවැත්හු; උද්දිට්ඨා ඛො, උදෙසන ලද්දහුමය. තත්ථ, එහි; ආයස්මන්තෙ, ආයුෂ්මතුන්; පුච්ඡාමි, විචාරමි. කච්චි පරිසුද්ධා අත්ථ, කිම පිරිසිදු වන්නහු ද? දුතියම්පි - පෙ- පරිසුද්ධා, අර්ථ කීසේයි.

එත්ථ, මෙහි; ආයස්මන්තො, ආයුෂ්මත්හු: පරිසුද්ධා, පිරිසුදුහ. තස්මා එහෙයින්; තුණ්හී, තුෂ්ණීම් භාවයයි. එතං, මේ තුෂ්ණීම්භාවය; එවං, මෙසේ; ධාරයාමි ඉති, දරමියි. (පිරිසුදු හෙයින් යයි හිතමි.)

නිස්සග්ගියා පාචිත්තියා, නිසඟි පචිති ඇවැත්හු;
නිට්ඨිතා, නිමියාහුය.

---

අර්ථ:- ආයස්මන්තො, ආයුෂ්මත්නි: ඉමෙ ඛො පන ද්වෙනවුති පාචිත්තියා ධම්මා, මේ දෙයානුවක් පචිති ඇවැත්හු: උද්දෙසං, උදෙසිය යුතු බවට; ආගච්ඡන්ති, පැමිණෙති.

1. අර්ථ:- සම්පජාන මුසාවාදෙ, දැන දැන මුසා කීමෙහි: හෙවත් දැන දැන බොරු කීම නිමිත්ත කොට ගෙන: පාචිත්තියං, පචිති ඇවැත් වේ.

සං:- **"සම්පජානමුසාවාදෙ"** යී (සම්පජානස්ස මුසාවාදෙ සම්පජානමුසාවාදෙ, තස්මිං - සම්පජානමුසාවාදෙ.) **"මුසාති. අභූතං අතච්ඡං වත්ථු. වාදෙති. තස්ස භූතතො තච්ඡතො විඤ්ඤාපනං"** යී කී

බැවින් සිඳු නො වූවක් සිඳ වූවක් සේ විඥප්පනය කිරීම මුසාවාදයයි. පූර්වභාගයෙහිත් බොරුවයයි දනගෙණ කියන මොහොතෙහිත් බොරුවයයි දනගෙණ වචනයෙන් හෝ කයින් හෝ තමන්ගේ අදහස අනිකෙකුට අවබොධ කරවීම සම්පජානමුසාවාද ය යි. ඒ නිමිත්ත කොට ගෙණ (හෙතු කොට ගෙණ) පචිති වේ.

## සප්තදශාකාරය

නිදනය - සැවැත්නුවරය

පුද්ගලයා - හත්ථක ශාක්‍ය පුත්‍රයාය.

වස්තුව - අවජානනය කොට පටිජානනාදිය කිරීම් වස්තුවය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්ති - උතුරු මිනිස්දම් ඇඟවීම සඳහා මුසා කියන්නහුට පරිජි වේ. අමූලක පාරාජිකාවෙන් චොදනා කරන්නහුට සඞ්ඝාදිසෙස යයි සඞ්ඝාදිසෙසයෙන් අනුධ්වංසනය කරන්නහුට පචිති යෙකි. ආචාර විපත්තියෙන් අනුධ්වංසනය කරන්නහුට දුකුළා වෙකි. 'යො තෙ විහාරෙ වසති' යනාදීන් අන් ක්‍රමයකින් උතුරු මිනිස්දම් අරොචනය සඳහා මුසා කියන්නහුට 'ථුලසි' යෙකි. පටිවිජානනය කරන්නහුට දුකුළා වෙකි. සාමාන්‍යයෙන් මුසා කියන්නහුට පචිතියම වේ. මේ ආපත්ති භෙදයයි.

අනාපත්ති - කල්පනා නොකොට වහා කියන්නහුටද, අනිකක් කියන්නෙමියි සිතා අනිකක් කියන්නහුටද, උම්මත්තකාදීන්ටද ඇවැත් නොවේ.

අඞ්ග - විසංවාදනපුරෙක්ඛාරතා, විසංවාදනචිත්තෙන යමත්ථං වත්තුකාමො තස්ස පුග්ගලස්ස විඤ්ඤාපනපයොගොචාති අඞ්ග දෙකකි .

සමුට්ඨානාදිය අදින්නාදනයෙහි මෙනි.

2. ඔමසවාදෙ පාචිත්තියං.

---

# නිදාන කථාව

හත්ථක ශාක්‍යපුත්‍රතෙම පරවාදීන් සමග වාදයට පිවිසියේය. හෙතෙම තීර්ථිකයන් සමග වාද කරණුයේ ස්වකීය කථාවෙහි කිසි දෙෂයක් දක ඒ මගේ කීම නොවේ යයි ද නැවත එහි කිසි අානිසංසයක් දක මගේ වාදය යි ද කියයි. අන් කරුණකින් (වචනයකින්) අනෙක් වචනයක් වසයි. මේ නිසා තීර්ථිකයෝ භික්ෂූන්ගේ නුගුණ කියන්ට වූහ. ප්‍රියශීලි භික්ෂූහු මෙය අසා නොපැහැදුනෝ බුදුරජානන් වහන්සේට ද සැළ කළහ. ඒ හේතු කොටගෙණ මේ ශික්ෂාපදය අනුදත් සේක.

**මුසාවාද වර්ගයෙහි ප්‍රථම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

**2. අථ:-** ඔමසවාදෙ, (ජාත්‍යාදීන් ගටා බිණීමෙහි; පාචිත්තියං, පචිති ඇවැත්වේ.

**සං:- "ඔමසවාදෙ"** යි, යම් කිසි වචනයක් කණ සහ හෘදය විදින්නාක් මෙන් දනෙයි නම් එබඳු වචන කණ් සුඛ නොවන හෙයිනුත් හෘදය සුඛ නොවන හෙයිනුත් ඔවිජ්ඣන වචන යි හෙවත් ගර්හා වචන යි. මෙය උත්කෘෂ්ට වශයෙන් හා හීන වශයෙන් පැවැති, ජාති, නාම, ගොත්‍ර කර්ම, ශිල්ප, ආබාධ, ලිඞ්ග, කෙලශ, ආපත්ති, ආක්‍රොශ යන දශවස්තූන් අතුරෙන් සත්‍ය වූ හෝ අසත්‍ය වූ හෝ යම් කිසිවකින් පරිජි අවන්වූ ද, නො අවන්වූ ද යම්කිසි මහණෙකුට කවර භාෂාවකට අයත් කිසි යම් වචනයකින් හෝ හස්ත සංඥවෙන් හෝ ආක්‍රොශ වචන පාවිච්චිකරන්නහුට පචිති ඇවැත් වේ.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීය භික්ෂූහුය. |
| වස්තුව | - | ඔමසන සංඛ්‍යාත වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | පාචිත්ති, දුකකට, දුබ්භාසිත යන මොහු යි. |

3. භික්ඛුපෙසුඤ්ඤෙ පාචිත්තියං.

---

අනාපත්ති - අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නන්ට හා උම්මත්තකාදීන්ටද ඇවැත් නොවේ.

අඞ්ග - යං අක්කොසති තස්ස උපසම්පන්නතා, අනඤ්ඤපදෙසෙන ජාති ආදීහි අක්කොසනං, මං අක්කොසතීති ජානනතා, අත්ථ පුරෙක්ඛාරතාදීනං අභාවො යී අඞ්ග සතරෙකි.

සමුට්ඨානාදිය අදින්නාදාන ශික්ෂාවෙහි මෙනි.

---

## නිදාන කථාව

එක් කලෙක ෂඩ්වර්ගීය භික්ෂූහු අන්‍ය වූ ප්‍රියශීලී භික්ෂූන් සමග කලහ කරන්නෝ ප්‍රියශීලී භික්ෂූන්ට ඔමසවාදයෙන් හෙවත් ජාති ආදියෙන් ගටා ගහා කෙරෙති. එයින් ප්‍රියශීලි අල්පෙච්ඡ භික්ෂූහු කලකිරුණාහු භාග්‍යවතුන් වහන්සේට සැළ කළාහුය. බුදුහු ද භික්ෂූන් අමතා වදරා 'නන්දිවිසාල' ජාතකය වදරා නැවත මේ ශික්ෂාපදය වදළසේකි.

**මුසාවාද වර්ගයෙහි ද්විතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

3. **අර්ථ**:- භික්ඛු පෙසුඤ්ඤෙ, භික්ෂූන්ගේ ප්‍රිය බව ශූන්‍ය කරණ (-නැති කරණ) කේලාම් කීමෙහි, පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"භික්ඛුපෙසුඤ්ඤෙ"** යී (පිංසති සමග්ගෙ සත්තෙ භින්නෙ කරොතීති: පිසුණා. පිස, පිංසනෙ) 'යු' ප්‍රත්‍යයට අන ආදෙශව නකාරයට 'රහදිතො නො ණ' යන්නෙන් 'ණ', කාරාදෙශ වේ. අකාරයට උකාරයයි. පිසුණා එව - පෙසුඤ්ඤං, 'ණ්‍යත්තතා' යී යොග විභාගයෙන් ස්වාර්ථයෙහි 'ණ්‍ය' ප්‍රත්‍යයයි. නකාර ලොපයයි 'යවතං' ආදියෙන් 'ණ්‍ය' යන්නට 'ඤ' කාරය ආදෙශ වේ. නැවත ඤකාර ද්විත්ත යයි. භික්ඛුස්ස පෙසුඤ්ඤං, භික්ඛු පෙසුඤ්ඤං, තස්මිං, භික්ඛු පෙසුඤ්ඤෙ)

යම් කිසි වචනයකින් සමගි වූවන් භින්න කෙරේ ද, ඒ වචනය 'පිසුණා' නම් වේ. පිසුණාව ම පෙසුඤ්ඤයි. ජාති ආදී දශාක්‍රොශ වස්තුවලින් මහණෙකුට ආක්‍රොශ කරන්නා වූ භික්ෂූහුගේ වචනය අසා

ආක්‍රොශක භික්‍ෂුහු කෙරෙහි බිඳවන අදහසින් හෝ ආක්‍රොශ කරණු ලැබූ භික්‍ෂුව හා මිත්‍ර වනු කැමතිව හෝ කයින් හෝ වචනයෙන් හෝ කියා පෑම පෙසුඤ්ඤය වේ. ඒ නිමිත්තකොට එකී භික්‍ෂුහට පචිති වේ.

**සප්තදශාකාරය.**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | සවග භික්‍ෂූහුය. |
| වස්තුව | - | පෙසුඤ්ඤ පහරණ වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්ති ය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | පචිති, දුක්කට යන මොහුය. |
| අනාපත්ති | - | පාපගරහී භාවය සඳහා කියන්නහුට ද උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | ජාති ආදීහි අනඤ්ඤපදෙසෙන අක්කොසන්තස්ස භික්ඛුනො වචනං සුත්වා භික්ඛුස්ස උපසංහරණං, පිය කම්‍යතා භෙදධිප්පායාදිසු අඤ්ඤතරතා, තස්ස විජානතා යී. අඞ්ග තුණෙකි, |

සමුට්ඨානාදිය අදින්නාදනයෙහි මෙනි.

**මුසාවාද වර්ගයෙහි තෘතීය ශික්‍ෂාපද වර්ණනාව නිමි.**

---

# නිදන කථාව

සැවැත් නුවර ෂඩ්වර්ගීය භික්‍ෂූහු කලහකාරී වූ විවාදාපන්න වූ භික්‍ෂූන්ට පිසුණු (කේළාම්) බස් කියති. කෙසේද? ඔවුනොවුන් බිඳවීම සඳහා මොහුගේ බස් ඔහුටත් ඔහුගේ බස් මොහුටත් කියති. මේ නිසා පළමුවෙන් ඇති නොවූ කොලාහල සහ විවාද ඇති වූහ. තිබුණු කොලාහලාදිය දියුණු විය. සුසිල්වත් භික්‍ෂූහු මේ කරුණ භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. එහිදී භික්‍ෂූන් අමතා මෙ ශික්‍ෂාපදය අනුදන වදළ සේක.

---

4. **යො** පන භික්ඛු අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙය්‍ය පාචිත්තියං.

---

4. **අර්ථ** යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: අනුපසම්පන්නං, අනුපසම්පන්නයෙකුහට: ධම්මං, පාලිධර්මය: පදසො, පද වශයෙන්: වාචෙය්‍ය, (එකට) කියවූයේ නම්: පාචිත්තියං, පචිති වේ.

සං:- **"පදසො"**යි මෙහි දක්වෙන පදය නම්: පද, අනුපද, අන්වක්ඛර, අනුබ්‍යඤ්ජන, වශයෙන් සිවු වැදෑරුම් වේ. ගාථා විෂයෙහි 'පදය' නම් එක් ගාථා පාදයකි. 'අනුපද' නම් දෙවෙනි පාදයයි. වාක්‍ය විෂයෙහි 'අන්වක්ඛර' නම් එක එක අකුරෙකි: 'අනුබ්‍යඤ්ජන' නම් පළමු උච්චාරිත බ්‍යඤ්ජන සමාන ඒ ලඟ පසු බ්‍යඤ්ජනය යි. එක අකුරකට 'අන්වක්ඛර' යයි කියාද, අකුරු සමූහයකට 'අනුබ්‍යඤ්ජන' යයි කියාද අක්ෂරානුබ්‍යඤ්ජන රාශියකට 'පද' ය යි ද කියති.

සං:- **"ධම්මං"** යනු මෙහි ත්‍රිපිටක පාලි ධර්මය පමණක් නොව සංගීතිත්‍රයාරූඪ නොවූ ධර්ම කොටස් වලට ද නමෙකි. ඒ බැවි **"රාජොවාද, තිකබින්ද්‍රිය, චතුපරිවත්ත, නන්දොපනන්ද, කුලුම්පසුත්ත, මග්ගකථාදි ධම්මකථා"**යි අර්ථකථා පාඨයෙන් ද, **"ආදිසද්දෙන සිලුපදෙශධුතඞ්ග පඤ්ඤක ආරම්මන කථා බුද්ධ කරණ්ඩ ඤණ වත්ථු අසුභකථාදීනං ගහණං"**යි ටීකා පාඨයෙන්ද ප්‍රකට කෙරෙති.

වර්ණපිටක, අඞ්ගුලිමාල පිටක, රට්ඨපාල ගර්ජිත, ආලවක ගර්ජිත, ගුළුමාර්ගී, ගුළු වෙස්සන්තර, ගුළු විනය වේදල්ල පිටකාදිය, බුද්ධභාෂිත නො වෙති.

අනුපසම්පන්නයෙකු සමඟ එකට ධර්මය උච්චාරණය කරණ භික්ෂු හට පද ගණනින් පචිති වෙති. උගන්වන අදහසින් කියන්නහුට ඇවැත් නොවේ.

'මනො පුබ්බඞ්ගමා ධම්මා'ති යන මේ පදය අනුපසම්පන්නයෙකු සමග එකට පටන් ගෙන එකවරට සමාප්ත කරන්නහුට පදගණනින් පචිති වෙති. මේ ක්‍රමයෙන් අනුපදදි යෙහි ද ඇවැත් සිදුවන පරිදි ටීකාව බලා දත යුතුයි.

**සප්තදශාකාරය.**

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීය භික්ෂූහුය. |
| වස්තුව | - | පදසො ධම්ම වාචන යයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය යි. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තිකපාචිත්තියයි. උපසම්පන්නයා අනුපසම්පන්නය යි සිතන්නහුට ද, වෙමතිකයාට ද, දුක්කටයෙකි. |
| අනාපත්ති | - | අනුපසම්පන්නයෙකු සමග එකට උද්දෙශ ග්‍රහණයෙහි ද, ඉගෙණ ගැණීමෙහි ද, සංඛලිතස්ථාන මෙසේ කියවයි එකට කියන්නහුටද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ. |
| අඞ්ග | - | අනුපසම්පන්නතා, වුත්තලක්ඛණං ධම්මං පදසො වාචනතා, එකතො ඔසාපනං යි අඞ්ග තුණෙකි. |
| සමුට්ඨාන | - | පදසො ධම්ම සමුට්ඨාන යයි. |
| ක්‍රියා | - | ක්‍රියා වශයෙනි. |
| සඤ්ඤ | - | නො සඤ්ඤ විමොක්ඛ යයි. |
| චිත්ත | - | අචිත්තක ය. |
| වජ්ජ | - | පණ්ණත්ති වජ්ජ ය. |
| කම්ම | - | වචී කර්මය ය. |
| කුශලත්‍රිකය | - | ත්‍රිවිධ චිත්ත යයි. (කුශල, අකුශල, අව්‍යාකෘත) |
| වෙදනාත්‍රිකය | - | ත්‍රිවෙදනා යි. (සුඛ, දුඃඛ, උපෙක්ෂා) |

**මුසාවාද වර්ගයෙහි චතුර්ථ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

# නිදාන කථාව

සැවැත් නුවරදී ෂඩ්වර්ගීය භික්ෂූහු උපාසකයන් සමග බුද්ධ භාෂිතාදිය එකට කියති. එයින් උපාසකයෝ භික්ෂූන් කෙරෙහි ගෞරව නැත්තාහු සමාන පැවැතුම් ඇත්තෝව විසූහ.

5. යො පන භික්ඛු අනුපසම්පන්නෙන උත්තරිං දිරත්තං තිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං.

---

එයින් අප්‍රසන්න වූ සුසිල්වත් භික්ෂූහු තථාගතයන් වහන්සේට මේ බැව් සැළ කළාහුය.

බුදුහුත් එවිට සවග භික්ෂූන් ආමන්ත්‍රණය කොට කරුණු විචාරා මේ ශික්ෂාව අනුදන වදළ සේක.

---

**5. අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක්තෙම වනාහි; අනුප සම්පන්නෙන, අනුපසම්පන්නයෙකු සමග; දිරත්තතිරත්තං උත්තරිං, දෙතුන් රැයකින් මත්තෙහි; සහසෙය්‍යං, එක සෙනස්නෙහි සමග වාසය; කප්පෙය්‍ය, කෙළේ නම්, පාචිත්තියං පචිති, වේ.

**සං**:- "**අනුපසම්පන්නෙන**"යි උපසපන් භික්ෂූහු හැර සාමණේරාදී සියල්ලෝ ම අනුපසම්පන්නයෝ යි. යටත් පිරිසෙයින් තිරිසනා පවා මෙහිදී අනුපසම්පන්න සංඛ්‍යාවෙහි ලා ගණිති. මෛථුන ධර්මාපත්තියට වස්තු වන බැවිනි.

"**උත්තරිං දිරත්ත තිරත්තං**" යි මෙහි 'දිරත්ත තිරත්තං' යන වචන වලින් විශේෂාර්ථයක් නො ලැබෙන බවත් ව්‍යඤ්ජන ශලිෂ්ටත්වය හා ලොක ව්‍යවහාරයත් සලකා ද්විත්තං වා තිණ්ණං වා රත්තීනං' යන පද වෙනුවට යෙදුන බවත් ටීකාවෙහි කියති.

'අනුපසම්පන්නෙනා'ති පදං 'සහසෙය්‍යං'ති පදෙ සහයොගතතියා; ද්වෙ රත්තියො, දිරත්තං; (සමාහාර දිගු) 'තියෙදුතාපිවෙ'ති සුත්තෙ වසදෙන ද්විස්ස, දි; ඣචී - පෙ- නෙතා' අප්පච්චයො.

තිස්සො රත්තියො; තිරත්තං; දිරත්තඤ්ච තිරත්තඤ්ච; දිරත්තතිරත්තං; දිරත්තතිරත්තස්ස උත්තරිං; දිරත්ත තිරත්තං; (අබ්‍යයීභාවො) 'උත්තරිං' ති පදං සහසෙය්‍ය'න්ති පාදෙ කාලසත්තමි යනු ගණ්ඨිපද පාඨ යි.)

**සං**:- "**සහසෙය්‍යං**" යි (රෑ දෙකකට තුණකට වැඩිය) සමග කරණ සෙය්‍යා ව මෙයින් කිය වේ.

සයනං, සෙය්‍යා, යන අර්ථයෙන් කායප්පසාරණ (කය දිග ඇරීම්) සංඛ්‍යාත සයනය ද, යම් සෙනාසන සංඛ්‍යාත ගෙයක සිටිත් නම් සයන්ති

එනම් සෙයයා: යන අර්ථයෙන් පර්ණශාලාදී ගෘහයක්ද මේ 'සෙයයා' යන වචනයෙන් කිය වේ. ඒ දෙවිධි යෙන් ම මෙහි අර්ථ සැලකිය යුතුයි.

සෙනසුන වනාහි සබ්බච්ඡන්න පටිච්ඡන්නය. යෙභුය්‍යච්ඡන්න පටිච්ඡන්න යයි දෙපරිදි වේ.

යම් සෙනසුනක් වහලවල් පසකින් හෝ යටත් පිරිසෙයින් වස්ත්‍රයකින් හෝ උඩ සැම තැනම වසන ලදද බිම සිට වහල දක්වා භිත්ති ආදියකින් වට කරණ ලදද, යටත් පිරිසෙයින් එක් රියන් භාගයක් පමණ වත් උස්වූ ප්‍රාකාරාදී යමකින් පරික්‍ෂප කරණ ලද නම් ඒ 'සබ්බච්ඡන්න සබ්බපටිච්ඡන්න' සෙනසුන වේ.

යම්කිසි සෙනසුනක මත්තෙහි වහල ආදියෙන් වහපු තැන් වැඩි නම් නොවහපු තැන් අඩුනම් ප්‍රාකාරාදියෙන් වටකරපු තැන් වැඩි නම් වට නොකරපු තැන් අඩු නම් ඒ 'යෙභුය්‍යච්ඡන්න යෙභුය්‍යපටිච්ඡන්න' සෙනසුන වේ.

එක දෙරකඩකින් යාම් ඊම් කරණ සත්මහල්පායක හෝ ඔවරක සියයක් ඇති පහයක හෝ වහලවල් එකිනෙකට සම්බන්ධ නම් ඒ සෙනසුන්වල අනුපසම්පන්න එකෙකු හෝ වැඩි දෙනෙකු සමග රෑ තුණක් වාසය කොට හතරවෙනි දවසේ රාත්‍රියෙහි අනුපසම්පන්නයන්ට කලින් වත් පසුව වත් සයනය කරණ ඒ භික්‍ෂුහට හෝ භික්‍ෂූන්ට නිදීම පිළිබඳ ප්‍රයොග ගණනින් හා අනුපසම්පන්නයන්ගේ ගණනින් ඇවැත් වෙති. අනුපසම්පන්න එකකු සමග සහ සෙයයාව කළ හොත් එක ඇවතකි. දෙදෙනකු සමග නම් දෙකකි. මේ නයින් ඇවැත් සිදුවන අයුරු සැලකිය යුතු.

සිවුවෙනි අරුණට පළමු නැගිට අනුසම්පන්නයන් සෙනසුනෙන් පිට කිරීම හෝ තමන් නැගිට පිට වී යාම හෝ කළ යුතුයි. එවිට කොතෙක් කල් සිටියත් ඇවැත් සිදු නොවේ.

## සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | ආලවියයි. |
| පුද්ගලයෝ | - | බොහෝ භික්‍ෂුහුය. |
| වස්තුව | - | අනුපසම්පන්නයන් සමග සහසෙයයා වස්තුවයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. |

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - තික පාචිත්තියයි.

උපසම්පන්නයන් අනුපසම්පන්නයයි සිතන්නහුටද, වෙමතිකයාට ද, භාගයක් සෙවිලි කළ භාගයක් වට කළ සෙනසුන්වල සිටින්නන්ට ද දුක්කටයෙකි.

අනාපත්ති - සෙවිලි නො කළ වට නොකළ සෙනසුන්වල වසන්නන්ට හා උම්මත්තකාදීන්ට ද "ඌනක දිරත්ත තිරත්තං" යනාදීන් දක් වෙන්නන් හට ද ඇවැත් නොවේ.

අඞ්ග - පාචිත්තිය වත්ථුක සෙනාසනං, තත්ථ අනුපසම්පන්නෙන සහ නිපජ්ජනං, චතුත්ථාදිවසෙ සූරියත්ථංගමනන්ති යී අඞ්ග තුණෙකි.

සමුට්ඨානාදිය එළකලොම සමුට්ඨානාදිය මෙනි.

**මුසාවාද වර්ගයෙහි පස්වම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

## තිදත කථාව

බුදුරදුන් වහන්සේ ආලවියෙහි අග්ගාලව වෙහෙරෙහි වැඩ වසන සමයෙහි උපාසකයෝ බණ අසන්ට වෙහෙරට යෙති. බණ සමහර කළ කල්හි ස්ථවිර භික්ෂූහු ඒ ඒ වෙහෙරට යෙති. නවක භික්ෂූහු උපස්ථාන ශාලාවෙහිම උපාසකයන් සමග ගොරවමින් කසිමින් නග්නව මූළා වූ සිහි ඇතිව සයනය කෙරෙති. උපාසකයෝ උජ්ඣායනය කරන්ට වූහ. ඒ හෙතු කොට ගෙණ **"යො පන භික්ඛු අනුපසම්පන්නෙන සඞ්ං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං"** යී අනුදත්හ.

එක් දවසක් කොසඹෑ නුවරදී භික්ෂූහු ආයුෂ්මත් රාහුලයන් වහන්සේට මෙසේ කීහ. ඇවැත්ති රාහුලය! භාග්‍යවතුන් වහන්සේ විසින් අනුපසම්පන්නයන් සමග සයනය නො කට යුතු යයි ශික්ෂාවක් පණවන ලදි. ඒ තිසා සයනයක් සොයා ගණු ව කියායි.

6. යො පන භික්ඛු මාතුගාමෙන සහ සෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං.

---

උන්වහන්සේ එද වැසිකිළියෙහි සයනය කළෝය. භාග්‍යවතුන් වහන්සේ එද රෑ ප්‍රත්‍යූෂකාලයෙහි නැගිට වැසිකිළියට වඩිනසේක් දෙර ලඟදී කැරුහ. රාහුල තෙමේ ද කැරුවේය. කවරෙක් දැයි ඇසූ කල්හි රාහුල තෙම කරුණු සැළ කෙළේය. ඒ හේතු කොට ගෙණ 'යො-පෙ-උත්තරිං දිරත්ත තිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං' යි අනුදන වදළ සේක.

---

6. **අථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; මාතුගාමෙන සහ, (මිනිස්) මාගමක් සමග; සෙය්‍යං කප්පෙය්‍ය, සයනය කෙළේ නම්; පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"මාතුගාමෙන"** යී එ දවස ම උපන් මාගම ද මෙහි දී 'මාතුගාම' සංඛ්‍යාවෙහි ලා ගත යුතුයි. මළා වූ මාගමක් සමග එක සෙනසුනෙහි සිටියේ වී නමුත් ඇවැත් නොවේ. අනුපාදින්න පක්ෂයෙහි සිටි හෙයිනි.

පෙණෙන රූප (ශරීර) ඇති යක්ෂ ප්‍රෙත ස්ත්‍රීහු ද, පණ්ඩකයා ද, මෛථුනාපත්තියට හේතු වූ තිරශ්චීන ස්ත්‍රීහු ද මෙහි දුකුළා වස්තු සංඛ්‍යාවෙහි ලා ගැණෙති. එබැවින් මොවුන් සමග එක සෙනසුනෙහි වසන භික්ෂූහුට දුකුළා ඇවැත් වේ.

පළමු ශික්ෂා පදයෙහි හතරවෙනි දවසෙහි ඇවත සිදුවන බැව් කීහු. මෙහි පළමු දවසේම ඇවත සිදුවේ.

සැවැත්නුවර ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් අරහයා මාගමක සමග එකට සයනය කිරීම් සංඛ්‍යාත වස්තුවෙහි දී පණවන ලදී. සෙසු විස්තර පළමු ශික්ෂාවෙහි මෙනි.

**මුසාවාද වර්ගයෙහි සවැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

# නිදාන කථාව

ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්වහන්සේ කොසොල් දනව්වේ සිට සැවැත් නුවරට වඩන සේක් සවස එක්තරා ගමකට පැමිණියෝය. එගමෙහි එක්තරා ස්ත්‍රියක් තොමෝ ආවසථාගාරයක් පැණවූවාය.

7. යො පන භික්ඛු මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙය්‍ය අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන පාචිත්තියං.

---

උන්වහන්සේ ද එහි ලැගුම් ගත්හ. එකල්හි ඒ ස්ත්‍රී තොමෝ අනුරුද්ධ තෙරුන් කරා පැමිණ ඇතුල් ගෙයි ඇඳක සැතපෙන සේ කියා සතුටු කරවා ගත්තී ය. අනතුරු ඒ ස්ත්‍රී තොමෝ අනුරුද්ධ තෙරුන් අසද්ධර්මයෙහි යොදවා ගැණීමට නොයෙක් බස් කීවාය. නොයෙක් උපා යෙදූවාය. තෙරණුවෝ ඒ කිසිවක් නො පිළි ගත්හ. පසුව ඒ ස්ත්‍රී තොමෝ තෙරුන් ක්‍ෂමා කොට ගෙණ පසුවද දන් දී බණ අසා තෙරුවන් සරණ ගියා ය.

අනුරුද්ධ තෙරුන් වහන්සේ මේ කරුණ භික්ෂූන්ට කීහ. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. ඒ කරුණ නිසා මේ ශික්ෂාපදය අනුදැන වදාළ සේක.

---

7. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; මාතුගාමස්ස, (මිනිස්) මාගමකට; ඡප්පඤ්චවාචාහි උත්තරිං, පස් පදයකින් හෝ සපදයකින් අධිකවූ හෝ වචනයෙන්; විඤ්ඤුනා, (ශ්‍රවණොපචාරයෙහි සිටි (නුවණැත්තා වූ;) වචන දන්නා වූ; පුරිස විග්ගහෙන අඤ්ඤත්‍ර, (මිනිස්) පුරුෂයෙකු හැර; ධම්මං, ධර්මය; දෙසෙය්‍ය, දෙශනා කෙරේ නම්; පාචිත්තියං, පචිති වේ.

සං:- **"ඡප්පඤ්චවාචාහි"** යි (ඡවා පඤ්චවා වාචා; ඡප්පඤ්ච වාචා (සඞ්ඛ්‍යාභයපද බහුව්‍රීහියි) තාහි. (ඡප්පඤ්චවාචාහි;) මෙහි "පඤ්චඡවාචාහි" යි කිය යුතු වුව ද සුඛොච්චාරණය සඳහා "ඡප්පඤ්චවාචාහි" යී යෙදින. පසකින් හෝ සයකින් යන අර්ථයි. මෙහි වාක් පරිච්ඡේදය මෙසේ දත යුතුයි. එක් ගාථා පාදයක් එක් වචනයෙකි. අර්ථ කථාව සහිත ධර්ම පදයක් හෝ ජාතකාදි කථා වස්තුවක් හෝ කියත් හොත් පදසයක් පමණ කිය හැක්කේය. පාළියෙන් එක පදයකුත් අර්ථ කථාවෙන් පද පසකුත් කිය යුත්තාහ. මේ ගණන ඉක්ම වන්නාහට පචිති වේ.

සං:- **"අඤ්ඤත්‍ර පුරිස විග්ගහෙන"** යි. මෙයින් වචනාර්ථ තේරුම් ගැණීමෙහි සමර්ථ නුවණැති මිනිස් පුරුෂයෙක් කිය වේ.

මිනිස් සිරුරකින් පෙණී සිටි යක්‍ෂයෙකු සමග හෝ ප්‍රෙතයෙකු සමග හෝ තිරිසනෙකු සමග හෝ සිටි ස්ත්‍රියකට දහම් දෙසීම නො වටී.

දෙළොස් රියණකින් මෙහා සිටි මිනිස් පුරුෂයෙකු විනා මිනිස් මාගමකට වචන පසකින් සයකින් වැඩි ධර්මයක් දෙසන්නා වූ භික්ෂුහට පද ගණනින් ද බොහෝ ස්ත්‍රීන්ට නම් මාගමුන්ගේ ගණනින් ද ඇවැත් වේ.

**සප්තදශාකාරය**

නිදනය - සැවැත් නුවරය.

පුද්ගලයා - උදයී තෙරණුවෝය.

වස්තුව - මාගමකට ධර්මදෙශනා කිරීම් වස්තුවය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්ති - තික පාචිත්ති ය ය.

අමාතුගාමයා කෙරෙහි මාතුගාම සංඥ ඇත්ත හුට ද, වෙමතිකයාට ද, යක්ෂ-ප්‍රෙත - පණ්ඩක මිනිස් සිරුරැති තිරිසන් ස්ත්‍රීන්ට දෙසන්න හුට ද, දුකුළා වේ.

අනාපත්ති - වචන සයකින් හෝ ඊට අඩු වචනවලින් දෙසන්නහුට ද, පළමු ලක්ෂණයෙන් යුත් පුරුෂයෙකු සිටි කල්හි (ඉරියවු වෙනස් කිරීම සඳහා) තෙමේ නැගිට නැවත වාඩි වී පළමු මාගම නැගිට අන්‍ය මාගමක් සිටි කල්හි දෙසන්නහුට ද, 'දීඝනිකායෝ නාම භන්තෙ කිමත්ථියෝ'යී විචාළ කල්හි සියලුම දික්සඟිය දෙසන්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නො වේ.

අඞ්ග - වුත්තලක්ඛණස්ස ධම්මස්ස ඡන්නං වාචානං උපරිදෙශනා, වුත්තලක්ඛණො මාතුගාමො, ඉරියාපථ පරිවත්තනා 'භාවො. කප්පිය කාරස්ස අභාවො, අපඤ්හා විස්සජ්ජනාති'යී අඞ්ග පසෙකි.

සමුට්ඨානාදිය පදසො ධම්මෙ සමුට්ඨානාදිය මෙනි. මෙහි 'ක්‍රියා ක්‍රියා'යී එපමණක් වෙනසයි:

**මුසාවාද වර්ගයෙහි සප්තම ශික්ෂාපද වර්ණනාව නිමි.**

8. යො පන භික්ඛු අනුපසම්පන්නස්ස උත්තරි මනුස්ස ධම්මං ආරොචෙය්‍ය භූතස්මිං පාචිත්තියං.

---

# නිදාන කථාව

ආයුෂ්මත් උදයී තෙරණුවෝ සැවැත් නුවර කුළුපග වූවාහු බොහෝ කුල වලට පැමිණෙති. එක් දවසක් එක්තරා කුලයකට පැමිණ ගෙයි ප්‍රධාන දෙරකඩ සිටි ඝරණියකගේ කණ ලඟ දම් දෙසූහ. ඇගේ යෙහෙළිය ඔවරකදොරයෙහි සිටින්නී මේ දැක මේ ශ්‍රමණයා නැන්දනියන්ගේ සොර පුරුෂයෙක් දැයි සැක කළාය. යෙහෙළියට ද එසේම දම් දෙසූහ. යෙහෙළිය නැන්දනියන් කෙරෙහි සැක කළාක් මෙන් නැන්දනියෝ ද ඈ කෙරෙහි සැක කළාහ. ඒ ස්ත්‍රීහු උජ්ඣායනය කරන්ට වන්හ. ඒ හඬ භික්ෂූන්ට ඇසී භාග්‍යවතුන් වහන්සේට සැළ කළ කල්හි 'යො පන භික්ඛු මාතුගාමස්ස ධම්මං දෙසෙය්‍ය පාචිත්තියං' යි අනුදැන වදාළ සේක.

ඊට පසු උපාසිකාවෝ භික්ෂූන් දැක දහම් දෙසන්ට ආරාධනා කළහ. භගිනියෙනි, එය අපට නොකැපය. එබැවින් නො හැකිය යි කීහ. ස්වාමීනි! අපට වචන පහකින් හයකින් වත් දෙසන්නැයි කීහු. එද නො පිළිගත්හ. උපාසිකාවෝ උජ්ඣායනය කරන්ට වූහ. ඒ දත් බුදුහු 'යො පන-පෙ-ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙය්‍ය පාචිත්තියං'යි අනුදත්හ.

එකල්හි භික්ෂූහු සමීපයෙහි අවිඥ පුරුෂයෙකු තබාගෙණ සපදයකට වැඩියෙන් දෙසන්ට වූහ. ඒ නිසා 'යො පන භික්ඛු-පෙ-අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන පාචිත්තියං'යි අනුදැන වදාළ සේකි.

---

8. අර්ථ:- යො පන භික්ඛු; යම් මහණෙක් තෙම වනාහි; අනුපසම්පන්නස්ස, අනුපසම්පන්නයෙකුට; උත්තරිමනුස්ස ධම්මං, (ධ්‍යානාදි ප්‍රභෙද ගත) උතුරු මිනිස් දම්; ආරොචෙය්‍ය, (ඉදුරා) කියා නම්; භූතස්මිං, විද්‍යමාන ගුණයෙහි (උතුරු මිනිස් දම් ඇති කල්හි) පාචිත්තියං, පචිති වේ.

සං:- "උත්තරිමනුස්සධම්මං"යි සතරවැනි පාරාජිකාවෙහි කීසේයි.

සං:- **"භූතස්මිං පාචිත්තියං"** යනු තමා කෙරෙහි ධ්‍යාන විමොක්‍ෂ මාර්ගී දී ධර්මයන් විද්‍යාමාන කල්හි උපසපත් මහණෙකුට හෝ භික්‍ෂුණියකට හැර අනිකෙකුට මම ප්‍රථමධ්‍යානයට පැමිණියෙමි යි යනාදී ක්‍රමයෙන් සෘජුව කියන්නහුට පචිති වේ.

පරිනිර්වාණ කාලයෙහිත් අතර අතික්කඩ්ඪනය කරණු ලබන්නහු විසිනුත් විද්‍යමාන උතුරු මිනිස්දම් උපසම්පන්නයෙකුට කියන්නට වටී ය යි `විනය අටුවාවෙහි` කීහු. අනතික්කඩ්ඪනය කරණු ලබන්නහු විසිනුදු එබඳු ආවශ්‍යක කරුණක් ඇති කල්හි කියන්නට වටී ය යි `ටීකායෙහි` කීහු.

තමා කෙරෙහි විද්‍යමාන ශ්‍රැත ගුණ, පර්‍යාප්ති භූණ, ශීල ගුණ, යන මොවුන් අනුසම්පන්නයෙකුට වුවත් කියන්නට වටනේය.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | වෙසාලි යයි. |
| පුද්ගලයෝ | - | වග්ගුමුදතිරිය භික්‍ෂුහු ය. |
| වස්තුව | - | ඔවුන්ගේ භූතාරොචන යයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. |
| ආණත්ති | - | අනාණත්තික ය. |
| ආපත්ති | - | නිෂ්පර්‍යාය වශයෙන් තමා කෙරෙහි විද්‍යමාන වූ ධ්‍යානාදි ධර්ම ආරොචනය කරන්නහුට යම් හෙයකින් යමෙකුට කියයි ද, ඔහු එකෙණෙහි ම මෙතෙම ධ්‍යානලාභියෙක. ආර්‍යයෙක. යනාදීන් දැනගත හොත් පචිති වේ. නො දත හොත් දුකුළා වෙකි. පරියාය වශයෙන් කියන ලද්ද දූනගත්තත්, දන නො ගත්තත්, දුකුළා වෙකි. |
| අනාපත්ති | - | ආවශ්‍ය කරුණක දී කියන්නහුට ද, ආදි කර්මිකයාට ද, ඇවැත් නො වේ. |
| | | (ධ්‍යානලාභීන්ගේ උම්මත්තකා දී භාවයක් නැති හෙයින් මෙහි එය නො යෙදින.) |
| විපත්ති | - | පෙර මෙනි. |
| අඞ්ග | - | `උත්තරිමනුස්සධම්මස්ස භූතතා, අනුපසම්පන්නස්ස ආරොචනං, තං ඛණං විජානනං, අනඤ්ඤපදෙසො`යි අඞ්ග සතරෙකි. |

9. යො පන භික්ඛු භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුප සම්පන්නස්ස ආරොචෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා පාචිත්තියං.

---

සමුට්ඨාන - භූතාරොචන සමුට්ඨානය යි.

ක්‍රියා - ක්‍රියා වශයෙනි.

සංඥ - නො සඤ්ඤ විමොක්ඛ ය.

චිත්ත - අචිත්තක ය.

වජ්ජ - පණ්ණත්ති වජ්ජය.

කර්ම - කාය කර්ම, වචීකර්ම යෝ්ය.

කුසලත්‍රිකය - කුසලාබ්‍යාකත වශයෙන් ද්විචිත්තයි.

වෙදනාත්‍රිකය - සුඛ මද්‍ධ්‍යස්ථ වශයෙන් ද්විවෙදනායි

**මුසාවාද වර්ගයෙහි අෂ්ටම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

# නිදාන කථාව

වැදුරට දුර්භික්ෂයෙන් පෙළෙන කල්හි බොහෝ සන්දිට්ඨ සම්භක්ත භික්ෂූහු වග්ගුමුද නදී තීරයෙහි වස්විසූහ. ඔවුහු ප්‍රත්‍යයාපෙක්ෂාවෙන් උතුරු මිනිස් දම් ආරොචනය කළහ. ඒ දත් තථාගතයන් වහන්සේ මේ ශික්ෂාපදය අනුදැන වදළ සේක.

---

9. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; භික්ඛුස්ස, (පාරාජිකාපත්තියකට නො පැමිණි භික්ෂුවක්හුගේ; දුට්ඨුල්ලං ආපත්ති, සඞ්ඝාදිසෙසාපත්තියක්; අනුපසම්පන්නස්ස, අනුපසම්පන්නයෙකුට; සඞ්ඝ සම්මුතියා අඤ්ඤත්‍ර, සඞ්ඝ සම්මුතිය නැතිව; ආරොචෙය්‍ය, (වස්තු සහිතවම) කියයි නම්; පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"දුට්ඨුල්ලං"** යි පාරාජිකා සඞ්ඝාදිසෙස සංඛ්‍යාත ආපත්තිස්කන්ධද්වයට ම නමෙකි. මෙහි වනාහි සඞ්ඝාදිසෙසාපත්තිය ම කිය වේ.

**සං**:- **"අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා"**යි. සඞ්ඝයා අභිණ්හාපත්තික භික්ෂුවට මෙතෙම පසුව භය ලජ්ජාවෙන් වත් සංවරණයට පැමිණෙන්නේ යයි සළකා මෙ පමණ ඇවැත් ආරොචිතව්‍යයහ මෙ පමණ කුලයන්හි

ආරාවනය කටයුත්තාහු යයි ඇවැත් පිළිබඳව ත් කුල පිළිබඳව ත් ප්‍රමාණයක් තියම කොට හෝ නො කොට තෙවරක් අපලොකනය කොට සම්මතයක් කෙරෙයි නම් ඔහුගේ දුට්ඨුල්ලාපත්ති කථනයෙන් ඇවැත් නොවේ. නොමගින් කළ සම්මුතියෙන් 'මෙතෙම අසුචි මොචනය කොට සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණියේය. යනාදී වශයෙන් ආරෝචනය කරන්නහුට ඇවැත් වේ.

### සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | සවග භික්ෂූහුය. |
| වස්තුව | - | දුට්ඨුල්ලාපත්ති ආරෝචනය යි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය. |
| ආණත්තිය | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තික පාචිත්තිය<br>අදුට්ඨුල්ලාපත්තියෙහි දුට්ඨුල්ලාපත්ති සංඥීහුටද, වෙමතිකයාට ද, දුකුළා වේ. |
| අනාපත්ති | - | වස්තු මාත්‍රයෙක් හෝ ආපත්ති මාත්‍රයෙක් හෝ ආරෝචනය කරන්නහුට ද, භික්ඛුසම්මුති පරිච්ඡේදය නො යික්මවා ආරෝචනය කරන්නහුට ද; උම්මත්තකාදීන්ට ද ඇවැත් නො වේ. |
| අඞ්ග | - | වුත්තලක්ඛණස්ස භික්ඛුනො සවත්ථුකො සඞ්ඝාදිසෙසො, අනුපසම්පන්නස්ස ආරෝචනං, භික්ඛු සම්මුතියා අභාවො, කියා අඞ්ග තුණෙකි. |

සමුට්ඨානාදි සෙස්ස අදින්නාදනයෙහි මෙනි. මෙහි 'දුංඛ' වෙදනාව වෙයි.

**මුසාවාද වර්ගයෙහි නවම ශික්ෂාපද වර්ණනාව තිමි.**

---

# නිදන කථාව

ආයුෂ්මත් උපනන්ද තෙරණුවෝ සවග මහණුන් සමග දබර කළහ. හෙතෙම සඞ්ඝාදිසෙසාපත්තියකට පැමිණ සඞ්ඝයාගෙන් පිරිවෙස් ලැබ ගෙණ පුරයි.

10. යො පන භික්ඛු පඨවිං ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා පාචිත්තියං.

**මුසාවාද වග්ගො පඨමො.**

---

ඒ අතර සැවැත්නුවර පිරිසකගේ සාඞ්ඝික දනයක් විය. උපනන්‍ද තෙරණුවෝ පිරිවෙස් පුරණ හෙයින් හත්‍තාග්‍රයෙහි අසුන් කෙළවර හිඳ ගත්හ. එකල්හි ෂඩ්වර්ගීය භික්ෂූහු ඒ උපාසකයන්ට මෙසේ කීහ. තොපගේ යහළුවූ අර උපනන්‍ද ශාක්‍ය පුත්‍රයා යම් අතකින් ශ්‍රද්‍ධාදෙය්‍යය බුදීද, ඒ අතින්ම උපක්‍රම කොට අසුචි මොචනය කෙළේය. දන් ඊට පිරිවෙස් පුරන්නේ යයි කියා යි. අල්‍පෙච්ඡ භික්ෂූහු මේ අසා පිළිකුල් කළහ. තථාගතයන් වහන්සේට ද සැළකළහ. ඒ හේතුකොට ගෙණ මේ ශික්ෂාව අනුදත් සේක.

---

10. **අථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහී: පඨවිං (නො කැප) පොළොව; ඛණෙය්‍ය වා, (නො කැප බැව් දන දන) සෑරුයේ නම් හෝ, ඛණාපෙය්‍ය වා, (අනුන් ලවා) සෑරවූයේ නම් හෝ; පාචිත්තියං, පචිති වේ.

පඨමො, පළමු වැනි; මුසාවාද වග්ගො, මුසාවාද වර්ගීය යි.

---

**සං**:- **"පඨවිං"** යි පෘථුවිය වනාහි: 'ජාත පඨවි, අජාත පඨවී' යයි දෙපරිදි වේ. එයින් ජාත පෘථිවිය; ශුද්ධපොළොවය, මිශ්‍ර පොළවය, පුඤ්ජ පොළොව යයි ත්‍රිවිධ වේ.

හුදකළා මැටි හෝ පස් හෝ ඇති පොළොව ශුද්ධ පෘථිවියයි.

පස්වලින් හෝ මැටිවලින් හෝ තුනෙන් කොටසක් පමණ ගල් කැබිලිති ආදියෙන් එක් වර්ගයක් ඇති නම් ඒ මිශ්‍රක පෘථිවිය වේ.

සාරමාසයකට වඩා තෙමුනු මැටි ගොඩකට නැතහොත් පස් ගොඩකට 'පුඤ්ජ පඨවී' යයි කියති.

මෙයින් ජාත පෘථිවිය අකැප පොළවයි. මේ අකැප පොළොව කණී නම් කණවයි නම් ප්‍රයෝග ගණනින් පචිති වෙති.

යටත් පිරිසෙයින් කකුලෙහි ඇඟිල්ලකින් වත් සෑරීම ද, වතුර වීසි කළ කල්හි පොළොව බිඳීම ද, පාත්‍රා පුළුස්සන කල්හි පොළොව දැවීම ද පොළොව කැණීම් සංඛ්‍යාවෙහි ලා ගැණෙති.

එහෙයින් **"ඛණන භෙදන විලෙඛන පචනාදිහි විකොපෙති"** යි අටුවාවෙහි දක් වේ.

මේ පොළොව සාරව, මේ මුල උගුලව යනාදීන් නියම කරන්නා වූ භික්ෂුවට දුකුළා වේ. තැනක් නියම නො කොට කැප වචනයෙන් සැරවී මෙහි ඇවැත් නොවේ.

**සප්තදශාකාරය.**

| | | |
|---|---|---|
| නිදානය | - | ආළවිය ය. |
| පුද්ගලයෝ | - | ආළවික භික්ෂූහු ය. |
| වස්තුව | - | පඨවි ඛණන සංඛ්‍යාත වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය. |
| ආණත්තිය | - | සාණත්තිකය. |
| ආපත්ති | - | පචිතියයි. පෘථිවිය පිළිබඳ වෙමතිකයාට ද, අපඨවියෙහි පෘථිවී සංඥ ඇත්තහුට ද; වෙමතිකයාට ද දුකුළාවෙකි. |
| අනාපත්ති | - | මෙය දන ගණුව, මෙය දෙව, මෙය ගෙණ එව, මෙයින් ප්‍රයෝජන ඇත්තෙම්, මෙය කැපකරවයි කියන්නහුට ද, නො දන බිඳින්නහුට ද, අමතක වීමෙන් කණින්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | ජාත පඨවි, පඨවි සඤ්ඤිතා, ඛණන ඛණා පනානං අඤ්ඤතරන්ති යී අඞ්ග තුණෙකි. |

සමුට්ඨානාදිය අදින්නාදනයෙහි මෙනි.

මෙහි ප්‍රඥප්ති වද්‍යයයි. ත්‍රි චිත්තයයි. ත්‍රි වෙදනාවයි.

**මුසාවාද වර්ගයෙහි දශම ශික්ෂාපද වර්ණනාව නිමි.**

පළමුවැනි මුසාවාද වර්ග වර්ණනාවයි.

---

1. භූතගාම පාතව්‍යතාය පාචිත්තියං

## නිදාන කථාව

ආලවික භික්ෂූහු නව කර්මාන්ත කරන්නාහු පොළව සාරති, සාරවති, එයට නො පහන් මනුෂ්‍යයෝ නුගුණ කථනයෙන් උජ්ඣායනාදිය කළහ. ඒ ඇසූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. බුදුහු එකල්හි මේ ශික්ෂාව අනු දන වදළ සේක.

---

1. **අර්ථ**:- භූතගාම පාතව්‍යතාය: වෘක්ෂලතා දී භූමියෙහි හටගත් භූත සමූහයාගේ විනාශ කිරීම නිමිතිකොට: පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"භූතගාම පාතව්‍යතාය"** යී. (භවන්ති අහෙසුං චාති; භූතා; භූතානං ගාමො, භූතගාමො: 'ගාම' යනු රාශ්‍යර්ථයෙහි ය.) පාතව්‍යස්ස භාවො, පාතව්‍යතා: භූතගාමානං පාතව්‍යතා: භූතගාම පාතව්‍යතා: තස්සා, භූතගාම පාතව්‍යතාය.)

'භූතගාම' නම් වැඩෙන තිල්වන් තෘණ වෘක්ෂ ලතාදියයි. ඔවුන්ගේ සිඳීම් බිඳීමාදිය භූතගාම පාතව්‍යතාවයයි. භූතගාම පාතව්‍යතා හෙතුවෙන් භික්ෂුවට පචිති ඇවැත් වේ.

යම්කිසි භික්ෂුවක් පෘථිවියෙහි වත් ජලයෙහි වත් ප්‍රාකාරාදි යම්කිසි තැනකවත් හටගත් නො වියලුනු ඉතා කුඩා තෘණයක් නමුත් උද්ධරණාදියෙන් විකොපනය කෙරෙයි නම් පචිති සිදු වෙන බැව් කීහු. එබැවින් යටත් පිරිසෙයින් අබටැක් පමණ වූ සෙවෙලක් වත් ජල මතුයෙහි සියුම් කොළ හා යට සියුම් මුල් ඇති සෙවෙල් විශෙෂය වත් විකොපනය කිරීම නොවටී.

භූතාගම පාතව්‍යතාවය පචිතියට හෙතු වූයේ කුමක් නිසාද යත්? (වෘක්ෂලතාදීහු අචිත්තක වූවෝ වෙති. එසේම අණ්ඩජාදි චතුයෝනිජද නොවෙති. නමුත් ඇතැම් මනුෂ්‍යයෝ වෘක්ෂ ලතාදිය සජීවයන් මෙන් සිතත්. ඒ බැව් **"ජීව සඤ්ඤිනොහි මොඝ පුරිස මනුස්සා රුක්ඛස්මිං"** යී දෙශිතය) 'ශ්‍රමණ අසාරුප්‍ය නිසාත් වෘක්ෂාදිය ආශ්‍රිත සතුන් රැකීම සඳහාත් භූතගාම පාතව්‍යය තහනම් කළ සේක.

මූලබීජ, ඛන්ධබීජ, ඵලුබීජ, අග්ගබීජ, බීජබීජ යන මොවුන් ගේ පාතව්‍යතාවය 'බීජගාම' පාතව්‍යතාවය යි. මෙය භූතගාම පාතව්‍යතාවෙන් වෙන් කරන ලදී. එහෙත් මූල බීජාදිය මුල්, කොළ නික්මුන කල භූතගාම සංඛ්‍යාවෙහි ලා ගැණෙති.

බීජගාමය කැපකරුවෙකු ලවා කැප කරවා ගත යුතුයි. කැපකරු ද ගින්නෙන් සවල්පයක් පුළුස්සා හෝ නියෙන් සවල්පයක් කඩා හෝ ආයුධයකින් සවල්පයක් කපා හෝ පිළිගැන්විය යුතුයි. මෙය ප්‍රතිග්‍රහකයා ලහදීම 'ස්වාමීනි! මෙය කැපයයි' වචනයෙන් කියාම කළ යුතු වේ.

වැඩි විස්තර අටුවාවෙන් බැලිය යුතුයි.

**සප්තදශාකාරය.**

| | | |
|---|---|---|
| නිදානය | - | ආළවිය ය. |
| පුද්ගලයෝ | - | ආළවික භික්‍ෂූහුය. |
| වස්තුව | - | වෘක්‍ෂච්ඡේදන සංඛ්‍යාත වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | සාණත්තික ය. |
| ආපත්ති | - | පාචිත්තිය ය. |
| | | අබීජයෙහි බීජසංඥිහුට ද, 'දුකුළා' වේ. |
| අනාපත්ති | - | 'ඉමං දෙහි, ඉමං ජාන, ඉමං ආහර, ඉමිනා අත්‍ථො, ඉමං කප්පියං කරොහි' යනාදීන් කියන්නහුට ද, නො දැනීමෙන් හා අමතක වීමෙන් ඡේදනය කරන්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නො වෙති. |
| අඞ්ග | - | 'භූතගාමො, භූතගාම සඤ්ඤිතා, විකොපනං වා, විකොපාපනං වා' ති අඞ්ග තුණෙකි. |

(සමුට්ඨානාදිය පඨවි ඛණන ශික්‍ෂාවෙහි මෙනි.)

---

# නිදන කථාව

අළවි නුවර වාසී භික්‍ෂූහු නව කර්මාන්ත කරන්නාහු ගස් කපති. එසේම කප්පවති. ඒ අතර එක් භික්‍ෂුවක් තෙම ගස්ක කපයි. ඒ රුකෙහි අධිගෘහීත දෙවතාවෙක් ඒ භික්‍ෂුවට මෙසේ කීය. ස්වාමීනි! තමන්ට ගෙයක් කරගණු කැමැත්තෙන් මගේ භවනය නො සිඳුව මැනව යි කියා යි. එය නො පිළිගෙන ඒ වෘක්‍ෂය කැපීය. දෙවතාවා කිපී ඒ භික්‍ෂුව මරන්ට සිතුවේය. නමුත් ඒ නුසුදුසු යයි පසුව කල්පනා කොට භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් කරුණු සැලකළාය.

2. අඤ්ඤවාදෙක විහෙසකෙ පාචිත්තියං.

---

තථාගතයන් වහන්සේ ඒ අසා දෙවතාවට ප්‍රශංසා කොට භික්ෂූන්ගේ ආයති සංවරණය පිණිස මේ ශික්ෂාව අනුදන වදළ සේක.

**භූතගාම වර්ගයෙහි ප්‍රථම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

2. **අර්ථ:-** අඤ්ඤවාදකෙ. (සහමැද විචාළ දෙය හැර) අනිකක් කීමෙහි ද; විහෙසකෙ, (තුෂ්ණිම්භූතව සඞ්ඝයාට) වෙහෙස දීමෙහි ද, පාචිත්තියං, පචිති ඇවැත් වේ.

**සං:-** **"අඤ්ඤවාදකෙ"** මෙහි අඤ්ඤවාදකයා නම් සහ මැද යමක් විචාල කල්හි ඊට කෙළින් උත්තර නො දී අනිකක් කියන්නායි. යම්කිසි භික්ෂුවක් සාවසෙසා පත්තියකට පැමිණී පසු සහ මැද දී යුෂ්මතා සාවසෙසා පත්තියකට පැමිණියෙහි දැයි අසනු ලැබූ කල්හි එය නො කියනු කැමැත්තෙන් ඇසූ වචනයට සෘජුව උත්තර නො දී වෙන වෙන කථාවලින් ප්‍රස්තුත කාරණය යට කර දමයි යනු මෙයින් කිය වේ.

**සං:-** **"විහෙසකෙ"**යි නිශ්ශබ්ද වන්නහු කිය වේ. සහ මැද දී පළමුසේ ම විචාළ කල්හි උත්තර නො දී තුෂ්ණිම්භූතව සිටී නම් නැවත නැවතත් විචාරීමෙන් සංඝයා වෙහෙසට පැමිණෙයි. එම නිසා 'නිශ්ශබ්ද වන්නහු ගැණ 'විහෙසකෙ'යි කීහු.

මේ අඤ්ඤවාදක, විහෙසක, දෙදෙනාට ම පචිති දෙකෙකි. අඤ්ඤවාදක කර්මයක් හා විහෙසක කර්මයක් ද භාග්‍යවතුන් වහන්සේ අනුදත් සේක. වුක්තාකාර භික්ෂූන්ට ඒ විනය කර්මය කළ කල්හි ත් එසේ ම පවතිත් නම් ඔවුනට ඇවැත් නො වැළකේ.

**සප්තදශාකාරය.**

| | | |
|---|---|---|
| නිදනය | - | කොසඹෑ නුවරය. |
| පුද්ගලයා | - | ඡන්නතෙරණු වෝය. |
| වස්තුව | - | අනිකකින් අනිකක් ප්‍රතිච්ඡන්නය (වැසීම) යි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |

3. උජ්ඣාපනකෙ ඛීය්‍යනකෙ පාචිත්තියං

| | | |
|---|---|---|
| ආපත්ති | - | ධර්ම කර්මයෙහි "තිකපාචිත්තිය" යි. අධර්ම කර්මයෙහි "තිකදුක්කට" යි. |
| අනාපත්ති | - | නො දැනීමෙන් ද, ගිලන් බැවින් ද, සඞ්ඝයාගේ භණ්ඩනාදියක් වේ යයි සිතීමෙන් ද, සඞ්ඝ භෙදදියක් වේයයි යන සිතින් ද, විචාරණ ලද්දෙන් අතිකක් කියන්නහුට ද, උම්මත්තකා දීන්ට ද, ඇවැත් නො වේ. |
| අඞ්ග | - | ධම්මකම්මෙන අරොපිතතා, ආපත්තියා වා වත්ථුනා වා අනුයුඤ්ජියමානතා, ඡාදෙතු කාමතාය අඤ්ඤෙන අඤ්ඤං පටිචරණං වා, තුණ්හීභාවො, වා යි අඞ්ග තුනෙකි. |

(සමුට්ඨානාදිය අදින්නාදානයෙහි මෙනි.)

මෙය වනාහි කිරිය ද, අකිරිය ද වෙයි.

දුක්ඛ වේදනාව වේ.

# නිදාන කථාව

ආයුෂ්මත් ඡන්න තෙරණුවෝ අනාචාරයක් කොට සඞ්ඝයා විසින් විචාරණු ලැබූ කල්හි කවරෙක් පැමිණියේ ද? කුමකට පැමිණියේ දැයි යනාදීන් අන්‍ය වචනවලින් අනාචාරය වැසූහ.

භික්ෂූහු මෙය රුචි නොකළාහුය. නුගුණ ද පැවසූහ. තථාගතයන් වහන්සේට ද සැළ කළහ. මේ හෙතුකොට ගෙණ "අඤ්ඤවාදකෙ පාචිත්තියං"යි අනුදත්හ.

පසුව ඡන්න ස්ථවිර තෙමේ ම එබඳු අවස්ථාවක දී නිශ්ශබ්ද විය. ඒ හෙතුවෙන් "අඤ්ඤවාදකෙ විහෙසකෙ පාචිත්තියං" යි අනුදත් සේක.

**භූතගාම වර්ගයෙහි ද්විතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

3. අර්ථ - උජ්ඣාපනකෙ, (සම්මුති ලත් භික්ෂූහු සෙසු භික්ෂූන් විසින් ලාමකකොට සිතන පරිදි) අගති දක්වා අගුණ කීමෙහි; ඛිය්‍යනකෙ, අගුණ ප්‍රකාශ කිරීමෙහි; පාචිත්තියං, පචිති ඇවැත්වේ.

සං:- **"උජ්ඣාපනකෙ"**යි. (උජ්ඣාපෙන්ති එතෙන වචනෙ නාති, උජ්ඣාපනකං, තස්මිං, උජ්ඣාපනකෙ; 'උ' පුබ්බකෙඩ, චින්තායං, යන ධාතුවයි. 'ධාතුහි ණෙ ණය - යනාදීන් 'ණාපෙ' ප්‍රත්‍යය යි. 'නුදාදීහි' යනාදීන් 'අනක' ප්‍රත්‍යයයි.

මෙහි උජ්ඣාපනය නම් අවමන් කරවීම යි. හෙවත් සෙස්සන් ලවා සැහැල්ලුකොට සිත වීමයි.

මෙ නම් භික්ෂුව පක්ෂපාත බැවින් ස්වකීය යහලුවන්ට හොඳ හොඳ සෙනසුන් පනවයි. එසේ ම හොඳ හොඳ බත් තියම කෙරෙයි. යනාදීන් සංඝයා විසින් සම්මත කරන ලද උපසම්පන්න භික්ෂුවකට නින්දා කරවනු කැමැත්තෙන් සෙස්සන් ලවා ලාමක කොට කථා කරවීම සිතවීමාදිය මෙයින් ප්‍රකාශ වේ.

සං:- **"ඛීය්‍යනකෙ"** යි (ඛීයන්ති අවණ්ණං පකාසෙන්ති එතෙන වචනෙනාති; ඛීය්‍යනකං, තස්මිං, ඛිය්‍යනකෙ; ඛී, ගරහෙ; මෙහි ද 'අනක' ප්‍රත්‍යය යි. ඣවිධාත්වාදියෙන් ඊ කාරයට 'ඊය' ආදෙශ යයි.) ඛීයනය නම් නුගුණ ප්‍රකාශ කිරීමයි.

මේ කී උජ්ඣාපනක, ඛීයනක, දෙක නිමිත්ත කොට ගෙණ පචිති දෙකක් වෙති.

## සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | රජගහනුවරය. |
| පුද්ගලයෝ | - | මෙත්තිය භුම්මජකයෝය. |
| වස්තුව | - | උජ්ඣාපන ඛීයන වස්තුව ය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | ධම්කම්යෙහි 'තිකපාචිත්ති' යයි, අධම් කම්යෙහි 'තික දුක්කට' යයි. |
| අනාපත්ති | - | ඡන්දාදී වශයෙන් කරන්නහුට ද, උජ්ඣාපනය හා ඛීයනය කරන්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |

4. යො පන භික්ඛු සංඝිකං මඤ්චං වා පීඨං වා භිසිංවා කොච්ඡං වා අජ්ඣොකාසෙ සන්ථරිත්වා වා සන්ථරා පෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය වා න උද්ධරාපෙය්‍ය, වා අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය පාචිත්තියං.

---

අඞ්ග - ධම්ම කම්මෙන සම්මතතා, උපසම්පන්නතා, අගති ගමනාභවො, තස්ස අවණ්ණකාමතා, යස්ස සන්තිකෙ වදති තස්ස උපසම්පන්නතා, උජ්ඣාපනං වා ඛීයනං වා'ති යි. අඞ්ග සයකි.

(සමුට්ඨානාදිය අදින්නාදානයෙහි මෙනි.)

මෙහි දුක්ඛ වෙදනාව වේ.

---

# නිදාන කථාව

ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රතෙමේ සංඝයාට සෙනසුන් පනවයි. බත් උදෙසයි. මෙත්තිය භුම්මජක භික්‍ෂූහු නවකයෝය. එසේ ම මද පිණැත්තෝය. ඔවුනට ස්වභාවයෙන් ලාමක සෙනසුන් හා ලාමක බත් ද ලැබෙති. ඒ නිසා දබ්බමල්ල පුත්‍රයන් කෙරෙහි කිපී උජ්ඣාපනය කරති. ඒ හෙතුවෙන් 'උජ්ඣාපනකෙ පාචිත්තියං' යී අනුදත්හ.

අනතුරුව සෙසු භික්‍ෂූන්ට ඇසෙන සේ දබ්බමල්ල පුත්හුගේ අගුණ කියන්ට වූහ. එයින් උජ්ඣාපනකෙ ඛීයනකෙ පාචිත්තියං' යී අනුදන වදල සේක.

**භූතගාම වර්ගයෙහි තෘතීය ශික්‍ෂාපද වර්ණනාව නිමි.**

---

4. **අර්ථ** - යො පන භික්ඛු, යම් භික්‍ෂුවක් තෙම වනාහි; සංඝිකං, සඟසතු වූ (සංඝයාට අයිති වූ); මඤ්චං වා, ඇඳක් හෝ; පීඨං වා, පුටුවක් හෝ; භිසිං වා, බිස්සක් හෝ; කොච්ඡං වා, කොස්සක් හෝ; අජ්ඣොකාසෙ. 'ආකාශාඞ්ගණ වෘක්‍ෂ මූලාදී, අභ්‍යවකාශයෙහි; සන්ථරිත්වා වා, අතුට (එලා) හෝ; සන්ථරා පෙත්වා වා, අනුන් ලවා අතුරුවා හෝ; පක්කමන්තො, බැහැර (පිට යන්නේ) තං ඒ මඤ්චාදිය; නෙව උද්ධරෙය්‍ය වා, නගා නොතබා නම් හෝ; න උද්ධරාපෙය්‍ය වා, නගා නොතබවා නම් හෝ; අනාපුච්ඡා, නො පිළිවිස; ගච්ඡෙය්‍ය වා, යන්නේ නම් හෝ; පාචිත්තියං, පචිති වේ.

සං:- **"මඤ්චං"** යී. මසාරකො, බුන්දිකාබද්ධො, කුළීර පාදකො, ආහච්ච පාදකො යයි දක්වෙන සිව් වැදෑරුම් ඇඳන් අතුරෙන් කිසියම් ඇඳක් මෙයින් ගැණෙ යි.

'පීඨං' යනු මෙසේ ම පීඨ (පුටු) සංඛ්‍යාවෙහි ගැණෙන යම්කිසි පුටුවක් කියයි.

'භිසි' යි. උණ්ණාභිසි, චොළභිසි, වාකභිසි, තිණභිසි, පණ්ණභිසි යන පස් වැදෑරුම් භිසි අතුරෙන් එකකි.

කැපසමකින් භිසි කළ යුත්තාහ. එණී මිග, වාත මිග, පසද මිග, කුරුඞ්ග මිග, මිග මාතුක, රොහිත මිග යන මොවුන්ගේ සම්වලින් කරන්නට වටී. මෙය කළයුතු ප්‍රමාණය ද අනියමිතය. එහෙයින් තමන්ට කැමති ප්‍රමාණයකින් කළහැකි වේ. මෙසේ කරගත් බිස්ස, වාඩිවීමටත් සයනය කිරීමටත් පාවිච්චි කළ හැකි වේ.

'මක්කටො කාළ සීහො ච සරභො කදලී මිගො,
යෙ ච වාල මිගා කෙචි තෙසං චම්මං න වට්ටති.'

මෙයින් භිසි කිරීමට නොගත යුතු සම් වර්‍ග කියවෙති. එබැවින් මෙකී සම්වලින් කළ භිසි පරිභොගයට නොගත යුතුයි.

සං:- **"අනාපුච්ඡා වා ගච්ජෙය්‍ය"** යී. ඒ සෙනසුනෙහි යම්කිසි භික්‍ෂුවක් හෝ සාමණේරයෙක් හෝ ඇතහොත් මේ මංච පීඨාදිය පටිසාමනය කොට තබවයි කියා පැවරිය යුතුවේ. යමෙක් එසේ නොකොට අපෙක්‍ෂා විරහිතව ගිය හොත් ථාම මධ්‍යම පුරුෂයෙකුගේ ලෙඩ්ඩුපාතාතික්‍රමණය කොට එක පියවරකින් දුකුලාව ද, දෙවෙනි පාදතික්‍රමණයෙන් පචිතිය ද වේ.

**සප්තදශාකාරය.**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | බොහෝ භික්‍ෂූහුය. |
| වස්තුව | - | සන්ථරණය කොට උද්ධරණය නො කොට නො පිළිවිස යෑම් සංඛ්‍යාත වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය යි. |
| ආණත්තිය | - | සාණත්තිකය. |
| ආපත්ති | - | තිකපාචිත්තිය ය. (පුද්ගලිකවූවෙහි) තික දුක්කටයයි. |

5. යො පන භික්ඛු සංඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡා වා ගච්ඡෙය්‍ය පාචිත්තියං.

---

අනාපත්ති - (ජීවිත බ්‍රහ්මචරියන්තරායකර) ආපදවන්හි නිරපෙක්ෂකව යන්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

අඞ්ග - මංචාදීනං සංඝිකතා, වුත්තලක්ඛණදෙසෙ සන්ථරණං වා, සන්ථරාපනං වා, අපලිබුද්ධතා, ආපදය අභාවො, නිරපෙක්ඛතා, ලෙඩ්ඩුපාතාතික්කමො යී. අඞ්ග සයෙකි.

(සමුට්ඨානාදිය පඨම කඨින ශික්ෂාවෙහි මෙනි.) මෙය වනාහි ක්‍රියා'ක්‍රිය වශයෙන් සිදුවේ.

---

## නිදාන කථාව

හෙමන්ත කාලයෙහි භික්ෂූහු අභ්‍යවකාශයෙහි සෙනසුන් පනවා ගෙන බලාර්කරශ්මිය විඳ යාගු භත්තාදි කාලය ආරොචිත කල්හි යන්නාහු සෙනසුන් උද්ධරණය නො කළාහුය. උද්ධරණය නො පිළිවිස ගියහ. ඇඳ පුටු ආදිය තෙමී ගියහ. ඒ බැව් දත් තථාගතයන්වහන්සේ මේ ශික්ෂාපදය අනුදත් සේකි.

එකල්හි භික්ෂූහු අභ්‍යවකාශයෙහි වැස කලින් ම සෙනසුන් අති හරණය කෙරෙති. ඒ දුටු තථාගතයන් වහන්සේ **"අනුජානාමි භික්ඛවෙ අට්ඨමාසෙ අවස්සික සංකෙතෙ මණ්ඩපෙ වා රුක්ඛමූලෙ වා යත්ථ කාකා වා කුලාලා වා න ඌහදන්ති. තත්ථ සෙනාසනං නික්ඛිපිතුන්ති."** යී වදාළ සේක.

**භූතගාම වර්ගයෙ හි චතුර්ත්ථ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

5. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; සංඝිකෙ විහාරෙ, සංඝික (සංඝයාට අයිති) විහාරයෙක්හි; සෙය්‍යං, සයනයක්; සන්ථරිත්වා වා, අතුරා හෝ: සන්ථරාපෙත්වා වා, (අනුන් ලවා) අතුරු වා හෝ: පක්කමන්තො, (යම් දිශාවකට)

යන්නේ; තං, ඒ සෙය්‍යාව, නෙව උද්ධාරෙය්‍ය වා, නගා නොතබා නම් හෝ; න උද්ධරාපෙය්‍ය වා, (අනුන් ලවා) ඔසවවා නො තැබවූයේ නම් හෝ, අනාපුච්ඡා; නොවිචාරා, ගච්ඡෙය්‍ය වා, යන්නේ නම් හෝ; පාචිත්තියං, පචිති වේ.

සං:- "සංඝිකෙ විහාරෙ"යි. සංඝයාට පරිත්‍යාග කරණ ලද (පූජාකරණ ලද) ඔවරක (කාමර) යක් හෝ සර්වපට්ච්ඡන්න (වටේටම අහුරපු) සෙනසුනක් ප්‍රකාශ වේ.

සං:- "සෙය්‍යං"යී. මෙයින් භිසි, චිලිමිකා, උත්තරත්ථරණං, භූමත්තරණං, තට්ටිකා, චම්මඛණ්ඩො, නිසීදනං, පච්චත්ථරණං, තිණසන්ථාරො, පණ්ණ සන්ථාරො යී දශ ප්‍රකාර සෙය්‍යා දක්වෙති.

'භිසි' පළමු කී සේයි. 'චිලිමිකා' යනු සිමෙන්ති හුණු ආදියෙන් පරිකම් කරණ ලද බිමෙහි වර්ණය රැකීම සඳහා කරණ ලද්දකි. 'උත්තරත්ථරණ' නම් ඇඳ පුටු ආදියෙහි ආස්තරණය (එලීම) කළයුතු පසතුරුණු යි. 'භූමත්ථරණ' නම් චිලිමිකාව ඇති කල්හි ඊ මත්තෙහිත්, නැති කල්හි පිරිසිදු බිමෙහිත් ඇතිරිය යුතු කළාලාදියෙකි. 'තට්ටිකා' නම් තල් කොල ආදියෙන් කරණ ලද පැදුරු වෙසෙසකි. 'චම්මඛණ්ඩ' නම් සිංහචර්මාදී යම්කිසි සමකි. සම් පරිහරණයේදී වනාහි අකප්පිය පරිභොගය ප්‍රතික්ෂිප්තය සෙනාසන පරිභොගයෙහි නො කැප සමක් නැත්තේයි. 'පච්චත්ථරණ' නම් පාවාර කොජව යන මොවුහුය, තෘණ සන්ථරණාදිය සුබොධය.

මෙකී දශවිධ සෙය්‍යාවන් අතුරෙන් එකක් නමුත් තමන් ගේ ප්‍රයෝජනයට රැගත්හොත් නැවත යන විටක වේ ආදීන්ගෙන් ආරක්ෂාවන හැටියටත් වැස්සට නොතෙමෙන හැටියටත් පටිසාමනය කොට යා යුතුය. නො එසේ නම් වෙන භික්ෂුවකට හෝ එවැන්නෙකු නැතහොත් සාමණේරයෙකුට හෝ එසේත් නැතහොත් විහාරය කරවා දුන් දයකයාට හෝ එ ගෙදර අතික් කෙනෙකුට හෝ භාරදී යා යුතුයි. එසේ නොකොට යන්නාවූ භික්ෂුවට හෝ භික්ෂූන්ට උපචාරය ඉක්මවා ප්‍රථමපාදයෙහි දුකුළාව ද, දෙවෙනි පාදයෙහි පචිතිය ද වේ. යම් තැනක උපචිකාදීන්ගෙන් අනතුරක් නොවේ යයි නිසැක නම් නොවිචාරා ගියත් වරදක් නොවේ. එහෙත් විචාරා යැම වතකි. හෙවත් චාරිත්‍රයෙකි.

### සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | සප්තරසවර්ගීය භික්ෂූහුය. |
| වස්තුව | - | සඞ්ඝික වෙහෙරෙහි සෙය්‍යා අතුරා උද්ධරණය නො කොට ආපුච්ඡා ද නො කොට යෑම් සංඛ්‍යාත වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්තිය | - | සාණත්තිකය. |
| ආපත්ති | - | තික පාචිත්තිය යි. පුද්ගලිකවූවෙහි තික දුක්කටය යි. |
| අනාපත්ති | - | සෙය්‍යාවත් නගා, තබා යන්නහුට ද, සාපෙක්ෂකව යන්නහුට ද ආපදපත්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | වුත්තලක්ඛණ සෙය්‍යා, තස්ස සඞ්ඝිකතා, වුත්තලක්ඛණෙ විහාරෙ සන්ථරණං වා සන්ථරාපණං වා, අපළිබුද්ධතා, ආපදය අභාවො, අනපෙක්ඛස්ස දිසා පක්කමනං, උපචාරසීමාතික්කමො යි අඞ්ග සතෙකි. |

(සමුට්ඨානාදිය අනන්තර ශික්ෂාපදයෙහි මෙනි.)

---

## නිදන කථාව

එක්කලෙක සප්තරසවර්ගීය භික්ෂූහු සහායකයෝ වූහ. ඔව්හු එකට වෙසෙති. එක්වම නික්ම යෙති. ඔව්හු එක්තරා සාඞ්ඝික විහාරයකැ සෙය්‍යා සන්ථරණයකොට වැස එයින් බැහැර යන්නෝ ඒ සෙය්‍යා නගා නොතැබූහ. අනුන් ලවාද නොතැබ්බවූහ. ආරාමිකාදීන්ට නො පවරා ගියහ. ඒ සෙය්‍යාවෝත් වේයන් විසින් කා විනාශකරණ ලද්දහුය.

අල්පෙච්ඡ භික්ෂූහු එයින් නොපැහැදුනෝ බුදුන්ට සැළකළහ. බුදුහු මේ ශික්ෂා පදය අනුදත් සේක.

**භූතගාම වර්‍ගයෙහි පසළොස්වම ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

---

6. යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ ජානං පුබ්බුපගතං භික්ඛුං අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙය්‍ය, යස්ස සම්බාධො භවිස්සති සො පක්කමිස්සතීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං.

---

6. **අර්:-** යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; සඞ්ඝිකෙ විහාරෙ, සඟසතු විහාරයෙහි; ජානං, සඞ්ඝයා විසින් දෙන ලද බව දැන දැන; පුබ්බුපගතං, පළමුකොට එළඹියා වූ; භික්ඛුං, භික්ෂුවක්; අනුපඛජ්ජ, ගටාගෙන; යස්ස, යමෙකුට; සම්බාධො, ගැහැටක්; භවිස්සති, වන්නේද; සො, හෙතෙම; පක්කමිස්සතීති, බැහැර යන්නේයයි; එතං එව, මේ සයනාසනයම; පච්චයං කරිත්වා, කරුණු කොට ගෙණ; අනඤ්ඤං (ගිලන් බව ඈ) අනිකක් කරුණු කොට නොගෙණ, සෙය්‍යං කප්පෙය්‍ය, සයනය කෙළේ නම්; පාචිත්තියං, පචිති වේ.

**සං:-** **"ජාන"** යී මෙතෙම නො නැගිටුවිය යුත්තෙකැයි දැන දැන යනුයි. එහෙයින් පදභාජනයෙහි **"වුඩ්ඪොති ජානාති ගිලානොති ජානාති සංඝෙන දින්නාති ජානාති"** යී කියන ලදී. වෘඩයා වැඩිමහලු නිසාත් ගිලනා ගිලන් නිසාත් නොනැගිය යුත්තෝයි. සඞ්ඝයා භාණ්ඩාගාරිකයාට හෝ ධර්මකථික විනයධර ගණවාචකාචාර්‍ය්‍යයන් අතුරෙන් යමෙකුට හෝ සඞ්ඝයාට උපකාර බව නිසාත් ගුණවත් බව නිසාත් නිත්‍යවාසයට විහාරයක් සම්මත කොට දෙයි. ඒ විහාරයෙහි සිටින ඔහුත් ඉවත් කළ නො හැක්කේය.

**සං:-** **"පුබ්බුපගතං"**යී. පුබ්බුපගතයා නම් කලින් එළඹි තැනැත්තේය.

**සං:-** **"අනුපඛජ්ජ"** යී උපචාරය නොතැබීම කිය වේ.

**සං:-** **"සෙය්‍යං කප්පෙය්‍ය"** යී. පළමුවෙන් එලඹුන භික්ෂුවට සම්බාධ කරණු කැමැත්තෙන් උපචාරයෙහි දශවිධ සෙය්‍යාවන් ගෙන් එකක් සන්ථරණය කරණ කරවන භික්ෂුවට දුකුළා වෙකි. එහි හිඳගන්නහුට ද නිදන්නහුට ද පචිති ඇවැත් වේ. දෙකම කරන්නහුට පචිති දෙකෙකි. නැවත නැවත හිඳීමාදිය කරන්නහුට ප්‍රයොගයක් පාසා පචිති වෙති.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීය භික්ෂූහුය. |
| වස්තුව | - | අනුපඛජ්ජ සෙය්‍යා කිරීම් වස්තුවය. |

7. යො පන භික්ඛු, භික්ඛුං කුපිතො අනත්තමනො සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍ය වා පාචිත්තියං.

---

| | | |
|---|---|---|
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තික පාචිත්තිය යි. පුද්ගලික වෙහෙරෙහි තික දුක්කටයයි. |
| අනාපත්ති | - | ගිලන්ව පිටිසෙයි ද සීතුණ්හයෙන් පීඩිතව පිටිසේ ද ආපදවන්හි පිටිසේ ද එබඳු අයට ද උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | සඞ්ඝික විහාරතා, අනුට්ඨපනීය භාව ජානනං; සම්බාධෙතු කාමතා, උපචාරෙ නිසීදනං වා, කියා අඞ්ග සතරෙකි. |

(සමුට්ඨානාදිය ප්‍රථම පාරාජිකාවේ මෙනි.) මෙහි දුක්ඛවෙදනා යි.

## නිදාන කථාව

සවග මහණහු උතුම් සෙනසුන් පළිබොධය යි කියා ස්ථවිර භික්ෂූන් නැගිටුවති. එකල්හි ඒ භික්ෂූනට මෙසේ සිතුනි. කවර නම් උපායකින් මෙහිම වෙසෙමුද කියා යි. එකල්හි සවග මහණෝ ස්ථවිර භික්ෂූන් ගටා සයනය කෙරෙති. යමෙකුට අපහසු නම් හෙතෙම බැහැර යන්නේ ය කියා යි.

මේ බැව් දත් අල්පෙච්ඡ භික්ෂුහු බුදුන්වහන්සේට සැළ කළහ. බුදුහු මේ කරුණු කොට ගෙණ මේ ශික්ෂාපදය අනුදන වදළසේක.

**භූතගාම වර්ගයෙහි ෂෂ්ඨම ශික්ෂාපද වණ්නාව නිමි.**

---

7. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; භික්ඛුං, භික්ෂුවක්; කුපිතො, කිපියේ; අනත්තමනො, නොසතුටු සිත් ඇත්තේ; සංඝිකා විහාරා, සඞ්ඝික විහාරයෙන්; නික්කඩ්ඪෙය්‍ය වා, එළවා, නම් හෝ; නික්කඩ්ඪාපෙය්‍ය වා, එළව වා නම් හෝ; පාචිත්තියං, පචිති වේ.

සං:- **"නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍යවා"** යී අතින් ගෙණ නොයෙක් මහල් ඇති ප්‍රාසාද ආදියෙන් අතර නොරඳවා එක පාරටම පිට කරන්නහුට එක් පචිතියෙක් වේ. ඒ ඒ තත්හි නැවති නැවතී නත් පියොවින් පිට කරන්නහුට වාර ගණනින් පචිති වෙති; අතින් නො අල්ලා පිටවී යව' යි වචනයෙන් එලවන්නහුට ද එසේම වචන ගණනින් පචිති වෙති. අනුන් ලවා පිට කරවීමට අණකළ හැටියේම දුකුළා වෙකි.

එක්වරක් ඇණවීම ලැබ දෙරවල් ගණනකින් නික්ම ගියත් ඇණවුවහුට එකම පචිතියෙකි. යම් හෙයකින් මෙපමණ දෙරකඩවල් වලින් පිට කරව. මහ දෙර දක්වා පිටකරවයි නියම කරන්නහුට ඬාර ගණනින් පචිති වෙති.

'මෙයින් නික්ම යව'යි යන වචනය ඇසී තමන්ගේ කැමැත්තෙන් නික්ම ගිය හොත් විධානය කළහුට ඇවැත් නොවේ. භණ්ඩන කාරක කලහකාරකයන් සංඝාරාමයෙන් සහමුලින්ම එළවන්ට වටනේය. පක්ෂබලය ඇතිවූ විටෙක සඞ්ඝභෙදය කළ හැකි බැවිනි. අලජ්ජීහු ස්වකීය වාසස්ථානයෙන් පමණක් එළවිය යුත්තාහ. සියලු සඞ්ඝාරාමයෙන් එලවන්ට නො වටී.

පත්තචීවරාදී පරිෂ්කාර පිට දැමීමෙහි ද අනුන් ලවා පිට දැම්ම වීමෙහිද දුකුළා' වෙති.

## සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීය භික්ෂූහුය. |
| වස්තුව | - | භික්ෂුවක් සංඝික විහාරයෙන් පිට කිරීම් සංඛ්‍යාත වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | සාණත්තිකය. |
| ආපත්ති | - | තික පාචිත්තිය යි. (පෞද්ගලිකයෙහි) තිකදුක්කට යයි. |
| අනාපත්ති | - | තමන්ගේ හෝ ස්වකීය විශ්වාසයෙකුගේ හෝ විහාරයෙන් පිට කරන්නහුට ද, භණ්ඩනකාරකයන් හා ඔවුන් ගේ පිරිකර පිට කරන්නහුට ද, කරවන්නහුට ද, තමන් වසන තැනින් අලජ්ජීන් හා උම්මත්තකයන් ද, අකීකරු අන්තෙවාසිකාදීන් පිට කරන්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |

8. යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ උපරිවෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා සහසා අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා පාචිත්තියං.

---

අඞ්ග - සඞ්ඝික විහාරො, උපසම්පන්නස්ස භණ්ඩන කාරක භාවාදි විනිමුත්තතා, කොපෙන නික්කඩ්ඪනංවා නික්කඩ්ඪාපනංවා, කියා අඞ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදනයෙහි කීයේයි.)

මෙහි වෙදනාව නම් දුක්ඛ වෙදනාවයි.

---

## නිදන කථාව

එක්කලෙක සත්තරස වර්ගීය භික්ෂූහු පසල් දනව්වෙක්හි මහා විහාරයක් (අපි මෙහි වස්වසමුයයි කියා) ප්‍රතිසංස්කරණය කෙරෙති. ෂඩ්වර්ගීය භික්ෂූහු මේ දක මෙසේ කීවාහුය. ඇවත්නි! මේ සප්තරස වර්ගීය භික්ෂූහු විහාරයක් ප්‍රතිසංස්කරණය කෙරෙති. අපි ඔවුන් එලවමුයයි කියා යි. ඇතැමෙක් ඇවැත්නි! ප්‍රතිසංස්කරණය කරණ තුරු නවතිව්. ප්‍රතිසංස්කරණය කළ පසු එලවමු යයි කීහ.

මෙසේ කියා සත්තරස වර්ගීය භික්ෂූන් සමග කලහකොට කිපී එලවූහ. ෂඩ්වර්ගීය භික්ෂූහු විහාරය අයත් කරගත්හ. අල්පේච්ඡ භික්ෂූහු මෙය රුචි නොකළාහුය. බුදුන්වහන්සේට ද සැළකළහ. බුදුන් එකරුණෙහි දී මේ ශික්ෂාව අනුදත් සේකි.

**භූතගාම වර්ගයෙහි සප්තම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

8. අර්ථ:- යො පන භික්ඛු, යම් භික්ෂුවක්තෙම වනාහි; සඞ්ඝිකෙ විහාරෙ, සඟසතු විහාරයෙක්හි; වෙහාසකුටියා, (පෝරු) නො අතුළ මතුමහල් ගෙයෙක්හි; උපරි, තුලා මත්තෙහි; ආහච්චපාදකං, වත විද ගසනලද පා ඇති; මංචං වා (මුදුනෙහි ඇණ නොගසන ලද) ඇඳක හෝ, පීඨං වා, (එවැනි) පුටුවක හෝ; සහසා, වහා; අභිනිසීදෙය්‍ය වා, හිඳින්නේ නම් හෝ; අභිනිපජ්ජෙය්‍ය වා, හොවින්නේ නම් හෝ; පාචිත්තියං, පචිති ඇවැත් වේ.

සං:- **"උපරිවෙහාස කුටියා"**යී (උපරි පුරිමතලං වෙහාසං එතිස්සා'ති: උපරිවෙහාසා: උපරිවෙහාසා ච සා කුටීචාති; උපරිවෙහාසකුටි; තස්මිං උපරිවෙහාස කුටියා.)

වෙහාසකුටිය නම - මතුතෙලෙහි නො අතුරණ ලද පෝරු ඇති දෙමහල් තෙමහල් ආදී ප්‍රභෙදවත් කිළියෙකි. පද භාජනයෙහි මේ කිළිය විස්තර කරන්නෝ **"වෙහාස කුටි නාම, මජ්ඣිමස්ස පුරිසස්ස අසීසඝට්ටා"** යි කිහු.

මධ්‍යම ප්‍රමාණ පුරුෂයෙකුගේ හිස නො තැවරෙන පමණ උසින් කරපු ඇඳන්, (මැසි) විශෙයක් ඇති කුටියක් මෙයින් ප්‍රකාශ වේ.

සං:- **"ආහච්චපාදකං"** යී (ආහච්චපාදෙ එතස්සාති! ආහච්චපාදකො) ඇඳ පුටුවල ලක්ෂණයක් කිය වේ. (වත) විට්ටම විද ඇණ නොගසා සවිකරණ ලද පා ඇති ඇඳ පුටු වෙසසක් මෙයින් ප්‍රකාශ කෙරෙයි. මේ ඇඳ පුටු වල හදිසියෙන් තරයේ වාඩි උවහොත් බුදිය ගතහොත් කකුල් ගැලවී වැටෙන බැව් මෙයින් හැඟේ. ඒ නිසාම වහා වාඩිවුවහොත් බුදිය ගතහොත් ඇවැත් සිදුවෙන බැව් දක්වේ.

**සප්තදශාකාරය**

නිදානය - සැවැත් නුවරය.

පුද්ගලයා - එක්තරා භික්ෂුවක්ය.

වස්තුව - උක්තාකාර මඤ්චාදියෙහි හිඳීදන වස්තුවය.

ප්‍රඥප්තිය - සාධාරණ (ප්‍රඥප්තිය ය)

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - 'තික පාචිත්ති'ය යි (පුද්ගලික) 'තිකදුක්කට' යයි.

අනාපත්ති - හිසගැටෙනසේ කළ අවෙහාස කුටියෙහි ද යට පරිභොග නො කරණ කුටියෙහි ද, උපරිතලය පෝරු ආදියකින් සඤ්චිත කුටියෙහි ද, ඇණ ගසන ලද ඇඳෙහි ද, අල්වා ගන්ට යමක් ඇති ඇඳන් ආදියෙහි ද සිටින තැනැත්තේත් උම්මත්තකාදීහුත් ඇවත් වලින් මිදෙති.

9. මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරය මානෙන යාවද්වාර කොසා අග්ගලට්ඨපනාය ආලොක සන්ධි පරිකම්මාය ද්වත්තිච්ඡදනස්ස පරියායං අප්පහරිතෙ ඨිතෙන අධිට්ඨාතබ්බං, තතො චෙ උත්තරිං අප්පහරිතෙපි ඨිතො අධිට්ඨහෙය්‍ය පාචිත්තියං.

---

අඞ්ග - සඞ්ඝිකවිහාරො, අසීසඝට්ටා වෙහාසකුටි, හෙට්ඨා සපරිභොගං, අපටානි දින්නෙ ආහච්චපාදකෙ නිසීදනං වා නිපජ්ජනං වා යී අඞ්ග සතරෙකි.

(සමුට්ඨානාදිය එළකලොම ශික්ෂාවෙහි සේයි.)

---

## නිදාන කථාව

භික්ෂූහු දෙනමක් එක්ව සහ සතු වෙහෙරෙක්හි උපරිවෙහාස කුටියෙහි උඩ එක් නමක් ද යට එක නමක් ද වෙසෙති. උඩ වසන භික්ෂුව එක් දිනක් වහා ඇඳෙහි වාඩිවිය. එයින් ඇඳ කකුල් පෙරළී යට හුන් භික්ෂුවගේ මත්තෙහි වැටුනේය. එයින් ඒ භික්ෂුව හයින් හා වේදනාවෙන් කෑ ගැසීය.

අසල සිටි භික්ෂූහු එතනට පැමිණ කරුණු විචාරා උජ්ඣායනය කරන්ට වූහ. මෙ කරුණ නිසා බුදුහු මේ ශික්ෂා පදය අනුදත් සේක.

**භූතගාම වර්ගයෙහි අෂ්ටම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

9. **අර්ථ**:- මහල්ලකං, (කරවාදෙන හිමියන් ඇති) මහල්ලක නම්වූ: විහාරං, (උල්ලිත්තාවලිත්තාදී) විහාරයක්; කාරය මානෙන, කර වන්නාවූ; භික්ඛුනා පන, භික්ෂුව විසින් වනාහි: ද්වාරකොසායාව: දෙරබාවගේ දෙරියන් හමාරක් දක්වා; අග්ගලට්ඨපනාය, දෙරබාව හා දෙර ස්ථිර බව පිණිස; ආලොකසන්ධි පරිකම්මාය, කවුලු පිරියම් කිරීම පිණිස; ද්වත්තිච්ඡදනස්ස, පියසි අග දෙකක් තුණක් හුගේ; පරියායං, පරික්ෂෙපයක්; අප්ප හරිතෙ, ධාන්‍ය මුද්ග මාසාදිය හා තෘණාදිය නැති තන්හි; ඨිතෙන, සිටියහු විසින්: අධිට්ඨා තබ්බං, විධානය කට යුත්තේය.

චෙ, ඉදින්: අප්පහරිතෙ අපි, තෘණාදිය නැති තන්හිද; ඨිතො, සිටියේ: තතො උත්තරිං, ඉන් මත්තෙහි: අධිට්ඨහෙය්‍ය, විධාන (නියම) කෙළේ නම්, පාචිත්තියං, පචිති වේ.

සං:- **"යාවද්වාරකොසා"** යි. මෙහි 'ද්වාරකොසය' නම් වැඩිම ගණනින් දෙරබාව (ද්වාරබන්ධනයාගේ) හාත්පස දෙරියන් බාගයක් පමණ පෙදෙසයි. ද්වාරබන්ධනය නම් උළුවස්සයි.

සං:- **"අග්ගලට්ඨපනාය"** යි. අග්ගලට්ඨපනය නම් අගුල් තැබීමයි. කවුළුව සහිත ද්වාරබන්ධනයාගේ නො සෙල්වීම සඳහා අගුල් තැබිය යුතුයි. කවුළුව වනාහි විවෘත කරණ කල භිත්තියෙහිත් පියන (වසන) කල ද්වාරබන්ධනයෙහිත් හැපෙයි. එයින් භිත්තිය දෙදරා (සෙලවී) මැටි සෙලවෙයි එපමණක් නොව මැටි වැටෙයි. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් 'යාවද්වාරකොසා අග්ගලට්ඨපනායා'ති. දෙශිතය. මෙයට කළ යුත්තක් මාතිකාවෙහිවත් පදභාජනයෙහිවත් ප්‍රකාශ නො වෙතත් ශික්ෂාපද නිදානයේ 'පුනප්පුනං ඡාදපෙසි පුනප්පුනං ලෙපාපෙසී'ති කියන ලද බැවින් ද්වාරකොසය දක්වා අගුල් තැබීමට ලිම්පනය කටයුතුයි. අනුන් ලවා ලිම්පනය කරවිය යුතුයි.

සං:- **"ආලොක සන්ධි පරිකම්මාය"** ආලොක සන්ධිය නම් වා කවුළුවයි. වා කවුළු විවෘත කරණ කල වියතක් පමණ තැන් හෝ ඊට වැඩියක් හෝ භිත්තියේ ගැටෙයි. එබැවින් හැම පැත්තෙන්ම කවුළු වේ පමණට පෙදෙසක් ලිම්පනය කටයුතුයි. අනුන් ලවා ද එසේ කරවීම වටී. නියම කළ පෙදෙසින් පිට එසේ කරන්ට කරවන්ට නොවටී. නැවත ඡදනය (වහල) පිළිබඳ කටයුතු දැ කියවෙති.

සං:- **"ද්වත්තිච්ඡදනස්ස පරියායං"** යී වහල සෙවිලි කරණ විට වහලේ වට (රවුන්) දෙකක් තුණක් පමණ මෙසේ කරවයි විධාන කරමින් ගෙය වටේ ඇවිදින්ට හැකි වේ. එහෙත් සාලි ව්‍රීහි ආදි පුබ්බණ්ණ ශස්‍ය ද මුද්ගමාසාදි අපරණ්ණ ශස්‍ය ද නො වපුල තැන සිටියහු විසින් විධාන කටයුතුයි. ඒ නිසා ශස්‍ය නැති තැනකම විහාරය කළ යුත්තේය. වහල උඩ පාර්ශ්වයෙක්හි සිටි පුරුෂයෙකුට බිම සිටි භික්ෂුව වහල කොණෙන්පෙණේ ද එසේම බිම සිටි භික්ෂුවට වහලේ සිටි පුරුෂයා පෙණේ ද එබඳු තැනක සිටගෙණ විධාන කට හැක්කේය.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදානය | - | කොසැඹෑ නුවරය. |
| පුද්ගලයා | - | ඡන්නතෙරණුවෝය. |
| වස්තුව | - | නැවත නැවත ඡාදපන ලෙපාපන වස්තුවයි. |

10. යො පන භික්ඛු ජානං සප්පාණකං උදකං තිණං වා මත්තිකං වා සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා පාචිත්තියං.

භූතගාම වග්ගො දුතියො

---

| | | |
|---|---|---|
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්ති ය ය. |
| ආණත්ති | - | අනාණත්තික ය. |
| ආපත්ති | - | 'තිකපාචිත්ති' ය යි. අතිරෙක සංඥී ආදීන්ට 'දුකුළා' වයි. |
| අනාපත්ති | - | ශුභ්‍රවර්ණාදිකරණයෙහි ද, දෙවටයක් හෝ එයට අඩුව හෝ විධාන කිරීමෙහි ද ලෙන් ගුහා තෘණ කුටි කරවීමෙහි ද, අනුන්ට සිය ධනයෙන් කරවන්නහුට ද වාසාගාරය හැර සෙස්සෙහි විධාන කරන්නහුට ද උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | මහල්ලක විහාරතා, අත්තනො වාසාගාරතා, උත්තරිං අධිට්ඨානතා, අඞ්ග තුණෙකි. |

(සමුට්ඨානාදිය සංචරිත්තයෙහි මෙනි.)

# නිදාන කථාව

ආයුෂ්මත් ඡන්නස්ථවිරයන් වහන්සේගේ උපස්ථායක මහා මාත්‍යයෙක් උන්වහන්සේට විහාරය කරවා දුන්නේය. ඡන්න ස්ථවිරතෙම ඒ විහාරය නැවත නැවත සොයවයි. නැවත නැවත ලිම්පනය කරවයි. ඉතා බරවූ එ ගෙය බිඳ වැටුනේය. ඡන්න ස්ථවිර එහෙයින් තෘණ කාෂ්ඨාදිය එක් රැස් කරණුයේ එක්තරා බමුණෙකුගේ යවකෙතක් (පොඩිකර) දූෂණය කෙළේය. ඒ බමුණා ද භික්ෂූන්ට දෙස් කියන්ට විය. මෙකරුණ නිසා බුදුහු මේ ශික්ෂාපදය අනුදැන වදළසේක.

---

10. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; ජානං, දැන දැන, සප්පාණකං, ප්‍රාණීන් (පණුවන්) සහිතවූ; උදකං, ජලය ගෙණ, තිණං වා, තෘණයෙහි හෝ; මත්තිකං වා, මැටියෙහි හෝ; සිඤ්චෙය්‍ය වා, (ඒ ජලයෙන්) ඉසින්නේ නම් හෝ; සිඤ්චාපෙය්‍ය වා, (අනුන් ලවා) ඉස්සවා (තෙමවා) නම් හෝ පාචිත්තියං, පචිති වේ.

දුතියො; දෙවැනි වූ; භූතගාමවග්ගො, භූතගාම වර්ගීය යි.

සං:- **"ජානං සප්පාණකං"** යී. මෙහි අදහස නම් - මෙය ප්‍රාණීන් (=පණුවන්) සහිත යයි ඇසින් දැක හෝ කිසිවෙකුගෙන් අසා හෝ කිසියම් ආකාරයකින් දැන දැන යනුයි.

සං:- **"සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා"** යී පණුවන් සහිත ජලයෙන් තමන්ම ඉසීම කළත් අනුන් ලවා කරවූවත් ඇවැත් සිදුවේ. ධාරාව නොකැඩී කළයේ වතුර එකවරටම වැගිර ඉවර වුවහොත් එක කළයකින් එක පචිතියෙකි. ධාරාව කඩ කඩා (නවත්වමින්) වත් කළහොත් ප්‍රයොග ගණනින් ඇවැත් නියම කළයුතුයි. බොහෝ තෘණ පර්‍ණ ශාඛාදිය එකවර පණුවන් සහිත දියට හෙලන්නහුට එක ඇවැතෙකි, එක එක හෙලන්නහුට ප්‍රයොග ගණනින් ඇවැත් වෙති.

මේ නියමය තෘණ පර්‍ණාදිය හෙලීමෙන් වතුර කැලැත් වී එයින් සතුන් මැරෙන්ට හැකි ජලය ගැණයි. මහා ගංගාදිය සඳහා නොවේ. ඇණවීමෙහි දුකුළා වෙකි,

## සප්ත දශාකාරය

නිදනය - අලවි නුවරය.

පුද්ගලයෝ - අලවි නුවර වැසි භික්‍ෂූහුය,

වස්තුව - සිඤ්චන වස්තුවය,

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය ය,

ආණත්තිය - සාණත්තිකය,

ආපත්ති - පාචිත්තිය යි,

ප්‍රාණීන් නැත්තෙහි ප්‍රාණීන් ඇතැයි සිතන්න හුට ද වෙමතිකයාට ද දුකුළා වේ.

අනාපත්ති - ප්‍රාණීන් නැතැයි සිතන්නහුට ද, නොදැන ඉසින්න හුට ද, අමතකවීමෙන් ඉසින්නහුට ද උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

අඞ්ග - උදකස්ස සප්පාණතා, සිඤ්චනෙන පාණකා මරිස්සන්තීති ජානනං, තථාරූප උදකං තාදිසමෙව, විනා වධක චෙතනාය කෙනචිදෙව කරණීයෙන තිණාදීනං සිඤ්චනන්ති කියා අඞ්ග සතරෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදානයෙහි කීසේයි.)

1. යො පන භික්ඛු අසම්මතො භික්ඛුනියො ඔවදෙය්‍ය පාචිත්තියං.

---

වද්‍ය - ප්‍රඥප්ති වද්‍ය යයි,

චිත්ත - ත්‍රිවිධ චිත්ත යයි.

වෙදනා - ත්‍රිවිධ වෙදනායි.

**දෙවැනි භූතගාම වර්ගයයි.**

---

# නිදාන කථාව

අලව්නුවර වැසි භික්ෂූහු නවකර්මාන්ත කරවන්නාහු පණුවන් සහිත ජලය ඉසිති. පණුවන් සහිත ජලයෙහි තෘණ මැටි ආදිය බහාලති.

මේ නිසා අල්පෙච්ඡ භික්ෂූහු කලකිරී තථාගතයන් වහන්සේට සැළ කළාහුය. මෙ කරුණ නිසා බුදුහු මේ ශික්ෂාපදය අනුදන වදළ සේක.

**භූතගාම වර්ගයෙහි දශවැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

1. **අර්ථ:-** යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: අසම්මතො, (භික්ෂූන් විසින්) සම්මත (නියම) නො කරණ ලද්දේ; භික්ඛුනියො, භික්ෂුණීන්ට; ඔවදෙය්‍ය (අෂ්ටගරු ධම්මවලින් අවවාද කෙරේ නම්; පාචිත්තියං පචිති වේ.

**සං:- "අසම්මතො"** යි භාග්‍යවතුන් වහන්සේ විසින් අඩග අටකින් යුක්ත භික්ෂුවට ඥප්ති චතුර්ථ කර්මවාක්‍යයෙන් භික්ඛුනො වාදක සම්මුතිය දීමට අනු දන්නා ලදි. එබඳු නියමයක් නොලත් භික්ෂූන් විසින් භික්ෂුණීන්ට අවවාද නොකට යුත්තේය.

**සං:- "ඔවදෙය්‍ය"** යි මෙහි අවවාදය නම් අෂ්ට ගරු ධර්ම වලින් අවවාද කිරීමයි.

**අෂ්ටගරු ධර්ම නම්:-**

1. "වස්සසතූපසම්පන්නාය වා භික්ඛුනියා තදහූපසම්පන්නස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කාතබ්බං"

2. න භික්ඛුනියා අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිතබ්බං

3. අන්වද්ධමාසං භික්ඛුනියා භික්ඛු සංඝතො ද්වෙ ධම්මා පච්චාසිංසිතබ්බා උපොසථ පුච්ඡනඤ්ච ඔවාදූපසංකමනඤ්ච.

4. වස්සං වුත්ථාය භික්ඛුනියා උභතො සංඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බං දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා.

5. ගරුධම්මං අජ්ඣාපන්නාය භික්ඛුනියා උභතො සංඝෙ පක්ඛමානත්තං චරිතබ්බං.

6. ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිත සික්ඛාය සික්ඛමානාය උභතො සංඝෙ උපසම්පද පරියෙසිතබ්බා.

7. න භික්ඛුනියා කෙනචි පරියායෙන භික්ඛු අක්කොසිතබ්බො පරිභාසිතබ්බො.

8. අජ්ජතග්ගෙ ඔවටො භික්ඛුනීනං භික්ඛුසු වචනපථො, අනොවටො භික්ඛූනං භික්ඛුනීසු වචන පථො'

මේ අට භික්ෂුණීන් විසින් ගරුකොට පිළිගත යුතු බැවින් ගරු ධර්ම වෙති.

### සප්තදශාකාරය

නිදානය - සැවැත්නුවරය.
පුද්ගලයෝ - සවග මහණෝයි.
වස්තුව - ඔවදන වස්තුවය.
ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තිය.
ආණත්ති - අනාණත්තිකය.
ආපත්ති - තිකපාචිත්ති ය ය.

(මෙහි පචිති අටලොසක් හා දුකුළා සතලොසක් වෙති.)

ඒ මෙසේයි:-

අධර්ම කර්මයෙහි අධර්ම කර්ම සංඥීව වර්ගිනී වූ භික්ෂුණී සංඝයාට වර්ගී සංඥීව අවවාද කෙළේ නම් 'පචිති' වේ. එසේම වෙමතිකව අවවාද කෙළේ නම් 'පචිති' වේ. නැවත එසේම සාමග්‍රී සංඥීව අවවාද කෙළේ නම් 'පචිති' වේ.

අධර්ම කර්මයෙහි වෙමතික වූයේ වර්ගිනී වූ භික්ෂුණී සංඝයාට වර්ගී සංඥීව අවවාද කෙළේ නම් 'පචිති' වේ. එසේම වෙමතිකව අවවාද කෙළේ නම් 'පචිති' වේ. සමග්ග සංඥීව අවවාද කෙළේ නම් 'පචිති' වේ.

අධම් කම්යෙහි ධම් කම් සංඥව ඇතිව වර්ගිනී වූ භික්ෂුණී සංඝයාට වගී සංඥීව අවවාද කෙළේ නම් ‘පචිති’ වේ. වෙමතිකව අවවාද කෙළේ නම් ‘පචිති’ වේ.

අධම් කම්යෙහි අධම් කම් සංඥ ඇතිව සමග්‍ග භික්ෂුණී සංඝයාට වගී සංඥීව අවවාද කෙළේ නම් ‘පචිති’ වේ. වෙමති කව අවවාද කෙළේ නම් ‘පචිති’ වේ. සමග්‍ග සංඥ ඇතිව අවවාද කෙළේ නම් ‘පචිති’ වේ.

අධම් කම්යෙහි වෙමතිකව අවවාද කෙළේ නම් ‘පචිති’ වේ. වෙමතිකව අවවාද කෙළේ නම් ‘පචිති’ වේ. එසේම සමග්‍ග සංඥ ඇතිව අවවාද කෙළේ නම් ‘පචිති’ වේ.

අධම් කම්යෙහි ධම් කම් සංඥ ඇතිව පළමු සේ අවවාද කෙළේ නම් ‘පචිති’ වේ. වෙමතිකව හා සමග්‍ග සංඥ ඇතිව අවවාද කෙළේ නම් ‘පචිති’ වේ.

ධම් කම්යෙහි අධම් කම් සංඥ ඇති වර්ගිනී වූ භික්ෂුණී සංඝයාට වගී සංඥ ඇතිව අවවාද කෙළේ නම් ‘දුකුළා’ වේ. (අනිත් ‘දුකුළා’ සොළස වන පරිදි මේ ක්‍රමයෙන් සැලකිය යුතුයි.)

අනාපත්ති - ධම් කම්යෙහි ධම් කම් සංඥ ඇතිව සමගි භික්ෂුණී සංඝයාට සමගිය යන සිතින් අවවාද කරන්නහුට ද, ගරු ධම් පාලිය උදෙසන්නා ට ද, ප්‍රශ්න විචාරන්නාට ද, ඔසාරණය කළ මැනවයි කී කල්හි එසේ කරන්නාට ද, අසන ලද ප්‍රශ්නයට උත්තර දෙන්නාට ද, සික්ඛමානා සාමණේර යන මොවුන්ට කියන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - අසම්මතතා, භික්ඛුනියා පරිපුණ්ණූපසම්පන්නතා, ඔවාදවසෙන අට්ඨ ගරුධම්ම භණනං, යන අඞ්ග තුනෙකි.

(සමුට්ඨානාදිය පදසො ධම් ශික්ෂාපදයෙහි කීසේයි.)

---

## නිදන කථාව

එක් කලෙක ස්ථවිර භික්ෂූහු භික්ෂුණීන්ට අවවාද කළහ. එයින් ඒ භික්ෂූන්ට චීවරාදී පරිෂ්කාර බහුල වූහ. එකල්හි චීවරාදී පරිෂ්කාර ආශාවෙන් භික්ෂුණීන්ට අවවාද කරන්ට සවග භික්ෂූහුද පටන් ගත්හ.

2 සම්මතො'පි චෙ භික්ඛු අත්ථංගතෙ සුරියෙ භික්ඛුනියො ඔවදෙය්‍ය පාචිත්තියං.

---

ඔහු අවවාද සවල්පයක් ම කරති. නොයෙක් තිරච්ඡාන කථාවලින් භික්ෂුණීන් සමග දවස් යවති. මේ කරුණු භික්ෂුණීහු භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. එකල්හි දැහැමි කථාව අවසානයේ දී "අනුජානාමි භික්ඛවෙ භික්ඛුනො වාදකං සම්මන්නිතුං" යනු අනුදත් සේක. නැවත මේ ශික්ෂාපදය ද වදළ සේකි.

එකල්හි සවග මහණෝ ඔවුනොවුන් සම්මත කොට ගෙණ භික්ෂුණීන්ට අවවාද කරන්ට වූහ. ඒ බැව් දත් තථාගතයන් වහන්සේ "**අනුජානාමි භික්ඛවෙ අට්ඨහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං භික්ඛුනොවාදකං සම්මන්නිතුං**" යනු ද අනුදත්හ.

**අවවාද වර්ගයෙහි ප්‍රථම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

2. **අථ**:- භික්ඛු, මහණ තෙම; චෙ, ඉදින්; සම්මතො අපි, (භික්ෂුන් විසින්) සම්මත කරණ ලද්දේ නමුත්; සුරියෙ, හිරු; අත්ථ ගතෙ, අස්තයට ගිය කල්හි; (ඉර බැස්ස කල්හි) භික්ඛුනියො, භික්ෂුණීන්ට; ඔවදෙය්‍ය, අවවාද කෙළේ නම්; පාචිත්තියං, පචිති වේ.

**සං**:- ඉර බැස්ස කල්හි අෂ්ඨගරු ධර්ම වලින් හෝ අන්‍ය ධර්මයෙකින් හෝ භික්ෂුණීන්ට අවවාද කරණ සම්මුති ලත් භික්ෂුවට වුව ද පචිති ඇවැත් සිදුවේ.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයා | - | චූලපන්ථක තෙරණුවෝය. |
| වස්තුව | - | හිරු අස්තංගත වූ කල්හි ඔවදන වස්තුවය. |
| පඤ්ඤත්ති | - | අසාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |

3. යො පන භික්ඛු භික්ඛුනූපස්සයං උපසංකමිත්වා භික්ඛුනියො ඔවදෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථා'යං සමයො ගිලානා හොති භික්ඛුනී. අයං තත්ථ සමයො.

---

ආපත්ති - තිකපාචිත්තිය.

ඉර නොබැස්ස කල්හි ඉර බැස්සේය යන සිතින් අවවාද කරන්නාට ද, ඒ ගැන වෙමතිකයාට ද, එකට උපසපන් වූවෙකුට අවවාද කරන්නාට ද 'දුකුළා' වේ.

අනාපත්ති - පළමු ශික්ෂාපදයෙහි කී සේයි.

අඞ්ග - අත්ථඞ්ගත සූරියතා, පරිපුණ්ණූපසම්පන්නතා, ඔවදනං, යන අඞ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය පදසො ධම්ම ශික්ෂා වෙහි කී සේයි.)

## නිදන කථාව

ස්ථවිර භික්ෂූහු වරින්වර භික්ෂුණීන්ට අවවාද කෙරෙති. චූලපන්ථක තෙරුන්ට ද වාරය පැමිණියේය. භික්ෂුණීහු මෙසේ කීවාහුය. අද අවවාදය සමෘද්ධ නොවන්නේය. 'චූලපන්ථකතෙම ඒ උදනය ම වරින්වර කියයි' චූලපන්ථක තෙමේ ද අවවාද කරන්ට ගොස් 'අධිචෙතසො අප්පමජ්ජතො' යනාදි උදනය නැවත නැවත කීය. භික්ෂුණීහු පළමු කථාව සථිර කර ගත්හ. එකල්හි චූලපන්ථක තෙම ඒ කථාව අසා අහසට නැග නොයෙක් අයුරින් ප්‍රාතිහාර්‍ය්‍ය දක්වමින් ඉර බසින තුරු අවවාද කෙළේය. මේ කාරණය නිසා මේ ශික්ෂාව අනුදත් සේක.

**අවවාද වර්ගයෙහි ද්විතීය ශික්ෂා පද වර්ණනාව නිමි.**

---

3. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; භික්ඛුනී උපස්සයං, මෙහෙණ වරට (= භික්ෂුණීන් වසන ස්ථානයට) උපසංකමිත්වා, එළඹ; භික්ඛුනියො, භික්ෂුණීන්ට; සමයා අඤ්ඤත්‍ර, කාලය හැර; ඔවදෙය්‍ය, අවවාද කෙළේ නම්; පාචිත්තියං, පචිති වේ.

තත්ථ, එහි; අයං, මේ; සමයො, කාලයයි; භික්ඛුනී, මෙහෙණිනොමෝ; ගිලානා හොති, ගිලන් වූවා ද; අයං, මේ; තත්ථ, එහි; සමයො, කාලයයි.

සං:- අන්තිම පරිච්ඡේදයෙන් එක් රැයකු දූ මෙහෙණියකගේ විසීමෙන් 'භික්ඛුනුපස්සය' යන නම් ලත් තැනකට ගොස් ගරු ධර්ම වලින් අවවාද කරණ මහණහුට පචිති ඇවැතෙක් වේ. භික්ඛුනොවාද සම්මුතියක් නොලද්දේ නම් පචිති දෙකෙකි. එබඳු වූවෙක් රෑ වූ කල්හි අවවාද කෙරෙයි නම් පචිති තුණෙකි. සම්මුතිය ලැබ රෑ වූ කලැ අවවාද කෙරෙයි නම් පචිති දෙකකි.

ගිලන් භික්ෂුණියකට නම් ඈ වසන තැනට ගොස් අවවාද කළ හැකි වේ.

## සප්තදශාකාරය.

නිදනය - ශාක්‍ය දනව්වය.

පුද්ගලයෝ - සවග මහණෝයි.

වස්තුව - භික්ඛුනුපස්සයට ගොස් අවවාද කිරීම් සංඛ්‍යාත වස්තුවය.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තිය ය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්ති - තිකපචිත්තියය.

අනුපසම්පන්න භික්ෂුණියකට උපසපන් යයි සිතා අවවාද කරන්නාට ද, ඒ ගැණ වෙමතිකයාට ද, අන්‍ය ධර්මයකින් අවවාද කරන්නාට ද 'දුකුළා' වෙති.

අනාපත්ති - පළමු ශික්ෂා පදයෙහි මෙනි. මෙහි සුදුසු සමයෙහි අවවාද කරන්නාට ද, ඇවැත් නොවේ.

අඞ්ග - 'උපස්සයුපගමනං, පරිපුණ්ණුපසම්පන්නතා, සමයා 'භාවො, ගරු ධම්මෙහි ඔවදනං' යන අඞ්ග සතරයි.

(සමුට්ඨානාදිය අදින්නාදන සමුට්ඨානාදිය මෙනි.)

මෙහි දුඃඛ වෙදනාවය.

4. යො පන භික්ඛු එවං වදෙය්‍ය ආමිස හෙතු භික්ඛූ භික්ඛුනියො ඔවදන්තී'ති පාචිත්තියං,

---

## නිදාන කථාව

එක් කලෙක ෂඩ්වර්ගීය භික්ෂූහු භික්ෂුණීන්ගේ වාසස්ථානයන් කරා එළඹ ෂඩ්වර්ගීය භික්ෂුණීන්ට අවවාද කෙරෙති. භික්ෂුණීහු ෂඩ්වර්ගීය භික්ෂුණීන්ට මෙසේ කීවාහුය. ආයසීාවෙනි! අවවාද ගන්නට යමු යයි කියායි. එවිට ෂඩ්වර්ගීය භික්ෂූහු අපට අවවාද කෙරෙතියි කීහ.

භික්ෂුණීහු මෙකරුණ භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. එකල්හි බුදුහු 'යොපන භික්ඛු - පෙ - පාචිත්තියං' යී අනුදන වදළසේක.

එකල්හි මහාප්‍රජාපතී ගෞතමී තොමෝ ගිලන්වූවා අවවාද ගන්නට යාගත නො හැකි වූවාය. භික්ෂූන්ට එහි දී දහම් දෙසන්ට කී නමුත් පළමු ශික්ෂා පදය නිසා එසේ නො කළාහුය. ඒ බැව් දත් තථාගතයන් වහන්සේ **"අනුජානාමි භික්ඛවෙ භික්ඛුනුපස්සයං උපසංකමිත්වා ගිලානං භික්ඛුනිං ඔවදිතුං"** යී වදරා 'යො පන භික්ඛු - පෙ - අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං තත්‍ථායං සමයො ගිලානා හොති භික්ඛුනී, අයං තත්‍ථ සමයො' යී අනුදන වදළ සේක.

**අවවාද වර්ගයෙහි තෘතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

4. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; භික්ඛු භික්ෂූහු; ආමිස හෙතු, ආමිස හෙතුවෙන්; භික්ඛුනියො, භික්ෂුණීන්ට; ඔවදන්ති ඉති, අවවාද කරන්නාහුයයි; එවං, මෙසේ; වදෙය්‍ය, කියන්නේ නම්, පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"ආමිසහෙතු"**යී (තණ්හාදිට්ඨීහි ආමසිතබ්බතො - ආමිසං චීවරාදියයි, ආමිසමෙවහෙතු - ආමිසහෙතු) මෙහි ආමිස නම් චීවරාදී සිව්පස ද, සත්කාර ගරුකාර මානන වන්දන පූජා යන මේවායි.

5. යො පන භික්ඛු අඤ්ඤත්‍රිකාය භික්ඛුනියා චීවරං දදෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා පාචිත්තියං.

---

**සප්තදශාකාරය.**

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීය භික්ෂූහු ය. |
| වස්තුව | - | 'ආමිසහෙතු ඔවදන්ති' යී භණන වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | අසාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | ධර්මකර්මයෙහි 'තිකපාචිත්ති' ය යි, අධර්මකර්මයේ 'තිකදුක්කට' ය යි. |
| අනාපත්ති | - | චීවරාදිය සඳහා ම අවවාද කරන්නෙක් සඳහා එසේ කියන්නාට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | උපසම්පන්නතා, ධම්මෙන ලද්ධසම්මුතිතා, අනාමිසන්තරතා, අවණ්ණකම්මතාය එවං භණනන්ති' යී අඞ්ග සතරෙකි. |

(සමුට්ඨානාදිය අදින්නාදානයෙහි මෙනි.) මෙහි දුක්ඛ වෙදනා යි.

---

# නිදාන කථාව

එක් කලෙකැ ස්ථවිර භික්ෂූහු භික්ෂුණීන්ට අවවාද කෙරෙති. ෂවග මහණෝ ස්ථවිර භික්ෂූන්ට ලැබෙන චීවරාදී සිව්පසය දක මෙසේ කීවාහු ය; ස්ථවිර භික්ෂූහු ධර්ම ගරුකව අවවාද නො කෙරෙති; චීවරාදී ආමිස ගරුකොට ඒ නිසා ම භික්ෂුණීන්ට අවවාද කරත්ය යි කියායි.අල්පෙච්ඡ භික්ෂූහු මෙ කරුණ භාග්‍යවතුන් වහන්සේට සැළකළහ. එකල්හි බුදුහු මේ ශික්ෂාපදය අනුදන වදාළ සේකි.

**අවවාද වර්ගයෙහි චතුර්ථ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

6. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බෙය්‍ය වා සිබ්බාපෙය්‍ය වා පාචිත්තියං.

---

5. අර්ථ:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: අඤ්ඤාතිකාය භික්ඛුනියා, නොනෑ භික්ෂුණියකට; පාරිපට්ටකා අඤ්ඤත්‍ර, පෙරලි කිරීමක් (= මාරුකිරීමක්) හැර (හෙවත්) පිරුළුවක් හැර; චීවරං, සිවුරක්: දදෙය්‍ය, දුන්නේ නම්; පාචිත්තියං, පචිති වේ.

සං:- මෙහි විස්තර චීවර ප්‍රතිග්‍රහණ ශික්ෂා පදයෙහි මෙනි. එහි ප්‍රතිග්‍රාහකයා භික්ෂුවකි. මෙහි භික්ෂුණියකි. වෙනස එපමණෙකි.

මෙය සැවැත්නුවර එක්තරා භික්ෂුවක් අරබයා චීවර දාන වස්තුවෙහි පණවන ලදී.

---

## නිදාන කථාව

සැවැත්නුවර එක්තරා භික්ෂුවක් එක්තරා වීථියක පිඩු පිණිස හැසිරෙණ අතර පිඩු පිණිස ම ඒ වීථියට ගිය එක්තරා භික්ෂුණියක් දැක නැගනිය යව අසුවල් තැන පිඩු දෙතියි කී ය. ඒ භික්ෂුණිය ද ඒ භික්ෂුවට එසේ ම පිඩු දෙන තැනක් කීවාය. මෙයින් ඒ දෙදෙන යහළුවෝ වූහ.

නැවත ඒ භික්ෂුව ඔහුගේ සිවුරු කොටසක් ද ඒ භික්ෂුණියට දුන්නේ ය. නුමුත් ඒ භික්ෂුවගේ සිවුරු ද දුර්වලය. අනිත් භික්ෂූහු ඔහුට සිවුරක් කරගන්ට ය යි කී කල්හි තමන්ගේ සිවුරු කොටස දුන් බැව් කීය. එයින් භික්ෂූහු උජ්ඣායනා කරන්ට වූහ. ඒ බැව් දැනගත් බුදුහු 'යො පන භික්ඛු-පෙ- පාචිත්තියං' යී අනුදත්හ.

එකල්හි භික්ෂූහු කුකුස් කරන්නෝ භික්ෂුණීන්ට මාරු කොටවත් සිවුරු නොදෙති. ඒ බැව් දත් තථාගතයන් වහන්සේ 'අනුජානාමි භික්ඛවෙ පඤ්චන්නං පාරිවට්ටකං දාතුං භික්ඛුස්ස, භික්ඛුනියා, සික්ඛමානාය, සාමණෙරස්ස, සාමණෙරාය, අනුජානාමි භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං පාරිවට්ටකං දාතුං' යනු වදරා මේ ශික්ෂාපදය අනුදැන වදළ සේක.

**අවවාද වර්ගයෙහි පස්වම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

6. අර්ථ:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; අඤ්ඤාතිකාය භික්ඛුනියා, නොනෑ මෙහෙණියකගේ; චීවරං, සිවුරක්; සිබ්බෙය්‍ය වා, (තෙමේ) ගෙත්තම් (මැහීම) කෙරේ නම් හෝ; සිබ්බාපෙය්‍ය වා, (අනුන් ලවා) ගෙත්තම් කරවා නම් හෝ; පාචිත්තියං, පචිති වේ.

සං:- "සිබ්බෙය්‍ය වා සිබ්බාපෙය්‍ය වා"යි නොනෑ මෙහෙණියකගේ අඳින්ට පොරවන්නට සුදුසු සිවුරක් තමා ගෙත්තම් කළහොත් ආරපථයක් (=ඉදිකටු පහරක්) පාසා පචිති වේ. සියවරක් නමුත් (සිවුරෙන් ඉදිකටුව ඉවත් නො කොට) සිවුර විද එකවරට ඉදිකටුව අදින්නහුට එක පචිතියෙකි. මේ සිවුර ගෙත්තම් කරවයි කියා කිසිවෙකුට අණකළ හොත් ගෙත්තම් කර්මාවසානයෙහි ආඥාපකයාට පචිතියක් වේ. මේ සිවුරෙහි කටයුතු සියල්ලම නිමකරවයි; අණකළහොත් නිමකළ විට ආඥාපකයාට එකවචනයෙන් ම ආරපථයක් ආරපථයක් පාසා පචිති වේ.

## සප්තදශාකාරය.

නිදානය - සැවැත්නුවරය.

පුද්ගලයා - උදායී තෙරණුවෝය.

වස්තුව - චීවරසිබ්බන වස්තුවය.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තිය.

ආණත්තිය - සාණත්තිකය.

ආපත්ති - තිකපාචිත්තිය ය නෑවූ භික්ෂුණිය නොනෑ ය යි සිතන්නාට ද, ඒ පිළිබඳ වෙමතිකයාට ද, එකට උපසපන් භික්ෂුණියගේ සිවුරක් මසන්නාට ද, දුකුළා වේ.

අනාපත්ති - ථවිකාදී පරිෂ්කාරයක් මහන්නාට ද, නෑ භික්ෂුණියගේ හෝ සික්ඛමානා සාමණේරීන්ගේ සිවුරක් මහන්නාට ද උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවෙති.

අඞ්ග - අඤ්ඤාතිකාය භික්ඛුනියා සන්තකතා, නිවාසන පාරුපනුපගතා, වුත්ත ලක්ඛණං සිබ්බනං, සිබ්බාපනං යි අඞ්ග තුනෙකි.

(සමුට්ඨානාදිය සංචරිත්ත සමුට්ඨානාදිය සේයි.)

7. යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධාන මග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං; තත්ථා'යං සමයො සත්ථගමනීයො හොති මග්ගො සාසඞ්කසම්මතො සප්පටිභයො. අයං තත්ථ සමයො.

---

# නිදාන කථාව

ලාලුදායී තෙරුන් වහන්සේ චීවර කර්මයෙහි දක්ෂයහ. උන් වහන්සේගේ පුරාණ දූතිකාව වූ මෙහෙණිය සිවුරක් මහ දෙන්නට ය යි කියා දුන්නාය. උදායී තෙරණුවෝ ද එය භාර ගෙණ සියලුම චීවර කර්මකොට නිමවා එහි මැද නොයෙක් වර්ණයෙන් විප්‍රකත මෛථුන්දම් ඇති ස්ත්‍රී පුරුෂ රූ දෙකක් කොට නමා තැබීය. ඒ මෙහෙණිය ද සිවුර ගෙණ ගොස් අවවාද ගන්නට යන විට පෙරවාගෙණ ගියාය. මනුෂයෝ මේ දක නුගුණ කියන්ට වූහ. මේ බැව් තථාගතයන් වහන්සේට සැළ කරණ ලදින් උන්වහන්සේ 'යො පන භික්ඛු අඤ්ඤාතිකාය - පෙ - පාචිත්තියං' යන ශික්ෂාපදය අනුදන වදළ සේකි.

**අවවාද වර්ගයෙහි ෂෂ්ඨ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

7. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; භික්ඛුනියා සද්ධිං, මෙහෙණක සමග; සංවිධාය, සංවිධානය කොට හෙවත් නියම කොට ගෙණ; එකද්ධානමග්ගං, එක් දීඝී මාර්ගයකට; අන්තමසො, යටත් පිරසෙයින්; ගාමන්තරං අපි, (තමා හුන් ගමින්) අතික් ගමකට ද. සමයා අඤ්ඤත්‍ර, කාලය හැර; පටිපජ්ජෙය්‍ය, පිළිපන්නේ නම්; (යේ නම්) පාචිත්තියං, පචිති වේ.

තත්ථ, එහි; අයං, මේ; සමයො, කාලයයි; මග්ගො, මාර්ගය තෙම; සාසංකසම්මතො, සැක සහිතයයි සම්මත කරණ ලද ද; සප්පටිභයො, ප්‍රතිභය සහිත ද; සත්ථගමනීයො, වාහනයකින්; (කරත්තයකින්) යා යුතු වේ ද; අයං, මේ; තත්ථ, එහි; සමයො, කාලයයි.

**සං**:- **"සංවිධාය"** මෙහි දී කප්පිය භූමිය, අකප්පිය භූමිය, යන දෙක දතගත යුත්තාහුය. භික්ෂුනී උපාශ්‍රය, අන්තරා රාමය, ආසන සාලාවය, තිර්ථිය සෙය්‍යාවය, යන මෙතෙක් තැන් 'කප්පිය භූමි' නමි. මෙහි සඳහන් ස්ථාන හැර සෙසු විහාර ආරාමාදිය 'අකප්පිය භූමි'යි.

අකප්‍පිය භූමියේ සිට සංවිධානය කරන්නහුට හෙවත් 'මම හෙට අසවල් ගමන යන්නෙමි මා සමග යන්නට එව නැතහොත් අසවල් තැන දී හමුවෙන්නට එව'යි යනාදී ක්‍රමයෙන් විධානය කරණ භික්‍ෂුවට එයින් පළමු කොට දුකුළා වෙයි. කප්‍පා කරගත් පරිදි දෙදෙන එක්වී එගමෙහි උපචාරය ඉක්ම වූ පළමු අඩියෙහි දුකුළා වේ. දෙවෙනි අඩිය තිබූ කල්හි පචිතිය වේ. යම් පමණ ග්‍රාම ඉක්ම වූවාහු ද, එ තාක්ම පචිති වෙති. ගම් නැති මගක ගියෝ නම් අඩ යොදුනක් පාසා පචිති වෙති.

## සප්තදශාකාරය.

නිදානය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - සවග මහණෝයි.

වස්තුව - 'එකද්ධානමග්ග පටිපජ්ජන' වස්තුවයි.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තිය ය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්ති - තිකපාචිත්තිය ය.

සංවිධානය නොකළ කල්හි සංවිදහිත සංඥ ඇත්තාහට ද, ඒ ගැණ වෙමතිකයාට ද, භික්‍ෂුණිය විසින් සංවිධානය නො කරන ලදුව තෙමේ ම සංවිධානය කරන්නහුට ද 'දුකුළා' වේ.

අනාපත්ති - සමයෙහි සංවිධානය කරන්නාට ද, තෙමේ සංවිධානය නොකරන්නා ට ද, ආපදවන්හි සංවිධානය කොට යන්නහුට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

විපත්ති - ආචාර විපත්තිය ය.

අඞ්ග - ද්විතනම්පි සංවිදහිත්වා මග්ග පටිපත්ති, අවිසංකෙතං, සමයා'භාවො, අනාපද, ගාමන්තරොක්කමණං වා අඩ්ඪ යොජනාතික්කමොවා, යී අඞ්ග පසෙකි.

සමුට්ඨානය - අද්ධාන සමුට්ඨාන ය යි.

කිරියා - 'ක්‍රියා' විසිනි.

8. යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකං නාවං අභිරුහෙය්‍ය උද්ධගාමිනං වා අධොගාමිනිං වා අඤ්ඤත්‍ර තිරියං තරණාය පාචිත්තියං

---

සඤ්ඤ - නො සඤ්ඤවිමොක්ඛය යි.

චිත්ත - අචිත්තකය යි.

වද්‍ය - ප්‍රඥප්තිවද්‍යය යි.

කුශලත්‍රිකය - ත්‍රිචිත්තය ය.

වෙදනාත්‍රිකය - ත්‍රිවෙදනාය.

---

# නිදන කථාව

එක්කලෙක ෂඩ්වර්ගීය භික්ෂූහු භික්ෂුණීන් සමග සංවිධානය කොට එකද්ධාන මාර්ගයට පිළිපන්නාහුය. මනුෂ්‍යයෝ එයින් කිපියාහු භික්ෂූන්ගේ නුගුණ පතුරුවන්ට වූහ. ඒ දත් තථාගතයන් වහන්සේ "යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං -පෙ-පාචිත්තියං" යන ශික්ෂාව අනුදන වදළ සේක.

එකල්හි බොහෝ භික්ෂූහු ද බොහෝ භික්ෂුණීයෝ ද සාකෙත නුවරින් සැවැත්නුවරට යන්නට එකද්ධාන මාර්ගයට පැමුණුනාහ. භික්ෂූහු භික්ෂුණීන් සමග නොගියාහුය. භික්ෂුණීහු පසුව ගියෝ සොරුන් විසින් පැහැර ගණු ලැබූහ. එ පමණක් ද නොවේ, දූෂණය ද කළහ. ඒ දත් තථාගතයන් වහන්සේ පළමු ශික්ෂා පදය අනුප්‍රඥප්තියකින් යුක්ත කොට වදළ සේකි.

**අවවාද වර්ගයෙහි සප්තම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

8. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: භික්ඛුනියා සද්ධිං, මෙහෙණක් සමග: සංවිධාය, සංවිධානය කොට (නියම කොට) උද්ධගාමිනිං වා, උඩුගං බලා යන්නාවූ හෝ: අධොගාමිනිං වා, යටිගං බලා යන්නාවූ හෝ: තරණාය, එතරවීම පිණිස: තිරියං අඤ්ඤත්‍ර, සරස හැර: එකං නාවං, එක් නැවකට: අභිරුහෙය්‍ය, නැංගේ නම්: පාචිත්තියං, පචිති වේ.

**සං:-** "**සංවිධාය**" මෙහි "සංවිධාය" යනු ලොකාස්වාද වශයෙන් හෝ මිත්‍ර සන්ථව වශයෙන් හෝ නැවට නැගෙණ විට ඔවුනොවුන් දෙඩාගෙණ යැමයි.

**සං:- "උඩගාමිනිං"** යි මෙය ක්‍රීඩා වශයෙන් ගඟේ ප්‍රතිශ්‍රොතසට (උඩට) යැමයි.

**සං:- "අධොගාමිනිං"**යි එසේම ගඟේ පහළට යැමයි. ඔරු පාරු ආදියකින් සරසට යන විට තියම තොටුපලට ගැණීමට ගඟේ උඩට හෝ පහළට ගියාට ඇවැත් සිදු නොවේ. ගම් සහිත ගොඩබිමක් අනුව උඩට හෝ පහළට යන කල පසු කළ ගම් ගණනින් ද එසේ ගම් නැතහොත් අර්ධයොජන ගණනින් ද ඇවැත් සිදුවෙන බැව් දත යුතුයි.

"උද්ධගාමිනිං වා අධොගාමිනිං වා"යි කී බැවින් වැව් සමුද්‍රාදියෙහි ක්‍රීඩා වශයෙන් යන්නහුටද ඇවැත් නොවන බැව් ටීකාවෙහි දක්වූහ. මුහුදෙහි කැමැති පරිද්දෙකින් යාහැකි වේ. තියම කරගත් කාලය වෙනස් වුවහොත් ඇවැතින් මිදෙයි. තිරී විසංකෙතයවත් නාවා විසංකෙතයවත් ඇවැත් නොවීමට කරුණු නොවෙති.

**සං:-** සැවැත්නුවර සවග මහණුන් නිසා "නාවාභිරූහන" වස්තුවෙහි පණවන ලදී. "අඤ්ඤත්‍ර තිරියං තරණාය" යනු අනුප්‍රඥප්තියයි.

සෙසු විස්තර පළමු ශික්ෂාපදයෙහි මෙනි.

---

# නිදාන කථාව

සවග භික්ෂූහු භික්ෂුණීන් සමග සංවිධානය කොට ගෙණ එක නැවට නැගෙති. එයින් මනුෂ්‍යයෝ කිපී නුගුණ කියන්නට පටන් ගත්හ. ඒ දත් තථාගතයන් වහන්සේ "**යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං =පෙ= පාචිත්තියං**"යි අනුදැන වදාළ සේක.

එකල්හි භික්ෂූහු එක නැවෙන් භික්ෂුණීන් සමග ගංගා තරණය කිරීමට වත් නො කැමති වූහ. භික්ෂුණීන් පමණක් නැව් ආදියෙන් යන විට සොර උවදුරු ඇතිවූහ. එසේම භික්ෂුණීන් දූෂණය කරන්නෝ ද ඇති වූහ. ඒ බැව් දත් තථාගතයන් වහන්සේ "**අනුජානාමි භික්ඛවෙ තිරියං තරණාය භික්ඛුනියා සද්ධිං එකං නාවං අභිරූහිතුං**"යි වදරා පළමු ශික්ෂාපදය අනුප්‍රඥප්තියකින් යුක්ත කොට අනුදැන වදාළ සේකි.

**අවවාද වර්ගයෙහි අෂ්ටම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

9. යො පන භික්ඛු ජානං භික්ඛුනී පරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජෙය්‍ය අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහී සමාරම්භා පාචිත්තියං.

---

**9. අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: ජානං, දන දන; භික්ඛුනී පරිපාචිතං, භික්ෂුණියක් විසින් පිසන ලද; පිණ්ඩපාතං, පිණ්ඩපාතයක්; පුබ්බෙ, (මෙහෙණකගේ පිසීමට කලින්;) ගිහී සමාරම්භා අඤ්ඤත්‍ර, ගිහීන්ගේ සමාරම්භය (පිළිවෙළ කිරීමක්) හැර; භුඤ්ජෙය්‍ය, අනුභව කෙළේ නම්; පාචිත්තියං, පචිති වේ.

සං:- **"භික්ඛුනී පරිපාචිතං"** යනු මෙහෙණක විසින් ගිහීන් ලගට ගොසින් අසුවල් ආයුෂ්‍යන් වහන්සේට දනය දෙන්නට යයි ඒ භික්ෂුවගේ ගුණ කියා පිළියෙළ කරණ ලද්දකි. නැතහොත් ලැබෙන සේ මාර්‍ගය යොද තබන ලද්දකි.

සං:- **"පුබ්බෙ ගිහිසමාරම්භා"**යී මෙහි සමාරම්භය නම් පිළිවෙළ කරණ ලද්දට කියන නමකි. භික්ෂුණියක විසින් යම් ගිහියෙක් හමුවෙහිදී අසවල් භික්ෂුව ධර්ම කථිකයෙක, බහුශෘතයෙක යනාදි ගුණ කියා පිළිවෙළ කරන්නට කලින්ම ඒ භික්ෂුවට හෝ භික්ෂූන්ට දීම සඳහා ගිහීන් විසින් සම්පාදනය කරණ ලද පිණ්ඩපාතයකි. එසේම නෑයන් විසින් පවරණ ලද්දකි. එබඳු පිණ්ඩපාත පරිභොගයෙන් ඇවැත් නොවේ. මෙ වැනි පිණ්ඩපාතයක් හැර භික්ෂුණියක විසින් පිළියෙළ කරණ ලද්දක් පරිභොග කළහොත් පචිති වෙන බැව් කීහු. පිළිගැනීමෙන් 'දුක්කට' යද අනුභව කිරීමෙන් 'පචිති' ය ද වේ.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | රජගහ නුවරය. |
| පුද්ගලයා | - | දෙව්දත් තෙරණුවෝය. |
| වස්තුව | - | 'භික්ඛුනී පරිපාචිත පිණ්ඩපාතය අනුභව කිරීම්' වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | අසාධාරණ ප්‍රඥප්තියය. |
| ආණත්තිය | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | පචිතියයි. |
| | | (එකට උපසපන් භික්ෂුණිය විසින් පිළියෙළ කරණ ලද්ද අනුභව කරන්නාට ද, පිළියෙළ නො කරණ ලද්දෙහි පරිපාචිත සංඥ ඇත්තාට ද, දෙතැන්හිම වෙමතිකයාට ද, 'දුකුළා' වේ. |

අනාපත්ති - දෙතැන්හිම අපරිපාචිත සංඥ ඇත්තාට ද, ගිහියන් විසින් සම්පාදනය කරණ ලද්දේහි ද, සික්ඛමානා සාමණේරාදීන් විසින් සම්පාදනය කරණ ලද්දෙහි ද, පස් වැදරුම් භොජන වලින් පිටත් අනුභව කළ යුත්තෙහි ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නැති.

අඩ්ග - භික්ඛුනියා පරිපාචිතං, පරිපාචිතභාව ජානනං, ගිහී සමාරම්භා භාවො, ඔදනාදීනං අඤ්ඤතරතා, තස්ස අජ්ඣොහරණං යි අඩ්ග පසෙකි. (සමුට්ඨානාදිය ප්‍රථම පාරාජිකාවෙහි මෙනි.)

වද්‍ය - ප්‍රඥප්ති වද්‍යය.

කුශලත්‍රිකය - ත්‍රිවිධ චිත්තය යි.

වෙදනාත්‍රිකය - ත්‍රිවිධ වෙදනා යි.

---

## නිදන කථාව

ථුල්ලනන්ද නැමැති භික්ෂුණී තොමෝ එක්තරා කුලයෙකැ නිතර වලඳන්නී කුලූපගවූවාය. එකුලෙහි ගැහැවියා විසින් දිනක් ස්ථවිර භික්ෂූන්ට දනයක් පිළියෙළ කරණ ලදී. එදින උදසන එගෙට පැමිණි ථුල්ලනන්ද භික්ෂුණිය මේ දක මේ කිම්දැයි අසුවාය. ස්ථවිර භික්ෂූන් වහන්සේලාට පිළියෙළ කළ දනය යයි කීය. එවිට තොපගේ දනය වලඳන්නෝ කවරහු දයි ඇසුවාය. එකල්හි ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ යන ආදී නම් කී කල්හි උන් වහන්සේලා වළක්වා කොකාලිකාදීන්ට දෙන්නට නියම කළ නමුත් එසේ නො කෙළේය. මේ කාරණය දනගත් තථාගතයන් වහන්සේ "යො පන භික්ඛු ජානං -පෙ-පාචිත්තියං" යි අනුදත්හ.

එක්තරා භික්ෂූන් වහන්සේ නමක් රජගහ නුවර තමන්ගේ නෑ ගෙදරකට වැඩිසේක. ඒ කුලෙහි මිනිස්සු උන්වහන්සේට දනය පිළියෙළ කළහ. ඒ එක්කම වාගේ පැමිණි භික්ෂුණියක් තොමෝ ආයර්‍යයන් වහන්සේට දනය දෙවයි කීවාය. ඒ භික්ෂූන් වහන්සේ ද ඇගේ වචනය ඇසී එදන නොවැළඳුහ. ඒ කාරණය නිසා බුදුහු **"අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහී සමාරම්භා"** යන අනුප්‍රඥප්තිය ද වදළ සේක.

**අවවාද වර්ගයෙහි නවම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

10. යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං.

භික්ඛුනොවාදවග්ගො තතියො.

---

**10. අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; එකො, හුදකලා (තනි) වූයේ; එකාය භික්ඛුනියා සද්ධිං, එක් මෙහෙණක් සමග; රහො, රහසිගතව; නිසජ්ජං, නිසද්‍යය; කප්පෙය්‍ය, කරන්නේ නම්; පාචිත්තියං, පචිති වේ.

තතියෙ, තුන්වැනි වූ; භික්ඛුනී ඔවාද වග්ගො, භික්ෂුණී අවවාද වර්ගයයි.

**සං**:- මේ ශික්ෂා පදයෙහි විස්තරය දෙවෙනි අනියත ශික්ෂා පදයෙන් දතයුතුයි.

මෙය අර්ථොත්පත්ති වශයෙන් වෙනස් වූවත් ශික්ෂා පද වශයෙන් දෙවෙනි අනියතය අචෙලක වර්ගයෙහි සිවුවැනි ශික්ෂාපදය යන දෙක හා සම වේ.

---

## නිදාන කථාව

ආයුෂ්මත් උදයී තෙරුන්ගේ පුරාණ දුතියිකා තොමෝ භික්ෂුණී පාශ්වයෙහි මහණ වූවාය. ඇ උදයී තෙරුන් හමුවට නිතර එන්නීය.

උදයී තෙරණුවෝ එක් දිනක් ඇ සමග රහසිගතව නිසද්‍යය කළෝය. ඒ බැව් දත් අල්පෙච්ඡ භික්ෂූහු උජ්ඣායනය කොට භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. එකල්හි මේ ශික්ෂාපදය අනුදැන වදාළ සේක.

**අවවාද වර්ගයෙහි දසවැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

1. අගිලානෙන භික්ඛුනා එකො ආවසථ පිණ්ඩො භුඤ්ජිතබ්බො තතො චෙ උත්තරිං භුඤ්ජෙය්‍ය පාචිත්තියං

---

1. **අර්:-** අගිලානෙන, නො ගිලන්වූ (ලෙඩ නොවූ) භික්ඛුනා, මහණහු විසින්; එකො ආවසථ පිණ්ඩො, එක දවසකට තිස වූ (පුණ්‍යාර්ථීන් විසින් අනියම කොට දෙන්නාවූ) නවාතැන් බතක්; භුඤ්ජිතබ්බො, අනුභව කටයුතුයි. චෙ, ඉදින්; තතො උත්තරිං, එයින් මත්තෙහි; භුඤ්ජෙය්‍ය, අනුභව කෙළේ නම්; පාචිත්තියං, පචිති වේ.

**සං:-** "**අගිලානෙන**"යි යටත් පිරිසෙයින් අසනීපයක් නිසා දෙගව්වක්වත් යන්නට අසමර්ථ නම් හෙතෙම මෙහි දී 'ග්ලාන' සංඛ්‍යාවෙහි ලා ගැණෙයි. අඩ යොදුනක් හෙවත් ගව් දෙකක් ගමන් කරන්නට සනීප ඇත්තෝ අගිලානයෝ වෙති.

**සං:-** "**අවසථ පිණ්ඩො**"යි (ආවසථෙ පිණ්ඩො: ආවසථ පිණ්ඩො, ආවසන්ති එත්ථාති: ආවසථො, ආ පූර්ව 'වස' නිවාසෙ යන ධාතුයි. ආධාරාර්ථයෙහි 'ථ' ප්‍රත්‍යයයි) නවාතැන් බත කිය වේ. මග යන්නන්ට හා ගිලනුන්ටද ගැබිනියන්ට හා මහණ බමුණන්ටද සුදුසු පරිද්දෙන් භිත්ති ආදියෙන් පිරිකෙව් කොට වෙන් කරණ ලද කාමර (ඔවරක) හා එහි පණවන ලද ඇඳ පුටු ආදී අසුන් ඇති විශ්‍රාම ශාලාවකට මෙහි අවසථ යයි කියනු ලැබේ. මණ්ඩප, වෘක්ෂමූල, අභ්‍යවකාශ යන ස්ථාන ද 'ආවසථ' යන්නෙන් කියවෙති.

අසවලුන්ටය කියා පුද්ගල විශෙෂයක් වත් මෙපමණෙකුටය කියා සංඛ්‍යා නියමයක්වත් මෙපමණ දන වස්තුවය කියා දෙය්‍යධර්ම පරිච්ඡේදයක් වත් නොකොට මාර්ගිකාදීන් අතුරෙන් පැමිණි තරමකට ඇති තාක් දීම පිණිස පින් කැමැත්තෙකු විසින් හෝ පින් කැමැත්තන් විසින් ශාලා මණ්ඩප ආදී යම් කිසි තැනකැ පිළියෙළ කොට තබනලද පඤ්චවිධ භොජනයට 'ආවසථ පිණ්ඩ' යයි කියනු ලැබේ. මෙකී ආවසථ පිණ්ඩය උපසපන් භික්ෂුවකට එක තැනකදී වැළඳිය හැක්කේ එක වරකි. දෙවෙනිවර හෝ දෙවෙනිදින හෝ වැළඳුව හොත් ආලොපයක් (පිඩක්) පාසා පචිති වෙති. නොයෙක් දෙනා විසින් නොයෙක් තැන්වල පණවන ලද ආවසථ පිණ්ඩ වෙත් නම් එක එක දවස එක එක තැනදී වැළඳිය හැකිවේ.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | සවග මහණෝය. |
| වස්තුව | - | ඒ ඒ තැන්වල නැවතී ආවසථ පිණ්ඩ අනුභව කිරීම් වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය. |
| ආණත්තිය | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තිකපාචිත්තියය. ගිලනා කෙරෙහි නොගිලන්ය යන හැඟීම් ඇත්තාට ද, ඒ ගැණ වෙමතිකයාට ද, 'දුකුළා' වේ. |
| අනාපත්ති | - | ගිලනාටද, නොගිලන්ව වරක් අනුභව කරන්නාට ද යමින් හෝ එමින් හෝ අනුභව කරන්නාට ද, දන් වැට හිමියාගේ ආරාධනාවෙන් අනුභව කරන්නාට ද, ඒ ඒ අය උදෙසා පණවන ලද්දක් වලඳන්නාට ද, පරිච්ඡේදයක් ඇතුව පණවන ලද්දක් අනුභව කරන්නාට ද, පඤ්චවිධ භොජනය හැර කැඳ අවුලු පත් ඵලාඵලාදිය අනුභව කරන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ. |
| අඞ්ග | - | ආවසථ පිණ්ඩතා, අගිලානතා අනුවසිත්වා පරිභොජනන්ති යී අඞ්ග තුණකි. |

(සමුට්ඨානාදිය එලක ලොම සමුට්ඨානාදිය මෙනි.)

---

# නිදාන කථාව

සැවැත්නුවර සමීපයෙහි එක්තරා ගෘහපතියෙක් ආවසථ පිණ්ඩයක් පැණ වීය. ෂඩ්වර්ගීය භික්ෂූහු පිණ්ඩපාතය සඳහා ගොස් කිසිවක් නො ලැබ එන්නෝ මේ ආවසථයට ගියෝය. එහි සිටි උපාසකයෝ මුන්වහන්සේලාට දන්දුන්හ. දෙවෙනි දින ද එසේම ගියහ. එදින ද පෙර දවස මෙන් දන්දුන්හ. එතැන් පටන් සවග මහණෝ එහි නැවතී ගණ ආවසථ පිණ්ඩය වලඳති. එයින් කිපුනාවූ තීථිකයෝ භික්ෂූන්ට

2. ගණ භොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්‍ථායං සමයො: ගිලාන සමයො, චීවර දාන සමයො, චීවරකාර සමයො, අද්ධාන ගමන සමයො, නාවාභිරූහණ සමයො, මහා සමයො, සමණ භත්තසමයො, අයං තත්‍ථ සමයො.

---

බැණ වදින්ට වූහ. මෙකරුණ නිසා **"එකො ආවසථ පිණ්ඩො= පෙ= පාචිත්තියං"** යි අනුදත් සේකි. එකල්හි සැරියුත් මහ රහතන් වහන්සේ ආවසථයකට වැඩමවා, වැළඳූහ. උන්වහන්සේ ඒ අතර ගිලන් වූහ. ශික්ෂාපදයට ගරුකොට දෙවෙනි දින දුන්බත් වූහ. ඒ දත් බුදුහු **"අගිලානෙන භික්ඛුනා= පෙ= පාචිත්තියං"** යි ශික්ෂාපදය අනුදන වදළ සේක.

**භොජන වර්‍ගයෙහි ප්‍රථම ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

---

**2. අර්‍ථ**:- ගණ භොජනෙ, ගණයා වී පිළිගත් භොජනය නිමිත්ත කොට ගෙණ හෙවත් සමූහයක් වී ගිහිගෙයි අනුභව කිරීමෙහි; සමයා අඤ්ඤත්‍ර, කාලය හැර, පාචිත්තියං, පචිති වේ.

තත්‍ථ, එහි; අයං මේ; සමයො, කාලයයි. ගිලාන සමයො, ගිලන් කාලය; චීවර දාන සමයො, (කෙළින් අතුළ පස්මස ද, නො අතුළ කැති මාසය ද යන) සිවුරු දෙන කාලය; චීවර කාර සමයො. සිවුරු (ගෙත්තම් ආදිය) කරණ කාලය; අද්ධාන ගමන සමයො, දීර්‍ඝ මාර්‍ගයෙහි යන කාලය; නාවාභිරූහණ සමයො, නැව් නගින කාලය; මහා සමයො, මහා සමූහයක්ව යන කාලය; සමණභත්ත සමයො, ශ්‍රමණයන්ට බත් දෙන කාලය යන; අයං, මේ; තත්‍ථ, එහි, සමයො (සුදුසු) කාලයයි.

**සං**:- **"ගණභොජනෙ"** යි (ගණස්ස භොජනං, ගණභොජනං, තස්මිං; ගණ භොජනෙ) මෙහි 'ගණය' නම් භික්ෂූහු සිවුදෙනෙක් හෝ එයට වැඩිගණනෙකි. එහෙත් **"සො ච ඛො ගණො කත්‍ථචි ද්වීහි කත්‍ථචි තීහිති ආදිනා අනෙකධා අධිප්පෙතො"** යි දක්වෙන ටීකා පාඨයෙන් දෙදෙනාට ද, තිදෙනාට ද, ඒ ඒ තැන්වල 'ගණ' නාමය ව්‍යවහාර කළ බැව් හැඟේ.

ගණ භොජනය නම්-ගණයා වී පිළිගත් ඔදන, සත්තු, කුම්මාස, මච්ඡ, මංස, යන පඤ්ච ප්‍රකාර භොජනයන් අතුරෙන් එක්තරා භොජනයෙකි; මේ ගණ භොජනය දෙපරිද්දෙකින් පිළියෙල වෙයි. එනම් නිමන්ත්‍රණයෙන් ද විඤ්ඤප්තියෙන් ද යන දෙපරිද්දෙනි.

යම් කිසිවෙක් එකතැනක සිට භික්ෂූන් සතර නමක් සමීපයට ගොස් හෝ වෙන වෙනම සිටි භික්ෂූන් සමීපයට ගොස් හෝ **"ඔදනෙත තිමනෙතම් ඔදනං මෙ ගණහථ"** යනාදී ක්‍රමයෙන් ආන්ධ්‍ර ද්‍රවිඩාදී කිසියම් භාෂාවකින් කරනු ලබන නොකැප නිමන්ත්‍රනයකින් ලත් භොජනය නිමන්ත්‍රණයෙන් ලත් භොජනයයි.

භික්ෂූන් සතර නමක් එක්ව උපාසකයෙකු ලඟට ගොස් අප සතර නමට බත් දෙවයි කියා හෝ වෙන් වෙන්ව ගොස් මට බත් දෙවයි කියා හෝ විඥප්තියෙන් ලත් භොජන ය විඥප්ති වශයෙන් ලත් භොජනයයි.

මෙකී දෙපරිද්දෙන් ම පිළියෙල කෙරෙණ භොජනය සතර නම එකට ගොස් පිළිගත් හොත් ඒ 'ගණභොජනය' වේ. සතර නම වෙන වෙනම (වරින්වර) ගොස් දෙළොස් රියනක් ඇතුළත සිට ගණ එකවිට පිළිගත්තත් ඒ 'ගණභොජනය' වේ. මෙහි එකවිට පිළිගැණීම ම පමණ වේ. මෙකී දෙපරිදිවූ ගණභොජනය පිළිගැණීමෙහි දී 'දුකුළා' වේ. වැළඳීමේ දී පිඩක් පාසා පචිති ඇවැත් වෙති.

සං:- **"ගිලාන සමයො"** යම්කිසි භික්ෂුවකගේ පතුල් පැලීමෙන් ගමෙහි පිඩු පිණිස යන්නට අපහසු වේ නම් ඒ ගිලාන සමයයි. **"චීවරදාන සමයො"** කෙළින් අතුල භික්ෂූන්ට පස්මසක් ද, අන්‍යයන්ට කත්තික (කැති) මාසය ද, 'චීවරදාන' කාලයයි.

**"චීවරකාරසමයො"** චීවර සාටකය හා නූල් ලැබුනු පසු සිවුර පිළියෙළ කර ගැණීම භික්ෂූන්ට අයත් වේ. මොස හූ ගැසීම, කැපීම, ගෙත්තම් කිරීමාදී සිවුර පිළිබඳ කටයුතු කරණ කාලය චීවර කාර සමය වේ.

**"අද්ධාන ගමන සමයො"** අන්තිම පරිච්ඡෙදයෙන් යොදුන් භාගයක්වත් දුර ගමණක් යනු කැමති වේ නම් හෝ යේ නම් හෝ ගියේ නම් හෝ මේ 'අද්ධාන ගමන සමය' වේ.

**"නාවාභිරූහණ සමයො"** නැවෙන් යනු කැමති වේද, නැවට නැගී යන්නේ වේද, නැවෙන් බැස්සේ වේද, මේ 'නාවාභිරූහණසමය' වේ.

**"මහාසමයො"** යටත් පිරිසෙයින් ගොදුරු ගමෙහි පිණ්ඩපාතයෙන් සතර නමකට යැපෙන්නට නොහැකි නම් ඒ 'මහාසමය' වේ.

එයට වැඩි ගණනක් රැස්වූ විට කියනුම කිම? එබඳු අවස්ථාවල දී මේ මහා සමය යයි අධිෂ්ඨාන කොට වැළඳිය යුතුයි.

**"සමණභත්ත සමයෝ"** කිසිවෙකු විසින් යම්කිසි පැවිද්දකු බතින් නිමන්ත්‍රණය කරණු ලැබුවහොත් ඒ 'සමණභත්ත සමය' වේ. මේ සප්ත ප්‍රකාර සමයන්හි දී පළමු කී දෙයාකාර ගණ භොජනයෙන් ඇවැත් නොවේ. ගිලාන සමයාදී සමය සත අනුප්‍රඥප්තීහු වෙති. මේ ශික්ෂාපදය පිළිබඳව **අතිමත්තික චතුක්කං**, **පිණ්ඩපාතික චතුක්කං**, **අනුපසම්පන්න චතුක්කං**, **පත්තචතුක්කං**, **ගිලාන චතුක්කං** යන පසැව චතුස්කයන්ගේ විස්තරද සමන්තපාසාදිකාවෙන් බලාගත යුතුයි.

## සප්තදශාකාරය

නිදානය - රජගහනුවරය.

පුද්ගලයා - දෙව්දත් තෙරණුවෝය.

වස්තුව - විඥ්ඤපනය කොට අනුභව කිරීම් වස්තුවය.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තියය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්තිය - තික පාචිත්තිය ය.

ගණභොජන නුවූවෙහි ගණභොජන යයි සිතන්නාට ද, ඒ පිළිබඳ වෙමතිකයාට ද, දුක්කට යෙකි.

අනාපත්ති - සමයෙහි වළඳන්නාට ද, දෙතුන්දෙනෙක් එක්වී වැළඳීමෙහි ද, පිඬු පිණිස හැසිර එකට රැස්ව වැළඳීමෙහි ද, නිත්‍ය භක්තිකයාට ද, සලාක බත් පක්ඛික බත් උපොසථික බත්, පාටිපදික බත් වළඳන්නහුට ද උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

අඞ්ග - ගණ භොජනතා, සමයා 'භාවො, අජ්ඣොහරනන්ති යී අඞ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය එළක ලොම සමුට්ඨානාදිය මෙනි.)

# නිදන කථාව

පිරිහුනු ලාභ සත්කාර ඇති දෙව්දත් තෙරණුවෝ සිය පිරිස් සමග කුලයන්හි විඥප්තියෙන් ලත් බොදුන් අනුභව කෙරෙති. ශ්‍රද්ධාවන්තයෝ එයට කිපුනාහුය. ඒ නිසා බුදුහු 'ගණ භොජනෙ පාචිත්තියං' යී අනුදත්හ.

නැවත ශ්‍රද්ධාවන්තයෝ ගිලන් භික්ෂූන් බතින් පැවරූහ. එහෙත් භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් ගණ භොජනය ප්‍රතික්ෂිප්තයයි කියා නොපිළිගත්හ. එයින් **"අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා ගණභොජනං භුඤ්ජිතුං"** යී වදාළ සේක.

නැවත මනුෂ්‍යයෝ චීවරදාන සමයෙහි චීවර බතක් පිළියෙළ කළහ. භික්ෂූහු එය නොපිළිගත්හ. එයින් **"අනුජානාමි භික්ඛවෙ චීවරදාන සමයෙ ගණ භොජනං භුඤ්ජිතුං"** යී වදාළ සේක.

නැවත මනුෂ්‍යයෝ සිවුරු කරණ භික්ෂූන් බතින් පැවරූහ. භික්ෂූහු පෙරසේ ම නොපිළිගත්හ. එයින් **"අනුජානාමි භික්ඛවෙ චීවරකාර සමයෙ ගණ භොජනං භුඤ්ජිතුං"** යි අනුදත් සේක.

නැවත භික්ෂූහු මිනිසුන් සමග දීඝී ගමණක් ගියහ. මගදී ඒ භික්ෂූහු ඒ මිනිසුන්ට මෙසේ කීහ. අපි පිණ්ඩපාතයේ ගොස් එනතුරු නවතින්ටය කියායි. මෙහිම අනුභව කරන්නටයයි මනුෂ්‍යයෝ ආරාධනා කළහ. එහෙත් එය නොපිළිගත්හ. එයින් **"අනුජානාමි භික්ඛවෙ අද්ධාන ගමන සමයෙ ගණ භොජනං භුඤ්ජිතුං"** යී අනුදත් සේකි.

නැවත භික්ෂූහු මිනිසුන් සමග නැවෙන් යන්නාහු පිණ්ඩපාත කාලය පැමිණිකල්හි නැව තොටකට ගන්නට කීහ. එහි සිටි මනුෂ්‍යයෝ ඔවුන්ට පිළියෙළ කළ බොජුන් එහිදී වළදන්නට කීහ. එහෙත් එය නොයිවසූහ. ඒ නිසා **"අනුජානාමි භික්ඛවෙ නාවාභිරූහණ සමයෙ ගණ භොජනං භුඤ්ජිතුං"** යී අනුදත් සේක.

නැවත නොයෙක් දිශාවල වස්විසූ භික්ෂූහු බුදුන් වහන්සේ දකින්නට රජගහනුවරට එති. එහි මිනිස්සු ඒ භික්ෂූන් බතින් පැවරූහ. එහෙත් නොයිවසූහ. එකල් හි **"අනුජානාමි භික්ඛවේ මහා සමයෙ ගණ භොජනං භුඤ්ජිතුං"** යී අනුදත් සේක.

3. පරම්පර භොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං: තත්‍ථායං සමයො, ගිලාන සමයො: චීවරදාන සමයො, චීවරකාර සමයො, අයං තත්‍ථ සමයො.

---

නැවත බිම්සර රජුගේ නෑයෙක් ආජීවකයන් කෙරෙහි පැවිදි විය. හෙතෙම සර්වපාෂාණ්ඩික බතක් දෙන්නට රජුගෙන් අවසර ඉල්වීය. රජතෙම පළමුවෙන් බුදුන් ප්‍රධාන භික්සඟනට වළඳ වන්නෙහි නම් යෙහෙකැයි කියා අවසර දුන්නේය. ඒ ආජීවකයා භික්‍ෂූන්ට ආරාධනා කළ නමුත් පිළි නොගත්හ. ඒ නිසා **"අනුජානාමි භික්ඛවේ සමණ භත්ත සමයෙ ගණ භොජනං භුඤ්ජිතුං"** යී අනුදැන වදළ සේක.

මෙසේ අනුප්‍රඥප්ති සතකින් යුක්ත කොට 'ගණ භොජනෙ - පෙ - පාචිත්තියං' යී ශික්ෂා පදය වදළ සේකි.

**භොජන වර්ගයෙහි ද්විතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

**3. අර්ථ**:- පරම්පර භොජනෙ, පැවරූ (- ආරාධනා කළ) පිළිවෙළින් නොවළඳ උත් පටි පාටියෙන් වැළඳීමෙහි: සමයා අඤ්ඤත්‍ර, කාලය හැර: පාචිත්තියං, පචිති වේ. තත්‍ථ, එහි: අයං, මේ: සමයො, කාලයයි: ගිලාන සමයො, ගිලන් කාලය: චීවරදාන සමයො, සිවුරු දෙන කාලය: චීවරකාර සමයො, සිවුරුකරණ කාලය: තත්‍ථ, එහි: අයං, මේ: සමයො, කාලයයි.

**සං:- "පරම්පර භොජනෙ"** යී පරම්පර භොජනය නම් ආරාධනා ලැබුනු පිළිවෙළින් නොවළඳා උත් පටිපාටියෙන් වැළඳීමය. යම් භික්‍ෂුවකට ක්‍රමයෙන් ආරාධනා දෙකක් හෝ ඊට වැඩි ගණනක් එක දවසටම ලැබුන හොත් නිමන්ත්‍රණ දෙකම හෝ වැඩියක් ඉවසා පළමු භාරගත් ආරාධනය වෙන කෙණෙකුට නොපවරා හෝ ප්‍රතික්ෂෙප නොකොට හෝ පසුව ලත් ආරාධනය ඉවසා එයින් බත්තුලක් නමුත් අනුභව කළ හොත් පචිති වේ. තෙමේ භාරගත් ආරාධනයට පංචසහධාර්මිකයන් අතුරෙන් කෙණෙක් යැවිය හැකි වේ.

ප්‍රතික්ෂෙපයද සම්මුඛයෙහි දී හෝ අසම්මුඛයේ දී කළ හැකිවේ.

**සප්තදශාකාරය**

නිදානය - විශාලා මහනුවරය.

පුද්ගලයෝ - බොහෝ භික්‍ෂූහුය.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තිය ය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්ති - තිකපාචිත්තිය ය.

පරම්පර භෝජනය නො වුවෙහි පරම්පර භෝජන සංඥ ඇත්තහුට ද, ඒ සඳහා වෙමතිකයාට ද, 'දුකුළා' වේ.

අනාපත්ති - සුදුසු සමයෙහි ද, විකල්පනය කොට අනුභව කිරීමෙහි ද නිමන්ත්‍රණ දෙකක් තුණක් එකට බුදීමෙහි නිමන්ත්‍රණ පටිපාටියෙන් බුදීමෙහි ද, ගම්වාසී සියල්ලන් විසින්ම නිමන්ත්‍රණය කළ කල්හි එගමෙහි කිසියම් තැනක බුදීමෙහි ද, සියලු පූගයන් විසින් නිමන්ත්‍රණය කරණ ලද කල්හි එක්තරා පූගයෙකුගෙන් බුදීමෙහි ද, නිත්‍ය භක්තාදියෙහි ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවෙති.

අඞග - පරම්පර භෝජනතා, සමයාභාවො, අජ්ඣොහරණන්ති යි අඞග තුණෙකි.

(සමුඨානාදිය ප්‍රථම කඨිනයෙහි මෙනි.) මෙය කිරියා කිරියයි.

---

## තිදත කථාව

විශාලා මහනුවර ප්‍රණීත බත් පටිපාටියක් තබන ලද්දීය. එකල්හි එක්තරා දිළිඳු කම්කරුවෙක් ද වේතනයක් ලැබගෙන බතක් තැබීය, භික්ෂූහු කලින් පිණ්ඩපාතයේ ගොස් වළඳ පසුව බුදුන් වහන්සේත් සමග දිළින්දගේ ගෙට වළඳන්නට ගියාහුය.

භික්ෂූහු කල් ඇතුව වළඳ ආ බැව් කියා ටික ටික වැළඳූහ. ඒ දත් තථාගතයන් වහන්සේ 'ගණභොජනෙ පාචිත්තියං' යි අනුදත් සේක.

නිමන්ත්‍රණයක් භාරගත් ගිලන් භික්ෂුවකට එක්තරා භික්ෂුවක් විසින් ගෙණැවිත් දුන් පිණ්ඩපාතය ප්‍රතික්ෂෙප කිරීම නිසා පළමු අනුප්‍රඥප්තිය ද, චීවර දන සමයෙහි බත් නො යිවසූ බැවින් දෙවෙනි අනුප්‍රඥප්තිය ද, චීවරකාර සමයෙහි බත් නො යිවසූ බැවින් තුන්වෙනි අනුප්‍රඥප්තිය ද, අනුදත්හ.

මෙහි අනුප්‍රඥප්තිය ත්‍රිවිධ වුවත් පරිවාරයෙහි 'විකප්පනය' ද ගෙණ සතරක් කොට දක්වූහ.

**භොජන වර්ගයෙහි තෘතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

4. භික්ඛුං පනෙව කුලං උපගතං පූවෙහි වා මන්ථෙහි වා අභිහට්ඨුං පවාරෙය්‍ය ආකංඛමානෙන භික්ඛුනා ද්වත්ති පත්ත පූරා පටිග්ගහෙතබ්බා. තතො චෙ උත්තරිං පටිග්ගණ්හෙය්‍ය පාචිත්තියං, ද්වත්තිපත්ත පූරෙ පටිග්ගහෙත්වා තතො නීහරිත්වා භික්ඛුහි සද්ධිං සංවිභජිතබ්බං, අයං තත්ථ සාමීචි.

---

4. **අර්ථ**:- කුලං උපගතං, කුලයට පැමිණියාවූ: භික්ඛුං පන එව, භික්ෂුවක් හට ම වනාහි: පූවෙහි වා, (පඬුරු පිණිස පිළියෙළ කළ අතිරස ලහළු ආදී) කැවුමෙන් හෝ: මන්ථෙහිවා (මාර්ගෝපකරණ පිණිස පිළියෙළ කල බදහත් නොබදහත් තිල තණ්ඩුලාදි) අග්ගලාවෙන් හෝ: අභිහට්ඨුං, එළවා: පවාරෙය්‍ය, පවරන්නේ ද,

ආකංඛමානෙන, කැමති වන්නා වූ: භික්ඛුනා, මහණහු විසින්, ද්වත්තිපත්තපූරා, පිරුණු පාත්‍රා දෙකක් තුනක් පමණ: පටිග්ගහෙතබ්බා, පිළිගත යුත්තාහුය. චෙ, ඉදින්: තතො උත්තරිං, තුන්පාත්‍රයෙකින් වැඩිය: පටිග්ගණ්හෙය්‍ය, පිළිගන්නේ නම්: පාචිත්තියං පචිති වේ.

ද්වත්ති පත්ත පූරා, පිරුණු පාත්‍රා දෙකක් තුණක් පමණ පටිග්ගහෙත්වා, පිළිගෙණ: තතො, එයින්: නිහරිත්වා, ගෙණ ගොස්: භික්ඛුහි සද්ධිං, භික්ෂූන් සමග: සංවිභජිතබ්බං, බෙදගත යුතුයි. අයං, මේ: තත්ථ, එහි: සාමීචි, (පිළිපැදිය යුතු) වතයි.

**සං**:- **"පූවෙහි"** යී මෙහි 'පූව' නම් කැවුමට නම්. නෑ මිතුරු ආදීන්ට තෑගි පිණිස යවන්නට පිළියෙළ කළ අතිරස, ලාලු, ආදී කැවුම් මෙයින් ප්‍රකාශ කෙරෙති.

**"මන්ථෙහි"** මෙහි 'මන්ථ' නම් අත්පුණ්ඩුය. මෙය බද්ධසත්තු (= ගුලිකළ අග්ගලාය) අබද්ධ සත්තු යයි දෙපරිද්දකින් ඇත්තේය. මේ අත්පුණ්ඩු සහල් තල ආදියෙන් සාදති. මෙහි කියවෙන 'මන්ථ' නම් දිග ගමනක් යන්නට සැරසී මගදී ප්‍රයෝජන ගණුවස් පිළියෙළ කල අග්ගලාය, හෙවත් අත්පුණ්ඩුය.

**සං**:- **"ද්වත්ති පත්තපූරා පටිග්ගහෙතබ්බා"** යී උක්තප්‍රකාර කැවුම් ආදිය දයකයා කොපමණ පිළිගන්වන්නට කැමැති වූවත් පාත්‍රා දෙකක් හෝ තුණක් පිරෙණ පමණ පිළිගත යුතු බැව් දක්වයි. එයත් පාත්‍රයේ මුවවිටේ යට රෙඛාවට සම වෙනතාක් පිරිවිය යුතුයි. මුවවිටෙන් උඩ තිබෙන කැවුම් ගණනින් හා අග්ගලා ගණනින් පචිති වෙති. එබැවින් පමණ දැන පිළිගත යුත්තේය.

යම්කිසි භික්ෂුවක් විසින් යම් ස්ථානයෙක්හි දී කැවුමෙන් හෝ අග්ගලා වලින් හෝ පිරුණු පාත්‍රා දෙකක් පිළිගන්නා ලද නම් එතැනටම යන වෙන භික්ෂුවක් දක්කහොත් අසවල් ස්ථානයෙන් පාත්‍රා දෙකක් පිළිගත් බවත් තවත් එකකට වඩා පිළි නොගතයුතු බවත් දන්විය යුතුයි. ඔහු විසින් ද අනික් භික්ෂුවක් දක පළමු පැමිණි භික්ෂුව පාත්‍රා දෙකක් පිළිගත් බවත් තමා එකක් පිළිගත් බවත් ඒ භික්ෂුවට එකක් වත් නො පිළිගත යුතු බවත් දන්විය යුතුයි. මෙසේම පරම්පරා රොචනය කටයුත්තේය. ඒ නොකරන්නහුට 'දුකුළා' වෙක් වේ. මෙසේ දන්වූ පසුත් සිවුවෙනි පාත්‍රයේ පටන් පිළිගත් භික්ෂූන්ට 'දුකුළා' ඇවැත් වෙති.

**සං:- "භිකඛුහි සඩිං සංවිභජිතබබං"** යි පිළිගත් 'පූ' ආදිය ගෙණැවිත් තමන්ට එක පාත්‍රයක් තබාගෙණ වැඩිපුර පාත්‍රයේ හෝ පාත්‍රා දෙකේ 'පූ' ආදිය භික්ෂූන්ට බෙද දිය යුතුයි. යමෙකු විසින් එක පාත්‍රයක් පුරා පිළිගන්නා ලද නම් තමන්ට කැමති සේ ප්‍රයෝජන ගත හැකි වේ.

## සප්තදශාකාරය

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුය.

වස්තුව - පමණ නො දන පිළිගැණීමයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්ති - තිකපාචිත්තිය යි.

(පිරුණු පාත්‍රා දෙකක් තුනකට අඩු කල්හි අතිරෙක සංඥ ඇත්තහුට ද, 'දුකුළා' වේ.)

අනාපත්ති - පාත්‍රා දෙකක් තුණක් පුරවා ගැණීමෙහි ද, අඩුවෙන් පිළිගැණීමෙහි ද, කිසිතැනක යැවීමට හෝ මාර්ගෝපකරණ පිණිස හෝ පිළියෙළ නොකරණ ලද්දක් ගැන්මෙහි ද, යැවීමාදිය කොට ඉතිරිවූවක් ගැණීමෙහි ද, ගමන වැලකුනු කල්හි ගැණීමෙහි ද, ඤාතක පවාරිත ස්ථානවලින් ගැණීමෙහි ද, අනුන් සඳහා ගැණීමෙහි ද, ස්වකීය ධනයෙන් ගැණීමෙහි ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

අඞ්ග - වුත්තලක්ඛණ පූව මන්ථතා, අසෙසකතා, අප්පටිප්පස්සද්ධ ගමනතා, අඤ්ඤාතකාදිතා, අතිරේක පරිග්ගහණන්ති යී අඞ්ග පසෙකි.

(සමුට්ඨානාදිය සංචරිත්ත සමුට්ඨානාදිය මෙනි.)

---

# නිදාන කථාව

කාණමාතා උපාසිකා තොමෝ ශ්‍රද්ධා ඇත්තීය, කාණාව එක්තරා පුරුෂයෙකුට දුන්නාය. ඈ පසුව කිසියම් කරුණක් සඳහා මවු දකින්නට ගියාය. ඒ අතර කාණාවගේ සැමියා සිය ගෙට එන ලෙස පණිවුඩයක් යැවීය. කාණමාතා තොමෝ හිස් අතින් කෙසේ නම් යවන්නීදැයි කියා බැනාගේ ගෙට යැවීම සඳහා කැවුම් පිළියෙළ කළාය. එසේ කළ කල්හි එගෙට එක්තරා පිණ්ඩචාරික භික්ෂුවක් පැමිණියේය. කාණමාතා තොමෝ උන්වහන්සේට කැවුම් පිළිගැන්වූවාය. ඒ භික්ෂුව ගොස් වෙන භික්ෂුවකට අසවල් තැන කැවුම් දෙත්යයි කීය. ඒ භික්ෂුවද එහි ගියේය. ඒ භික්ෂුවටද කැවුම් පිළිගැන්වූවාය. මේ ක්‍රමයෙන් පැමිණි භික්ෂූන්ටම දී ඒ කැවුම් සමාප්ත වූහ. දෙවෙනි වරද එසේම විය. ඒ නිසාම කාණාවට පුරුෂයා කරායන්ට නොහැකි වූවාය. හෙතෙම අන්‍ය ප්‍රජාපතියක් ගෙණෑවේයයි අසා කාණාව අඬමින් සිටියාය.

ඒ අතර භාග්‍යවතුන් වහන්සේ එගෙට වැඩිසේක. එකල්හි කාණ මාතා තොමෝ බුදුන්වහන්සේ වැඳ මෙකරුණ සැළ කළාය. භාග්‍යවතුන් වහන්සේ ඇට දැහැමි කථාවෙන් අනුග්‍රහ කොට වැඩි සේක.

නැවත එක්තරා ගැලක් දිග ගමනක් යන්නට සූදනම් විය. එක්තරා භික්ෂුවක් එහි පිඩු පිණිස වැඩියේය. එහි සිටි උපාසකයෙක් තෙම උන්වහන්සේට අග්ගලා දුන්නේය. පළමු සේම පැමිණි භික්ෂූන්ට දීමෙන් මාර්ගෝපකරණ සඳහා පිළියෙළ කළ අග්ගලා සමාප්ත වූහ. නැවත මාර්ගෝපකරණ පිළියෙල කරගණ පසුව ගිය උපාසකයාට සොරු අනතුරු කළාහුය. එකල්හි උපාසකයෝ භික්ෂූන් නිසා මේ අනතුර සිදුවීයයි දෙස් කියන්නට වූහ. ඒ බැව් දත් බුදුහු මේ ශික්ෂාපදය අනුදැන වදළ සේකි.

**භොජන වග්ගයෙහි චතුර්ථ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

5. යො පන භික්ඛු භුත්තාවී පවාරිතො අනතිරිත්තං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං.

---

**5. අර්ථ:-** යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: භුත්තාවී, වැළඳුයේ: පවාරිතො, (ලඟට ගෙනා භොජනය) පවාරණය කෙළේ: අනතිරිත්තං, අනතිරිත්ත වූ: ඛාදනීයං වා, කෑ යුතු දෙයක් හෝ: භොජනීයං වා, (ඔදනාදි) අනුභව කළයුතු දෙයක් හෝ: ඛාදෙය්‍ය වා කාතම් හෝ: භුඤ්ජෙය්‍ය වා, අනුභව කෙළේ නම් හෝ: පාචිත්තියං, පචිති වේ.

**සං:-** **"භුත්තාවී"** යනු කරණ ලද බත් කිස ඇත්තෙකි. යම්කිසි භික්ෂුවක් විසින් ඔදන, කුම්මාස, සත්තු, මච්ඡ, මාංස යන පස්වැදෑරුම් භොජනයන් අතුරෙන් ඍලප වූ ද භොජනයක් විකා හෝ නොවිකා හෝ ගිලින ලද නම් ඒ භික්ෂුවට 'භුත්තාවී' කියා හෝ 'භුත්තවා' කියා හෝ කිව හැකි වේ.

**සං:-** **"පවාරිතො"** යී කරණ ලද ප්‍රතික්‍ෂෙප ඇත්තෙක් දක්වේ. යම්කිසි භික්ෂුවක් වළඳන අතර පරිවෙසකයා විසින් වැළඳ වීමට බලාපොරොත්තුවෙන් ගෙණෙන ලද භොජනයක් තෙමේ වළඳන්නට නො කැමැත්තේ කයින් හෝ වචනයෙන් ප්‍රතික්ෂේප කෙරෙයි නම් ඒ භොජනය ඔහු විසින් පවාරිතය; එහෙත් ඒ පවාරිත කළ පමණින් ප්‍රතික්ෂේපය නොවේ. අඩග පසකින් යුක්තවූ ප්‍රතික්‍ෂෙපය පවාරිත සංඛ්‍යාවෙහි ලා ගැණෙයි. එහෙයින් **"පංචහි උපාලි ආකාරෙහි පවාරණා පඤ්ඤායති. ආසනං පඤ්ඤායති. භොජනං පඤ්ඤායති. හත්ථපාසෙ ඨිතො පඤ්ඤායති. අභිහරති. පටික්ඛෙපො පඤ්ඤායති"** යී දෙශනා කරණ ලදී.

'අසනං පඤ්ඤායති' යි මෙයින් විප්‍පකත භොජන ඇත්තහු පෙණෙයි කියා දක් වූ හෙයින් වළඳන්නා වූ (අනුභව කරණ) පුද්ගලයෙක් වෙයි යන අර්ථයි. 'ආසනං පඤ්ඤායති' යන්නෙන් විප්‍පකත භොජන ඇත්තේ 'පවාරිතයා' ය යි කියන ලදී. යමෙක් විප්‍පකත භොජන වේ ද ඔහු විසින් භොජනයෙන් සමහරක් (කොටසක්) අනුභව කැරිණ. සමහරක් අනුභව නොකැරිණ, ඔහු විසින් කොටසක් අනුභව කරණ ලද ද, ඒ නිසා 'භුත්තාවී' යන ගණනට ඇතුළත් වේ. එහෙයින් 'භුත්තාවී' යන පදයෙන් විශෙෂාර්ථයෙක් නො පෙණෙයි. 'අචිරත්ත තිරත්තං' යනාදි තන්හි අචිරත්ත ශබ්ද ප්‍රයොගය මෙන් මෙහි ද, 'පවාරිත පදයාගේ පරිවාරයක් වශයෙන් හා ව්‍යඤ්ජන ශලිෂ්ඨත්වය සඳහාත් ප්‍රකාශිත බැව් අර්ථ කථාවෙහි කීහු:

'භොජනං පඤ්ඤායති' යනු ඔදනාදී පඤ්චප්‍රකාර භොජන යන් අතුරෙන් එකක් හෝ ඊට වැඩියක් පාත්‍රාදියෙහි පෙණීමයි. **"පවාරණ පහොතකං භොජනං දිස්සති"** යි අට්ඨකථා පාඨයෙන් ඒ බැව් ස්ඵුට කෙරෙයි.

'හත්ථපාසෙ ඨිතො' යනු පවාරණයට පොහෝනා ඔදනාදී කිසියම් භොජනයක් රැගෙණ වළඳන භික්ෂුවගේ අත්පසැ සිටීමයි. මෙහි 'අත්පස' නම් දෙරියන් වියතක් පමණ තැන වේ. එපමණ තැන නොයික්මවා සිටීම අත්පසෙහි සිටීම වෙයි.

'අභිහරති' යනු භික්ෂුවට බෙදීම (පිළිගැන්වීම) පිණිස යථොක්ත භොජන අතුරෙන් එකක් හෝ වැඩි ගණනක් කයින් අභිහරණය කිරීමයි.

'පටික්ඛෙපො පඤ්ඤායති' යනු ප්‍රතික්ෂෙපය දැකීමයි. ප්‍රතිග්‍රාහක භික්ෂු තෙම ලඟට ගෙණෙන ලද භොජනය ඇඟිලි සෙලවීමාදියෙන් කයින් හෝ 'අලං මා දෙහි' (කම්නැත, නො දෙව යනාදි) වාග් විකාරයෙන් හෝ ප්‍රතික්ෂෙප කෙරෙයි. එයාකාර ප්‍රතික්ෂෙපය මෙයින් ප්‍රකාශ වේ.

මෙහි ප්‍රකාශිත පඤ්චාඞ්ග සමන්නාගත වීමෙන් ප්‍රතික්ෂෙපය හෙවත් පවාරණය සිදුවේ.

පවාරණය වන පරිදි හා නොවන පරිදි මෙසේ දත යුතුයි. එනම්:- ඔදන, කුම්මාස, සත්තු, මච්ඡ, මාංස යන පංචවිධ භොජනය පවාරණයට පොහෝනේ වෙයි.

ඔදනය නම් - බතයි. මේ වනාහි සාලි (- හැල්) ව්‍රීහි (-වී) යව (එනම් ධාන්‍ය වර්ගය) ගොධුම (-තිරිඟු) කඞ්ගු (-තණ) වරණ (-වරා නම් ධාන්‍ය වර්ගය) කුද්‍රූසක (-හමු) යන සත් වැදෑරුම් ධාන්‍යවල සහල් ගෙණ බත් පිසමි කියා හෝ යාගු (-කැඳ) පිසමි කියා හෝ යම් කිසිවක් තිසා පිසුවේ නම් එය උෂ්ණ සහිතව හෝ සිහිල් වූ විට හෝ අනුභව කරණ කල්හි ගත් ගත් තැන සීමාව පෙනෙයි නම් ඒ ඔදනයයි. මෙකී ඔදනය පවාරණය වෙයි. කිසියම් කිරිබතක් හෝ වේවා අම්බිලයාගුවක් හෝ වේවා උදුනෙන් ගත් කෙණෙහි ඉතා උණුසුම් වේ. එකෙණෙහි කුරු ගා හෝ හැදිගා අනුභව කරන්නට හෝ බොන්නට හැකි වේ. මෙබඳු පායාසයක හෝ යාගුවක අතින් ගත් සීමාව නොපෙණෙයි නම් එය පවාරණය නො කළැකි වේ. එයම නිවුණු (සිසිල්) කල්හි ගත් සීමාව පෙණෙයි. එවිට පවාරණය වෙයි. කොළ, ගෙඩි, කළීර (කිළිල්) ආදිය වැඩි කොටසක් බහා සහල් මිටක් පමණ

බහා පිසන ලද ආහාරයෙහි අනුභව කරණ විට ඔධිය (-ගත් සීමාව) පෙණෙයි නම් එය ද පවාරණය වෙයි.

අයාගුක නිමන්ත්‍රණයෙහි කැඳ පිළිගන්වන්නෙමු යි කියා බත්වල වතුර කැඳ කිරි ආදිය වත්කොට කැඳ ගන්නට යයි කියා දෙත් නම් හෙද පවාරණය වේ. එය ඝන බැවින් කැඳ සංඛ්‍යාවට නොයන බැවිනි. ඒ බතම පැසුනු ජලයෙහි බහා නැවතත් පැසවා දෙයි නම් එය පවාරණය නොවෙයි. යාගු (කැඳ) සංඛ්‍යාවෙහි ඇතුළත් බැවිනි. කැඳෙහි අබැටක් පමණවත් මත්ස්‍ය මාංශ කඩක් බහා දෙත් නම් පවාරණට පහෝනේය.

අල වර්ගවලින් හා ගෙඩි වර්ගවලින් කරණ ලද ආහාරය පවාරණයට නොපොහොනේය.

'කුම්මාස' නම් යව ධාන්‍යයෙන් කරණ ලද ආහාර (තලප) විශෙෂයකි. එයද පවාරණයට සුදුසු වේ. එහෙත් මුං ආදියෙන් කරණ ලද කුම්මාසය පවාරණයට නුසුදුසුය.

'සත්තු' නම් සප්තවිධ ධාන්‍යයන් බැද සුණුකර ගන්නා ලද අබඩ සත්තු (ගුලි නොකරන ලද කුඩු) බඩසත්තු (අගලා) යයි ද්විප්‍රකාර ආහාර විශෙෂයකි. එහෙත් එය පවාරණයට පොහොනේය. මත්ස්‍ය මාංශ ගැණ ද මෙසේමය. ආහාර පිණිස ගන්නා වූ සියලුම මත්ස්‍ය වර්ගද කප්පිය මාංශ වර්ග පවාරණයට යොග්‍ය වෙති. විස්තරාර්ථීන් විසින් සමන්තපාසාදිකාව බැලිය යුතුයි.

සං:- **"අනතිරිත්තං"** යනු අයිරිත් (වැඩි) නොවූ ආහාරයකි. 'කප්පියං කතං' යනාදි වූ සත්වැදෑරුම් විනය කර්මාකාර වලින් යම් භොජනයක් කැප කරණ ලද නම් එයත් යම් භොජනයක් ගිලානාතිරිත්ත නම් එයත් යන ද්විප්‍රකාර භොජන යටම 'අතිරිත්ත භොජන' යයි කියනු ලැබේ. උක්තාකාරයෙන් අයිරිත් නොවූ භොජනයකට 'අනතිරිත්ත' භොජනයයි කියති. අනතිරිත්තං යන්නෙන් එවැනි භොජනයක් කියවේ.

**"කප්පියං කතං, පටිග්ගහිතං කතං, උච්චාරිතං කතං, හත්ථපාසෙ ඨිතං කතං, භුත්තා විනා කතං, භුත්තා විනා පරිවාරිතෙන ආසනා අවුට්ඨී තෙනකතං, අලමෙතං සබ්බන්ති වුත්තන්ති කතං"** යනු සප්තවිධ විනය කර්මා කාරයෝයි.

මෙහි 'ගිලානාතිරිත්තය' නම්:- ගිලන් භික්ෂුව අනුභව කොට ඉතිරි වූ යම් (ආමිස) භොජනාදියක් වෙත් නම් එයත්, ගිලන් භික්ෂුව සඳහා ම අද හෝ හෙට හෝ කැමති දවසක කැමති පරිද්දෙන් අනුභව

කෙරේවායි එළවා තබන ලද යම් ආහාර විශෙෂයක් වේ නම් එයත් 'ගිලානාතිරිත්ත භොජනය' යයි කියනු ලැබේ.

සං:- **"ඛාදනීයං වා භොජනීයං වා"** යම්කිසි යාවකාලික ආමිස විශෙෂයෙකි. මෙය විස්තර කරණුවෝ **"ඛාදනීයං" නාම පංච භොජනානි යාමකාලිකං සත්තාහ කාලිකං යාවජීවිකං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම "භොජනීයං" නාම පංච භොජනානි ඔදනො. කුම්මාසො සත්තු මච්ඡො මංසං"** යී පද භාජනයෙහි කීහු.

සං:- **"ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා"** යනු, යට කී ක්‍රමයෙන් පවාරිත භික්ෂුවක් තෙම මෙකී දෙයාකාරයෙන් අතිරික්ත නොවූ හෙවත් කැප නොවූ භොජනාදියක් වළඳයි නම් පිඩක් පිඩක් පාසා පචිති වෙති.

**සප්තදශාකාරය**

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුය.

වස්තුව - අන් තන්හි අනුභව කිරීම් වස්තුවය.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තියයි.

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - තික පාචිත්තිය යි.

(යාම කාලිකාදිය ආහාර පිණිස ගන්නාට ද, නිරාමිස අනුභව කරන්නාට ද, අතිරිත්ත භොජනයෙහි අනතිරිත්ත සංඥීහුට ද, ඒ පිළිබඳ වෙමතිකයාටද 'දුකුළා' වේ.

අනාපත්ති - අතිරිත්ත කරවා අනුභව කරන්නෙමි යී ගන්නා හට ද, අතිකෙකු සඳහා ගන්නා හට ද, යාම කාලික, සත්තාහකාලික යාවජීවිකයන් කරුණක් ඇතිවිට අනුභව කරන්නාට ද, උම්මත්ත කාදීන්ට ද ඇවැත් නොවෙති.

අඞ්ග - පවාරිත භාවො, ආමිසස්ස අනතිරිත්තතා, කාලෙන අජ්ඣොහරණන්ති යී අඞ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය පඨම කඨිනයෙහි කීජේයි.) මෙය කිරියා කිරිය වශයෙන් වේ. 'අනතිරිත්තං' යනු අනුප්‍රඥප්තියයි.

6. යො පන භික්ඛු භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන ඛාදනීයෙන වා භොජනීයෙන වා අභිහට්ඨුං පවාරෙය්‍ය, හන්ද භික්ඛු ඛාද වා භුඤ්ජවාති, ජානං ආසාදනා පෙඛො භුත්තස්මිං පාචිත්තියං.

---

# නිදාන කථාව

එක්තරා බ්‍රාහ්මණයෙක් තෙම භික්ෂූන් නිමන්ත්‍රණය කොට වැළඳවීය. ඇතැම් භික්ෂූහු එහි බත් කිස කොට නිමවා ඤාති කුලවලට ගොස් නැවත වැළඳූහ. ඇතැම් භික්ෂූහු පිණ්ඩපාතය ගෙණ ගියාහ. ඒ බ්‍රාහ්මණ තෙම අසල ගෙවල්වල අයට ද ආහාර දෙන්නට අඬගැසීය. නුඹ අපට කෙසේ නම් අහර දෙන්නෙහි ද, නුඹේ ගෙයි වැළඳූ භික්ෂූහුත් නැවත අපේ ගෙවල වැළඳූහ යි කීහ. ඒ දැනගත් බ්‍රාහ්මණ තෙම භික්ෂූන්ට දෙස් පැවරුයේය. ඒ දත් බුදුහු 'යො පන භික්ඛු භුත්තාවි - පෙ-පාචිත්තියං' යී අනුදත්හ.

එකල්හි භික්ෂූහු ගිලන් භික්ෂූන්ට පිණ්ඩපාතය ගෙණ යති. ගිලන්හු සිත් සේ එය නොවළඳති. භික්ෂූහු එය අහක දමති. ඒ ගිලානාතිරිත්තය භික්ෂූහු නො වළඳිත් යයි අසා බුදුහු නැවත 'යො පන භික්ඛු භුත්තාවී පවාරිතො අනතිරිත්තං - පෙ - පාචිත්තියං' යී අනුදත් සේක්.

**භොජන වග්ගයෙහි පසදවම ශික්ෂාපද වර්ණනාව නිමි**.

---

**6. අථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; භුත්තාවී, වැළඳුවා වූ; පවාරිතං, (ලහට ගෙණා භොජනය) පවාරණය කළා වූ; භික්ඛුං, භික්ෂුවක්හු; අනතිරිත්තෙන, අතිරිත්ත භොජනයෙන් අන්‍ය වූ; ඛාදනීයෙන වා, කන දෙයකින් හෝ; භොජනීයෙන වා, බුදින දෙයකින් හෝ; හන්ද, එහෙනම්; භික්ඛු, මහණ; ඛාදවා, කවයි කියා හෝ; භුඤ්ජවා ඉති, වළඳවයි කියා හෝ; ආසාදනා පෙඛො, චෝදනා කරණු කැමැත්තෙන්; ජානං දැන දැන; අභිහට්ඨුං, ගෙණ දෙන්නට; පවාරෙය්‍ය, පවරා නම් (නියම කෙරේ නම්); භුත්තසමිං, වැළඳූ කල්හි; පාචිත්තියං, (ඔහුට) පචිති වේ.

**සං**:- "**අභිහට්ඨුං පවාරෙය්‍ය**" යී පංචප්‍රකාර භොජනයන් අතුරෙන් කිසියම් භොජනයක් ලහට ගෙණවුත් ආයුෂ්මත්නි! කියා හෝ ස්වාමීනි! කියා හෝ සුදුසු ආමන්ත්‍රණයකින් අමතා එසේ නම් මේ භොජනය කවයි කියා හෝ අනුභව කරවයි කියා හෝ නියම කිරීම මෙයින් ප්‍රකාශ වේ.

**සං:-** "**ජානං**" යී පවාරිත බැව් අනිකෙකු විසින් කියන ලදින් හෝ ඇසීම වත් ඒ භික්ෂුව පවාරණය (ප්‍රතික්ෂෙපය) කරණවා දක වත් මේ පිළිබඳ දනීම ඇතිව යන අදහසයි.

**සං:- ආසාදනාපෙඛො**" යී ආසාදනං අපෙක්ඛතී ති - (ආසාදනාපෙඛො) ආසාදනය නම් චොදනාවයි. එය බලාපොරොත්තුවෙන් යනු මෙහි අදහසයි. මෙහි "හන්ද" යන නියොගාර්ථයි.

**සං:-** "**භුත්තසමිං පාචිත්තියං**" යී ලහට එළවීමෙහි චොදනා කටැටි භික්ෂුවට "දුකුළා" වේ. ඒ භික්ෂුව අතට අහර ගත් කල්හි නැවතත් අභිහාරකයාට "දුකුළා" වෙකි. අනුභව කරණවිට අභිහාරකයාට පිඩක් පිඩක් පාසා "දුකුළා" වෙති. අනුභව කොට සමාප්ත වූ කල්හි පචිති ඇවැත වේ.

## සප්තදශාකාරය

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයා - එක්තරා භික්ෂුවකි.

වස්තුව - අනතිරිත්ත භොජනයෙන් ලහට ගෙණවුත් පැවරීම් වස්තුවය.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තිය ය.

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - පවාරිතෙහි පවාරිතසංඥ ඇත්තහුට "පචිති" ය යි; ඒ පිළිබඳ වෙමතිකයාට ද, යාමකාලිකාදීන් ආහාර පිණිස අභිහරණය කරන්නාට ද, ඒ අහර පිළිගැණීම් වැළදීම්හි ද, අපවාරිත යෙහි පවාරිත සංඥ ඇත්තාට ද වෙමතික යාට ද "දුකුළා" වෙති.

අනාපත්ති - අප්පවාරිත සංඥීහුට භොජනය කරවා දෙයි ද, කරවා හෝ අනුභවකරවයි කියා දෙයි ද, යමෙක් අනිකෙකුට ගෙණ යමින් යවයි කියා දෙයි ද, යාමකාලිකාදිය කරුණක් ඇති කල්හි අනුභව කරවයි කියා දෙයි ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවෙති.

7. යො පන භික්ඛු විකාලෙ ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං.

---

අඞ්ග - 'පවාරිතතා, පවාරිත සඤ්ඤිතා, ආසාදනා පෙක්ඛතා, අනතිරිත්තෙන අභිහට්ඨුං පවාරණතා, භොජන පරියොසානන්ති' අඞ්ග පඤ්චකයෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදනයෙහි මෙනි.) මෙහි දුක්ඛ වේදනාවයි.

---

## නිදාන කථාව

කොශල ජනපදයේ සිට සැවැත් නුවරට යනු පිණිස භික්ෂූහු දෙනමක් දීඝී මාර්ගයට පැමිණියාහු ය. එයින් නමක් නොකටයුතු දේ කෙරෙයි. අනික් භික්ෂුව ඔහුට අවවාද කෙළේය. එයින් ඔහු කෙරෙහි වෛර කෙළේය. මෙසේ ඒ දෙදෙන සැවැත් නුවරට ගියාහු ය.

එකල්හි සැවැත් නුවරට එක්තරා පූගය (=සමූහය) කගේ සඞ්ඝ බතක් වෙයි. දෙවැනි භික්ෂුව බත් කිස නිම කෙළේය. වෛර බැඳි භික්ෂූ තෙම ඥාති කුලයකට ගොස් පිණ්ඩපාතය ගෙණැවිත් එ පවාරිත භික්ෂුව කරා ගොස් පිණ්ඩපාතය වළඳන්නට කීය. හෙතෙමේ ද එය ප්‍රතික්ෂෙප කෙළේය. එහෙත් ඒ භික්ෂුව විසින් කරදර කරණ ලදින් අනුභව කෙළේය. එකල්හි මහණ තෝ ද මට අවවාද කරන්නට හිතුවෙ? තෝ පවාරිත වූයෙහි අනතිරිත්ත භොජනය වැළඳුවෙහි ය. එය කියයුතු නොවේ ද යි චොදනා කෙළේය. ඒ බැව් දත් බුදුහු **"යො පන භික්ඛු භික්ඛුං භුත්තාවිං =පෙ= පාචිත්තියං"** යන ශික්ෂා පදය අනුදන වදළ සේකි.

**භොජන වර්ගයෙහි ෂෂ්ඨ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

7. **අර්ථ** - යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; විකාලෙ, පෙරවරු කාලය ඉකුත් වූ කල්හි; ඛාදනීයං වා, කෑ යුත්තක් හෝ; භොජනීයං වා, බුදිය යුත්තක් හෝ; ඛාදෙය්‍ය වා, කා නම් හෝ; භුඤ්ජෙය්‍ය වා, අනුභව කෙළේ නම් හෝ පාචිත්තියං, පචිති වේ.

**සං:-** "**විකාලෙ**" යි කාලය නම් අරුණෝද්ගමනෙහි පටන් මධ්‍යාහ්න කාලය දක්වා කාලයයි, හෙවත් බුධාදී මහොත්තමයන් විසින් පුරුදු කරණ ලද භොජන කාලයයි.

මධ්‍යාහ්න කාලයේ පටන් අරුණෝද්ගමනය තෙක් විකාලයයි. ඒ විකාලයෙහි භික්ෂූන්ට කන්නට බුදින්නට හෝ නොවටී, මේ අතර (විකාලයෙහි) කැප ගිලන්පස පානය කළ හැකි වේ. ඒත් කුකුස් ඇත්තහු විසින් නොකට යුතුයි. වේලාව දන ගැණීම සඳහා කාලසතම්භයක් පිළියෙළ කරගත යුතුයි. වර්තමාන කාලයේ ඒ සඳහා ඔර්ලෝසුවක් තබා ගණිති.

විකාලයෙහි අනුභව කිරීම පිණිස ආමිස සංඛ්‍යාවට අයත් කෑ යුත්තක් වත් බුදිය යුත්තක් වත් පිළිගත්තොත් "දුකුළා" වේ. අනුභව කිරීමෙන් වස්තුවක් පාසා පචිති වෙති.

## සප්තදශාකාරය

නිදනය - රජගහනුවරය.
පුද්ගලයෝ - සත්තරස වර්ගීය භික්ෂූහු ය.
වස්තුව - විකාලෙහි අනුභව කිරීමයි.
ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය යි.
ආණත්තිය - අනාණත්තිකය.
ආපත්ති - තිකපාචිත්තිය ය.
(යාමකාලිකාදිය ආහාර පිණිස ගැණීම් අනුභව කිරීම්හි ද, කාලයෙහි නො කාලයයි සංඥ ඇත්තහුට ද, වෙමතිකාදීන්ට ද, "දුකුළා" වේ.)

අනාපත්ති - කාලයෙහි කාලසංඥ ඇත්තහුට ද, යාමකාලිකාදිය කරුණක් ඇති විටක අනුභව කරන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ. "අනුජානාමි භික්ඛවෙ රොමන්ථකස්ස රොමන්ථං න ච භික්ඛවෙ බහිමුඛඬාරා නීහරිත්වා අජ්ඣොහරිතබ්බං" යී අනුඥාත බැවින් රොමන්ථකයාට ද ඇවැත් නොවේ.

අඞග - විකාලතා, යාවකාලිකතා, අජ්ඣොහරණන්ති අඞග තුණෙකි.

(සමුට්ඨානාදිය එළකලොම ශික්ෂාවෙහි කී පරිදියි.)

8. යො පන භික්ඛු සන්නිධිකාරකං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං.

---

# නිදන කථාව

රජගහ නුවර ගිරග්ග සමජ්ජ නම් නෘත්‍යයෙකි. සප්ත රස වර්ගීය භික්ෂූහු ඒ නෘත්‍යය බැලීමට ගියාහුය. එහි සිටි මිනිස්සු භික්ෂූන් දක සතුටුව නහවා විලිම්පනය ද කොට අනුභව කරවා ගෙණ යන්නට ද කැවුම් ආදිය දුන්නාහුය. ඒ භික්ෂූහු ආරාමයට ගොස් ෂඩ්වර්ගීය භික්ෂූන්ට ද ඇවැත්ති! කැවුම් ආදිය ගනිව් ය යි ද කීවාහුය. ෂඩ් වර්ගීය භික්ෂූහු මෙ කරුණ සෙසු භික්ෂූන්ට කීහ. උන්වහන්සේලා තථාගතයන් වහන්සේට සැළ කළහ. එකල්හි බුදුන් වහන්සේ මේ ශික්ෂාව පණවා වදළ සේකි.

**භොජන වර්ගයෙහි සප්තම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

8. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: සන්නිධිකාරකං, (පිළිගෙණ එක් රැයකුදු) කල් තැබීම කොට: ඛාදනීයං වා, (යාවකාලික) කන දෙයක් හෝ: භොජනීයං වා, අනුභව කටයුත්තක් හෝ: ඛාදෙය්‍ය වා, කානම් හෝ: භුඤ්ජෙය්‍ය වා, බුදිනම් හෝ: පාචිත්තියං, පචිති වේ.

**සං**:- "**සන්නිධිකාරකං**" යනු (සම්මා නිධානං ඨපනං සන්නිධි: සං, නි, පුබ්බ, "ධා" නිදහනෙ, කරණං, කාරො: සන්නිධිකාරො එතස්සාති: සන්නිධිකාරං: සාන්නිධිකාරං එව: සන්නිධිකාරකං: ස්වාර්ථයෙහි කාගමයයි) උපසම්පද භික්ෂුවකගේ අතින් හෝ ශරීරය පිළිබඳ යම්කිසි අවයවයකින් පිළිගෙණ එක රැයක් ගතවූ කිසියම් ආමිසයකට "සන්නිධිකාරක" ය යි කියනු ලැබේ. ඒ නිසා **"සන්නිධිකාරකං නාම අජ්ජපටිග්ගහිතං අපරජ්ජු"** යී කියන ලදී: මෙසේ සන්නිධි කරණ ලද යාව කාලිකයක් හෝ යමකාලිකයක් හෝ අනුභව කරන්නෙම් යි කියා ගත්තොත් ඒ ගැණීමෙන් "දුකුළා" වක් වේ. වළඳත් හොත් එයින් පිඩක් පිඩක් පාසා "පචිති" වෙති.

දුදෙධාත පාත්‍රයෙහි (යම් පාත්‍රයක ඇඟිල්ලෙන් ඝර්ෂණය කරණ විට ඇඟිලි පාර පෙණෙයි නම් ඒ දුදෙධාත පාත්‍රයෙහි) දෙවෙනි දිනෙහි අනුභව කරන්නහුට ද, පචිති වේ. ගණ්ඨිත පාත්‍රයෙහි (බිඳීමෙන් බැම් ගසන ලද පාත්‍රයෙහි) බැම් අතරෙහි තෙල් පිවිසිය හැකි වේ. එබඳු

පාත්‍රයක් අව්වෙන් රත් කරණ විට තෙල් වැගිරෙයි. එසේම උණු කැඳ වත්කළ විට කැඳෙහි තෙල් මතුවෙයි. එබඳු පයක නමුත් දෙවෙනිද වැලඳුව හොත් පචිති වේ. අවිජහිත පටිග්ගහණය නිසයි.

තෙලවර්ණ පාත්‍රයෙහි ද ඇඟිලි රේඛාව පෙණේ. එහෙත් ඒ අබ්බොහාරික වේ. ඒ රේඛාව තෙමේ ම විගසින් නැතිවී යෙයි. පාත්‍ර පර්‍ය්‍යාපන්නයන් කෙරෙහි කිසි අපෙක්ෂාවක් (=නැවත බලාපොරොත්තුවක්) නැතිව අනුපසම්පන්නයෙකුට දුන් කල්හි හෙතෙමේ එය පිළිගෙණ එහි වූ යමක් දෙවෙනිද පිළිගැන්නුව හොත් පිළිගෙණ වළඳන්නට වටී. එයින් ඇවැත් නොවේ.

යම්කිසි කැප භොජනයක් තෙමේ ම පිළිගෙණ අනුප සම්පන්නයෙකුට අපෙක්ෂා රහිතව නොදී දෙවෙනිදත් එයින් ම ඝාලපයක් නමුත් වැලඳුව හොත් පචිති වේ. නොකැප මස් අතුරෙන් මිනිස් මස් පෙරසේ අනුභව කරන්නහුට තුලසියක් සමග පචිතියෙක් වේ. සෙසු හස්ති, අශ්ව, ශුනක, අහි, සිංහ, ව්‍යාඝ්‍ර, දීපි, අච්ඡ, තරච්ඡ, යන මොවුන්ගේ මස් සහ උද්දෙසික මසත් පළමු පරිදි අනුභව කරන්නහුට දුකුළාවක් සමග පචිතියෙක් වේ.

**"සත්තා 'හකාලිකං යාවජ්ජීවිකං ආහාරත්ථාය පටිගණ්හාති ආපත්ති දුක්කටස්ස"** යනාදී පාලියෙන් සන්නිහිත වූ සත්තාහ කාලික යාවජීවකයන් පෙරවරු කාලයෙහි ද ආහාර පිණිස අනුභව කිරීමෙන් දුකුළාවක් වේය යි කී බැවින් යාමකාලිකයන් ආහාර පිණිස අනුභව කිරීමෙන් වෙනම දුකුළාවක් විය යුතුයි. ඒ නිසා අට්ඨකථාවෙහි **"ආහාරත්ථාය අජ්ඣොහරතො දුක්කටෙන සද්ධිං පාචිත්තියං"** යි කීහු.

'යාවකාලික' යනු ඉර උදවූ තැන් පටන් මධ්‍යාහ්න කාලය දක්වා හෙවත් පෙරවරු කාලයෙහි අනුභව කළයුතු ඛාද්‍ය භොජ්‍යයන්ට නමෙකි. ඔහු නම්-සියලුම සප්තවිධ ධාන්‍ය සහ අනුලොම ධාන්‍යවලින් කළ ආහාර විශෙෂයන් ද තල්, පොල්, කොස්, දෙල්, ලබු, කොමඩු, පුස්සඵල, තිපුසඵල, කැකිරි යන නවවිධ මහා ඵලද, මුං, උඳු ආදියද ආහාර සඳහා පවත්නා තවත් මුල් කොළ මල් ගෙඩි ආදියද 'යාවකාලික' යන්නෙන් කිය වෙති.

'යාමකාලික' නම් රාත්‍රියෙහි පශ්චිම යාමය දක්වා පියයුතු අම්බපානාදි අෂ්ඨවිධ පානයන්ට හා අනුලොම් පාන වර්ගයන්ටද ව්‍යවහෘත සාසනික නමෙකි. ඒවා නම්:- අඹ පැන්ය, දඹ පැන්ය, ඇට කෙහෙල් පැන්ය, මස් කෙහෙල් පැන්ය, සිය දූ මිදිරසයෙහි දියවත්කොට යොදන

ලද පැන්ය. දියෙහි ලා මිදිපක් (වියලිමිදි) මැඩගත් පැන්ය. ඕලු නොහොත් රතුපුල් තිලුපුල් ගෙඩි මිරිකා කළ පැන්ය. උගුරැස්ස පැන්ය. යන අෂ්ඨපාන වර්ගයත් හා මේවාට අනුලොම් වූ සිතිඹලා, ලප්නාරං, ජුල්, කොසඹ ආදී කුඩා එලවලින් කළ පැන්ය. යන මේ පැන් වර්ග 'යාමකාලික' යන්නෙන් කිය වෙති. මෙකී පානයෝ අනුපසම්පන්නයන් විසින් සිහිල් වතුරෙහි ලා පොඩිකර පෙරාගන්නා ලද්දෝ වියයුත්තාහ. ගින්නෙන් පැසවූවහොත් නොකැප වෙති.

'සත්තාහකාලික' නම් පිළිගෙණ සත්දවසක් තබා ගෙණ පරිභොග කළ හැකි (සප්පි, තෙල, නවනීත, මධු, ඵාණිත) ගිතෙල්, වෙඩරු තලතෙල් (ආදිය) මීපැණි උක්සකුරු යන පඤ්ච භෛෂජ්‍යයන්ට නමෙකි.

'යාවජීවක' යනු මෙකී යාවකාලිකාදී තුණත් කාලවිමුක්ත ජලයත් හැර ඛාද්‍ය භොද්‍ය පිණිස නොපවත්නා සෙසු මුල් කොළ ගෙඩි ආදියයි. මේවා පිළිගෙණ කරුණක් ඇති විටෙක දිවි ඇතිතාක් පරිභොග කළ හැකි බැවින් යාවජීවික නම් වෙති.

පවාරිත වූ යමෙක් අනතිරිත්ත භොජනයක් අනුභව කළ හොත් ඔහුට 'කප්පිය භොජනං භුඤ්ජන්තස්ස' යනාදි ක්‍රමයෙන් දක්වන ලද සියලුම විකල්පයන්ට වැඩිපුර පචිතිය බැගින් වැඩේ.

### සප්තදශාකාරය

නිදානය - සැවැත්නුවරය.

පුද්ගලයා - බෙලට්ඨසීස තෙරණුවෝයි.

වස්තුව - සන්නිධිකාරක භොජනයයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි.

ආණත්තිය - අනාණත්තික යයි.

ආපත්ති - තිකපාචිත්තිය යි.

යාමකාලික, සත්තාහ කාලික, යාවජීවකයන්, පිළිගැණීමෙන් හා වැළඳීමෙන්ද, අසන්නිධි කාරකයෙහි සන්නිධිකාරක සංඥ ඇත්තාටද, වෙමතිකයාටද, 'දුකුළ' වේ.

9. යානි ඛො පන තානි පණීත භොජනානි සෙය්‍යථීදං සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං මච්ඡො මංසං ඛීරං දධි යො පන භික්ඛු එවරූපානි පණීත භොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පාචිත්තියං.

---

අනාපත්ති - යාවකාලිකයක් යාවකාලයෙහි වළඳන්නාටද, යාමකාලික යක් යාමයෙහි තබාගෙන වළඳන්නාට ද, සත්තාහ කාලිකයක් සත් දවසක් තබාගෙණ වළඳන්නාටද, යාවජීවිකයක් කරුණක් ඇති කල්හි වළඳන්නාට ද, උන් මත්තකාදින්ට ද, ඇවැත් නොවෙති.

අඞ්ග - ආමිසං, සන්නිධිභාවො, තස්ස අජ්ඣොහරණං කියා අඞ්ග තුණෙකි.

**(සමුට්ඨානාදිය එළකලොම සමුට්ඨානාදිය සේයි.)**

## නිදාන කථාව

ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ උපාධ්‍යාය වූ බෙලට්ඨසීස තෙරණුවෝ ආරණ්‍ය වාසීවූහ. උන්වහන්සේ ගමෙහි පිඩුසිඟා 'සුක්ඛකුර' නම් වියළි ආහාරය ආරාමයට ගෙණ ගොස් එය වේලා තබති. උවමනා විටෙක වතුරෙන් පොඟවා (තෙමා) වළඳති. ඒ නිසා දිනපතා පිඩු පිණිස ගමට නොවඩිති. මෙකරුණ භික්ෂූන්ට දැනී තථාගතයන් වහන්සේට සැළ කළාහුය. ඒ නිමිත්ත කොට මේ ශික්ෂාව අනුදත්හ.

**භොජන වර්ගයෙහි අෂ්ටම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

9. **අර්ථ**:- යානි ඛො පන තානි, යම් ඒ: පණීත භොජනානි, ප්‍රණීත භොජනයෝ වෙද්ද: සෙය්‍යථීදං, ඔහු කවරහුද? යත්. සප්පි, ගිතෙල්ය: නවනීතං, වෙඬරුය: තෙලං, තලතෙල්ය: මධු, මීය: ඵාණිතං, උක්සකුරුය: මච්ඡො, දිය මස්ය: මංසං, ගොඩ මස්ය: ඛීරං, කිරිය: දධි, දීය: යන එවරූපානි, මෙබඳුවූ: පණීත භොජනානි, ප්‍රණීත (මිහිරි) භොජනයන්: යො පන භික්ඛු, යම් කිසි මහණෙක් තෙමේ වනාහි, අගිලානො, නො ගිලන්වූයේ: අත්තනො අත්ථාය, තමන් පිණිස: විඤ්ඤාපෙත්වා, ඉල්වාගෙණ: භුඤ්ජෙය්‍ය, අනුභව කෙළේ නම්: පාචිත්තියං, පචිති වේ.

සං:- **"පණීත භොජනානි"** යනු (පණීතෙහි සංසට්ඨානි-භොජනානි, පණීත භොජනානි; මධ්‍යපදලොප තත්පුරුෂයයි) මිහිරි රසැති ආහාරයෝය, ගිතෙල් ආදී මිහිරි රස සමග මිශ්‍ර කිරීමෙන් භොජනය ප්‍රණීත (මිහිරි) වේ. 'සප්පි' ආදියෙන් ප්‍රණීත භොජන දක්වෙති.

ගවාදී යමෙකුගේ මස් භික්ෂූන්ට කැප වේ නම් ඔවුන්ගේ ගිතෙල් මෙහි 'සප්පි' යනුවෙන් කියවේ. නවනීතං, ඛීරං, දධි යන මොවුන්ගේ විනිශ්චයද මෙසේ මැයි.

තල, මී, අබ, එරඬු යන මොවුන්ගේ ඇටවලින් සැපයූ තෙල් හා වසා තෙල් ද මෙහි 'තෙලං' යනුවෙන් කිය වේ.

ඵාණිතං යනු උක්ගසින් සැපයූ පැණි සකුරු, සීනි යන මේ ද්‍රව්‍ය වලට නමෙකි. 'මධු' නම් මක්ඛිකා මධුවයි. දියෙහි හටගත් ප්‍රාණී විශෙෂයන්ට 'මච්ඡ' යයි කියනු ලැබේ. 'මංස' නම් ගොඩ මස්ය. යමෙකුගේ කිරි ආදිය කැප නම් ඔවුන්ගේ මසත් කැපවේ.

සං:- **"අගිලානො"** මෙහි කියැවෙන අගිලානයා නම්, මෙකී ප්‍රණීත භොජන නොමැතිව යමෙකුගේ යම් රොගාදියක් සුවවෙයි නම් එබන්දෙකි. ප්‍රණීත භොජන නොමැතිව සුව නොවෙයි නම් එබන්ද ගිලනෙකි.

**"අත්තනො අත්ථාය විඤ්ඤාපෙති"** යනු යම් භික්ෂුවක් පිරිසිදු ගිතෙල් ආදී පඤ්ච භෛෂජ්‍යයන් දයකාදීන්ගෙන් ඉල්වයි නම් එහි විනිශ්චය මහානාම ශික්ෂාපදයෙන් කටයුතුයි. **"අගිලානෙන භික්ඛුනා චාතුමාසපච්චය පවාරණා සාදිතබ්බා" අඤ්ඤත්‍ර පුන පවාරණාය අඤ්ඤත්‍ර නිච්ච පවාරණාය තතො චෙ උත්තරිං සාදියෙය්‍ය පාචිත්තියං"** යනු මහානාම ශික්ෂා පදයයි.

සඞ්ඝ වශයෙන් ගිලාන පච්චය පවාරණයෙන් පැවරූ තැනෙක්හි යම් හෙයකින් රාත්‍රි ගණනක් හෝ බෙහෙත් ගණනක් හෝ මෙපමණ යයි නියම කරණ ලද නම් එපමණ රාත්‍රි ගණනක් ඇතුළත හෝ එපමණ බෙහෙත් ගණනක් ම හෝ ඉල්වා ගත යුතුයි. ඒ රාත්‍රි ගණනවත් බෙහෙත් ගණන වත් ඉක්මවා විඥපනය කළහොත් ඇවැත්වේ.

යමෙක් නොගිලන්ව මත්ස්‍යාදී සතර විඥපනය කොට වැළඳුවහොත් සූපොදන විඥප්තියෙන් විනිශ්චය කට යුතුයි. **"න සූපංවා ඔදනං වා අගිලානො"** ති යනාදී සෙඛියාවෙන් සූපොදන විඥප්තියෙන්

'දුකුළා' වක් වන බැව් කිය වේ. සප්පි ආදියෙන් මිශ්‍රිත භොජනය විඤපනය කරන්නහු පිළිබඳ විනිශ්චය මෙසේ දතයුතුයි. 'ගිතෙල් සමග බත් දෙව; ගිතෙල් ඉස බත් දෙව, ගිතෙල් මිශ්‍ර කොට දෙව, ගිතෙල් සමග දෙව, ගිතෙල් බත් දෙවයි' මෙසේ ඉල්වන්නාට විඥප්තියෙන් 'දුකුළා' වෙකි. පිළිගැණීමෙන් ද 'දුකුළා' වෙකි. අනුභව කිරීමෙහි දී පිඩක් පාසා පචිති වෙති.

ඇවැත් වීමට විඥප්තිය විසංකෙත නොවිය යුතුයි. විසං කෙත වුවහොත් ඇවැත් නොවේ. සියලුම පද පිළිබඳ විනිශ්චය මෙසේ ම සැලකිය යුතුයි.

ගිතෙල් ආදී මේ සියල්ල ම එක තැනකින් හෝ නොයෙක් තැනින් හෝ ඉල්වා ගෙණවුත් එකට මිශ්‍රකොට (සම්භින්නරසයක් කොට) එයින් තණ අගකින් එක බින්දුවක්වත් පානය කළ හොත් 'පචිති' නවයක් වෙති.

### සප්තදශාකාරය

නිදනය - සැවැත් නුවරය.

පුද්ගලයා - සවග භික්ෂුහුය.

වස්තුව - පණීත භොජන විඥපන වසතුවයි. ('අගිලානො' යනු අනුප්‍රඥප්තිය යි.)

ආණත්තිය - අනාණත්තිකයයි.

ආපත්ති - තිකපාචිත්තිය යි. (අගිලාන සංඥ ඇති ගිලනාට ද, වෙමතිකයාට ද දුකුළා වේ.)

අනාපත්ති - ගිලන් යයි සංඥ ඇත්තාට ද, ගිලන් කලැ විඥපනය කොට නොගිලන් කලැ වළඳන්නා ට ද, ගිලනාගේ ඉතිරි වූවක් වළඳන්නාට ද, අනිකෙකුට විඥපනයෙහි ද; තමන්ගේ ධනයෙන් ගත් දැහි ද; උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවෙති.

අඞ්ග - පණීත භොජනතා; අගිලානතා; කතවිඤ්ඤත්තියා පටිලාභො: අජ්ඣොහරණං යී කියා අඞ්ග සතරෙකි.

සමුට්ඨාන - අද්ධාන සමුට්ඨාන ය යි.

කිරියා - ක්‍රියා විසිනි.

සඤ්ඤ - නො සඤ්ඤ විමොක්ඛය යි.

10. යො පන භික්ඛු අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය අඤ්ඤත්‍ර උදක දන්තපොනා පාචිත්තියං.

**භොජනවග්ගො චතුත්ථො.**

---

චිත්ත - අචිත්තකයි.

වද්‍ය - ප්‍රඥප්ති වද්‍යය යි.

කම්ම - කායකම්ම වචීකම්ම දෙකයි.

කුශලත්‍රිකය - තිචිත්තය යි.

වෙදනාත්‍රිකය - තිවෙදනාවයි.

---

# නිදාන කථාව

එක් කලෙක ෂව්ගග භික්ෂූහු තමන් උදෙසා ප්‍රණීත භොජන විඥපනය කොට වැළඳූහ. මනුෂ්‍යයෝ ඒ නිසා භික්ෂූන්ගේ නුගුණ පතළ කළහ. ඒ බැව් දත් බුදුහු **"යානි ඛො පන තානි පණීත භොජනානි =පෙ=පාචිත්තියං"** යී ශික්ෂාපදය අනුදත්හ.

එකල්හි භික්ෂූහු ගිලන් වූහ ග්ලානොපසථායක භික්ෂූහු ගිලන් උවටැන් විචාළ කල්හි ඇවැත්නි! පෙර අප ගිලන් වූ විට ප්‍රණීත භොජනයන් විඥපනය කොට ගෙන්වා ගෙණ වැළඳීමු. දැන් එය භාග්‍යවතුන් වහන්සේ ප්‍රතික්ෂෙප කොට අනුදත් සේක. ඒ නිසා අපට සුව නො වේය යි කීහ. මේ කරුණ දත් බුදුරජානන් වහන්සේ **"අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා පණීත භොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිතුන්ති"** යී අනුදැන වදරා මේ ශික්ෂාපදයට අනුප්‍රඥප්තියක් එක්කොට වදළ සේකි.

**භොජන වර්ගයෙහි නවම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

10. **අර්ථ:-** යො පන භික්ඛු, යම් මහණෙක් තෙමේ වනාහි; අදින්නං, (අනුන් විසින්) නො දෙන ලද; ආහාරං, ආහාරයක්; උදකදන්ත පොනා අඤ්ඤත්‍ර, පැන් දැහැටි හැර; මුඛද්වාරං, ගල බිලයට (-උගුරට); ආහරෙය්‍ය, ගන්නේ වී නම්; පාචිත්තියං පචිති වේ.

චතුත්ථො, සිවුවැනි වූ; භොජනවග්ගො බොජුන් වගයි.

සං:- **"අදින්නං"** යනු යම්කිසිවකු විසින් අත්පසැ සිට පිළි නොගන්වන ලද්දකි. පිළිගැන්වීම හා පිළිගැණීම කෙසේ වියයුතු ද? යත්! හස්තාදි ශරීරාවයවයකින් හෝ කය පිළිබඳ හැඳි ආදියකින් හෝ නිස්සග්ගිය වශයෙන් (ප්‍රතිග්‍රාහකයාගේ අතෙහි හෝ පාත්‍රාදියෙහි වැටෙන්නට දැමීම) හෝ අත්පසැ සිට යමක් (බුදියයුතු වූවක්) දීම පිළිගැන්වීම වේ. මෙසේ දනය කරන භොජනයක් හස්තාදි යම්කිසි ශරීරාවයවයකින් වත් ශරීර ප්‍රතිබඩ පාත්‍රාදි යමකින් වත් ස්පර්ශකොට ඉවසීම පිළිගැණීම වේ. යටත්පිරිසෙයින් පාදයේ ඇඟිල්ලකින් වත් ස්පර්ශ කටයුතු වේ. තමන්ට අයිතිවූ භොජනයක් වුවත් පිළිගන්වා නොගෙණ නො වැළඳිය යුතුයි. විශ්වාසයෙකුට පිළිගන්වන ලද්දක් වුවොත් වැළැදීම කළහැකි වේ.

පිණ්ඩපාතය කරන්නහුගේ පාත්‍රයෙහි රජසක් වැටුනොත් පිළිගන්වා ගෙණ භික්ෂාව ගතයුතු වේ. නැතහොත් විනය දුක්කටයෙකි. (විනයෙහි පනවන ලද දුකුළාවෙකි.) මේ පාත්‍රය අතට අරගෙණ නැවත දෙවයි කියද්දීත් නො ඇසුනාක්මෙන් භික්ෂාව දෙත් නම් විනය දුක්කටයෙන් මිදෙයි.

යම් හෙයකින් මහාවාතයක් ඒ ඒ පැත්තෙන් හමා රජස් හෙලයිද පිඩු සිඟන්ට නොහැකිද එකල්හි අනුපසම්පන්නයෙකුට දෙන්නෙමියි ශුද්ධ සිතින් සිතාගෙණ පිඩුසිඟිය යුතුයි. ආරාමයට අවුත් ඒ පිඩු අනුපසම්පන්නයෙකුට දියයුතුයි. පසුව ඔහු විසින් පිළිගන්වන ලද්දක් හෝ විශ්වාසකමින් හෝ වැළඳීමෙන් ඇවැත් නොවේ.

සං:- **"මුඛද්වාරං"** යනු ගලනාළිකාවයි. මුඛයෙන් හෝ නැහැයෙන් හෝ ප්‍රවෙශවූවක් කණ්ඨයෙන් (උගුරෙන්) ගිලිය යුතු වේ. ඒ නිසා ගලනාළිකාවට (උගුර) මුඛද්වාරය යයි කියනු ලැබේ.

සං:- **"ආහාරං"** යනු (ආහරීයතීති; ආහාරො; 'ආ' පූර්ව හර හරණෙ) අනුභව කටයුතු යම් කිසිවකි.

කිසියම් යාවකාලිකයක් හෝ යාමකාලිකයක් හෝ සත්තාහ කාලිකයක් හෝ යාවජීවිකයක් හෝ වේවා මේ සියල්ලම අනුභව කටයුතු බැවින් ආහාර නම් වෙති. (යාවකාලිකාදියෙහි විස්තර සන්නිධිකාරක ශික්ෂා වර්ණනාවෙන් බලනු.)

සං:- **"අඤ්ඤත්‍ර උදකදන්තපොනා"** මේ අනුප්‍රඥප්තිය යි. පැන් කැමැති පරිද්දකින් රැගෙණ පානය කළ හැකි වේ. දැහැටි ද දන්තකට්ඨ පරිභොගයෙන් පරිභොග කරන්නට වටී. එහෙත් දැහැටි රසය ගිලින්නට

නොවටී. දැහැටි රස නොදනී ගිලුනත් පවිති වේ. නො පිළිගන්වන ලද මහාවිකට භොජන සතරද , සර්පයන් විසින් දෂ්ටකිරීමාදී අවශ්‍ය කරුණකදී ප්‍රයොජන ගත හැකි වේ. මහා විකටයෝ නම්:- අසූචි, මූත්‍ර, අළු, මැටි යන සතරයි. ආශ්‍රය ස්ථානාදීන්ගේ වශයෙන් විරූපව ඇති වෙන නිසා 'විකට භොජන' යයි කියා හෝ 'ප්‍රකෘති භොජන' යයි ද කියති.

### සප්තදශාකාරය

නිදානය - විශාලා මහනුවරය.

පුද්ගලයා - අඤ්ඤතර භික්ෂුවය.

වස්තුව - නොපිළිගන්වන ලද ආහාර ගැණීමයි.

ප්‍රඥප්ති - සාධාරණ ප්‍රඥප්තියයි.

(අඤ්ඤත්‍ර උදකදන්තපොනා යනු අනුප්‍රඥප්ති යයි.)

ආණත්තිය - අනාණත්තික යයි.

ආපත්ති - තිකපාචිත්තියයි.

පිළිගත්දැහි නොපිළිගත්තකැයි සංඥ ඇත්තාට ද, වෙමතිකයාට ද 'දුකුළා' වේ.

අනාපත්ති - පිළිගන්නා ලදැයි සංඥ ඇත්තහුට ද, පැන් දැහැටි හා සිවුමහාවිකටයන් ද, කරුණක් ඇති කල්හි කප්පිය කාරකයෙක් නැතහොත් තෙමේ ගෙණ අනුභව කරන්නහුට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

(දුර්වවූද අසමර්ථවූ ද කැපකරුවා සිටියත් කැපකරුවෙකු නොමැති යයි සැළකේ. අළු නැතහොත් ගසකින් අමුදර කඩක්වත් කඩා ගෙණ අළු කරගත හැකිවේ. ඇවැත් නොවේ. මැටි ගන්නට පොළව සාරන්නටද වටී. එයින් ඇවැත් නැත්තේය. මෙසේ කළයුත්තේ සර්පයකු දෂ්ට කළ කල්හිය. අන් අවස්ථාහිදී පිළිගන්වා ගෙණම පරිභොග කටයුතුයි.)

අඞ්ග - අපටිග්ගහිතකතා, අනනුඤ්ඤාතතා, ධූමාදි අබ්බොහාරිකා භාවො, අජ්ඣොහරණං, කියා අඞ්ග සතරෙකි.

(සමුට්ඨානාදිය එළක ලොම සමුට්ඨානාදීය මෙනි.)

1. යො පන භික්ඛු අචෙලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය පාචිත්තියං.

---

## නිදාන කථාව

එක්තරා මහණෙක් තෙමේ සර්ව පාංශුකූලිකවූයේ සොහොනෙහි වෙසෙයි. හෙතෙම මිනිසුන් විසින් දෙනු ලබන්නක් පිළිගන්නට කැමැති නොවේ. සොහොනෙහි ද රුක්මුල් ආදියෙහි ද තබන ලද අහර තෙමේම ගෙණ අනුභව කරයි. එසේම කළුරිය කළ පිතා පිතාමහාදීන් (පියමුතුන්) සඳහා තබන ලද ඛාද්‍ය භොජ්‍යයන් ගෙණ වළඳයි. ඒ නිසා මිනිස්සු නො පැහැදී දෙස් කීහ. ඒ බැව් දත් බුදුහු 'යො පන භික්ඛු -පෙ-පාචිත්තියං යි ශික්ෂාව අනුදත්හ.

එකල්හි භික්ෂූහු පැන් දැහැටි ආදිය ද නොපිළිගෙණ පරිභොග කරන්ට නුසුදුසු යයි කුකුස් කළාහුය. එකල්හි තථාගතයන් වහන්සේ **"අනුජානාමි භික්ඛවෙ අදින්නං උදක දන්තපොනං සාමං ගහෙත්වා පරිභුඤ්ජිතුං"** යී වදරා **"අඤ්ඤත්‍ර උදක දන්ත පොනා"** යන අනුප්‍රඥප්තියක් පළමු ශික්ෂාවට ඇතුළත් කොට වදළ සේක්.

**භොජන වර්ගයෙහි දශම ශික්ෂාපද වර්ණනාව නිමි.**
**සිවුවැනිවූ බොජුන් වගයි.**

---

1. **අර්:-** යො පන භික්ඛු, යම් මහණෙක් තෙමේ වනාහි: අචෙකස්ස වා, නග්නයෙකුට හෝ: පරිබ්බාජකස්ස වා, පිරිවැජි යෙකුට හෝ: පරිබ්බාජිකාය වා, පිරිවැජිනියකට හෝ: සහත්ථා, සියතින්: ඛාදනීයං වා, ඛාද්‍යයක් හෝ: භොජනීයං වා, භොජ්‍යයක් හෝ: දදෙය්‍ය, දෙන්නේ නම්: පාචිත්තියං, පචිති වේ.

**සං:-** **"අචෙලකස්ස"** යී (නත්ථි චෙලො එතස්සාති: අචෙලකො තස්ස) අචෙලකයා නම් - නග්න වූ (නිර්වස්ත්‍ර වූ) යම්කිසි අන්තොටු පැවිද්දෙකි.

**සං:-** **"පරිබ්බාජකස්ස"** යනු (පරිවජ්ජ පබ්බජ්ජං ගච්ඡතීති: පරිබ්බාජකො: තස්ස) භික්ෂු සාමණේර දෙදෙනා හැර සෙසු පැවිද්දන්ට ව්‍යවහාරප්‍රාප්ත නමෙකි. හෙද අන්තොටුවෙකි.

සං:- "**පරිබ්බාජිකාය**" යනු භික්ෂුණියත් සික්ඛමානාවත් සාමණේරියත් හැර සෙසු කිසියම් මෙහෙණියකි. ඇද අන්තොවුයි.

මෙහි කී අචෙලකාදි අන්‍ය තීර්ථික පැවිද්දනට යම්කිසි ආමිසයක් සියතින් එකප්‍රයොගයකින් දෙන්නහුට එක පචිතියෙකි. වරින් වර දෙන්නහුට ප්‍රයොගයක් පාසා පචිති වෙති.

### සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | වෙසාලියයි. |
| පුද්ගලයා | - | ආයුෂ්මත් ආනන්‍ද ස්ථවිරයන් වහන්සේය. |
| වස්තුව | - | පිරිවැජිනියකට කැවුම් දෙකක් දීමයි. |
| ප්‍රඥප්තිය | - | අසාධාරණ ප්‍රඥප්තියයි. |
| ආණත්ති | - | අනාණත්තිකයයි. |
| ආපත්ති | - | තික පාචිත්තිය යි. (පැන්, දැහැටි දෙන්නහුට ද, අතීර්ථිකයා කෙරෙහි තීර්ථික සංඥ ඇත්තහුට ද, වෙමතික යාට ද "දුකුළා" වේ.) |
| අනාපත්ති | - | අතීර්ථිකයන් කෙරෙහි අතීර්ථික සංඥ ඇත්තහුට ද, අනුසම්පන්නයෙකු ලවා දෙවන්නාට ද, ඔවුන් ලඟ ආහාර භාජනය තබා මේ ගණුවයි කියන්නාට ද, ඔවුන් විසින් තබන ලද භාජනයට අහර දමන්නාට ද බාහිරාලෙපයක් (තෛලාදියක්) දෙන්නාට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | අඤ්ඤතිත්ථියතා, අනනුඤ්ඤාතතා, අජ්ඣොහරණීයං, අජ්ඣොහරණත්ථාය සහත්ථා අනික්ඛිත්තභාජනෙ දනන්ති; කියා අඞග තුණෙකි. |

(සමුට්ඨානාදිය එළකලොම සමුට්ඨානාදිය මෙනි.)

## නිදන කථාව

එක් කලෙක සඟනට බොහෝ ඛාදනීය ද ලැබුනාහ. ඒ දනගත් බුදුහු විඝාසාදනයට දෙන සේ නියම කළහ. ආයුෂ්මත් ආනන්‍ද ස්ථවිරයන් වහන්සේ විඝාසාදයන් පිළිවෙළට සිටුවා එකෙක කැවුම් දෙන්නාහු

2. යො පන භික්ඛු භික්ඛුං එවං වදෙය්‍ය එහාවුසො ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමාති. තස්ස දාපෙත්වා වා අදාපෙත්වා වා උය්‍යොජෙය්‍ය ගච්ඡාවුසො න මෙ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හොති. එකකස්ස කථා වා නිසජ්ජා වා ඵාසුහොතී'ති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං.

---

එක්තරා පිරිවැජියකට එකක් යයි සිතා දෙකක් දුන්හ. දෙවනුත් එසේම දුන්හ. ඒ දුටු පරිබ්‍රාජිකාවෝ මේ තිගේ ජාරයෙක්ද යි තෙවරම ඇගෙන් ඇසූහ. ඈ ද එය එකක්යයි සිතා දුන්නා මිස වෙනෙකක් නිසා නොවේ ය යි තෙවරම කීවා ය.

තවත් භික්ෂුවක් පරිබ්‍රාජිකාවකට ගිතෙල් මිශ්‍ර ලොකු බත් ගුලියක් දුන්නී ය. ඒ ගෙණ ගොස් තිඳබසින් කථාකරමින් අනුභව කෙළේය. ඒ කථාව ඇසූ උපාසකයෝ බුදුන් වහන්සේට මෙ කරුණ කීහ. බුදුහු එකල්හි මේ ශික්ෂාව අනුදත්හ.

**අචෙලක වග්ගයෙහි ප්‍රථම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

**2. අර්ථ:-** යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; භික්ඛුං, භික්ෂුවක් හට; ආවුසො, ඇවැත්ති! එහි, (මා හා කැටිව) එව; ගාමං වා, ගමකට හෝ; නිගමං වා, නියම් ගමකට හෝ; පිණ්ඩාය, පිඩු පිණිස; පවිසිස්සාම ඉති, පිවිසෙන්නෙමු ය යි; එවං, මෙසේ; වදෙය්‍ය, කියන්නේ; තස්ස, ඒ භික්ෂුවට; දාපෙත්වා වා, (යම් ආමිසයක්) දෙවා හෝ; අදාපෙත්වා වා, නොදෙවා හෝ; ආවුසො, ඇවැත; ගච්ඡ, යව; තයා සද්ධිං, තා හා සමග; කථා වා, බිණීම් හෝ; නිසජ්ජා වා, හිඳීම හෝ; ඵාසු න හොතීති, පහසු නොවේ ය යි; එකකස්ස, හුදකලා වූ; මෙ, මාගේ; කථා වා, බිණීම හෝ; නිසජ්ජා වා, හිඳීම හෝ; ඵාසු හොති ඉති, පහසු වන්නේ ය යී; එවං වදෙය්‍ය, මෙසේ කියන්නේ නම්; එතං එව, එයම; පච්චයං කරිත්වා, හෙතුකොට ගෙණ; අනඤ්ඤං, අනිකක් හෙතු කොට නො ගෙණ; උය්‍යොජෙය්‍ය, පිටත් කරන්නේ නම්; පාචිත්තියං, පචිති වේ.

**සං:-** **"උය්‍යොජෙය්‍ය"** යනු යම්කිසි මහණෙක් තෙම ක්‍රීඩාවට සුදුසු වූ; මාගමක් දැක ඈ සමග සිනාසීම ක්‍රීඩාකිරීම රහසිගතව සිඳීමාදිය කරණු කැමැතිව තමන් විසින් කැඳවනු ලැබූ භික්ෂුව පිටත් කිරීමයි. පිටත් කිරීම් සඳහා කරණු ලබන ව්‍යාජ කථාව 'න මෙ ආවුසො' යනාදියෙන් ප්‍රකාශ වේ.

සං:- **"එතදෙව පච්චයං කරිත්වා"** යනු යථොක්ත හසනාදී අනාචාරයම කරුණු කොට ගෙණ බැව් දක්වීමයි.

මෙසේ පිටත් කිරීම් පමණෙකින් ඒ භික්ෂුවට දුකුළාවක් වේ. යවනු ලැබූ භික්ෂුව දර්‍ශනොපචාරයත් ශ්‍රවනොපචාරයත් ඉක්මවා එක අඩියක් ගියවිට තවත් දුකුළාවෙකි. දෙවෙනි පියවර ඉක්මවූ කල්හි පචිතිය වේ.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයා | - | උපනන්‍ද තෙරණුවෝය. |
| වස්තුව | - | උය්‍යොජන වස්තුවය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | උය්‍යොජනාණත්තියෙන් සාණත්තිකය. |
| ආපත්ති | - | තිකපාචිත්තිය යි. (අනුපසම්පන්නයෙක් පිටත් කළ හොත් තික දුක්කටයෙකි. දෙදෙනාට ම ක්‍රොධ වශයෙන් අණ කිරීමෙහි දුකුළා වෙකි.) |
| අනාපත්ති | - | දෙදෙනා එකට ගොස් යාපනය නොවන්නෙමුයි, යනාදී සුදුසු කරුණෙක්හි පිටත් කරන්නාට ද, උන්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | අනාචාරං ආචාරිතුකාමතා, තදත්ථ මෙව උපසම්පන්නස්ස උය්‍යොජනා, එවං උය්‍යොජිතස්ස උපචාරාතික්කමො යී අඞ්ග තුණෙකි. |

**(සමුට්ඨානාදිය අදින්නාදන සමුට්ඨානාදිය මෙනි.)**

# නිදන කථාව

ආයුෂ්මත් උපනන්‍ද ශාක්‍ය පුත්‍ර තෙම තම සොහොයුරානන්ගේ සද්ධිවිහාරික භික්ෂුවකට ඇවැත්නි! ගමට පිඩු පිණිස යන්නට එවයි කීයේය. ඔහු පැමිණි කල්හි ඇවැත්නි! තොප සමග කථා කිරීමාදිය මට අපහසුය. හුදකලා වූ මාගේ බිණීමාදිය පහසුය යි යාගු ආදී ආමිසයක් නො දී පිටත් කෙළේය. ඒ භික්ෂුව එයින් එද සුන්බත් වීය. මෙ කරුණ දත් තථාගතයන් වහන්සේ මේ ශික්ෂාපදය අනුදත් සේකි.

**අචෙලක වර්‍ගයෙහි ඨතීය ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

3. යො පන භික්ඛු සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං.

---

**3**. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: සභොජනෙ, (මෛථුන රාගයෙන් සමන්විතවූ) අඹු සැමි දෙදෙනෙක් ඇති: කුලෙ, කුලයෙක්හි: අනුපඛජ්ජ, ඇතුළට පිවිස: නිසජ්ජං කප්පෙය්‍ය, හිඳීම කරන්නේ නම්: පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"සභොජනෙ"** මෙහි අර්ථ දෙපරිද්දෙකින් ගත යුතු වෙති. (සහ උභොහි ජනෙහි වත්තතීති: සභොජනං: තස්මිං සභොජනෙ: 'සහ' ශබ්දයට සකාරාදෙශව 'උභ' ශබ්දයේ උකාර ලොපයයි.) ස්ත්‍රී පුරුෂ දෙදෙනෙකු වසන කුලයට 'සභොජන' යයි කියනු ලැබේ. නොහොත් (භුඤ්ජිතබ්බන්ති: භොජනං, භොජනෙන සහ වත්ත තීති: සභොජනං, තස්මිං; සභොජනෙ) මෛථුන රාගයෙන් යුත් පුරුෂයාට ස්ත්‍රිය භොග්‍යයකි. එබඳු ස්ත්‍රියට ද පුරුෂයා භොග්‍යයකි. එබඳු භොග්‍යයක් සහිත කුලයක් මෙයින් ගත යුතුයි.

**සං**:- **"අනුපඛජ්ජ නිසජ්ජං"** යි වාසගෘහයෙහි ඇතුළට පිවිස වාඩිවී හිඳීම දක් වේ.

මහල්ලක (ලොකු) සයනීය ඝරයක නම් දෙරබාවේ සිට අත්පස හැර ඇතුළත වූ යහනට ආසන්න (කිට්ටු) ස්ථානයක සිටීමත්, කුඩා සයනීය ඝරයක නම් පරිමැද ඉක්මවා පසෙක සිටීමත්, මෙයින් ප්‍රකාශ කෙරෙයි. මේ ආකාරයෙන් සිටියහුට පචිති වේ.

## සප්තදශාකාරය

නිදානය - සැවැත්නුවරය.

පුද්ගලයා - උපනන්ද තෙරණුවෝය.

වස්තුව - අනුපඛජ්ජ නිසිදනය යි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය යි.

ආණත්තිය - අනාණත්තිකය යි.

ආපත්ති - තිකපාචිත්තිය යි.

අසයනීයඝරයෙහි සයනීයඝර සංඥ ඇත්තහුටද වෙමතිකයාටද, 'දුකුළා' වේ.

4. යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං.

5. යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියං.

---

අනාපත්ති - සයනීයසර සංඥ නැත්තහුටද; කියවුන ලක්ෂණ ඇති පෙදෙස නොඉක්මවා සිටින්න හුටද; දෙවැනි භික්ෂුවක් ඇති කල්හිද; ස්ත්‍රී පුරුෂ දෙදෙනා නික්මුනු පසුද; වීතරාගයන් ලඟ ඉන්නහුටද, උම්මත්තකාදීන්ටද ඇවැත් නොවේ.

අඞ්ග - අවීතරාග ජයම්පත්තිකානං සන්නිහිතතා, සයනීයසරතා, දුතියස්ස භික්ඛුනො අභාවො, අනුපඛජ්ජ නිසීදනන්ති අඞ්ග සතරෙකි.

(සමුට්ඨානාදිය ප්‍රථම පරිජියෙහි මෙනි.)

---

4. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙමේ වනාහි; රහො, (ඇසට) නො පෙණෙන සේ වූයේ; මාතුගාමෙන සද්ධිං, (මිනිස්) මාගමක් සමග පටිච්ඡන්නෙ ආසනෙ, ප්‍රතිච්ඡන්න (=මුවාවූ) අසුනක; නිසජ්ජං, හිඳීම; කප්පෙය්‍ය, කෙරේ නම්; පාචිත්තියං, පචිති වේ.

5. යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; එකො, හුදකලා වූයේ; රහො, රහසිගත වූයේ; එකාය, හුදකලා වූ; මාතුගාමෙන සද්ධිං, මිනිස් මාගමක් සමග; නිසජ්ජං, හිඳීම; කප්පෙය්‍ය, කෙරේ නම්; පාචිත්තියං, පචිති වේ.

## නිදාන කථාව

ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර තෙමේ දිනක් සහායයෙකුගේ ගෙට ගොස් ඔහුගේ භාර්‍ය්‍යාව සමග යහන් ගෙයි සිටියේය. එකල්හි ඒ පුරුෂයා ගෙට විත් වැඳ එකත්පසෙකැ සිටියේ සිය බිරිඳට මෙසේ කීයේය. ආර්‍ය්‍යයන් වහන්සේට පිඬු දෙවයි කියායි. ඇද පිඬු පිළිගැන්වූවා ය. ඒ පුරුෂ තෙම උපනන්ද තෙරුන්ට පිඬු ලත් බැවින් යන්නට කීය. එහෙත් ඔහුගේ බිරිඳ වැඩ සිටින්නට කීවාය. දෙවනු තෙවනුත් යන්ට ය යි කී නමුත් ඈ දෙවනු තෙවනුත් සිටින්ට කීවාය. අනතුරු ඒ පුරුෂයා

6. යො පන භික්ඛු නිමන්තිතො සභත්තො සමානො සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං; තත්ථායං සමයො; චීවරදාන සමයො, චීවරකාර සමයො, අයං තත්ථ සමයො.

---

ගෙයින් නික්ම ගොස් උපනන්ද තෙරුන්ට දෙස් කීයේය. මේ කරුණ දත් තථාගතයන් වහන්සේ මේ ශික්ෂාව පණවා වදාළ සේක.

**අචෙලක වර්ගයෙහි තෘතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

**සං:- 4 - 5** වෙනි ශික්ෂාපද දෙක සැවැත් නුවරදී උපනන්ද තෙරණුවන් අරබයා ප්‍රතිච්ඡන්නාසනයේ රහො නිසජ්ජනය කිරීම නිමිත්ත කොට පණවන ලදී.

මේ දෙකම සාධාරණ ප්‍රඥප්තීහු ය. සමුට්ඨානාදිය පඨම පාරාජිකාවෙහි මෙනි.

**මෙහි විස්තරය අනියත වර්ණනා දෙක බලා දතයුතුයි.**

---

**6. අර්ථ:-** යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; නිමන්තිතො, පවරණ ලද්දේ; සභත්තො සමානො, (පැවරූ බතින්) සමාන බත් ඇත්තේ; සන්තං භික්ඛුං, (අරමෙහි දෙළොස් රියනක් ඇතුළත) විද්‍යමාන (- සිටින) භික්ෂුවක්; අනා පුච්ඡා, ආපුච්ඡා (-ඇසීම) නොකොට; පුරෙ භත්තං වා, පවාරිත බත් වැලඳීමට පෙරටුව (-කලින්) හෝ; පච්ඡා භත්තං වා, වැළඳූ ඉක්බිති (වැළඳූ පසු) හෝ; කුලෙසු, අන්‍ය කුලයන්හි; සමයා අඤ්ඤත්‍ර, කාලය හැර; චාරිත්තං, හැසිරීමට; ආපජ්ජෙය්‍ය, පැමිණෙන්නේ නම්; පාචිත්තියං, පචිති වේ.

තත්ථ, එහි; අයං, මේ; සමයො, කාලය යි. චීවරදාන සමයො සිවුරු දෙන කාලය; චීවරකාර සමයො, සිවුරු කරණ කාලය; අයං, මේ; තත්ථ, එහි; සමයො, කාලය යි.

**සං:- "සන්තං භික්ඛුං අනාපුච්ඡා"** යනු යම් තැනක සිටි මහණෙක් හට කුලයන් කරා යන අදහසක් ඇති වූයේ නම් ඇතුළත උපචාර සීමාවෙහි (දර්ශනොපචාරයෙහි) පැත්තක හෝ ඉදිරියේ හෝ සිටි භික්ෂුවක් දැක ප්‍රකෘති වචනයෙන් 'මම මෙනම් කුලයට හෝ කුලවලට යන්නෙමි' යි කියා යා යුතුයි. දෙළොස් රියනකින් ඇතුළත සිටියහුට ප්‍රකෘති

වචනය ඇසෙයි. එබඳු වචනයකින් කිය යුතුයි. දර්‍ශිනොපචාරයේ යමෙක් නැතහොත් එහේ මෙහේ සොයා බලා ආරොචනය කිරිම නො උවමනා වේ.

'සන්තං භික්ඛුං අනාපුච්ඡා, පුරෙභත්තං වා, පච්ඡාභත්තං වා, අඤ්ඤත්‍ර සමයා' කියා අනුප්‍රඥප්තිය චතුර්විධ වේ.

මෙහි කියැවුන ඡ්ප්‍රකාර සමයෙහි විනා මධ්‍යාහ්න කාලය ගතවෙන්ට කලින් අන් කුලයකට පිවිසිය හොත් ඔහුට සරුපචාරාතික්‍රමණයෙන් දුකුළාවක් වෙයි. ප්‍රථම පාදයෙන් එලිපත ඉක්මවූ කල්හි තවත් දුකුළාවෙකි. දෙවෙනි පාදය ඉක්ම වූ කල්හි පචිති වේ.

## සප්තදශාකාරය

නිදනය - රජගහ නුවරය.

පුද්ගලයා - උපනන්ද තෙරණුවෝය.

වස්තුව - චාරිත්තාපජ්ජනය යි.

ප්‍රඥප්ති - සාධාරණ ප්‍රඥප්තිය යි.

ආණත්ති - අනාණත්තිකයි.

ආපත්ති - තිකපාචිත්තිය යි.

(අනිමන්ත්‍රණයේ නිමන්ත්‍රණය සංඥීහුට ද, වෙමතිකයාට ද දුකුළා වේ.)

අනාපත්ති - අනිමන්තිත සංඥ ඇත්තහුට ද, සමයෙහි භික්‍ෂුවක් ඇතිවිට විචාරා නැති විටක නොවිචාරා යන්නහුටද, අන් ගෙයින් හෝ සරුපාචාරයෙන් හෝ මාර්‍ගයක් වේ නම් එයින් යන්නාට ද, ආපදවන්හි අන්තරාරාම භික්ඛුනුපස්සය තිත්ථියසෙය්‍යා පටික්කමණ භත්තිය සර යන මොවුන් කරා යන්නාට ද උන්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - පඤ්චන්නං භොජනානං අඤ්ඤතරෙන නිමන්තන සාදියනං, සන්තං භික්ඛුං අනාපුච්ඡනා, භත්තිය සරතො අඤ්ඤස්ස සරප්ප වෙසනං, මජ්ඣන්තිකා 'නතික්කමො, සමයස්ස වා ආපදනං වා අභාවො' යී අඞ්ග පසෙකි.

(සමුට්ඨානාදිය පඨම කඨිනයෙහි මෙනි.)

මෙය චනාභි ක්‍රියා'ක්‍රියා විසිනි.

7. අගිලානෙන භික්ඛුනා චාතුමාසප්පච්චය පවාරණා සාදි තබ්බා අඤ්ඤත්‍ර පුන පවාරණාය අඤ්ඤත්‍ර නිච්ච පවාරණාය තතො චෙ උත්තරිං සාදියෙය්‍ය පාචිත්තියං.

---

# නිදන කථාව

උපනන්ද ශාක්‍ය පුත්‍රයන්ගේ උපස්ථායක කුලයක් තෙම උපනන්ද ශාක්‍යයන් හා අන්‍ය භික්ෂූන් ද බතින් නිමන්ත්‍රණය කෙළේය. එදින උපනන්ද ශාක්‍ය පුත්‍රයෝ පෙරවරු කුලයන්හි හැසිරෙති. අන් භික්ෂූහු එහි ගියෝය. එහෙත් උපනන්ද ශාක්‍ය පුත්‍රයෝ ඉතා දවල් වනතුරු නො පැමිණියෝ ය. ඒ නිසා අනික් භික්ෂූන්ට කැමති පරිදි වළඳන්නට කල් මදිවිය. ඒ දත් තථාගතයන් වහන්සේ 'යො පන භික්ඛු -පෙ- පාචිත්තියං' යී වදාළ සේක.

තවෙක දිනක් උපස්ථායක කුලයකින් උපනන්ද ශාක්‍ය පුත්‍රයන්ට පෙන්වා සඞ්ඝයාට පිළිගන්වන්ට යයි කැවුම් යැවූහ. උපනන්ද තෙරණුවෝ ද එවේලෙහි පිඩු පිණිස ගියාහ. තථාගතයන්වහන්සේගේ වචනයෙන් ඒ කැවුම් පිළිගෙණ එනතුරු සිටි නමුත් පස්වරුත් කුලයන්හි හැසිරෙන්නට ගොස් වේලාවට නො පැමිණියේ ය. සඞ්ඝයාට කැවුම් වළඳන්නට නොහැකි විය. ඒ නිමිත්ත කොට ගෙණ 'පච්ඡාභත්තංවා' යී අනුප්‍රඥප්තිය පැණවූහ. සෙසු අනුප්‍රඥප්තිය පළමු කී සේයි.

**අචෙලක වර්ගයෙහි ෂෂ්ඨ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

7. **අර්ථ**:- අගිලානෙන, නොගිලන්වූ; භික්ඛුනා; මහණහු විසින්; පුන පවාරණාය අඤ්ඤත්‍ර, නැවත (සිවුමසක්) පැවරීම හැර; නිච්චපවාරණාය අඤ්ඤත්‍ර, නිත්‍යයෙන් පැවරීම හැර; චාතුමාසප්පච්චය පවාරණා, සාරමසකට අයිති ප්‍රත්‍යයෙන් පැවරීම; සාදිතබ්බා, ඉවසිය යුතුයි. චෙ, ඉදින්; තතො උත්තරිං, ඉන් මත්තෙහි; සාදියෙය්‍ය, ඉවසා නම්; පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"චාතුමාසප්පච්චය පවාරණා"** යනු සාරමසක් මුලුල්ලෙහි ගිලානප්‍රත්‍යය පිළිගැණීම පිණිස කරණ ආරාධන යයි.

මේ සියල්ලම ශික්ෂාපද නිදන සංඛ්‍යාත වස්තූන්ගේ වශයෙන් ප්‍රකාශ කරණ ලදී. මහානාම ශාක්‍යයා විසින් සිවුමසක් බෙහෙතින් පවරණ ලදී. ඒ නිසා බුදුරජාණන් වහන්සේ මෙසේ අනුදත්සේකි.

චාතුමාසපච්චය පවාරණයක් හෝ වේවා, නැවත සාරමසකට ආරාධනය කිරීම් සංඛ්‍යාත පුනපවාරණයක් හෝ වේවා, සැමදම ගිලාන ප්‍රත්‍යය පිළිගන්නට යයි කරණු ලබන නිත්‍ය පවාරණයක් හෝ වේවා සියලුම ආරාධනා පිළිගත යුත්තාහුය. දන් මට රෝගයක් නැතැයි කිසිවෙකුටත් ප්‍රතික්ෂෙප නො කළැකි වේ. රොගයක් ඇති විටෙක දන්වන්නෙමියි කියා ඉවසිය යුතුයි.

සං:- **"තතො වෙ උත්තරිං සාදියෙය්‍ය"** යනු මෙපමණ රාත්‍රි ගණනක් ඇතුළතදී හෙවත් මෙපමණ කාලයක් ඉවසන්නට යයි රාත්‍රි පරිච්ඡෙදය කිරීමෙන් හෝ ගිතෙල් තලතෙල් ආදියෙන් මෙපමණ නැළි ගණනක් මෙපමණ ලාස් ගණනක් ඉවසන්නට යයි බෙහෙත්වල සීමාවක් කොට හෝ පවරතොත් එපමණම කාලයක් එපමණ බෙහෙත් ඉවසිය යුත්තාහ.

රාත්‍රි ගණනින් හෝ බෙහෙත් පමණින් හෝ වැඩිපුර විඤ්ඤපනය කරන්නාට ද, බෙහෙතකට නොව වෙනෙකකට බෙහෙත් ඉල්ලන්නාට ද; වෙනින් බෙහෙතක් කළ යුත්තෙහි වෙන බෙහෙතක් ඉල්ලන්නාට ද පචිති වේ.

## සප්තදශාකාරය

නිදානය - ශාක්‍ය දනව්වය.

පුද්ගලයෝ - ෂඩ්වර්ගීය භික්ෂූහුය.

වස්තුව - භෛෂජ්‍යයන් විඥාපණයයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය යි.

ආණත්තිය - අනාණත්තිකය යි.

ආපත්ති - තිකපාචිත්තිය යි.

(තතුත්තරි නොවුවක් තතුත්තරියයි සිතන්නාට ද, වෙමතිකයාට ද 'දුකුළා' වේ.

අනාපත්ති - තතුත්තරි නොවුවක් තතුත්තරි නොවේයයි සිතන්නාට ද, යම්කිසි බෙහෙත්වලින් පවරණ ලද නම් කරුණක් ඇති කල්හි එයින් අන්‍යවූ වැඩිපුර බෙහෙත් විඤ්ඤපනය කරන්නාට ද, යම් රාත්‍රිගණනක් පවරණ ලද නම් එය ඉක්ම ගිය කල්හිත් අවශ්‍ය කරුණකදී

යථාභූතාවික්ඛනය කොට ඉල්වන්නාට ද, නෑයන් විසින් හෝ පුද්ගලික පවාරණයෙන් හෝ අපරියන්ත පවාරණයෙන් හෝ අනුන් නිසා හෝ ස්වකීය ධනයෙන් හෝ විඥපනය කරන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් වේ.

අඞ්ග - සඞ්ඝපවාරණා, තතො භෙසජ්ජ විඤ්ඤත්ති, අගිලානතං පරියන්තාතික්කමො යී අඞ්ග සතරෙකි.

(සමුට්ඨානාදිය සඤ්චරිත්තයෙහි මෙනි)

---

## නිදාන කථාව

මහානාම ශාක්‍යතෙම සිවුමසක් බෙහෙතින් පැවරුවේය. භික්ෂූහු එය කුකුස් ඇත්තෝව නො ඉවසූහ. එකල්හි **"අනුජානාමි භික්ඛවෙ චාතුමාස පච්චය පවාරණං සාදියිතුන්ති"** අනුදත්හ.

අනතුරුව නැවතත් සාරමසක් පැවරුවේය. භික්ෂූහු පෙර සේම නො ඉවසූහ. එකල්හි **"අනුජානාමි භික්ඛවෙ පුන පවාරණම්පි සාදියිතුං" යි** අනුදත් සේක.

නැවතත් යාවජීව පවාරණය කෙළේය. හෙද නො ඉවසූහ. එකල්හි **"අනුජානාමි භික්ඛවෙ නිච්ච පවාරණම්පි සාදියිතුං"** යි අනුදත් සේක.

එකල්හි සවග මහණෝ මහානාම ශාක්‍යයන්ට නිඥකරවනු වස් ගිතෙල් ද්‍රොණයක් ඉල්ලූහ. එකල්හි ගාලෙන් (පිළියෙළ කරණ තැනින්) ගිතෙල් ගෙණෙන තුරු ඉවසන්නටයයි කී නමුත් ඒ නො ගිවිස්හ. දෙවනු තෙවනුත් එසේම කළහ. ඒ දත් තථාගතයන්වහන්සේ 'අගිලානෙන භික්ඛුනා -පෙ- පාචිත්තියං' යී අනුදන වදළ සේකි.

**අචෙලක වර්ගයෙහි සප්තම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

8. යො පන භික්ඛු උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා පාචිත්තියං.

---

**8. අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි, තථාරූපප්පච්චයා අඤ්ඤත්‍ර, සුදුසු කරුණක් නැතිව: උය්‍යුත්තං: යුධ පිණිස නික්මුනාවූ: සෙනං, සිවුරඟ සෙනඟක්: දස්සනාය, දකීමට: ගච්ඡෙය්‍ය, යේනම්: පාචිත්තියං, පචිති වේ.

**සං**:- 'උය්‍යුත්තං සෙනං' යනු කරණ ලද උයොාග ඇති හෙවත් යුධ පිණිස ගමන් නික්මුන චතුරඞ්ගිණී සේනාවයි හස්ති, අශ්ව, රථ, පත්ති යන සතර සේනාඞ්ගයෝයි. එක ඇතෙකුට පුරුෂයන් දෙළොස් දෙනා බැගින් වූවා හස්ති සෙනාවයි. එක අශ්වයෙකුට පරිවාර පුරුෂයන් තුන්දෙනා බැගින් ඇත්තී අශ්ව සේනාවය, එක රියකට පුරුෂයන් සතර දෙනා බැගින් ඇත්තී රථ සෙනාවයි. කඩුගත් පුරුෂයන් සතර දෙනා බැගින් ඇත්තී පත්ති සේනාවයි. මේ පශ්චිම කොටියෙන් චතුරඞ්ගිණී සෙනාවෙහි ප්‍රමාණයයි. මෙබඳු සෙනාවක් කියනු ලැබේ.

**සං**:- **"අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා"** යනු අත්‍යවශ්‍ය කරුණක් නැතුව සෙනාව දකීම පිණිස ම යන්නාවූ භික්ෂුවට පියවරක් පාසා දුකුළා වේ. දර්ශනොපචාරයේ සිටගණ බලන්නාට පචිති වේ. නැවත නැවත බලන්නාට ප්‍රයොගයක් පාසා පචිති වේ. මෙහි දර්ශනොපචාරය නම් තැනක සිට බලන්නාට සේනාව පෙණෙයි නම් ඒ ස්ථානයයි.

## සප්තදශාකාරය

නිදානය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - ෂඞ්වර්ගීය භික්ෂූහුය.

වස්තුව - සෙනාදර්ශනයයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි.

('අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා' යනු අනුප්‍රඥප්තියයි.)

ආණත්තිය - අනාණත්තිකයයි.

ආපත්ති - තිකපාචිත්තියයි.

හස්ත්‍යාදී සෙනාවලින් එක එක බලන්නට යාමෙන්ද; අනුයුක්ත සෙනාව උයුක්තයයි සිතන්නාට ද, වෙමතිකයාටද 'දුකුළා' වේ.

අනාපත්ති - අනුයුක්ත සංඥීහුට ද, ආරාමයට පැමිණි සෙනාව හා ඉදිරියට ආ සෙනාව බලන්නාට ද, සුදුසු කරුණකදී බලන්නාට ද, ආපදවන්හි බලන්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

අඞ්ග - උය්‍යුත්තසෙනං, දස්සනත්ථාය ගමනං, අනුඤ්ඤතොකාසතො අඤ්ඤත්‍ර දස්සනං, තථා රූපප්පච්චයස්ස ආපදය වා අභාවො යි අඞ්ග සතරෙකි.

(සමුට්ඨානාදිය එළක ලොමයෙහි මෙනි.) ලොකවද්‍යයයි අකුසල චිත්තයයි; ත්‍රිවෙදනායි.

---

# නිදාන කථාව

ෂඩ්වර්ගීය භික්ෂූහු යුදයට නික්මුණු සිවුරඟ සෙනඟ බලන්නට ගියාහුය. පසේනදී කොසොල් රජතෙම භික්ෂූන් දැක කුමක් සඳහා මෙහි පැමිණියාහුදැයි ඇසීය. රජතුමන් දැකීමට යයි කීහ. යුදයට නික්මුන මා දැකීමෙන් කිමද? දක්ක යුත්තෝ තථාගතයන් වහන්සේ නොවේදැයි කීය. භික්ෂූන්ට උජ්ඣායනා කරන්නට වූහ. ඒ දත් බුදුහු **"යො පන භික්ඛු උය්‍යුත්තං සෙනං= පෙ= පාචිත්තියං"** යි අනුදත් සේක.

එකල්හි එක්තරා භික්ෂුවකගේ මයිලණු කෙනෙක් යුද සෙනගෙයි ගිලන් විය. හෙතෙම ස්වකීය බෑනා වූ භික්ෂුව දකින්නට කැමති බැව් කියා වඩින ලෙස දූතයෙකු යැවීය. භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළකළ කල්හි **"අනුජානාමි භික්ඛවෙ තථාරූපප්පච්චයා සෙනං ගන්තුං"** යි වදරා පළමු ශික්ෂාපදය අනුප්‍රඥප්තියකින් යුක්ත කොට අනුදත් සේකි.

**අචෙලක වර්ගයෙහි අෂ්ටම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

9. සියා ච තස්ස භික්ඛුනො කොචිදෙව පච්චයො සෙනං ගමනාය දිරත්ත තිරත්තං තෙන භික්ඛුනා සෙනාය වසිතබ්බං තතො චෙ උත්තරිං වසෙය්‍ය පාචිත්තියං.

---

**9**. **අර්ථ**:- තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහට; සෙනං ගමනාය, සෙනාවට යාම පිණිස; කොචි එව පච්චයො, කිසියම් කටයුත්තක්; සියා ච, වන්නේ නම්; තෙන භික්ඛුනා, ඒ භික්ෂුව විසින්; දිරත්තතිරත්තං, දෙතුන් රැයක්; සෙනාය, සෙනාවෙහි; වසිතබ්බං, විසිය යුතුයි. චෙ, ඉදින්; තතො උත්තරිං, තුන් රැයකින් වැඩිය; වසෙය්‍ය, වෙසේ නම්; පාචිත්තියං පචිති වේ.

සං:- **"තතො චෙ උත්තරිං"** යනු හතරවෙනි දවසේ සූර්‍ය්‍යයා අස්තයට ගිය කල්හි යුද සෙනගෙහි සිවුඉරියාවෙන් එකකින් වත් යුක්තව සිටියත් සෑඩියෙන් යම්කිසි ඉරියව්වක් ගතකළත් ඒ භික්ෂුවට පචිතිය නොවැලකේ.

**සප්තදශාකාරය**

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - සවග භික්ෂූහුය.

වස්තුව - තුන්රැයකට වැඩිය සෙනාවෙහි විසීමය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි.

ආඥප්තිය - අනාඥප්තිකයයි.

ආපත්ති - තිකපාචිත්තියයි.
(තුන්රැයක් නොවූකලැ තුන් රැයකට වැඩියයි සිතන්නාට ද, වෙමතිකයාට ද 'දුකුළා' වේ.

අනාපත්ති - ඌනක සංඥ ඇත්තාට ද, තුන්වැනි රැයෙහි අරුණට පළමු එයින් නික්ම ගොස් නැවත විත් වසන්නාට ද, ගිලනාට ද, ගිලනෙක් නිසා සිටින්නාට ද, ප්‍රතිසෙනාව වැලකුනු කල්හි ද, කිසිකෙනෙකුන් විසින් ගමන වලකන ලද කල්හි ද, ආපදවත්හි ද, උන්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

අඩග - තිරත්තාතික්කමො, සෙනාය සුරියස්ස අත්ථඩගමො, ගිලානතාදීනං අභාවො, යී අඩග තුණෙකි.

(සමුට්ඨානාදිය එළකලොම සමුට්ඨානාදිය මෙනි.)

10. දිරත්තතිරත්තසෙඛ භික්ඛු සෙනාය වසමානො උය්‍යොධිකං වා බලග්ගං වා සෙනාබ්‍යුහං වා අණීකදස්සනං වා ගච්ඡෙය්‍ය පාචිත්තියං,

අචේලක වග්ගො පඤ්චමො.

---

# නිදන කථාව

ෂඩ්වර්ගීය භික්ෂූහු කරුණක් ඇති කල්හි යුදසෙනහට ගොස් තුන් රැයකට වඩා යුදසෙනගෙහි වෙසෙති. එවිට මනුෂ්‍යයෝ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ කෙසේ නම් සේනාවෙහි වෙසෙද්දැයි උජ්ඣායනා කළාහුය. ඒ බැව් දත් තථාගතයන් වහන්සේ මේ ශික්‍ෂාව අනුදත් සේක.

**අචේලක වර්ගයෙහි නවම ශික්‍ෂාපද වර්ණනාව නිමි.**

---

10. **අථ:-** වෙ, ඉදින්: දිරත්ත තිරත්තං, දෙතුන් රැයක්: වසමානො, වාසය කරන්නාවූ, භික්ඛු, මහණ තෙම: උය්‍යොධිකං වා, යුධකරණ තැනට හෝ: බලග්ගං වා, හටසෙනා ගණින තැනකට හෝ: සෙනාබ්‍යුහං වා, සෙනා සන්නිවෙසස්ථානයකට හෝ: අණීකදස්සනං වා. බල ඇණි දකීමට හෝ: ගච්ඡෙය්‍ය, යේ නම්: පාචිත්තියං, පචිති වේ.

**සං:-** **"උය්‍යොධිකං"** යනු (උපගන්ත්වා එත්ථ යුජ්ඣන්තීති: උය්‍යොධිකං, උ පූර්ව 'යුධ' සම්පහාරෙ, 'ණවු' ප්‍රත්‍යයයි.) සම්ප්‍රහාරස්ථානය හෙවත් යුධ භූමියයි.

**සං:-** **"බලග්ගං"** යනු (බලස්ස අග්ගං ජානන්ති එත්ථාති: බලග්ගං) මෙපමණ ඇත්තුය, මෙපමණ අශ්වයෝය, මෙපමණ රථය, මෙපමණ පත්තියයි බලයාගේ කොටස් ගණින ස්ථානයයි.

**සං:-** **"සෙනාබ්‍යුහං"** යනු (සෙනාය වියුහණං, සන්නි වෙසනං: සෙනබ්‍යුහො) මෙහි ඇත්තු ද, මෙහි අශ්වයෝ ද, මෙහි රිය ද, පාබල ද සිටිත්වායි සෙනග රැස්කොට තබන ස්ථානයයි.

**සං:-** **"අණීකදස්සනං"** යනු (අණීකස්ස දස්සනං: අණීක දස්සනං) සිවුරඟ සෙනග පළමු කීයේයි. එකී ලක්‍ෂණ වලින් යුත් ඇත්තු තිදෙනෙක් පශ්චිම වශයෙන් 'හත්ථාණීක' යයි. අස්සාණීක රථාණීක දෙකද මෙසේමැයි. ආයුධ ගත් අත් ඇති පුරුෂයෝ සතර දෙනෙක් 'පත්තාණීක' යයි. මෙකී අණීක සතරෙන් එකක්වත් දකින්නට යන භික්ෂුවට ඇවැත් වෙති හෙද පළමු ශික්‍ෂාවෙහි මෙනි. සපාදශාකාරයද එසේමැයි.

1. සුරාමෙරය පානෙ පාචිත්තියං.

---

# නිදාන කථාව

දෙතුන් රැයක් යුදසෙනගෙහි වසන්නාවූ සවග මහණෝ යුඬභූමියද, බල ගණිනා ස්ථානයද, සෙනග රැස්කොට තබන තැන ද, බලඇණි ද, බලනට ගියහ. ඒ දත් තථාගතයන් වහන්සේ මේ ශික්ෂා පදය අනුදත් සේකි.

**අචෙලක වර්‍ගයෙහි දශම ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

**පස්වැනි අචෙලක වගයි.**

---

**1. අර්‍ථ:-** සුරාමෙරය පානෙ, සුරා හා මෙරය බීමෙහි; පාචිත්තියං, පචිති වේ.

**සං:- "සුරාමෙරයපානෙ"** යි පිටි ආදියෙන් කරණ ලද (පෙරාපු) මද්‍යය 'සුරා' නම්. එය 'පිඨ්ඨසුර, පූවසුරා, ඔදනීයසුරා, කිණ්ණපක්ඛිත්තා, සම්භාරසංයුත්තා' යි පඤ්චවිධ වේ. පිටි භාජනයක බහා ප්‍රමාණවත් ජලය වත්කොට කලතා කරණ ලද්ද 'පිට්ඨසුරා' වයි. පූවසුරා ඔදනීය සුරා යනුද එසේම කරණ ලද්දෝ වෙති. සුරාබීජ (මණ්ඩි) බහා කරණ ලද්ද 'කිණ්ණපක්ඛිත්තා' නම්. ධාතකී (මයිලමල්) සාසපාදී නොයෙක් ද්‍රව්‍යයන් සංයොග කොට කරණ ලද්ද 'සංභාරසංයුත්තා' නම්. මල් ආදියෙන් කරණ ලද ආසවය 'මෙරය' යයි කියනු ලැබේ. එය 'පුප්ඵාසව, ඵලාසව, මධ්වාසව, ගුලාසව, සම්භාරසංයුත්තා' යි පඤ්චවිධ වේ.

මී, තල්, පොල් ආදීන්ගේ මල්රස ගෙන කීපදවසක් පල් කොට කරණ ලද්දේ පුප්ඵාසවයයි. කොස් ආදී ඵලයන්ගේ රස ගෙණ එසේම පල්කොට කරණ ලද්දේ 'ඵලාසවය' යි. මිදිරසය මධ්වාසවයයි. (සමන්ත පාසාදිකාවෙහි-මිදි ඵලාදිය මිරිකා ගත් රසය පල්කොට කරණ ලද්දේ 'ඵලාසව' යයි ද, මිදිවල ජාති රසයෙන් කරණ ලද්දේ 'මධ්වාසව' යයිද විස්තර කරති. එහිම මධ්වාසවය මක්ඛිකාවෙන්ද කරණු ලැබේයයි කියති.) උක්රස පල්කොට කරණ ලද්දේ 'ගුලාසව' යයි. අරළු නෙල්ලි ආදීන්ගේ රසය ගෙණ පල්කොට කරණ ලද්දෝ 'සම්භාර සංයුත්තා' නම්. සුරාමෙරය යන දෙකේ එකිනෙකට ඇති වෙනස ද්‍රව්‍ය සංයොග කොට මිරිකා පෙරා ගත්තේ සුරාවයි. එයම පල්කොට පෙරා ගත්තේ මෙරය යයි. මෙකී දෙවර්ගයම බීජයෙහි පටන් තෘණාග්‍රගත බිඳුවක් නමුත් පානය කරණ භික්ෂුවට ප්‍රයොගයක් පාසා පචිති වේ.

### සප්තදශාකාරය

නිදානය - කොසඹෑනුවරය.

පුද්ගලයා - සාගත තෙරණුවෝය.

වස්තුව - මද්‍යපානයයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි.

ආණත්ති - අනාණත්තිකයි.

(අමද්‍යයෙහි මද්‍යසංඥ ඇත්තාට ද, ඒ පිළිබඳ වෙමතිකයාට ද, දුකුලා වේ.)

ආනාපත්ති - අමද්‍ය සංඥ ඇත්තහුට ද, අමද්‍යවූ මද්‍ය වර්ණ ගන්ධ රස ලොණ සොවීරකයන් හෝ සුත්තයක් (ලොණ සොවීරක සුත්ත යන දෙකම බෙහෙතින් කළ ආසව විශෙෂයෝය) පානය කරන්නාට ද, මද්‍ය මිශ්‍රිත සූපාදිය අනුභව කිරීමෙහි ද, අරිෂ්ට පානය කරන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - මජ්ජභාවො, තස්ස පානං, යන දෙකයි.

(සමුට්ඨානාදිය එළකලොම සමුට්ඨානාදිය මෙනි.)

වද්‍ය - ලොකවද්‍යයයි.

චිත්තය - අකුශල චිත්තයයි.

වෙදනා - ත්‍රිවෙදනායි.

## නිදාන කථාව

භාග්‍යවතුන් වහන්සේ භද්දවතිකාවෙහි වැඩ වසද්දී සාගත ස්ථවිරයන් වහන්සේ අම්බතිත්ථ ජටිලයාගේ අසපුවේදී නාගයා සමග පධූපායනාදි වශයෙන් යුද්ධ කොට භද්දවතිකාවට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවරට වැඩි කල්හි සවග භික්ෂුහු කොසඹෑ නුවර උපාසකයන් ලවා ගෙන්වා ගෙණ 'කාපොතිකා' නැමැති මද්‍ය විශෙෂය

2. අඞ්ගුලි පතොදකෙ පාචිත්තියං.

---

පානය කළහ. සාගත තෙරණුවෝ ද මද්‍යපානය කොට නගර දෙරටුවෙහි වැටුනාහ. විහාරයට ගෙණවුත් තැබුවායින් පසු භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් අසුනට පයලා සිහි නැතිව හුන්හ. ඒ කරුණු කොට මේ ශික්ෂාපදය අනුදත් සේක.

**සුරාපාන වර්ගයෙහි ප්‍රථම ශික්ෂාපද වර්ණනාව නිමි.**

**2. අර්ථ:-** අඞ්ගුලි පතොදකෙ, ඇඟිල්ලෙන් ගිරිති කැවීමෙහි; පාචිත්තියං, පචිති වේ.

**සං:-** "**අඞ්ගුලි පතොදකෙ**" යනු පතුදනං සංඝට්ටනං; පතොදනං, "ප" පූර්ව තුද ව්‍යථනෙ-"ණවු", අඞ්ගුලීහි උපකච්ඡකාදීනං පතොදකං; අඞ්ගුලිපතොදකං "අක" ආදෙශයයි.) ඇඟිලි වලින් කිහිලි ආදියෙහි කිති කැවීමයි. යම්කිසි ශරීරාවයකින් ක්‍රීඩා වශයෙන් උපසම්පන්නයකු ස්පර්ශ කරන්නාට පචිති වේ. ක්‍රීඩා වශයෙන් භික්ෂුණියක් ස්පර්ශ කරණ මහණ හට දුකුළා වේ. භික්ෂුවක් ස්පර්ශ කරණ භික්ෂුණියටත් එසේ මැයි. මෙහිදී භික්ෂුණිය භික්ෂුවට ද, භික්ෂුව භික්ෂුණියට ද අනුප සම්පන්නයෙකු මෙනි.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීය භික්ෂුහුය. |
| වස්තුව | - | අඞ්ගුලිපතොදකයෙන් හසනය කරවීමයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය යි. |
| ආණත්තිය | - | අනාණත්තිකය යි. |
| ආපත්ති | - | තික පාචිත්තියයි. (අනුපසම්පන්නයන්ට කිති කැවීමෙන් තික දුක්කට යයි, කය පිළිබඳ කොතැනක කිති කැව්වත් "දුකුළා" ම වෙයි) |
| අනාපත්ති | - | ක්‍රීඩා පිණිස කිති නොකවන්නාට ද, කටයුත්තක් ඇති විට කය ස්පර්ශ කරන්නාට ද, උන්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ. |
| අඞ්ග | - | "හසාධිප්පායතා, උපසම්පන්නස්ස කායෙන කායාමසනා" යී අඞ්ග දෙකෙකි. |

(සමුට්ඨානාදිය පඨම පාරාජිකාවෙහි මෙනි.)

---

3. උදකෙ හස්සධම්මෙ පාචිත්තියං.

---

## නිදාන කථාව

ෂඩ්වර්ගීය භික්ෂූහු සප්ත රස වර්ගීය භික්ෂූන්ට අයත් භික්ෂුවක් අඞ්ගුලිපතොදනයෙන් (කිතිකැවීමෙන්) හසනය කර වූහ. ඒ භික්ෂුව එයින් උත්ත්‍රස්තව ආශ්වාස ප්‍රශ්වාස කරනට නො හැකි වූයේ මළේය. ඒ නිමිති කොට මේ ශික්ෂාව අනුදත් සේක.

**සුරාපාන වර්ගයෙහි ද්විතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

**3**. **අර්ථ**:- උදකෙ, දියෙහි; හස්සධම්මෙ, හාස්‍ය කිරීමෙහි (ක්‍රීඩා කිරීමෙහි) පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"උදකෙ හස්සධම්මෙ"** යනු ජල ක්‍රීඩාවයි. යම්කිසි භික්ෂුවක් ගොප්මසින් උඩ ජලයෙහි ක්‍රීඩා වශයෙන් ගැලෙයි ද, මතුවෙයි ද, පීනයි ද, ඔහුට ඒ සඳහා දියට බැසීමේදී පදවාර ගණනින් 'දුකුළා' වෙති. කිමිදීම් මතුවීමාදියෙහි ප්‍රයොග ගණනින් 'පචිති' ඇවැත් වෙති. දිය යටින් යන්නහුට හස්තවාර පදවාර ගණනින් ද, දිය මතුපිට පීනන්නාට ප්‍රයොගයක් පාසා ද 'පචිති' වෙති.

**සපත්‍රදශාකාරය**

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | සප්තරස වර්ගීය භික්ෂූහුය. |
| වස්තුව | - | ජලක්‍රීඩා කිරීමයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය යි. |
| ආණත්තිය | - | අනාණත්තිකය යි. |
| ආපත්ති | - | තික පාචිත්තිය යි. |

(ක්‍රීඩා පිණිස නොවූ වෙහි ක්‍රීඩාවට යයි සිතන්නාට ද, වෙමතිකයාට ද, නැව් (ඔරු) වලින් ගොස් ක්‍රීඩා කරන්නාට ද, අතින් හෝ පයින් හෝ කාෂ්ටයකින් හෝ කැඩ කැබලිති වලින් හෝ දියට ගසන්නාට ද, භාජන ගත ජලයක් හෝ කැඳ ආදිය හෝ මඩ හෝ විසි කිරීමෙන් ක්‍රීඩා කරන්නාට ද, දුකුළා වේ.) ජලයේ අතපීවත් වචන ලියන්නට වටී.

4. අනාදරියෙ පාචිත්තියං.

---

අනාපත්ති - ක්‍රීඩා අදහස් නැත්තාට ද, කටයුත්තක් ඇති විට නිමුජ්ජනාදිය කරන්නාට ද, පරතෙරට යන්නාට ද, ආපදවන්හි නිමුජ්ජනාදිය කරන්නාට ද, උන්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞග - උපරි ගොප්ඵකතා, හස්සාධිප්පායෙන කීළනං' යී අඞග දෙකෙකි.

(සමුට්ඨානාදිය පඨම පාරාජිකාවෙහි මෙනි.)

---

## නිදාන කථාව

සප්තරස වර්ගීය භික්ෂූන් අචිරවතියේ ජලක්‍රීඩා කරණ විට කොසොල් මහ රජතුමාට ඍඩකීය පහයට පෙණුනේය. ඒ බැව් තථාගතයන් වහන්සේට නොකියා දන්වන්නට උපායක් සිතා තථාගතයන් වහන්සේට පිළිගන්වන්නට කියා ලොකු ගුළ පිණ්ඩයක් ඒ භික්ෂූන් කැදවා දුන්නේය. එය ගෙණ ගොස් පිළිගැන්නූ විට තොරතුරු අසා කරුණු දනගෙණ මේ ශික්ෂාව අනුදත් සේක.

**සුරාපාන වර්ගයේ තෘතීය ශික්ෂාපද වණීනාව නිමි.**

---

4. **අථ**:- අනාදරියෙ, (සිකපදයෙන් අවවාද කළහුට හෝ ධර්‍මයට) අනාදර කිරීම නිමිත්ත කොට; පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"අනාදරියෙ"** යනු 'පුද්ගලානාදරිය' ධර්‍මනාදරිය' යයි දෙකෙකි. යම්කිසි මහණෙක් තෙම උපසපන් මහණෙකු විසින් ප්‍රඥප්ති ව්‍යතික්‍රමණයක් නිමිත්ත කොට අවවාද කරණු ලබන කල්හි මෙතෙම උක්ඛිත්තකයෙක, ගර්හිතයෙක මොහුගේ වචනය අදහන්නේ කවරෙක් දැයි අනාදර කෙරෙයි නම් ඒ 'පුද්ගලානාදරිය' යයි. එසේම යමෙක් ප්‍රඥප්තියකින් අවවාද කරණු ලබන කල්හි ඔය කථාව ටික කලකින් නැතිවේය; අතුරුදන් වේයයි එහි නොහික්මෙනු කැමැතිව කියයි නම් ඒ 'ධර්‍මනාදරිය' යයි. මෙකී ඩිප්‍රකාර අනාදරිය කරණ භික්ෂුවට ඒ නිසා 'පචිති' වේ.

**සප්තදශාකාරය**

නිදානය - සැවැත් නුවරය.

පුද්ගලයා - ඡන්න තෙරණුවෝය.

වස්තුව - අනාදරියකරණ වස්තුවය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියය.

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - තික පාචිත්තියය.

අනුපසම්පන්නයෙකු කෙරෙහි නම් තික දුක්කටයෙකි. එසේම උපසපනෙකු විසින් හෝ අනුපසම්පන්නයෙකු විසින් හෝ මේ සල්ලෙඛය පිණිස නොපවතීය යනාදීන් ප්‍රඥප්ති නොවූ වකින් ද කියනු ලබන කල්හි අනාදර කළහොත් දුකුළා වේ.

අනාපත්ති - පරම්පරාගත ආචායෙර්‍යාද්ග්‍රහණය ගෙණ **"එවං අම්හාකං ආචරියානං උග්ගහො පරිපුච්ඡා"** ති. මෙසේ කියන්නාට ද, උන්මත්තකාදීන්ට ද, ඇවැත් නැත්තේය.

අඞ්ග - උපසම්පන්න පඤ්ඤත්තෙන වචනං, අනාදරිය කරණං, කියා අඞ්ග දෙකෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදානයෙහි මෙනි.)
මෙහි දුක්ඛ වෙදනායි:

---

# නිදාන කථාව

ඡන්නායුෂ්මත් තෙම අනාචාරයෙහි හැසිරෙයි. එක්තරා භික්ෂුවක් මෙසේ නොකරවයි. ප්‍රඥප්ති අනුව කීයේය. එය අනාදර කොට නොපිළි ගත්තේය. ඒ නිසා බුදුහු මේ ශික්ෂාව අනුදැන වදළ සේක.

**සුරාපාන වර්ගයේ චතුර්ථ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

5. යො පන භික්ඛු, භික්ඛුං භිංසාපෙය්‍ය පාචිත්තියං.

---

**5. අථ:**- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; භික්ඛුං, මහණහු; භිංසාපෙය්‍ය, බියගැන්වී නම්; පාචිත්තියං, `පචිති` වේ.

**සං:**- **"භිංසාපෙය්‍ය"** යනු යම් කිසි උපසපන් භික්ෂුවක් තෙම උපසපනෙකු බිය කරණු කැමැත්තේ බිය ජනක රූප ශබ්දදියක් හෝ අම්හිරි ගන්ධරස ඵොට්ඨබ්බයන් හෝ උපසංහරණය කළහුට `පචිති` වේ.

### සප්තදශාකාරය

නිදනය - සැවැත් නුවරය.

පුද්ගලයෝ - ෂඩ්වර්ගීය භික්ෂූහුය.

වස්තුව - භිංසාපන වස්තුවය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය යි.

ආණත්තිය - අනාණත්තිකයයි.

ආපත්ති - තික පාචිත්තියයි.

`අනුපසම්පන්නයකු බිය කිරීමෙන් `තික දුක්කට` යයි.

අනාපත්ති - බිය කරණ අදහසක් නැත්තාහට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - උපසම්පන්නතා, තස්ස දස්සන සවන විසයෙ භිංසාපෙතු කාමතාය වායමන්තතා යී අඞ්ග දෙකෙකි.

(සමුට්ඨානාදිය අනතුරු ශික්ෂාවෙහි මෙනි.)

---

# නිදන කථාව

ෂඩ්වර්ගීය භික්ෂූහු සප්තරස වර්ගීය භික්ෂූන් බියකරවති. ඔහු එයින් රොදනය කෙරෙති. තෙපි කුමක් නිසා හඬන්නහු දැයි භික්ෂූන් විචාළ කල්හි ෂඩ්වර්ගීය භික්ෂූහු අප බිය කරවත් යයි කීහ. මේ කරුණ තථාගතයන් වහන්සේට සැළකල කල්හි මේ ශික්ෂාපදය අනුදන වදළ සේකි.

**සුරාපාන වර්ගයේ පස්වම ශික්ෂාපද වණ්නාව නිමි.**

---

6. යො පන භික්ඛු අගිලානො විසිබ්බනාපෙඛො ජොතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා පාචිත්තියං.

---

**6. අථ:-** යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: අගිලානො, නොගිලන් වූයේ: විසිබ්බනාපෙඛො, (සීත බැවින්) ගිනි තපිනු කැමැත්තේ: තථාරූපප්පච්චයා අඤ්ඤත්‍ර, එබඳු හේතුවක් නැතිව: ජොතිං, ගිනි: සමාදහෙය්‍ය වා, (තෙමේ) දල් වන්නේ නම් හෝ: සමාදහාපෙය්‍ය වා, (අනුන් ලවා) දල්වන්නේ නම් හෝ: පාචිත්තියං, `පචිති` වේ.

**සං:- "අගිලානො"** මෙහි `ගිලානයා` නම් ගිනි තැපීමෙන් සුවවෙන යම්කිසි රෝගයකින් පෙළෙන්නෙකි.

**සං:- "විසිබ්බනාපෙඛො"** යනු (විසීවයතෙති: විසීවනං, `වි` පුර්‍ව, සිවු, තප්පනෙ `යු` ප්‍රත්‍යයට අනාදෙශයයි. විසීවනං අපෙක්ඛති කාමෙතීති: විසීවනාපෙඛො, වකාරය ද්විත්ත වේ. වකාරද්වයයට බකාරද්වයයක් වෙති.) තපිනු කැමති වීමයි.

**සං:- "අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා"** යී. (සො රූපො එතස්සාති: තථාරූපො: තථාරූපො ච සො පච්චයො චාති: තථා රූපප්පච්චයො, තස්මා-) පහන් දල්වීමක් හෝ, පාත්‍රා පිසීමාදී ආවශ්‍යක කරුණක් හෝ නැතිව ගිනිදල්වීම නොවටී. යම්කිසි උපසපන් භික්ෂුවක් තමන්ම ගිනි දල්ලුව හොත් ගිනිපෙණෙලි (ලිපට) දමූ තැන් පටන් ගිනිදල් නගින තුරු සියලු ප්‍රයෝගයන්හි දුකුළා වෙති. ගිනිදල් නැගුනු කල්හි පචිති වෙති. අනුන් ලවා දල්වන්නහුට නියොගයෙන් දුකුළා වෙති. වරක් නියොග කිරීමෙන් කීපපලක දල්වුවත් ආණාපකයාට එක පචිතියෙකි.

**සප්තදශාකාරය**

නිදානය - භග්ග දනව්වෙහිය.

පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුය.

වස්තුව - ගිනි දල්වා විසීවනය කිරීමයි.

ප්‍රඥප්ති - සාධාරණ ප්‍රඥප්තියයි. `අගිලානො` යනු ද අඤ්ඤත්‍ර තථා රූපප්පච්චයා` යනු ද අනු ප්‍රඥප්තීහුය.)

ආණත්තිය - සාණත්තිකයි.

ආපත්ති - තිකපාචිත්තිය යි.
ගිලනා අගිලානයා යයි සිතන්නාට ද, වෙමතික යාට ද, ගිනිපෙණෙලි ඔසොවන්නාට ද, උස්සා නැවත දල්වෙන පිරිදි තබන්නාට ද, දුකුළා වෙති. දල්වන ලද්ද නැවත නැවත දල් වන්නාට පචිතිය ම වේ.

අනාපත්ති - ගිලාන සංඥ ඇත්තාට ද, වෙන කෙනෙකු විසින් කරණ ලද්දක් හෝ දිලිසෙන අඟුරු හෝ තපින්නාට ද, පහන් දල්වීමාදිය කරන්නහුට ද, සුදුසු කරුණකදී ගිනි දල් වන්නාට ද, ආපදවන්හි දල්වන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞග - අගිලානතා, අනුඤ්ඤත කාරණාභාවො, විසි-වෙතුකාමතා; සමාදහනන්ති යී අඞග සතරෙකි.

(සමුට්ඨානාදිය සඤ්චරිත්තයෙහි කීසේයි.)

---

## නිදාන කථාව

බොහෝ භික්ෂූහු හෙමන්ත කාලයේ දිරූ ගස් බිලයකට ගිනි දල්වා තැප්පාහුය. ඒ සුසිරයෙහි (බිලය තුළ) සිටි නාගයෙක් ගිනි දල්වීමෙන් කිපී පිටට අවුත් දඹ කෙළේය. ඒ දත් බුදුහු **"යො පන භික්ඛු විසිබ්බනාපෙඛො - පෙ - පාචිත්තියං"** යී අනුදත්හ.

එකල්හි භික්ෂූහු ගිලන් වූහ. ගිනි තැපීමෙන් ඔවුන්ගේ රෝග සුවවෙති. ප්‍රඥප්තිය නිසා එසේ නොකරති. ඒ දත් තථාගතයන් වහන්සේ **"අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා ජොතිං සමාදහිත්වා වා විසිබ්බෙතුං"** යී අනුදත් සේක.

එකල්හි භික්ෂූහු පහන් දල්වීමටත් පාත්‍ර පචනාදිය සඳහා ගිනි දල්වීමට ජන්තාඝරයේ ගිනි දල්වීමටත් සැක ඉපදවූහ. ඒ දත් බුදුහු **"අනුජානාමි භික්ඛවේ තථාරූපප්පච්චයා ජොතිං සමාදහිතුං"** යී වදරා 'යො පන භික්ඛු - පෙ - පාචිත්තියං' යි අනුදැන වදළ සේකි.

**සුරාපාන වර්ගයෙහි ෂෂ්ඨ ශික්ෂාපද වණ්ණනාව නිමි.**

---

7. යො පන භික්ඛු ඔරෙනද්ධමාසං නහායෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං; තත්‍ථා'යං සමයො, දියඩ්ඪො මාසො සෙසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍ය මාසා උණ්හ සමයො පරිළාහ සමයො ගිලාන සමයො කම්ම සමයො අද්ධාන ගමන සමයො වාතවුට්ඨි සමයො, වාතවුට්ඨි සමයො, අයං තත්‍ථ සමයො.

---

**7. අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; අද්ධමාසං ඔරෙන, අඩ් මාසයකින් මෑත; සමයා අඤ්ඤත්‍ර; ස්නාන කාලය හැර; නහායෙය්‍ය, ස්නානය කළේ නම්, පාචිත්තියං, පචිති වේ. තත්‍ථ, එහි; අයං, මේ; සමයො, කාලයයි; ගිම්හානං, ග්‍රීෂ්ම සාරමාසයන් අතුරෙන්; දියඩ්ඪො මාසො, එක්මස් පසළොස් දවසක්; සෙසො, ඉතිරි වූ කාලය ද; වස්සානස්ස, වර්ෂා ඍතුවෙහි; පඨමො මාසො, පළමු වැනි මාසය දයි; ඉති, මෙසේ; එතෙ අඩ්ඪතෙය්‍ය මාසා, මේ දෙමස් දෙපෝයක් (දෙමස් පසළොස් දිනක්); උණ්හසමයො, උෂ්ණ කාලය; පරිළාහ සමයො, දාහ ඇති කාලය; ගිලානසමයො, ගිලන් කාලය, කම්ම සමයො කර්මාන්ත කාලය; අද්ධාන ගමන සමයො, දීර්ඝ මාර්ගයේ ගමන් කරණ කාලය; වාතවුට්ඨි සමයො, වාත යෙන් (සුළඟින්) යුක්ත වූ වැස්ස ඇති කාලය; (යන) අයං, මේ; තත්‍ථ, එහි; සමයො, කාලයයි.

සං:- **"නහායෙය්‍ය"** යනු මධ්‍යම දෙශයෙහි යම් කිසි භික්ෂුවක් තෙම ස්නානය කළ දවසේ සිට අඩ් මාසයක් ගත වෙන්ට කලින් අනුදන්නා ලද සමයන්හි හැර ස්නානය කරන්නෙමියි ඇඟෙහි ගෑම පිණිස යම්කිසි සුණු වර්ගයක් හෝ මැටි ආදියක් හෝ පිළියෙළ කරගණී නම්, ඒ අතර හැම පියොවකින් ම 'දුකුළාව' බැගින් වේ. නහා සමාප්ත කිරීම සමග ම පචිතිය වේ.

සං:- ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම එක්මස් පසළොස් දවස 'උණ්හසමය' නම්. වර්ෂා ඍතුවෙහි ප්‍රථම මාසය 'පරිළාහ සමය' නම්. යම් රෝගයක් වතුර නොනෑමෙන් සුව නොවෙයි නම්, ඒ රොගයෙන් පෙළෙන භික්ෂුවට කැමති දවසක නාන්නට හැකිවේ. මේ 'ගිලාන සමය' යයි. යටත් පිරිසෙයින් පිරිවෙණ හැමදීම ද කර්මාන්තයෙකි. (වැඩකි) එබඳු අවස්ථාවකදී නාන්නට වටනේය. මේ 'කම්මසමය' නම්. යොදුන් බාගයක්වත් දුර ගමනක් යන්නට අදහස් ඇත්තාටද, එපමණ දුර ගමනක් යමින් සිටින තැනැත්තාට ද එපමණ දුර ගිය තැනැත්තාට ද නාන්නට වටනේය. මේ 'අද්ධානගමන සමය' ය යි.

සුලහින් දූවිලි තැවරුණා වූ යම්කිසි භික්ෂුවකගේ කයෙහි වතුර බිඳු දෙකක් තුණක් වැටුනොත් නාන්නට වටී. මේ 'වාතවුට්ඨිසමය' යයි. මෙය ප්‍රාදේශික ප්‍රඥප්තියක් බැවින් මධ්‍යමදෙශයේ භික්ෂූන්ට පමණක් සීමා වූවකි.

**සප්තදශාකාරය**

නිදානය - රජගහනුවරය.

පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුය.

වස්තුව - පමණ නොදන නැමය. (මෙහි අනුප්‍රඥප්තිසයෙකි)

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි.

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - තිකපාචිත්තියය. (අඩමසකට වැඩිවූ කල්හි අඩු යයි සිතන්නාට ද, වෙමතිකයාට ද දුකුළා වේ.)

අනාපත්ති - අතිරෙක සංඥීහුට ද, සමයෙහි නාන්නාට ද, වියලි නදියෙහි කතාවාටයෙහි නාන්නාට ද, ප්‍රත්‍යන්ත ජනපදයේ සියල්ලන්ට ද, ආපදවන්හි ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

අඩ්ග - මජ්ඣිමදෙසො, ඌනඩමාසෙන නහානං, සමයානං වා නදී පාර ගමනස්ස වා ආපදනං වා අභාවො, යී අඩ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය එළකලොමයේ කීසේයි.)

# නිදාන කථාව

එක් දවසක් භික්ෂූහු තපොදයෙහි ස්නානය කෙරෙති. බිම්බිසාර රජ තෙමේ ද නාන්නට එහි ගියේය. භික්ෂූහු අන්ධකාර වනතුරු නැවාහුය. රජතෙම විකාලයෙහි නහා දෙර වැසු බැවින් නගරයෙන් පිටත වාසය කොට අසම්භින්න විලෙපනයෙන් යුක්තව ගොස් බුදුන් වැඳ සිට මෙකරුණ සැළකෙළේය. එකලැ බුදුහු **"යො පන භික්ඛු ඔරෙනඩ්මාසං නහායෙය්‍ය පාචිත්තියං"** යී අනුදත්හ.

8. නවං පන භික්ඛුනා චීවරලාභෙන තිණ්ණං දුබ්බණ්ණ කරණානං අඤ්ඤතරං දුබ්බණ්ණ කරණං ආදාතබ්බං නීලං වා කද්දමං වා කාළසාමං වා, අනාද වෙ භික්ඛු තිණ්ණං දුබ්බණ්ණ කරණානං අඤ්ඤතරං දුබ්බණ්ණ කරණං නවං චීවරං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං.

---

එකලැ භික්ෂූහු උෂ්ණ කාලයෙහිත් පරිදහකාලයෙහිත් කුකුස් කොට නොනා දඩියෙන් සෙනසුන් කිළිටු කළහ. එකලැ **"අනුජානාමි භික්ඛවෙ උණ්හ සමයෙ ඔරෙනඩමාසං නහායිතුං"** යී අනුදත්හ.

එකල්හි භික්ෂූහු නවකර්මාන්ත කොට නොනා සිවුරු සහ සෙනසුන් දඩියෙන් කිළිටු කළහ. එකලැ **"අනුජානාමි භික්ඛවෙ කම්ම සමයෙ ඔරනඩ මාසං නහායිතුං"** යී අනුදත්හ.

එකල්හි දීඝ ගමනක් ගොස් නොනා දඩියෙන් සිවුරුත් සෙනසුනුත් කිළිටු කළහ. **"අනුජානාමි භික්ඛවෙ අඩාන ගමන සමයෙ ඔරෙනඩමාසං නහායිතුං"** යී අනුදත්හ.

නැවත ගිලන් භික්ෂූන් සඳහා **"අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා ඔරෙනඩමාසං නහායිතුං"** යී අනුදත්හ.

නැවත වාතවුට්ඨිසමයේ චීවර කරණ භික්ෂූන් සඳහා **"අනුජානාමි භික්ඛවෙ වාතවුට්ඨි සමයෙ ඔරෙනඩමාසං නහායිතුං"** යී අනුදත්හ.

**සුරාපාන වර්ගයේ සප්තම ශික්ෂාපද වර්ණනාව නිමි**.

---

8. **අර්ථ**:- නවං චීවරලාභෙන, අලුත් සිවුරු ලැබුවාවූ: භික්ඛුනා පන, භික්ෂුව විසින් වනාහි: නීලං වා, නිලක් හෝ: කද්දමං වා, මඩ පාටක් හෝ: කාළසමං වා, කාළසෳාම පාටක් හෝ: තිණ්ණං දුබ්බණ්ණ කාරණානං, (මෙකී) ත්‍රිවිධ දුර්වර්ණ කරණයන් අතුරෙන්: අඤ්ඤතරං දුබ්බණ්ණ කරණං, එක්තරා දුර්වර්ණ කිරීමක්: ආදාතබ්බං, ගතයුතුයි.

වෙ, ඉදින්: තිණ්ණං දුබ්බණ්ණ කරණානං, තුන් දුර්වර්ණ කරණයන් අතුරෙන්: අඤ්ඤතරං දුබ්බණ්ණ කරණං, එක්තරා දුර්වර්ණ කිරීමක්: අනාද, නොගෙණ: නවං චීවරං, අලුත් සිවුරක්: පරිභුඤ්ජෙය්‍ය, පරිභොග (-පෙරවීම) කෙරේ නම්: පාචිත්තියං, පචිති වේ.

සං:- "නවං චීවර ලාභෙන" (නවං ච තං චීවරං චාති: නවං චීවරං; නිග්ගහීතය ලොප් නොවීමයි.) මෙහි "පන භික්ඛුනා" යන පද දෙකක් අතර ඇතත් අර්ථවශයෙන් සම්බන්ධ හෙයින් සමාස වේයයි වෙයාාකරණඥයෝ කියති. අලභීති; ලභො; ලභො එව; ලාභො, ස්වාර්ථයෙහි "ණ" ප්‍රත්‍යයයි. නවං චීවරං ලාභො එතෙනාති: නවං චීවර ලාභො: තෙන=) නව චීවර ලාභය නම්-හඳින්ට පොරවන්ට සුදුසුවූ අලුත් සිවුරක් ලැබීමය.

සං:- "තිණ්ණං දුබ්බණ්ණ කරණානං" (දුට්ඨුවණ්ණං; දුබ්බණ්ණං, දුබ්බණ්ණං කරොන්තීති; දුබ්බණ්ණ කරණානි) දුර්වර්ණ කරණ තුනෙකි: නිල්පාට-මඩපාට-කාළසාාම පාට යන තුණය. මේ කී පාට තුනෙන් එකකින් සිවුර දුර්වර්ණ කිරීම නම් කප්බින්දුව තැබීමයි. මෙය සිවුර මාරු නොවීම පිණිසය.

හඳින්නට පොරවන්නට පොහෝනා අලුත් සිවුරක් ලැබුවාවූ භික්ෂුව විසින් මෙහි කී පාට (වර්ණ තුනෙන් එකකින් වෙනෙකකට මාරුනොවීම පිණිස මොනර ඇස් මඩලක් පමණවූ හෝ මකුණු පිටක් පමණ වූ හෝ කප්බින්දුවක් තැබිය යුතුයි. මෙය සිවුර පඩු පොවා නිමකොට කොන් හතරෙහි හෝ තුනෙහි හෝ දෙකක හෝ එකක හෝ කළ හැකිවේ. කප්බින්දුව නොතබා අලුත් සිවුරක් පොරවන අඳින භික්ෂුවට පචිතියක් වන බැව් මෙයින් කියන ලදි.

### සප්තදශාකාරය

නිදානය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුය.

වස්තුව - ස්වකීය සිවුරු නො හැඳිනීමය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්තිය - තිකපාචිත්තියය. (ආදින්නයෙහි අනාදින්න යයි සිතන්නාට ද, වෙමතිකයාට ද දුකුළා වේ.)

අනාපත්ති - ආදින්න සංඥීහුට ද, කප්බින්දුව මැකීගිය කල්හි ද, කප්පකතස්ථානය දිරුණු කල්හි ද, කප්පකතයක් සමග අකප්පකතයක් මැසූ කල්හි ද, පසුව අග්ගලාදිය ඇල්ලූ කල්හි ද, පරිභොගකරන්නහුට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නැතිවේ.

9. යො පන භික්ඛු භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරස්ස වා සාමණෙරියා වා සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියං.

---

අඞ්ග - 'වුත්තප්පකාරස්ස චීවරස්ස අකතකප්පතා' න නට්ඨ චීවරාදිතා, නිවාසනං වා පාරුපනං වාති'යී අඞ්ග තුනෙකි.

(සමුට්ඨානාදිය එළක ලොමයේ කීසේයි.)
මෙහි 'ක්‍රියා 'ක්‍රියා' විසිති.

---

# නිදාන කථාව

බොහෝ භික්ෂූන්වහන්සේත් පිරිවැජියෝත් සාකෙත නුවරින් සැවැත් නුවර යන්නට අදත්මගට පිළිපත්හ. මගදී සොරු සිවුරු ආදිය පැහැර ගත්හ. සැවැත් නුවර රාජපුරුෂයෝ බඩු සහිත සොරුන් අල්ලාගෙණ තමතමන්ගේ සිවුරු ගෙනයන්ට යයි භික්ෂූන්ට පණිවුඩයක් යැවූහ. එහෙත් භික්ෂූහු සිවුරු නො හඳුනති. එය කරුණු කොට මේ ශික්ෂාව අනුදත්සේක.

**සුරාපාන වර්ගයෙහි අෂ්ඨම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

**9**. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; භික්ඛුස්ස වා, භික්ෂුවකට හෝ; භික්ඛුනියා වා. මෙහෙණකට හෝ සික්ඛමානාය වා ශික්ෂමානාවකට හෝ; සාමණෙරස්ස වා, සාමණෙරයෙකුට හෝ; සාමණෙරියා වා, සාමණෙරියකට හෝ; සාමං, තෙමේ; චීවරං, සිවුරක්; විකප්පෙත්වා, විකල්පනය කොට; අපච්චුද්ධාරකං, පච්චුද්ධරණය නො කොට; පරිභුඤ්ජෙය්‍ය, වැළඳ ගණී නම්; පාචිත්තියං, පචිති වේ.

සං:-**"විකපෙත්වා"** මෙහි විකල්පනය නම් සම්මුඛ (-ඉදිරි) යෙහිදී විකල්පනය පරම්මුඛයෙහි දී (පිට දී) විකල්පන යයි දෙපරිද්දකින් වේ. සිවුරු පිළිබඳ ඒක බහු භාවය හා සන්නිහිතා 'සන්නිහිත භාවය සළකා සුදුසු පරිද්දෙන් විකල්පනය කටයුතුයි.

මෙසේ පඤ්ච සහධාර්මිකයන් අතුරෙන් කෙනෙකුට විකල්පනය කොට ඔවුන් විසින් පච්චුද්ධරණය නොකරණ ලද්දක් පරිභොග කරන්නහුට පචිති වේ.

**සප්තදශාකාරය**

නිදානය - සැවැත්නුවරය.

පුද්ගලයා - උපනන්ද තෙරණුවෝය.

වස්තුව - අපච්චුද්ධාරක වස්තුවය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්තිය - තිකපාචිත්තිය ය.

(අපච්චුද්ධරණය නොකරණ ලද්දක් අධිෂ්ඨාන කරන්නාට ද, විස්සජ්ජනය කරන්නාට ද, වෙමතිකයාට ද, දුකුළා වේ.

අනාපත්ති - (පච්චුද්ධාරක සංඥ ඇත්තාට ද, විශ්වාසයෙන් පරිභොග කරන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - සාමං විකප්පිතස්ස අපච්චුද්ධාරො, විකප්පනුපග චීවරතා, පරිභොගොති, අඞ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය පඨම කඨිනයෙහි කීසේයි.)

මෙහි ක්‍රියා'ක්‍රියා, විසිනි.

---

# නිදාන කථාව

ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙමේ සහෝදරයාගේ සද්ධිවිහාරික භික්ෂුවක්හට තෙමේම සිවුරක්දී ඔහු විසින් පච්චුද්ධරණය නො කරණ ලදින් පරිභොග කෙළේය. සෙසු භික්ෂූහු මෙකරුණ තථාගතයන් වහන්සේට සැළ කළහ. එකල්හි මේ ශික්ෂාපදය අනුදූන වදළ සේක.

**සුරාපාන වර්ගයෙහි නවම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

10. යො පන භික්ඛු භික්ඛුස්ස පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙය්‍ය වා අපනිධාපෙය්‍ය වා අන්තමසො හස්සාපෙක්ඛොපි පාචිත්තියං.

සුරාපාන වග්ගො ඡට්ඨො.

---

10. **අථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: භික්ඛුස්ස, භික්ෂුවකගේ: පත්තං වා, පාත්‍රයක් හෝ: චීවරං වා, සිවුරක් හෝ: නිසීදනං වා, නිසීදනයක් හෝ: කායබන්ධනං වා, කා බහනක් (-පටිය) හෝ: අන්තමසො, යටත් පිරිසෙයින්: හස්සාපෙක්ඛො අපි, කෙළි කැමැතිව ද: අපනිධෙය්‍ය වා (තෙමේ) සැඟවූයේ නම් හෝ: අපනිධාපෙය්‍ය වා, අනුන් ලවා සැඟවූයේ නම් හෝ: පාචිත්තියං, පචිති වේ.

ඡට්ඨො, සැවැනි වූ සුරාපානවග්ගො, සුරාපානවගයි.

**සං**- මෙහි ˙පාත්‍රය˙ නම් අධිට්ඨානයට සුදුසු වූ අයොමයවූ හෝ මෘන්මයවූ හෝ පාත්‍රයෙකි. ˙චීවරය˙ නම් විකල්පනයට පොහෝනා සිවුරකි. ˙සූචිඝරය˙ නම් ඉදිකටු සහිත වූ හෝ රහිතවූ කුලාවකි. ˙කායබන්ධනය˙ නම් පට්ටිකා, සූකරන්ත, යන දෙයාකාර පටිවලින් එකෙකි.

මෙකී පාත්‍රාදියෙන් කිසිවක් ක්‍රීඩා වශයෙන්වත් සැඟවූවත් අනුන්ට කියා සැඟවවූවත් පචිති වේ.

## සප්තදශාකාරය

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - ෂඩ්වර්ගීය භික්ෂූහුය.

වස්තුව - අපනිධාපන වස්තුවය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියය.

ආණත්ති - සාණත්තිකය.

ආපත්ති - තිකපාචිත්තියය. (සාමණෙරයෙකුගේ පාත්‍රාදිය සැඟවූව හොත් තිකදුක්කටයෙකි. උක්තප්‍රකාර පාත්‍රාදිය හැර සෙසු පිරිකරක් උපසම්පන්නයෙකුගේ හෝ වේවා අනුපසම්පන්නයෙකුගේ හෝ වේවා සඟවන්නාට දුකුළා වේ.)

1. යො පන භික්ඛු සංචිච්ච පාණං ජීවිතා ඔරොපෙය්‍ය පාචිත්තියං.

---

අනාපත්ති - දුර්නික්ෂිප්තයක් ප්‍රවේසම් පිණිස තබන්නාට ද, ධර්මකථාවක් කොට පසුව දෙන්නෙමියි පටි සාමනය කරන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - උපසම්පන්නස්ස සන්තකානං පත්තාදිනං අපනිධානං, විහෙසෙතු කාමතා වා හස්සාධිප්පායතා වාති, අඞ්ග දෙකෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදනයෙහි මෙනි.)

---

# නිදාන කථාව

ෂඩ්වර්ගිය භික්ෂූහු සප්තරස වර්ගීය භික්ෂූන්ගේ පාත්‍රචීවරාදිය සැඟවූහ. ඇවැත්නී අපගේ පාත්‍ර චීවරාදිය දෙව්යයි කී කල්හි ඔහු සිනා පහළ කළහ. ඒ භික්ෂූහු ඇඬූහ. මෙකරුණ දත් බුදුහු මේ ශික්ෂාපදය පැණවූහ.

**සුරාපාන වර්ගයෙහි දශම ශික්ෂාපද වර්ණනා නිමි.**
**සවෙනි සුරාපාන වගයි.**

---

1. **අර්ථ:-** යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: සංචිච්ච, (මොහු මරම්යි) දැන දැන, පාණං, (තිරිසන්ගිය) සතකු: ජීවිතා, ජීවිතයෙන්: ඔරොපෙය්‍ය, තොර කළේ නම්: පාචිත්තියං, පචිති වේ.

**සං:-** **"පාණං"** මෙහින් තිරිසන් ගත සතෙක් කියනු ලැබේ. තිරිසන් ගත සතා කුඩා වුවත් මහත්වුවත් මරණ භික්ෂුවට පචිති වේ. යටත් පිරිසෙයින් මකුණු බිජයක්වත් ප්‍රාණ සංඥා ඇතිව බිඳ දමා විනාශ කෙරෙයි ද ඔහුට පචිති වේ. මහත් සතෙක් මරණ කල ඒ සඳහා යොදන උපක්‍රම මහත් බැවින් අකුශලය ද මහත් වේ.

බොහෝ වාර ගණනක් පැවති ජවන් සිත්වලින් ලබන ලද ආසෙවන ප්‍රත්‍යය ඇති සන්නිට්ඨාපක චෙතනාවගේ වශයෙන් ප්‍රයොගයාගේ මහත් බැවින් අකුශලය ද මහත් වේයයි ද මහාසාවද්‍ය වේයයි ද (ටීකාවෙහි) කීහු.

2. යො පන භික්ඛු ජානං සපපාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියං.

---

**සප්තදශාකාරය**

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයා - උදයී තෙරය.

වස්තුව - ප්‍රාණියකු ජීවිතයෙන් තොර කිරීමය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය.

ආණත්තිය - සාණත්තිකය.

ආපත්ති - තිකපාචිත්තිය.

ප්‍රාණියෙකු කෙරෙහි වෙමතිකයාට ද, ප්‍රණීනුවූවෙක්හි ප්‍රාණ සංඥ ඇත්තාට ද වෙමතික යාට ද දුකුළා වේ.

අනාපත්ති - ප්‍රාණයක් නොවේයයි සිතන්නාට ද, නො දන්නාහට ද, මරණ අදහස් නැත්තාට ද, උම්මත්තකාදීන්හට ද, ඇවැත් නොවේ.

(සෙසු විස්තර මනුස්ස විග්‍රහ පරිජියෙහි කීසේයි.)

---

# නිදාන කථාව

ආයුෂ්මත් උදයී ස්ථවිරයන්වහන්සේ ඉස්සාසයෙක් (ගිහි කාලයේ ධනුර්ග්‍රහාචාර්‍ය්‍යයෙක්) වූහ. උන්වහන්සේට කවුඩෝ ද අමනාප වෙති. ඒ නිසා කපුටන් මර මරා හිස් කපා ගෙණවුත් පිළිවෙලට හුලෙහි තබති. මේ දුටු සෙසු භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සැළකළාහුය. එකල්හි මේ ශික්ෂාව අනුදත් සේක.

**සප්පාණක වර්‍ගයේ ප්‍රථම ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

---

2. **අර්‍ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; ජානං දන දන, සප්පාණකං, පණුවන් සහිත; උදකං, ජලය, පරිභුඤ්ජෙය්‍ය, පරිභොග කෙළේ නම්; පාචිත්තියං, පාචිති වේ.

**සං**:- **"සප්පාණකං"** (සහ පාණකෙහි පවත්තතීති, සප්පාණකං) පරිභොග කිරීමෙන් මැරෙන පණුවන් සහිත ජලය සප්පාණක ජලයයි. එබඳු ජලය මෙහි ක්‍ෂුද්‍රප්‍රාණීන් ඇතැයි දන දනත් පානය කිරීමාදියෙන් පරිභොග කරණ භික්ෂුවට පියොවක් පාසා පචිති වෙති.

3. යො පන භික්ඛු, ජානං යථා ධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කොටෙය්‍ය පාචිත්තියං.

---

**සප්තදශාකාරය**

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - සවග මහණෝයි.

වස්තුව - දැන දැන පණුවන් සහිත ජලය පරිභොග කිරීමය.

**සෙසු විස්තර සිංචන ශික්ෂාපදයෙහි කීසේයි**.

---

# නිදන කථාව

ෂඩ්වර්ගීය භික්ෂූහු දැන දැන පණුවන් සහිත ජලය පරිභොග කෙරෙති. ඒ බැවි භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට සැළකළාහුය. බුදුන් වහන්සේ එය නිමිත්තකොට ගෙණ මේ ශික්ෂාපදය අනුදත් සේකි.

**සප්පාණක වර්ගයෙහි ද්විතීය ශික්ෂාපද වර්‍ණනාව නිමි**.

---

3. **අර්‍ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; ජානං, දැන දැන; යථා ධම්මං, ධර්‍මය වූ පරිද්දෙන්; නිහතාධිකරණං, සමාප්ත (කෙළවර) කරණලද අධිකරණයක්; පුන, නැවත; කම්මාය, කර්‍මය පිණිස; උක්කොටෙය්‍ය, උගුළුවා නම්; පාචිත්තියං පචිති වේ.

**සං**:- **"යථා ධම්මං"** (යො යො ධම්මො; යථාධම්මං; 'යථා ධම්මො' යි කියයුතු වුවද 'අං' ආදෙශව 'යථධම්මං යී සිඩය) යම්කිසි අධිකරණයක් ව්‍යපසමනයට දෙශිත ධර්‍ම නීතිය යථා ධර්‍මයයි.

**සං**:- **"නිහතාධිකරණං"** (නිහතං වූපසමිතං අධිකරණං; නිහතාධිකරණං) සමථක්ඛන්ධකයෙහි කියන ලද ක්‍රමයෙන්ම ව්‍යපසමනය කරණ අයුරු අධිකරණ සමථයන්හිදීම කියවේ.

**සං**:- **"උක්කොටෙය්‍ය"** යනු උච්චාලනය (උගුළුවීම්) යි. යම්කිසි අධිකරණයක් ධර්‍ම නීතියෙන් ව්‍යපසමනය කළ කල්හි ඒ ඒ භික්ෂූන් සමීපයට ගොස් **"අකතං කම්මං දුක්කතං කම්මං පුන කාතබ්බං කම්මං අනිහතං දුන්නිහතං පුනනිහරිතබ්බන්ති"** යි මෙසේ කියමින් නැවත විසඳීම් පිණිස ඉදිරියට ඇද ගත්තොත් ඒ භික්ෂුවට පචිති වේ. සමථක්ඛන්ධක යෙහි කී පරිදි ධර්‍මයෙන් යම් අධිකරණයක් සංසිඳුවන ලද නම් එය ධාර්‍මික විනිශ්චයකි.

**සප්තදශාකාරය**

නිදානය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - ෂඩ්වර්ගීය භික්ෂූහුය.

වස්තුව - උක්කොටනය කිරීමය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියය.

ආණත්ති - අනාණත්තිකය (ධර්ම කර්මයෙහි වෙමතිකයාට ද, අධර්ම කර්මයෙහි ධර්ම කර්ම සංඥා ඇත්තහුට ද, වෙමතිකයාට ද දුකුළා වේ.)

අනාපත්ති - දෙකර්මයෙහි ම අධර්ම කර්ම සංඥා ඇත්තාට ද, අධර්මයෙන් හෝ වර්ගවීමෙන් හෝ කර්මාර්හ නො වූවෙකුට කර්මය කරණ ලදයි දන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - යථාධම්මං නිහතභාවො, ජානනතා, උක්කොටනාති අඞ්ග තුනෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදානයෙහි මෙනි.)

මෙහි දුක්ඛ වෙදනාවයි.

---

# නිදාන කථාව

ෂඩ්වර්ගීය භික්ෂූහු ධර්මය වූ පරිද්දෙන් සංසිඳුවන ලද අධිකරණයක් නැවත විනිශ්චය කිරීමට උක්කොටනය කෙරෙති. ඒ බැව් දත් තථාගතයන් වහන්සේ මේ ශික්ෂාව අනුදත් සේකි.

**සප්පාණක වර්ගයෙහි තෘතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

4. යො පන භික්ඛු භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙය්‍ය පාචිත්තියං.

---

4. **අර්ථ**:- යො පන, භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; භික්ඛුස්ස, භික්ෂුවක්හුගේ; දුට්ඨුල්ලං ආපත්තිං, සඞ්ඝාදිසෙසාපත්තියක්; ජානං, දැන දැන; පටිච්ඡාදෙය්‍ය, වැසුයේ නම්; පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"දුට්ඨුල්ලං ආපත්තිං"** යනු සඞ්ඝාදිසෙසා පත්තියයි. භික්ෂුවක් සම්බන්ධී සඞ්ඝාදිසෙසා පත්තියක් යම්කිසි ක්‍රමයකින් දැනගෙණ අනිකෙකුට දැනගන්නට නොලැබෙන පරිදි සඟවයි නම් පචිති වේ. මෙය කිසිවෙකුට නො දන්වන්නෙමියි ධූරනික්ෂෙප කොට පසුව ආරොචනය කළත් ධූරනික්ෂෙපක්ෂණයෙහි ම පචිති අවන් බැවින් ඇවැතින් නොමිදෙයි.

එසේ ම මෙය කිසිවෙකුට නොදන්වන්නෙමියි ධූරනික්ෂෙප කොට තමන්ගේ හිත මිත්‍රාදී කිසිවෙකුට කිසිවෙකුටවත් නොකියන සේ ගිවිස්වා ගෙණ සැඟවීම පිණිස ම ආරොචනය කෙරෙයි ද, හෙතෙම එසේම අනිකෙකුට කියයි ද, මේ ක්‍රමයෙන් භික්ෂූන් සියයකට වුවත් ඇවැත් සිදුවිය හැකිවේ. කොණක් නොපෙණේ.

යම් හෙයකින් ඇවැතට පැමිණි භික්ෂුව අනිකෙකුට කියයි ද, හෙතෙමේත් තවත් භික්ෂුවකට කියයි ද, ඒ භික්ෂුව විසින් ආරොචක භික්ෂුවට නැවත ආරොචනය කරණ ලද නම් කෙළවරක් වේ.

---

## සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයා | - | එක්තරා භික්ෂුවකි. |
| වස්තුව | - | දුට්ඨුල්ලාපත්ති ප්‍රතිච්ඡාදනයයි |
| ප්‍රඥප්තිය | - | අසාධාරණ ප්‍රඥප්තියයි. |
| ආණත්තිය | - | අනාණත්තිකයි. |
| ආපත්ති | - | දුට්ඨුල්ලා පත්තියෙහි ආදී පදයෙහි පචිති යයි. ඉතිරි දෙතැන්හි දුකුළාවයි. අදුට්ඨුල්ලාපත්ති යෙහි තික 'දුක්කට' යයි. (මෙහි පද තුණ නම් - දුට්ඨුල්ලාපත්ති සඤ්ඤී, වෙමතිකො, අදුට්ඨුල්ලාපත්තිසඤ්ඤී, යනුයි.) දුට්ඨුල්ලවූ හෝ අදුට්ඨුල්ලවූ හෝ දුසිරිත අනුපසම් පන්න යෙකුට ආරොචනය කිරීමෙහි 'දුකුළා' වයි. |

අනාපත්ති - මෙයින් සඞ්ඝයාගේ භණ්ඩනාදිය වේයයි කියා හෝ මෙතෙම ක්‍රෑරයෙක ජීවිතාන්තරායාදිය නමුත් කෙරේ යයි කියා හෝ ආරෝචනය නොකරන්නාට ද, සුදුසු භික්ෂුවක් නොදන්නාට දඃ වසනු නො කැමැත්තාට ද, මෙයින් තෙමේ ප්‍රකට වේයයි සිතා ආරෝචනය නොකරන්නාට ද, උම්මත්තකා දීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - උපසම්පන්නස්ස දුට්ඨුල්ලාපත්ති ජානනං, පටිච්ඡාදෙතු කාමතාය නාරෝචෙස්සාමීති ධුරනික්ඛෙපොති අඞ්ග දෙකෙකි.

(සමුට්ඨානාදිය සමනුභාසනයෙහි කීසේයි.)

---

# නිදාන කථාව

ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර තෙමේ සංචෙතනිකා ශුක්‍රවිසට්ඨි ආපත්තියකට පැමිණ සහෝදරයාගේ සද්ධිවිහාරික භික්ෂුවට කිසිවෙකුට නො කියවයි කියා ඇවැතකට පැමිණි බැව් කීය.

එකල්හි තවත් භික්ෂුවක් තෙම ගරු ඇවැතකට පැමිණ පිරිවෙස් පුරයි. ඒ අතර මේ භික්ෂුව දක තෙමේ ගරු ඇවැතකට පැමිණ ඊට පිරිවෙස් පුරණ බවත් එය දනගත යුතු බවත් කීය. එකල්හි ඇවැත්නි ඇවැත්වලට පැමිණි අන්‍යයන් විසිනුදු මෙසේම පිරිවෙස් පිරිය යුතුදැයි ඇසීය. එවිට එසේ යයි. කීය.

මේ උපනන්ද ආයුෂ්මත් තෙම ගරු ඇවැතකට පැමිණ එය කිසිවෙකුටත් නොකියන සේ මට කීය, තොප එය සැහ වීදැයි ඇසීය, එසේ යයි කීය. මෙකරුණ දත් තථාගතයන් වහන්සේ මේ ශික්ෂාපදය අනුදත් සේක.

**සප්පාණක වර්ගයෙහි චතුර්ථ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

5. යො පන භික්ඛු ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙය්‍ය, සො ච පුග්ගලො අනුපසම්පන්නො, තෙ ච භික්ඛූ ගාරය්හා, ඉදං තස්මිං පාචිත්තියං.

---

**5. අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: ඌනවීසතිවස්සං, (ප්‍රතිසන්ධියෙහි පටන්) උනු විසිවයස් ඇති: පුග්ගලං, පුද්ගලයකු: ජානං, දැන දැන: උපසම්පාදෙය්‍ය, උපසපන් කරවූයේ නම්; සො ච පුග්ගලො, ඒ පුද්ගල තෙමේත්: අනුපසම්පන්නො, උපසම්පන්න නොවේ: තෙ ච භික්ඛූ, ඒ (ගණපූරක) භික්ෂූහුත්: ගාරය්හා, ගර්හාකට යුත්තෝය. ඉදං, මේ: තස්මිං, ඒ උපාධ්‍යායයා කෙරෙහි: පාචිත්තියං, පචිති වේ.

සං:- **"ඌනවීසතිවස්සං පුග්ගලං"** මෙයින් විසිවස් පිරි පුන් නොවූවෙකු අභිමතය, යමෙකුගේ පිළිබඳ ගැණුමේ (මව් කුසැ ප්‍රථම චිත්තොද්පාදක්ෂණයෙහි) පටන් උපසම්පද දිනය දක්වා ඇති අතර කාලය වර්ෂ විස්සක් සම්පූර්ණ නොවී නම් එබඳු පුද්ගලයා උනුවිසිවස් ඇත්තෙකි. නොපිරිපුන් විසිවස් ඇත්තා උපසම්පදහී නොවේ. එහෙත් ගර්භවිංශයාත් උපසම්පදහී බැව් **"ගබ්භවීසො'පි පරිපුණ්ණවීසොත්වෙව "සංඛං ගච්ඡති"** යි සමන්ත පාසාදිකාවේ දක්වති. මෙයින් හැඟෙන්නේ යමෙක් මව්කුස විසූ කාලයෙන් නවමාසයක් ගෙණ වර්ෂ විස්ස සම්පූර්ණ කොට උපසම්පද කළහැකි බවය. ලක්දිව මහා විහාරිකාචාර්‍ය්‍යවරයන්ගේ පෙර සිට පැවති සිරිත නම් මව් කුසින් හත්මසකට වඩා නො ගැණීමය, ඒ නිසැක පාරිශුඩිය සඳහාය.

තවෙක ක්‍රමයකට පෞරාණිකාචාර්‍ය්‍යවරයෝ විසි වර්ෂය පිරිපුන් කෙරෙති. එනම් එකුන් විසිවස් සාමණේරයකු නික්ඛමනීය පුණු පොහොය ඉක්මවා පැළවිය දිනෙහි උපසම්පද කෙරෙති. ඒ මෙලෙසිනි, එක වර්ෂයකට චාතුද්දසී සයක් වෙති. මෙලෙසින් අවුරුදු විස්සක් ගතවන කල්හි දවස් එකසිය විස්සක් හෙවත් මාස හතරක් අඩුවේ. රජවරු වර්ෂ තුණකට වරක් වස්සුක්කඩ්ඪනය කෙරෙති. මෙලෙසින් වර්ෂ දහ අටක් ගතවන විට සමසක් වැඩිවේ. එයින් පළමු උපොසථ වශයෙන් අඩුවූ සාරමස අඩු වූ කල්හි දෙමසක් ඉතිරිවේ. ඒ දෙමස ගණනට ගෙණ විසිවස පිරිපුන් කෙරෙති. මේ ක්‍රමයෙන් ගණන් ගෙණ නිසැකව නික්ඛමනීය පුණ්ණමාසිය ඉක්මවා පැළවිය දිනෙහි උපසම්පද කරණ බැව් විනය අටුවාවෙහි කීහු.

### සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදානය | - | රජගහ නුවරය. |
| පුද්ගලයෝ | - | බොහෝ භික්ෂූහුය. |
| වස්තුව | - | ඌනවීසති වාර්ෂිකයකු උපසම්පද කිරීමයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තික පාචිත්තියයි. (උනු විසිවස් ඇත්තා කෙරෙහි වෙමතිකයාට ද, පිරිපුන් විසිවස් ඇත්තහු කෙරෙහි උනු විසිවස් ඇත්තායයි සිතන්නාට ද, වෙමතිකයාට ද, දුකුළා වේ.) |
| අනාපත්ති | - | දෙදෙනා කෙරෙහිම විසිවස් පිරිපුන් සංඥ ඇත්තහුටද, උම්මත්තකාදීන්ටද, ඇවැත් නොවේ. |
| අඞ්ග | - | ඌනවීසති වස්සතා, ඌනක සඤ්ඤිතා, උපසම්පාදනන්ති, කියා අඞ්ග තුනෙකි. (සමුට්ඨානාදිය අදින්නාදානයෙහි කීසේයි.) |
| වද්‍ය | - | ප්‍රඥප්ති වද්‍යයයි. |
| කම්ම | - | කායකම්ම, වචීකම්මය. |
| කුශලත්‍රිකය | - | ත්‍රිවිධ චිත්තයයි. |
| වේදනාත්‍රිකය | - | ත්‍රිවේදනාවයි. |

# නිදාන කථාව

රජගහ නුවර උපාලි දරකයා ප්‍රධාන කොට ඇති සපන රසවර්ගීය දරුවෝ මව්පියන්ගේ කැමැත්තෙන් පැවිදිවෙන්නට සිතා ගොස් භික්ෂූන්ට දැන්වූහ. භික්ෂූහු ද ඔවුන් පැවිදි කළහ. උපසපන් කළහ, ඔවුහු ප්‍රත්‍යූෂ කාලයෙහි නැගිට කැඳ බත් ආදිය ඉල්ලා ඇඬූහ. ඒ හඬින් තථාගතයන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් අතින් කිම්දැයි අසා වදළ සේක. උන්වහන්සේ කරුණු ඇති සැටි ප්‍රකාශ කළසේක. එකරුණු නිමිත්තකොට මේ ශික්ෂාව අනුදැන වදළසේකි.

කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ගබ්භ වීසයෙක්ව සිටගෙණ උපසපන් වූහ. පළමු ශික්ෂාව පැනවූ පසු උන් වහන්සේට සැකයක් උපන. ඒ දුරුකිරීම සඳහා "**යං භික්ඛවෙ මාතකුච්ඡිස්මිං පඨමං**

6. යො පන භික්ඛු ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධාන මග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි පාචිත්තියං.

---

**විත්තං උප්පන්නං පඨමං විසඤ්ඤණං පාතු භූතං තදුපදය සාවස්ස ජාති: අනුජානාමි භික්ඛවෙ ගබ්භවීසං උපසම්පාදෙතුං"** යි අනුදත් සේකි.

**සප්පාණක වර්ගයෙහි පසළොස්වන ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

6. **අර්ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: ජානං, දැන දැන: ථෙය්‍ය සත්ථෙන සද්ධිං, හොර සාර්ථ වාහකයෙකු සමඟ: සංවිධාය, සංවිධානය කොට: අන්තමසො, යටත් පිරිසෙයින්: ගාමන්තරං අපි, අන්‍ය ගමකට නමුදු: එකද්ධාන මග්ගං, එක් දීඝී මාර්ගයකට: පටිපජ්ජෙය්‍ය, පිළිපන්නේ නම්: පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"ථෙය්‍යසත්ථෙන සද්ධිං"** මෙයින් රජුන් අයත් බඩු සොරකම් කොට ගෙණ යන ගැලක් හෝ හොරකම් කිරීම සඳහා යන ගැලක් හෝ සුංකම අයකරණ තැනින් සුංකම් නොදී හොරා යන රථයක් හෝ අභිමතය, මේ නයින් සොරකම් කොට යන්නාවූ ද, එසේම සොරකම් පිණිස යන්නාවූ ද, හොරු ගැණ ද, සැළකිය යුතුයි. මෙහි කී පරිදි ගැලක් සමගවත් හොරුන් සමඟවත් කථාකොට ගෙණ දීර්ඝ මාර්ගයේ යන්නාවූ භික්ෂූන්ට පචිති වෙති. ආපත්ති විනිශ්චය ඔවාද වර්ගයෙහි කී සෙයින් දන්නේය.

**සප්තදශාකාරය**

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයා - අන්‍යතර භික්ෂුවකි.

වස්තුව - සොර සාර්ථවාහකයන් සමග කථාකොට ගෙණ එකද්ධාන මාර්ගයේ යෑමයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය ය.

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - තික පාචිත්තියයි. මිනිසුන් සංවිදහනය නො කරණ කල්හි තෙමේ සංවිදහනය කොට යන්නහුටද, ථෙය්‍ය සත්ථයක් දෝයි වෙමතික යාට ද, අථෙය්‍ය සත්ථයෙහි ථෙය්‍ය සත්ථ සඤ ඇත්තාට ද, වෙමතිකයාට ද දුකුළා වේ.

අනාපත්ති - අථෙය්‍ය සත්ථ සංඥ ඇත්තහුට ද, සංවිදහනය නොකොට හෝ කාලවිසංකෙතයෙන් හෝ ආපදවන්හි හෝ යන්නහුට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - "ථෙය්‍යසත්ථභාවො ජානනං, සංවිධානං, අවිසංකෙතෙන ගමනන්ති" යී අඞ්ග සතරෙකි.

සමුට්ඨාන - ථෙය්‍ය සත්ථ සමුට්ඨානයයි.

ක්‍රියා - ක්‍රියා විසිති.

සඤ්ඤ - සඤ්ඤ විමොක්ඛයයි.

චිත්ත - සචිත්තකය.

වද්‍ය - ප්‍රඥප්තිවද්‍යයයි.

කර්ම - කායකර්ම, වචීකර්ම දෙකය.

කුශලත්‍රිකය - කුශලාදි ත්‍රිචිත්තයයි.

වෙදනාත්‍රිකය - සුඛාදි ත්‍රිවෙදනායි.

---

# නිදාන කථාව

එක්තරා භික්ෂුවක් තෙම සොර සාර්ථවාහකයන් සමඟ කථා කොට ගෙණ රජගහනුවරින් පටියා ලොකයට (පශ්චිම දිශාවට) යන්නට පිටත් විය. සුංකම් නොදී යන්නට පිටත් වූ ගැල් සුංකස්ථානයෙහි කම්කරුවෝ අල්වා ගත්හ. ඒ සමග ගිය භික්ෂූන්ට අවවාද කොට හැරියාහුය. මේ දත් භාග්‍යවතුන් වහන්සේ මේ ශික්ෂාව අනුදන වදළ සේක.

**සප්පාණක වර්ගයෙහි සවෙනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

8. යො පන භික්ඛු එවං වදෙය්‍ය, තථා'හං භගවතා ධම්මං දෙසිතං අජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයෝ, මා ආයස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, නහි සාධු භගවතො අබ්භක්ඛානං, නහි භගවා එවං වදෙය්‍ය, අනෙක පරියායෙන ආවුසො අන්තරායිකා ධම්මා වුත්තා භගවතා, අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායායාති. එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය. සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො, තස්ස පටිනිස්සග්ගාය, යාව තතියඤ්චෙ සමනුභාසියමානො තම්පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, පාචිත්තියං.

---

8. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: එවං වදෙය්‍ය, මෙසේ කියන්නේ නම් (කෙසේද?): යථා, යම්සේ: භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්: යෙ ඉමෙ, යම් මේ: අන්තරායිකා ධම්මා, අන්තරායකර ධර්මයෝ: වුත්තා, වදරණ ලද්දහුද: තෙ, ඒ ධර්මයන්: පටිසෙවතො, සෙවනය කරන්නාහට: අන්තරායාය, අන්තරාය පිණිස: න අලං ඉති, නුසුදුසු යයි: අහං, මම: තථා, එසේම: භගවතා, භගවත්හු විසින්: දෙසිතං, දෙශනා කරණ ලද: ධම්මං, ධර්මය: ආජානාමි, දනිමි. (කියායි) සො භික්ඛු, ඒ මහණ තෙම: භික්ඛූහි, භික්ෂූන් විසින්: එවං, මෙසේ: වචනීයො අස්ස, කීය යුතු වන්නේය. අයස්මා, ආයුෂ්මත් තෙම: එවං, මෙසේ: මා අවච, නොකියාවා: භගවන්තං, භාග්‍යවත්හට: මා අබ්භාචික්ඛි, අභිභවා, නොකියාවා: භගවතො, භාග්‍යවතුනට: අබ්භක්ඛානං, බිණීම හෙවත් ගැරහීම, නහි සාධු, යහපත් නොවේ. භගවා, භාග්‍යවත්තෙම: එවං මෙසේ: නහි වදෙය්‍ය, නො කියන්නේය. ආවුසො, ඇවැත්නි, අනෙක පරියායෙන, නොයෙක් ක්‍රමයෙන්: අන්තරායිකා ධම්මා, අන්තරායකර ධර්මයෝ: අන්තරායිකා, අන්තරායකර ධර්මයෝයයි: භගවතා, භාග්‍යවතුන් විසින්: වුත්තා වදරණ ලද්දහුය: තෙ, ඒ ධර්මයන්: පටිසෙවතො, සෙවනය කරන්නහුට: අන්තරායාය, අන්තරාය පිණිස: අලඤ්ච පන ඉති, සුදුසු වන්නේයයි: එවං ච, මෙසේත්: සො භික්ඛු, ඒ භික්ෂුතෙම: භික්ඛූහි, (සෙසු) භික්ෂූන් විසින්: වුච්චමානො, කියනු ලබන්නේ: තථා එව, එසේම: පග්ගණ්හෙය්‍ය, ගෙණ සිටියේ නම්: සො භික්ඛු, ඒ මහණ තෙම: භික්ඛූහි, (සෙසු භික්ෂූන් විසින්:) යාව තතියං, තුන්යලක්: තස්ස පටිනිස්සග්ගාය, ඒ දෘෂ්ටිය හැරළීම පිණිස: සමනුභාසිතබ්බො, සමනුභාසනකම් කටයුත්තේය. හෙවත් කම් වාක්‍යයෙන්

කිය යුත්තේය. වෙ, ඉදින්: යාව තතියං, තුන්වෙනිවර දක්වා: සමනු භාසියමානො, සමනුභාසනකම් කරණු ලබන්නේ: තං, ඒ දෘෂ්ටිය: පටිනිස්සජ්ජෙය්‍ය, හැර පී නම්; ඉති, මෙසේ: එතං, ඒ හැරපීම, කුසලං, යහපති: වෙ, ඉදින්: නො පටිනිස්සජ්ජෙය්‍ය, නො හළේ නම්: පාචිත්තියං: පචිති වේ.

සං:- **"අන්තරායිකා" යනු.** (සඟ්ගමොක්ඛානං අන්තරායං කරොන්තී'ති: අන්තරායිකා): දෘෂ්ටධාර්මික සාම්පරායික අනර්ථකර ධර්මයෝය. ටීකාකාරයෝ මෙය මෙසේ විස්තර කෙරෙති. කෙසේද? **"තං තං සම්පත්තියා විබන්ධන වසෙන සත්ත සන්තානස්ස අන්තරෙ වෙමජ්ඣෙ එති ආගච්ඡතීති: අන්තරායො: දිට්ඨධම්මිකාදි අනත්ථො: තස්මිං අන්තරායෙ නියුත්තා: අන්තරායං වා ඵලං අරහන්ති අන්තරායස්ස වා කරණ සීලාති. අන්තරායිකා"** යනු යි.

අන්තරායික ධර්මයෝ නම් 'කම්ම, කිලෙස, විපාක, උපවාද, පඤ්ඤත්ති, වීතික්කමන,' වශයෙන් පංච ප්‍රකාර වෙති.

(පංචානන්තරිය කර්මය 'කම්මන්තරායික' නම් වේ. හික්ෂුණී දූෂක කර්මය ද එසේමැයි. එය මොක්ෂාවරණය මුත් සවර්ගාවරණය නොම කෙරෙයි. නියත මිත්‍යා දෘෂ්ටි ධර්මයෝ 'කිලෙසන්තරායිකා' නම් වෙති. පණ්ඩක තිරච්ඡානගත උභතොබ්‍යඤ්ජනකයන්ගේ ප්‍රතිසන්ධි ධර්මයෝ 'විපාකන්තරායිකා' නම් වෙති. ඔහු වනාහි උපවාදිත ආයර්යයන් කමාකර ගන්නාතෙක් පමණෙකි. දන දන අවත් ඇවැත්හු 'පඤ්ඤත්ති වීතික්කමන්තරායිකා' නම් වෙති. ඔහුද හික්ෂුත්වය පිළිදන්නා තෙක් වෙති. යම් හෙයකින් ආපත්තියෙන් උට්ඨානය කළ හොත් නැතහොත් දෙශනා කළහොත් අන්තරායකර නොවෙති.)

මෙකී පංචප්‍රකාර අන්තරායික ධර්මයන් අතුරෙන් (මෘදු වූ ආස්තරාණාදීන්ගේ ස්පර්ශය මෙන් ස්ත්‍රී ස්පර්ශයද වටනේයයි සිතා මෛථුන ධර්ම ව්‍යතික්‍රමණයෙහි දෙස් නො පෙණී) 'ප්‍රඥප්තිව්‍යතික්‍රම සංඛ්‍යාත අන්තරායික ධර්මයන් සඳහා 'යෙ මෙ අන්තරායිකා - පෙ- නාලං අන්තරායායා' යි කියන ලදී.

'අරිට්ඨ' නැමැති හික්ෂුව බහුශ්‍රැතයෙකි. එසේම ධර්මකථික යෙකි. එබැවින් සෙසු අන්තරායකර ධර්ම දනී. නමුත් විනය නොදන්නෙකි. ඒ

නිසා ප්‍රඥප්ති ව්‍යතික්‍රමණානතරායික ධර්‍මයන් නොදනී. එසේ හෙයින් මෙසේ සිතුනි. කෙසේ ද? පස්කම් සැප විඳින අගාරිකයෝ සෝවාන් වෙති. භික්ෂූහු ද මනාපික රූපාදියෙහි රස විඳ ගණිති. එය වටනේ නම් සත්‍රී ස්පර්‍ශය නො කැපවීමට හෙතුව කිම්දැයි රසයෙන් රසය සමාන කොට සිතා මෙබඳු දෘෂ්ටියක් උපදවා ගත්තේය.

### සප්තදශාකාරය

නිදනය - සැවැත් නුවරය.

පුද්ගලයා - අරිට්ඨ භික්ෂූවය.

වස්තුව - ලාමක දෘෂ්ටිය නොහැරීමය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය ය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්ති - තික පාචිත්තිය ය.

අධර්‍ම කර්‍මයෙහි තික දුක්කට යයි.

අනාපත්ති - සමනුභාෂණය නොකරනු ලබන්නහුට ද, ප්‍රතිනිඃස්සජනය කරන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - ධම්මකම්මතා, සමනුභාසනං, අප්පටිනිස්සජ්ජනන්ති අඞ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය සමනුභාසන සඞ්ඝාදිසෙසයෙහි මෙනි.)

**සප්පාණක වර්ගයෙහි අටවැනි ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

---

## නිදාන කථාව

අරිට්ඨ භික්ෂුවට **"තථා'හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි"** යනාදී වශයෙන් කියවෙන ලාමක දෘෂ්ටියක් උපන. එය දුරුකිරීමට තෙවරක් ම සෙසු භික්ෂූහු සමනුභාෂණ කර්‍ම කළ නමුත් නොහළේය. ඒ බැව් දත් තථාගතයන් වහන්සේ මේ ශික්ෂාව අනුදැන වදළ සේක.

9. යො පන භික්ඛු ජානං යථාවාදිනා භික්ඛුනා අකතානුධම්මෙන තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජෙය්‍ය වා සංවසෙය්‍ය වා සහසෙය්‍යං වා කප්පෙය්‍ය පාචිත්තියං.

---

9. **අර්ථ:-** යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: ජානං, දැන දැන: යථා වාදිනා, එසේ බුදුන් වහන්සේගේ නුගුණ කියන්නාවූ: අකතානුධම්මෙන, නොකරණ ලද ඔසාරණ සඞ්ඛ්‍යාත අනුධම් ඇත්තාවූ: තං දිට්ඨිං, ඒ (ලාමක) දෘෂ්ටිය: අප්පටිනිස්සට්ඨෙන, නොහරණ ලද්දවූ: භික්ඛුනා සද්ධිං, භික්ෂුවක් සමග: සම්භුඤ්ජෙය්‍ය, (ධර්මාමිෂ) සම්භොග කෙළේ නම් හෝ: සංවසෙය්‍ය වා, උපොසථාදී සඞ්ඝකර්ම කෙළේ නම් හෝ: සහසෙය්‍යං කප්පෙය්‍ය වා, සමග එක ගෙයි සයනය කෙළේ නම් හෝ: පාචිත්තියං, පචිති වේ.

**සං:-** **"අකතානුධම්මෙන"** මෙයින් අවසාරණ කර්මය නොකරණු ලැබුවෙක් කියවේ. අවන් ඇවැත් නොදකීමෙන් හෝ ඇවතුන්ට සුදුසු ප්‍රතිකර්ම නොකිරීමෙන් හෝ පාපී වූ දෘෂ්ටිය නොහැරීමෙන් හෝ ධර්ම විනය පරිදි යම් යම් භික්ෂූන්ට උක්ෂෙපණීය කර්මය කෙරෙයි. එබඳු උක්ෂෙපණීය කර්මයක් කරණු ලැබුවෙකට උපසම්පද කිරීම නිඃශ්‍රය දීමාදී අටලොස්වතක් නුසුදුසු වේ. ඒ අටලොස්වතට අනුලොම්ව පවත්නා බැව් දුටුවහොත් උක්ෂෙපණීය කර්මය ඔසාරණය කෙරෙයි. එබඳු අවසාරණයක් නොකරණු ලැබුවෙක් මෙයින් ගැණෙයි.

**සං:-** **"සම්භුඤ්ජෙය්‍ය"** මෙයින් ධර්මාමිෂ සම්භොග දෙකම ගැණෙති. යම්කිසි ආමිෂයක් දීමත් ගැණීමත් ආමිෂ සම්භොග යයි. එසේම ධර්මපද පිළිබඳ උදෙසීමත් උදෙසවීමත් ධර්ම සම්භොගයයි.

ආමිෂ පරිභොගයේ දී එකවර රැසක් දුන්නත් ගත්තත් එකම පචිතියෙකි. වරින්වර නම් පියොවින් පියොව පචිති වෙති ධර්මසම්භොගයෙහි ආපත්ති භෙදය 'පදසො ධම්ම' ශික්ෂාවෙහි මෙන් ද, උපොසථාදී ත්‍රිවිධ සංවාසයේ දී කර්ම පර්‍ය්‍යවසාන වශයෙන් ද, සහසෙය්‍යාවෙහි දී එකෙක් නිපන් කල්හි අනිකාගේ නිපජ්ජන ප්‍රයොග වශයෙන් ද සැළකිය යුතුයි.

**සප්තදශාකාරය.**

නිදානය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - ෂඩ්වර්ගීය භික්ෂූහුය.

වස්තුව - අරිට්ඨ භික්ෂුව සමග ධර්මාමිෂ සම්භොග යයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි.

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - තික දුක්කටයයි.

උක්ඛිත්තකයා කෙරෙහි වෙමතිකයාට ද, අනුක්ඛිත්තයා කෙරෙහි උක්ඛිත්තක සංඥ ඇත්තාට ද, වෙමතිකයාට ද දුකුළා වේ.

අනාපත්ති - උක්ඛිත්තා'නුක්ඛිත්ත දෙදෙනා කෙරෙහි ම අනුක්ඛිත්ත සංඥ ඇත්තහුට ද, ඔසාරිත යයි කියා හෝ ඒ දෘෂ්ටිය ප්‍රතිනිඃසර්ජනය කෙළේ යයි කියා හෝ දන්නහුට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - අකතානු'ධම්මතා, ජානනතා, සම්භොගාදි කරණතා, අඞ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදානයෙහි කී සේයි.)

වද්‍ය - ප්‍රඥප්ති වද්‍ය යයි.

කුශලත්‍රිකය - කුශලාදී ත්‍රිචිත්ත යයි.

වෙදනාත්‍රිකය - සුඛාදී ත්‍රිවෙදනා යි.

**සප්පාණක වර්ගයෙහි නවම ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

# නිදාන කථාව

ෂඩ්වර්ගීය භික්ෂූහු දැන දැන ම උක්ෂෙපණීය කර්මයකින් තහනම් කරණ ලද අරිට්ඨ භික්ෂුව සමග ධර්මාමිෂ සම්භොගාදිය කෙරෙති. ඒ නිසා ප්‍රියශීලි භික්ෂූහු නොයෙක් අයුරින් උජ්ඣායනය කෙරෙති. ඒ බැව් දැන වදළාවූ බුදුන් වහන්සේ මේ ශික්ෂාපදය පණවා වදළසේක.

10. සමණුද්දෙසො පි චෙ එවං වදෙය්‍ය තථා'හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නා'ලං අන්තරායායාති: සො සමනුද්දෙසා භික්ඛුහි එවමස්ස වචනයො, මා අවුසො සමණුද්දෙස එවං අවච: මා භගවන්තං අබ්භාචික්ඛි, නහි සාධු භගවතො අබ්භක්ඛානං, නහි භගවා එවං වදෙය්‍ය අනෙක පරියායෙන ආවුසො සමණුද්දෙස අන්තරායිකා ධම්මා. අන්තරායිකා වුත්තා භගවතා, අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායායාති. එවඤ්ච සො සමණුද්දෙසො භික්ඛුහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය සො සමණුද්දෙසො භික්ඛුහි එවමස්ස වචනීයො අජ්ජතග්ගෙ තෙ ආවුසො සමණුද්දෙස නචෙව සො භගවා සත්ථා අපදිසිතබ්බො. යම්පි චඤ්ඤෙ සමණුද්දෙසා ලභන්ති භික්ඛුහි සද්ධිං දිරත්ත තිරත්තං සහසෙය්‍යං සාපි තෙ නත්ථි චර පරෙ විනස්සාති.

යො පන භික්ඛු ජානං තථා නාසිතං සමණුද්දෙසං උපලා ලෙය්‍ය වා උපට්ඨාපෙය්‍ය වා සම්භුඤ්ජෙය්‍ය වා සහ සෙය්‍යං කප්පෙය්‍ය වා පාචිත්තියං

## සප්පාණක වග්ගො සත්තමො

---

10. අර්ථ:- චෙ ඉදින්: සමණුද්දෙසො අපි, සාමණේරයෙකුදු; භගවතා, භාග්‍යවත්හු විසින්; යෙ ඉමෙ ධම්මා, යම් මේ ධර්ම කෙනෙක්: අන්තරායිකා, (ප්‍රථමධ්‍යානාදියට) අන්තරාය කරහයි: වුත්තා, වදරණ ලද්දහුද; තෙ, ඒ ධර්මයන්: පටිසෙවතො, සෙවුනාහට: අන්තරායාය, අන්තරාය පිණිස: න අලං ඉති, නුසුදුසු යයි; යථා යම්සේ භගවතා භගවත්හු විසින්: දෙසිතං දෙශනා කරණලද: ධම්මං, ධර්මය: අහං, මම, තථා, එසේ: ආජානාමි, දනිමියයි: එවං වදෙය්‍ය, මෙසේ කියන්නෙ නම්: සො සමණුද්දෙසො, ඒ හෙරණ තෙම; භික්ඛුහි, භික්ෂූන් විසින්: එවං මෙසේ: වචනීයො අස්ස, කිය යුතු වන්නේය. ආවුසො සමණුද්දෙස, ඇවැත්නි සාමණෙරය! එවං, මෙසේ: මා අවච, නොකියව: භගවන්තං, භාග්‍යවතුන්ට: මා අබ්භාචික්ඛි, අබ්භ්‍යාඛ්‍යානය නො කරව: (නො ගරහව) භගවතො, භාග්‍යවතුන් වහන්සේට: අබ්භක්ඛානං, ගැරහීම: නහි සාධු, යහපත් නොවේ. භගවා, භාග්‍යවත් තෙම: එවං මෙසේ; නහි වදෙය්‍ය, නො කියන්නේය.

ආවුසො සමණුද්දෙස, ඇවැත්නි සාමණේරය! අනෙක පරියායෙන (අට්ඨිකඞ්කලූපමා කාමා යනාදී) නොයෙක් ක්‍රමයෙන් අන්තරායිකා ධම්මා, අන්තරායකර ධර්මයෝ: අන්තරායිකා, අන්තරායකර ධර්මයෝ (යයි) භගවතා, භගවත්හු විසින්: වුත්තා, වදරණලද්දහුය.

තෙ, ඒ ධර්මයන්: පටිසෙවතො, සෙවනය කරන්නාට: අන්තරායාය, අන්තරාය පිණිස: අලඤ්ඣ පන ඉති, සුදුසු වන්නේයයි: එවං ච, මෙසේත්: සො සමණුද්දෙසො, ඒ සාමණේර තෙම: භික්ඛූහි, භික්ෂූන් විසින්: වුච්චමානො, කියනු ලබන්නේ: තථා එව, එසේ ම:. පග්ගණ්හෙය්‍ය: දැඩිකොට ගෙණ සිටියේ නම්: සො සමණුද්දෙසො, ඒ සාමණේර තෙම, භික්ඛූහි, භික්ෂූන් විසින්, එවං, මෙසේ: වචනීයො අස්ස, කිය යුතු වන්නේය. ආවුසො සමණුද්දෙස, ඇවැත්නි සාමණේරය! අජ්ජතග්ගෙ, අද පටන්: තෙ, තා විසින්: භගවා, භාග්‍යවත්වූ: සො සත්ථා, ඒ ශාස්තෘතෙම: න අපදිසිතබ්බො එව, නො ඇදහිය යුත්තේමය. අඤ්ඤෙ සමණුද්දෙසා, අන්‍යවූ සාමණේරයෝ: භික්ඛූහි සද්ධිං, භික්ෂූන් සමග: දිරත්ත තිරත්තං, දෙතුන් රැයක්: යම්පිච සහසෙය්‍යං ලභන්ති, යම් සහසෙය්‍යාවක් ලබද්ද: සා අපි, ඒ සහසෙය්‍යා තොමෝ ද: තෙ, තට: නත්ථි, නැත: චර, (කැමති තැනක) හැසිරෙව: පරෙ, අපගේ නොවන්න: විනස්ස ඉති, වැනසෙවයි (කිය යුත්තේය.)

යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: ජානං දන දන: තථා නා සිතං, එසේ නෙරණ ලද්දවූ: සමණුද්දෙසං, සාමණේරයකු: උපලාලෙය්‍ය වා, (පා සිවුරු දෙමි යනාදීන්) සංග්‍රහ කෙරේ නම් හෝ: උපට්ඨාපෙය්‍ය වා, උවටැන් කරවා ගණී නම් හෝ: සම්භුඤ්ජෙය්‍ය වා, සම්භොග කෙරේ නම් හෝ: සහසෙය්‍යං කප්පෙය්‍ය වා, සහසෙය්‍යාව කෙරේ නම් හෝ, පාචිත්තියං, පචිති වේ.

සත්තමො, සත්වෙනිවූ: සප්පාණක වග්ගො, සප්පාණක වර්ග යයි.

---

සං:- **"පරෙ"** මෙය නිපාත පදයෙකි. සමහර තැනක 'පිරෙ' කියාත් පෙණේ. 'අපට අයිති නො වූවෙක' යනු අදහසයි.

සං:- **"විනස්ස"** යනු නො පෙණෙන තැනකට මෙයින් යව' යන අදහසයි.

සං:- **"තථා නාසිතං"** යනු නාසනා තුණෙකි. සංවාස නාසනා, ලිඞ්ග නාසනා, දණ්ඩකම්ම නාසනා කියා යි.

ඇවැත් නොදැකීමාදිය නිසා සඞ්ඝයා විසින් යමෙක්හට උක්ඛෙපණීය කර්මය කරණ ලද නම්, ඒ 'සංවාසනාසන' යයි. **"දූසකො නාසෙ තබ්බො මෙතතියං භික්ඛුණිං නාසෙථා"** ති යනාදී ක්‍රමයෙන් දූෂක දූෂිත දෙපක්ෂයගේ සිවුරු රැගෙණ ගිහියෙකු කිරීම ( සිවුරු හැරවීම) 'ලිඞ්ගනාසන' යයි.

සාමණේරය අද පටන් තා විසින් භාග්‍යවතුන් වහන්සේ නො ඇදහිය යුත්තාහුයයි දඬුවම් කිරීම, 'දණ්ඩකම්මනාසනය'යි. එසේ දණ්ඩකම්මනාසනයෙන් නසන ලද්දෙක් මෙහි ගැණෙයි.

සං:- **"උපලාලෙය්‍ය"** යනු දණ්ඩකර්ම නාශනයෙන් නසන ලද හෙරණකුට පාත්‍රා සිවුරු ආදිය දීමෙන් ද උදෙදස පරිප්‍රච්ඡාදිය දීමෙන් ද සංග්‍රහ කිරීමයි. 'උපට්ඨාපෙය්‍ය' යනු සුණුවැටි ආදිය ඉවසමින් තමන්ට වතාවත් කරවා ගැණීමය. (විස්තර පළමු ශික්ෂාවෙහි මෙනි.)

**සප්තදශාකාරය**

නිදානය - සැවැත් නුවරය.

පුද්ගලයෝ - ෂඩ්වර්ගීය භික්ෂූහුය.

වස්තුව - කණ්ටක නැමැති සාමණේරයාට සංග්‍රහ කිරීමය.

(සෙස්ස අරිට්ඨ සික්ඛා පදයෙහි කීසේයි.)

**සප්පාණක වර්ගයෙහි දශවෙනි ශික්ෂාපද වර්ණනාව නිමි.**
**සත්වෙනි සප්පාණක වර්ගයයි.**

---

# නිදාන කථාව

කණ්ටක නැමැති සාමණේරයාට ද අරිට්ඨ භික්ෂුවට මෙන් පවිටු දෘෂ්ටියෙක් උපන. ඒ දුරලීමට සඞ්ඝයා තෙවරක් ම අවවාද කළමුත් නොහැකි විය. එබැවින් හෙතෙම දණ්ඩකම්මනාසනයෙන් නසනු ලැබීය.

එසේ නසන ලද හෙරණහුට ෂඩ්වර්ගීය භික්ෂූහු පාත්‍රා සිවුරුදීමාදියෙන් සංග්‍රහ කෙරෙති. ඒ කරුණු කොට මේ ශික්ෂාපදය අනුදැන වදාළ සේක.

1. යො පන භික්ඛු භික්ඛූහි සහ ධම්මිකං වුච්චමානො එවං වදෙය්‍ය න තාවාහං ආවුසො ඉමස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමීති පාචිත්තියං. සික්ඛමානෙන භික්ඛවෙ භික්ඛුනා අඤ්ඤාතබ්බං පරිපුච්ඡිතබ්බං පරිපඤ්හිතබ්බං. අයං තත්‍ථ සාමීචි.

---

1. **අර්‍ථ:-** යො පන භික්ඛු, යම් භික්‍ෂුවක් තෙම වනාහි: භික්ඛූහි, භික්‍ෂූන් විසින්: සහධම්මිකං, ප්‍රඥප්ත ශික්‍ෂාපදයකින්: වුච්චමානො, කියනු ලබන්නේ: ආවුසො, ඇවැත්නි: ව්‍යත්තං, ව්‍යක්තවූ: විනයධරං, විනයධාරීවූ: අඤ්ඤං භික්ඛුං, අන්‍ය (වෙන) භික්‍ෂුවක්: යාව, යම්තාක්: න පරිපුච්ඡාමි, නො පිළිවිසීම් ද: තාව, ඒ තාක්: අහං, මම: එතස්මිං සික්ඛාපදෙ, මේ ශික්‍ෂාපදයෙහි: න සික්ඛිස්සාමි ඉති, නොහික්මෙන්නෙමියි: එවං වදෙය්‍ය, මෙසේ කියන්නේ නම්: පාචිත්තියං, පචිති වේ.

භික්ඛවෙ, මහණෙනි: සික්ඛමානෙන, හික්මෙන්නාවූ: භික්ඛුනා, භික්‍ෂුව විසින්: අඤ්ඤාතබ්බං, (වස්තුනිදානාදිය) දන ගත යුත්තේය. පරිපුච්ඡිතබ්බං (අර්‍ථ) පිළිවිසිය යුත්තේය. පරිපඤ්හිතබ්බං, ප්‍රශ්න කටයුත්තේය. අයං, මේ, තත්‍ථ එහි: සාමීචි, (පිළිපැදිය යුතු) වතයි.

**සං:-** **"සහධම්මිකං වුච්චමානො"** යනු ප්‍රඥප්ති සංඛ්‍යාත ශික්‍ෂාපදයෙන් කියනු ලැබීමය. 'සහධම්මිකං' යනු කරණාර්‍ථයෙහි ද්විතීයාවයි. පංච සහධාර්මිකයන් විසින් හික්මිය යුතු නිසා හෝ ඔවුන්ට අයිති නිසා හෝ ප්‍රඥප්තියට 'සහධම්මික' යයි කියනු ලැබේ. එබැවින් 'සහධාර්මික' යන නම් ලත් ශික්‍ෂාපදයෙන් කියනු ලබන කල්හි යයි සංක්‍ෂෙප වශයෙන් සැළකිය යුතුයි. වැඩි විස්තර දුර්‍වච ශික්‍ෂාපදයෙන් දත යුත්තාහුය.

**සං:-** **"පාචිත්තියං"** යී ශික්‍ෂාවට අනාදර කිරීමේ භීතියෙන් 'නොහික්මෙන්නෙමි' යි කෙළින්ම නොකියා 'යාව න අඤ්ඤං භික්ඛුං' යනාදී ලෙශයෙන් කියන්නහුට ද, වචනයක් පාසා පචිති වන බැව් සූචිතය.

2. යො පන භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය කිං පනිමෙහි ඛුද්දානුඛුද්දකෙහි සික්ඛාපදෙහි උද්දිට්ඨෙහි යාවදෙව කුක්කුච්චාය විහෙසාය විලෙඛාය සංවත්තන්තීති සික්ඛාපද විවණ්ණකෙ පාචිත්තියං.

---

## සප්තදශාකාරය

නිදනය - කොසඹෑ නුවරය.

පුද්ගලයා - ඡන්නස්ථවිරයෝය.

වස්තුව - ශික්‍ෂාපදයෙහි කී පරිදි ගර්‍හීමය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තිය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්ති - තිකපාචිත්තියය.

අනුපසම්පන්නයා කෙරෙහි තිකදුක්කට යයි. දෙදෙනා විසින්ම මෙය සලෙලඛය පිණිස නොවේයයි යනාදීන් නොපණවන ලද්දකින් කියන්නාට ද, දුකුළා වේ.

අනාපත්ති - දනගන්නෙමියි, හික්මෙන්නෙමියි කියන්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

අඞ්ග - උපසම්පන්නස්ස පඤ්ඤත්තෙන වචනං, අපිකඛිතු කාමතාය එවං වචනන්ති යී අඞ්ග දෙකෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදනයේ මෙනි.) මෙහි දුක්ඛවෙදනාවය.

---

## නිදන කථාව

ආයුෂ්මත් ඡන්නස්ථවිරයෝ අනාචාරයෙහි හැසිරෙති. භික්‍ෂූහු ඡන්නය මේ මේ නොකරව. භික්‍ෂූන්ට ඒ ඒ නොකැපයයි කීහ. එවිට ඇවැත්නි ව්‍යක්තවූ විනයධාරීවූ අනිත් භික්‍ෂුවකගෙන් විචාරා දන ගන්නා තෙක් මේ ශික්‍ෂාවෙහි නොහික් මෙන්නෙමියි කීය. මෙය තථාගතයන් වහන්සේට සැලකළාහුය. එකල්හි මේ ශික්‍ෂාපදය අනුදන වදළසේකි.

**සහධාර්මික වර්ගයෙහි ප්‍රථම ශික්‍ෂාපද වර්‍ණනාව නිමි.**

---

2. අථි:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; පාතිමොක්ඛෙ, ප්‍රාතිමොක්ෂය; උද්දිස්සමානෙ, උදෙසනු ලබන කල්හි, උද්දිට්ඨෙහි, උදෙසන ලද; ඛුද්දනු ඛුද්දකෙහි, ක්ෂුද්‍රානු ක්ෂුද්‍රවූ; ඉමෙහි සික්ඛාපදෙහි, මේ ශික්ෂාපදවලින්; කිං පන, කවර ප්‍රයෝජන ද; යාවදෙව, යම්තාක්; කුක්කුච්චාය, කුකුස් පිණිස; විහෙසාය, (විපිළිසර විසින්) උපදනා වෙහෙස පිණිස; විලෙඛාය, (විචිකිත්සා සංඛ්‍යාත) බෙදය පිණිස; සංවත්තන්ති ඉති, පත්වනාහුයයි; එවං වදෙය්‍ය, මෙසේ කියන්නේ නම්; සික්ඛාපද විවණ්ණනකෙ (මෙසේ) ශික්ෂාපදයනට නිඳා කිරීමෙහි; පාචිත්තියං, පචිති වේ.

සං **"ඛුද්දනුඛුද්දකෙහි සිකඛාපදෙහි"** යි. ක්ෂුද්‍රානු ක්ෂුද්‍ර ශික්ෂාපද පිළිබඳව මතභෙද වෙති. එහෙත් ටීකාවෙහි සඞ්ඝාදිසෙසාදිය ක්ෂුද්‍ර ඇවැත් බවත් 'ථුලසි' ආදිය අනුක්ෂුද්‍ර ඇවැත් බවත් කීහු. සතර පාරාජිකා හැර සෙසු සියලුම ශික්ෂාපද එක් ක්‍රමයෙකින් ක්ෂුද්‍රානුක්ෂුද්‍රක වෙති. පංචසතිකක්ඛන්ධකයෙහි-

ධම්සංගායනා කරණ අවස්ථාවෙහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ස්ථවිර භික්ෂූන්ට මෙසේ කීහ. කෙසේද? ස්වාමීනි! මට භාග්‍යවතුන්වහන්සේ පරිනිර්වාණ සමයේදී මෙසේ වදළසේක. ආනන්දය සංඝයා කැමැති නම් මාගේ ඇවෑමෙන් ඛුද්දනුඛුද්දක ශික්ෂාපද සමූහනනය කරන්නේය. හෙවත් අහක්කරන්නේ යයි කියායි. ආනන්දය! ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ඇවැත් කවරහුදයි භාග්‍යවතුන්වහන්සේගෙන් විචාළෙහිද? භාග්‍යවතුන්වහන්සේ ගෙන් නොවිචාළෙමියි කීහ. එවිට ඇතැම්හු සතර පාරාජිකාවන් හැර සෙසු සියලුම ශික්ෂාපද ඛුද්දනුඛුද්දකයෝ යයි කීහු. ඇතැමෙක් සතර පාරාජිකා තෙළෙස් සංඝාදි සෙස හැර සෙසු සියල්ලටද, ඇතැමෙක් සතර පාරාජිකාද, තෙළෙස් සංඝාදිසෙසද, අනියත දෙකද හැර සෙසු සියල්ලටද, ඇතැමෙක් සතර පාරාජිකාද, තෙළෙස් සංඝාදිසෙසද, අනියත දෙකද තිස් නිසඟි පචිතිද හැර සෙසු සියලුම ඇවැත්ද, ඇතැමෙක් සතර පාරාජිකාවන්ද, තෙළෙස් සංඝාදිසෙසද, අනියත දෙකද තිස් නිසඟි පචිතිද, දෙයානු පචිතිද හැර සෙසු සියලුම ශික්ෂාපදද, ඇතැමෙක් සතර පාරාජිකාවන්ද, තෙළෙස් සංඝාදිසෙසද, තිස් නිසගි පචිති ද, දෙයානු පචිති ද, පාටිදෙසනීය සතරද හැර සෙසු සියලුම ශික්ෂාපද ඛුද්දනුඛුද්දකයෝයයි කීහු. මෙයින්ද ක්ෂුද්‍රානු ක්ෂුද්‍රක ඇවැත් අවිනිශ්චිතයහ.

මිළිඳු රජහු විසින් විචාරණ ලදින් නාගසෙන ස්ථවිරයන් වහන්සේ මහරජාණෙනි! 'දුක්කට' ආපත්තිය ඛුද්දකය 'දුබ්භාසිත' ආපත්තිය අනුඛුද්දකයයි කීහ. ශ්‍රද්ධාවත් ප්‍රඥප්ති ගරුකයන් විසින්

ධර්‍මසංගාහකාවස්ථාවෙහි අන්තිම කොටස ප්‍රකාශ කළ පරිදි හික්මිය යුතු යයි සැළකීම වටී.

සං:- **"සික්ඛාපද විවණ්ණනකෙ"** යනු ප්‍රඥප්තිවලට නිඳා ගර්‍හා කිරීමයි. ඒ නිමිත්තකොට පචිති වේ.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීය භික්ෂූහුය. |
| වස්තුව | - | විනය විවණ්ණනයයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තිකපාචිත්තියයි. අනුපසපනෙකු ලහදී ගැරහීමෙන් තිකදුක්කටයෙකි. දෙදෙනා ලහදීම අනික් ධර්‍මයකට ගැරහීමෙන් දුකුළා වෙකි. |
| අනාපත්ති | - | නොගරහනු කැමැත්තාට ද, එසේ නම් පළමු කොට සුත්තන්තාදියක් ප්‍රගුණ කරව. පසුව විනය ප්‍රගුණ කරන්නෙහියි කියන්නාටද, උම්මත්තකාදීන්ටද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | ගරහිතුකාමතා ච, උපසම්පන්නස්සසන්තිකෙ සික්ඛා විවණ්ණනඤ්චාති යී අඞ්ග දෙකෙකි. |

(සමුට්ඨානාදිය අදින්නාදන සික්ඛා පදයේ කීසේයි.)
මෙහි දුක්ඛ වෙදනායි.

---

# නිදන කථාව

භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ක්‍රමයෙන් විනයකථා වදළසේක. එසේම උපාලි තෙරුන්ගේ ගුණ වදළසේක. අනතුරු බොහෝ භික්ෂූහු උපාලි තෙරුන්වහන්සේගෙන් විනය ඉගෙණීමට ගියාහුය. ෂඩ්වර්ගීය භික්ෂූහු මෙයින් තමන්ගේ අනාචාරවලට පහර වැදේයයි සිතා විනය ගරහන්නට වූහ. ඒ බැව් දත් තථාගතයන්වහන්සේ මේ ශික්ෂාපදය භික්ෂූන්ට අනුදත්සේක.

**සහධාර්මික වග්ගයෙහි ද්විතීය ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

---

3. යො පන භික්ඛු අන්වද්ධමාසං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය ඉදනෙව ඛො ආවුසො අහං ආජානාමි අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතීති; තඤ්ච භික්ඛුං අඤ්ඤෙ - භික්ඛූ ජානෙය්‍යුං නිසින්නපුබ්බං ඉමිනා භික්ඛුනා ද්වත්තික්ඛත්තුං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ කො පන වාදෙ භිය්‍යොති, න ච තස්ස භික්ඛුනො අඤ්ඤාණකෙන මුත්ති අත්ථි යඤ්ච තත්ථ ආපත්තිං ආපන්නො තඤ්ච යථා ධම්මො කාරෙතබ්බො උත්තරිං චස්ස මොහො ආරොපෙතබ්බො තස්ස තෙ ආවුසො අලාභා තස්ස තෙ දුල්ලද්ධං යං ත්වං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ න සාධුකං අට්ඨිං කත්වා මනසි කරොසීති ඉදං තස්මිං මොහනකෙ පාචිත්තියං.

---

3. **අර්ථ:**- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; අනුඅද්ධ මාසං, (පිළිවෙළින්) අඩමසක් පාසා; පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ (උපොසථ වසයෙන්) පාමොක් උදෙසනු ලබන කල්හි; ආවුසො, ඇවැත්නි; අයං කිර ධම්මො අපි, මේ ධර්මය තෙමේ ද, සුත්තාගතො; සූත්‍රයෙහි ආයේය; සුත්තපරියාපන්නො, සූත්‍රයට ඇතුළත් වූයේය. අන්වද්ධමාසං, අඩමසක් පාසා; උද්දෙසං, උදෙසී, මට; ආගච්ඡති ඉති, එන්නේ යයි; අහං, මම; ඉදනි එව ඛො පන, දැන්ම වනාහි; ආජානාමි ඉති, දනිමියි; එවං වදෙය්‍ය, මෙසේ කියයි නම්; වෙ, ඉදින්; අඤ්ඤෙ භික්ඛූ, සෙසු භික්ෂූහු; තං භික්ඛුං, ඒ භික්ෂුව; ඉමිනා භික්ඛුනා, මේ භික්ෂුව විසින්; ද්වත්තික්ඛත්තුං, දෙතුන් වරක්, පාතිමොක්ඛෙ, උද්දිස්සමානෙ, පාමොක් උදෙසනු ලබන කල්හි; නිසින්න පුබ්බං පෙර හිඳිනා ලද්දේයයි; ජානෙය්‍යුං, දන්නාහුද; භිය්‍යො, බොහෝසේ; කො පන වාදෙ, කියනු කිම? තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහට; අඤ්ඤාණකෙන, නො දැනීමෙන්; මුත්ති, මිදීමෙක්; නච අත්ථි, නොමැත්තේය.

තත්ථ, (තෙමේ කළ) ඒ අනාචාරයෙහි, යඤ්ච ආපත්තිං, යම් ඇවතකට; ආපන්නො, පැමිණියේද; තඤ්ච, ඒ ඇවතද; යථා ධම්මො, ධර්මය නොයික්මවා (ධර්මය යම් සේ නම් එසේ) කාරෙතබ්බො, කරවිය යුත්තේය. අස්ස, ඔහුට, උත්තරිංච, මත්තෙහිද; ආවුසො, ඇවැත්නි! ත්වං, නුඹ; පාතිමොක්ඛෙ, පාමොක්; උද්දිස්සමානෙ, උදෙසනු ලබන කල්හි; සාධුකං, මනාකොට; අට්ඨිං කත්වා, අර්ථවත්කොට; න මනසි කරොසි, මෙනෙහි නොකරන්නෙහිය. තස්ස තෙ, ඒ නුඹට; අලාභා, අලාභයෝය. (තස්ස තෙ, ඒ නුඹට) දුල්ලද්ධං (කුසල් බෙලෙන් ලත් මිනිස් බවට) දුලීභයයි; මොහො ආරොපෙතබ්බො, මොහාරොපන කර්මය කටයුත්තේය.

තස්මිං මොහණකෙ, (මොහාරොපනය කළ කල්හි නැවතත් මොහණය කරණ) ඒ පුද්ගලයා කෙරෙහි; ඉදං, මේ; පාචිත්තියං, පචිතිය වේ.

සං:- **"යථා ධම්මො කාරෙතබ්බො"** යනු නොදනීමෙන් අවන් තිසායයි කියා මිදීමක් නැත්තේය. එබැවින් දෙශනා ගාමිනී ඇවැතකට පැමිණියේ නම් දෙශනා කරවිය යුතුයි. වුට්ඨාන ගාමිනී ඇවතකට පැමිණියේ නම් ඇවැතින් වුට්ඨාපනය කරවිය යුත්තේය. මේ යථා ධර්මයයි.

සං:- **"උත්තරිං තස්ස මොහො ආරොපෙතබ්බො"** යි යථාධර්ම කරණයෙන් පසු 'තස්ස තෙ ආවුසො' යනාදී වචනවලින් නිඥ කොට ඒ භික්ෂුවට ඥප්ති ද්විතීය කර්මවාක්‍යයෙන් මොහාරොපනය කට යුතුයි. මෙසේ ඥප්තිය දෙවැනි කොට ඇති කර්ම වාක්‍යයෙන් මොහාරොපනය කළ පසුත් මුළාවෙයි නම් පචිති වේ. යම් හෙයකින් මොහාරොපනය නොකළ හොත් දුකුළා වෙකි.

## සප්තදශාකාරය

නිදනය - සැවැත්නුවරය.

පුද්ගලයෝ - සවග මහණෝය.

වස්තුව - මොහනයයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි.

ආණත්ති - අනාණත්තිකය.

ආපත්ති - තිකපාචිත්තියය අධර්ම කර්මයෙන් තිකදුක්කට යයි. මොහාරොපනය නොකළ කල්හි දුකුළා වක් වේ.

අනාපත්ති - විස්තර වශයෙන් නො අසන ලදද, දෙතුන්වරකට අඩුව විස්තරයෙන් අසන ලදද, මුලා වනු කැමැත්තෙන් නො අසන ලදද, ඔවුන්ටත් උම්මත්තකාදීන්ටත් ඇවැත් නොවේ.

අඞ්ග - 'මොහාරොපනං, මොහෙතුකාමතා, වුත්තනයෙන සුතභාවො, මොහනන්ති' යී අඞ්ග සතරෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදනයෙහි මෙනි.)
මෙහි දුක්ඛ වෙදනාවය.

4. යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො පහාරං දදෙය්‍ය පාචිත්තියං.

## නිදාන කථාව

ෂඩ්වර්ගීයයෝ අනාචාර කොට ඇවැත්වලට පැමිණ නොදනී මෙන් පැමිණුනෙමුයි පාමොක් උදෙසන කල්හි මෙසේ කියති. 'ඇවැත්ති අපි මෙය සූත්‍රාගත සූත්‍ර පයර්‍යාපන්න ධර්‍මයක් බවත් අඩ් මාසයක් පාසා උදෙසිය යුත්තක් බවත් දන් ම දනිමු. පෙර නො දනිමු' යි කීහ. මෙ කරුණ භාග්‍යවතුන්වහන්සේට සැළ කරණ ලදින් මේ ශික්‍ෂාපදය පණවා වදළසේක.

### සහධාර්මික වර්ගයෙහි තෘතීය ශික්‍ෂාපද වර්‍ණනාව නිමි.

4. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්‍ෂුවක් තෙම වනාහි; භික්ඛුස්ස, භික්‍ෂුවක් හට; කුපිතො, කිපියේ; අනත්තමනො, නො සතුටු සිත් ඇත්තේ; පහාරං, පහරක්; දදෙය්‍ය, දුන්නේ නම්; පාචිත්තියං පචිති වේ.

**සං**:- **"පහාරං දදෙය්‍ය"** යනු යම්කිසි භික්‍ෂුවක් තෙම උපසපන් භික්‍ෂුවකට කිපියාවූ සිතින් යුක්තව කයින් හෝ කය පිළිබඳ යමකින් හෝ නිස්සග්ගිය (වීසිකිරීමෙන්) වශයෙන් හෝ කෙසේ නමුත් පහරක් ගැසුව හොත් පචිතියෙක් වේ. යටත් පිරිසෙයින් මෙසේ උපුල් පතකින් ගැසුවත් පචිතිය වේ මැයි. මෙසේ ගැසුවිට අතක් හෝ පාදයක් බිඳුනත් හිස බිඳුනත් එයින්ම මැරුණත් මරණ චෙතනාවක් නොමැති නම් පචිතිය මැයි.

### සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීයයෝය. |
| වස්තු | - | ප්‍රහාරදනයයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තිකපාචිත්තියය. අනුපසම්පන්නයා කෙරෙහි තික දුක්කට යයි. විරූප කිරීමේ අදහසින් උපසපනෙකුට ගැසීමෙන්ද, කන් නාසාදිය කැපීමෙන් ද දුකුළා වේ. |

5. යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරෙය්‍ය පාචිත්තියං.

---

අනාපත්ති - කිසිවෙකු විසින් පීඩා කරණු ලබන කල්හි එයින් මිදෙන්නට ගසන්නාටද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නැති.

අඞ්ග - කුපිතතා, න මොක්ඛාධිප්පායතා, උපසම්පන්නස්ස පහාරදනන්ති අඞ්ග, තුණෙකි.

(සමුට්ඨානාදිය පඨම පාරාජිකාවේ මෙනි.)
මෙහි දුක්ඛ වේදනාවය.

---

## නිදාන කථාව

ෂඩ්වර්ගීය භික්ෂූහු කිපී නොසතුටු සිතින් සප්තරශ වර්ගීය භික්ෂූන්ට පහර දුන්හ. ඔවුහු ඇඬූහ. භික්ෂූහු කිම්දැයි ඇසූහ. එවිට පහරදුන් බැව් කීහ. එය තථාගතයන් වහන්සේට සැළ කළ කල්හි මේ ශික්ෂාපදය පැණවූ සේක.

**සහධාර්මික වර්ගයෙහි චතුර්ථ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

5. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: භික්ඛුස්ස: භික්ෂුවක් හට: කුපිතො, කිපියේ: අනත්තමනො, නොසතුටු සිත් ඇත්තේ: තලසත්තිකං, අත්සත්, උග්ගිරෙය්‍ය, ඔසවා නම්: පාචිත්තියං, පචිති වේ.

**සං**:- **"තලසත්තිකං"** (තල මෙව සත්තිකං; තලසත්තිකං; තැළීමට සුදුසුය යන අර්ථයෙන් 'සත්තික' යයි සමහරු කියති: (ටීකා) පහරදීම් ආකාරය දක්වමින් අතවත් කකුලවත් ඔසවයි ද, නැතහොත් අතින් ගත් දඬු ආදියක් එලෙස නගයි ද, ඒ තලසත්තිකය යි. ගැසීමට නැගීම් පමණකින් ම පචිතිය වේ.

යම්හෙයකින් පහරදීමට අදහසක් නැතත් එසවූ යමකින් පහරක් වැරදීමකින් වැදේ නම් දුකුළා වෙයි. ඒ පහරින් අත්පා ආදිය බිඳුනත් දුකුළාව මැයි.

(විස්තර හා සප්තදශාකාරය අනතුරු ශික්ෂාපදයෙහි කීසේයි.)

---

6. යො පන භික්ඛු භික්ඛුං අමූලකෙන සංඝාදිසෙසෙන අනුද්ධංසෙය්‍ය පාචිත්තියං.

---

# නිදාන කථාව

ෂඩ්වර්ගීයයෝ කිපී නොසතුටු සිතින් සප්තරශ වර්ගීයයන්ට තලසත්තිකය ඔසවති, ඔවුහු බියපත්ව ඇඬූහ. භික්ෂූහු මේ පරීක්ෂා කොට බුදුරජුන්වහන්සේට සැළ කළහ. එකල්හි මේ ශික්ෂාව පණවා වදළසේක්.

**සහධාර්මික වර්ගයෙහි පස්වෙනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

6. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; අමූලකෙන, දෘෂ්ට ශ්‍රැතාදී මූලක් නැත්තාවූ; සංඝාදිසෙසෙන, සඞ්ඝාදි සෙසාපත්තියකින්; භික්ඛුං, භික්ෂුවක් හට; අනුද්ධංසෙය්‍ය, චොදනා කෙරේ නම්; පාචිත්තියං, පචිති වේ.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | ඡවග්ගමහණෝය. |
| වස්තුව | - | අමූලක සඞ්ඝාදිසෙසයකින් අනුද්ධංසන යයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. |
| ආණත්ති | - | සාණත්තිකයයි. |
| ආපත්ති | - | තිකපාචිත්තියය. ආචාර විපත්තියෙන් හෝ දෘෂ්ටි විපත්තියෙන් හෝ චොදනා කරන්නහුට දුකුළා වේ. අනුපසම්පන්නයෙකුට චොදනා කිරීමෙන් තිකදුක්කටයෙකි. |
| අනාපත්ති | - | තථා සංඥීහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | උපසම්පන්නතා, සඞ්ඝාදිසෙසස්ස අමූලකතා, අනුද්ධංසතා, තං ඛණං විජානන්ති යි අඞ්ග සතරෙකි. |

(සමුට්ඨානාදිය අදින්නාදනයෙහි මෙනි.)

මෙහි දුක්ඛ වෙදනාවයි.

7. යො පන භික්ඛු භික්ඛුස්ස සංච්චච කුක්කුච්චං උප්පාදෙය්‍ය ඉතිස්ස මුහුත්තම්පි අඵාසු භවිස්සතීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං.

---

# නිදන කථාව

ෂඩ්වර්ගීය භික්ෂූන්වහන්සේ එක්තරා භික්ෂුවකට අමූලක සංඝාදි සෙසයකින් චොදනා කළහ. එකරුණ නිසා මේ ශික්ෂාපදය පණවා වදළ සේක.

**සහධාර්මික වග්යෙහි සවෙනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

7. **අථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; භික්ඛුස්ස, භික්ෂුවක් හට; සංච්චච, දැන දැන; ඉති, මෙසේ; අස්ස, මොහුට; මුහුත්තං අපි, මොහොතකුදු; අඵාසු භවිස්සති ඉති, අපහසු වන්නේයයි; එතං එව, එයම; පච්චයං කරිත්වා, ප්‍රත්‍යය කොට; අනඤ්ඤං, අනිකක් ප්‍රත්‍යය නොකොට; කුක්කුච්චං, කුකුසක්; උප්පාදෙය්‍ය, උපදවා නම්; පාචිත්තියං, පචිතිවේ.

**සං**:- "**කුක්කුච්චං උප්පාදෙය්‍ය**" යනු සැක ඇතිකරවීමයි. ටික වේලාවක් නමුත් සිත් තැවුල් කරවන අදහසින්ම "තොපට විසිවයස් අසම්පූර්ණ යයි සිතමි" කියාද, "තා විසින් බුදින ලද්දේ විකාලයේ යයි සිතමි" කියාද තා විසින් පානය කරණ ලද්දේ මද්‍යයයි සිතමි" කියාද, "මාගමක් සමග රහසිගතව තුඹ සිටියේයයි සිතමි" කියාද, කියමින් සැක ඇතිකර වූවහොත් දැන දැන කළ බැවින් වචනයක් පාසා පචිති වෙති.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | සවග මහණෝය. |
| වස්තුව | - | කුකුස් ඉපදවීමය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තිකපාචිත්තිය ය, අනුපසමපන්නයා කෙරෙහි "තික දුක්කට" වේ. |

8. යො පන භික්ඛු භික්ඛූනං භණ්ඩන ජාතානං කලහ ජාතානං විවාදපන්නානං උපස්සුතිං තිට්ඨෙය්‍ය යං ඉමෙ භණිස්සන්ති තං සොස්සාමීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තියං.

---

අනාපත්ති - තැවුල් නොඋපදවන අදහසින් හා විශ්වාස කමින් කියන්නහුටද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.

අඞ්ග - උපසම්පන්නතා, අථාසුකාමතා, කුක්කුච්චුප්පාද නන්ති, අඞ්ගු තුණෙකි.

(සමුට්ඨානාදිය අනන්තර ශික්ෂාපදයේ කීසේයි.)

---

# නිදාන කථාව

ෂඩ්වර්ගීය භික්ෂූහු සප්තරශ වර්ගීය භික්ෂූන්ට තෙපි උනු විසි වයස් ඇත්තෝය, තෙපිත් උපසම්පන්නයෝදැයි යනාදීන් කියා කුකුස් ඇති කරවූහ. ඔව්හු ඇඩුවාහුය. මෙකරුණ තථාගතයන් වහන්සේට සැල කරණ ලදින් බුදුහු මේ ශික්ෂාපදය අනුදත්හ.

**සහධාර්මික වර්ගයෙහි සත්වැනි ශික්ෂාපද වණ්නාව නිමි**.

---

8. **අථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; භණ්ඩන ජාතානං, උපන්ඩබර ඇත්තාවූ; කලහ ජාතානං, හටගත් කලහ ඇත්තාවූ; විවාද පන්නානං, (භණ්ඩන කොලා හලයෙන් වඩනලද) විවාදයට පැමිණියාවූ; භික්ඛූනං, භික්ෂූන්ගේ; යං, යමක්, ඉමෙ, මොවුහු; භණිස්සන්ති, කියන්නාහුද; තං, එය; සොස්සාමි ඉති, අසන්නෙමියි; එතං එව, එයම; පච්චයං කරිත්වා, කරුණු කොට; අනඤ්ඤං, අනිකක් නොකරුණු කොට (ගෙණ) උපස්සුතිං, (බස් ඇසෙන තන්හි) කණ සමීපයෙහි; තිට්ඨෙය්‍ය, සිටින්නේ නම්; පාචිත්තියං, පචිති වේ.

සං:- "උපස්සුතිං" යී (සූයතීති; සූති; "සූති" සවනෙ; සූතියා සමීපං; උපස්සුති, (අව්‍යයීභාව සමාසයයි.) නි ශබ්දයා කෙරෙන් "සම්ං" විභක්ති ලොපයයි.) "උපස්සුති" නම් ශ්‍රැති සමීපයයි ශබ්ද සමීපයයි. යම් තැනක සිටියහු විසින් ශබ්දය අසන්ට හැකි වෙයිද, එබඳු ස්ථානය ශබ්ද සමීපය වේ. නොහොත් "උපෙච්ච සූයති එත්ථාති; උපස්සුති" මෙයින් ස්ථානයක් කිය වේ. යම් තැනකට පැමිණියහු විසින් මන්ත්‍රණය කරන්නන්ගේ ශබ්දය අසන්නට හැකිවෙයිද එබඳු ස්ථාන උපස්සුතියයි.

සං:- "සොස්සාමීති" යනු මොවුන් විසින් කෙරෙණ කුමන්ත්‍රණ අසාගෙණ චොදනා කරන්නෙමියි සිතා පළමු කී ශ්‍රැති සමීපයෙහි හෝ සිට අසයිද, අසන්නෙමියි යෙයිද ඉදිරියෙහි යන්නවුන්ගේ බස් අසන්නෙමියි කිට්ටු කරන්ට වහා වහා යෙයිද, තමාට පසුව එන්නන්ගේ බස් ඇසීමට සෙමෙන් සෙමෙන් යෙයිද, මෙහි කී කොයි ආකාරයකින් ඇසුවත් පචිති වේ. අනුන්ගේ බස් අසන්නෙමියි සිතා යාමෙහි පියවරක් පියවරක් පාසා පචිති වෙති. කුමන්ත්‍රණකාරයෝ තමන් සිටි ස්ථානයට පැමිණ තමන් නොදක කුමන්ත්‍රණය කරන්ට ආරම්භ කළහොත් උක්කාසිත ශබ්දයෙන් හෝ මම මෙහි සිටිමියි කියා හෝ තමන් සිටින බැව් දන්විය යුතුයි. නො එසේ කළහොත් පචිතියෙන් නොමිදෙයි.

### සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | සවග මහණෝය. |
| වස්තුව | - | උපස්සුතියෙහි සිටීමයි. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. |
| ආණත්ති | - | අනාණත්තිකයයි. |
| ආපත්ති | - | තිකපාචිත්තියයි. අනුපසම්පන්නයන්ගේ නම් තික දුක්කටයයි. |
| අනාපත්ති | - | මොවුන්ගේ බස් අසා ඔරමනය කරන්නෙම් විරමණය කරන්නෙම් වූපසමනය කරන්නෙම් තෙමේ මුදවන්නෙමියි කියා යන්නහුට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ. |
| අඞ්ග | - | උපසම්පන්නතා, චොදනාධිප්පායො, සවණත්ති යි තුණෙකි. |
| සමුට්ඨාන | - | ථෙය්‍ය සත්ථ සමුට්ඨානයයි. |
| කිරියා | - | ක්‍රියා ක්‍රියා වශයෙනි. |
| සඤ්ඤ | - | සඤ්ඤ විමොක්ඛයයි. |
| චිත්ත | - | සචිත්තකයයි. |
| වජ්ජ | - | ලොකවජ්ජයයි. |
| කම්ම | - | කායකම් වචීකම් දෙකයි. |
| කුශලත්‍රිකය | - | අකුශල චිත්තයයි. |
| වෙදනාත්‍රිකය | - | දුක්ඛවෙදනාවයි. |

9. යො පන භික්ඛු ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයන ධම්මං ආපජ්ජෙය්‍ය පාචිත්තියං.

# නිදාන කථාව

ෂඩ්වර්ගීයයෝ ප්‍රිය ශීලී භික්ෂූන් සමග භණ්ඩනය කෙරෙති. පෙශල භික්ෂූහු ඔවුනට අලජ්ජිවාදයෙන් කියති. ෂඩ්වර්ගීයයෝ කුමක් නිසා අපට අලජ්ජීහුයයි කියත්දැයි විචාළාහුය. එය තෙපි කොතනකදී ඇසුවාදැයි ඇසූ කල්හි උපශ්‍රුතියෙහිදී ඇසූ බැව් කීහ. මේ නිමිත්ත කොට මේ ශික්ෂාපදය අනුදැන වදළසේකි.

**සහධාර්මික වර්ගයෙහි අෂ්ටම ශික්ෂාපද වණ්නාව නිමි.**

9. **අර්:-** යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; ධම්මිකානං, ධාර්මිකවූ (අපලොකනාදී චතුර්විධ) කර්මයන්ට; ඡන්දං, ඡන්දය; දත්වා, දී; පච්ඡා, පසුව; ඛීයනධම්මං, නුගුණකියන සවභාවයට; ආපජ්ජෙය්‍ය, පැමිණියේ නම්; පචිත්තියං, පචිති වේ.

**සං:-** "**ධම්මිකානං කම්මානං**" යනු ධර්මයටත් විනයටත් ශාස්තෘ ශාසනයටත් අවිරුඬ පරිදි කරණ ලද කර්මයෙකි. එබඳු ධාර්මික කර්ම සතරෙකි. එනම් - **අපලොකන කර්මය. ඥප්ති කර්මය. ඥප්ති ද්විතිය කර්මය. ඥප්ති චතුත්ථ කර්මය** යනුයි. කයින් හෝ සිතින් එකී භූත (සමගිවූ) සඞ්ඝයාගේ අනුමතියෙන් නුගුණ කීමාදීවූ ඒ ඒ වස්තු කිර්තනය කොට "රුච්චති සඞ්ඝස්ස" යි තෙවිටක් අස්වා කළ යුතු කර්මය "අපලොකනකර්ම" යයි.

එසේම සමගිවූ සඞ්ඝයාගේ කැමැත්තෙන් එක ඥප්තියකින් කළ යුතු කර්මය "ඥප්තිකර්ම" යයි. එසේම එක් ඥප්තියකින් හා අනුසාවනයකින් කළයුතු කර්මය "ඥප්ති ද්විතීය කර්ම"යි. එක ඥප්තියකින් හා අනුසාවණා තුණකින් කළ යුත්තේ "ඥප්තිය චතුත්ථ කර්ම" යයි.

නැවත, **ඔසාරණය. නිස්සාරණය. භණ්ඩුකම්මය. බ්‍රහ්මදණ්ඩය. කම්මලක්ඛණය**"යි අපලොකන කර්මය පංචවිධ වේ.

"**ඔසාරණය. නිස්සාරණය**" **උපොසථය. පවාරණය. සම්මතිය. දනය. පටිග්ගහණය. පච්චුක්කඩ්ඩනය. කම්මලක්ඛණ**" යයි ඥප්ති කර්මය නවවිධ වේ.

**ඔසාරණය. නිස්සාරණය. සම්මතිය. දනය. උද්ධාරය. දෙසනය. කම්මලක්ඛණ** යයි ඥප්ති ද්විතීය කර්මය සප්තවිධවේ.

**ඔසාරණය. නිස්සාරණය. සම්මතිය. දනය. නිග්ගහය. සමණුභාසනය. කම්මලක්ඛණයයි** ඥප්ති චතුර්ථ කර්මය සප්තවිධ වේ. (විස්තර අර්ථ කථාවෙන් දතයුතු)

**සප්තදශාකාරය**

නිදානය - සැවැත්නුවරය.
පුද්ගලයෝ - ඡබ්බග්ගීයයෝය.
වස්තුව - ඛීයන ධර්මාපජ්ජනයයි.
ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි.
ආණත්ති - අනාණත්තිකයයි.
ආපත්ති - තිකපාචිත්තියයි.
ධර්ම කර්මයෙහි වෙමතිකයාට ද, අධර්ම කර්මයෙහි ධර්ම කර්මයයි සංඥ ඇත්තහුට ද, ඒ සඳහා වෙමතිකයාට ද, දුකුළා වේ.
අනාපත්ති - අධර්මකර්මයයි සිතන්නාටද, අධර්මකර්මයෙන් හෝ වර්ග වශයෙන් හෝ කර්මකරණ බැව් දන නුගුණ කියන්නාට ද: කර්මාහීයාට කර්ම නො කරණ බැව් දන නුගුණ කියන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ.
අඞ්ග - ධම්මකම්මතා, ධම්මකම්ම සඤ්ඤිතා, ඡන්දං දත්වා ඛීයනන්ති, යි අඞ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදාන ශික්ෂාවෙහි මෙනි.)

---

# නිදාන කථාව

ඡබ්බග්ගීය භික්ෂූහු අනාචාරයෙහි හැසිර එකෙකුට ධර්ම විනය පරිදි කර්ම කරණ විට පටික්කොසනය කෙරෙති. එකල්හි සංඝ තෙමේ කිසියම් කටයුත්තක් සඳහා රැස්විය. ඡබ්බග්ගීයයෝ එකෙකුට ඡන්දය දී පිටත් කළහ. සංඝ තෙමේත් එද ඔහුට විනය කර්මයක් කෙළේය. හෙතෙම ඒ බැව් ඡබ්බග්ගීයයන්ට කීහ. ඇවැත්නි, තොපට කර්මයක් කරණ බැව් අපි නො දනිමු. කලින් දන ගත්තෝ නම් ඡන්දය නො දන්නෙමු යයි කීහ.

ඒ කරුණ දත් තථාගතයන් වහන්සේ නොයෙක් අයුරින් ඡබ්බග්ගීයයන් ගරහා මෙය අනුදන වදළ සේක්.

**සහධාර්මික වර්ගයෙහි නවවැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

10. යො පන භික්ඛු සඞ්ඝෙ විනිච්ඡය කථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමෙය්‍ය පාචිත්තියං.

---

**10. අර්:-** යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: සංඝෙ, සංඝයා කෙරෙහි: විනිච්ඡය කථාය වත්තමානාය, විනිච්ඡය කථාවක් පවත්නා කල්හි: ඡන්දං අදත්වා, ඡන්දය නොදී: ආසනා උට්ඨාය, හුනස්නෙන් නැගිට: පක්කමෙය්‍ය (කර්මකොප්‍යකරණුවස්) පිටත ගියේ නම්: පාචිත්තියං, පචිති වේ.

**සං:- "විනිච්ඡය කථාය වත්තමානාය"** මෙයින් ධර්මවිනය පරිදි කැරෙණ විනිශ්චයක් පවත්නා අවස්ථාවක් ප්‍රකාශ වේ.

වස්තු ආරෝචනය කොට චෝදක චුදිත දෙපක්ෂයෙහි කථා සමාප්ත කොට අනුවිජ්ජකයෙකු සම්මත කොට සාපත්තික බැවින් විනිශ්චය නොවූ කාලයත්, ඥප්තිය හෝ තබා කර්ම වාක්‍යය හෝ නොනිමි කාලයත් යන දෙකාලය විනිශ්චය කථා පවත්නා කාලයයි. යම් කිසි භික්ෂුවක් ඒ අතර කර්ම කොප්‍ය කරණු පිණිස පිරිසෙහි අත්පස හැරියේ නම් ඔහුට හස්තපාසවිජහනයෙන් දුකුලාවත්, බැහැර ගිය කල්හි පචිතියත් සිදුවෙති.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයා | - | එක්තරා භික්ෂුවකි. |
| වස්තුව | - | ඡන්දය නොදී බැහැර යාමය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. |
| ආණත්ති | - | අනාණත්තිකය යි. |
| ආපත්ති | - | තිකපාචිත්ති යයි. ධර්ම කර්මයෙහි වෙමතිකයාට ද, අධර්ම කර්මයෙහි ධර්ම කර්ම සඤ්ඤීහුටද, වෙමතිකයාට ද දුකුළා වේ. |
| අනාපත්ති | - | සඞ්ඝයාගේ භණ්ඩනාදිය වේය යි සිතා යන්නහුට ද, සඞ්ඝ භෙදදිය වේය යි සිතා යන්නහුට ද, අධර්මයෙන් හෝ, වර්ග වශයෙන් හෝ කර්මාර්හයාට කර්ම නොකරන්නේ යයි සිතා හෝ යන්නහුට ද, ගිලනෙකු සඳහා හෝ ගිලන්ව හෝ යන්නහුට ද, උච්චාර පස්සාව වලින් පීඩිතව යන්නහුට ද, නැවත ඒමට යන්නහුට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |

11. යො පන භික්ඛු සමග්ගෙන සංඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයන ධම්මං ආපජ්ජෙය්‍ය යථා සන්ථුතං භික්ඛු සංඝිකං ලාභං පරිණාමෙන්තීති පාචිත්තියං.

---

| | | |
|---|---|---|
| අඞ්ග | - | විනිච්ඡය කථාය වත්තමානතා, ධම්මකම්මතා, ධම්මකම්ම සඤ්ඤිතා, සමාන සීමායං ඨිතතා, සමාන සංවාසකතා, කොපෙතුකාමතාය හත්ථපාසං විජහනන්ති, අඞ්ග සයෙකි. |
| සමුට්ඨාන | - | සමනුභාසන සමුට්ඨාන යයි. |
| ක්‍රියා | - | ක්‍රියාක්‍රිය විසිනි. |
| සඤ්ඤ | - | සඤ්ඤ විමොක්ඛ යයි. |
| චිත්ත | - | සචිත්තක යයි. |
| වද්‍ය | - | ලොක වද්‍ය යයි. |
| කර්ම | - | කායකර්ම, වචීකර්ම, දෙකය. |
| කුශලත්‍රිකය | - | අකුශල චිත්ත යයි. |
| වෙදනාත්‍රිකය | - | දුක්ඛ වෙදනාව යි. |

# නිදාන කථාව

එක් සමයෙක්හි සඞ්ඝ තෙම කිසියම් කටයුත්තක් සඳහා රැස්විය. ඡබ්බග්ගීයයෝ කාගේත් ඡන්දය දී එක් නමක් පිටත් කළහ. සඞ්ඝයා රැස් වූ කාරණය ඉටුකිරීමට ඥප්තිය තැබිය. ෂඩ්වර්ගීයයන්ට අයත් ඒ භික්ෂුව ඡන්දය නොදී නැගිට ගියේය. එකරුණ නිමිත්ත කොට ගෙණ මේ ශික්ෂාව පණවන ලදී.

**සහධාර්මික වර්ගයෙහි දසවෙනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

11. **අර්ථ:-** යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; සමග්ගෙන, සමගිවූ; සංඝෙන, සංඝයා සමග; චීවරං, සිවුරක්; දත්වා, දී; පච්ඡා, පසුව; යථාසන්ථුතං, විශ්වාවාසය කළ පරිද්දෙන්; භික්ඛු, භික්ෂූහු; සංඝිකං ලාභං, සඟසතු ලාභය; පරිණාමෙන්තීති, පිරිණමත් යයි; ඛීයන ධම්මං, අගුණ කියන ස්වභාවයට; ආපජ්ජෙය්‍ය, පැමිණියේ නම්; පාචිත්තියං, පචිති වේ.

**සං:-** "**සමග්ගෙන සංඝෙන**" යී සමගි සංඝයා නම් සමාන සංවාසක සමාන සීමස්ථ සංඝයායි.

සං:- "**යථා සන්ථුතං**" යනු (සංථවනං - සන්ථුතං: සං, ත්‍රු, ථු, අභිත්‍ථ වෙ.) සන්ථුත ය නම් පුරුද්දයි. දකීම් ආශ්‍රය කිරීමාදියෙන් පුරුදු (මිත්‍ර) වූ යහළුවන් ගේ වශයෙන් යන අදහසයි. මිත්‍රයෝ තිදෙනකි. **මිත්ත, සන්දිට්ඨ මිත්ත, සම්භත්ත මිත්ත** කියා යි. දකීමෙන් කථා කිරීමෙන් සාමාන්‍ය විශ්වාසය දිනාගත්තේ "මිත්‍රයා"ය. ඒ ඒ තැන්වලදී හමුවී දකීම් පමණෙකින් දැඩි ප්‍රේමයක් ඇති කර ගත්තේ "සන්දිට්ඨ මිත්ත" නමි. එයටත් වඩා අධික සෙනහයක් දිනාගත්තේ "සම්භත්ත මිත්ත" නම් වේ. සහසතු යමක් මෙකී මිත්‍රයන්ගේ වශයෙන් විහිදුවන්ට නො හැකි වේ.

සංඝික වස්තුවල සඬඝයා අතර බෙදිය හැකි දේත් නොබෙදිය හැකි දේත් ඇත්තාහුය. පංච ගරු භාණ්ඩ හැර සෙසු සංඝික වස්තුව සඬඝයා අතර බෙදිය හැකි වේ. බෙදීමෙන් පසු පෞද්ගලික වේ. තම තමන්ගේ කොටස් කැමැති සේ පරිභොග කිරීම හෝ අනුන්ට දීම කළ හැකිවේ. පංචගරු භාණ්ඩ නො බෙදිය හැකි වෙති. (නො විහිදිය හැකි වෙති) බෙදුවත් සංඝිකම වෙති. එබැවින් ගරුභාණ්ඩ යම් අරමකට ලැබුන හොත් එහිම තබා සංඝික පරිභොගයෙන් පරිභොග කටයුතුයි.

පංචගරු භාණ්ඩයෝ නම්:- **1. ආරාමො, ආරාම වත්ථු: 2 විහාරො. විහාර වත්ථු: 3 මඤ්චො, පීඨං, භිසි, බිම්බොහනං: 4 ලොහකුම්භි, ලොහභාණකො, ලොහ වාරකො, ලොහ කටාහං, වාසි, ඵරසු, කුඨාරි, කුද්දලො, නිඛාදනං, 5 වල්ලි, වෙළු, මුඤ්ජ බබ්බජං, තිණපණ්ණං, දරුභණ්ඩං, මත්තිකා භණ්ඩං** යනුයි. මෙහි නොකී සියලුම ගරුභාණ්ඩ මේ රාශි පසට අනුලොම් වශයෙන් අයිති වෙති. විස්තර විනය අටුවාවෙන් බැලිය යුතුයි.

### සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදානය | - | රජගහ නුවරය. |
| පුද්ගලයෝ | - | ජබ්බග්ගියයෝය. |
| වස්තුව | - | සිවුරු දී පසුව බැණ වැදීමය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියය. |
| ආණත්ති | - | අනාණත්තිකයයි. |
| ආපත්ති | - | ධම් කම්යෙහි තිකපාචිත්ති යයි. සිවුරක් හැර බෙදිය හැකි පිරිකරක් දී පසුව බැණ වදින්නහුට "දුකුළා" වෙකි. අනුපසම්පන්නයෙකුට දී බැණ වදින්නහුට තික දුකුළාවෙකි. |

12. යො පන භික්ඛු ජානං සංඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය පාචිත්තියං.

**සහධම්මික වග්ගො අට්ඨමො.**

---

අනාපත්ති - ඡන්දදී වශයෙන් දීම කරන්නහු දක ඔහුට දීමෙන් කිම? ලැබගෙණ විනාශ කරන්නේ යයි යනාදීන් කියන්නාටද, උම්මත්තකාදීන්ටද, ඇවැත් නොවේ.

අඞ්ග - උපසම්පන්නතා, ධම්මෙන ලද්ධසම්මුතිතා, සඞ්ඝෙන සඞ්ඝං විකප්පනුපගචීවර දනං, පච්ඡා බීයතු කාමතාය බීයනතාති, අඞ්ග සතරෙකි.

(සමුට්ඨානාදිය අදින්නාදනයෙහි මෙනි.)

මෙහි 'දුක්ඛ' වෙදනාවය.

---

# නිදන කථාව

ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රතෙම සංඝයාට සෙනසුන් පණවයි. බත් උදෙසයි. එහෙත් උන්වහන්සේගේ සිවුරු දුර්වල වූහ. එකල්හි සංඝයාට සිවුරක් ලැබුනේය. එය සංඝයාගේ කැමැත්තෙන් දබ්බමල්ලපුත්හට දුන්හ. එයින් ඡබ්බග්ගියයෝ කිපී නුගුණ කියන්ට වූහ. එකරුණෙන් මේ ශික්ෂාපදය පණවන ලදී.

**සහධාර්මික වර්‍ගයෙහි එකොලොස්වැනි ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

---

12. **අර්‍ථ**:- යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි; ජානං, දන දන; පරිණතං, (සඟනට) පිරිණමන ලද; සංඝිකං, සඟසතු වූ; ලාභං, (චීවරාදී) ලාභයක්; පුග්ගලස්ස, පුද්ගලයෙකුට; පරිණාමෙය්‍ය, පිරිණැමුයේ නම්; පාචිත්තියං, පචිති වේ.

අට්ඨමො, අටවැනිවූ; සහධම්මික වග්ගො, සහධාර්මික වර්‍ගය යි.

සං:- මෙහි විස්තර තිස් නිසඟි පචිති කාණ්ඩයේ පරිණාමන ශික්ෂාපදයේ කී සේයි. වෙනස නම්:- එහි තමාට පරිණාමිත බැවින් නිසඟි පචිතිය වේ. මෙහි වෙන පුද්ගලයෙකුට පරිණාමිත බැවින් ශුද්ධ පාචිත්තිය වේ.

**සහධාර්මික වර්‍ගයෙහි ද්වාදශම ශික්ෂාපද වර්‍ණනාව නිමි.**

**අටවැනි සහධාර්මික වර්‍ගයයි.**

---

1. යො පන භික්ඛු රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස අනික්ඛන්ත රාජකෙ අනීහත රතනකෙ පුබ්බෙ අප්පටිසංවිදිතො ඉන්දඛීලං අතික්කමෙය්‍ය පාචිත්තියං.

---

1. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: මුද්ධාවසිත්තස්ස, (ක්ෂත්‍රියාභිෂෙකයෙන්) මස්තකාභිෂෙක කරණු ලැබුවා වූ: ඛත්තියස්ස රඤ්ඤො, ක්ෂත්‍රිය රජක්හුගේ; අනික්ඛන්ත රාජකෙ (පිටතට) නො නික්මුනු රජහු ඇති: අනීහත රතනකෙ, බැහැර නො කරණ ලද ස්ත්‍රීරත්නය ඇති; (සයනී සරයෙක්හි) පුබ්බෙ, පෙර: අප්පටි සංවිදිතො, (තෙමේ පැමිණියේ යයි) නො දන්වූයේ: ඉන්දඛීලං, එලිපත: අතික්කමෙය්‍ය, ඉක්මවූයේ නම්; පාචිත්තියං, පචිති වේ.

සං:- "**මුද්ධාවසිත්තස්ස**"යි. (මුද්ධනී අවසිත්තො: මුද්ධාව සිත්තො, තස්ස.) මෙයින් ක්ෂත්‍රියයන්ට අයත් අභිෂෙක විධියෙන් මස්තකයෙහි අභිෂෙක කරණ ලද (ඔටුනු පලන්) මිහිපතියෙක් ප්‍රකාශ වේ.

සං:- "**අනික්ඛන්තරාජකෙ**" යනු (අනික්ඛන්තො රාජා ඉතො සයනීසරතොති; අනික්ඛන්තරාජකං, තස්මිං.) (සමාසාන්ත යෙහි ක ප්‍රත්‍යය යි. බැහැර නොගිය රජහු ඇති සයනීසරය හෙවත් නිදන කාමරයයි.

සං:- "**අනීහතරතනකෙ**" යනු (අනීහතං රතනං ඉතො සයනීසරතොති අනීහතරතනකං; තස්මිං-) මෙහි "රතන" නම් මෙහෙසි යයි. පිටතට නොගිය මෙහෙසිය ඇති සයනී සරය මෙයින්ද ප්‍රකාශිතය.

සං:- "**ඉන්දඛීලං**" (ඛීලති ජනානං ගමනා ගමනං පටිඝාතෙතීති; ඛීලො, "ඛිල" පටිඝාතෙ. ඉන්දෙ එව ඛිලො; ඉන්දඛීලො නොහොත් ඉන්දෙ එව පදං ඛීපති එත්ථාති; ඉන්දඛීලො; "ඛීප" පෙරණෙ; පකාරයට ලකාරා දෙශයයි.) මෙය එලිපත, එසිකාස්ථම්භය; නුවර දෙර සවිකරණු වස් සිටුවන ලද කණුව යන මොවුන්ට ව්‍යවහාර කෙරෙති. මෙහි "එලිපත" සඳහා යෙදිනි.

යම් කිසි භික්ෂුවක් තෙම අභිෂෙක ලත් ක්ෂත්‍රිය රජුගේ ශ්‍රී යහන් ගබඩාවට (නිදන කාමරයට) රජය මෙහෙසිය යන දෙදෙනාම හෝ එක් කෙනෙක් හෝ බැහැර නොගොස් අභ්‍යන්තර යෙහි සිටින විට තමන් පැමිණි බැව් නො දන්වා සයනීසරයෙහි එලිපත ප්‍රථම පාදයෙන් ඉක්ම වුවහොත් දුකුළා වේ. දෙවෙනි පාදය තැබූ කෙණෙහි පචිතිය වේ. යටත් පිරිසෙයින් වස්ත්‍රයෙන් වටකළ තැනක සිටිත් නම් එහි ද නොයා යුතුයි.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයා | - | ආයුෂ්මත් ආනන්‍ද ස්ථවිරයන් වහන්සේය. |
| වස්තුව | - | රජුගේ අන්තඃ පුරයට පිවිසීමය. |
| ප්‍රඥප්තිය | - | අසාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තික පාචිත්තිය ය. අභවන ලද කල්හි නො අභවන ලද යයි සිතන්නාට ද, වෙමතිකයාට ද, දුකුළාවේ. |
| අනාපත්ති | - | පටිසංවිදිත සංඥ ඇත්තහුට ද, ක්‍ෂත්‍රිය නො වූවෙකුගේ හෝ ඔටුනු නොපලන් කෙනෙකුගේ හෝ, සයනීඝරයට යන්නහුට ද, දෙදෙනම හෝ එක්කෙනෙක් හෝ පිටවී ගිය සයනීඝරයට යන්නාටද, නො නිදන කාමරයට යන්නහුටද, උම්මත්තකාදීන්ට ද, ඇවැත් නොවේ. |
| අඞ්ග | - | ඛත්තියතා, අභිසිත්තතා, උභිතනම්පි සයනී ඝරතො අභික්කන්තතා, අප්පටිසංවිදිතතා, ඉන්‍දඛීලා - තික්කමො'ති අඞ්ග පසෙකි. |

(සමුට්ඨානාදිය ප්‍රථම කඨිනයෙහි මෙනි.)
මෙහි ක්‍රියා'ක්‍රිය වශයෙනි.

# නිදන කථාව

ආයුෂමත් ආනන්‍ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ අනුදැනීමෙන් කොසොල් රජුගේ අන්තඃපුරයෙහි කලින් කල ධර්‍මදෙශනා කළසේක. එක් දවසක් ආයුෂ්මත් ආනන්‍ද ස්ථවිරයන් වහන්සේ පෙරවරු කාලයෙහි කොසොල් රජුගේ නිවසට වැඩිසේක. එකල්හි කොසොල් රජතෙම මල්ලිකා දෙවියන් සමග සයනයෙහි සිටියේය. මල්ලිකා දෙවීතොමෝ දුරදීම එන්නා වූ තෙරුන් වහන්සේ දක වහා නැගිට්ටාය. එහෙත් තෙරුන් වහන්සේ එයින් පෙරළා ආරාමයට වැඩිසේක. මෙය දන වදළා වූ භාග්‍යවතුන් වහන්සේ අන්තඃපුරයට පිවිසීමෙන් වන්නා වූ ආදීනව දශයක් වදරා මේ ශික්‍ෂාපදය අනුදත් සේකි.

**රාජ වර්‍ගයෙහි ප්‍රථම ශික්‍ෂාපද වර්‍ණනාව නිමි.**

2. යො පන භික්ඛු රතනං වා රතන සම්මතං වා අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා පාචිත්තියං.

රතනං වා පන භික්ඛුනා රතන සම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගණ්හාපෙත්වා වා නික්ඛිපිතබ්බං යස්ස භවිස්සති සො හරිස්සතී ති. අයං තත්ථ සාමීචි.

---

2. **අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: රතනං වා, රත්නයක් හෝ: රතන සම්මතං වා, (වස්ත්‍රාදී) රත්න යයි සම්මත කරණ ලද වස්තුවක් හෝ: අජ්ඣාරාමා වා, ආරාමය ඇතුළත දී හෝ: අජ්ඣාවසථා වා, ආවාස ගෘහයෙක්හි හෝ: අඤ්ඤත්‍ර, අන්තැනකින් හෝ: උග්ගණ්හෙය්‍ය වා, (තෙමේ) ඔසවා ගත්තේ නම් හෝ: උග්ගණ්හාපෙය්‍ය වා, (අනුන් ලවා) ඔසවවා ගත්වා නම් හෝ: පාචිත්තියං, පචිති වේ.

භික්ඛුනා පන, භික්ෂුවක් විසින් වනාහී: රතනං වා, රත්නයක් හෝ: රතන සම්මතං වා, රත්නයයි සම්මත කරණ ලද්දක්: හෝ: අජ්ඣාරාමෙ වා, ඇතුලු අරමෙන් හෝ: අජ්ඣවසෙථ වා, ඇතුලු ගෙයින් හෝ: උග්ගහෙත්වා, ඔසවාගෙණ හෝ: උග්ගණ්හා පෙත්වා වා (අනුන් ලවා) ඔසවා වා ගත්වා හෝ: යස්ස, යමෙකුගේ භවිස්සති, (අයිතිය) වන්නේද: සො, හෙතෙම, හරිස්ස තීති, ගෙණයන්නේ යයි: නික්ඛිපිතබ්බං, බහා තැබිය යුත්තේය: තත්ථ, එහි: අයං, මේ: සාමීචි, (පිළිපැදිය යුතු) වතයි.

සං:- "**රතනං**" යනු මිනිසුන්ගේ උපභොග පරිභොගයට ගන්නා මහාර්‍ඝ දුර්ලභ වස්තුවකි. අත්ථකථාචාර්‍ය්‍යවරයෝ "**චිත්තීකතං මහග්ඝඤ්ච අතුලං දුල්ලභ දස්සනං අනොම සත්ත පරිභොගො රතනන්ති පවුච්චති**" යි කීහු. මෙහි කී රත්න දශවැදෑරුම් වෙති. එනම්:- මුක්තා, මණි, වෙළුරිය, සඞ්ඛ, සිලා, පවාල, රජත, ජාතරූප, ලොහිතඞ්ක, මසාරගල්ල කියායි.

සං:- "**අජ්ඣාරාමෙ**" මෙහි අජ්ඣාරාමය නම් - ප්‍රාකාරාදියකින් පිරිකෙව් කරණ ලද අරමක් නම්, ප්‍රාකාරාදියෙන් වට කෙරෙණු පෙදෙසයි. එසේ පිරිකෙව් නොකළ අරමක නම් ගල් දෙකක දුර වටේටම අජ්ඣාරාමයයි.

සං:- "**ආවසථෙ**" මෙහි ආවසථය නම්:- වැටකින් හෝ වෙන ක්‍රමයකින් වට කරපු ගෙයක් නම්, ඒ වැටවල් ආදියෙන් ඇතුළත ආවසථ යයි. එසේ නැතහොත් දෙරකඩ සිට මොහොලක් විසි කළ විට එය වැටුන තැනින් ඇතුළත "ආවසථ" යයි.

### සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයා | - | අන්‍යතර භික්ෂුවකි. |
| වස්තුව | - | රත්න පිළිගැණීමය. |
| ප්‍රඥප්තිය | - | සාධාරණ ප්‍රඥප්තියයි. අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා, අජ්ඣාවසථා වා'යි අනුප්‍රඥප්ති දෙකකි. |
| ආණත්ති | - | සාණත්තිකයයි. |
| ආපත්ති | - | තිකපාචිත්ති යයි. අනුඤ්ඤාතස්ථානයෙහි අනාදරයෙන් රැගෙණ නික්ෂෙප නොකරන්නහුට දුකුළාවෙකි. |
| අනාපත්ති | - | විශ්වාස වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ ගන්නහුටද, පාංශුකූල සංඥවෙන් ගන්නහුට ද, උමමත්තකාදීන්ට ද, ඇවැත් නොවේ. |
| අඞ්ග | - | අනනුඤ්ඤාතකාරණං, පරසන්තකතා, විස්සාස ගාහ පංශුකූල සඤ්ඤානං අභාවො, උග්ගහනංවා උග්ගහාපනංවා'යි අඞ්ග සතරෙකි. |

(සමුට්ඨානාදිය සඤ්චරිත්ත ශික්ෂාවෙහි කීසේයි.)

---

## නිදන කථාව

එක්තරා භික්ෂුවක් තෙම අචිරවතියෙහි ස්නානය කෙළේය. එක්තරා බ්‍රාහ්මණයෙක් ද එහිම නහා පන්සියයකින් යුත් මුදල් පසුම්බියක් එහි දමා ගියේය. එය නැතිවේ යයි සිතා ඒ භික්ෂුව රැගෙණ එන අතර හිමියා හමුවී දුන්නේය. බ්‍රාහ්මණයා ද භික්ෂුවට චොදනා කරණු සඳහා එහි මුදල් අඩු බැව් කීය. ඒ දත් බුදුහු "**යො පන භික්ඛු රතනං - පෙ - පාචිත්තියං**" යී අනුදත්හ. විශාඛා උපාසිකා තොමෝ මේලපලඳනාව ආරාමයෙහි අමතක කොට ගියාය. එය භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට කීහ. එකල්හි එය ආරක්ෂාකොට දිය යුතුයයි කියා. 'අනුජානාමි - පෙ - සො හරිස්සති' යී වදරා අඤ්ඤත්‍ර අජ්ඣාරාමා, යන ප්‍රඥප්තිය අනුදත්සේකි.

එක්තරා ගෘහපතියෙක් සඞසයා වලඳවනාතර ඇඟිලි මුද්ද ගලවා තැබීය. හෙතෙම කිසියම් කටයුත්තක් සඳහා සඞසයා වලඳද්දී මුදුව

3. යො පන භික්ඛු සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසෙය්‍ය අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා පාචිත්තියං.

---

අමතක කොට ගෙයින් පිටවී ගියේය. මුදුව නැතිවේය යන බියෙන් භික්ෂූහු සවස්වන තුරුම එහි සිටියේය. ඒ දත් තථාගතයෝ දෙවෙනි අනු ප්‍රඥප්තිය වදළහ.

**රාජ වර්ගයෙහි දෙවෙනි ශික්‍ෂාපද වර්‍ණනාව නිමි.**

---

**3. අර්ථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; සන්තං (ආරාමයෙහි දෙළොස් රියනකින් ඇතුළත) විද්‍යමානවූ (සිටින්නාවූ) භික්ඛුං, භික්ෂුවක්; අනාපුච්ඡා, ('විකාලෙගාමප්පවෙසනං පුච්ඡාමි' යනාදීන්) නොපිළිවිස; විකාලෙ, විකාලයෙහි; තථාරූපා, එබඳුවූ; අච්චායිකා, ඉක්මන්වූ; කරණීයා අඤ්ඤත්‍ර, කටයුත්තක් නැතිව; ගාමං, ගමකට; පවිසෙය්‍ය, පිවිසියේ නම්; පාචිත්තියං, පචිති වේ.

**සං**:- "**විකාලෙ**" මෙහි විකාලය නම් - මධ්‍යාහ්න කාලයේ සිට අරුණොද්ගමණය තෙක් ඇති කාලයයි. මෙකී කාලය ඇතුළත 'ගාමප්පවෙසනං පුච්ඡාමි' යනාදීන් නොවිචාරා ආවශ්‍යකවූත් ඉක්මන් වූත් කරුණුත් නැතිව ආරාමයෙහි සිටින භික්ෂුවකට නොදන්වා ග්‍රාම ප්‍රවේශය කරන්නාවූ භික්ෂුවට පචිති ඇවතක් වේ. භික්ෂූහු රාශියක් ග්‍රාම ප්‍රවේශය කරත්හොත් ඔවුනොවුන්ම විචාරිය යුතුයි.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | ඡබ්බග්ගීයයෝය. |
| වස්තුව | - | විකාලයෙහි ග්‍රාමප්‍රවේශයයි. |
| පඤ්ඤත්ති | - | අසාධාරණ ප්‍රඥප්තියයි. 'සන්තං භික්ඛුං' කියාද, 'අනාපුච්ඡා' කියාද, 'තථාරූප අච්චායිකා' කියාද අනුප්‍රඥප්ති තුණෙකි. |
| ආණත්ති | - | අනාණත්තිකයයි. |
| ආපත්ති | - | තිකපාචිත්තියයි. කාලයෙහි විකාල සංඥිහුටද, ඒ ගැණ වෙමතිකයාටද, 'දුකුළා' වෙකි. |

අනාපත්ති - කාල සංඥ ඇත්තහුට වනාහි ඉක්මන් කටයුත්තක් සඳහාත් ආවශ්‍යක කරුණක් සඳහාත් යන්නහුටද, වෙන භික්ෂුවකට දන්වා යන්නහුටද, අන්තරාරාම භික්ඛුනූපස්සය තිත්ථිය සෙය්‍යා පටික්කමනයන් අතුරෙන් එක්තරා තැනකට යන්නහුටද; ගම මැදින් මග වෙයි නම් එයින් යන්නහුටද, ආපදවන්හි යන්නහුටද, උම්මත්තකාදීන්ටද ඇවැත් නොවේ.

අඞ්ග - සන්තං භික්ඛුං ආපුච්ඡනං, අනුඤ්ඤාත කාරණා භවො විකාලෙගාමප්පවෙසනං යි අඞ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය කඨින සමුට්ඨානාදිය මෙනි.)
මෙහි ක්‍රියා ක්‍රියායි

## නිදාන කථාව

ඡබ්බග්ගීයයෝ විකාලයේ ගම් වැද සභාවලදී 'රාජකථා' ආදී තිරිසන් කථාවන් කෙරෙති. මනුෂ්‍යයෝ එයින් කිපියාහු භික්ෂූන්ට නිගාකරන්ට වූහ. ඒ දත් තථාගතයන්වහන්සේ 'යො පන භික්ඛු = පෙ = පාචිත්තියං යි අනුදත්සේක.

නැවත බොහෝ භික්ෂූහු කොසොල් රට සිට සැවැත් නුවරට යෙති. සවස් කාලයේ එක්තරා ගමකට ගියාහුය. එගම්වාසීහු අසුන් පණවා දීමාදියෙන් උපස්ථාන කරණු පිණිස නවතින්ටයයි ආරාධනා කළාහුය. එහෙත් එය නොපිළිගත්හ. එදින රෑ මගදී උන්වහන්සේලාට චෞරොපද්‍රවයක් විය. ඒ දත් බුදුහු **"අනුජානාමි භික්ඛවෙ ආපුච්ඡා විකාලෙ ගාමං පවිසිතුං"** යි වදරා 'අනාපුච්ඡා' යන අනුප්‍රඥප්තිය අනුදත්හ.

නැවත එසේම එක්තරා භික්ෂුවකට සොරු උපද්‍රව කළහ. ඒ දත් බුදුහු **"අනුජානාමි භික්ඛවෙ සන්තං භික්ඛුං ආපුච්ඡා විකාලෙ ගාමං පවිසිතුං"** යි වදරා 'සන්තං භික්ඛුං' යනු අනුප්‍රඥප්තිය අනුදත්හ.

නැවත එක් අරමක භික්ෂුවක් සර්පයෙක් දෂ්ට කළේය. එහි හුන් අනික් භික්ෂුව ගිහි ගෙණෙන්නට කලින්ම ගියේය. සර්පයා විසින් දෂ්ට කරණු ලැබූ භික්ෂුව කියා යන්ට කෙණෙක් නැති නිසා සර්ප විෂහරණ යට සුදුසු පිළියම් කරන්ට ගමට නොගියේ ය. ඒ දත් බුදුහු **"අනුජානාමි භික්ඛවෙ තථාරූපෙ අච්චායිකෙ කරණීයෙ සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසිතුං"** යි වදරා 'තථාරූපෙ අච්චායිකෙ කරණීයෙ' අනුප්‍රඥප්තිය අනුදත්හ.

**රාජ වර්ගයෙහි තෘතීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

4. යො පන භික්ඛු අට්ඨිමයං වා, දන්තමයං වා විසාණමයං වා සූචිඝරං කාරාපෙය්‍ය භෙදනකං පාචිත්තියං

---

4. **අථ**:- යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි: අට්ඨිමයං වා, අස්ථිමය වූ (ඇටයෙන් කරණ ලද්දවූ) හෝ: දන්තමයං වා, (හස්ති දන්තාදී) දන්තමයවූ (දන්තයෙන් කරණ ලද්දවූ) හෝ: විසාණමයං වා, (මුව අං ආදී) අඟින් කරණ ලද්දවූ හෝ, සූචිඝරං, ඉදිකටු කුලාවක්: කාරාපෙය්‍ය, කරවූයේ නම්: භෙදනකං, බිඳීම කරන්නාවූ හෙවත් බිද දමා දෙසිය යුතුවූ: පාචිත්තියං, පචිතිය වේ.

**සඃ**- **"භෙදනකං"** යනු (භෙදන මෙව-භෙදනකංඃ භෙදනං අස්ස අත්ථීති: භෙදනකං) පළමුකොට බිඳදමා පසුව ඇවැත් දෙශනා කළයුතු බැවින් මීට භෙදනක පාචිත්ති යයි කියනු ලැබේ.

මෙබඳු සූචිඝරයක් කරන්ටවත් කරවන්ටවත් නොවටී. දූකුළාවක් විය හැකි බැවිනි. මෙබඳු සූචිඝරයක් කරවා ගතහොත් එය බිඳදමා ඇවැත් දෙශනා කරගත යුතුයි.

**සප්තදශාකාරය**

නිදනය - ශාක්‍යදනව්වය.

පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුය.

වස්තුව - සූචිඝර විඥපනයයි.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියයි.

ආණත්ති - සාණත්තිකයයි.

ආපත්ති - චතුක්ක පාචිත්තියයි. ඒ මෙසේයි. (තමන් විසින් අඩාල කරණලද සූචිඝරයක් තෙමේම සමාප්ත කෙරෙයිද, තමන් විසින් අඩාල කරණ ලද්දක් අනුන් ලවා සමාප්ත කෙරවයිද, එසේම අනුන් විසින් විප්පකතයක් තෙමේ සමාප්ත කෙරෙයිද, අනුන් විසින් අඩාල කරණ ලද්දක් අනුන් ලවා සමාප්ත කරවයිද, මෙකී ක්‍රම චතුස්කයෙන් පචිති සතරක් වෙති. මේ චතුක්ක පාචිත්තියයි.)

අනිකෙකු සඳහා කිරීම කරවීමෙන්ද, අනුන් විසින් කරණ ලද්දක් ලැබී පරිභොග කිරීමෙන්ද දුකුළා වෙයි.

අනාපත්ති - ගණ්ඨික අරණිකාදී ඇටවලින් කරන්නහුටද, උම්මත්තකාදීන්ටද, ඇවැත් නැත්තේ ය.

අඞ්ග - සූචිඝරතා, අට්ඨිමයාදිතා, අත්තනො අත්ථාය කරණං වා කාරා පෙත්වා පටිලාභොති, යි අඞ්ග තුණෙකි.

(සමුට්ඨානාදිය සඤ්චරිත්ත ශික්ෂාපදයේ මෙනි.)

---

# නිදාන කථාව

එක්තරා දන්ත කම් කරන්නෙකු විසින් ආයුෂ්මතුන් වහන්සේලාට සූචිඝරවලින් ප්‍රයෝජන ඇති විටෙක මට දන්වන්නයයි පවරණලදී. එකල්හි බොහෝ භික්ෂූහු සූචිඝර කරදෙන්ට යයි කීහ. මහත් සූචිඝර කරදෙන්ටයයි කියාද කුඩා සූචිඝර ඇත්තෝ මහත් සූචිඝර කරදෙන්ට යයි කියාද නිතර පවරති. මෙයින් ඒ කම්කරුවාට විකිණියයුතු බඩු සාදන්නට නොහැකි වෙයි. ඒ නිසා තෙමේත් අඹුදරුවෝත් කලාන්ත වෙති.

මෙකරුණ දත් තථාගතයන්වහන්සේ මේ ශික්ෂාපදය අනුදන වදළසේකි.

**රාජ වර්ගයෙහි චතුත්ථ ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

5. නවං පන භික්ඛුනා මඤ්චං වා පීඨං වා කාරයමානෙන අට්ඨඞ්ගුල පාදකං කාරෙතබ්බං සුගතඞ්ගුලෙන අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියා තං අතික්කාමයතො ඡේදනකං පාචිත්තියං

---

5. **අර්ථ**:- නවා: අළුත්වූ මඤ්චං වා, ඇඳක් හෝ: පීඨං වා, පුටුවක් හෝ: කාරය මානෙන, කරවන්නාවූ: භික්ඛුනා පන, භික්ෂුව විසින් වනාහි: හෙට්ඨිමාය අටනියා අඤ්ඤත්‍ර, යට ප්‍රතිපාදය (ඇඳවත) හැර, සුගතඞ්ගුලෙන, සුගත් අඟුලෙන්: අට්ඨඞ්ගුලපාදකං, අටඟුල් පා ඇති කොට හෙවත් අට අඟුල් පාද ඇත්තක්: කාරෙතබ්බං, කරවිය යුත්තේය: තං, ඒ ප්‍රමාණය: අතික්කාමයතො, ඉක්මවන්නාහට: ඡේදනකං පාචිත්තියං, බිඳීම කරන්නා වූ පාචිත්තියක් වේ.

**සං**:- සුගත් අඟුලෙන් අට අඟුලකට වඩා දික් පා ඇති ඇඳක් වත් පුටුවක් වත් ලැබුනොත් ඇඳවතේ යට මට්ටමේ (හුලගේ) සිට අටඟුල මැන පා සතරේම වැඩි කොටස් කපා දමා හෝ යම් තැනක එකී ඇඳ පුටු තබත් හොත් වැඩි කොටස් පොළව සාරා යට කොට හෝ පරිභොග කටයුතුයි:

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයා | - | උපනන්ද තෙරණුවෝය. |
| වස්තුව | - | උස් ඇඳෙහි සයනය කිරීමය. |
| අනාපත්ති | - | ප්‍රමාණ වූවක් කරන්නාට ද, ප්‍රමාණය ඉක්ම වූවක් ලැබ වැඩි කොටස් කපා දමා හෝ යට කොට හෝ පරිභොගකරන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවත් නොවේ. |
| අඞ්ග | - | පමාණාතික්කන්ත මඤ්චපීඨතා අත්තනො අත්ථාය කරණං කාරාපෙත්වා වා පටිලාභො'ති, අඞ්ග දෙකෙකි. |

(මෙහි නොකී සියල්ල අනතුරු ශික්ෂාපදයෙහි මෙනි.)

# නිදන කථාව

ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙමේ උස් ඇඳක සයනය කෙරෙයි. දිනක් භික්ෂූන් සමග සෙනාසන චාරිකාවෙහි වඩින්නා වූ තථාගතයන් වහන්සේ මුන්වහන්සේගේ විහාරයට වැඩිසේක. එකල්හි තමන්ගේ සයනය බලන්නට වඩින ලෙස තථාගතයන් වහන්සේට කීයේය.

6. යො පන භික්ඛු මඤ්චං වා පීඨං වා තූලොනද්ධං කාරාපෙය්‍ය උද්දාලනකං පාචිත්තියං.

---

භාග්‍යවතුන් වහන්සේ අදහස ලෙසින්ම මොස පුරුෂයා දතයුතු යයි එහිදීම භික්‍ෂූන් අමතා මේ ශික්‍ෂාපදය අනුදත් සේක.

### රාජ වර්‍ගයෙහි පස්වන ශික්‍ෂාපද වර්‍ණනාව නිමි.

---

6. **අර්‍ථ**:- යො පන භික්ඛු, යම් භික්‍ෂුවක් තෙම වනාහි: මඤ්චං වා, ඇඳක් හෝ: පීඨං වා, පුටුවක් හෝ: තූලොනද්ධං, පුලුනෙන් වැසීමක් කොට: කාරාපෙය්‍ය, කරවූයේ නම්: උද්දාලනකං, ගලවා දැමීම කරන්නා වූ: පාචිත්තියං, පාචිතියක් වේ.

**සං**:- "**තූලොනද්ධං**" (තූලං ඔනද්ධමෙත්ථාති- තූලොනද්ධං) මෙහි තූලොනද්ධය නම්:- පුලුන් ඇතුලට දමා කුසිම් කිරීම ය. පුලුනින් කළ බිම්බොහන (කොට්ට) හැර මෙට්ට, කුසින් ආදිය කැප නොවේ. කොට්ටයද සීස ප්‍රමාණයෙන් කළ යුතුයි. පුලුලින් මිටිරියනක් හා දිගින් එක්රියන් භාගයක් හෝ දෙරියනක් තබා කොට්ට සැදිය යුත්තාහුය. මෙයට වඩා දිග පුලුල් කොට්ට නොකැපයහ, මෙයට වඩා කුඩා වුවද පරිභොගයට වටී.

ගිලනාට කොට්ට අතුරා මත්තෙහි ඇතිරිල්ලක් එලා සයනය කටන්නට වටනේය.

### සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත්නුවරය. |
| පුද්ගලයෝ | - | ඡබ්බග්ගියයෝය. |
| වස්තුව | - | තූලොනද්ධ කාරාපන යයි. |
| අනාපත්ති | - | අයොගයෙහිද, කායබන්ධනයෙහිද, අංසවට්ටකයෙහිද, පත්තත්ථවිකාවෙහිද, පරිස්සාවනයෙහිද බිම්බො හනයෙහිද, පුලුනින් කුසම් කරණ ලද්දක් ලැබී කුසිම් ගලවා දමා පරිභොග කරන්නාට ද, උම්මත්තකාදීන්ට ද, ඇවත් නොවේ. |
| අඩ්ග | - | තූලොනද්ධමඤ්චපීඨතා, අත්තනො අත්ථාය කරණංවා කාරාපෙනංවා වා පටිලාභො ති අඞ්ග දෙකකි. |

(නොකී සියල්ලම පූර්වසර ශික්‍ෂාපදයෙහි කීයේ යි.)

7. නිසීදනං පන භික්ඛුනා කාරය මානෙන පමාණිකං කාරෙතබ්බං, තත්‍රිදං පමාණං දීඝසො ද්වෙ විදත්ථියො තිරියං දියඩ්ඪං දසා විදත්ථි තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියං.

---

# නිදන කථාව

සවග භික්‍ෂූහු පුලුනින් ඇඳ පුටු කුසිම් කොට පරිභොග කෙරෙති. ශ්‍රද්ධාවත් මනුෂ්‍යයෝ එයින් නො පහන්ව භික්‍ෂූන්ගේ නුගුණ කීහ. එය දත වදළ තථාගතයන් වහන්සේ මේ ශික්‍ෂාපදය වදළ සේක.

**රාජ වර්ගයෙහි සවෙනි ශික්‍ෂාපද වර්ණනාව නිමි.**

---

7. **අථ:- නිසීදනං** පන, හිඳිනා ඇතිරියක් වනාහි: කාරය මානෙන, කරවන්නාවූ, භික්ඛුනා පන, භික්‍ෂුව විසින් වනාහි: පමාණිකං, පමණින් යුක්ත කොට: කාරෙතබ්බං, කරවිය යුතුයි. තත්‍ර, එහි: ඉදං මේ: පමාණං, පමණ යි. දීඝසො, දිගින්: සුගත විදත්ථියා, සුගත් වියතින්: ද්වෙ: විදත්ථියො, දෙවියතෙක, තිරියං, සරස, දියඩ්ඪං, එක් වියත් හමාරය: දසා, දවල්ල: විදත්ථි, වියතය: තං, ඒ ප්‍රමාණය: අතික්කාමයතො, ඉක්ම වන්නාට: ඡෙදනකං පාචිත්තියං, බිඳීම කරන්නා වූ පචිතිය වේ.

**සං:-** "**නිසීදන**" යනු "නිසීදන්ති එත්ථාති-නිසීදනං" කී බැවින් භික්‍ෂූන් හිඳීමට ගන්නා පිරිකරකි. මෙයත් සන්ථතය සමාන වූවකි. මෙය සන්ථරණය කොට එක් කෙළවරක සුගත් වියතක් පමණ දෙතැනකින් පලා දවලු තුනක් තබා කරගත යුත්තෙකි. කායගුප්තිය, චීවරගුප්තිය හා සෙනාසන ගුප්තිය සඳහා මෙය අනු දන්නා ලදී.

**සප්තදශාකාරය**

| | | |
|---|---|---|
| නිදානය | - | සැවැත් නුවරය |
| පුද්ගලයෝ | - | ෂඩ්වර්ගීය භික්‍ෂූහුය. |
| වස්තුව | - | ප්‍රමාණ රහිත නිසීදන දැරීමය |
| ප්‍රඥප්තිය | - | අසාධාරණ ප්‍රඥප්තිය. |
| | | 'දසා විදත්ථි' යනු අනු ප්‍රඥප්තිය ය. |
| අනාපත්ති | - | ප්‍රමාණ වූවක් හෝ පමණින් අඩුවූවක් කරන්නහුටද, අනෙකෙකු විසින් කළ පමණ |

8. කණ්ඩු පටිච්ඡාදිං පන භික්ඛුනා කාරයමානෙන පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං දීඝසො චතස්සො විදත්ථියො සුගත විදත්ථියා තිරියං ද්වෙ විදත්ථියො; තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියං,

---

ඉක්මවූවත් ලැබ් ඡෙදනය කොට පරිභොග කරන්නාට ද, විතානාදි යමක් කරන්නාට ද, ඇවත් නොවේ.

අඞ්ග - නිසීදන පමාණාතික්කන්තතා, අත්තනො අත්ථාය කරණං වා කාරාපෙත්වා වා පටිලා හො'ති කියා අඞ්ග දෙකකි.

(සෙස්ස පළමු කී පරිදි දත යුතුයි.)

---

## නිදන කථාව

භාග්‍යවතුන් වහන්සේ නිසීදනය අනුදැන වදාළ කල්හි ඡබ්බග්ගීයයෝ පමණ ඉක්ම ගිය නිසීදන දරති. ඇඳ පුටුවල ඉදිරියෙන් හා පසෙන් ද එල්බෙති. ඒ බැව් දත් තථාගතයන් වහන්සේ මේ ශික්ෂාපදය අනුදත් සේක.

එකල්හි උදායි තෙරණුවෝ මහ කයක් ඇත්තෝය. උන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි නිසීදනය පණවා හාත්පස (වටේට) අදිමින් සිටියාහුය. මේ කරුණ නිසා 'දසා විදත්ථි' යන අනු ප්‍රඥප්තිය අනුදත් සේකි.

**රාජ වර්ගයෙහි සත්වැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

8. **අර්ථ:-** කණ්ඩු පටිච්ඡාදිං, කස් පිළිසන් සිවුරක්; කාරය මානෙන, කරවන්නා වූ, භික්ඛුනා පන, භික්ෂුව විසින් වනාහි පමාණිකා, පමණින් යුක්ත කොට; කාරෙතබ්බා, කරවිය යුත්තීය. තත්‍ර, එහි; ඉදං, මේ; පමාණං, පමණය; දීඝසො, දිගින්; සුගත විදත්ථියා, සුගත් වියතින්; චතස්සො විදත්ථියො, සිවු වියතෙක; තිරියං, සරස; ද්වෙ විදත්ථියො; දෙවියතෙක; තං, ඒ ප්‍රමාණය, අතික්කායමතො, ඉක්ම වන්නාහට, ඡෙදනකං, සිඳීම කොට දෙසිය යුතු වූ; පාචිත්තියං, පචිතියෙක් වේ.

**සං:-** **"කණ්ඩු පටිච්ඡාදිං"** යනු (කණ්ඩු පටිච්ඡාදෙන්ති එතෙන චීවරෙනාති-කණ්ඩු පටිච්ඡාදී, තං) කණ්ඩු ආදිය වසාගැණීම සඳහා

9. වස්සික සාටිකං පන භික්ඛුනා කාරය මානෙන පමාණිකා කාරෙතබ්බා; තත්‍රිදං පමාණං; දීඝසො ඡව්දත්ථියො සුගත විදත්ථියා තිරියං අඩ්ඪතෙය්‍යා, තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියං

---

අනුදත් සිවුරෙකි. මෙය අනුදන්නා ලද්දේ නාභියෙන් යටත් දන මඩලින් උඩත් යන පෙදෙසෙහි හට ගන්නා 'විතච්ඡිකා' නැමැති කුෂ්ඨයද, 'ලොහිත පිළකා' නම් පොල ද, අශීස් භගන්ධරා දින් ගේ පූයාද මහා පිළිකාබාධයද යන මේ ආබාධ වසා ගැණීමටය. කණ්ඩුපටිච්ඡාදිය මෙකී ආබාධ ඇති කල්හි පරිභොග කට යුතුයි.

**සප්තදශාකාරය**

නිදනය - සැවැත්නුවරය

පුද්ගලයෝ - ඡබ්බග්ගියයෝය.

වස්තුව - පමණ ඉක්ම ගිය කණ්ඩු පටිච්ඡාදිකා දැරීමය.

ප්‍රඥප්තිය - සාධාරණ ප්‍රඥප්තියය.

**(සෙස්ස නිසීදනයෙහි මෙනි.)**

---

# නිදන කථාව

භාග්‍යවතුන්වහන්සේ කණ්ඩු පටිච්ඡාදිය අනුදත් පසු ඡබ්බග්ගීයයෝ පමණ ඉක්මවා කණ්ඩු පටිච්ඡාදිකා කොට ගෙණ පරිභොග කෙරෙති. කණ්ඩු පටිච්ඡාදිකා ඉදිරි පසින් හා පසුපසින් එල්ලෙන පරිදි හැඳගෙන ඇවිදිත්. එකරුණ නිසා මේ ශික්ෂාපදය භික්ෂූන්ට අනුදත් සේක.

**රාජ වර්ගයෙහි අෂ්ටම ශික්ෂාපද වණ්ණාව නිමි.**

---

**9. අර්ථ**:- වස්සික සාටිකං, වැසිසළු සිවුරක්; කාරයමානෙන, කරවන්නාවූ; භික්ඛුනා පන, භික්ෂුව විසින් වනාහි; පමාණිකා, පමණින් යුක්තවූවා; කාරෙතබ්බා, කරවිය යුත්තීය. තත්‍ර, එහි, ඉදං, මේ, පමාණං, පමණය; දීඝසො, දිගින්, සුගත විදත්ථියා, සුගත් වියතින්; ඡව්දත්ථියො, සවියතෙක; තිරියං, සරස, අඩ්ඪතෙය්‍යා, දෙවියත් හමාරෙක; තං, ඒ ප්‍රමාණය; අතික්කාමයතො, ඉක්ම වන්නාහට; ඡෙදනකං; සිඳීම කරන්නාවූ; පාචිත්තියං, පචිතිය වේ.

10. යො පන භික්ඛු සුගත චීවරප්පමාණං චීවරං කාරා පෙය්‍ය අතිරෙකං වා ඡෙදනකං පාචිත්තියං, තත්‍රිදං සුගතස්ස සුගතචීවරප්පමාණං දීඝසො නව විදත්ථියො සුගතවිදත්ථියා තිරියං ඡ විදත්ථියො ඉදං සුගතස්ස සුගත චීවරප්පමාණං

**රතන වග්ගො නවමො**

---

**සප්තදශාකාරය**

නිදානය - සැවැත් නුවරය

පුද්ගලයෝ - ඡබ්බග්ගීයයෝය.

වස්තුව - පමණ ඉක්මවූ වැසිසළු දැරීමය.

(සෙස්ස නිසීදනයෙහි කීසේයි.)

---

## නිදාන කථාව

භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට වැසි සළු අනුදත් කල්හි ඡබ්බග්ගීයයෝ පමණ ඉක්මවූ වැසි සළු කොට ගෙණ දරති. වස්සික සාටිකා ඉදිරි පසින් හා පසු පසින් එල්ලෙන පරිදි පොරවා ගෙණ ඇවිදිති. ඒ කරුණු කොට ගෙණ මෙය අනුදත් සේක.

**රාජ වර්ගයෙහි නවවැනි ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

10. **අර්ථ:-** යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම වනාහි; සුගත චීවරප්පමාණං, සුගත් සිවුර පමණවූ හෝ; අතිරෙකං වා, අසිරිත් වූ (වැඩිවූ) හෝ; චීවරං, සිවුරක්; කාරාපෙය්‍ය, කරවා නම්; ඡෙදනකං; සිඳීම් කරන්නාවූ; පාචිත්තියං, පචිතිය වේ.

තත්‍ර, එහි; ඉදං; මේ, සුගතස්ස, සුගත්හුගේ; සුගත චීවරප්පමාණං, සුගත් සිවුරේ පමණය; දීඝසො, දිගින්, සුගත විදත්ථියා, සුගත් වියතින්; නව විදත්ථියො, නව වියතෙකි. තිරියං, සරස; ඡ විදත්ථියො, සවියතෙකි. ඉදං, මේ, සුගස්ස, සුගත්හුගේ; සුගත චීවරප්පමාණං, සුගත් චීවරයාගේ ප්‍රමාණ යයි.

නවමො, නවවෙනිවූ; රතනවග්ගො, රතන වග්ග යයි.

**සං:- "සුගත චීවරප්පමාණ"** සුගත් සිවුරේ ප්‍රමාණය මෙසේ දත යුතුයි. සුගත් වියත මෙකලැ මධ්‍යම පුරුෂයෙකුගේ වියතින් තුන් වියතෙකි. දිග සුගත් වියත් නවයේ මධ්‍යම පුරුෂයෙකුගේ වියත්

උද්දිට්ඨා ඛො ආයස්මන්තො ඡෙනවුති පාචිත්තියා ධම්මා. තත්ථා යස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පාරිසුද්ධා. පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමිති.

**පාචිත්තියා නිට්ඨිතා.**

---

විසිහතක් වෙති. එය රියන් විසින් දහතුණහමාරෙකි. පුලුල සුගත් වියත් හයේ මධ්‍යම පුරුෂ යෙකුගේ වියත් දහ අටක් වෙති. එවිට රියන් නවයෙකි. මෙසේ ගත්විට මධ්‍යම පුරුෂයෙකුගේ රියනින් රියන් දහතුණ හමාරක් දිගද නවරියනක් පුලුලද ඇත්තේ සුගත් සිවුරය.

**සං:-** සැවත් නුවරදී ආයුෂ්මත් නන්‍දතෙරණුවන් නිසා සුගත චීවර ප්‍රමාණ චීවර ධාරණය නිසා පණවන ලදී. මෙය සාධාරණ ප්‍රඥප්ති යෙකි.

(සෙස්ස නිසීදන ශික්‍ෂාපදයේ කී යේයි.)

# නිදන කථාව

ආයුෂ්මත් නන්‍ද ස්ථවිරයන් වහන්සේ සුගත චීවර ප්‍රමාණ සිවුරක් දරූහ. ස්ථවිර භික්‍ෂූහු නන්‍ද තෙරුන් එනවිට භාග්‍ය වතුන් වහන්සේයයි වරදවා සිතා වහා නැගිටිති. හැඳිනගත් පසු නුගුණ කියති. මේ නිමිත්තෙන් මේ ශික්‍ෂාව පැණවූහ.

**රාජ වර්ගයෙහි දසවැනි ශික්‍ෂාපද වණ්නාව නිමි.**

---

**අථ:-** ආයස්මන්තො, ආයුෂ්මත්නි; ඡෙනවුති පාචිත්තියා ධම්මා, දෙයානුවක් පචිති ඇවැත්හු; උද්දිට්ඨා ඛො, උදෙසන ලද්දාහුමය. ආයස්මන්තෙ, ආයුෂ්මතුන්; පුච්ඡාමි, විචාරමි; කච්චි, කිම; පරිසුද්ධා අත්ථ,? පිරිසිදු වන්නහුද; දුතියං අපි, දෙවනුවත්; පුච්ඡාමි, විචාරමි; කච්චි, කිම; පරිසුද්ධා අත්ථ, පිරිසුදු වන්නහුද? තතියං අපි, තෙවනුවත්; පුච්ඡාමි, විචාරමි; කච්චි, කිම; පරිසුද්ධා අත්ථ? පිරිසිදු වන්නහුද; එත්ථ, මෙහි, ආයස්මන්තො, ආයුෂ්මත්හු, පරිසුද්ධා, පිරිසිදුහ; තස්මා, එහෙයින්; තුණ්හී, තුෂ්ණීම් භාවයයි; එවං, මෙසේ; එතං, මේ තුෂ්ණීම් භාවය; ධාරයමි ඉති, ධරමියි.

පාචිත්තියා, පචිති ඇවැත්හු; නිට්ඨිතා, නිමවන ලද්දහුය.

**භික්‍ෂු භික්‍ෂුණී ප්‍රාතිමොක්‍ෂයෙහි දෙයානු පචිති**

**වණ්ණා නිමවන ලද්දහු ය.**

---

ඉමෙ බො පනා, යසමනෙතා චත්තාරො පාටිදෙසනීයා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා ගාරය්හං ආවුසො ධම්මං අපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමීති.

---

අර්ථ:- ආයසමනෙතා, ආයුෂ්මත්නි: ඉමෙ බො පන චත්තාරො පාටිදෙසනීයා ධම්මා, මේ සිව් පාටිදෙශනීය ආපත්තීහු: උද්දෙසං, උදෙසීමට: ආගච්ඡන්ති, පැමිණෙති.

1. යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: අන්තරඝරං, ඇතුල් ගමට: පවිට්ඨාය, පිවිසියාවූ: අඤ්ඤාතිකාය, නොනෑ වූ: භික්ඛුනියා, මෙහෙණකගේ: හත්ථතො, අතින්: ඛාදනීයං වා, (යාවකාලික) කෑයුතු දෙයක් හෝ: භොජනීය වා (ඔදනාදී) අනුභව කටයුතු භොජනයක් හෝ: සහත්ථා, සියතින්: පටිග්ගහෙත්වා, පිළිගෙණ: ඛාදෙය්‍ය වා, කෑයේ නම් හෝ: භුඤ්ජෙය්‍යවා, අනුභව කෙළේ නම් හෝ: තෙන භික්ඛුනා, ඒ භික්ෂුව විසින්: ආවුසො, ඇවැත්නි, ගාරය්හං, ගැරහිය යුතුවූ: අසප්පායං, සප්‍රාය නොවූ: පාටිදෙසනීයං, අනුන්ට දෙශනා කටයුතුවූ: ධම්මං, ඇවැතකට: ආපජ්ජිං, පැමිණියෙමි: තං, එය: පටිදෙසෙමි ඉති, නැවත දෙසම්'යී පටිදෙසෙ තබ්බං, අනුන්ට දෙසිය යුතුයි.

**සං:-"අන්තරඝරං පවිට්ඨාය"** මෙහි 'අන්තරඝර' යන්නෙන් වීථිය, විතිවිද නොගිය වීථිය: මංසන්ධිය, ගෘහය, යන මෙතෙක් තැන් පැවසේ. මෙකී අන්තරඝරයෙහි සිටි නොනෑ භික්ෂුණියක් විසින් දෙන ලද යම් කිසි ආමිෂයක් වීථි ආදී ස්ථානවල සිටගෙණ හෝ අන්තරාරාමාදී යම් කිසි ස්ථානයක සිට ගෙණ හෝ අනුභව කිරීමේ දී පිඩක් පාසා පාටිදෙශනියාපත්ති ද වෙති.

යම් හෙයකින් අන්තරාරාමය භික්ඛුනු පස්සය ආදී ස්ථානයක සිටි භික්ෂුණියක විසින් දෙන ලද ආමිෂයක් වීථ්‍යාදියෙහි සිටගෙණ අතින් ගැණීම නිදෙස් වේ.

මේ පිළිගැණීමේ දී භික්ෂුණිය සිටි ස්ථානය මුත් භික්ෂුව සිටි ස්ථානය ප්‍රමාණ නොවේ.

**සං:-** 'ගාරය්හං ආවුසො' යනාදිය මෙය දෙසිය යුතු ආකාර යයි.

**සප්තදශාකාරය**

නිදානය - සැවැත් නුවරය.

වස්තුව - අන්තරඝරයට පිවිසි නොනෑ මෙහෙණියගේ අතින් ආමිෂ ප්‍රතිග්‍රහණ ය යි.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්ති ය යි.

ආණත්ති - අනාණත්තික ය යි.

ආපත්ති - තික පාටිදෙසනී ය යි.

යමකාලිකාදිය පිළිගැනීමෙන් හා අනුභව යෙන් 'දුකුළා' වෙති. එකට උපසපන් මෙහෙණියකගේ අතින් ආමිෂ පිළිගැණීමෙන් හා අනුභව කිරීමෙන් ද දුකුළා වෙති.

අනාපත්ති - නෑ මෙහෙණියක විසින් දෙවයි ද, බිම තබා ආයර්‍යයෙනි! මේ නුඹට යයි කියා දෙයිද, අන්තරාරාම, භික්ඛුනුපස්සය, තිත්ථියසෙය්‍යා, පටික්කම්නයන්හි සිට දෙයි ද, ගමින් ගෙණවුත් දෙයි ද, යාමකාලිකාදිය කරුණක් ඇති විටෙක වළඳවයි කියා දෙයි ද, මෙකී අයුරෙන් දෙන ලද ආමිෂ පිළිගන්නාට ද, සික්ඛමානාවක විසින් හා සාමණේරියක විසින් දෙනලද ආමිෂයක් ගන්නාහටද, උම්මත්තකාදීන්ට ද, පාටිදෙසනීයාපත්තිය නොවේ.

අඞ්ග - පරිපුණ්ණුපසම්පන්නතා, අඤ්ඤාතිකතා, අන්තරඝරෙ ඨිතාය හත්ථතො සහත්ථා පටිග්ගහණං, යාවකාලිකතා, අජ්ඣොහරණන්ති යී අඞ්ග පසෙකි.

(සමුට්ඨානාදිය එළකලොමයෙහි කීසේයි.)

# නිදාන කථාව

එක්තරා භික්ෂුණියක් පිඩුසිඟා ගෙණ අරමට එනවිට එක්තරා භික්ෂුවක් මගදී දැක ආයර්‍යයෙනි! එසේ නම් පිඩු ගන්නටයයි කීවාය. භගිනිය! යහපතැයි කියා පාත්‍රයේ පිඩු සියල්ලම ගත්තේය. නැවතත් පිඩු සිඟන්නට කල් මදවූ හෙයින් ඇ එදින සුන්බුත් වූවාය.

2. භික්ඛූ පනෙව කුලෙසු නිමන්තිතා භුඤ්ජන්ති, තත්‍ර චෙ සා භික්ඛුනී වොසාසමානරූපා ඨිතා හොති. ඉධ සූපං දෙථ, ඉධ ඔදනං දෙථාති, තෙහි භික්ඛූහි සා භික්ඛුනී අපසාදෙ තබ්බා. අපසක්ක තාව භගිනි යාව භික්ඛූ භුඤ්ජන්තී'ති, එකස්ස චෙ පි භික්ඛුනො නප්පටිභාසෙය්‍ය තං භික්ඛුනිං අපසාදෙතුං අපසක්කතාව භගිනි යාව භික්ඛූ භුඤ්ජන්තීති පටිදෙසෙ තබ්බං, තෙහි භික්ඛූහි ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිම්හා අසප්පායං පාටිදෙසෙනීයං තං පටිදෙසෙමාති;

---

දෙවෙනි තෙවෙනි දවස් වලද එසේම වූවාය. මේ පුවත මග යන සිටු ගැහැවිනියට දන්වුයෙන් ඈ භික්ෂුණිය ගෙට කැඳවා වළඳවා පසුව භික්ෂූන්ට චොදනා කළාය. එකරුණෙන් මේ ශික්ෂාව අනුදත් සේකි.

**ප්‍රථම පාටිදෙසනීය ශික්ෂාපද වර්‍ණනාව නිමි**.

---

2. **අර්‍ථ**:- භික්ඛූ එව පන, භික්ෂූහුම වනාහි; කුලෙසු, උපාසක කුලයන්හි; නිමන්තිතා, පවරණ ලද්දාහු; භුඤ්ජන්ති; අනුභව කෙරෙද්ද; තත්‍ර, එහි; චෙ, ඉදින්; සා භික්ඛුනී, ඒ මෙහෙණි තොමෝ, ඉධ, මෙතැන්හි; සූපං, බ්‍යඤ්ජන, දෙථ, දෙව්; ඉධ, මෙතැන්හි; ඔදනං, බත්; දෙථ ඉති, දෙව් යයි. වොසාසමාන රූපා, විධාන කරණ සභාව ඇතිව; ඨිතා හොති, සිටියා වීද; තෙහි භික්ඛූහි (වළඳමින් හුන්) ඒ භික්ෂූන් විසින්; භගිනි, නැගනිය; යාව, යම්තාක්; භික්ඛූ, භික්ෂූහු; භුඤ්ජන්ති, වළඳද්ද; තාව, ඒ තාක්; අපසක්ක ඉති, ඉවත් වෙවයි කියා; සා භික්ඛුනී, ඒ මෙහෙණි තොමෝ; අපසාදෙතබ්බා, ඉවත් කළ යුත්තීය. චෙ, ඉදින්; එකස්ස භික්ඛුනො අපි, එක භික්ෂූවකට වත්; භගිනි, නැගනිය; යාව, යම්තාක්; භික්ඛූ, භික්ෂූහු; භුඤ්ජන්ති, වළඳද්ද; තාව, ඒ තාක් අපසක්ක ඉති, ඉවත් වේවයි කියා; තං භික්ඛුනිං, ඒ භික්ෂුණිය; අපසාදෙතුං, ඉවත් කරන්නට; නප්පටිභාසෙය්‍ය, නො වැටහුනේ නම්; තෙහි භික්ඛූහි, ඒ භික්ෂූන් විසින්; ආවුසො, ඇවැත්නි; ගාරය්හං, නිඳා කටයුතු වූ; අසප්පායං, අසප්‍රාය වූ (සවර්ග මොක්ෂයන්ට අහිතවූ) පාටිදෙසනීයං, ප්‍රතිදෙශනා කටයුතු වූ; ධම්මං, ඇවතකට; ආපජ්ජිම්හා, පැමිණියෙමු; තං, ඒ ඇවත; පටිදෙසෙම ඉති, ප්‍රතිදෙශනා කරමුය කියා; පටිදෙසෙ තබ්බං, ප්‍රතිදෙශනා කටයුතු යි.

**සං**:- **"වොසාසමානරූපා"** යනු (වොසාසීයතෙ කථීයතෙ'ති= වොසාසමානං; වි; අව; පූ; සාස අනුසිට්ඨියං, භාවයෙහි 'මාන' ප්‍රත්‍ය යයි. 'ඔ අවස්ස' යන්නෙන්; ඔ ආදෙශයයි වොසාසමාන රූපංසභා

වො එතිස්සාති- වොසාසමාන රූපා:) විධාන කරණ ආකාර ඇත්තියකි. ‘ඉදං සූපං දෙථ’ යනාදීන් විධාන කරණ ආකාරය දක්වති. ‘අපසක්ක තාව භගිනි’ යනාදීන් අපසාදෙතව්‍යාකාරය දක්වති.

## සප්තදශාකාරය

නිදනය - රජගහ නුවරය.

පුද්ගලයෝ - ඡබ්බග්ගීය භික්ෂුහුය.

වස්තුව - විධාන කරණ භික්ෂුණිය අපසාදනය නො කිරීමය.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තිය ය.

ආණත්තිය - අනාණත්තිකය.

ආපත්ති - තිකපාටිදෙසනීය ය.

එකට උපසපන් භික්ෂුණිය විධාන කරණ කල්හි නො වළකන්නාට ද, සාමණෙරිය කෙරෙහි උපසම්පන්න සංඥ ඇත්තාට ද, වෙමතිකයාට ද, දුකුළා වේ.

අනාපත්ති - අනුපසම්පන්න සංඥීහුට ද, තමන්ට බත් දෙවන්නාවූ ද, අනෙකෙකුට බත් දෙන්නාවූ ද, නො දෙන ලද්දක් දෙවන්නා වූ ද, යම් කෙනෙකුට නො දෙන ලද නම් එහි දෙවන්නා වූද, සියල්ලන්ටම සම සමව දෙවන්නා වූ ද, භික්ෂුණිය විසින් විධාන කරණ ලද්ද පිළිගෙණ වළඳන්නාට ද, සික්ඛමානාවක විසින් හා සාමණෙරියක විසින් විධාන කළ කල්හි පිළිගෙණ වළඳන්නාට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ.

අඞග - පරිපුණ්ණුපසම්පන්නතා, පඤ්චභොජනතා, අන්තරඝරෙ අනුඤ්ඤතප්පකාරතො අඤ්ඤථා වොසාසනා, අනිවාරණං අජ්ඣොහරො’ති අඞග පසෙකි.

(සමුට්ඨානාදිය කඨිනයෙහි මෙනි.) මෙහි ක්‍රිය’ක්‍රිය යි.

3. යානි ඛො පන තානි සෙඛ සම්මතානි කුලානි යො පන භික්ඛු තථාරූපෙසු සෙඛසම්මතෙසු කුලෙසු පුබ්බෙ අනිමන්තිතො අගිලානො ඛාදනීයං වා, භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙ තබ්බං තෙන භික්ඛුනා ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටි දෙසනීයං තං පටිදෙසෙමීති

---

# නිදාන කථාව

භික්ෂූහු ආරාධනා පිළිගෙණ කුලයන්හි වළඳති. ඡබ්බග්ගීය මෙහෙණියෝ ඡබ්බග්ගීය භික්ෂූන්ට බෙදීමට විධාන කෙරෙති. එකල්හි ඡබ්බග්ගීයයෝ හොඳට වැළඳුහ. අන්‍ය භික්ෂූහු ඇතිතාක් නො වැළඳූ හ. එයින් අල්පෙච්ඡ භික්ෂූහු උජ්ඣායනය කළහ. ඒ දත් තථාගතයන් වහන්සේ මෙය අනුදත් සේක.

**ද්වීතීය පාටිදෙශනීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

3. **අර්ථ**:- සෙඛසම්මතානි, සෙඛයයි සම්මත කරණ ලද්දවූ: යානි ඛො පන තානි කුලානි, යම් ඒ උපාසක කුලයෝ වෙද්ද; යො පන භික්ඛු, යම් මහණෙක් තෙම වනාහි: සෙඛ සම්මතෙසු, සෙඛයයි සම්මත කරණ ලද්දවූ: තථා රූපෙසු, කුලෙසු, එබඳු කුලයන්හි: පුබ්බෙ, (සරුපවාරයට බස්නට) පූර්වයෙහි: අනිමන්තිතො, පැවරීමක් නො කරණ ලද්දේ: අගිලානො, ගිලන් නොවූයේ: ඛාදනීයං වා (යාවකාලික) කෑ යුතු දෙයක් හෝ: භොජනීයං වා, (ඔදනාදි) බුදිය යුතු භොජනයක් හෝ: සහත්ථා, සියතින්: පටිග්ගහෙත්වා, පිළිගෙණ: ඛාදෙය්‍ය වා, කෑ යේ නම් හෝ: භුඤ්ජෙය්‍ය වා, අනුභව කෙළේ නම් හෝ: තෙන භික්ඛුනා, ඒ මහණහු විසින්: ආවුසො, ඇවැත්ති: ගාරය්හං, නින්‍දා කටයුතු වූ: අසප්පායං, සප්පාය නොවූ: පාටිදෙසනීයං ධම්මං, පාටිදෙසනීයා පත්තියකට: ආපජ්ජිං, පැමිණියෙමි: තං, ඒ ඇවත: පටිදෙසෙමී ඉති, දෙසමියි කියා: පටිදෙසෙ තබ්බං, දෙසිය යුත්තේය.

**සං**:- **"සෙඛසම්මතානි"** යනු ඤප්ති ද්වීතීය කර්ම වාක්‍යයෙන් ලබන ලද සෙඛ සම්මුතිය ඇති කුලයෝය. යම්කිසි කුලයක් ශ්‍රද්ධාවෙන් දියුණු වෙයිද වස්තුවෙන් පිරිහෙයිද, එබඳු කුලයකට සඞ්ඝතෙම සෙඛ සම්මුතිය දනය කෙරෙයි. සෙඛයෝ නම් මාර්ග ඵලයන්හි හික්මෙන්නාවූ ආර්‍ය්‍යයෝය. මෙහි සෝවාන් ඵලස්ථ කුලයක් කියා වේ. අඹු සැමි දෙදෙනම සෝවාන් වූ හෙයිනි.

**සං:- "පුබ්බෙ අනිමන්තිතො"** සෙඛ සම්මුතිය ලත් කුලයකින් කලින් ආරාධනයක් නො ලැබ යම් කිසි ආමිෂයක් පිළිගන්නටත් වලඳන්නටත් නො වටී. පිණ්ඩපාතයේ යනු වස් පා සිවුරු ගත් භික්ෂුවට සරූපචාරය ඉක්මවන්නට කලින් ආරාධනාවක් ලැබුනොත් සෙඛ සම්මුතිය ලත් කුලයකින් වුවත් පිඩු සිඟිය හැකි වේ.

## සප්තදශාකාරය

| | | |
|---|---|---|
| නිදනය | - | සැවැත් නුවරය. |
| පුද්ගලයෝ | - | බොහෝ භික්ෂූහුය. |
| වස්තුව | - | පමණ නොදන පිළිගැනීමය. |
| ප්‍රඥප්තිය | - | අසාධාරණ ප්‍රඥප්තිය ය. |
| ආණත්ති | - | අනාණත්තිකය. |
| ආපත්ති | - | තික පාටිදෙසනීය යයි. යමකාලිකාදිය පිළිගැණීමෙහිත් අනුභවයෙහිත් දුකුළා වේ. සෙඛ සම්මත නො වූ කුලායෙහි සෙඛ සම්මත යයි සිතන්නාට ද, වෙමතිකයාට ද දුකුළා වේ. |
| අනාපත්ති | - | ආරාධිතයාට ද, ගිලනාට ද, මෙකී දෙදෙන විසින් අයිරිත් කරණ ලද්දක් බුදින්නාට ද, අනිකෙකුට පිළියෙළ වූවක් බුදින්නාට ද, ආසන ශාලාදීන්හි ගෙණැවිත් දුන්නක් බුදින්නාට ද, නිති බත්, සලාක බත්, පක්ඛික බත්, උපොසථික බත්, පාටිපදික බත් බුදින්නන්ට ද, කරුණකදී යාමකාලික සත්තාහකාලික යාවජීවකයන් බුදින්නාට ද, උම්මත්තකාදීන්ට ද ඇවැත් නොවේ. |
| අඞ්ග | - | සෙඛ සම්මතතා, පුබ්බෙ අනිමන්තිතතා, අගිලානතා, සරූප වාරොක්කමනං, ඨපෙත්වා නිච්චභත්තකාදීනි අඤ්ඤත ආමිසංගහෙත්වා භුඤ්ජනන්ති යී අඞ්ග සතරෙකි. |

(සමුට්ඨානාදිය එළකලොම සමුට්ඨානාදිය මෙනි.)

4. යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි සාසඞ්ක සම්මතානි සප්පටිභයානි, යො පන භික්ඛු තථාරූපෙසු සෙනාසනෙසු විහරන්තො පුබ්බෙ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භොජනීයං වා සජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා අගිලානො ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍යවා පටිදෙසෙතබ්බං, තෙන භික්ඛුනා ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී'ති.

---

# නිදාන කථාව

සැවැත් නුවර එක්තරා කුලයෙක්හි අඹුසැමි දෙදෙනම සෝවාන් වූහ. ඒ කුලය ශ්‍රද්ධාවෙන් වැඩෙයි, සම්පතින් පිරිහෙයි. පෙරවරු කල්හි එගෙයි සැපයෙන අහර සියල්ලම භික්ෂූන්ට දී ඇතැම් දවසෙක ගෙහිමියෝ සුන්බත් වෙති. **"අනුජානාමි භික්ඛවෙ යං තං කුලං සද්ධාය වඩ්ඪති භොගෙන හායති එව රූපස්ස කුලස්ස ඤත්තිදුතියෙන කම්මෙන සෙඛ සම්මුතිං දතුං"** යී වදරා **"යානි ඛොපන තානි කුලානි - පෙ- පටිදෙසෙමීති"**යී අනුදත් සේකි.

එකල්හි සැවැත්නුවර උත්සවයකි. මිනිස්සු භික්ෂූන්ට ආරාධනා කොට වළඳවති. සෙඛ සම්මත කුලයකින් ද ආරාධනාවක් ලැබුන නමුත් භික්ෂූහු පළමු ශික්ෂා පදය නිසා සැක කොට නො ඉවසූහ. එකරුණ නිසා **"අනුජානාමි භික්ඛවෙ නිමන්තිතෙන සෙඛ සම්මතෙසු කුලෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිතුං වා භුඤ්ජිතුං වා"**යී වදරා **"පුබ්බෙ අනිමන්තිතො"**යන අනුප්‍රඥප්තිය අනුදත් සේක.

නැවත සෙඛ සම්මුතිය ලත් කුලයකට ගිය භික්ෂුවක් එහිදී ගිලන්විය. එකුල වැස්සන් වළඳන්නට කී නමුත් නො වළඳ සුන්බත් විය. එකරුණ දත් බුදුහු **"අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා සෙඛ සම්මතෙසු කුලෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිතුං වා භුඤ්ජිතුංවා"** යී වදරා 'අගිලානො' යන අනුප්‍රඥප්තිය වදාළ සේක.

**තෘතීය පාටිදෙශනීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

4. **අර්ථ:-** ආරඤ්ඤකානි, ආරණ්‍යයෙහි වූ: සාසඞ්ක සම්ම තානි, සැක සහිත යයි සම්මත වූ: සප්පටිභයානි, ප්‍රතිභය සහිතවූ: යානි ඛො පන තානි සෙනාසනානි, යම් ඒ සෙනසුන් වෙද්ද.

යො පන භික්ඛු, යම් භික්ෂුවක් තෙම එනාහි: තථාරූපෙසු, එබඳු වූ: සෙනාසනෙසු, සෙනසුන්හි: විහරන්තො, වාසය කරන්නේ: පුබ්බෙ, පෙර: (කලින්) අප්පටිසංවිදිතං, නො හඳුනන ලද්දක්හු: (නොහඳුනන ලද්දෙකුගෙන්) ඛාදනීයං වා, කෑ යුතු දෙයක් හෝ: භොජනීයං වා, බුදිය යුතු දෙයක් හෝ: අජ්ඣාරාමෙ, ඇතුළු අරමෙහි දී: සහත්ථා, සියතින්: පටිග්ගහෙත්වා, පිළිගෙණ: අගිලානො, නොගිලන් වූයේ: ඛාදෙය්‍ය වා, කැයේ නම් හෝ: භුඤ්ජෙය්‍ය වා, අනුභව කළේ නම් හෝ: තෙන භික්ඛුනා, ඒ භික්ෂුව විසින්: ආවුසො ඇවැත්නි: ගාරය්හං, ගැරහිය යුතුවූ: අසප්පායං, සප්‍රායනොවූ: ධම්මං, ඇවතකට: ආපජ්ජිං, පැමිණියෙමි: තං, ඒ ඇවත: පටිදෙසෙමි ඉති, දෙසනා කෙරෙමි'යි (කියා) පටිදෙසෙතබ්බං, දෙසිය යුතුයි.

සං:- **"සාසඞ්ක සම්මතානි"**යි. (සහ සඞ්කාය යං වත්තති තං- සාසඞ්කං, සාසඞ්කානි ඉති සම්මතානි - සාසඞ්ක සම්මතානි) යම් සෙනසුනක් සම්බන්ධ අරමෙහි හෝ චෞරයන්ගේ පිවිසීම් අනුභවකිරීම් ඉඳුම් හිටුම් හා සයනය කිරීම් ඒ ඒ ලකුණුවලින් ප්‍රකටව පෙණෙත් නම් එබඳු සෙනසුන සාසඞ්ක සම්මත වේ.

සං:- **"සප්පටිභයානි"** යී (සහ පටිභයෙන යානි වත්තන්තිති- සප්පටිභයානි;) අරමෙහි හෝ ආරාමූපචාරයෙහි හෝ සොරුන් විසින් මිනිසුන් නසනලද බවත් මිනිසුන්ගේ බඩු පැහැර ගන්නාලද බවත් එසේම මිනිසුන්ට හිරිහැර කරණ ලද බවත් ඒ ඒ ලකුණුවලින් හා ජනශ්‍රැතියෙන් දැනගන්නට තිබේ නම් එබඳු සෙනසුන සප්පටිභයද වේ.

සං:- **"පුබ්බෙ අප්පටිසංවිදිතං"** යනු, කලින් පටිසංවිදිත නොවූවකි. 'පටිසංවිදිත'ය නම් - යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයකු හෝ අරමට හෝ ආරාමූපචාරයට විත් ස්වාමිනි අසුවල් කුලයෙන් (ගෙදරින්) නැතහොත් කුලවලින් අසුවල් වෙලාවේ දනයක් ගෙණෙන්නේයයි දැන්නුවහොත් සෙනසුන සොරුන් නිසා සාසඞ්ක සප්පටිභය නම් ඒ බැව් දන්විය යුතුයි. ස්වාමීනි එසේ වේවා: අපි දනය ගෙණෙන්නෙමුයි දන් විය යුතුයි. ස්වාමීනි එසේ වේවා: අපි දනය ගෙණෙන්නෙමු යි කියා යෙත්නම් නැවත අසුවල් වෙලාවේ මිනිසුන් මෙහි හැසිරෙණ බැව් කියා සොරුන්ට ඉවත්වෙන්නට අණකළ යුත්තේය.

පසුව ඒ දන්වන ලද ආහාරය හෝ ඒ සමග තවත් බොහෝ ආහාරපාන වර්ග හෝ ගෙණෙත් නම් ඒ 'පටිසංවිදිත' යයි. මේ පටිසංවිදිත ආහාරය පිළිගත යුතුයි. අප්පටිසංවිදිත (පළමුවෙන් නොදන්වා ගෙණෙන ලද්ද) නො පිළිගත යුතුයි.

## සප්තදශාකාරය

නිදානය - ශාක්‍ය දනව්වය.

පුද්ගලයෝ - බොහෝ භික්ෂූහුය.

වස්තුව - අරමෙහි සොරුන් වෙසෙද්දී ආරෝචනය නොකිරීමය.

ප්‍රඥප්තිය - අසාධාරණ ප්‍රඥප්තිය ය.

ආනත්තිය - අනාණත්තිකය.

ආපත්ති - තිකපාටිදෙසනීය ය.

යාමකාලිකාදිය - අප්පටිසංවිදිත සංඥිහුට ද, ඒ ගැන වෙමතික යාටද එසේම දුකුළාවෙකි.

අනාපත්ති - පටිසංවිදිතයක් බුදින්නාට ද, ගිලනාට ද, පටිසංවිදිතයෙක්හි වත් ගිලනාගේවත් අධිකවූ (වැඩිවූ) වක් බුදින්නහුට ද, අරමෙන් පිටදී පිළිගෙණ ඇතුළතදී බුදින්නාට ද, අරමෙහි හටගත් මූල ඵලාදියක් බුදින්නාට ද, යාම කාලිකාදිය කරුණක් ඇතිවිටකදි බුදින්නාටද, උම්මත්තකාදීන්ටද ඇවැත් නොවේ.

අඞ්ග - යථාවුත්ත ආරඤ්ඤක සෙනාසනතා, යාව කාලිකතා; අනජ්ඣජාතිකතා; අගිලානතා, අගිලානාවසෙසතා, අප්පටිසංවිදිතෙ අජ්ඣාරාමෙ පටිග්ගහණං, අජ්ඣොහරණන්ති කියා අඞ්ග සතෙකි.

## පාටිදෙසනීයා නිට්ඨිතා

(සමුට්ඨානාදිය කඨින සමුට්ඨානාදිය මෙනි.)

මෙහි ක්‍රියා'ක්‍රියායි.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො චත්තාරො පාටිදෙසනීයා ධම්මා තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? පරි සුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එව මෙතං ධාරයාමී'ති.

---

## නිදාන කථාව

එක්කලෙක ශාක්‍ය දසකයෝ ශාක්‍යයන් සමග විරුද්ධවූහ. එකලැ සාකියානීහු ආරණ්‍යක සෙනසුනකට ප්‍රණීත ඛාද්‍ය භොජ්‍යාදිය ගෙණයත් යයි අසා ශාක්‍ය දසකයෝ මග රැක සිට ඔවුන්ගෙන් බඩු පැහැර ගත්හ. එසේම දූෂණයද කළහ. නැවත ශාක්‍යයෝ බඩු සහිත සොරුන් අල්වාගෙණ අරමෙහි සොරුන් සිටින බැව් දන දන නොදන්වූහ'යි භික්ෂූන්ට චෝදනා කළහ. ඒ දත් භාග්‍යවතුන්වහන්සේ මේ ශික්ෂාපදය අනුදත් සේක.

**අර්ථ**:- අයස්මන්තො, ආයුෂ්මතුනි; චත්තාරො පාටිදෙසනීයා ධම්මා, සතර පාටිදෙශනීයාපත්තීහු; උද්දිට්ඨා ඛො, උදෙසන ලදහ. තත්ථ, එහි; ආයස්මන්තෙ, ආයුෂ්මතුන්; පුච්ඡාමි, විචාරමි; කච්චි, කිම; පරිසුද්ධා අත්ථ, පිරිසිදුවූවහු ද; දුතියම්පි, දෙවනුත්; පුච්ඡාමි, විචාරමි; කච්චි, කිම; පරිසුද්ධා අත්ථ, පිරිසුදුද? තතියං අපි, තෙවනුත්; පුච්ඡාමි, විචාරමි; කච්චි කිම? පරිසුද්ධා අත්ථ, පිරිසුදුද? එත්ථ, මෙහි; ආයස්මන්තො, ආයුෂ්මත්හු; පරිසුද්ධා, පිරිසිදුහ; තස්මා, එහෙයින්; තුණ්හී, තුෂ්ණීම්භූතයහ; එතං, මෙ තුෂ්ණීම්භාවය; එවං, මෙසේ; ධාරයාමි ඉති, දරමියි. (කියායි)

පාටිදෙශනීයා, පාටිදෙශනීයා පත්තීහු, නිට්ඨිතා, නිමවන ලද්දහ.

**භික්ෂු භික්ෂුණී ප්‍රාතිමොක්ෂයෙහි පාටිදෙසනීය වර්ණනාව නිමි.**

---

නැවත වන සෙනසුනැක ගිලන්ව සිටි භික්ෂුවකට මිනිසුන් ගෙණ ගිය දනය නැවත නොපිළිගත් හෙයින් "**අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා ආරඤ්ඤකෙසු සෙනාසනෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිතුං වා භුඤ්ජිතුං වා**"යි වදරා අනුප්‍රඥප්තිය අනුදත් සේක.

**චතුර්ථ පාටිදෙශනීය ශික්ෂාපද වර්ණනාව නිමි.**

---

ඉමෙ ඛො පනායස්මන්තො සෙඛියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛා කරණීයා.
2. පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛා කරණීයා.
3. සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
4. සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසිදිස්සාමීති සික්ඛා කරණීයා.
5. සුසංවුතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
6. සුසංවුතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
7. ඔක්ඛිත්ත චක්ඛු අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

---

අර්ථ:- ආයස්මන්තො, ආයුෂ්මතුනි; ඉමෙ ඛො පන සෙඛියා ධම්මා, මේ සෙඛියා ඇවැත්හු වනාහි; උද්දෙසං, උදෙසීමට; ආගච්ඡන්ති, පැමිණෙත්.

1. පරිමණ්ඩලං හාත්පසින් වටකොට; නිවාසෙස්සාමීති, (අඳනය) අඳින්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය. (හික්මිය යුතුයි.)

2. පරිමණ්ඩලං, හාත්පසින් වටකොට; පාරුපිස්සාමි ඉති, (පොරෝනය) පොරවන්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තෙම; කරණීයා, කටයුත්තීය.

3. සුපටිච්ඡන්නො, මනාකොට කය වසන ලද්දේ; අන්තරඝරෙ, ඇතුල් ගමෙහි; ගමිස්සාමී ඉති, යන්නෙමි කියා; සික්ඛා ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

4. සුපටිච්ඡන්නො, මනාකොට කය වසන ලද්දේ; අන්තරඝරෙ, ඇතුල් ගමෙහි; නිසීදිස්සාමි ඉති, හිඳින්නෙමි යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

5. සුසංවුතො, මොනවට සංවරණය කරණ ලද ඉඳුරන් ඇත්තේ; අන්තරඝරෙ, ඇතුල් ගමෙහි; ගමිස්සාමී ඉති, යන්නෙමි කියා; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

6. සුසංවුතො, මොනවට සංවරණය කරණ ලද ඉඳුරන් ඇත්තේ; අන්තරඝරෙ, අන්තරඝරයෙහි; නිසීදස්සාමි ඉති, හිඳින්නෙමි'යි සික්ඛා, ශික්ෂා තොමෝ, කරණීයා, කටයුත්තීය.

8. ඔක්ඛිත්ත චක්ඛු අන්තරඝරෙ නිසිදිස්සාමීති සික්ඛා කරණීයා.

9. න උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසිදිස්සාමීති සික්ඛා කරණීයා.

10. න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

**පරිමණ්ඩල වග්ගො පඨමො.**

---

7. ඔක්ඛිත්ත චක්ඛු, යටිකුරුව හෙළන ලද ඇස් ඇත්තේ, අන්තරඝරෙ, අන්තරඝරයෙහි, ගමිස්සාමි ඉති, යන්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ, කරණීයා, කටයුත්තීය.

8. ඔක්ඛිත්ත චක්ඛු, යට බලා හෙළන ලද ඇස් ඇතිව, අන්තරඝරෙ, අන්තරඝරයෙහි, නිසීදිස්සාමි ඉති, හිඳින්නෙමි'යි සික්ඛා; ශික්ෂා; තොමෝ, කරණීයා; කටයුත්තීය:

9. උක්ඛිත්තකාය, සවුර එසවීමෙන්; අන්තරඝරෙ, අන්තරඝරයෙහි, න ගමිස්සාමි ඉති, නොයන්නෙමි'යි සික්ඛා, ශික්ෂා තොමෝ, කරණීයා, කටයුත්තීය.

10. උක්ඛිත්තකාය, සිවුර එසවීමෙන්, අන්තරඝරෙ, අන්තරඝරයෙහි; න නිසීදිස්සාමි ඉති, නොහිඳින්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

පඨමො, පළමුවෙනි වූ, පරිමණ්ඩල වග්ගො, පිරිමඬුලු වගයි.

1. සං:- **"පරිමණ්ඩලං නිවාසෙස්සාමි"** මෙහි පරිමණ්ඩල නිවාසනය නම්:- අන්තරවාසකයෙන් (අඳනා සිවුරෙන්) නාභි මණ්ඩලය හා ජානු මණ්ඩලය යන දෙමඬුලු වසා හැඳීමය. මෙසේ හඳින්නහු විසින් දන මඩලින් පහලට අටඟුලක් පමණ එල්ලෙන පරිදි හැන්ද යුතුයි.

මෙකී ප්‍රමාණය ඉක්මවා ඉදිරිපසින් හෝ පස්සෙන් අඳනය එල්ලෙන පරිදි හඳින්නහුට දුකුළා වෙක් වේ. එසේම ඛන්ධක යෙහි දක්වෙන නිවාසන දෙෂ වලිනුදු වැළකිය යුත්තේයි. හත්ථිසොණ්ඩක, මච්ඡ වාලකාදී නානා ක්‍රමයෙන් ගිහියන් මෙන් හඳින්නාවූ භික්ෂුවට හෝ භික්ෂූන්ට දුකුළා වෙති.

**සං:- "සික්ඛා කරණීයා"** (සික්ඛිතබ්බාති- සික්ඛා) ඇතුළු ගමෙහිදීත් බුද්ධොපස්ථානය, බුදුන් වැඳීම; ධර්මශ්‍රවණය කිරීමාදී අවස්ථාවලදී විහාරයෙහිදීත් පිරිමඬුලු නිවාසනයෙන් යුක්ත වන්නෙමියි හික්මිය යුතුය යනුයි.

පාරාජිකා සංඝාදිසෙසාදියෙහි මෙන් මෙහි සෙඛියාවල සංඛ්‍යාවක් නො පෙණේ. ඊට හේතුව නම්:- ප්‍රාතිමොක්ෂයෙහි පෙණෙන සෙඛියා පමණක් නොව භික්ෂූන් විසින් හික්මිය යුතු තවත් ශික්ෂා (සෙඛියා) වත් ඇතිවීමය. වත්තක්ඛන්ධකයෙහි දක්වෙන ආගන්තුගවත් නෙවාසිකවත් ආදී සියලුම වත් හික්මිය යුතු බැවින් සෙඛියා වෙති.

මේ සෙඛියාවන් **"යො පන භික්ඛු ඔලම්බෙන්තො නිවා සෙය්‍ය දුක්කටං"**යී මෙසේ ආපත්ති නාමයෙන් නො දක්වා 'සික්ඛාකරණීයා'යී දක්වන්නට හෙතුව නම් චාරිත්‍ර ක්‍රම දැන්වීම් නිසා යයි අටුවායෙහි කීහු. සෙඛියා වලින් උගන්වන්නේ යහපත් සිරිත් රැසෙකි. එකී චාරිත්‍ර විධි වලට අනාදර කොට ව්‍යතික්‍රමණය කරන්නන්ට පමණක් දුකුළා වෙති.

**සං:-** සෙඛියාවන් සම්බන්ධ නිදන පුද්ගලාදිය පිළිබඳව දතයුතු විස්තරය මෙහිදී දත යුතුයි.

**"න සුරු සුරුකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා"** මෙය කොසඹෑ නුවරදීද, 'සාම්සෙන හත්ථෙන' යනාදියද, **"සසිත්ථකං පත්ත ධොවනං"** යනාදිය භග්ගදනව්වෙහිදීද බොහෝ භික්ෂූන් අරභයා දෙශිතයහ. සෙසු සියලුම සෙඛියා සැවැත් නුවරදී ඡබ්බග්ගියයන් නිසා ඒ ඒ කරුණු නිමිත්ත කොට පණවන ලදහ.

සූපොදන විඤ්ඤත්තියෙහි හා ධර්මදෙශනාදියෙහිද ගිලනාගේ වශයෙන් එකම අනුප්‍රඥප්තියෙකි.

සියල්ලම සාධාරණ ප්‍රඥප්තීහුය. එසේම අනාණත්තිකය. සියලු සෙඛියාවලින් දුකුළා පමණෙකි. අනික් ආපත්ති භෙදයක් නැත්තේය.

අනාපත්ති හා අඞ්ග පමණක් ඒ ඒ තැන්වලදී දක්වන්නෙමු. මෙහි නො දැනීමෙන් හා අමතකවීමෙන් අපරිමණ්ඩල කොට හදින්නාටද, පරිමණ්ඩල නිවාසනය නො දන්නාටද, ගිලනාටද, ආපදවන් හිදී අපරිමණ්ඩල කොට හදින්නාටද, උම්මත්තකාදීන්ටද ඇවත් නොවේ.

'අනාදරියං, අනාපත්තිකරණාභාවො, අපරිමණ්ඩලං නිවාසනං'යී අඞ්ග තුණෙකි.

අනික් ශික්ෂාවලද අඞ්ග තුණෙකි. ඒ ඒ තැනදී 'අපරිමණ්ඩලං' යන්න වෙනස් කොට සුදුසු සුදුසු පරිදි යොද ගත යුතුයි.

මින් මතු අනාපත්ති පමණක් දක්වේ.

1. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

2. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

---

**2 සං:-** 'න භික්ඛවෙ ගිහී පාරුතං පාරුපිතබ්බං'යි ප්‍රතික්ෂිප්ත ගිහී පාරුපනය නොකොට ගොදුරු ගමෙහි හැසිරෙනවිට ද, අරමෙහි සිටිනවිට ද සිවුරෙහි කොන් සමව එල්ලෙන පරිදි පිරිමඩුලු කොට පෙරවිය යුතුයි.

සෙඛතපට පාරුපනය, පරිව්‍රාජක පාරුපනය, එකසාටක පාරුපනය, සුරාසොණ්ඩ පාරුපනය, මහාජෙට්ඨක පාරුපනය, කුටිපවෙසක පාරුපනය, බ්‍රාහ්මණ පාරුපනය, පාලිකාරක පාරුපනය යනාදි පෙරවීම් පරි මණ්ඩල ලක්ෂණයෙන් වෙනස් හෙයින් ගිහියන්ගේ පෙරවීම්ය භික්ෂූන්ට මෙකී පෙරවීම් නොකැපය. ශ්‍රමණ සාරුප්‍ය නොවන හෙයිනි.

**3 - 4. සං:- "සුපටිච්ඡන්නො"** සුපටිච්ඡන්න පාරුපනය නම් දන මඩුලුත් පපුවත් වසා පෙරවීමය. මෙසේ පෙරවන්නහු විසින් බෙල්ලෙන් උඩ කොටස හා මැණික් කටුවේ පටන් දෙඅත්ද පිණ්ඩික මාංසයේ පටන් දෙපාදයත් විවෘත කොට පෙරවිය යුතුයි. මෙකී ලක්ෂණ උභයාංශ පාරුපනයෙහි විද්‍යමාන වෙති.

**5 - 6. සං:- "සුසංවුතො"** මෙහි සුවෘත්තය නම් අත් පා ක්‍රීඩා වශයෙන් චලනය නොකට හැසිරීමය.

**7 - 8. සං:- "ඔක්ඛිත්තචක්ඛු"** යනු බිම බලා ගැණීමය. මග යන්නාවූ භික්ෂුව විසින් ඉදිරියෙහි වියදණ්ඩක දුර බලාගෙණ ගමන්කළ යුතුයි. රථ වාහනාදිය ගමන් කරණ මගක නම් එක් තැනක සිට මාර්ගය දිගට බැලීම වටී.

**9 - 10. සං:- "නඋක්ඛිත්තකාය"** එක පැත්තකින් හෝ දෙපැත්තෙන්ම හෝ සිවුර ඔසවාගෙණ ගොදුරු ගමෙහි හැසිරෙන්නට නොවටී.

1. **අථ:-** උජ්ජග්ඝිකාය, මහත් සිනාවෙන් යුක්තව; අන්තරඝරෙ, ගොදුරු ගමෙහි; න ගමිස්සාමි ඉති, නොයන්නෙමි යි, සික්ඛා, ශික්ෂා තොමෝ, කරණීයා කටයුත්තීය.

2. උජ්ජග්ඝිකාය, මහත් සිනාවෙන් යුක්තව, අන්තරඝරෙ, අන්තරඝරයෙහි, න නිසීදිස්සාමි ඉති. නො හිඳින්නෙමි යි: සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

3. අප්පසද්දෙ අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

4. අප්පසද්දෙ අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා

5. න කායප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

6. න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

7. න බාහුප්පචාලකං අන්තරඝරෙ ගාමිස්සාමීති සික්ඛා කරණීයා.

8. න බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

---

3. අප්පසද්දෙ, ස්වල්ප ශබ්ද ඇතිව, දෙළොස් රියනකින් එපිට, නො ඇසෙන ශබ්ද ඇතිව, අන්තරඝරෙ, අන්තරඝරයෙහි, ගමිස්සාමි ඉති, යන්නෙමියි; සික්ඛා; ශික්ෂා තොමෝ; කරණීයා කටයුත්තීය.

4. අප්පසද්දෙ; ස්වල්ප ශබ්ද ඇතිව; අන්තරඝරෙ, අන්තරඝරයෙහි; නිසීදිස්සාමි ඉති, හිඳින්නෙමි යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

5. කායප්පචාලකං, ශරීරය සෙලවීමෙන් යුක්තව: අන්තරඝරෙ; අන්තරඝරයෙහි; න ගමිස්සාමි ඉති, නොයන්නෙමි යි: සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

6. කායප්පචාලකං, කය සෙලවීමෙන් යුක්තව: අන්තරඝරෙ, ඇතුළු ගමෙහි; න නිසීදිස්සාමි ඉති, නොහිඳින්නෙමි යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

7. බාහුප්පචාලකං, බාහුව සෙවීමෙන් යුක්තව, අන්තරඝරෙ, අන්තරඝරයෙහි; න ගමිස්සාමි ඉති, නො යන්නෙමි යි; සික්ඛා' ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

8. බාහුප්පචාලකං, බාහුව සෙලවීමෙන් යුක්තව; අන්තරඝරෙ, ඇතුළු ගමෙහි; නනිසීදිස්සාමි ඉති, නොහිඳින්නෙමි යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා කටයුත්තීය.

9. න සීසප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

10. න සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

උජ්ජග්ඝික වග්ගො දුතියො.

---

9. සීසප්පචාලකං, හිස සෙලවීමෙන් යුක්තව; අන්තරඝරෙ ඇතුළු ගමෙහි; න ගමිස්සාමි ඉති, නොයන්නෙමි යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

10. සීසප්පචාලක, හිස සෙලවීමෙන් යුක්තව; අන්තරඝරෙ, ඇතුළු ගමෙහි; න නිසීදිස්සාමි ඉති, නොහිඳින්නෙමි යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

දුතියො, දෙවැනිවූ; උජ්ජග්ඝිකවග්ගො, උජ්ජග්ඝික වර්ගයයි.

**සංලක්ෂ්‍යය**- 'උජ්ජග්ඝිකාය' (උජ්ජග්ඝනං-උජ්ජග්ඝිකං, උ. පු. හස. හසනෙ, භාවයෙහි 'ණවු' ප්‍රත්‍යයයි. අකා දෙශය හා ඉකාරාදෙශ යයි) උජ්ජග්ඝිකාව නම් මහා සිනාවය. මද සිනාව ආපත්ති නොකෙරෙයි. 1-2-සෙඛියා දෙකම හසනීය වස්තුන්හි ප්‍රඥප්තයහ.

**3. සං:- "අප්පසද්දෙ"** මෙහි අල්ප ශබ්දය නම් සෙමින් කථාකිරීමේදී පවත්නා ස්වල්ප හඬය. ඒ ප්‍රමාණ කරණ පරිදි මෙසේය. එනම්, දෙළොස්රියන් ශාලාවකැ මහ තෙරුන් වහන්සේ මුල කෙළවරේද, දෙවෙනි තෙරුන් වහන්සේ හරි මැදද, තෙවෙනි තෙරුන් වහන්සේ අග කෙළවරේද වැඩ සිට ගෙණ මහ තෙරුන් වහන්සේ දෙවෙනි තෙරුන් සමග කරණ කථාව දෙවෙනි තෙරුන්ට අවබොධ කරගන්නට හැකි වෙයිද, තෙවෙනි තෙරුන්ට ශබ්දය මුත් වචන තේරුම් යන පරිදි නොඇසෙයිද, එබඳු ශබ්දය අල්ප ශබ්දයයි. තුන්වෙනි තෙරුන් ටත් තේරුම් කරගන්නට තරම් හඬ ඇතිනම් ඒ ශබ්දය මහා ශබ්දයයි.

**5. සං:- "කායප්පචාලකං"** (කායස්ස පචලනං-කායප්ප-චාලං., ප. පු. 'චල' චලනෙ, කායප්පචාල මෙව-කායප්පචාලකං.,) කායප්ප චාලය නම්-කය සෙලවීමය. ගොදුරු ගමෙහිදී යන එන විටද, හිඳිනා විටද කය සෙලවීමෙන් විකාර නොකොට සම ඉරියව්වලින් යාම් ඊම් ආදිය කළ යුත්තේය.

නිසීදන ප්‍රතිසංයුක්ත ශික්ෂාත්‍රයෙහිදීම වාසූපගතයාට ඇවැත් නොවේ.

1. න ඛම්භකතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

2. න ඛම්භකතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා

3. න ඔගුණ්ඨිතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.

4. න ඔගුණ්ඨිතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

5. න උක්කුටිකාය අන්තරඝරෙ ගාමිස්සාමීති සික්ඛා කරණීයා.

6. න පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

7. සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.

---

1. අර්ථ:- ඛම්භකතො. උකුලෙහි තබනලද අත් ඇත්තේ, අන්තරඝරෙ, අන්තරඝරයෙහි, න ගමිස්සාමි ඉති, (මම) නොයන්නෙමි'යි; සික්ඛා, ශික්‍ෂා තොමෝ, කරණීයා, කටයුත්තීය.

2. ඛම්භකතො, උකුලෙහි තබනලද අත් ඇත්තේ: අන්තරඝරෙ, අතුළු ගමෙහි; න නිසීදිස්සාමි ඉති, නොහිඳින්නෙමි'යි සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

3. ඔගුණ්ඨිතො, හිසවසා පොරවනලද්දේ; අන්තරඝරෙ, ඇතුළු ගමෙහි: න ගමිස්සාමි ඉති, නොයන්නෙමි'යි: සික්ඛා, ශික්‍ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

4. ඔගුණ්ඨිතො, හිසවසා පොරවන ලදුව, අන්තරඝරෙ, ඇතුළු ගමෙහි: න නිසීදිස්සාමි ඉති, නොහිඳින්නෙමි'යි සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

5. උක්කුටිකාය, විලුඹ හෝ අක්පතුල බිම ඇනීමෙන් යන ගමන් ඇත්තේ: අන්තරඝරෙ, ඇතුළු ගමෙහි; න ගමිස්සාමි ඉති, නොයන්නෙමි'යි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

6. පල්ලත්ථිකාය, සහල සිවුර (දෙපට සිවුර) ඇතිරවීමෙන් යුක්තව; අන්තරඝරෙ, ඇතුළු ගමෙහි: න නිසීදිස්සාමි ඉති, නොහිඳින්නෙමි'යි සික්ඛා, ශික්‍ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

7. සක්කච්චං, සකස්කොට (නොහොත්) සිහි එලවා, පිණ්ඩපාතං, පිණ්ඩපාතය; පටිග්ගහෙස්සාමි ඉති, පිළිගන්නෙමියි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

8. පත්ත සඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.

9. සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.

10. සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.

**ඛම්භකත වග්ගො තතියො.**

---

8. පත්ත සඤ්ඤි, පාත්‍රයෙහි: (පාත්‍රගත) සංඥ ඇතිව: පිණ්ඩපාතං, පිණ්ඩපාතය: පටිග්ගහෙස්සාමි ඉති, පිළිගන්නෙමි'යි සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා කටයුත්තීය.

9. සමසූපකං, සමවූ මුද්ගසූපාදී ව්‍යඤ්ජන ඇතිකොට: පිණ්ඩපාතං, පිණ්ඩපාතය: පටිග්ගහෙස්සාමි ඉති, පිළිගන්නෙමි'යි සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා කටයුත්තීය.

10. සමතිත්තිකං, මුවවිට හා සමව පිරීම ඇතිකොට, පිණ්ඩපාතං, පිණ්ඩපාතය; පටිග්ගහෙස්සාමි ඉති, පිළිගන්නෙමි'යි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා කටයුත්තීය.

තතියො, තුන්වෙනිවූ: ඛම්භකතවග්ගො, ඛම්භකත වර්ගයයි.

**3. සංලක්‍ෂ්‍යයඃ- "ඔගුණ්ඨිතො"** යනු හිසවසා පෙරවීමය, ගණ්ඨි දීපනියෙහි 'ඔගුත්ථිතො'යි පෙණේ.

**සංඃ- "උක්කුටිකාය"** මෙහි 'උක්කුටිකාව' නම් එක විලුඹක් හෝ විලුම් දෙකම හෝ උස්කොට පා අඟින් පොළව ස්පර්ශ කරමින් ගමන් කිරීමය. එසේම අක් පා ඔසවා විලුම්වලින් භූමිය ස්පර්ශ කරමින් ගමන් කිරීමය. මේ දෙයාකාරයම 'උක්කුටිකා' වෙහි ඇතුළත්වේ.

**6. සංඃ- "පල්ලත්ථිකාය"** යනු (මෙහි 'පල්ලත්ථ' ධාතුව ආයොග කරණෙහිය) අතින් හෝ සිවුරෙන් හෝ කරණලද පල්ලත්ථිකාවෙහි හිඳීමය. ඇතුළු ගමේදී සහල සිවුරු අතුරා හෝ අත (යටට තබා උඩ හෝ හිඳීම නොවටී. වාසූපගතයාට වරද නොවේ.

**8. සංඃ- "පත්ත සඤ්ඤී"** යනු (පත්තෙ සඤ්ඤා පත්ත සඤ්ඤා; සා අස්ස අත්ථී'ති පත්ත සඤ්ඤී') වළඳන භාජනය කෝප්පයක් වුවත් එය තමන්ගේ පාත්‍ර යයි සිතා ගැණීමය. (ස්වකීය පාත්‍රයෙහි උපන් සංඥ ඇතිවීමය.)

1. සක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

2. පත්ත සඤ්ඤී පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

3. සපදනං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

---

9. සං:- **"සමසූපකං"** යනු (ක්‍රියා විශෙෂණයකි.) බතට ප්‍රමාණවත් ව්‍යඤ්ජන ගැනීමය. ඒ ප්‍රමාණය මෙසේ යි. මුද්ගසූපාදී හස්තහාරීය සූප බතින් හතරෙන් කොටසක ප්‍රමාණ ගත යුතුයි. ඉන් වැඩිය පිළිගන්නාට දුකුළා වේ. මෙහි 'සූප' හැර සෙසු ව්‍යඤ්ජන ජාතීහු 'රස රස' යයි කියනු ලැබෙත්. මෙහි රසරසය නෑයන්ගෙන් හෝ පැවරූ තැනින් හෝ අනිකකු සඳහා ස්වකීය ධනයෙන් හෝ ගන්නහුට ඇවැත් නොවේ.

10. සං:- **"සමතිත්තිකං පිණ්ඩපාතං"** (තප්පනං පූරණං- තිත්ති: සමා තිත්ති එතස්මිනති: සමතිත්තිකො;) මෙහි සමතිත්තික පිණ්ඩපාතය නම්-අදිටන් පොහෝනා පාත්‍රයෙක්හි මුවවිටෙන් උඩට නොසිටින සේ (මුවවිට හා සමව) පිළිගත් යාවකාලික භොජනයෙකි. මුවවිටෙන් උඩ ථූපයක් සේ ගොඩ ගැසෙන තුරු පිණ්ඩපාතය නොපිළිගත යුතුයි. දුකුළාවක් විය හැකි හෙයිනි.

අදිටන් නොපොහොනා පාත්‍රයෙක්හි නම් යාවකාලිකා හාරයත් යාමකාලිකාදියත් මුවවිටෙන් උඩට සිටින සේ පිළිගන්නට වටී. එසේම පාත්‍රා දෙකකට පිළිගෙණ එක පාත්‍රයක් පුරවා පන්සලට ගෙණෙන්නට හැකිවේ. කැවුම් උක්දඬු පලතුරු ආදිය මුවවිටෙන් උඩ සිටින සේ පිළිගැනීම වටනේය. කොළයක හෝ තලියක හෝ යම්කිසි භාජනයක දමා පාත්‍රයේ උඩ තැබුව හොත් එයත් පිළිගැනීමෙන් වරදක් නොවේ. මේ ශික්ෂාපදයෙහි ගිලනාට ද (සමතිත්තිකය ඉක්මවා පිළිගත් නොත්) දුකුළා වේ.

---

1. **අර්:**- සක්කච්චං, සකසා; නොහොත් ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්; පිණ්ඩපාතං, පිණ්ඩපාතය; භුඤ්ජිස්සාමි ඉති, අනුභව කරන්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයං, කටයුත්තීය.

2. පත්ත සඤ්ඤී, පාත්‍ර ගත සංඥ ඇතිව; පිණ්ඩපාතං පිණ්ඩපාතය; භුඤ්ජිස්සාමි ඉති. අනුභව කරන්නෙමියි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

3. සපදනං, ගෙපිළිවෙළින්; පිණ්ඩපාතං, පිණ්ඩපාතය; භුඤ්ජිස්සාමි ඉති, අනුභව කරන්නෙමියි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයං, කටයුත්තීය.

4. සමසූපකං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

5. න ථූපතො ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජිස්සාමි සික්ඛා කරණීයා.

6. න සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙස්සාමීති භියොකම්‍යතං උපාදයාති සික්ඛා කරණීයා.

7. න සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

8. න උජ්ඣාන සඤ්ඤී පරෙසං පත්තං ඔලොකෙස්සාමීති සික්ඛා කරණීයා.

9. නාතිමහන්තං කබලං කරිස්සාමීති සික්ඛා කරණීයා.

---

4. සමසූපකං, බතට සුදුසු ප්‍රමාණ (මුද්ග සූපාදී) ව්‍යඤ්ජන ඇති කොට: පිණ්ඩපාතං, පිණ්ඩපාතය: භුඤ්ජිස්සාමි ඉති, අනුභව කරන්නෙමි'යි සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

5. ථූපතො, බත් මුදුනෙන්: ඔමද්දිත්වා, හනා හෙවත් මැඩ: පිණ්ඩපාතං, පිණ්ඩපාතය: න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නො කරන්නෙමි'යි සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

6. භීයෝ‍යා කම්‍යතං, බොහෝ (වැඩි කරගණු) කැමති බවක්: උපාදය, ගෙණ (නිසා) සූපං වා, (මුද්ගසූපාදී) සූපයක් හෝ: බ්‍යඤ්ජනං වා, (අනික්) ව්‍යඤ්ජනයක් හෝ: ඔදනෙන, බතින්: න පටිච්ඡාදෙස්සාමි ඉති, නොවසන්නෙමි'යි සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

7. අගිලානො, නො ගිලන් වූයේ: සූපංවා, (මුද්ග සූපාදී) සූපයක් හෝ: ඔදනං වා, බතක් හෝ: අත්තනො අත්ථාය, ස්වකීය ප්‍රයෝජනය පිණිස: විඤ්ඤාපෙත්වා, විඥපනය කොට: (ඉල්වා) න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නොකරන්නෙමි'යි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

8. උජ්ඣාන සඤ්ඤී, නුගුණ කියන රිසි ඇත්තේ: පරෙසං, අනුන්ගේ: පත්තං, පාත්‍රය: න ඔලොකෙස්සාමි ඉති, නොබලන්නෙමි'යි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

9. අතිමහන්තං, (මොණර බිජුවට සේ) ඉතා මහත් වූ: කබළං, ආලොපය: න කරිස්සාමි ඉති, නො කරන්නෙමියි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

10. පරිමණ්ඩලං, ආලොපං කරිස්සාමීති සික්ඛා කරණීයා.

**සක්කච්චවග්ගො චතුත්ථො.**

---

10. පරිමණ්ඩලං, හාත් පසින් වට කොට; ආලොපං, ආලොපය; (බත්පිඩ) කරිස්සාමි ඉති, කරන්නෙමි, යි; සික්ඛා; ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

**චතුත්ථො, සතරවෙනි වූ; සක්කච්ච වග්ගො, සක්කච්ච වර්ගයයි.**

---

**3**. සං:- 'සපදනං' (අපෙතං දනතො; අපදනං; සහ අපදනෙන; සපදනං) මෙහි 'දනං' යනු (පිළිවෙළ) සිඳීමය. සිඳීමෙන් (කැඩීමෙන්) තොරවූයේ අපදන යයි. අපදනයෙන් යුක්තවූයේ සපදනයයි. පිළිවෙළ නොසිඳීමය. වළඳනවිට පාත්‍රයේ තැන් තැන් වලින් නොගෙණ පිළිවෙළින් (කොණක සිට) වැළඳිය යුතු බැව් මෙයින් ප්‍රකාශ කරයි.

**6**. **සං**:- වැඩිපුර වළඳනු කැමැත්තෙන් සූප ව්‍යඤ්ජන බත් වලින් නො පෙණෙන සේ වැසීම නොවටී. මාඝාත සමයෙක්හි (යම් කලෙක රජවරු සතුන් නො මරත්වායි බෙර හසුරුවත් නම් ඒ කාලය මාඝාත සමයයි.) බත් දෙන්නෝ ව්‍යඤ්ජන බතින් වසා දෙත් නම් එය පිළිගන්නාටද, භියෙ‍යා කම්‍යතාවයක් නැතිව ප්‍රතිච්ඡාදනය කරන්නාට ද ඇවැත් නොවේ. මෙහිද ගිලනාද ඇවතින් නොමිදෙයි.

8. සං:- **"උජ්ඣානසඤ්ඤී"** (උජ්ඣායති එතෙන විතෙනනාති; උජ්ඣායනං. උජ්ඣායනෙ සඤ්ඤා; උජ්ඣානසඤ්ඤා; සා අස්ස අත්ථීති; උජ්ඣානසඤ්ඤී.) උජ්ඣාන සංඥව නම් නුගුණ (දෙස්) කියන අදහසයි. යම් කිසිවක් දෙන්නට හෝ දෙවන්නට සිතා අනුන්ගේ පාත්‍රය බැලීම වටී, මෙහිද ගිලනා ඇවතින් නොමිදෙයි.

9. සං:- **"අතිමහන්තං කබලං"** මෙහි ඉතා මහත් බත් පිඩ නම් මොණර බිජුවටක් පමණ වූවකි. ඉතා කුඩා බත් පිඩ කිකිළි බිජුවටක් පමණ වූවකි. මෙසේ ඉතා මහත් නොවූත් ඉතා කුඩා නොවූත් ආලොප (පිඩු) කටයුත්තාහුය.

සියලුම බාද්‍ය වර්ගත් ඵලාඵල වර්ගත් පහසු පරිදි වැළඳිය හැකි වේ.

1. නානාහටෙ කබලෙ මුඛද්වාරං විවරිස්සාමීති සික්ඛා කරණීයා.

2. න භුඤ්ජමානො සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපිස්සාමීති සික්ඛා කරණීයා.

3. න සකබලෙන මුඛෙන බ්‍යාහරිස්සාමීති සික්ඛා කරණීයා.

4. න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

5. න සකබළාවච්ඡෙදකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

6. න අවගණ්ඩකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

7. න හත්ථ නිද්ධුනකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

---

1. අර්ථ:- කබලෙ, ආලොපය, (බත්පිඩ) අනාහටෙ, ලඟට නො ගෙණා කල්හි, මුඛද්වාරං, මුවදෙර: න විවරිස්සාමි ඉති, විවෘත නොකරන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

2. භුඤ්ජමානො, වළඳමින්: සබ්බං හත්ථං, සියලු අත: මුඛෙ, මුඛයෙහි: න පක්ඛිපස්සාමි ඉති, නො හෙලන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

3. සකබලෙන, අලොපය සහිතවූ: මුඛෙන, මුඛයෙන්: නබ්‍යා හරිස්සාමි ඉති, කථා නොකරන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

4. පිණ්ඩුක්ඛෙපකං ආලොපය මුඛයට දම දමා: (බත් පිඩ කටට විසිකරමින්,) න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නොකරන්නෙමි'යී: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

5. කබළාවච්ඡෙදකං, බත් පිඩ කඩ කඩා: න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නොකරන්නෙමි'යී: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

6. අවගණ්ඩකාරකං, (වඳුරන් මෙන්) මුඛයෙන් ආලොපය රැස් කිරීම කොට: න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නොකරන්නෙමි'යී: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

7. හත්ථනිද්ධුනකං, අත ගසා දැමීම කොට කොට: න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නොකරන්නෙමි'යී: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා කටයුත්තීය.

8. න සිත්ථාව කාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
9. න ජිව්හානිච්ඡාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
10. න චපු චපු කාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

---

8. සිත්ථාවකාරකං, බත්තුළු ඉස ඉස; න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නොකරන්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

9. ජිව්හානිච්ඡාරකං, දිව නෙර නෙරා (දිව එලියට අදිමින්); න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නොකරන්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා කටයුත්තීය.

10. චපු චපු කාරකං, චපු චපු යන හඬ ඇති කොට; න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නොකරන්නෙමි'යි සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කට යුත්තීය.

**පඤ්චමො, පස්වෙනිවූ; කබලවග්ගො, කබල වර්ගයයි**.

---

2. **සංලක්ෂ්‍යයː-** **"සබ්බං හත්ථං"** මෙහි හස්ත ශබ්දයෙන් හස්තෛක දෙශවූ අඞ්ගුලීහු (ඇඟිලි වාච්‍ය වෙති.) 'හත්ථමුද්ද' යනාදී තන්හි මෙනි. වළඳන විට ඇඟිලි පසම මුඛයෙහි ප්‍රවෙශ නොකටයුතු බැව් ප්‍රකාශ කිරීමෙන්ම එක ඇඟිල්ලක් නමුත් මුඛයෙහි ප්‍රවෙශ නොකට යුතුයයි සැලකිය යුතුයි.

3. **සංː-** **"සකබලෙන මුඛෙන"** මුඛයෙහි ආහාර තිබියදී කථා කිරීම නොවටනේය. යම් පමණ අහරක් මුඛයෙහි තිබියදී කථාකරන්නහුගේ වචන (අක්ෂරොච්චාරණයෙන්) සම්පූර්ණ නම් එපමණ බත් තිබි යදී කථා කිරීමෙන් ඇවැත නොවේ.

ධර්මදෙශනා කරණ අවස්ථාවෙහිදී අරළු, වැල්මී, ආදිය ස්වල්පයක් මුඛයෙහි තිබීමෙන්ද ඇවැත නොවේ. එහෙත් වචන සම්පූර්ණ කොට කියන්නට බැරි තරම් අරළු ආදිය මුඛයෙහි පුරවා ගෙණ බණ දෙසන්නට නොවටී.

7. **සංː-** **"හත්ථනිද්ධූනකං"** මෙහි වළඳන විට මාලු කටු කරපිංච කොල ආදි කචවර ඉවත් කිරීම පිණිස අතගසා දැමීමෙන් ඇවත නොවේ.

**සංː-** **"සිත්ථාවකාරකං"** මෙහිද කචවර ඉවත් කිරීමේදී බත්තුළු විසිරීමෙන් ඇවත නොවේ.

---

1. න සුරු සුරු කාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
2. න හත්ථ නිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
3. න පත්ත නිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
4. න ඔට්ඨ නිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
5. න සාමිසෙන හත්ථෙන පානීය ථාලකං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.
6. න සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙස්සාමීති සික්ඛා කරණීයා.

---

1. අර්ථ:- සුරු සුරු කාරකං; සුරු සුරු යන අනුකරණ ඇතිව; න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නොකරන්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා; කටයුත්තීය.

2. හත්ථනිල්ලෙහකං, අත ලෙව ලෙව; න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නොකරන්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා කටයුත්තීය.

3. පත්තනිල්ලෙහකං, (එක ඇඟිල්ලකින් නමුත්) පාත්‍රය ලෙව ලෙව; න භුඤ්ජිස්සාමි ඉති, අනුභව නො කරන්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

4. ඔට්ඨනිල්ලෙහකං, (දිවෙන්) පිටිතොල් ලෙව ලෙව; න භුඤ්ජිස්සාමි ඉති, නුබුදින්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

5. සාමිසෙන හත්ථෙන, ආමිස සහිතවූ අතින්, පානීය ථාලකං පැන් තලිය; න පටිග්ගහෙස්සාමීති, නො පිළිගන්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

6. සසිත්ථකං; බත්තුළු සහිතවූ; පත්තධොවනං, පාත්‍රය සෝදූ ජලය; අන්තරඝරෙ, අන්තරඝරයෙහි; න ඡඩ්ඩෙස්සාමි ඉති, නො දමන්නෙමි'යි; සික්ඛා, ශික්ෂා තොමෝ, කරණීයා, කටයුත්තීය.

**2. සංලක්ෂණය:- "හත්ථනිල්ලෙහකං"** යනු (නිල්ලෙහී යතෙති, නිල්ලෙහකං, නි: පු: ලිහ: ලෙහනෙ. 'ණවු' ප්‍රත්‍යයයි, හත්ථස්ස නිල්ලෙහකං, හත්ථ නිල්ලෙහකං) අත ලෙවකෑමය. ඝන පාකයෙන් යුත් යාගු පැණි ආදිය ඇඟිල්ලෙහි දවටා මුව තුළට ප්‍රවෙශ කිරීම වටනේය.

**සං:- "සාමිසෙන හත්ථෙන"** යනු සංඝික වූ හෝ පුද්ගලික වූ හෝ ගිහීන්ට අයිති වූ හෝ පැන් කලය කිතිස්ස යනාදිය ඉඳුල් සහිත අතින් නො ඇල්ලිය යුතුයි. අතෙහි (ඇඟිලිවල) එක පෙදෙසක ඉඳුල් නො තැවරුණි නම් එ පෙදෙසින් ඇල්ලීම කළ හැක්කේ ය.

7. න ඡත්ත පාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා

8. න දණ්ඩ පාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා

9. න සත්ථ පාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා

10. න ආයුධ පාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා

**සුරු සුරු වග්ගො ජට්ඨො.**

7. න පාදුකා රූළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා

---

7. ඡත්තපාණිස්ස, කුඩයක් ගත් අත් ඇත්තාවූ: අගිලානස්ස, නො ගිලන් පුද්ගලයෙකුට, ධම්මං, ධර්මය, න දෙසිස්සාමි ඉති, දෙශනා නො කරන්නෙමි'යි සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

8. දණ්ඩ පාණිස්ස, දඬුගත් (සැරටියක් ගත්) අත් ඇත්තාවූ: අගිලානස්ස, නො ගිලන්වූ පුද්ගලයෙකුට, ධම්මං, ධර්මය, න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

9. සත්ථපාණිස්ස, ශස්ත්‍රයක් ගත් අත් ඇත්තාවූ: අගිලානස්ස, නො ගිලන්වූ පුද්ගලයෙකුට: ධම්මං, ධර්මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

10. ආයුධ පාණිස්ස: (දුනු ආදි) ආයුධ ගත් අත් ඇත්තාවූ: අගිලානස්ස, නො ගිලන්වූ පුද්ගලයෙකුට: ධම්මං, ධර්මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

1. අර්ථ:- පාදුකාරූළ්හස්ස, (කාෂ්ඨපාදුකාදි) පාදුකා වෙක්හි නැගුනාවූ, අගිලානස්ස, නොගිලන් පුද්ගලයෙකුට, ධම්මං, ධර්මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා, කටයුත්තීය.

2. න උපාහණා රූළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා
3. න යාන ගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා
4. න සයනගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා
5. න පල්ලත්ථිකාය නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා
6. න වෙඨිත සීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා
7. න ඕගුණ්ඨිත සීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා

---

2. උපාහණාරූළ්හස්ස: (පා) වහන්හි (සෙරෙප්පුවල) නැගුනාවූ: අගිලානස්ස, නො ගිලන් පුද්ගලයෙකුට: ධම්මං, ධර්මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා: කටයුත්තීය.

3. යානගතස්ස, යානාවකට (රියකට) නැගුනාවූ: අගිලානස්ස, නො ගිලන් පුද්ගලයෙකුට: ධම්මං, ධර්මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා: කටයුත්තීය.

4. සයන ගතස්ස, හෝනා (නිදන) ඇඳට නැගුනාවූ: අගිලානස්ස, නොගිලන් පුද්ගලයෙකුට: ධම්මං, ධර්මය: න දෙසිස්සාමි ඉති, නො දෙන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා: කටයුත්තීය.

5. පල්ලත්ථිකාය, වස්ත්‍ර අතුරුවා ගැණීමාදියෙන්: නිසින්නස්ස, හුන්නාවූ: අගිලානස්ස, නොගිලන් පුද්ගලයෙකුට: ධම්මං, ධර්මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා: කටයුත්තීය.

6. වෙඨිතසීසස්ස, (කෙසාන්තය නොපෙණෙන සේ වස්ත්‍රා දියෙන්) වෙළනලද හිස ඇත්තාවූ: අගිලානස්ස, නොගිලන් වූ වෙකුට: ධම්මං, ධර්මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා: කටයුත්තීය.

7. ඕගුණ්ඨිතසීසස්ස, හිස වසා පොරවන ලද්දවූ: අගිලානස්ස, නොගිලන් වූවෙකුට: ධම්මං, ධර්මය: න දෙසිස්සාමි ඉති, දෙශනා නොකරන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා: කටයුත්තීය.

8. න ඡමාය නිසීදිත්වා ආසනෙ, නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා.

9. න නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ, නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා.

10. න ඨිතො නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා.

1. න පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා.

2. න උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා.

---

8. ඡමාය, භූමියෙහි: නිසීදිත්වා, හිඳ: ආසනෙ, අසුනෙක්හි: නිසින්නස්ස, හුන්නාවූ: අගිලානස්ස, නොගිලන්වූවෙකුට: ධම්මං: ධර්‍මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා. කටයුත්තීය.

9. නීචෙ ආසනෙ, මිටි අසුනෙක්හි: නිසීදිත්වා, හිඳ උච්චෙ ආසනෙ, උස් අසුනෙක්හි: නිසින්නස්ස, හුන්නාවූ: අගිලානස්ස, නොගිලන්වූවෙකුට: ධම්මං: ධර්‍මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා. කටයුත්තීය.

10. ඨිතො, සිටියේ: නිසින්නස්ස, හුන්නාවූ: අගිලානස්ස, නො ගිලන්වූවෙකුට: ධම්මං: ධර්‍මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා. කටයුත්තීය.

1. පච්ඡතො, පස්සෙන්: ගච්ඡන්තො, යන්නේ: (යමින්) පුරතො, ඉදිරියෙන්: ගච්ඡන්තස්ස, යන්නාවූ: අගිලානස්ස, නොගිලන් වූවෙකුට: ධම්මං, ධර්‍මය: න දෙසිස්සාමි ඉති, නො දෙසන්නෙමි'යි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා. කටයුත්තීය.

2. උප්පථෙන, නොමගින්: ගච්ඡන්තො, යන්නේ: පථෙන, මාර්‍ගයෙන්: ගච්ඡන්තස්ස, යන්නාවූ: අගිලානස්ස, නොගිලන් වූවෙකුට: ධම්මං: ධර්‍මය: න දෙස්සාමි ඉති, නොදෙසන්නෙමි'යි: සික්ඛා, ශික්‍ෂා තොමෝ: කරණීයා. කටයුත්තීය.

3. න ඨිතො අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා.

4. න හරිතෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා.

5. න උදකෙ, අගිලානො, උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා.

**පාදුකා වග්ගො සත්තමො.**

---

3. ඨිතො, සිටියේ: අගිලානො, නොගිලන් වූයේ: උච්චාරං වා මල (අසූචි) හෝ: පස්සාවං වා, මුත්‍ර හෝ: ඛෙළං වා කෙළ හෝ: න කරිස්සාමි ඉති: නොකරන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා: කටයුත්තීය.

4. හරිතෙ, තිල් තෘණ ඇති භූමියෙහි: අගිලානො, නොගිලන් වූයේ: උච්චාරං වා මල හෝ: පස්සාවං වා, මුත්‍ර හෝ: ඛෙළං වා කෙළ හෝ: න කරිස්සාමි ඉති: නො කරන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා: කටයුත්තීය.

5. උදකෙ, පරිභොග ජලයෙහි: අගිලානො, නොගිලන් වූයේ: උච්චාරං වා මල හෝ: පස්සාවං වා, මුත්‍ර හෝ: ඛෙළං වා කෙළ හෝ: න කරිස්සාමි ඉති: නො කරන්නෙමි'යි: සික්ඛා, ශික්ෂා තොමෝ: කරණීයා: කටයුත්තීය.

**සත්තමො, සත්වෙනි වූ: පාදුකා වග්ගො, පාදුකා වර්ගයයි.**

1. සං:- 'පාදුකාරුළ්හස්ස' මෙහි 'පාදුකා' නම් වහන් විශෙෂයෝය. සම්වලින් හෝ ලීවලින් කෙරෙති. පාදුකාව ඇඟිලි අතරෙන් ගලවා කකුල්වලින් පාගා සිටින්නාට ද බණ කියන්නට නොවටී.

සං:- "යානගතස්ස" මෙහි යටත් පිරිසෙයින් දෙදෙනෙකු විසින් කරණ ලද අත් පුටුවද යානයෙකි. එහි සිටියහුටද බණ කියන්නට නොවටී. උස් යානයෙහි සිටියහු විසින් නීච යානයෙහි සිටියහුට ධර්මය කීම වටී. දෙදෙන සම සම යාන දෙකෙක්හි නම් හෙද වටී.

සං:- "සයනගතස්ස" මෙහි යටත් පිරිසෙයින් කළාලයෙක්හි හෝ ප්‍රකෘති භූමියෙහි හෝ නිදන්නාට උස් වූ ඇඳ පුටු ආදියෙහි වාඩි වී සිට ගෙණවත් බණ කියන්නට නොවටී.

ඉමෙ ඛො පනායස්මන්තො සත්ත අධිකරණ සමථා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

---

උස්වූ සයනයක සිටින්නහු විසින් පාත් සයනෙහි සිටින්නාටද සමාන සයනෙහි සිටියහු විසින් පාත් සයනෙහි සිටින්නාටද බණ දෙසන්නට වටනේය.

**5**. සං:- **"න උදකෙ"** මෙය පරිභොගාර්‍හ ජලය සඳහා කියන ලදී. වච්චකුටි, සමුද්‍ර, උදකාදියෙහි නම් ඇවැත නොවේ. වර්‍ෂාව බහුල සමයෙක්හි ජලය නැති තැනක් සොයා ගන්නට නොහැකි නම් ජලයෙහි මල මූත්‍රාදිය කළාට වරදක් නොවේ.

මෙසේ සෙඛියාවල සමුට්ඨානාදිය මිශ්‍ර වශයෙන් දක්වති. උජ්ජග්ඝිකා උච්චා ශබ්ද ප්‍රතිසංයුක්ත සතර ද, සකබල මුඛයෙන් ඛ්‍යාහරණය, ඡමා නිචාසනට්ඨිත, පච්ඡතො ගමන, උප්පථගමන, ප්‍රතිසංයුක්ත සයද, යන දසය සමනු භාෂණ සමුට්ඨානයෝය.

එසේ ම එකක් පාසා ක්‍රියාය, සංඥ විමොක්‍ෂය, සචිත්තකය, ලොකවද්‍යය, කායකර්‍මය, අකුශල චිත්තය, දුක්ඛ වෙදනාය.

සූපොදන විඥප්ති ශික්‍ෂාපදය, ථෙය්‍ය සත්ථ සමුට්ඨානය යි කියායි. සංඥ විමොක්‍ෂය, සචිත්තකය, ලොකවද්‍යය, කායකර්‍මය, වාක්කර්‍මය, අකුශල චිත්තය, දුක්ඛ වෙදනාවය.

ඡත්ත පාණි, දණ්ඩ පාණි, සත්ථ පාණි, ආවුධ පාණි, පාදුකොපාහණ, යාන සයන පල්ලත්ථික වෙඨිත ඔගුණ්ඨිත යන ශික්‍ෂා එකොළස, ධර්‍ම දේශනා සමුට්ඨානයෝය, ක්‍රියාක්‍රියයෝය සංඥ විමොක්‍ෂයෝය, සචිත්තකයෝය, ලොකවද්‍යයහ, වාක්කර්‍මයහ, අකුශල චිත්තයහ, දුක්ඛ වෙදනාහුය.

සෙසු පණස්තුණ ප්‍රථම පාරාජිකා සමුට්ඨානාදිය හා සම වෙති.

**අර්‍ථ**:- ආයස්මන්තො, ආයුෂ්මත්නි; ඉමෙ ඛො පන සත්ත අධිකරණ සමථා ධම්මා, මේ අධිකරණ සමථ ධර්‍ම සත වනාහි; උද්දෙසං, උදෙසීමට; ආගච්ඡන්ති, පැමිණෙත්.

උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛා විනයො දාතබ්බො, සතිවිනයො දාතබ්බො: අමූළ්හ විනයො දාතබ්බො: පටිඤ්ඤාය කාරෙතබ්බො: යෙභුය්‍යසිකා, තස්සපාපියසිකා තිණවත්ථාරකොති.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො සෙඛියා ධම්මා තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, පරිසුද්ධෙත්ථා'යස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

**සෙඛියා නිට්ඨිතා.**

---

උප්පන්නුප්පන්නානං, උපනුපන්නා වූ (විවාදධිකරණාදී) අධිකරණයන්ගේ: සමථාය, සංසිඳවීම පිණිස: වූපසමාය, ව්‍යපසමනය පිණිස: සම්මුඛාවිනයො, සම්මුඛාවිනය සමථය තෙම: දාතබ්බො, දිය යුත්තේය. සතිවිනයො, සතිවිනයතෙම: දාතබ්බො, දිය යුත්තේ ය: අමූළ්හාවිනයො, අමූළ්හාවිනය සමථය තෙම: දාතබ්බො දීය යුත්තේය: පටිඤ්ඤාය, ප්‍රතිඥාවෙන්: කාරෙතබ්බො, (ඇවතින්) කරවිය යුත්තේය: යෙභුය්‍යයිකා, යෙභුය්‍යසිකා නම් සමථයද, තස්ස පාපිය්‍යසිකා, තස්සපාපිය්‍යසිකා නම් සමථයද: තිණවත්ථාරකො, තිණවත්ථාරක නම් සමථයද යන මොහුයි.

**අර්ථ:-** ආයස්මන්තො, ආයුෂ්මත්නි: සෙඛියා ධම්මා, සෙඛියා පන්තීහු: උද්දිට්ඨා ඛො, උදෙසන ලද්දහුමය. තත්ථ, එහිලා: ආයස්මන්තෙ, ආයුෂ්මතුන්: පුච්ඡාමි, විචාරමි: කච්චි, කිම: පරිසුද්ධා අත්ථ, පිරිසිදු වන්නහුද? දුතියං අපි, දෙවනුවත්: පුච්ඡාමි, විචාරමි: කච්චි, කිම: පරිසුද්ධා අත්ථ, පිරිසිදු වන්නහුද? තතියං අපි, තෙවනුත්: පුච්ඡාමි, විචාරමි: කච්චි, කිම? පරිසුධා අත්ථ, පිරිසිදු වන්නහුද?

ආයස්මන්තො, ආයුෂ්මත්හු: තත්ථ, එහි: පරිසුද්ධා, පිරිසිදුහ: තස්මා, එහෙයින්: තුණ්හී, තුෂ්ණිභූතයහ: එවං මෙසේ: එතං, මේ තුෂ්ණිම්භාවය: ධාරයාමී ඉති, දරම්'යි.

**ප්‍රාතිමොක්ෂ වණ්ණනායෙහි සෙඛියා වණ්ණනා නිමි.**

---

සං:- **"සත්ත අධිකරණ සමථා"** (සමථාසමථ වසෙන අධිකරීයන්ති එත්ථ ආපත්තාධිකරණාදීනිවෙති; අධිකරණානි: අධි, පු, කර, කරණෙ, අධිකරණානි සමෙන්ති වූපසමෙන්තීති; අධිකරණ සමථා:) සප්තාධිකරණ සමථයෝ නම් විවාදධිකරණාදී සිවු අධිකරණයන් සංසිඳුවන ක්‍රම සත ය. නොහොත් ´නීති´ සත ය.

අධිකරණ සතරෙකි; විවාදධි කරණය=අනුවාදධි කරණය, ආපත්තාධිකරණය-කිච්චාධිකරණය කියායි.

මේ ධර්‍මය යි කියා හෝ මේ අධර්‍මය කියා හෝ අටළොස් භෙද කර වස්තුන්ගෙන් විවාදපත්ත භික්‍ෂූන්ගේ යම් විරුද්ධවාදයක් උපනි නම් ඒ ´විවාදධිකරණ´ ය යි.

ශීල ආචාර දෘෂ්ටි ආජීව විපත්වලින් චොදනා කරන්නවුන්ගේ යම් යම් අනුවාද උපවාද චොදනා වෙත් නම් ඒ අනුවාදධිකරණ´ යයි.

සප්තාපත්තිස්කන්ධයෝ ´ආපත්තාධිකරණ´ ය යි; අපලොකන කර්‍මාදි සිවු වැදෑරුම් වූ කර්‍මයක් වේ නම් ඒ ´කිච්චාධිකරණ´ ය යි.

සඞ්ඝ-ධර්‍ම-විනය-පුද්ගල යන මොවුන්ගේ සම්මුඛත්වය ඇත්තේ ´සම්මුඛාවිනය´යි.

අමූලික වූ ශීලවිපත්තියෙන් චොදිත ක්‍ෂීණාශ්‍රවයන්ට දියයුතු විනය ´සතිවිනය´යි දබ්බමල්ල පුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙනි.

උමතු වූ භික්‍ෂුවට දිය යුතු විනය ´අමූළ්හවිනය´යි. ගර්‍ග භික්‍ෂුවට මෙනි.

ප්‍රතිඥාව කරණකොටගෙණ කිරීම ´පටිඤ්ඤාතකරණය´යි. යම් විනය කර්‍මයෙක්හි ධර්‍මවාදි භික්‍ෂූහු වැඩිය සිටිත් නම් ඕ තොමෝ ´යෙභුය්‍යසිකාව´යි.

පාපුස්සන්නත්වයෙන් යම් භික්‍ෂුවක් පාපී සඞ්ඛ්‍යාවට ගැණෙයි නම් ඕ තොමෝ ´තස්සපාපීයසිකා´ නම්. උපවාල භික්‍ෂුවට මෙනි.

යම්කිසි අධිකරණයක් මූල කාරණා සොයන්නට යාමෙන් කෲර වෙයි නම් භෙදය පිණිස පවතී නම් එය ගූථයක් මෙන් වසා දැමිය යුතු බැවින් තිණ වත්ථාරකය සමානවූයේ ´තිණවත්ථාරකය´යි.

උද්දිට්ඨා බො ආයස්මන්තො සත්ත අධිකරණ සමථා ධම්මා, තත්ථා'යස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි: කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථා යස්මන්තො: තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

## අධිකරණ සමථා නිට්ඨිතා.

---

'විවාදධිකරණය' - සම්මුඛා විනයෙන් හා යෙභුය්‍යසිකාවෙන්ද.

'අනුවාදධිකරණය' - සම්මුඛාවිනය, සතිවිනය, අමූළ්හ විනය, තස්සපාපිය්‍යසිකාය, යන සතරෙන්ද,

'ආපත්තාධිකරණය' - සම්මුඛාවිනය, පටිඤ්ඤාතකරණය, තිණ වත්ථාරකය, යන තුණෙන්ද.

'කිච්චාධිකරණය' - එකම සම්මුඛාවිනයෙන්ද ව්‍යපසමනය කට යුතුයි. හෙවත් සංසිඳවිය යුතුයි.

(වැඩි විස්තර සමන්තපාසාදිකාවෙන් බැලිය යුතුයි.)

**අථ**:- ආයස්මන්තො, ආයුෂ්මත්නි: සත්ත අධිකරණ සමථා, අධිකරණ සමථ ධම් සත: උද්දට්ඨා බො, උදෙසන ලද්දහුමය. තත්ථ: එහිලා: ආයස්මන්තො, ආයුෂ්මතුන්: පුච්ඡාමි, විචාරමි, කච්චි, කිම, පරිසුද්ධ අත්ථ, පිරිසිදු වන්නහුද? දුතියං අපි, දෙවනුත්: පුච්ඡාමි, විචාරමි: කච්චි, කිම: පරිසුද්ධා අත්ථ, පිරිසිදු වන්නහුද? තතියං අපි, තෙවනුත්: පුච්ඡාමි, විචාරමි: කච්චි, කිම: පරිසුද්ධා අත්ථ, පිරිසිදු වන්නහුද? ආයස්මන්තො ආයුෂ්මත්හු, තත්ථ, එහි: පරිසුද්ධා, පිරිසිදුහ: තස්මා එහෙයින්: තුණ්හී, තුෂ්ණිම්භූතයහ. එවං මෙසේ: එතං මෙ තුෂ්ණිම් භාවය: ධාරයාමීති, දරමි'යි (පිරිසිදු හෙයිනැයි සලකමි.)

අධිකරණ සමථා, අධිකරණ සමථයෝ: නිට්ඨිතා, නිමවන ලදහ.

## භික්ඛු භික්ඛුණී ප්‍රාතිමොක්ෂයෙහි අධිකරණ සමථ වර්ණනාව නිමි.

---

උද්දිට්ඨං ඛො ආයස්මන්තො, නිදානං, උද්දිට්ඨා චත්තාරො පාරාජිකා ධම්මා, උද්දිට්ඨා තෙරස සංඝාදිසෙසා ධම්මා, උද්දිට්ඨා ද්වෙ අනියතා ධම්මා, උද්දිට්ඨා, තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා. උද්දිට්ඨා ද්වෙනවුති පාචිත්තියා ධම්මා, උද්දිට්ඨා චත්තාරො පාටිදෙසනීයා ධම්මා, උද්දිට්ඨා සෙඛියා ධම්මා, උද්දිට්ඨා සත්ත අධිකරණ සමථා ධම්මා, එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්ත පරියාපන්නං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති, තත්ථ සබ්බෙහෙව සමග්ගෙහි සම්මොදමානෙහි අවිවදමානෙහි සික්ඛිතබ්බන්ති.

**භික්ඛු පාතිමොක්ඛං නිට්ඨිතං.**

---

ආයස්මන්තො, ආයුෂ්මත්නි; නිදානං, නිදානය; උද්දිට්ඨං ඛො, උදෙසන ලද්දේමය; චත්තාරො පාරාජිකා ධම්මා; සතර පාරාජිකා පත්තීහු; උද්දිට්ඨා, උදෙසන ලද්දහුමය. තෙරස සංඝාදිසෙසා ධම්මා, තෙළෙස් සංඝාදිසෙසාපත්තීහු; උද්දිට්ඨා, උදෙසන ලද්දහුය. ද්වෙ අනියතා ධම්මා, අනියතා පත්ති දෙක උද්දිට්ඨා, උදෙසන ලද්දහුය. තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, තිස් නිසගි පචිති ඇවැත්හු උද්දිට්ඨා, උදෙසන ලද්දහුමය. ද්වෙනවුති පාචිත්තියා ධම්මා, දෙයානුවක් පචිති ඇවැත්හු; උද්දිට්ඨා, උදෙසන ලද්දහුමය. චත්තාරො පාටිදෙසනීයා ධම්මා, සතර පාටිදෙසනීයා පත්තීහු; අද්දිට්ඨා උදෙසන ලද්දහුමය. සෙඛියා ධම්මා, සෙඛියා ඇවැත්හු; උද්දිට්ඨා, උදෙසන ලද්දහුමය. සත්ත අධිකරණ සමථා ධම්මා, අධිකරණ සමථ ධම් සත; උද්දිට්ඨා, උදෙසන ලද්දහුමය.

තස්ස භගවතො, ඒ භගවත්හුගේ; සුත්තාගතං, සූත්‍රයෙහි ආවා වූ; සුත්ත පරියාපන්නං, සූත්‍රයෙහි ඇතුළත්වූ; එත්තකං, මේ පමණක් ශික්ෂාපද; අන්වද්ධමාසං, අඩමසක් පාසා; උද්දෙසං, උදෙසීමට; ආගච්ඡති, පැමිණේ; තත්ථ, ඒ ශික්ෂාපදයන්හි; සමග්ගෙහි, සමගිවූ; සම්මොදමානෙහි, මොනවට සතුටු වන්නාවූ; අවිවදමානෙහි, විවාද; නො කරන්නාවූ; සබ්බෙහි එව, සියලු භික්ෂූන් විසින්ම; සික්ඛි තබ්බං ඉති, හික්මිය යුත්තේය. (ඒ ඒ ශික්ෂාපද නොයික්ම අධිශීල ශික්ෂා තොමෝ සම්පාදනය කටයුත්තීය.)

භික්ඛු පාතිමොක්ඛං, භික්ෂු ප්‍රාතිමොක්ෂය, නිට්ඨිතං, නිමවන ලදී.

**රත්නාථ සුදතී නම් වූ**
**භික්ෂු භික්ෂුණී ප්‍රාතිමොක්ෂ වර්ණනාව නිමි.**

# සංවර්ණිත පදානුක්‍රමණිකාව


| | පිට | පෙළ |
|---|---|---|
| අංගුලි පතොදකෙ | 296 | 8 |
| අකතානු ධම්මෙන | 323 | 12 |
| අකප්පිය වොහාරං | 103 | 19 |
| අකාමා පරිවත්තබ්බං | 110 | 28 |
| අකාල චීවරං | 135 | 10 |
| අග්ගලට්ඨපනාය | 231 | 4 |
| අගිලානෙන | 251 | 8 |
| අච්චෙක චීවරං | 190 | 25 |
| අච්ඡින්දෙය්‍ය | 183 | 26 |
| අචෙල කස්ස | 279 | 23 |
| අජ්ඣාරාමෙ | 348 | 26 |
| අඤ්ඤත්‍රඋදකදන්තපොනා | 277 | 31 |
| අඤ්ඤත්‍රභික්ඛු සම්මුතියා | 211 | 25 |
| අඤ්ඤත්‍ර පාරිවට්ටකා | 140 | 27 |
| අඤ්ඤත්‍රපුරිස විග්ගහෙන | 207 | 26 |
| අඤ්ඤත්‍ර සමයා | 143 | 6 |
| අඤ්ඤත්‍ර සුපිනන්තා | 60 | 15 |
| අඤ්ඤ වාදකෙ | 217 | 8 |
| අඤ්ඤතිකාය භික්ඛුනියා | 137 | 14 |
| අට්ඨගරුධම්මා | 234 | 22 |
| අට්ඨධම්මකොවිදෙ | 127 | 6 |
| අඩ්ඪමාසො සෙසො ගිම්හානං | 181 | 30 |
| අණීකදස්සනං | 293 | 24 |

| | පිට | පෙළ |
|---|---|---|
| අත්තකාම පාරිචරියාය | 71 | 10 |
| අත්තනො අත්ථාය විඤ්ඤාපෙති | 274 | 18 |
| අත්තනො පරිණාමෙය්‍ය | 194 | 23 |
| අත්තූපනායිකං | 51 | 25 |
| අතිමහන්තං කබලං | 381 | 24 |
| අතිරෙක චීවරං | 128 | 22 |
| අතිරෙක පත්තො | 175 | 7 |
| අදින්නං | 277 | 1 |
| අද්ධානගමන සමයො | 254 | 24 |
| අද්ධානමග්ග පටිපන්නස්ස | 167 | 22 |
| අධිකරණං | 88 | 22 |
| අධිමානා | 52 | 15 |
| අධොගාමිනිං | 247 | 6 |
| අන්තරඝරං පවිට්ඨාය | 361 | 20 |
| අන්තරඝරෙ නික්ඛිපෙය්‍ය | 193 | 16 |
| අන්තරායිකා | 321 | 6 |
| අනතිරිත්තං | 264 | 20 |
| අනභිජානං | 51 | 13 |
| අනාදරියෙ | 298 | 19 |
| අනාපුච්ඡා වා ගවෙසෙය්‍ය | 221 | 17 |
| අනික්ඛන්ත රාජකෙ | 346 | 14 |
| අනියතො | 117 | 24 |
| අනීහතරතනකෙ | 346 | 18 |
| අනුද්ධංසෙය්‍ය | 84 | 19 |
| අනුපසම්පන්නං | 203 | 11 |
| අනුසාවන සම්පත්ති | 22 | 25 |
| අප්පතීතො | 83 | 16 |
| අප්පසද්දො | 376 | 15 |
| අබ්භානං | 113 | 29 |
| අභිහට්ඨුං | 145 | 12 |
| අමූලකෙන පාරාජිකෙන | 83 | 19 |

| | පිට | පෙළ |
|---|---|---|
| අලංකම්මනියෙ | 116 | 13 |
| අලමරිය ඤාණදස්සනං | 51 | 30 |
| අසන්තෙපි | 168 | 1 |
| අසම්මතො | 234 | 16 |
| අසංවාසො | 26 | 18 |
| ආදියෙය්‍ය | 34 | 22 |
| ආපත්ති ච හොති පකතත්තසඤ්ඤී ච | 110 | 1 |
| ආමිස හෙතු | 239 | 21 |
| ආරඤ්ඤකානි සෙනාසනානි | 193 | 1 |
| ආලොකසන්ධි පරිකම්මාය | 231 | 14 |
| ආවසථ පිණ්ඩො | 251 | 12 |
| ආවසථෙ | 348 | 30 |
| ආවිකා තබ්බා | 19 | 16 |
| ආහච්ච පාදකං | 229 | 10 |
| ඉන්දඛීලං | 346 | 21 |
| උක්කුටිකාය | 378 | 17 |
| උක්කොටෙය්‍ය | 312 | 23 |
| උජ්ඣාන සඤ්ඤී | 381 | 19 |
| උජ්ඣාපනකෙ | 219 | 1 |
| උත්තරිං ඡාරත්තං | 113 | 1 |
| උත්තරිං දිරත්තතිරත්තං | 203 | 15 |
| උත්තරිමනුස්සධම්මං | 209 | 26 |
| උතුක්ඛානං | 5 | 22 |
| උද්ධගාමිනිං | 247 | 4 |
| උදකෙ හස්සධම්මෙ | 297 | 10 |
| උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය | 170 | 27 |
| උපරිවෙහාසකුටියා | 229 | 1 |
| උපවස්සං | 192 | 18 |
| උපස්සුතිං | 338 | 24 |
| උපලාලෙය්‍ය | 327 | 9 |
| උපාසිකා | 117 | 7 |
| උපොසථො | 8 | 19 |

| | පිට | පෙල |
|---|---|---|
| උබ්භතස්මිං කඨිනෙ | 124 | 18 |
| උය්‍යුත්තං සෙනං | 290 | 7 |
| උය්‍යොජෙය්‍ය | 281 | 28 |
| ඌනපඤ්චබන්ධනෙ න | 177 | 20 |
| ඌනවීසතිවස්සං | 316 | 10 |
| ඔගුණ්ඨිතො | 378 | 15 |
| ඔතිණ්ණො | 64 | 15 |
| ඔභාසෙය්‍ය | 68 | 23 |
| ඔමසවාදෙ | 198 | 13 |
| ඔරෙන චෙ භික්ඛු ජනතං වස්සානං | 163 | 17 |
| ඔවාදෙ | 6 | 8 |
| කඨිනත්ථරණකම්මවාචා | 125 | 19 |
| කඨිනොද්ධරණං | 127 | 9 |
| කණ්ඩුපටිච්ඡාදිං | 357 | 29 |
| කත්තිකතෙමාසිපුණ්ණමං | 190 | 12 |
| කතචීවරමෙව උප්පජ්ජති | 126 | 8 |
| කප්පිය වොහාරං | 103 | 21 |
| කය වික්කයං | 174 | 1 |
| කල්‍යාණ කම්‍යතං උපාදය | 149 | 8 |
| කාය සං සග්ගං | 65 | 1 |
| කිඤ්චිදෙසං ලෙසමත්තං | 88 | 13 |
| කුක්කුච්චං උපාදෙය්‍ය | 337 | 15 |
| කුටිං | 78 | 3 |
| කුලදූසකො | 102 | 24 |
| කොසිය මිස්සකං | 159 | 11 |
| ඛීයනකෙ | 219 | 12 |
| බුද්ධනුබුද්ධකෙහි | 330 | 10 |
| ගණ භොජනෙ | 253 | 22 |
| ගහ පති | 143 | 1 |
| ගාමං වා නිගමං වා | 102 | 11 |

| | පිට | පෙල |
|---|---|---|
| ගාමා වා අරඤ්ඤා වා | 32 | 23 |
| ගිලාන සමයො | 254 | 16 |
| ගොචරියානං | 162 | 6 |
| චත්තාරො යාව තතියකා | 109 | 11 |
| චාතුමාසප්පච්චය පවාරණා | 287 | 26 |
| චිත්තසංකප්පො | 47 | 4 |
| චීවර කාර සමයො | 254 | 20 |
| චීවර චෙතාපන්නං | 148 | 13 |
| චීවර දනසමයො | 254 | 18 |
| චොරං | 38 | 17 |
| ඡක්ඛත්තුපරමං | 156 | 20 |
| ඡන්දගාමිනො භික්ඛු | 104 | 16 |
| ඡන්දපාරි සුද්ධි | 5 | 7 |
| ඡප්පඤ්චවාචාහි | 207 | 18 |
| ඡාදෙතු කාමො ච හොති ඡාදෙති ච | 110 | 22 |
| ජාතරූප රජතං | 170 | 15 |
| ජානං | 225 | 12 |
| ජානං සප්පාණකං | 233 | 1 |
| ඤත්තිසම්පත්ති | 22 | 14 |
| තථා නාසිතං | 326 | 30 |
| තල සත්තිකං | 335 | 19 |
| තිණ්ණං දුබ්බණ්ණ කරණානං | 306 | 8 |
| තිරච්ඡාන ගතාය පි | 25 | 13 |
| ත්‍රිවිධ සම්පත්ති | 11 | 14 |
| තුලොනද්ධං | 355 | 10 |
| ථෙය්‍ය සත්ථෙන | 318 | 12 |
| ද්වත්තිච්ඡදනස්ස | 231 | 20 |
| ද්වත්තිපත්තපූරා | 259 | 27 |
| ද්වාදස - පෙ - සුගතවිදත්ථියා | 78 | 15 |
| ද්වෙචීවරස්ස අධිට්ඨානා ති | 130 | 1 |
| දස ඉත්ථියො | 74 | 4 |
| දස භරියා | 74 | 9 |

| | පිට | පෙල |
|---|---|---|
| දසාහනාගතං | 190 | 6 |
| දුට්ඨුල්ලං ආපත්තිං | 314 | 6 |
| දුට්ඨුල්ලාහි වාචාහි | 68 | 16 |
| දුට්ඨො | 83 | 11 |
| දුබ්බච ජාතිකො | 98 | 15 |
| ධම්මං | 201 | 13 |
| ධම්මිකා නං කම්මා නං | 340 | 14 |
| ධොවා පෙය්‍ය | 138 | 9 |
| නව පඨමා පත්තිකා | 109 | 5 |
| නවං චීවර ලාභෙන | 306 | 1 |
| නහා යෙය්‍ය | 303 | 18 |
| නාවා භිරූහණ සමයො | 254 | 27 |
| නික්කඩ්ඪෙය්‍ය | 227 | 1 |
| නිට්ඨිත චීවරස්මිං | 124 | 1 |
| නිමිත්ත කම්මං | 104 | 1 |
| නිසජ්ජං කප්පෙය්‍ය | 116 | 21 |
| නිසජ්ජං භික්ඛු පටිජානමානො | 117 | 9 |
| නිසීදනං | 356 | 16 |
| නිසීදන සන්ථතං | 165 | 15 |
| නිහතාධි කරණං | 312 | 20 |
| පකතත්තො ච හොති | 110 | 7 |
| පදසො | 201 | 6 |
| පටිග්ගණ්හෙය්‍ය | 140 | 19 |
| පටිච්ඡන්න පරිවාසො | 111 | 1 |
| පටිච්ඡන්නෙන ආසනෙ | 116 | 11 |
| පටිසාය නීයානි | 179 | 22 |
| පඨවිං | 213 | 17 |
| පණීත භොජනානි | 274 | 1 |
| පත්තකල්ලං | 14 | 29 |
| පත්තපරියන්තො | 178 | 7 |
| පතිසෙවෙය්‍ය | 25 | 4 |
| පරම්පර භොජනෙ | 257 | 19 |

| | පිට | පෙල |
|---|---|---|
| පරිණතං | 194 | 21 |
| පරිබ්බාජකස්ස | 279 | 26 |
| පරිමණ්ඩලං නිවාසෙස්සාමි | 372 | 18 |
| පරියායං | 103 | 23 |
| පල්ලත්ථිකාය | 378 | 21 |
| පවාරිතො | 262 | 13 |
| පහිණෙය්‍ය | 155 | 6 |
| පහු ච හොති පහු සඤ්ඤි ච | 110 | 18 |
| පාණං | 310 | 19 |
| පාතිමොක්ඛං | 15 | 25 |
| පාපසමාචාරො | 103 | 8 |
| පාරාජික ඛෙත්තං | 27 | 1 |
| පිණ්ඩපාතමත්තං | 188 | 11 |
| පුබ්බෙ අප්පටිසංවිදිතං | 368 | 22 |
| පුබ්බෙ ගිහී සමාරම්භා | 248 | 12 |
| පුරාණ චීවරං | 137 | 26 |
| බද්ධසීමා | 11 | 10 |
| බලග්ගං | 293 | 18 |
| භිංසාපෙය්‍ය | 300 | 4 |
| භික්ඛු | 21 | 1 |
| භික්ඛුනී පරිපාචිතං | 248 | 8 |
| භික්ඛුනූ පස්සයං | 239 | 2 |
| භික්ඛු පෙසුඤ්ඤෙ | 199 | 18 |
| භික්ඛුමානත්තාය | 103 | 5 |
| භිසි | 221 | 6 |
| භුත්තාවී | 262 | 8 |
| භූතගාම පාතව්‍යතාය | 215 | 10 |
| භූතස්මිං | 210 | 1 |
| භෙදන සංවත්තනිකං | 91 | 11 |
| භෙසජ්ජානි | 179 | 26 |
| මඤ්චං | 221 | 1 |
| මත්ථෙහි | 259 | 22 |

| | පිට | පෙළ |
|---|---|---|
| මනුස්ස විග්ගහං | 44 | 11 |
| මරණාය වා සමාදපෙය්‍ය | 40 | 15 |
| මහල්ලකං | 81 | 30 |
| මහා සමයො | 254 | 30 |
| මාතුගාමෙන | 206 | 11 |
| මාතුගාමෙන සද්ධිං | 64 | 28 |
| මාසො සෙසො ගිම්හානං | 181 | 20 |
| මුඛ ද්වාරං | 277 | 22 |
| මොහො ආරොපෙතබ්බො | 333 | 8 |
| යතස්ස චීවරචෙතාපන්නං | 157 | 18 |
| යථාසන්ථුතං | 344 | 1 |
| යාමකාලිකං | 271 | 30 |
| යාව කාලිකං | 271 | 23 |
| යාව ජීවිකං | 272 | 11 |
| යාව තතියං අනුසාවිතං | 18 | 23 |
| යාව තිහං ජානං පටිච්ඡාදෙති | 109 | 20 |
| යාව ද්වාරකොසා | 231 | 1 |
| රතනං | 348 | 21 |
| රහො | 115 | 23 |
| රාජභොග්ගො | 155 | 1 |
| රාජා නො | 38 | 9 |
| රූපිය සංවොහාරං | 172 | 19 |
| වත්ථුදෙසනාය | 78 | 19 |
| වායාපෙය්‍ය | 185 | 20 |
| විකප්පං ආපජ්ජෙය්‍ය | 188 - 148 | 9 - 20 |
| විකාලෙ | 350 - 369 | 13 - 1 |
| විපරිණතෙන චිත්තෙන | 64 | 23 |
| විසුද්ධාපෙක්ඛො | 52 | 9 |
| විහෙසකෙ | 217 | 14 |
| වෙණිගාහං | 65 | 14 |
| වෙය්‍යාවච්චකරො | 155 | 23 |
| සංඝාදිසෙස නිදානං | 67 | 3 |

| | පිට | පෙළ |
|---|---|---|
| සංඝාදිසෙසෙන | 122 | 1 |
| සංඝිකං | 194 | 17 |
| සංඝිකෙ විහාරෙ | 223 | 5 |
| සංචරිත්තං | 73 | 25 |
| සංචිච්ච | 44 | 5 |
| සංවිධය | 247 - 244 | 1 - 26 |
| සකබලෙන මුඛෙන | 383 | 18 |
| සංඩෙසා | 15 | 14 |
| සඤ්ඤත්තො සො මයා | 156 | 3 |
| සඤ්ඤවිකාය | 77 | 17 |
| සඤ්චෙතනිකා | 58 | 20 |
| සත්ත අධිකරණ සමථා | 391 | 1 |
| සත්තාහකාලිකං | 272 | 8 |
| සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය | 46 | 5 |
| සද්ධෙය්‍ය වචසා | 117 | 1 |
| සන්තං භික්ඛුං අනා පුච්ඡා | 285 | 25 |
| සන්ත රුත්තර පරමං | 145 | 19 |
| සත්ථ තං | 159 | 19 |
| සන්නිධිකාරකං | 180 - 270 | 7 - 18 |
| සප්පටිභයානි | 93 - 368 | 10 - 17 |
| සප්පාණ කං | 311 | 26 |
| සපරික්කමණං | 79 | 13 |
| සබ්බං හත්ථං | 383 | 13 |
| සභොජනෙ | 283 | 7 |
| සම්පජාන මුසාවාදස්ස | 19 | 1 |
| සම්භුඤ්ජෙය්‍ය | 323 | 20 |
| සම්මජ්ජනී | 3 | 16 |
| සමග්ගස්ස සංඝස්ස | 91 | 6 |
| සමණ හත්ත සමයො | 255 | 3 |
| සමතිත්තිකං | 379 | 11 |
| සමනුග්ගාහියමානො | 52 | 4 |
| සමසූපකං | 379 | 4 |

| | පිට | පෙළ |
|---|---|---|
| සහත්ථා | 167 | 30 |
| සහධම්මිකං | 98 | 25 |
| සහසෙය්‍යං | 203 | 25 |
| සාමන්තා | 165 | 24 |
| සාමං චීවරං දත්වා | 183 | 23 |
| සාමිසෙන හත්ථෙන | 384 | 29 |
| සාසඞ්කසම්මතානි | 193 - 368 | 6 - 12 |
| සික්ඛං පච්චක්ඛාය | 23 | 5 |
| සික්ඛා සාජීව සමාපන්නො | 21 | 18 |
| සිඤ්චෙය්‍ය | 333 | 3 |
| සිබ්බෙය්‍ය | 243 | 5 |
| සීමා | 10 | 5 |
| සීමා සම්පත්ති | 22 | 28 |
| සුක්ක විසට්ඨි | 58 | 25 |
| සුගත චීවරප්පමාණං | 359 | 27 |
| සුත්තං | 185 | 16 |
| සුද්ධ කාළකානං | 161 | 12 |
| සුද්ධන්තපරිවාසො | 111 | 14 |
| සුපටිච්ඡන්නො | 374 | 12 |
| සුරාමෙරය පානෙ | 294 | 10 |
| සෙඛසම්මතානි | 365 | 26 |
| සෙනාබ්‍යූහං | 293 | 21 |
| සෙය්‍යං | 223 | 8 |
| සෙය්‍යං කප්පෙය්‍ය | 225 | 23 |
| හත්ථගාහං | 65 | 6 |
| හත්ථනිල්ලෙහකං | 384 | 25 |


නිමි.

# පිරිවෙන් පොත් සහ බණදහම් පොත්

| | | | |
|---|---|---|---|
| 01. | උවාසගදසාඕ 6-10 - ගරු රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල හිමි | මිල රු. | 150.00 |
| 02. | විනයකර්ම පොත - ගරු වේඩරුවේ ආනන්ද මූර්ති හිමි | මිල රු. | 160.00 |
| 03. | ගුත්තිල කාව්‍යය - සංස්කරණය, වී. ඩී. එස්. ගුණවර්ධන | මිල රු. | 140.00 |
| 04. | පාළි නාම වරනැගිල්ල | මිල රු. | 120.00 |
| 05. | සංස්කෘත නාම ආඛ්‍යාත වරනැගිල්ල | මිල රු. | 70.00 |
| 06. | සිංහල ග්‍රන්ථාණිවය හෙවත් සිහළගත් සයුර - තලල්ලේ සිරි ධම්මානන්ද හිමි | මිල රු. | 90.00 |
| 07. | අභිනව සාසන වංසො - තුඹුල්ලේ ධම්මානන්ද හිමි | මිල රු. | 190.00 |
| 08. | බුත්සරණ - සංස්කරණය ගරු වැලිවිටියේ සොරත නාහිමි | මිල රු. | 380.00 |
| 09. | කව්සිළුමිණ - සංස්කරණය ගරු වැලිවිටියේ සොරත නාහිමි | මිල රු. | 500.00 |
| 10. | භික්ෂු භික්ෂුණී ප්‍රාතිමොක්ෂ වර්ණනාව | මිල රු. | 350.00 |
| 11. | පංචතන්ත්‍රය (මිත්‍රභේද කථා සංග්‍රහය) - පහමුණේ ශ්‍රී සුමංගල හිමි | මිල රු. | 360.00 |
| 12. | කච්චායන ධාතු මංජුසාව - ගරු ඉඳුරාගාරේ ධම්මරතන හිමි | මිල රු. | 80.00 |
| 13. | කථාමෘතය - ගරු වැලිවිටියේ සෝරත නාහිමි | මිල රු. | 90.00 |
| 14. | භෝජ ප්‍රබන්ධය (සංස්කෘත පෙළ හා සන්නය) | මිල රු. | 320.00 |
| 15. | සිංහල බෝධි වංශය - සංස්කරණය වී.ඩී.එස්. ගුණවර්ධන | මිල රු. | 250.00 |
| 16. | පාළි භාෂාව හා රචනය - පණ්ඩිත පැණිහෙල සිරිසම්බෝධි හිමි | මිල රු. | 300.00 |
| 17. | ධම්ම පදය (1-5 වර්ග) - රන්ජිත් වනරත්න | මිල රු. | 140.00 |
| 18. | ධම්ම පදය (6-10 වර්ග) - රන්ජිත් වනරත්න | මිල රු. | 85.00 |
| 19. | ධම්ම පදය (11-18 වර්ග) - රන්ජිත් වනරත්න | මිල රු. | 95.00 |
| 20. | ධම්ම පදය (19-26 වර්ග) - ශාස්ත්‍රපති ගරු ඉඳුරාගාරේ ධම්මපාල හිමි | මිල රු. | 200.00 |
| 21. | ජින චරිතය - ගරු බද්දේගම විමලවංස නාහිමි | මිල රු. | 200.00 |
| 22. | අමාවතුර - ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගමේ සංස්කරණය | මිල රු. | 300.00 |
| 23. | දශ කුමාර චරිතම් (පූර්ව පීඨිකා) - නාගොඩ ආරියදාස සෙනෙවිරත්න | මිල රු. | 340.00 |
| 24. | අලහබාද් ප්‍රශස්ති ටැම්ලිපිය - බෙල්ලන ඤාණවිමල මහානායක හිමි | මිල රු. | 20.00 |
| 25. | සමන්ත පාසාදිකා - සංස්කරණය ගරු රඹුක්වැල්ලේ විපස්සී හිමි | මිල රු. | 360.00 |
| 26. | ථේරී ගාථා - සංස්කරණය ගරු රඹුක්වැල්ලේ විපස්සී හිමි | මිල රු. | 350.00 |
| 27. | English for Pirivena Students (Year 1, 2, 3, and 4) L. B. Herath | මිල රු. | 150.00 |
| 28. | දාඨාවංස - පණ්ඩිත, රන්ජිත් වනරත්න (බී. ඒ.) | මිල රු. | 180.00 |
| 29. | අභිධානප්පදීපිකා පාලි නිඝණ්ඩුව - නාගොඩ ආරියදාස සෙනෙවිරත්න | මිල රු. | 425.00 |
| 30. | සිංහල අනුවාදය සහිත ධම්මපදය - අත්තුඩාවේ සිරි රාහුල නාහිමි | මිල රු. | 125.00 |
| 31. | සංස්කෘත නාමාඛ්‍යාත විවරණය - වරාගොඩ පේමරතන හිමි | මිල රු. | 300.00 |
| 32. | ශ්‍රී බුද්ධචරිත මහා කාව්‍යය (1 - 2 සර්ග) - නාගොඩ ආරියදාස සෙනෙවිරත්න | මිල රු. | 225.00 |
| 33. | සමන්තකූට වණ්ණනා - දෙනියායේ පඤ්ඤාලෝක හිමි | මිල රු. | 325.00 |
| 34. | සියබස්ලකර දීපනී - සංස්කරණය වී. ඩී. එස්. ගුණවර්ධන | මිල රු. | 400.00 |
| 35. | සිංහල ථූපවංශය - රන්ජිත් වනරත්න (බී.ඒ) | මිල රු. | 150.00 |
| 36. | බුඬ චරිතය - ගරු බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නාහිමි | මිල රු. | 275.00 |
| 37. | පාලිකථා මඤ්ජුසා (පඨමො භාගො) | මිල රු. | 100.00 |
| 38. | කාව්‍යාදර්ශය - ගරු වැලිවිටියේ පේමරතන හිමි | මිල රු. | 400.00 |
| 39. | රඝුවංශය (1 - 2 - 3 සර්ග) - ඒ. ඇම්. ඩී. වයි. සරත්චන්ද්‍ර අමරතුංග | මිල රු. | 300.00 |
| 40. | සංස්කෘත නාමාඛ්‍යාත පද වරනැගිල්ල - රඹුක්වැල්ලේ විපස්සී හිමි | මිල රු. | 280.00 |
| 41. | Jataka Tales Abridged - W. A. Abeysinghe | මිල | |

***සහ වෙනත් අධ්‍යාපනික හා පිරිවෙන් පොත් ලබාගත හැක.***

**සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම**

61, 63, හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි මාවත,
(මාලිගාකන්ද පාර) මරදාන - කොළඹ 10.
දුරකථනය - 2683986, 2677539, 4714917 ෆැක්ස්: 2688977, 2683386

ISBN: 955-570-145-8
SMB 101 - මිල රු. 350/-